English is a subject that requires engaging and interactive teaching methods to enhance student engagement and participation. In this context, participatory learning strategies are considered an important component of the curriculum. Consequently, the teaching and learning process can be continuously improved based on the experiences gained from classroom activities. This action research study investigates the effectiveness of gamification in English lessons with Grade 6 students at a selected Type 1AB girls' school in the Kandy District. The primary objective of this study is to examine how gamification affects student participation in English lessons. Additional objectives of this study are to assess the extent to which existing English teaching practices promoted active student engagement, explore the gamification tools and strategies implemented in the classroom, examine the teacher's experiences and students' perceptions of these tools, and identify the benefits and challenges associated with the use of gamification in English Language Teaching (ELT), while suggesting practical solutions to address those challenges. An action research design with a mixed-methods approach was employed to achieve the objectives of this study. The study sample consisted of Grade 6 students from a selected Type 1AB girls' school and was selected through convenience sampling. Primary data were collected through questionnaires, interviews, and classroom observations, with the informed consent of all participants. Qualitative data were analysed using thematic and content analysis, while quantitative data were analysed using descriptive statistics and pre- and post-test comparisons. The findings are expected to reveal the effect of gamification on students' participation levels and provide practical strategies for effectively incorporating gamification into English language teaching.

***Keywords*:** gamification, student participation, English language teaching, action research, mixed-methods

I wish to acknowledge Subhashini Wijesundara for her guidance and supervision.

UNDERGRADUATE STUDENTS' PERCEPTIONS ON SOCIAL INCLUSION IN THE CLASSROOM

F. Zainab
Department of Education, University of Peradeniya
a20874@arts.pdn.ac.lk

This study explores undergraduate students' perceptions of social inclusion in the classroom context at the University of Peradeniya. The study was guided by five objectives, namely, to explore students' awareness and understanding of social inclusion, to identify the level of social inclusion experienced by students in the classroom, to examine the factors influencing social inclusion, to identify barriers that hinder social inclusion, and to recommend strategies for improving social inclusion. A quantitative research approach was adopted using the cross-sectional survey method. Data were collected through a structured questionnaire consisting of 24 Likert-scale items and administered to a sample of 140 undergraduate students. Stratified random sampling was employed to select 35 students from each year of study (first through fourth year), ensuring equal representation across academic levels. Data were analysed using SPSS application and using descriptive statistics. The findings revealed that a considerable proportion of students selected neutral responses regarding their awareness and understanding of social inclusion and also their experiences of social inclusion within the classroom. Students neither strongly agreed nor disagreed that they felt fully included, respected, and valued in classroom activities, indicating limited awareness or unclear experiences of inclusive practices. The results also showed that students perceived language differences, socioeconomic disparities, lack of awareness, discrimination, and low self-confidence as significant barriers to social inclusion. Furthermore, respondents generally agreed that strategies such as group activities, inclusive teaching practices, strengthened diversity policies, peer support programmes, and awareness-building initiatives could enhance social inclusion. The study concludes that while undergraduate students recognise the importance of social inclusion, many remain uncertain about their own experiences of inclusion within the classroom.

***Keywords*:** social inclusion, undergraduate students, classroom environment, higher education, inclusive education

I wish to acknowledge the guidance and supervision of Pushpa Vitharana.

අටවන ශ්‍රේණියේ භූගෝල විද්‍යාව විෂය ඉගැන්වීම සඳහා පෙරළුණු පන්තිකාමර ක්‍රමය යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයක්

ටී. එස්. එම්. කේ. වික්‍රමරත්න
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a19852@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන පද්ධතිය තුළ භූගෝල විද්‍යාව යනු න්‍යායාත්මක සංකල්ප මෙන්ම සිතියම් ලකුණු කිරීම වැනි ප්‍රායෝගික කුසලතා බහුල විෂයයකි. එහෙත් වර්තමාන සාම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය ඉගැන්වීම් රටාවේදී විෂය කරුණු පැහැදිලි කිරීමට වැඩි කාලයක් වැය වන බැවින්, පන්ති කාමරය තුළ සිසුන්ට ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල නිරත වීමට ලැබෙන කාලය සීමිතය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සිසුන් අක්‍රීය ඉගෙනුම්කරුවන් බවට පත්වන අතර විෂය කෙරෙහි පවතින උනන්දුව ද ක්‍රමයෙන් හීන වී යයි. අටවන ශ්‍රේණියේ භූගෝල විද්‍යාව විෂය සඳහා පෙරළුණු පන්තිකාමර ක්‍රමය යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණයි. ඒ යටතේ අටවන ශ්‍රේණියේ භූගෝල විද්‍යාව විෂයය අන්තර්ගතය අධ්‍යයනය කිරීම, පෙරළුණු පන්තිකාමර ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව සිසුන්ගේ භූගෝල විද්‍යාව විෂයය සාධනය අධ්‍යයනය කිරීම, භූගෝල විද්‍යාව විෂයය ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පෙරළුණු පන්තිකාමර ක්‍රමය යොදා ගැනීම සම්බන්ධව සිසුන්ගේ අදහස් විමසා බැලීම සහ භූගෝල විද්‍යාව විෂයය ඉගැන්වීම සඳහා පෙරළුණු පන්තිකාමර ක්‍රමය වඩාත් සාර්ථකව යොදා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සෙසු අරමුණු කොට ගනිමින් මෙම අධ්‍යයනය සිදු විය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණ ළඟුම යටතේ අභිසාරී පිරිසැලසුම යොදාගන්නා ලදි. මේ සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ මධ්‍ය මහා විද්‍යාලයක අටවන ශ්‍රේණියේ සිසුන් තිස් අට දෙනෙකු සහ විෂයභාර ගුරුවරුන් සිව්දෙනෙකු සසම්භාවී නොවන නියැදිකරණ ක්‍රමවේදය යටතේ තෝරාගත් අතර දත්ත රැස් කිරීම සඳහා ලේඛනගත වාර්තා සහ ප්‍රශ්නාවලි භාවිත කෙරිණි. රැස්කරගත් දත්ත SPSS හා Excel මෘදුකාංග මඟින් සංඛ්‍යානමය විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේද ඔස්සේ විශ්ලේෂණය කර අර්ථ නිරූපණය කරන ලදි. භූගෝල විද්‍යාව විෂය යටතේ පාඩම් පහක් සාම්ප්‍රදායික ක්‍රමයට හා පෙරළුණු පන්තිකාමර ක්‍රමවේදය අනුව උගන්වන ලද අතර මෙහිදී එක් එක් නියැදි පෙර හා පසු පරීක්ෂාවක් සිදු කළ අතර, අනතුරුව කරන ලද දත්ත විශ්ලේෂණයේදී, සාම්ප්‍රදායික ක්‍රමය මඟින් ඉගැන්වීමෙන් අනතුරුව සිසුන් ලබාගත් ලකුණුවල සාමාන්‍යය අගය 5.5 ක්ද, පෙරළුණු පන්තිකාමර ක්‍රමය මඟින් ඉගැන්වීමෙන් අනතුරුව සිසුන් ලබා ගත් ලකුණුවල සාමාන්‍යය අගය 16.32 ක්ද බව සොයා ගන්නා ලදි. මෙම පෙරළුණු පන්තිකාමර ක්‍රමය භාවිත කිරීමට පෙර සිසුන් ලබාගත් ලකුණුවලට වඩා එය භාවිත කිරීමෙන් පසු ලබාගත් ලකුණුවල පැහැදිලි වර්ධනයක් පෙන්වන බව නිගමනය කළ හැක. ඒ අනුව, පෙරළුණු පන්තිකාමර ක්‍රමය මඟින් සිසුන්ගේ විෂය සාධනය සහ ප්‍රායෝගික කුසලතා ඉහළ නැංවීමට මෙන්ම සක්‍රීය සිසු කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට හැකි බව ප්‍රකාශ කළ හැකි ය.

ප්‍රමුඛ පදඃ පෙරළුණු පන්ති කාමර ක්‍රමය, භූගෝල විද්‍යාව, විෂය සාධනය

මෙම අධ්‍යයනය සඳහා පී. ආර්. කේ. ඒ. විතාරණගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

නව යොවුන්විය පාසල් සිසුන්ගේ ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම හා ශාරීරික යෝග්‍යතා මට්ටම පිළිබඳ අධ්‍යයනය කිරීම

එල්. එස්. අබේරත්න
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20002@arts.pdn.ac.lk

නව යොවුන්විය යනු මනුෂ්‍ය ජීවිතයේ ශාරීරික, මානසික වශයෙන් විශාල වෙනස්කම් සිදුවන අතිශය වැදගත් අවධියකි. මෙම අවධියේදී ශරීර වර්ධනය, මාංශපේෂී ශක්තිමත්වීම, ශ්වසන ක්‍රියාකාරීත්වය වර්ධනය හා සමස්ත ශරීරික සංවර්ධනය සිදුවේ. මෙම වයස් කාණ්ඩයේ පාසල් සිසුන්ගේ දෛනික ජීවන රටාව, ක්‍රීඩා හා ශාරීරික ක්‍රියාකාරකම්වලට සහභාගී වීම ඔවුන්ගේ වර්තමාන හා අනාගත සෞඛ්‍ය තත්ත්වයට දැඩිලෙස බලපෑම් ඇති කරයි. තාක්ෂණික උපාංග භාවිතය, අධ්‍යාපනික පීඩනය හා විවේකය සීමාවීමෙන් නව යොවුන්විය පාසල් සිසුන්ගේ ක්‍රීඩා ක්‍රියාකාරකම් අඩුවීමක් පෙන්වයි. නව යොවුන්වියේ සිටම පාසල් සිසුන් විවිධ ලෙඩ රෝගවලට ගොදුරු වන්නේ මේ නිසාය. නව යොවුන්විය පාසල් සිසුන්ගේ ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම හා ශාරීරික යෝග්‍යතා මට්ටම අතර සම්බන්ධය පිළිබඳ පාසල් පද්ධතිය ආශ්‍රයෙන් විද්‍යාත්මකව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූ අතර නව යොවුන්විය පාසල් සිසුන්ගේ ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම හඳුනාගැනීම, ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතා මට්ටම මැන බැලීම සහ පාසල් සිසුන්ගේ ජීවනරටා ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාවට බලපාන ආකාරය ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ සුවිශේෂ අරමුණු විය. පර්යේෂණය මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදු කරන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක 8 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා ශ්‍රේණි හතරකින් ශිෂ්‍යයන් 40 ක නියැදියක් ස්තරායන අහඹු නියැදිකරණය මඟින් තෝරාගෙන ප්‍රශ්නාවලිය සහ ශාරීරික යෝග්‍යතා දර්ශකය මඟින් මැනීමෙන් ලබාගත් දත්ත රූස්කර ප්‍රමාණාත්මක දත්ත සමීක්ෂණ මඟින්ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය මඟින්ද විශ්ලේෂණය සිදුකළ අතර පර්යේෂණ නියමු පරීක්ෂණ අනාවරණවලට අනුව පැහැදිලි වුයේ ක්‍රීඩා ක්‍රියාකාරකම් හා ශාරීරික යෝග්‍යතා මට්ටම අතර සහසම්බන්ධතාවක් පවතින බවයි. එනම් ශාරීරික සංයුතිය හා ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම අතර සහසම්බන්ධතා සංගුණකය +0.4ද, හිටි දුර පැනීමේ යෝග්‍යතාව හා ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම අතර සහසම්බන්ධතා සංගුණකය +0.2ද, ස්වසන යෝග්‍යතාව හා ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම අතර සහසම්බන්ධතා සංගුණකය +0.05ද, යනුවෙන් ධන සහසම්බන්ධතාවක් පවතින බවත්, නම්‍යශීලීබව හා ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම අතර සහසම්බන්ධතා සංගුණකය - 0.02ද, පේශීමය යෝග්‍යතාව හා ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම අතර සහසම්බන්ධතා සංගුණකය - 0.04 ද,ලෙස ඍණ සහසම්බන්ධතාවක් පවතින බවත් නිගමනය කළ හැක.

ප්‍රමුඛ පද: ශාරීරික යෝග්‍යතා මට්ටම, ක්‍රීඩා ක්‍රියාකාරකම් මට්ටම, ශාරීරික යෝග්‍යතා දර්ශක

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපුර්වකව සිහිපත් කරමි.

ගණිතය විෂයය ඉගැන්වීමේදී සිසුන්ගේ අධිප්‍රජානන කුසලතා සංවර්ධනය කිරීම සඳහා පලංචිකරණ සංකල්පය යොදා ගැනීම පිළිබඳ අත්හදා බැලීමක් සඳහා ක්‍රියාමූල පර්යේෂණයක්

ඒ.එස්.එච්. අබේරත්න
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20009@arts.pdn.ac.lk

නිර්මාණශීලී චින්තනය සහ තර්කානුකූල චින්තනයට අවශ්‍ය ඉහළ මානසික හැකියා සංවර්ධනයට ගණිතය විෂයය ඉවහල් වේ. ශ්‍රී ලංකාවේද පාසල්වල 1 සිට 13 ශ්‍රේණිය දක්වා ගණිතය විෂයය ඉගෙනීම සිදු වේ. නමුත් පංති කාමරය තුළ ගණිතය විෂයෙහි සාධන මට්ටම අඩු ප්‍රතිශතයක් ගනී. මේ සඳහා ගණිත විෂයය ඉගෙනීමට අත්‍යවශ්‍ය වන අධිප්‍රජානන කුසලතා සිසුන් තුළ සංවර්ධනය වීමේ පවතින දුර්වලතා බලපෑ හැකිය. තමන්ගේ චින්තන ක්‍රියාවලිය පිළිබඳ පවතින දැනුවත්භාවය සහ නියාමනය කිරීම අධිප්‍රජානනය යනුවෙන් හඳුන්වයි. ගණිත විෂය සාධනය ඉහළ නැංවීම සඳහා අධිප්‍රජානන උපායමාර්ග අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස පිළිගෙන ඇත. පන්ති කාමරය තුළ බොහොමයක් සිසුන් ගණිත විෂයය ඉගෙනීමට අධිප්‍රජානන කුසලතා භාවිත කිරීම අවම මට්ටමක පවතින බව පර්යේෂණවලින් හෙළි වී ඇත. එබැවින් මෙම තත්ත්වය වෙනස් කරමින් ගණිතය විෂය ඉගෙනීමේදී අධිප්‍රජානන කුසලතා භාවිතය සිසුන්ට හුරු කිරීම සහ එහි ඵලදායිතාව ගවේෂණය කිරීම අරමුණු කර ගනිමින් මා ගුරු පුහුණුව ලබන පාසලේ 7 ශ්‍රේණිය සිසුන් සමග මෙම ක්‍රියාමූල පර්යේෂණය සිදු කළෙමි. මේ සඳහා විගොට්ස්කි විසින් ඉදිරිපත් කරනු ලැබූ අවිදුර සංවර්ධන කලාපය තුළ පලංචිකරණ උපාය මාර්ග භාවිත කර ගුරුවරයා තාවකාලික සහාය ලබා දෙන්නෙකු ලෙස ක්‍රියාකරමින් සිසුන්ගේ සැලසුම්කරණය, ස්වයං ප්‍රශ්නකරණය, ශබ්ද නගා සිතීම සහ සවිචාරාත්මක චින්තනය උත්තේජනය කිරීමට අවශ්‍ය අභ්‍යාසවල සිසුන් නිරත කරවීමට ක්‍රියා කළෙමි. එහිදී සිසුන් කෙටි ක්‍රම, කණ්ඩායම් වැඩසටහන්, සමූහ සාකච්ඡා, ආධාරක භාවිත කිරීම සහ ගුරුවරයා විසින් ආදර්ශනය කර පෙන්වීම මඟින් සාම්ප්‍රදායික ඉගෙනුම් රටාවෙන් මිදී ක්‍රියාශීලීව ඉගෙනීම සිදු කිරීමට අවස්ථාව ලබා දුනිමි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියා මූලික පර්යේෂණ පිරිසැලැස්ම භාවිත කළ අතර මැදිහත්වීම් ත්‍රිත්වයක් යොදා ගතිමි. පූර්ව පරීක්ෂණයක් මඟින් 40% - 50% ත් අතර ලකුණු ලබා ගත් සිසුන් හය දෙනෙකු නියැදිය ලෙස තෝරා ගෙන ඇති අතර දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, සජීවී නිරීක්ෂණ, ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල සහ ලිඛිත ලේඛන යොදා ගතිමි. දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව සිදු කර ඇති අතර ප්‍රස්තාර, වගු, තීරු සටහන් සහ රාමුගත විශ්ලේෂණ මඟින් අනාවරණය වූයේ මෙම උපායමාර්ග භාවිතයෙන් සිසුන්ගේ සැලසුම්කරණය, ස්වයං ප්‍රශ්නකරණය, සවිචාරාත්මක චින්තනය, ශබ්ද නගා සිතීම සහ විෂය කැමැත්ත ප්‍රමාණාත්මක ලෙස වර්ධනය වූ බවයි. සමස්තයක් ලෙස වර්තමාන පන්ති කාමරය තුළ ගණිතය විෂයය ඉගෙනීමේදී ගුරුවරයා විසින් ලබා දෙන පලංචිකරණය සිසුවාගේ ගණිත සාධනය සංවර්ධනයට ප්‍රයෝජනවත් ලෙස යොදා ගත හැකි බව මේ අනුව පෙනී යයි.

ප්‍රමුඛ පදඃ අධිප්‍රජානනය, අධිප්‍රජානන උපායමාර්ග, පලංචිකරණය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, ගණිත විෂයය

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

10 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සිංහල මාධ්‍යයෙන් හදාරන සිසුන් සඳහා ඉංග්‍රීසි මාධ්‍ය පාරිභාෂික වචන භාවිතය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සහ විෂය අවබෝධයට බලපාන ආකාරය

ජේ. ඩබ්. එච් ආරච්චි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20043@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට 2002දී 12 ශ්‍රේණිය සඳහා සාමාන්‍ය තොරතුරු තාක්ෂණය, 2007 දී අ.පොෙ.ස. සාමාන්‍ය පෙළ සහ 2011 දී අ.පොෙ.ස. උසස් පෙළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයත් හඳුන්වා දෙන ලදි. විෂය ක්ෂේත්‍රය යාවත්කාලීන වුවද, ඊට සමගාමීව දේශීය සිංහල පාරිභාෂික වචන නිර්මාණය වීම ප්‍රමාද වී ඇත. මේ හේතුවෙන් ඉංග්‍රීසි මාධ්‍ය පාරිභාෂික වචන බහුලව භාවිත කිරීමට ප්‍රායෝගිකව සිදුවී තිබේ. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ ලෙස 10 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂය සිංහල මාධ්‍යයෙන් හදාරන සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ ඇගයීම් ක්‍රියාවලියේදී ඉංග්‍රීසි පාරිභාෂික වචන භාවිත වන ආකාරය විමර්ශනය කිරීමත් එමඟින් සිසුන්ගේ විෂය අවබෝධය කෙරෙහි ඇති වන බලපෑම හා පවත්නා ගැටලු හඳුනා ගනිමින් ඒ සඳහා යෝග්‍ය විසඳුම් හා යෝජනා ඉදිරිපත් කිරීම වේ. සුවිශේෂී අරමුණු ලෙස මූලාශ්‍රවල (විෂය නිර්දේශයේ / ගුරු මාර්ගෝපදේශයේ / පොත්පත්වල) පරිභාෂික වචන දක්වා ඇති ආකාරය, ගුරුවරුන් පන්ති කාමරයේදී සිංහල පාරිභාෂික වචන සඳහා යොදා ගන්නා ඉංග්‍රීසි මාධ්‍ය යෙදුම් භාවිත කරන ආකාරය අධ්‍යයනය කිරීම සහ ඉංග්‍රීසි පාරිභාෂික වචන භාවිතය නිසා සිසුන්ගේ විෂය අවබෝධයට වන බලපෑම සහ එහි ගැටලු හඳුනා ගැනීම හා විසඳුම් යෝජනා කිරීම සිදු කරන ලදි. ඒ මත පර්යේෂණ ප්‍රශ්නද තැනුණිග මෙම අධ්‍යයනය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයහි (convergent parallel design) යොදා ගැනේ. ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ අහඹු ලෙස තෝරාගත් එක් ග්‍රාමීය සහ එක් නාගරික පාසලක් ඇසුරින් ගුරුවරුන් 4ක් සහ සිසුන් 40ක් ඇතුළත් නියැදියක් මේ සඳහා භාවිත කෙරිණි. දත්ත රැස්කිරීමේදී ප්‍රමාණාත්මක ක්‍රමවේදය යටතේ සිසුන් වෙත ප්‍රශ්නාවලී ලබාදුන් අතර, ගුණාත්මක ක්‍රමවේදය යටතේ නිරීක්ෂණ පත්‍රිකාවක් මඟින් පන්තිකාමර නිරීක්ෂණය සිදු කරන ලදි. තවද, ගුරුවරුන් සමඟ සම්මුඛ සාකච්ඡා සහ ද්විතියික මූලාශ්‍ර විමර්ශනය ද සිදු කෙරිණි. රැස් කළ දත්ත තේමා විශ්ලේෂණය හා සංඛ්‍යාත්මක විශ්ලේෂණයට ලක් කිරීම මඟින්, විෂය මූලාශ්‍රවල පාරිභාෂික වචන ස්වභාවය, ගුරුවරුන් ඉංග්‍රීසි මාධ්‍ය යෙදුම් භාවිත කරන ආකාරය සහ එමඟින් සිසුන්ගේ විෂය අවබෝධයට වන බලපෑම හා ගැටලු හඳුනා ගනිමින් අවශ්‍ය යෝජනා සහ ප්‍රායෝගික විසඳුම් රාශියක් අනාවරණය කර ගැනීම අපේක්ෂාව විය.

ප්‍රමුඛ පද: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ඉංග්‍රීසි පාරිභාෂික වචන, පන්තිකාමර නිරීක්ෂණය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, විෂය අවබෝධය

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රම භාවිතයෙන් ඉතිහාසය විෂය ඉගෙනීම කෙරෙහි සිසුන් තුළ පවතින රුචිකත්වය වර්ධනය කිරීම පිළිබඳ ක්‍රියාමූලික පර්යේෂණය

ඩබ්ලිව්.එස්.එම්. බංඩාර
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20084@arts.pdn.ac.lk

පන්ති කාමරය තුළ පවතින සාම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය දේශන ක්‍රමවේද සහ විභාග කේන්ද්‍රීය ඉගෙනුම් ආතතිය හේතුවෙන් ඉතිහාසය විෂය කෙරෙහි සිසුන් තුළ පවතින රුචිකත්වය සහ සහභාගිත්වය අවම වීම පොදු ගැටලුවකි. මෙම ගැටලුව මා ගුරු පුහුණුව ලද පාසලේද දක්නට ලැබුණි. මෙම ක්‍රියාමූලික පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවේද ක්‍රමානුකූලව පන්ති කාමරය තුළ භාවිත කිරීම මඟින් ඉතිහාසය විෂය ඉගෙනීම කෙරෙහි සිසුන් තුළ පවතින රුචිකත්වය වර්ධනය කිරීමයි. පර්යේෂණයේ සුවිශේෂී අරමුණු ලෙස සිසුන් තුළ පවතින මූලික පෙළඹීමේ මට්ටම හඳුනා ගැනීම, ශිෂ්‍ය පෙළඹවීම වැඩිදියුණු කිරීමට දායක වන ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම සැලසුම් කර ක්‍රියාවට නැංවීම, නව ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කිරීමෙන් පසුව සිසුන් තුළ ඇති වූ උනන්දුව, කැමැත්ත සහ පන්ති කාමර සහභාගිත්වය කෙතරම් දුරට වර්ධනය වී ඇත්දැයි නිරීක්ෂණය කර තක්සේරු කිරීම සහ විවිධ ඉගැන්වීම් ක්‍රමවේද මඟින් ඉතිහාස විෂය පිළිබඳ ශිෂ්‍යයන් තුළ ධනාත්මක ආකල්පයක් ගොඩනැගීම හඳුනා ගන්නා ලදි. මිශ්‍ර ක්‍රමවේදය යටතේ සිදුකරනු ලැබූ ක්‍රියාමූලික පර්යේෂණයක් වන අතර මා ගුරු පුහුණුව ලද පාසලේ හත ශ්‍රේණියේ සිසුන් (45) ක් පර්යේෂණය සඳහා භාජනය කළෙමි. සිසුන්ගේ මූලික පෙළඹීම් මට්ටම හඳුනා ගැනීම සඳහා මූලික ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිත කළ අතර මැදිහත් වීමේ ක්‍රියාවලිය ලෙස භූමිකා රංගන ක්‍රමවේදය, ක්‍රීඩා ක්‍රමය සහ කතන්දර ක්‍රමය යන ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රමවේද පන්ති කාමරයේදී සාර්ථකව ක්‍රියාවට නංවන ලද අතර දත්ත රැස් කිරීම සඳහා සහභාගිත්ව නිරීක්ෂණ මෙවලම් සහ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා සක්‍රීයව භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූයේ භූමිකා රංගන, ක්‍රීඩා සහ කතන්දර වැනි ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවේද භාවිතයෙන් පසුව සිසුන්ගේ පන්ති කාමර සහභාගිත්වය, ඉගෙනුම් කැමැත්ත සහ විෂය කෙරෙහි පවතින උනන්දුව කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇති බවයි. සාම්ප්‍රදායික කරුණු කටපාඩම් කිරීමේ ක්‍රමවේදවලින් මිදී ක්‍රියාකාරී ඉගෙනුම් ක්‍රම භාවිතය සිසුන් තුළ ඉතිහාසය පිළිබඳ ධනාත්මක ආකල්පයක් ගොඩ නැගීමටත් පන්ති කාමරයේ සමාජ සබඳතා වර්ධනය කිරීමටත් හේතු වන බව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: ඉතිහාසය විෂය, ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවේද, ශිෂ්‍ය පෙළඹවීම, ශිෂ්‍ය රුචිකත්වය, පන්ති කාමර සහභාගිත්වය

මෙම පර්යේෂණය සඳහා සුභාෂිණි විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කණිෂ්ඨ-ද්විතීක ශ්‍රේණිවල සිසුන්ගේ ගණිත විෂය රුචිකත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රීඩා පාදක ක්‍රියාකාරකම් යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයක්

බී.එම්.ටී.ඩී.කේ. බස්නායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20089@arts.pdn.ac.lk

ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද අධ්‍යාපනයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. මෙම අධ්‍යයනයෙන් කණිෂ්ඨ ද්විතීක ශ්‍රේණිවල සිසුන්ගේ ගණිත විෂය රුචිකත්වය ක්‍රීඩා පාදක ක්‍රියාකාරකම් ඇසුරින් වැඩිදියුණු කරන්නේ කෙසේදැයි ගවේෂණය කරයි. ගණිතයේ පවතින සෛද්ධාන්තික සංකීර්ණත්වය නිසා බොහෝ සිසුන් තුළ පවතින මැළිකම සහ ගණිත භීතිකාව දුරුකරමින්, විෂය රුචිකත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රීඩා පාදක උපායමාර්ගවල ඵලදායීතාව අධ්‍යයනය කිරීම මෙහි අරමුණ විය. විශේෂයෙන්ම ගණිත සංකල්ප සඳහා ක්‍රීඩා සැලසුම් කිරීම, සිසුන්ගේ පූර්ව සහ පශ්චාත් රුචිකත්ව මට්ටම් මැන බැලීම මෙන්ම මේ පිළිබඳ ගුරු-ශිෂ්‍ය අදහස් විමසීම මෙහි සුවිශේෂී අරමුණු වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රවේශ සහිත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත විය. ඒ යටතේ පූර්ව සහ පශ්චාත් පරීක්ෂණ සහිත අර්ධ සම්පරීක්ෂණාත්මක සැලසුම, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ පත්‍රිකා උපයෝගී කරගන්නා ලදි. සාරම්මන සහ සරල සසම්භාවී නියැදිකරණයෙන් තෝරාගත් පාසලක 7 ශ්‍රේණියේ සිසුන් 25 දෙනෙකු නියැදිය ලෙසත්, සම්මුඛ සාකච්ඡා සඳහා අහඹු ලෙස සිසුන් 05 දෙනෙකු සහ ගුරුවරුන් 05 දෙනෙකුත් ලෙස සමස්ත නියදිය 35 දෙනෙකුගෙන් සමන්විත විය. දත්ත විශ්ලේෂණයේදී විස්තරාත්මක සංඛ්‍යානය සහ අන්තර්ගත විශ්ලේෂණය භාවිත කෙරිණි. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව සාම්ප්‍රදායික ක්‍රමවලින් මිදී ක්‍රීඩා පාදක ක්‍රියාකාරකම් යොදා ගැනීම සිසුන්ගේ රුචිකත්වය සහ සාධනය ඉහළ නංවන බව පර්යේෂණ දත්ත මඟින් තහවුරු විය. මිනිත්තු 40 සීමිත කාලය, විභාග කේන්ද්‍රීය රටාව, විෂය නිර්දේශ ආවරණ ගැටලු සහ පන්තිකාමර කළමනාකරණය මෙහි ප්‍රධාන බාධාවන්ය. අවසන් වශයෙන් නිගමනය කළ හැක්කේ, ප්‍රායෝගික බාධාවන් මතු වුවද කණිෂ්ඨ ද්විතීක සිසුන්ගේ ගණිත රුචිකත්වය සාධනීය ලෙස ඉහළ නැංවීමට ක්‍රීඩා පාදක ක්‍රියාකාරකම් ඉහළ ඵලදායීතාවකින් යුත් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් උපායමාර්ගයක් බවයි.

ප්‍රමුඛ පද: ගණිත විෂය රුචිකත්වය, ක්‍රීඩා පාදක ක්‍රියාකාරකම්, කණිෂ්ඨ ද්විතීක ශ්‍රේණි

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

නව යොවුන් වියේ පාසල් ළමුන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතා සහ ඔවුන්ගේ අධ්‍යාපන කාර්යසාධනය අතර පවතින සබඳතාව (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් මිශ්‍ර පාසලක 10-13 ශ්‍රේණිවල සිසුන් ඇසුරින්) කෙරෙන අධ්‍යයනයක්

බී.ජී.එන්.එස්. චන්ද්‍රසේන
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20098@arts.pdn.ac.lk

නව යොවුන් විය යනු මිනිස් ජීවිතයේ ශාරීරික, මානසික හා සමාජීය වෙනස්කම් රැසක් සිදුවන සංවේදී මෙන්ම පරිවර්තනීය අවධියකි. මෙම කාලසීමාවේදී පාසල් වියේ පසුවන සිසුන් අතර ප්‍රේම සබඳතා ඇතිවීමේ ප්‍රවණතාවක් පවතින අතර, එය ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රියාවලියට කෙරෙහි විවිධාකාරයෙන් බලපෑම් එල්ල කරයි. එබැවින් මෙම පර්යේෂණයේ අරමුණ වූයේ නව යොවුන්වියේ පසුවන පාසල් ළමුන් අතර ඇතිවන ප්‍රේම සබඳතා සහ ඔවුන්ගේ අධ්‍යාපන කාර්යසාධනය අතර පවතින සබඳතාව ගවේෂණය කරමින් එමගින් ඔවුන්ගේ අධ්‍යාපන කාර්ය සාධනයට ඇතිවන අහිතකර බලපෑම් මැඩ පැවැත්වීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමයි . මහනුවර දිස්ත්‍රික්කයේ මිශ්‍ර පාසලක් කේන්ද්‍ර කරගනිමින්, එහි 10 සිට 13 ශ්‍රේණි දක්වා වූ සිසුන් අතරින් අහඹු ලෙස තෝරාගත් 30 දෙනෙකුගෙන් යුත් නියැදියක් ඇසුරින් මෙම අධ්‍යයනය සිදුකරන ලදි . මෙහිදී ගුණාත්මක ක්‍රමවේදයට ප්‍රමුඛතාව දෙමින් සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, සිද්ධි අධ්‍යයන සහ විවෘත ප්‍රශ්නාවලි මඟින් ප්‍රාථමික දත්ත රැස්කර එය තේමාත්මක විශ්ලේෂණයකට ලක් කළ අතර පර්යේෂණයේ සොයාගැනීම්වලට අනුව, ප්‍රේම සබඳතා පවතින සිසුන්ගෙන් බොහොමයකගේ අධ්‍යාපන කාර්යසාධනය, එම සබඳතා ඇතිවීමට පෙර තිබූ සාධන මට්ටමට වඩා යම් මට්ටමකින් පහළට ගොස් ඇති බව අනාවරණය විය. එබැවින් මෙම නොමේරූ ප්‍රේම සබඳතා සිසුන්ගේ අධ්‍යාපන ප්‍රගතිය අඩාල කිරීමට දායක විය හැකි බවත්, තවද සාපේක්ෂව එහි දායකත්වය අධ්‍යාපන ප්‍රගතිය වැඩි කිරීමට වඩා අඩු කිරීමට ලැබී ඇති බවත් දත්ත විශ්ලේෂණය කිරීම් මඟින් තහවුරු විය. අවසාන වශයෙන් මෙම අධ්‍යයනයෙන් මා එළඹි නිගමනය වන්නේ, පාසල් වියේ දී ඇතිවිය හැකි ප්‍රේම සබඳතා මඟින් සිසුන්ගේ අධ්‍යාපනයට ඇති කරන හිතකර මෙන්ම අහිතකර බලපෑම් ද්විත්වයම පවතින නමුත්, හිතකර බලපෑම්වලට වඩා අහිතකර බලපෑම් ව්‍යාප්ත වීමේ ප්‍රවණතාව වැඩි බවය. එබැවින්, මෙම ද්විවිධ බලපෑම්වල ස්වභාවය කුමක් වුවද, නොමේරූ ප්‍රේම සබඳතා කෙරෙහි සිසුන් මානසිකව සහ චර්යාත්මකව දැඩි ලෙස ග්‍රහණය වීමේ සමස්ත ප්‍රවණතාව අවම කරගත යුතුය. පාසල තුළ සිසුන්ගේ අධ්‍යාපනය සුරක්ෂිත කිරීම උදෙසා ප්‍රේම සබඳතා මඟින් ඇතිවිය හැකි බලපෑම පාලනය කරනු පිණිස දෙමාපියන්, ගුරුවරුන්, පාසල් උපදේශකවරුන් සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ගේ ක්‍රියාකාරී මැදිහත් වීම් සහ මගපෙන්වීම් ශක්තිමත් කළ යුතු බව මෙම පර්යේෂණය මඟින් අවධාරණය කරමින් නිර්දේශ කර සිටිමි.

ප්‍රමුඛ පද: නව යොවුන් විය, පාසල් ප්‍රේම සබඳතා, අධ්‍යාපන කාර්යසාධනය, ගුණාත්මක ක්‍රමවේදය, තේමාත්මක විශ්ලේෂණය

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුන උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ගම්පොළ අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසලක හත ශ්‍රේණියේ සිසුන්ට ගණිත සංකල්ප සංජානනය සඳහා ආධාරක භාවිතයෙන් ඉගැන්වීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ජී.ඒ.ඩී.කේ. චන්ද්‍රසිරි
අධ්‍යාපනවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරදෙණිය විශ්වවිද්‍යාලය
a20100@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාව තුළ ගණිතය බොහොමයක් සිසුන්ට දුෂ්කර අපහසු විෂයක් මෙන්ම සාමාන්‍ය පෙළ විභාගයේ 39% ක පමණ අඩු සිසුන් ප්‍රමාණයක් ප්‍රථමවරදී අසමත් වේ. ශ්‍රී ලංකාවේ ගණිත විෂය මාලාව සකස්වී ඇත්තේ පහළ පංතිවල සිට ඉහළ පන්තිවලට යන විට ක්‍රමයෙන් සංකීර්ණ වන ආකාරයටයි. කනිෂ්ඨ ද්විතීක අංශයේදී ගණිත සංකල්ප නිසි පරිදි සංජානනය නොවීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ ද්විතීක අංශයේදී ගණිතය අපහසු විෂයක් බවට පත් වී ඇත. මෙම තත්ත්වය යටතේ ඉගැන්වීම් ආධාරක නොමැතිව ගණිතය ඉගැන්වීම මගින් ගණිත සංකල්ප සංජානනය හා ඉගැන්වීම් ආධාරක සහිතව ගණිතය ඉගැන්වීම මගින් ගණිත සංකල්ප සංජානනය අතර වෙනසක් තිබේද යන්න අධ්‍යයනය කිරීම මූලික අරමුණ විය. හත ශ්‍රේණිය සිසුන්ට ගණිත සංකල්ප හොඳින් සංජානනය කිරීමට ආධාරක භාවිතයෙන් ඉගැන්වීම කොතරම් ඵලදායි වන්නේද, ආධාරක භාවිතයෙන් තොරව ඉගැන්වීමෙන් පසු සිසුන්ගේ සාධන මට්ටම කෙසේද, ගණිත සංකල්ප සංජානනය සඳහා සුදුසු ආධාරක මොනවාද, තෝරා ගත් ඉගෙනුම් ආධාරක භාවිත කොට ඉගැන්වීම මගින් කොතරම් දුරට ගණිත සංකල්ප සංජානනය වනවාද, යනාදිය සෙසු අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මිශ්‍ර ක්‍රමවේදය භාවිතයෙන් සිදුකළ මෙම පර්යේෂණය සඳහා ගම්පොළ අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසලක හත ශ්‍රේණියේ සිසුන් 28 දෙනෙකු අරමුණු සහගත නියැදිය යටතේ තෝරා ගෙන අදාළ පාර්ශ්ව වෙතින් අවසර ලබාගෙන දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්න පත්‍ර ,ප්‍රශ්නාවලී යනාදිය යොදාගත් අතර මෙලෙස රැස් කරගත් දත්ත විස්තරාත්මක සංඛ්‍යානය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදි. එමගින් ආධාරක භාවිත නොකර ඉගැන්වූ කණ්ඩායමට වඩා ආධාරක භාවිත කර ඉගැන්වූ කණ්ඩායම වැඩි සාධන මට්ටමක් පෙන්වා තිබීම (පසු පර්යේෂණයේදී පරීක්ෂණාත්මක කණ්ඩායම් විසින් ලබාගත් ලකුණුවල මධ්‍යයනය 30.6 ක් වූ අතර පාලක කණ්ඩායම විසින් ලබාගත් ලකුණුවල මධ්‍යයනය 23 කි), ආධාරක භාවිතයෙන් ඉගැන්වීම සංකල්ප සංජානනයට ඉතා ඵලදායි වන බවත්, ගැටලු විසඳීමට උපකාරී වන ආකාරයේ ඉගෙනුම් ආධාරක ගණිතය ඉගැන්වීමට සුදුසු බවත් යනාදී කරුණු අනාවරණය විය. මෙම පර්යේෂණයේදී කාලය ප්‍රමාණවත් නොවීම හා ළඟා වීමේ අපහසුව යන ගැටලු හේතුවෙන් එක් පාසලක් පමණක් තෝරා ගන්නා ලදි. කණිෂ්ඨ ද්විතියික අංශයේ සිසුන්ට ගණිත සංකල්ප සංජානනය සඳහා ආධාරක භාවිතයෙන් ඉගැන්වීම ඵලදායි වන බව මෙම පර්යේෂණය අවසානයේ නිගමනය කළ හැකි විය. එබැවින් ගුරුවරුන් කනිෂ්ඨ ද්විතීක අංශයේදී සිසුන්ට ගණිත සංකල්ප සංජානනය සඳහා සුදුසු ආධාරක භාවිත කර ඉගැන්වීම වඩාත් වැදගත් වන බව යෝජනා කළ හැක.

ප්‍රමුඛ පදඃ ඉගෙනුම් ආධාරක, ගණිත සංකල්ප, සංජානනය

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංග ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

භූගෝල විද්‍යාව විෂයෙහි සිතියම් ලකුණු කිරීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් උපක්‍රම භාවිතයේ සඵලතාව පිළිබඳ ක්‍රියාමූලික පර්යේෂණයක්

පී.ජී.ඒ.ජේ. චතුරිකා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20111@arts.pdn.ac.lk

නූතන අධ්‍යාපනික ප්‍රවේශවල භූගෝල විද්‍යාව විෂය ඉගැන්වීමෙන් සිසුන්ගේ අවකාශීය සංජානනය සහ සිතියම්කරණ සාක්ෂරතාව වර්ධනය කිරීම ප්‍රධාන අරමුණකි. සිසුවෙකු සිතියමක් ග්‍රහණය කරගැනීම සහ එහි ස්ථාන නිවැරදිව ලකුණු කිරීම හුදෙක් යාන්ත්‍රික මතකයෙන් ඔබ්බට ගිය, අවකාශීය සබඳතා මනසින් ප්‍රතිනිර්මාණය කිරීමේ උසස් සංජානන ක්‍රියාවලියකි. අර්ථාන්විත ඉගෙනුම් ඵල ළඟා කර ගැනීමට ක්‍රියාකාරකම් පාදක උපක්‍රම අත්‍යවශ්‍ය මෙවලමක් ලෙස පිළිගත්තද, කණිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියේ සිතියම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රායෝගිකත්වයෙන් බැහැරව මතකයෙන් ලකුණු කිරීමේ සාම්ප්‍රදායික රාමුවකට පමණක් සීමා වී පවතින බව ගුරු පුහුණු පාසලේදී මා හට නිරීක්ෂණය විය. එබැවින් 8 ශ්‍රේණියේ සිසුන් සිතියම් ලකුණු කිරීමේදී මුහුණ දෙන ප්‍රායෝගික දුෂ්කරතා මඟහරවා, ඔවුන්ගේ සිතියම් නිපුණතාව හා නිරවද්‍යතාව වර්ධනය උදෙසා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් උපක්‍රම භාවිතයේ සඵලතාව ගවේෂණය කිරීම මෙම ක්‍රියාමූලික පර්යේෂණයේ අරමුණයි. මෙහිදී සාම්ප්‍රදායික ක්‍රමවේදවලින් මිදී සිසුන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වය, සිතියම් ඉගෙනීමේදී සුදුසු උපායමාර්ග තෝරාගැනීම සහ අවකාශීය චින්තනය උත්තේජනය කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් භාවිත කෙරිණි. ඒ අනුව ආධාරක භාවිතය, සිතියම් ප්‍රහේලිකා, ත්‍රිමාණ ආකෘති, කෙටි ක්‍රම ඉගැන්වීම, ට්‍රේසිං පේපර් භාවිතය, කණ්ඩායම් ක්‍රියාකාරකම්, දෘශ්‍යාධාරක සහ තාක්ෂණික මෙවලම් භාවිතය ආදී ක්‍රම භාවිත කරන ලදි. මේ සඳහා ක්‍රියාමූලික පර්යේෂණ ක්‍රමවේදය යටතේ මිශ්‍ර පර්යේෂණ පිරිසැලසුමක් සහ මැදිහත් වීමේ චක්‍ර ත්‍රිත්වයක් යොදාගත් අතර තෝරාගත් පාසලේ 8 ශ්‍රේණියේ සමස්ත ශිෂ්‍ය ගහනය වන සිසුන් දසදෙනා සහ විෂයභාර ගුරුවරයා පහසු නියැදිකරණ ක්‍රමවේදය ඔස්සේ තෝරාගැනිණ.. දත්ත රැස් කිරීමට පූර්ව-අපර සාධන පරීක්ෂණ, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල් යොදාගත් අතර එම දත්ත ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණය කිරීම මඟින් අනාවරණය වූයේ මෙම උපක්‍රම ක්‍රියාත්මක කිරීමෙන් පසු භූගෝල විද්‍යාව විෂය සඳහා සිසුන්ගේ විෂය කැමැත්ත, සිතියම් ලකුණු කිරීමේ සාර්ථකත්වය සහ අවකාශීය හැකියා ප්‍රමාණාත්මක ලෙස වර්ධනය වූ බවයි. ඒ අනුව භූගෝල විද්‍යාව වැනි විෂයක සිතියම්කරණය ඉගැන්වීමේදී සිසුන්ට මතකය සහ නිරවද්‍යතාව වැඩිදියුණු කිරීමට ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් උපක්‍රම සාර්ථකව භාවිත කළ හැකි බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය. එබැවින් භූගෝල විද්‍යාව විෂය සඳහා වන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරු-සිසු සක්‍රීය භූමිකාව ප්‍රායෝගිකව ක්‍රියාවට නංවමින් සිතියම් ලකුණු කිරීම සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් උපක්‍රම සැලසුම්කර ක්‍රියාත්මක කිරීම වඩාත් යෝග්‍ය වන බව යෝජනා කළ හැකිය.

ප්‍රමුඛ පද: භූගෝල විද්‍යාව, සිතියම් ලකුණු කිරීමේ කුසලතා, ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණි විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණිවල සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන විෂයමාලාව ප්‍රායෝගික ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

කේ. පී. පී දනන්ජනී
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20115@arts.pdn.ac.lk

සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය යනු, සිසුවෙකුගේ කායික, මානසික සහ සාමාජීය යහපැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය විෂය පථයකි. එහිදී න්‍යායාත්මක දැනුමට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකම් මූලික වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කනිෂ්ඨ ද්විතීක ශ්‍රේණි සඳහා පවතින සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන විෂය නිර්දේශයේ ඇතුළත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාසල් පද්ධතිය තුළ සැබෑ ලෙසට ක්‍රියාත්මක වන ආකාරය සහ ඒ ආශ්‍රිත ගැටලු විමර්ශනය කිරීමයි. මේ යටතේ විෂයෙහි අන්තර්ගත ප්‍රායෝගික ක්‍රියාකාරකම් හඳුනාගැනීම, ගුරුවරුන්ගේ උගන්වන උපක්‍රම හා රුචිකත්වය, සිසුන්ගේ සහභාගීත්වය හා උනන්දුව මෙන්ම පවතින අභියෝග හඳුනාගැනීම මෙම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වේ .මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදු කළ මෙම අධ්‍යයනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ එක් පාසලක් තෝරා ගනිමින් ගුරුවරුන් තුන්දෙනෙකු හා ළමුන් හතළිස් දෙනෙකු යොදා ගනිමින් සාරම්මන නියැදිකරණය යටතේ දත්ත රැස් කරන ලදි. ඒ සඳහා ගුරුවරුන් ඉලක්ක කර ගනිමින් සම්මුඛ සාකච්ඡා සහ සිසුන් සඳහා 1-5 පරිමාණයේ ලිකර්ට් ප්‍රශ්නාවලි, ප්‍රායෝගික කොටස් උගන්වන ආකාරය විමර්ශනය කිරීම සඳහා නිරීක්ෂණ පත්‍රිකාවක් ද, පවතින සම්පත් විමර්ශනය කිරීම සඳහා සැසඳුම් පත්‍රිකාවක් ද භාවිත කළ අතර එමගින් ලැබෙන දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක දත්ත excel මෘදුකාංග යටතේ ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේ ද, දත්ත විශ්ලේෂණය සිදුකරන ලදි. පර්යේෂණයේ සොයාගැනීම්වලින් පෙනී යන්නේ එම පාසලේ න්‍යායාත්මක කොටස් සහ ප්‍රායෝගික කොටස් ඉගැන්වීම සඳහා වෙන් වෙන් වශයෙන් ගුරුවරු සිටින බවත් එහිදී ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේ දී, සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමවේදවලින් මිදී නවීන ක්‍රියාකාරී ඉගැන්වීමේ ක්‍රමවේද යොදාගැනීම මගින් සිසුන්ගේ රුචිකත්වය වැඩිදියුණු කළ හැකි බවත් ක්‍රියාකාරකම් පදනම් කරගත් සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීමේ ක්‍රම සිසුන්ගේ උනන්දුව සහ සහභාගීත්වය වැඩි දියුණු කරන බවත් ය. මේ සඳහා පවතින බාධා ලෙස ක්‍රීඩා උපකරණ හිඟකම, කාලච්ඡේදයේ පවතින වේලාව සීමිත වීම, ශාරීරික අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් ප්‍රමුඛතාවක් නොලැබීම යන සාධක හඳුනා ගත හැකි විය. අවසාන වශයෙන් මෙම අධ්‍යයනය මගින් ශාරීරික අධ්‍යාපනයේ පවතින වැදගත්කම අවධාරණය කිරීම, එයට පවතින කාලච්ඡේද ප්‍රමාණය වැඩි කිරීම සහ ප්‍රායෝගික කොටස් සඳහා විභාග ඇතුළත වෙනම ම ලකුණු ප්‍රමාණයක් වෙන් කිරීම යනාදී නිර්දේශ ඉදිරිපත් කළ හැකි ය.

ප්‍රමුඛ පද : ශාරීරික අධ්‍යාපන විෂයමාලාව, ප්‍රායෝගික ක්‍රියාකාරකම්

මෙම අධ්‍යනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

06 ශ්‍රේණිය සිසුන්ගේ සිංහල භාෂා අක්ෂර වින්‍යාස දෝෂ මඟහරවා ගැනීම සඳහා සිදු කරනු ලබන ක්‍රියාමූල පර්යේෂණයක්

එච්.කේ.ජී.එම් ද සිල්වා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20127@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතියෙහි 06 ශ්‍රේණියට ප්‍රවේශ වන සිසුන් මුහුණ දෙන ප්‍රධානතම භාෂාමය ගැටලුවක් වන්නේ සිංහල භාෂා අක්ෂර වින්‍යාස රීති නිවැරදිව භාවිත කිරීමට නොදැනීමයි. ප්‍රාථමික අධ්‍යාපනයේ සිට කනිෂ්ඨ ද්විතීයික මට්ටමට පැමිණීමේදී සිදුවන මෙම අක්ෂර වින්‍යාස දෝෂ (විශේෂයෙන් ණ , න , ළ , ල භේදය, ශ ,ෂ, ස අක්ෂර භාවිතය) සිසුන්ගේ ඉදිරි ලේඛන කුසලතා, අධ්‍යයන කාර්ය සාධනය සහ සමස්ත භාෂා ප්‍රවීණතාව කෙරෙහි ඍණාත්මක ලෙස බලපායි. ශ්‍රී ලාංකේය පන්ති කාමර සන්දර්භය තුළ සිසුන්ගේ අක්ෂර වින්‍යාස දෝෂ හඳුනාගෙන ඒවාට ප්‍රායෝගිකව පිළියම් කිරීම සඳහා ගුරුවරයා කේන්ද්‍ර කරගත් ක්‍රියාමූල පර්යේෂණ මැදිහත් වීම් අවම මට්ටමක පවතී. එබැවින් මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක 06 ශ්‍රේණියේ සිසුන්ගේ සිංහල භාෂා අක්ෂර වින්‍යාස දෝෂ මට්ටම පරීක්ෂා කිරීම, එම දෝෂ අවම කිරීම සඳහා සුදුසු ප්‍රායෝගික උපක්‍රම හඳුන්වා දීම සහ එම උපක්‍රමවල ඵලදායීතාව සොයා බැලීම අරමුණු කර ගනිමින් මෙම ක්‍රියාමූල පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියාමූල පර්යේෂණ සැලැස්ම භාවිත කරන ලදි. ඒ අනුව සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ ප්‍රත්‍යාවේක්ෂණය කිරීම යන ප්‍රධාන පියවර හතර ඇතුළත් සර්පිලාකාර මැදිහත් වීම් චක්‍ර හතරක් ඔස්සේ පර්යේෂණය ක්‍රියාත්මක විය. මෙහිදී 06 ශ්‍රේණියේ සිසුන් අතරින් ඉහළම අක්ෂර වින්‍යාස දෝෂ පෙන්වූ සිසුන් සිව්දෙනෙක් (04) මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදි. සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂාව, ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, භාවිතයෙන් දත්ත රැස් කරන ලදි. දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මකව සිදු කෙරිණි. පර්යේෂණය අවසානයේදී සිසුන්ගේ අක්ෂර වින්‍යාස දෝෂ සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස ශබ්ද උච්චාරණයේ පවතින දුර්වලතා, නිවැරදි කියවීමේ පුරුද්දක් නොමැතිකම, අවධානය නොමැතිකම සහ අකුරුවල හැඩරුව පටලවා ගැනීම හඳුනා ගන්නා ලදි. පර්යේෂණ මැදිහත් වීම් ලෙස භාවිත කළ Spelling Fishing Game, රහස් පරීක්ෂක ක්‍රීඩාව, Spelling Snakes Ladders , Spelling Kahoot Quiz ක්‍රම සිසුන්ගේ අක්ෂර වින්‍යාස දෝෂ අවම කිරීම සඳහා ප්‍රායෝගිකව සාර්ථක උපක්‍රම බව නිගමනය කළ හැකි විය. පාසලක සිංහල විෂය භාර ගුරුවරයා පමණක් නොව, විද්‍යාව, ඉතිහාසය වැනි සෙසු විෂයයන් උගන්වනු ලබන සෑම ගුරුවරයෙකුම තමන්ගේ පන්ති කාමරයේදී සිසුන් ලියන ලේඛන රටා පිළිබඳව විමසිලිමත් වෙමින්, ඔවුන්ගේ අක්ෂර වින්‍යාසය නිවැරදි කිරීමට ආකල්පමය මැදිහත් වීමක් සිදු කරන්නේ නම් එය වඩාත් ඵලදායී වන බව මෙම පර්යේෂණය මඟින් අවධාරණය කෙරේ. ඒ අනුව කලාප හෝ කොට්ඨාස මට්ටමින් සමස්ත ගුරුවරුන් උදෙසා මෙවැනි පන්ති කාමර මට්ටමේ ක්‍රියාමූල පර්යේෂණ සිදු කිරීම පිළිබඳව ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සහ වැඩමුළු අධ්‍යාපන බලධාරීන් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මෙම අධ්‍යයනය මඟින් දැඩිව යෝජනා කරනු ලබයි.

ප්‍රමුඛ පද: අක්ෂර වින්‍යාස දෝෂ, 06 ශ්‍රේණිය, සිංහල භාෂාව

මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා පී.ආර්.කේ.ඒ. විතාරණගෙන් ලැබුණු උපදෙස් සහ අධීක්ෂණය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා ද්විත්වයක් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසලකට හඳුන්වාදීම සහ සංවර්ධනය කිරීම

එච්.පී. ධනංජය
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20135@arts.pdn.ac.lk

දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයේ වැදගත් අංගයක් වන අතර, ඒවා සමාජීය සබඳතා වර්ධනය කිරීම, කණ්ඩායම් හැඟීම ඇති කිරීම, නායකත්ව කුසලතා වර්ධනය කිරීම සහ දරුවන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබා දෙයි. එහෙත් වර්තමානයේ තාක්ෂණික දියුණුව, විදේශීය ක්‍රීඩා හා තාක්ෂණික ක්‍රීඩා ක්‍රම ජනප්‍රිය වීම හේතුවෙන් දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා පිළිබඳ දැනුම සහ භාවිතය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. මේ නිසා අනාගත පරපුරට මෙම වටිනා සංස්කෘතික උරුමය අහිමි වීමේ අවදානමක් පවතී. මෙම පසුබිම තුළ දේශීය ක්‍රීඩා පාසල් පද්ධතිය තුළ නැවත ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය ඉතා වැදගත් වී ඇත. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය පාසලකට දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා වන තාච්චි හා නෙරෙංචි හඳුන්වාදීම සහ ඒවා සංවර්ධනය කිරීමෙන් සිසුන්ගේ ශාරීරික, සමාජීය සහ සංස්කෘතික වර්ධනයට ඇති බලපෑම අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ අභිසාරී පිරිසැලසුම භාවිත කරන ලද අතර, සාරම්මන නියැදිකරණ ක්‍රමය යටතේ පර්යේෂණ නියැදිය ලෙස ග්‍රාමීය පාසලකින් තෝරාගත් සිසුන් 20 දෙනෙකු යොදාගන්නා ලදි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ක්‍රම භාවිත කරන ලද අතර, ප්‍රාථමික දත්ත නිරීක්ෂණ, ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ අනියම් සම්මුඛ සාකච්ඡා මගින් රැස් කරන ලදි. එසේ රැස් කරන ලද ප්‍රමාණාත්මක දත්ත Microsoft Excel මෘදුකාංගය භාවිත කරමින් විස්තරාත්මක සංඛ්‍යාත්මක ක්‍රම වන සංඛ්‍යාත, ප්‍රතිශත සහ මධ්‍යන්‍යය අගය යොදාගෙන විශ්ලේෂණය කරන ලද අතර, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය මගින් විග්‍රහ කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව තාච්චි හා නෙරෙංචි ක්‍රීඩා හඳුන්වාදීමෙන් පසුව සිසුන්ගේ සහභාගීත්වය හා උද්යෝගය 90%ක් ඉහළ ගොස් ඇති අතර, සිසුන්ගෙන් 85%ක් ශාරීරික ක්‍රියාකාරකම්වල වැඩි සක්‍රීයතාවක් පෙන්වූ අතර 78%ක් කණ්ඩායම් ක්‍රීඩා තුළ සහයෝගී හැසිරීම් වර්ධනය වූ බවද, 80%ක් සාම්ප්‍රදායික ක්‍රීඩා පිළිබඳ ධනාත්මක ආකල්පයක් පෙන්වූ බවද අනාවරණය විය. එමෙන්ම මෙම ක්‍රීඩා ඔස්සේ සිසුන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වය, සන්නිවේදන කුසලතා සහ සංස්කෘතික අවබෝධය ද වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය. එබැවින් සාම්ප්‍රදායික ක්‍රීඩා විෂය මාලාවට ඒකාබද්ධ කිරීම මගින් සිසුන්ගේ පූර්ණ වර්ධනය ප්‍රවර්ධනය කළ හැකි අතර දේශීය සංස්කෘතික උරුමය රැකගැනීමටද වැදගත් දායකත්වයක් ලබා දිය හැකි බව මෙම පර්යේෂණයෙන් නිගමනය කරයි. තවද මෙම පර්යේෂණය සිදු කිරීමේදී, දත්ත රැස් කිරීම සඳහා පාසල් දෙකක් තෝරා ගත් නමුත් පැවති කාල වේලාව සීමා වීම, පාසල් නිවාඩු හා විභාග කටයුතු, අයහපත් කාලගුණ තත්ත්ව වැනි ගැටලු හා අභියෝග ද මතු විය.

ප්‍රමුඛ පද : ග්‍රාමීය පාසල්, තාච්චි, දේශීය සාම්ප්‍රදායික ක්‍රීඩා, නෙරෙංචි

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දහවන ශ්‍රේණියේ ඉතිහාසය විෂය මාලාවේ අපේක්ෂිත නිපුණතා සාධනය කෙරෙහි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රායෝගික උපයෝගීතාවය පිළිබඳ අධ්‍යයනයක්

එම්.එස්.අයි. ධර්මදාස
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20137@arts.pdn.ac.lk

සමකාලීන ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතිය නිපුණතා පාදක ප්‍රවේශයක් මත ක්‍රියාත්මක වන අතර, ඉතිහාසය විෂය මාලාව ද ඒ අනුව ප්‍රතිසංස්කරණය වී ඇත. මෙම මූලික නිපුණතා සාධනය කර ගැනීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂා කෙරේ. එබැවින් මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටලුව වූයේ දහවන ශ්‍රේණියේ ඉතිහාසය විෂය මාලාවට අදාළ නිපුණතා සාධනය සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රායෝගික උපයෝගීතාවය කවරාකාර ද යන්නය. ඒ අනුව දහවන ශ්‍රේණියේ ඉතිහාස විෂය මාලාවෙන් අපේක්ෂිත නිපුණතා සාධනයට යොදා ගන්නා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථකභාවය හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණ විය. දහවන ශ්‍රේණියේ පළමු පාඩම් පහට පමණක් අයත් නිපුණතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාධනය වීම අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන පර්යේෂණ සීමාව වූවේය. මෙහිදී මිශ්‍ර පර්යේෂණ ප්‍රවේශය යටතේ අභිසාරී සමාන්තර පිරිසැලසුම යොදා ගන්නා ලදි. මහනුවර හිඳගල සීවලී විද්‍යාලයේ දහවන ශ්‍රේණියේ සිසුන් 26 දෙනෙකු (n=26) සහ විෂයභාර ගුරුවරුන් දෙදෙනෙකු ඇතුළත් අරමුණු සහගත නියැදියක් මෙහිදී තෝරා ගැනිණි. නිපුණතා ආවරණය වන පරිදි සකස් කළ ප්‍රශ්න පත්‍රයක් මඟින් ප්‍රමාණාත්මක දත්තද, සමාජ නිර්මාණාත්මකවාදී ප්‍රවේශය මත පදනම් වූ සම්මුඛ සාකච්ඡා, පන්තිකාමර නිරීක්ෂණ සහ ලේඛන විශ්ලේෂණය මඟින් ගුණාත්මක දත්තද රැස් කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණයට අනුව අපේක්ෂිත නිපුණතා සිසුන් විසින් සාධනය කරගැනීමේ මට්ටම 65%ක සාමාන්‍ය අගයක් ගත්තේය. ගුණාත්මක දත්ත තේමාත්මකව විශ්ලේෂණය කිරීමෙන් අනාවරණය වූයේ විෂය නිර්දේශයේ ඇති පුළුල් බව නිසා සිසුන්ට කරුණු ධාරණය කරගැනීමේ අපහසුතාව, ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා අවම වීම නිසා ශිෂ්‍ය සහභාගිත්වය උදාසීන වීම යනාදියයි. එමෙන්ම විෂය කොටස් ආවරණය කිරීමට කාලය සීමිත වීම, පන්තිකාමරය තුළ ඉහළ ගුරු කේන්ද්‍රීය ස්වභාවයක් පැවතීම හේතුවෙන් ගුරුවරයාගේ සුසාධ්‍යකාරක භූමිකාව බිඳ වැටීම ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රධාන දුබලතා විය. මෙම දුබලතා මඟහරවා ගෙන නිපුණතා පාදක අධ්‍යාපනයේ විවෘත අපේක්ෂාව සාක්ෂාත් කර ගැනීමට නම් පන්තිකාමරය තුළ ප්‍රායෝගික හා ශිෂ්‍ය-කේන්ද්‍රීය ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීම, සිසුන්ගේ විවිධත්වයට ගැළපෙන පරිදි ඉගෙනුම් ක්‍රියාවලිය හැඩගැස්වීම, උසස් තත්ත්වයේ ඉගෙනුම් ආධාරක බහුලව භාවිත කිරීම, සෑම පාඩම් ඒකකයක් අවසානයේදීම අපේක්ෂිත නිපුණතාව තක්සේරුව හා ඇගයීම විධිමත්ව සිදු කිරීම මෙම අධ්‍යයනයෙහි ප්‍රධාන නිගමන විය.

ප්‍රමුඛ පද: ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රායෝගික උපයෝගීතාවය, ඉතිහාසය විෂය මාලාව, නිපුණතා සාධනය, මිශ්‍ර පර්යේෂණය, සමාජ නිර්මාණාත්මකවාදය

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පෙරදිග සංගීතය විෂයමාලාවේ ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග හා ශිෂ්‍ය සාධනය පිළිබඳ අධ්‍යයනයක්

එම්. පී. එස්. දිලක්ෂි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20140@arts.pdn.ac.lk

පෙරදිග සංගීතය යනු හුදෙක් විනෝදාස්වාදය ඉක්මවා ගිය ගැඹුරු ශිල්පීය ක්‍රමවේද සහිත විෂය පථයකි. න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂය කොටස්වලින් යුක්ත වන මෙම විෂයමාලාවෙහි ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික අංශයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. වර්තමාන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි මෙම ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරු විවිධ අභියෝගවලට මුහුණ දෙති. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ පෙරදිග සංගීතය විෂයමාලාවේ ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග හඳුනා ගැනීම සහ එම අභියෝග ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස්වල ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කිරීමය. සෙසු අරමුණු වූයේ ශාස්ත්‍රීය ගායන ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග හඳුනා ගැනීම, පාසල් තුළ ශාස්ත්‍රීය ගායන ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා පවතින භෞතික සම්පත් සහ යටිතල පහසුකම්වල ප්‍රමාණවත් බව ඇගයීමට ලක් කිරීම, ශාස්ත්‍රීය ගායන ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝගවලට මුහුණ දීම සඳහා ගුරුවරුන් දැනට භාවිත කරන උපායමාර්ග ඇගයීමට ලක් කිරීම සහ ශාස්ත්‍රීය ගායන ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග, ශාස්ත්‍රීය ගායන ප්‍රායෝගික පරීක්ෂණවල ශිෂ්‍ය සාධනය කෙරෙහි බලපා ඇති ආකාරය විශ්ලේෂණය කිරීම යනාදියයි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ ගවේෂණාත්මක අනුක්‍රමික පිරිසැලසුම භාවිත කර, අධ්‍යයනය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් 1AB වර්ගයේ පාසලක පෙරදිග සංගීත ගුරුවරුන් දෙදෙනෙකු හා 10,11 ශ්‍රේණි සිසුන් විසි දෙනෙකු ඇතුළත් විසි දෙකකින් යුත් (n=22) නියැදියක් පහසු නියැදිකරණය යටතේ තෝරා ගන්නා ලදි. පර්යේෂණ උපකරණ ලෙස පෙරදිග සංගීත ගුරුවරුන් සඳහා සම්මුඛ සාකච්ඡාවක්, ප්‍රායෝගික පන්තිකාමරයක් නිරීක්ෂණය සඳහා නිරීක්ෂණ පත්‍රිකාවක් සහ පවතින භෞතික සම්පත් පිළිබඳ සොයා බැලීමට සැසඳුම් ලැයිස්තුවක් භාවිත කරන ලදි. මෙහිදී ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය මගින්ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විග්‍රහය මඟින්ද විශ්ලේෂණය කරන ලදි. එමගින් පෙරදිග සංගීතය විෂයමාලාවේ ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් මුහුණපාන අභියෝග හා ශාස්ත්‍රීය ගායනයේ ප්‍රායෝගික කොටස්වල විෂය සාධනය අතර ධන සහසම්බන්ධතාවයක් පවතින බව නිගමනය කරන ලදි. මෙම අධ්‍යයනය මඟින් අනාවරණය වූයේ සීමිත කාලය, ප්‍රායෝගික පරීක්ෂණ සඳහා ශිෂ්‍ය සහභාගිත්වය අවම වීම හා භෞතික සම්පත් හිඟකම යනාදිය ගුරුවරුන් මුහුණ දෙන ප්‍රධානතම අභියෝග වන අතර ඒවා සිසුන්ගේ ශාස්ත්‍රීය ගායනයේ සාධන මට්ටම් පහළ යාමට සෘජුවම බලපාන බවයි.

ප්‍රමුඛ පද : ශාස්ත්‍රීය ගායනය

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය භාවිතයෙන් 06 ශ්‍රේණියේ සිසුන්ගේ පුරවැසි අධ්‍යාපන විෂය සාධනය වර්ධනය පිළිබඳ ක්‍රියාමූල පර්යේෂණයක්

එච්. එස්. දිල්රුක්ෂි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20144@arts.pdn.ac.lk

පුරවැසි අධ්‍යාපනය යනු සිසුන් වගකීම් සහගත, ප්‍රජාතන්ත්‍රවාදී පුද්ගලයන් ලෙස සමාජගත කරන ප්‍රධාන විෂයයකි. වර්තමානයේ බහුලව භාවිත වන ගුරු කේන්ද්‍රීය දේශන ක්‍රමවේදය හමුවේ ශිෂ්‍යයා හුදෙක් සටහන් ලබා ගන්නා විෂය සාධනය ඉතා අවම නිශ්ක්‍රීය පාර්ශ්වයක් බවට පත්ව ඇත. පර්යේෂකයාගේ ගුරු පුහුණු කාලයෙහි 06 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය ඉගැන්වීමේදී හඳුනාගත් මෙම ගැටලුවට පිළියමක් ලෙස ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය භාවිතයෙන් පුරවැසි අධ්‍යාපනය විෂය ධාරාව සඳහා සිසුන්ගේ විෂය සාධනය වර්ධනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණ වූයේ 06 ශ්‍රේණියේ සිසුන්ගේ පුරවැසි අධ්‍යාපන විෂය සාධනයේ වත්මන් තත්ත්වය හඳුනා ගැනීම, විෂය සාධනය වර්ධනය කිරීමට ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේද සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, එම ක්‍රමවේද භාවිතයෙන් පසු සිසුන්ගේ විෂය සාධනයේ වෙනස්කම් ඇගයීමයි. සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යාවේක්ෂණය යන ප්‍රධාන පියවර 04 ඇතුළත් මැදිහත්වීම් චක්‍ර දෙකකින් යුත් ක්‍රියාමූල පර්යේෂණ ක්‍රමවේදය භාවිත කෙරිණි. පර්යේෂණ නියැදිය ලෙස මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ ගුරු පුහුණුව ලද පාසලේ පළමු වාර විභාගයේ පුරවැසි අධ්‍යාපනය සඳහා ලකුණු 50ට අඩු මට්ටමක සිටි 06 ශ්‍රේණියේ සිසුන් 10 දෙනෙකු අරමුණු සහගත නියැදිකරණය යටතේ තෝරාගන්නා ලදි. දත්ත රැස් කිරීම සඳහා පූර්ව හා අපර පරීක්ෂණ, ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල භාවිත කළ අතර දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක හා ගුණාත්මකව සිදු කෙරිණි. පළමු මැදිහත්වීම ක්‍රියාකාරකම් දෙකක් යටතේ ක්‍රියාත්මක කළ අතර එමගින් සිසුන්ට පුරවැසි අධ්‍යාපනය විෂයට කැමැත්තක් ඇති කිරීම අපේක්ෂා කරන ලදි. මේ සඳහා ක්‍රීඩා පාදක ඉගෙනුම් සහ සංගීතාත්මක ඉගෙනුම් ප්‍රවේශ යොදා ගන්නා ලදි. පළමු මැදිහත් වීමෙන් පසුව මැදිහත් වීමේ සාර්ථකත්වය පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ පත්‍ර, සම්මුඛ සාකච්ඡා භාවිත කෙරිණි. පළමු මැදිහත් වීමෙන් පසුව සිසුන්ගේ විෂය සාධනයේ සුළු වර්ධනයක් පෙන්නුම් කළද ඒ තත්ත්වය කවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා දෙවන මැදිහත් වීමක් සිදු කරනු ලැබීය. දෙවන මැදිහත් වීම ක්‍රියාකාරකම් තුනක් යටතේ ක්‍රියාත්මක කළ අතර එහිදී භූමිකා රංගන, තාක්ෂණික අන්තර් ක්‍රියාකාරී ඇගයුම්, සංකල්ප සිතියම් භාවිත කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵලවලට අනුව අනාවරණය වූයේ ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේද භාවිතයෙන් සිසුන්ගේ පුරවැසි අධ්‍යාපන විෂය කෙරෙහි ඇති උනන්දුව සහ විෂය සාධනයේ සැලකිය යුතු ධනාත්මක වර්ධනයක් ඇති කළ හැකි බවයි.

ප්‍රමුඛ පද: ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදය, පුරවැසි අධ්‍යාපනය, විෂය සාධනය

මෙම අධ්‍යයනය සඳහා විශාකා ලිදකුඹුරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වතු ආශ්‍රිත දරුවන් හට විධිමත් අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථා පිළිබඳ අධ්‍යයනයක්

ඒ.ඩී.පී. දිනුෂිකා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20151@arts.pdn.ac.lk

සම අධ්‍යාපන අවස්ථා ඇතිකිරීම කාලීන අවශ්‍යතාවයකි. ශ්‍රී ලංකාවේ ද බොහෝ කාලයක සිට ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇතත් ඒවා සාර්ථක වීම අවම මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙන්ම එක් ප්‍රදේශයක් තුළද අධ්‍යාපනයේ විෂමතා පවතී. අධ්‍යාපනය අනිවාර්යයෙන් ලැබිය යුතු වුවත් එය අල්ප වශයෙන් ලබන පිරිස් ඇත. මෙවැනි පිරිස් විධිමත් අධ්‍යාපනයෙන් ගිලිහෙන බව අතීතයේ මෙන්ම වර්තමානයේද දැක ගැනීමට හැකිය. මෙවැනි පිරිසක් ලෙසට වතු ආශ්‍රිත පවුල්වල දරුවන් දැක්විය හැකිය. මේ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ නගරයේ ඇල්ලේපොල ග්‍රාමයේ වතු ආශ්‍රිතව තෝරාගත් පවුල් 12ක දරුවන් හට විධිමත් අධ්‍යාපනය ලබා දී ඇති අවස්ථා පිළිබඳව සොයා බැලීම, එම දරුවන්ගේ ජීවන තත්ත්වය විධිමත් අධ්‍යාපනයට බලපාන ආකාරය සොයා බැලීම, එම දරුවන්ට විධිමත් අධ්‍යාපනයට සම්බන්ධ වීමේ ඇති ප්‍රායෝගික දුෂ්කරතා හඳුනා ගැනීම සහ එම දරුවන්ට විධිමත් අධ්‍යාපනයට ඇති දුෂ්කරතා මගහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වේ. ගුණාත්මක ප්‍රවේශය යටතේ බහුවිධ ප්‍රත්‍යක අධ්‍යයන පිරිසැලැස්ම භාවිත කළ අතර සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ හා ලේඛන විශ්ලේෂණය යොදාගනිමින් දත්ත රැස්කර එම දත්ත තේමා විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරන ලදි. මෙහිදී තේමා ලෙස යටිතල පහසුකම්වල හිඟය, ආර්ථික ගැටලු, අධ්‍යාපනය ලැබීමට නිවසේ ඇති බාධක, දරුවන් රැකියාවල නිරතවීම සහ දෙමාපියන් හා දරුවන් සතුව අධ්‍යාපනය කෙරෙහි පවතින ආකල්ප හඳුනා ගැනීමට හැකි විය. මේ අනුව වතු ආශ්‍රිත දරුවන් විධිමත් අධ්‍යාපනයට සම්බන්ධ වීම සැලකූ විට බොහෝ ප්‍රායෝගික දුෂ්කරතාවලට මුහුණ දෙන බව පැහැදිලිය.

ප්‍රමුඛ පද: අධ්‍යාපනයේ විෂමතා, වතු ආශ්‍රිත, විධිමත් අධ්‍යාපනය, සම අධ්‍යාපන අවස්ථා

මෙම අධ්‍යයනය සඳහා පී. ආර්. කේ. ඒ. විතාරණගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

තරගකාරී අධ්‍යාපනය උසස් පෙළ විද්‍යා විෂය හදාරන සිසුන්ගේ මානසික ආතතිය කෙරෙහි බලපාන ආකාරය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම

ඩී.එම්.ඩි.එස්. දිසානායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20152@pdn.ac.lk

මුළු මහත් සමාජයම පෝෂණය වන්නා වූ මූල බීජය වන්නේ අධ්‍යාපනයයි. 1978 විවෘත ආර්ථිකයත් සමඟ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය දැවැන්ත අර්බුදකාරී මෙන්ම තරගකාරී ස්වභාවයක් ගන්නට විය. එය කෙතරම් තරගකාරී වනවාද යත් එය සමාජයේ මුල් බැස ගෙන හමාරය. එම තරගකාරී ස්වභාවයට ගුරුවරුන් දෙමව්පියන් සහ සිසුන් ද අනුවර්තනය වී ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන කඩයිම් විභාගයක් වන අ.පොෙ.ස. උසස් පෙළ විභාගය සිසුන්ගේ ජීවිතය තීරණය කරන තීරණාත්මක විභාගයක් වී ඇත. ඒ අතරිනුත් විද්‍යා විෂය ධාරාවෙහි ප්‍රබල තරගකාරී ස්වභාවයක් දක්නට ලැබේ. මෙම පර්යේෂණය කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ තරගකාරී අධ්‍යාපනය සිසුන්ගේ මානසික අතතිය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය කිරීමයි. එයට අමතරව කාලීන වශයෙන් විසඳුම් යෝජනා කිරීම සුවිශේෂී අරමුණු වේ. මෙම අධ්‍යයනය ප්‍රමාණාත්මක ක්‍රමවේදයේ සමීක්ෂණ පිරිසැලසුම යටතේ ක්‍රියාත්මක කරයි. මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට කෝරළ අධ්‍යාපන කලාපයේ 1AB පාසල් බාලක දෙකක් (50) සහ බාලිකා දෙකක් (50 ඇසුරින් සිසුන් 100ක් ක්‍රමවත් නියැදිකරණය මඟින්ද ගුරුවරුන් විස්සක් සරල සසම්භාවී නියැදීකරණයෙන් තෝරා ගන්නා ලදි. දත්ත රැස්කිරීම ප්‍රශ්නාවලී ඔස්සේ ද දත්ත විශ්ලේෂණය කිරීම අනුමිතික සංඛ්‍යානය, විස්තරාත්මක සංඛ්‍යානය යොදා ගනිමින් එස්පීඑස් ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. තරගකාරී අධ්‍යාපනය සහ මානසික ආතතිය අතර r- 0.9983ක ප්‍රබල ධන සහසම්බන්ධතා සංගුණකයක් පවතින බව කාල් පියර්සන්ගේ සහසම්බන්ධතා සංගුණකයෙන් සොයා ගත් අතර සිසුන්ගේ ආතති මට්ටම පරීක්ෂා කිරීමෙන් 68%ක ආතතියක් ද (perceived stress scale) පිරිමි සිසුන්ට සාපේක්ෂව සිසුවියන්ගේ ආතති මට්ටම සාපේක්ෂව 72%ක් ඉහළ විය. ප්‍රශ්නාවලිය නියමු පරීක්ෂණයකට ලක්කර සමස්ත සිසුන්ට දෙන ලදි. ප්‍රශ්නාවලියෙන් අනාවරණය වූයේ සිසුන්ට මානසික ආතතිය ඇතිවීම සඳහා ගුරුවරුන් සහ දෙමව්පියන්ගේ බලපෑම 72%ක් ද, අමතර පන්ති ප්‍රමාණය 82%ක් ද, ප්‍රමාණවත් නින්දක් නොමැති වීම 62% ක් ද, විභාග පීඩනය 88%ක් ද වන බවයි. ගුරුවරුන්ගේ ප්‍රශ්නාවලිය මගින් අනාවරණය වූයේ විභාග හා ඇගයීම් සම්බන්ධ පීඩනය 60%ක් ඇති බවයි. මෙම ආතතිය අවම කරගැනීම සඳහා අධ්‍යාපනයේ තරගකාරී බව අඩු කිරීම, දෙමාපියන් ගුරුවරුන්ගෙන් වන බලපෑම අඩු කිරීම, විෂය නිර්දේශය යාවත්කාලීන කිරීම උචිත බව යෝජනා කළ හැකිය.

ප්‍රමුඛ පද: ආතති කළමනාකරණය, උසස් පෙළ විද්‍යා සිසුන්, ගුරුවරුන්, තරගකාරී අධ්‍යාපනය, මානසික ආතතිය

මෙම අධ්‍යයනය සඳහා විශාකා ලිඳකුඹුරගෙන් ලැබුණ උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

හත්වන ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපනය විෂය ඉගැන්වීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතය විෂය සාධනයට ඇති කරන බලපෑම

එම්. ඒ. සී. දිව්‍යාංජලී
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20169@arts.pdn.ac.lk

වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශය මගින් ශිෂ්‍යයන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු වී ඇත. එම ප්‍රවේශය අතර කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතය ප්‍රමුඛ ස්ථානයක් ගනී. 7 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපන විෂය ඉගැන්වීම සඳහා කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතය ශිෂ්‍යයන්ගේ විෂය සාධනයට ඇති කරන බලපෑම විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වී ඇත. එමෙන්ම 7 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපන නිල විෂය මාලාවේ ස්වභාවය විමර්ශනය කිරීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් සඳහා සුදුසු පාඩම් හඳුනා ගැනීම, ශිෂ්‍යයන්ගේ රුචිකත්වය අධ්‍යයනය කිරීම සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් හා විෂය සාධනය අතර පවතින සම්බන්ධතාවය හඳුනා ගැනීම ද මෙම පර්යේෂණයේ අරමුණු වී ඇත. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක පර්යේෂණ ප්‍රවේශය ඒකාබද්ධ කළ මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කරන ලදි. පර්යේෂණ නියැදිය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ එක් පාසලක 7 ශ්‍රේණියේ ශිෂ්‍යයන් 25 දෙනෙකු සරල නියැදිකරණ ක්‍රමය මඟින් තෝරා ගන්නා ලදි. ශිෂ්‍යයන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම් පිළිබඳ රුචිකත්වය මැන බැලීම සඳහා ප්‍රශ්නාවලියක් ද, ඉගෙනුම් ක්‍රියාවලියෙහි ඔවුන්ගේ හැසිරීම්, සහභාගීත්වය හා අන්තර්ක්‍රියා නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂණ පත්‍රිකා ද භාවිත කර දත්ත රැස් කර විස්තරාත්මක විශ්ලේෂණය සහ සංඛ්‍යාන විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම උපයෝගී කර ගනිමින් දත්ත විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණ මගින් අනාවරණය වූයේ 7 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපන විෂය කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතය මගින් ඉගැන්වීම ශිෂ්‍යයන්ගේ විෂය සාධනය ඉහළ නැංවීමට හේතුවන බවයි. තවද ශිෂ්‍යයන්ගේ රුචිකත්වය, ඉගෙනුම් සඳහා වූ අභිප්‍රේරණය, පන්තිකාමර සහභාගීත්වය, සන්නිවේදන කුසලතා, නායකත්ව හැකියාව සහ සහයෝගීතා කුසලතාද වර්ධනය වී ඇති බව අනාවරණය විය. එමෙන්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතය හා විෂය සාධනය අතර ධනාත්මක සම්බන්ධතාවයක් පවතින බව ද තහවුරු විය. 7 ශ්‍රේණියේ පුරවැසි අධ්‍යාපන විෂය ඉගැන්වීමේදී කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිතයට ගැනීම ශිෂ්‍යයන්ගේ විෂය සාධනය ඉහළ නැංවීමට මෙන්ම විෂය පිළිබඳ ශිෂ්‍ය රුචිකත්වය හා ශිෂ්‍ය සහභාගිත්වය ඉහළ නැංවීමට හේතු වන බව මෙම අධ්‍යයනය මඟින් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: අභිප්‍රේරණය, විෂය සාධනය

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ උපදේශන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ඊ. එම්. එම්. එල්. බී. ඊරියගම
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20176@arts.pdn.ac.lk

වර්තමාන පාසල් පද්ධතියේ සිසුන් මුහුණ දෙන මානසික ආතතිය, හැසිරීම් ගැටලු හා සමාජීය අභියෝග වැඩිවීම නිසා පාසල් උපදේශන සේවාවේ වැදගත්කම ඉහළ ගොස් ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ පාසල්වල උපදේශන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය, එහි ඵලදායීතාවය හා මුහුණ දෙන ප්‍රායෝගික බාධක පිළිබඳ ගැඹුරු අධ්‍යයන හිඟය. ඒ අනුව මෙම පර්යේෂණය මඟින් ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියෙහි උපදේශන ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය ගංහත මහ විදුහල සහ රණබිම රාජකීය විදුහල ඇසුරු කොටගෙන විස්තරාත්මක පර්යේෂණයක් සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ පාසල් මට්ටමින් උපදේශන ක්‍රියාවලියේ ව්‍යුහය, සම්බන්ධීකරණය, අදාළ පාර්ශවයන්ගේ භූමිකාවන් හා ක්‍රියාත්මක කිරීමේදී පවතින අභියෝග හඳුනා ගැනීමයි. මිශ්‍ර පර්යේෂණ ප්‍රවේශය යටතේ මධ්‍යම පළාතේ ගංහත මහ විදුහල සහ රණබිම රාජකීය විදුහල යන පාසල්වලින් 1 AB හා 1C ශ්‍රේණි රාජ්‍ය පාසල් 2කින් දත්ත රැස් කරන ලදි. අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් පාසල් උපදේශකවරුන් 2 දෙනෙකු හා විදුහල්පතිවරුන් 8 දෙනෙකුගෙන් ද, නාභිගත කණ්ඩායම් සාකච්ඡා මඟින් සිසුන් 24 දෙනෙකුගෙන් ද තොරතුරු ලබා ගන්නා ලදි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා, පාසල් ලොග් සටහන්, පාසල් ලේඛන වාර්තා භාවිත කරන ලදි. 1 AB හා 1C පාසල් ගත්විට 1AB පාසල්වලට සාපේක්ෂව 1C පාසලේ සිසුන් තුළ උපදේශන ගැටලු බහුලව දක්නට ලැබුණි. රණබිම රාජකීය විදුහලේ 9C ශ්‍රේණියේ සිසුන් 20 දෙනෙකුගෙන් යුත් නියදියකින් සිදුකරන ලද නියමු පරීක්ෂාවට අනුව සිසුන් ලබා දුන් නිර්ණාමික තොරතුරු පදනම් කරගෙන 85%කට විවිධ මානසික ගැටලු පවතින බව පැහැදිලි විය. සිසුන් තිදෙනෙක් කිසිම තොරතුරක් සඳහන් නොකෙරිණි. ඔවුන්ගේ බහුතරයට පවතින්නේ අධ්‍යයන පීඩනය, ක්‍රීඩා කිරීමට අවස්ථා අහිමි වීම, නේවාසිකගාරයේ ඇතිවන ගැටලු යනාදියයි. දරිද්‍රතාවය පහසුකම් අවම වීම හේතුවෙන් ඔවුන්ගේ ගැටලු කල්පැවතීම සිදුව තිබුණි. ප්‍රතිඵල අනුව ජාතික පාසල් උපදේශන සේවාව මඟින් මාර්ගෝපදේශ ලබා දුන්නත් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීමේදී උපදේශකවරුන්ගේ පුහුණුව අඩුකම, රහස්‍යභාවය තහවුරු කිරීමට නොහැකි වීම, භෞතික ඉඩකඩ මද බව, විභාග-නැඹුරු අධ්‍යාපන සංස්කෘතිය හා දෙමාපිය/සමාජ පිළිගැනීමේ ඌනතාවය ප්‍රධාන බාධක ලෙස හඳුනා ගන්නා ලදි. එමගින් උපදේශනය "úභාග මූලික වැඩසටහනක්" ලෙස සීමා වී ඇති බව පෙනී ගියේය. නිගමනය ලෙස උපදේශන ක්‍රියාවලිය ඵලදායී කිරීමට උපදේශකවරුන්ගේ අඛණ්ඩ පුහුණුව, පාසල් පරිපාලනයේ කැපවීම, දෙමාපිය දැනුම්වත් කිරීම් හා ප්‍රජා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය බව නිර්දේශ කෙරේ. තවද මෙහිදී පාසල්වල උපදේශන ක්‍රියාවලිය සිදුකිරීමේදි ඇතිවන බාධක, උපදේශනය නිසි අයුරින් සිදු නොවීම හේතුවෙන් සිසුන්ගේ ගැටලු කල් පැවතීම අධ්‍යාපන සාධනය අවම වීම සහ ඔවුන් මානසික අක්‍රමිකතාවට මුහුණදීම යනාදියට විසඳුම් යෝජනා කෙරිණි.

ප්‍රමුඛ පදඃ උපදේශන ක්‍රියාවලිය, පාසල් උපදේශනය, බාධක, ශ්‍රී ලංකාව, සිසු යහපැවැත්ම

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක 6 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන සිසුන් සිදු කරන සිංහල අක්ෂර දෝෂ පිළිබඳ කාර්යමූලික පර්යේෂණයක්

කේ.පී.එම්.කේ.ආර්. ගජනායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20196@arts.pdn.ac.lk

පර්යේෂකයාගේ ගුරු පුහුණු කාලසීමාව සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක කණිෂ්ඨ ද්විතීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ ලිඛිත කාර්යයන් නිරීක්ෂණය කිරීමේදී සිංහල අක්ෂර දෝෂ බහුලව සිදුවන බවත් එය ඔවුන්ගේ ලිවීමේ කුසලතා, භාෂා ප්‍රවීණතාවට අහිතකර බවත් හඳුනා ගන්නා ලදි. මෙම ගැටලුවට විසඳුමක් ලෙස සිසුන්ගේ අක්ෂර දෝෂ හඳුනාගෙන ක්‍රියාකාරකම් මූලික ඉගෙනුම් ක්‍රම භාවිතයෙන් ඒවා අවම කිරීම සඳහා මෙම ක්‍රියාකාරී පර්යේෂණයක් සිදු කරන ලදි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කණිෂ්ඨ ද්විතීය අධ්‍යාපන අවධියට අයත් තෝරාගත් සිසුන්ගේ සිංහල අක්ෂර දෝෂ සහ ඒවායේ බලපෑම හඳුනා ගැනීම, ඒවා ඇති වීමට බලපාන හේතු අධ්‍යයනය කිරීම, ක්‍රියාකාරකම් මූලික ඉගෙනුම් ක්‍රම යටතේ විවිධ ක්‍රියාකාරකම්, නිරීක්ෂණ, ප්‍රත්‍යාවේක්ෂණය මගින් ගැටලුවට විසඳුම් ක්‍රියාත්මක කිරීම සහ යොදාගත් ක්‍රියාමාර්ගවල ඵලදායීතාවය ඇගයීමයි. මෙම පර්යේෂණය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යාවේක්ෂණය යන ක්‍රියාකාරී පර්යේෂණ චක්‍රය අනුගමනය කරමින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා නිරීක්ෂණ, ලිඛිත පර්යේෂණ, ගුණාත්මක දත්ත සඳහා ප්‍රත්‍යාවේක්ෂණ සටහන්, අවිධිමත් සම්මුඛ සාකච්ඡා සහ සිසුන්ගේ ලිඛිත කාර්යයන් විශ්ලේෂණය කරන ලදි. ප්‍රමාණාත්මක දත්ත වගු හා ප්‍රස්තාර මගින් විශ්ලේෂණය කරන ලද අතර, ගුණාත්මක දත්ත විස්තරාත්මක සාරාංශය මගින් අර්ථකථනය කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව සිසුන් අතර ස්වර, ව්‍යංජන, දීර්ඝ-හ්‍රස්ව, විරාම ලකුණු භාවිතය සම්බන්ධ අක්ෂර දෝෂ බහුලව පවතින බව අනාවරණය විය. ක්‍රියාකාරකම් මූලික ඉගෙනුම් ක්‍රමය යටතේ ක්‍රීඩා අක්ෂර ගැලපීමේ අභ්‍යාස, ලිවීමේ පුහුණු, වැඩ පත්‍රිකා, ප්‍රතිපෝෂණ ලබා දීමෙන් අනතුරුව සිසුන්ගේ අක්ෂර දෝෂ සැලකිය යුතු ලෙස අඩු වී නිවැරදි ලිවීමේ කුසලතා භාෂා අවබෝධය සහ ඉගෙනුම් උනන්දුව වර්ධනය වූ බව නිරීක්ෂණය විය. ඒ අනුව කණිෂ්ඨ ද්විතීය අධ්‍යාපනය ලබන සිසුන්ගේ සිංහල අක්ෂර දෝෂ අවම කිරීම සඳහා ක්‍රියාකාරකම් මූලික ඉගෙනුම ඉතා ඵලදායී බව නිගමනය කරන අතර සිංහල භාෂා ගුරුවරුන්ගේ දෛනික ඉගැන්වීම් ක්‍රියාවලියට ඒකාබද්ධ කළ යුතු බව නිර්දේශ කළ හැකිය.

ප්‍රමුඛ පද: කණිෂ්ඨ ද්විතීය අධ්‍යාපනය, මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය, සිංහල අක්ෂර දෝෂ

මෙම පර්යේෂණය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ප්‍රාථමික සිසුන්ගේ බෙදීමේ ගණිත කර්මය ආශ්‍රිත කුසලතා සාධනය සඳහා ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්.එම්.එච්.එන් ගුණතිලක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20206@arts.pdn,ac.lk

ප්‍රාථමික ගණිත ඉගෙනුම් ක්‍රියාවලියේදී බෙදීමේ සංකල්පය දරුවාගේ තර්කන ශක්තිය පියවරෙන් පියවර ගොඩනැඟිය යුතු මූලික ගණිතමය පදනමක් විය. වර්තමාන පන්තිකාමරයේදී ගුරුවරුන් අනුගමනය කළ සාම්ප්‍රදායික ඉගැන්වීම් රටාව හේතුවෙන් බෙදීමේ ගැටලු විසඳීමේදී සිසුන් පසුබෑමට ලක්වීමත්, සාමාන්‍ය පෙළ විභාගය දක්වාම සිසුන් ගණිතය විෂය කෙරෙහි පවතින උදාසීනත්වය සහ දුර්වල සාමර්ථ වාර්තා වීමත් බෙදීමේ සංකල්පයෙහි පවතින අපැහැදිලි බව සෘජුවම ආධ්‍යාපනික ක්ෂේත්‍රයේ පවතින ගැටලුවකි. එබැවින් ගුරුවරුන් භාවිත කළ ඉගැන්වීම් ක්‍රමවේදවල සාර්ථකත්වය සහ සිසුන්ගේ කුසලතා සාධනය කෙරෙහි ඒවා බලපෑ ආකාරය විමර්ශනය කිරීම ප්‍රධාන අරමුණ විය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත රැස් කළ මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයක් භාවිත කෙරිණි. මහනුවර දිස්ත්‍රික්කයේ පාසලක (3) හා (4) ශ්‍රේණිවල සිසුන් 40 දෙනෙකු සහ ගුරුවරුන් 10 දෙනෙකු අහඹු නියැදියක් ලෙස යොදා ගනිමින් පන්තිකාමර නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා ඔස්සේ තොරතුරු රැස් කළ අතර, සිසුන්ගේ බෙදීමේ මූලික සංකල්ප පිළිබඳ දැනුම මට්ටම හඳුනා ගැනීම, ගුරුවරුන් භාවිත කළ ඉගැන්වීම් ක්‍රමවේද සොයා බැලීම, එම ක්‍රමවේද සිසුන්ගේ කුසලතා සාධනය කෙරෙහි බලපෑ ආකාරය විශ්ලේෂණය කිරීම සහ ගුරුවරුන් මුහුණ දුන් ගැටලුවලට විසඳුම් යෝජනා කිරීම යන කරුණු සාක්ෂාත් කර ගැනිණි. ගුරුවරුන් සිසුන්ගේ තර්කන ශක්තිය වර්ධනය නොකළ පැරණි සාම්ප්‍රදායික ඉගැනවීම් ක්‍රමවලට පමණක් සීමා වූ අතර, සිසුන්ගේ බෙදීමේ මූලික දැනුම් මට්ටම දුර්වලව පැවති බව නිරීක්ෂණය විය. පවතින ඉගැන්වීම් ක්‍රමවල සීමාසහිත බව සිසුන්ගේ ගණිත කුසලතාවලට බලපෑ බැවින් ඒවායින් බැහැරව කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්‍රමය හා දරුවාගේ එදිනෙදා අත්දැකීම් සමඟ බෙදීමේ සංකල්පය බද්ධ කිරීම සහ ගුරුවරයා සහයෝගී ක්‍රියාකාරිකයෙකු ලෙස කටයුතු කිරීම ඉගැන්වීමේදී භාවිත කිරීම ඉතා සාර්ථක බව හඳුනා ගැණිනි. එම ක්‍රමෝපාය මඟින් සිසුන් සතු වූ ගණිතය විෂය කෙරෙහි පැවති බිය දුරු කරමින් ඉගෙනුම් ක්‍රියාවලිය ආකර්ෂණීය බවට පත් කිරීමට හැකි වුණි. ගුරුවරුන්ගේ ඉගැන්වීම් රටා නව්‍යකරණය කිරීම, නිරන්තර වෘත්තීය පුහුණුව සහ විෂය නිර්දේශයට ගැළපෙන ක්‍රීඩා උපකරණ පන්තිකාමරයට හඳුන්වා දීම ආධ්‍යාපනික උන්නතිය සඳහා අතිශයින්ම වැදගත් විය. බෙදීමේ සංකල්පය ඉගැන්වීමේදී ගුරුවරුන් සාම්ප්‍රදායික ක්‍රමවලින් බැහැරව ක්‍රීඩා මූලික, කණ්ඩායම් ක්‍රියාකාරකම් හා තාක්ෂණික ඉගැන්වීම් උපක්‍රම අනුගමනය කිරීම මඟින් සිසුන්ගේ තර්කන ශක්තිය සහ ගණිත කුසලතා සාධනය වඩාත් ඵලදායීව හා ප්‍රායෝගිකව කරගත හැකි බව පර්යේෂණය මඟින් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: කුසලතා සාධනය

මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදෙස් හා අධීක්ෂණය කෘතඥතා පුර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ගුරුවරුන්ගේ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ දැනුම්වත්භාවය සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කෘත්‍රිම බුද්ධිය භාවිතය පිළිබඳ අධ්‍යයනයක්: තෝරාගත් නාගරික හා ග්‍රාමීය පාසල් ඇසුරින්

එම්.කේ.සී. ගුණවර්ධන
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20208@arts.pdn.ac.lk

විසි එක්වන සියවසේ ශීඝ්‍ර තාක්ෂණික පරිවර්තනයත් සමඟ කෘතිම බුද්ධිය අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම, ඵලදායී හා පුද්ගලීකරණය කළ ප්‍රවේශයක් බවට පත් කිරීමට සමත් විය. එහෙත් මෙම නවීන තාක්ෂණය කෙතරම් දුරට ප්‍රායෝගිකව භාවිත කරන්නේද යන්න තවමත් පර්යේෂණාත්මක හිඩැසක්ව පවතී. එබැවින් පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ නාගරික සහ ග්‍රාමීය පාසල්වල කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල (6-9 ශ්‍රේණි) ගුරුවරුන්ගේ කෘතිම බුද්ධිය පිළිබඳ දැනුම්වත්භාවය සහ භාවිතය විශ්ලේෂණය කිරීමයි. මෙම ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා ගුරුවරුන්ගේ අවබෝධතා මට්ටම විමසා බැලීම, ඉගැන්වීමේදී AI මෙවලම් භාවිත කරන ආකාරය පරීක්ෂා කිරීම, ඒ සඳහා බලපාන ගැටලු සහ සීමා හඳුනා ගැනීම මෙන්ම ඒ සඳහා සාර්ථක විසඳුම් යෝජනා කිරීම යන සුවිශේෂී අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය මෙහෙයවනු ලබයි. මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණය ඇතුළත් අභිසාරී මිශ්‍ර පර්යේෂණ සැලසුම භාවිත කෙරේ. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් නාගරික පාසල් දෙකක් සහ ග්‍රාමීය පාසල් දෙකක් නියෝජනය වන පරිදි පහසු නියැදි ක්‍රමය යටතේ ගුරුවරුන් 80 දෙනෙකු පර්යේෂණ නියැදිය ලෙස තෝරාගෙන ඇත. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක්, පන්ති කාමර නිරීක්ෂණ සහ අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා භාවිත කර ඇති අතර රැස් කරන ලද ප්‍රමාණාත්මක දත්ත MS Excel භාවිතයෙන් සංඛ්‍යානමය විශ්ලේෂණයටත්, ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණයටත් ලක් කෙරේ. ප්‍රමාණාත්මක දත්තවලින් ලබාගත් ප්‍රතිඵල අනුව නියැදියේ සියලුම ගුරුවරුන් 100% AI පිළිබඳව අසා ඇති අතර ඉන් 59%කට මධ්‍යස්ථ අවබෝධයක් පවතී. එහෙත් "ඉතා හොඳ" අවබෝධතා මට්ටමක් ඇත්තේ 10%කට පමණි. ගුරුවරුන්ගෙන් 72%ක් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා AI භාවිත කරන අතර ඒ අතරින් ChatGPT (87%) සහ Google Gemini (77%) ප්‍රමුඛ මෙවලම් වේ. ගුරුවරුන් ප්‍රධාන වශයෙන් පාඩම් සැලසුම් සැකසීමට, ඉගැන්වීම් ද්‍රව්‍ය නිර්මාණයට සහ තොරතුරු සෙවීමට AI යොදා ගනී. එහෙත් බාධා ලෙස Premium AI මෙවලම් සඳහා පවතින ගෙවීම් ගැටලු (74%) සහ ජාතික AI ප්‍රතිපත්තියක් නොමැතිකම (67%) ප්‍රධාන බාධක ලෙස හඳුනාගෙන ඇත. අවසාන වශයෙන් නාගරික හා ග්‍රාමීය අංශ දෙකෙහිම දැනුම්වත්භාවය ඉහළ වුවද, AI භාවිතය ගැඹුරින් ඒකාබද්ධ කර ඇති ගුරුවරුන් සිටින්නේ ඉතා ස්වල්පයක් බව මෙම අධ්‍යයනය පෙන්වා දෙයි.

ප්‍රමුඛ පද: ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, කනිෂ්ඨ ද්විතීයික, කෘතිම බුද්ධිය

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ප්‍රාථමික ශ්‍රේණිවල බහුතල ඉගැන්වීම, ඉගෙනුම් ක්‍රමයක් ලෙස භාවිත කරන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

කේ.කේ.ඩී.එස්. එච්. ගුණවර්ධන
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20209@arts.pdn.ac.lk

පන්ති කාමරයක විවිධ නිපුණතා මට්ටම් සහිත ශිෂ්‍යයින් සිටින අතර ගුරුවරුන් විසින් ඔවුන්ට සමාන නිපුණතා මට්ටමක් ලබා දෙන්නේ නැත. බහුතල ඉගැන්වීම මෙයට හොඳ විසඳුමකි. මධ්‍යම පළාතේ ඇතැම් ග්‍රාමීය දුෂ්කර පාසල්වල මෙය භාවිත කරයි. ප්‍රාථමික ශ්‍රේණිවල බහුතල ඉගැන්වීම, ඉගෙනුම් ක්‍රමයක් ලෙස භාවිත කිරීම කෙබඳු ස්වභාවයක් ගනීද? යන්න විමසා බැලීම අධ්‍යයන ගැටලුව වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බහුතල ඉගැන්වීම, ඉගෙනුම් ක්‍රමයක් ලෙස භාවිතය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලිකම අරමුණ වේ. බහුතල ඉගැන්වීම් ක්‍රමවේදයේ ස්වභාවය, ගුරුවරුන්ගේ අදහස් විමසීමට ලක් කිරීම, බහුතල ඉගැන්වීම ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරු මුහුණ දෙන අභියෝග හා බහුතල ඉගැන්වීම ඵලදායි ලෙස යොදා ගැනීමට ඉදිරිපත් කරන යෝජනා සෙසු අරමුණු කරගනිමින් ප්‍රත්‍යයක අධ්‍යයනයක් සිදු කරන ලදි. ඒ අනුව ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරමින් ගුණාත්මක පර්යේෂණ පිරිසැලසුම යටතේ සසම්භාවී නොවන නියැදිකරණයේ පහසු නියැදිය ඔස්සේ මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් එක් පාසලක් ඇසුරින් ගුරුවරු 05ක් විදුහල්පති, නියෝජ්‍ය /සහකාර විදුහල්පතිවරු 05ක් සහිතව සමස්ත නියැදිය 10කින් දත්ත ලබා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා නිරීක්ෂණ පත්‍රිකා , සම්මුඛ සාකච්ඡා හා ගුරුවරුන්ගේ පාඩම් සටහන් පොත් ආදිය යොදාගන්නා ලදි. මෙලෙස එකතු කරගන්නා ලද දත්ත තේමා විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරන ලදි. ප්‍රාථමික ශ්‍රේණිවල පාඩම් 05ක් නිරීක්ෂණය කර ලබා ගන්නා දත්ත ඇසුරින් පහත කරුණු අනාවරණය විය. සාම්ප්‍රදායික පෙළපොත කේන්ද්‍ර කරගත් ඉගෙනුම් රටාවෙන් බැහැරව ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට ගුරුවරුන් කටයුතු කරන ආකාරය නිරීක්ෂණය විය . බහුතල ඉගැන්වීම් ක්‍රමවේදයේදී ගුරුවරයා විසින් විවිධ දෘශ්‍ය ආධාරක සහ ඉගෙනුම් උපකරණ පන්තිකාමරය වෙත රැගෙන විත් තිබූ අතර එමඟින් සිසුන්ගේ අවධානය සහ ඉගෙනුම් උනන්දුව ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. සිසුන් විසින් ඉගෙනුම් ආධාරක හා ප්‍රායෝගික දේවල් ඔස්සේ ඉගෙනීමට වැඩි කැමැත්තක් දැක්වූ අතර සිසුන්ගේ මනසෙහි වඩාත් ඵලදායි ලෙස විෂය කරුණු ධාරණය වන බවත් විවිධ මට්ටම්වල පසුවන සිසුන් පහසුවෙන්ම හඳුනා ගැනීමට හා ඔවුන්ට ගැළපෙන පරිදි ඉගැන්වීමට ගුරුවරයාට අවස්ථා ලැබෙන බව නිරීක්ෂණ දත්ත මඟින් තහවුරු විය. බහුතල ඉගැන්වීම ප්‍රාථමික අධ්‍යාපනයට ඉතා සාර්ථක මෙන්ම අනාගතය සඳහා අත්‍යවශ්‍ය විකල්පයක් වන ඉදිරියට අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ගුරුවරුන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කළ යුතු බව සම්මුඛ සාකච්ඡා මඟින් තහවුරු විය. පාසල් පද්ධතියේ පවතින භෞතික සම්පත්වල හිඟය හේතුවෙන් බහුතල ඉගැන්වීම් ක්‍රමවේදය සැම පාසලකම ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව වැඩිදුරටත් අනාවරණය විය. සමස්තයක් ලෙස ගත් විට බහුතල ඉගැන්වීම ශිෂ්‍යයාගේ ස්වයං ඉගෙනුම හා සමාජීය කුසලතා වර්ධනය කළ හැකි ඉහළ විභවතාවයක් සහිත පාසල් පද්ධතියට උචිත සාර්ථක ක්‍රමවේදයක් බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: බහුතල ඉගැන්වීම

මෙම අධ්‍යයනය සඳහා විශාඛා ලිඳකුඹුරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

උසස් පෙළ සිසුන් ක්‍රීඩාවේ නියැලීම සහ ශාස්ත්‍රීය කටයුතු කළමනාකරණය කරගන්නා ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්.ටී.එම්.එස්. හංසිකා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව , පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20219@arts.pdn.ac.lk

මානසික, සමාජීය හා කායික වශයෙන් පරිපූර්ණ පුද්ගලයකු බිහි කිරීම අධ්‍යාපනයේ මූලික අරමුණක් වන අතර එහිදී ක්‍රීඩාව සිසුන්ගේ සමස්ත සංවර්ධනය සඳහා වැදගත් දායකත්වයක් සපයයි. කෙසේ වෙතත් උසස් පෙළ අවධිය තීරණාත්මක බැවින් ක්‍රීඩා හා ශාස්ත්‍රීය කටයුතු සමබරව පවත්වාගෙන යාම සිසුන්ට අභියෝගයකි. උසස් පෙළ සිසුන් ක්‍රීඩාවේ නියැලීමේදී මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම, ඒවා කළමනාකරණයට ඔවුන් ගන්නා උපක්‍රම විශ්ලේෂණය කිරීම, ඔවුන්ගේ විෂය සාධනය හඳුනා ගැනීම සහ මෙම කටයුතු වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා ගත හැකි යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු විය. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ මෙම අධ්‍යයනයේ නියැදිය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් පහක (05) ප්‍රධාන විෂය ධාරාවන් (විද්‍යා, ගණිත, වාණිජ, කලා) නියෝජනය වන පරිදි උසස් පෙළ ක්‍රීඩක සිසුන් 100ක්, දෙමාපියන් 25ක් සහ ගුරුවරුන් 25ක් ඇතුළත් කරගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා සිසුන් වෙත ප්‍රශ්නාවලියක් ලබාදුන් අතර ගුණාත්මක දත්ත සඳහා ගුරුවරුන් සහ දෙමාපියන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. රැස් කරගත් ප්‍රමාණාත්මක දත්ත Microsoft Excel මෘදුකාංගය භාවිතයෙන් සංඛ්‍යාත හා ප්‍රතිශත වශයෙන් ද, ගුණාත්මක දත්ත විස්තරාත්මකව ද විශ්ලේෂණය කරන ලදි. ප්‍රතිඵල අනුව සිසුන්ගෙන් 80%ක් පාසල් ක්‍රීඩා කණ්ඩායම්වල සාමාජිකයන් වූ අතර 65%ක් පසුගිය වාර විභාගයේදී 60%ට වැඩි සාමාන්‍ය ලකුණු ලබාගනිමින් ඉහළ විෂය සාධනයක් පෙන්වා තිබුණි. ක්‍රීඩාව හා ශාස්ත්‍රීය කටයුතු සමබර කිරීමේදී විෂය නිර්දේශයේ පුළුල්භාවය (85%), අධික ශාරීරික වෙහෙස (80%), පාඩම් කිරීමට කාලය ප්‍රමාණවත් නොවීම (75%) සහ අමතර පන්ති සමඟ ඇතිවන කාල කළමනාකරණ ගැටුම් (75%) ප්‍රධාන අභියෝග ලෙස හඳුනා ගැනිණි. එම අභියෝග ජය ගැනීම සඳහා සිසුන්ගෙන් 90%ක් මිතුරන්ගෙන් සටහන් ලබාගැනීම, 85%ක් විභාග කාලයේදී ක්‍රීඩා සීමා කිරීම සහ 80%ක් නිශ්චිත කාලසටහන් භාවිත කිරීම වැනි උපක්‍රම ක්‍රියාවට නංවා තිබුණි. ක්‍රීඩාව මඟින් සිසුන්ගේ චිනය, නායකත්වය හා කාල කළමනාකරණය වර්ධනය වන බව සම්මුඛ සාකච්ඡාවලින් හෙළි විය. අධ්‍යයනය මත පදනම්ව, ක්‍රීඩක සිසුන් වෙනුවෙන් විශේෂ අතිරේක පන්ති පැවැත්වීම, නම්‍යශීලී කාලසටහන් සැකසීම සහ පාසල, ගුරුවරුන් හා දෙමාපියන්ගේ අඛණ්ඩ සහයෝගය සැපයීම වැනි ක්‍රියාමාර්ග යෝජනා කෙරේ. ඒ අනුව සිසුන්ගේ ක්‍රීඩාමය හා ආධ්‍යාපනික සාර්ථකත්වය උදෙසා සහයෝගී පාසල් හා පවුල් පරිසරයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: උසස් පෙළ සිසුන්, කාල කළමනාකරණය, ක්‍රීඩාව, විෂය සාධනය, ශාස්ත්‍රීය කටයුතු

මෙම අධ්‍යයනය සඳහා විශාඛා ලිඳකුඹුරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය විධිමත් විෂය මාලාවට අනුව නූතන පන්තිකාමරයෙහි ඉගැන්වීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ අධ්‍යයනය (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් තුනක 7 ශ්‍රේණියේ සිසුන් ඇසුරින්)

ඩබ්.කේ.ටී.ඩී. ජයසිරි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20278@arts.pdn.ac.lk

2018 නව චක්‍රලේඛය යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය 6-9 ශ්‍රේණි සඳහා අනිවාර්යය විෂයක් ලෙස හඳුන්වාදී ඇත. මෙම තත්ත්වය යටතේ නූතන පන්තිකාමරයේ දී විධිමත් විෂය මාලාවට අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය ඉගැන්වීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ සොයා බැලීම සඳහා පොදු අරමුණ ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය ඉගැන්වීමේ ක්‍රියාවලිය ජාතික විෂය මාලාවට අනුව සිදුවන ආකාරය විමසීමයි. මෙහි සුවිශේෂී අරමුණු ලෙස වර්තමාන පාසලේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය විෂයක් ලෙස ඉගැන්වීම සිදුවන ආකාරය සොයා බැලීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය ඉගැන්වීමේදී මතුවන ගැටලු හඳුනා ගැනීම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික විෂය ඉගැන්වීම සාර්ථක වීම සඳහා සංවර්ධනය විය යුතු මූලික අංග හඳුනාගැනීම ආදිය අධ්‍යයනය කිරීමට යොමු විය. ගුණාත්මක ක්‍රමවේදය භාවිත කරමින් මෙම පර්යේෂණය මහනුවර දිස්ත්‍රික්කයේ 1AB, 1C හා 2 වර්ගයේ පාසල් ත්‍රිත්වයක සිසුන් 90 හා ගුරුවරුන් 6 දෙනෙකු පහසු නියැදිකරණය යටතේ තෝරාගනිමින් අදාළ පාර්ශව වෙතින් අවසර ලබා ගෙන දත්ත රැස්කිරීම සිදු කරන ලදි. ඒ සඳහා මෙම දත්ත රැස් කිරීමේ උපකරණ භාවිත කරන ලදි. එනම් සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ , පරිගණක විද්‍යාගාරයේ පිරික්සුම් ලැයිස්තුවක්, ගුරුවරුන්ගේ පාඩම් සටහන් පොත්, ලොග් සටහන් පොත් ආදියයි. එසේ රැස්කර ගන්නා ලද ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමය යටතේ මනාව අධ්‍යයනය කර අදාළ සුවිශේෂී අරමුණු අවබෝධ කර ගැනීමට අපේක්ෂා කරන ලදි.

ප්‍රමුඛ පද: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නූතන පන්තිකාමරය, විධිමත් විෂය මාලාව

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

හත්වන ශ්‍රේණිය සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයමාලාවේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමට සමපදස්ථ ක්‍රමය භාවිත කිරීම පිළිබඳ අධ්‍යයනයක් (මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක හත ශ්‍රේණිය පන්තිකාමරයේ සියලුම සිසුන් ඇසුරෙන්)

එස්. එච්. ජේ. ඩී. ජයසූරිය
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20281@arts.pdn.ac.lk

ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතිය සිසුවාගේ දැනුම කුසලතා ආකල්ප යන ත්‍රිවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සකස් වුණු විශිෂ්ට විෂය නිර්දේශයකින් යුක්ත වේ. මෙහිදී සිසුවාගේ ක්‍රියාශීලී නීරෝගී හා තෘප්තිමත් බවින් යුතු ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය දැනුම ආකල්ප කුසලතා හා සමාජ සම්බන්ධතා සමෝධානය කෙරෙන නිපුණතා පෙළක් සංවර්ධනය කර ගැනීම අරමුණු කර ගනිමින් හඳුන්වා දුන් සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන විෂය මාලාවේ වර්තමාන තරගකාරී අධ්‍යාපන ක්‍රමය හේතුවෙන් න්‍යායාත්මක කරුණු මත පමණක් පදනම් වෙමින් විෂයයේ ඇති ප්‍රායෝගික කොටස් සඳහා අඩු අවධානයක් යොමු කරමින් පන්ති කාමරයකට කොටු වූ ගුරු කේන්ද්‍රීය දේශන සාකච්ඡා ක්‍රමයකට රාමුවීම මත විෂයයේ අරමුණු ශිෂ්‍යයන් වෙතට සම්ප්‍රේෂණය කරවීමේ ගැටලු පවතී. විෂයයන් සකස් වී ඇත්තේ සර්පිලාකාර ආකෘතියකට බැවින් සිසුන් විසින් එම විෂයයෙන් ඉගෙන ගන්නා මුල් අවදියේම සිසුන් හට එම සියලු පූර්ව දැනුම කුසලතා හා ආකල්ප ආවරණය වන පරිදි දැනුම සම්ප්‍රේෂණය නොවීම ගැටලුවකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ 07 ශ්‍රේණිය සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂය මාලාවේ ප්‍රායෝගික කොටස් සඳහා සමපදස්ථ ඉගැන්වීම් ක්‍රමය භාවිත කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. තෝරාගත් 07 ශ්‍රේණිය සිසුන්ගේ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපන විෂය මාලාව පිළිබඳ දැනට දක්වන රුචිකත්වය හා සාධන මට්ටම සොයා බැලීම, විෂයයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමට දැනට භාවිත කරන ඉගැන්වීම් ක්‍රමවේද සොයා බැලීම, මෙම සමපදස්ථ ඉගැන්වීම් ක්‍රමවේදය ඔස්සේ විෂයයේ ඇති ප්‍රායෝගික කොටස් කෙරෙහි සිසුවාගේ සහභාගිත්වය, ක්‍රියාශීලීභාවය, අධ්‍යාපන ප්‍රගතිය, සන්නිවේදන කුසලතා, කණ්ඩායම් කාර්යය හැකියා මත සිදුකළ හැකි සාධනීය බලපෑම පිළිබඳ අධ්‍යයනය කර මෙම සමපදස්ථ ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරුන්ගේ හා සිසුවාගේ ආකල්ප පිළිබඳ දත්ත එක් රැස්කිරීම මෙම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වේ. පර්යේෂණය සඳහා දත්ත එක් රැස්කිරීමට ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේද ඒකාබද්ධ වූ මිශ්‍ර ක්‍රමවේදයක් යොදාගන්නා ලදි. මෙහිදී මහනුවර ප්‍රදේශයේ පාසලක සාරම්මන නියැදිකරණ ක්‍රමය යටතේ තෝරා ගත් 07 ශ්‍රේණිය පන්ති කාමරයේ සිටින සියලුම සිසුන් (14) දෙනා හා සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂය උගන්වන ගුරුභවතුන් දෙදෙනා මඟින් නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී හා සැසඳුම් පත්‍රිකා ආදී දත්ත එක් රැස් කිරීමේ ක්‍රම මඟින් දත්ත එක්රැස් කරන ලදි. දත්ත විශ්ලේෂණය කිරීම සඳහා යොදාගන්නා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද මිශ්‍ර වූ ක්‍රමවේදයක් දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලදි. පර්යේෂණ නියැදිය පිළිබඳ පූර්ව දත්ත එක්රැස් කිරීම්වලදී සිසුන්ගේ දැනුම කුසලතා ආකල්ප යන ක්ෂේත්‍ර තුනම පරිපූර්ණ වී නොතිබුණු බවයි. න්‍යායාත්මක කරුණු පිළිබඳ අවබෝධයක් තිබුණද 07 ශ්‍රේණිය සිසුවා සතුව ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලදී සතුටුදාය නිරීක්ෂණ දුටුවේ අල්ප වශයෙනි. පර්යේෂණ සොයා ගැනීම්වලින් පෙනී යන්නේ පන්ති කාමරයකට රාමුවෙමින් ගුරු කේන්ද්‍රීය ලෙසින් ඉගැන්වීමට සාපේක්ෂව සිසුන් හට සම වයස් කණ්ඩායම් ඇසුරින් ගුරු මාර්ගෝපදේශය යටතේ ඉගෙනීමට ඉඩ සැලැස්වීම විෂයයෙන් අපේක්ෂිත විෂය අරමුණු සතුටුදායී මට්ටමකට ශිෂ්‍යයන් හට ළඟා කළ හැකි බවයි. මෙහිදී සිසුවා මිත්‍රශීලීව, කණ්ඩායම් කුසලතා වර්ධනය කර ගනිමින්, ක්‍රම ක්‍රමයෙන් අපේක්ෂිත සාධන මට්ටම කරා ළඟා කරවා ගැනීමට ගුරුවරයාට හැකිය. සැම මොහොතකම සිසුවාට තම මිතුරන් සමග අත්දැකීම් ඔස්සේ විෂයයේ ප්‍රායෝගික කොටස් ඉගෙනීමට ඉඩ ලබාදීමෙන් විෂය පිළිබඳ මනා අවබෝධයකින් යුතුව ක්‍රියාශීලී වෙමින් යහපත් සන්නිවේදන කුසලතා පවත්වා ගනිමින් විෂයයේ ප්‍රායෝගික කොටස්වල අවබෝධය තමා වෙත ළඟා කර ගත හැකි බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: සමපදස්ථ ඉගැන්වීම් ක්‍රමය

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ට ගණිතය විෂය ඉගැන්වීමේ දී ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම විෂය සාධනය හා සක්‍රීය සහභාගීත්වයට කරන බලපෑම පරීක්ෂණාත්මක අධ්‍යයනයක්

ආර්. පී. එස්. එස්. ජයතිලක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තුමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20287@arts.pdn.ac.lk

ලංකාවේ අධ්‍යාපන ක්‍රමයෙහි ගණිතය විෂය අ.පොෙ.ස සාමාන්‍ය පෙළ දක්වා අනිවාර්ය විෂයක් වන්නේ විවේචනාත්මක චින්තනය, ගැටළු විසඳීමේ කුසලතා වර්ධනයට අත්‍යවශ්‍ය පදනම සපයන බැවිනි. එහෙත් කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ගණිතය ඉගැන්වීමට භාවිත වන ගුරු කේන්ද්‍රීය ක්‍රමවේද හේතුවෙන් සිසුන්ට ගණිතය අපහසු විෂයක් වී ඇත. එබැවින් ගණිත විෂය සාධනය ද අඩු ප්‍රතිශතයක් ගනී. මෙම තත්ත්වය වෙනස් කරමින් කණිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ගණිතය විෂය සාධනය හා සක්‍රීය සහභාගීත්වයට ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් ක්‍රමවේදවල වැදගත්කම හඳුනා ගැනීම ප්‍රධාන අරමුණ කරගනිමින් ක්‍රියාකාරකම් පාදකව ඉගැන්වීමට පෙර සිසුන්ගේ විෂය සාධනය හා අභිප්‍රේරණය හඳුනා ගැනීම, ගණිතය ඉගැන්වීමට ක්‍රියාකාරකම් සහිත ඉගෙනුම් ක්‍රම සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, ක්‍රියාකාරකම් සහිත ඉගෙනුම් ක්‍රම භාවිතය මඟින් ගණිතය විෂය සාධනය හා සක්‍රීය සහභාගීත්වය අතර සැලකිය යුතු වෙනසක් තිබේද පරීක්ෂා කිරීම, ක්‍රියාකාරකම් පාදක ක්‍රමවේද මඟින් ගණිතය ඉගැන්වීමේ දී සිදුවන ගැටලු හඳුනාගෙන ඒවාට විසඳුම්, යෝජනා ඉදිරිපත් කිරීම සුවිශේෂී අරමුණු කරගෙන පර්යේෂණය කර ඇත. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ අභිසාරී පිරිසැලසුම මෙහිදී භාවිත කරන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ දෙනුවර අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසලක සිසුන් 39ක් අරමුණු සහගත නියදි ක්‍රමය යටතේ තෝරාගන්නා ලදි. දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි, ප්‍රශ්න පත්‍ර, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ යොදා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය, යුගල කළ t පරීක්ෂණය ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය මඟින් ද විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණ අරමුණු අනුව ක්‍රියාකාරකම් පාදකව ඉගැන්වීමට පෙර ගණිත විෂය සාධනය හා අභිප්‍රේරණය හඳුනා ගෙන පසුව තෝරාගත් පාඩම් කිහිපයක් ක්‍රියාකාරකම් පාදක ක්‍රම අනුව උගන්වන ලදි. යුගල කළ t පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව පූර්ව ලකුණු මධ්‍යයනයට ($M = 55.05$, $SD = 18.708$) සාපේක්ෂව පසු පරීක්ෂණ මධ්‍යයනය ($M = 66.08$, $SD = 16.405$) වෙසෙසි ($t = -4.413$, $p = 0.000$, $P < 0.05$) වර්ධනයක් පෙන්වයි. ගණිතය කෙරෙහි ශිෂ්‍ය අභිප්‍රේරණය හඳුනා ගැනීමට දෙන ලද ප්‍රශ්නාවලි විශ්ලේෂණයට අනුව පූර්ව ප්‍රශ්නාවලියේ අභිප්‍රේරණ මට්ටමට වඩා මැදිහත්වීමෙන් පසුව අභිප්‍රේරණ මට්ටම් ඉහළ ගොස් ඇත. ප්‍රතිඵල අතර පවතින පැහැදිලි වර්ධනය අනුව ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම සිසුන්ගේ ගණිත විෂය සාධනය හා සක්‍රීය සහභාගීත්වයට හේතු වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම, ගණිතය, විෂය සාධනය, සක්‍රීය සහභාගීත්වය

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ කනිෂ්ඨ ද්විතීයික පාසල් සිසුන්ගේ විනය සංවර්ධනය කර ගැනීම සඳහා පාසල ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයක් : ගාල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් ඇසුරින්

කේ.එල්.ඒ.ඩී.එන්.එස්. ජයවර්ධන
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20291@arts.pdn.ac.lk

චක්‍රලේඛ මගින් ශාරීරික දඬුවම් තහනම් කිරීමත් සමඟ සිසුන් හික්මවීම සඳහා ධනාත්මක විනය ප්‍රවේශයන්හි දැඩි අවශ්‍යතාවයක් මතු වී ඇත. වාර්තාගත දත්තයන්ට අනුව පාසල් විනය සහ හිංසන පැමිණිලි 2021 (2,137), 2022 (2,519) සහ 2023 (2,866) ලෙස ක්‍රමයෙන් ඉහළ ගොස් තිබේ. මෙම පසුබිම තුළ කනිෂ්ඨ ද්විතීයික සිසුන්ගේ විනය සංවර්ධනය උදෙසා පාසල් මට්ටමින් ගන්නා ධනාත්මක උපක්‍රම, ඒවායේ ප්‍රායෝගික සාර්ථකත්වය සහ ගුරුවරුන් හා පරිපාලන අංශ මුහුණ දෙන සැබෑ අභියෝග විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවයි. මෙම අධ්‍යයනය මූලික වශයෙන් බෞද්ධ විනය සංකල්පය මත පදනම් වන අතර නාහායිකව පෙන්වා දෙන පරිදි විනය යනු හුදෙක් බාහිරින් කරනු ලබන බලහත්කාරී පාලනයක් නොව, පුද්ගලයාගේ කය, වචනය හික්මවීම තුළින් සිදුවන අභ්‍යන්තර හැඩගැස්මකි. මෙම නාහායික පදනම වර්තමාන අධ්‍යාපන පද්ධතියේ අපේක්ෂිත "ධනාත්මක විනය" ප්‍රවේශ සහ විකල්ප විනය ක්‍රමවේද සමඟ මනාව බද්ධ වේ. ගාල්ල දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල කනිෂ්ඨ ද්විතීයික මට්ටමින් විනය සංවර්ධනය සඳහා පාසල විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳව විස්තරාත්මකව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන අතර, දැනට ක්‍රියාත්මක පාසල් වැඩසටහන්වල ස්වභාවය අධ්‍යයනය කිරීම, එහි ප්‍රබලතා සහ දුබලතා ඇගයීම, විනය සංවර්ධන ක්‍රියාවලියට බලපාන ප්‍රධාන ගැටලු, අභියෝග හඳුනා ගැනීම සහ සිසුන්ගේ විනය සංවර්ධනය සඳහා වඩාත් ඵලදායී ධනාත්මක උපක්‍රම හඳුනා ගැනීම මෙහි උප අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදයේ අභිසාරී පිරිසැලසුම යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බාලක, බාලිකා, මිශ්‍ර පාසල් 03ක් ඇසුරින් පුද්ගලයන් 42ක නියැදියක් යොදා ගැනේ. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි (සිසුන් 30, ගුරුවරුන් 06) සඳහාද, විදුහල්පතිවරුන් (03) සහ විනය භාර ගුරුවරුන් (03) සමඟ අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ද, විනය වාර්තා ලේඛන පරිශීලනය භාවිත කිරීමට බලාපොරොත්තු වේ. ප්‍රමාණාත්මක දත්ත MS Excel මෘදුකාංගය මඟින් ප්‍රතිශත සහ සංඛ්‍යාත ඇසුරින්ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණයෙන්ද විග්‍රහකොට, දත්ත ත්‍රිකෝණකරණයෙන් සියලු දත්ත සංසන්දනය කර අවසන් නිගමනවලට එළඹේ. දත්ත රැස් කිරීම දැනට ක්‍රියාත්මක වන බැවින්, මෙමඟින් රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය අතර පවතින පරතරය අනාවරණය කරගැනීම, සිසුන්ගේ විනය වර්ධනය සඳහා ගුරු-ශිෂ්‍ය සබඳතා ශක්තිමත් කිරීම, දෙමව්පිය දායකත්වය විධිමත් කිරීම සහ ධනාත්මක විනය උපක්‍රම හඳුන්වා දීමට අදාළ ප්‍රායෝගික යෝජනා ඉදිරිපත් කිරීම මෙහි බලාපොරොත්තුවයි.

ප්‍රමුඛ පද: කනිෂ්ඨ ද්විතීයික සිසුන්, ධනාත්මක විනය, පාසල් විනය, මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය, විනය චක්‍රලේඛ

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වක ව සිහිපත් කරමි.

සිසුන්ගේ ගණිත වගන්ති ගැටලු විසඳීමේ කුසලතාව වර්ධනය කිරීම සඳහා පෝල්යාගේ පියවර ක්‍රමය භාවිත කිරීම පිළිබඳ ක්‍රියා මූලික පර්යේෂණයක්

ඒ.අයි.පී. කුමාරගේ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20345@arts.pdn.ac.lk

පාසල් විෂය මාලාව තුළ ප්‍රායෝගික ගැටලුවලට ගණිතමය සිද්ධාන්ත උපයෝගී කර ගැනීමට මඟ පාදන්නේ වගන්ති ගැටලු විසඳීමේ කුසලතාවයි. කෙසේ වුවද, භාෂාමය අර්ථය වටහා ගැනීමට නොහැකි වීම, දත්ත වෙන් කර නොගැනීම සහ දත්ත ගණිතමය ප්‍රකාශන බවට පරිවර්තනය කිරීමේ අපහසුව නිසා වගන්ති ගැටලු විසඳීමේදී සිසුන් බහුලවම අසාර්ථක වේ. මේ අනුව ගුරු පුහුණු කාලය තුළදී 8 ශ්‍රේණියේ සිසුන් තුළ මෙම දුර්වලතාව නිරීක්ෂණය වූ අතර, ඊට පිළියම් ලෙස පෝල්යාගේ ගැටලු විසඳීමේ සිව් පියවර ක්‍රමය භාවිතයෙන් සිසුන්ගේ කුසලතා මට්ටම ඉහළ නැංවිය හැකි දැයි සොයා බැලීමට ක්‍රියාමූලික පර්යේෂණයක් සිදු කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. මෙහි දී නියැදිය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ ගුරු පුහුණුව ලද පාසලේ 8 ශ්‍රේණියේ සිසුන් සිව්දෙනෙකු තෝරාගත් අතර, ඔවුන් පූර්ව පරීක්ෂණ ලකුණු අනුව, අඩු මට්ටමේ සිසුන් දෙදෙනෙකු සහ සාමාන්‍ය මට්ටමේ සිසුන් දෙදෙනෙකු ලෙස තෝරා ගන්නා ලදී. මෙහිදී මැදිහත්වීම් ලෙස පියවර කාඩ්පත් ක්‍රමය, වැඩ පත්‍රිකා හා පියවර සිහිපත් කරමින් ගැටලු විසඳීම වැනි මැදිහත්වීම්, චක්‍ර දෙකක් ඔස්සේ සිදු කළෙමි. මෙහිදී ශිෂ්‍ය චර්යාව නිරීක්ෂණය, අභ්‍යාස පොත් පරීක්ෂාව, ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල සහ ප්‍රශ්න පත්‍ර භාවිතයෙන් දත්ත රැස් කිරීම මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ සිදු කළෙමි. පර්යේෂණය තුළදී සිසුන් පෝල්යාගේ පියවරයන් නිවැරදිව හඳුනාගත්ත ද භාෂාමය බාධා නිසා ගැටලු විසඳීමට වැඩි කාලයක් ගත වූ අතර, විශේෂයෙන්ම ප්‍රතිලෝම ගණනය කිරීමේ හැකියාව අවම වීම නිසා සිව්වන පියවර වන 'නැවත පරීක්ෂා කර බැලීම' තනිව සිදු කිරීමට අපහසුතා ඇති විය. කෙසේ වෙතත් අඛණ්ඩව මැදිහත්වීම් අවසානයේදී පරීක්ෂණ ලකුණු මට්ටම් සැසඳීමේදී, ඔවුන්ගේ ගැටලු විසඳීමේ තර්කන ශක්තියේ සහ ලකුණුවල සාධනීය වර්ධනයක් සිදු විය. මේ අනුව සමස්තයක් ලෙස සම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය ඉගැන්වීම් රටාව වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ප්‍රවේශයක් සඳහා පෝල්යාගේ පියවර හතරෙන් යුත් සක්‍රීය ක්‍රමවේදය පන්තිකාමරයට ආදේශ කිරීම මගින් සිසුන්ගේ ගණිත වගන්ති ගැටලු විසඳීමේ කුසලතාව සෘජුව හා අර්ථවත් ලෙස වර්ධනය කිරීමට හේතු වන බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය.

ප්‍රමුඛ පද: ක්‍රියාමූලික පර්යේෂණය, ගණිත වගන්ති ගැටලු, පෝල්යාගේ පියවර ක්‍රමය, 8 ශ්‍රේණියේ සිසුන්,

මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා සුභාෂිණි විජේසුන්දරගෙන් ලැබුණු උපදෙස් සහ අධීක්ෂණය කෘතඥතාපූර්වකව සිහිපත් කරමි

ප්‍රාථමික අධ්‍යාපනයේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ප්‍රායෝගික කොටස් ඉගැන්වීම පිළිබඳව සිදු කරන විමර්ශනාත්මක අධ්‍යයනයක්

බී.ඒ.එම්. ලසන්තිකා කුමාරි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20350@arts.pdn.ac.lk

ප්‍රාථමික අධ්‍යාපනය යනු දරුවකුගේ සමස්ත සංවර්ධනයේ මූලික පදනම වන අතර එහිදී " පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්" විෂය මාලාව සිසුන්ගේ නිරීක්ෂණය "ගවේෂණ" නිර්මාණශීලීත්වය සහ ප්‍රායෝගික කුසලතා වර්ධනය උදෙසා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මෙම විෂය හුදෙක් පන්ති කාමරය තුළ ලබාදෙන සෛද්ධාන්තික දැනුමට පමණක් සීමා නොවී විවිධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් දරුවාට සැබෑ ලෝකයේ අත්දැකීමට සැලැස්වීම මෙහි මූලික අපේක්ෂාව වේ. වත්මන් ශ්‍රී ලාංකික පාසල් පද්ධතිය තුළ මෙම විෂයෙහි අන්තර්ගත ප්‍රායෝගික කොටස් කොතරම් දුරට ඵලදායී සහ ගුණාත්මක ලෙස සිසුන් වෙත ළඟා කර දෙන්නේද යන්න විමර්ශනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. ඒ අනුව "ප්‍රාථමික පන්ති කාමර තුළ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ ප්‍රායෝගික පාඩම් සහ ක්‍රියාකාරකම් සැබෑ ලෙසම ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන ප්‍රායෝගික ගැටලු" සීමා සහ අභියෝග මොනවාද යන්න මෙම පර්යේෂණයේ මූලික ගැටලුව විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයෙහි ප්‍රායෝගික කොටස් ඉගෙන්වීමේ වත්මන් තත්වය සහ පන්ති කාමරය තුළ පවතින ගැටලුකාරී ස්වභාවය විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනය සාර්ථක කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත භාවිත වන මිශ්‍ර පර්යේෂණය ක්‍රමවේදය අනුගමනය කරන ලදී. එහිදී නියැදිකරණ ක්‍රමය ලෙස සසම්භාවී නොවන නියැදි ක්‍රමය භාවිත කරමින් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාථමික පාසල් 05 ක දැනට සේවය කරනු ලබන ප්‍රාථමික ශ්‍රේණි ගුරුවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. ඒ අනුව ගුරුවරුන් සඳහා විශේෂයෙන් සැකසූ ව්‍යුහගත ප්‍රශ්නාවලි" සම්මුඛ සාකච්ඡා සහ පන්ති කාමර ක්‍රියාවලිය නිරීක්ෂණ සටහන් පත්‍රිකා දත්ත රැස්කිරීමේ උපකරණ ලෙස භාවිතා කෙරිණි. මෙලෙස රැස්කරගත් ප්‍රාථමික සහ ද්විතීයික දත්ත දත්ත විශ්ලේෂණ ක්‍රම මගින් විශ්ලේෂණය කරන ලදී. ප්‍රධාන පර්යේෂණය ආරම්භ කිරීමට පෙර තෝරාගත් කුඩා කණ්ඩායමක් ඇසුරින් පවත්වන ලද නියමු පරීක්ෂණයේ දී අනාවරණය වූයේ දත්ත රැස් කිරීම සඳහා සකස් කරන ලද මෙවලම් 85% ක ඉහළ විශ්වාසනීයත්වයකින් යුක්ත වූ බවයි. පර්යේෂණයේ සමස්ත අනාවරණ මඟින් හෙළි වූයේ වත්මන් ප්‍රාථමික ගුරුවරුන්ගෙන් 75% ක්ම ක්‍රියාකාරකම් පාදක කරගත් ඉගෙනුමට වඩා සෛද්ධාන්තික ඉගැන්වීම් ක්‍රම සඳහා වැඩි නැඹුරුවක් දක්වන බවයි. ප්‍රායෝගික කොටස් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීමට බලපාන හේතු ලෙස ගුරුවරුන්ගෙන් 80%ක්ම නිල විෂය නිර්දේශයේ පවතින අධික වැඩ බර සහ කාලවේලාව මදිවීම ප්‍රධාන ගැටලුවක් ලෙස දක්වා තිබූ අතර 65% ම පෙන්වා දුන්නේ පාසල් තුළ ප්‍රායෝගික විද්‍යාත්මක උපකරණ, තාක්ෂණික මෙවලම් සහ ස්වභාවික පරිසර සම්පත්වල පවතින උග්‍ර හිඟකමයි. ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේදී පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයෙහි නියමිත ඵලදායිතාවය සහ අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීමට නම් පවතින භෞතික සම්පත් සහ කාලීන බාධා ඉවත් කරමින් ප්‍රායෝගික පදනම් කරගත් නවීන ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමවේද සඳහා ගුරුවරුන් ව්‍යත්තීමය වශයෙන් මෙන්ම ආකල්පමය වශයෙන්ද බලගැන්වීම අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකිය

ප්‍රමුඛ පද: පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

10 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයමාලාවේ ප්‍රායෝගික අංග ඉගැන්වීමේදී ගුරුවරුන් යොදාගන්නා ඉගැන්වීම් ක්‍රම පිළිබඳව අධ්‍යයනයක්

ඊ.එම්.ඒ.ජී.ආර්.වයි. කුමාරි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20351@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ජාතික විෂයමාලාව යටතේ දෙන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයමාලාව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අන්තර්ගතයන්ගෙන් යුක්ත විෂයකි. මෙහි විෂය අරමුණුවලට අනුව සිසුන්ට න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලබාදිය යුතුය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, 10 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයමාලාවේ ප්‍රායෝගික අංග ඉගැන්වීමේදී ගුරුවරුන් යොදාගන්නා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමයි. මෙහි සුවිශේෂී අරමුණු වන්නේ 10 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයමාලාවට අදාළ ප්‍රායෝගික කොටස් ඉගැන්වීමේදී ගුරුවරුන් දැනට භාවිත කරනු ලබන ඉගැන්වීම් ක්‍රම, පාසල සතු භෞතික සම්පත් ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා ගුරුවරුන් විසින් උපයෝගී කරගන්නා ආකාරය, ගුරුවරුන් දැනට යොදාගන්නා ඉගැන්වීම් ක්‍රම පිළිබඳව ශිෂ්‍යයන් දක්වන ආකල්ප, ප්‍රතිචාර මෙන්ම ඉන් සිසුන්ගේ විෂයමය සංජානනයට සිදුවන බලපෑම, ප්‍රායෝගික අංග ඉගැන්වීමේදී සහ ඉගෙනීමේදී ගුරුවරුන් මෙන්ම සිසුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු සහ අභියෝග විමර්ශනය කිරීම යනාදියයි. මෙම අධ්‍යයනය සඳහා සසම්භාවී නොවන පහසු නියැදිකරණය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ 1AB, 1C සහ Type 2 ලෙස තෝරාගත් පාසල් තුනක් කේන්ද්‍ර කරගත් අතර, එහිදී ගුරුවරුන් 6 දෙනෙකු සහ සිසුන් 45 දෙනෙකු පර්යේෂණ නියැදිය ලෙස තෝරා ගනිමින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක අනුක්‍රමික පර්යේෂණ පිරිසැලැසුම අනුගමනය කරමින් දත්ත රැස් කරන ලදී. මෙහිදී ප්‍රාථමික දත්ත රැස්කිරීමට සිසුන් සඳහා ප්‍රශ්නාවලි සහ ගුරුවරුන් සමඟ අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා හරහා දත්ත රැස්කරගත් අතර ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය මඟින් ද, ප්‍රමාණාත්මක දත්ත Microsoft Excel මෘදුකාංගය මඟින්ද විශ්ලේෂණය කිරීමට නියමිතය. මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව, 10 ශ්‍රේණිය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයයේ ප්‍රායෝගික අංග ඉගැන්වීමේදී ගුරුවරුන් ප්‍රයෝගික ක්‍රියාකාරකම් සහ දේශන ක්‍රම මිශ්‍රව භාවිත කළද, පන්ති කාමරවල පවතින ඉහළ ශිෂ්‍ය-පරිගණක අනුපාතය සහ යාවත්කාලීන නොවූ විද්‍යාගාර සම්පත් හේතුවෙන් සිසුන්ට තනිවම පුහුණුවීමට ඇති අවස්ථා සීමිත වී ඇත. මෙය සිසුන්ගේ විෂය සංජානනයට හා ආත්ම විශ්වාසයට ඍණාත්මකව බලපාන අතර විෂය නිර්දේශය ආවරණය කිරීමට ඇති කාලය මදිවීම සහ වත්මන් විභාග රටාව තුළ ප්‍රායෝගික කුසලතාවලට වඩා න්‍යායාත්මක දැනුමට පමණක් මුල්තැන දීම ගුරුවරුන් මෙන්ම සිසුන්ද මුහුණදෙන ප්‍රධානතම අභියෝග ලෙස හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද: ඉගැන්වීම් ක්‍රම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ප්‍රායෝගික අංග, භෞතික සම්පත්, සිසුන්ගේ සංජානනය

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ග්‍රාමීය රජයේ පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ ගුරු හිඟය මඟහරවා ගැනීම සඳහා යොදා ගනු ලබන උපක්‍රම පිළිබඳ අධ්‍යයනයක් (දෙහිඅත්තකණ්ඩිය කලාපය ඇසුරෙන්)

ඩබ්ලිව්.ඒ.ජී.පී ලක්ෂිකා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20382@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය තුළ සැමට සමාන අධ්‍යාපන අවස්ථා ලබාදීමට ප්‍රතිඥා දී තිබුණද, ග්‍රාමීය පාසල්වල පවතින ගුරු හිඟය තවමත් ජාතික මට්ටමේ ප්‍රධාන ගැටලුවකි. විශේෂයෙන්ම දෙහිඅත්තකණ්ඩිය වැනි දුෂ්කර හා අර්ධ දුෂ්කර කලාපවල පිහිටි රජයේ පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ (අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ) විෂයයන් සඳහා පවතින ගුරු හිඟය සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් කෙරෙහි සෘජුවම බලපායි. මෙම ගුරු හිඟය කළමනාකරණය කරගැනීම සඳහා විදුහල්පතිවරු, කලාප අධ්‍යාපන බලධාරීහු හා පාසල් සිසුහු විවිධ කෙටි කාලීන සහ දිගු කාලීන උපක්‍රම භාවිත කරති. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ දෙහිඅත්තකණ්ඩිය අධ්‍යාපන කලාපයේ ග්‍රාමීය රජයේ පාසල්වල ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයේ පවතින ගුරු හිඟයේ ස්වභාවය හඳුනා ගැනීම සහ එම හිඟය මඟහරවා ගැනීම සඳහා පාසල් මට්ටමින්, කලාප මට්ටමින් හා සිසුන් විසින් අධ්‍යයන කටයුතු සඳහා යොදාගන්නා උපක්‍රමයන්හි සාර්ථකත්වය විශ්ලේෂණය කිරීමයි. ඒ අනුව මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන්ගේ එකතුවක් ලෙස මිශ්‍ර ක්‍රමවේදය ඔස්සේ විස්තරාත්මක අනුක්‍රමික පිරිසැලසුම භාවිත කරන ලදී. මේ පර්යේෂණයට දත්ත රැස් කිරීම සඳහා අහඹු නියැදිකරණය ක්‍රමය යටතේ එන ස්ථරායන නියැදිකරණ ක්‍රමය යොදා ගන්නා අතර දෙහිඅත්තකණ්ඩිය කලාපයේ ග්‍රාමීය පාසල් 03ක් මේ සඳහා තෝරා ගැනිණි. ඒ අනුව දත්ත රැස් කිරීම සඳහා තෝරාගත් පාසල් 03හි විදුහල්පතිවරුන්, එක් පාසලකින් සිසුන් විස්සක් බැගින් සිසුන් හැටක් සහ පරිපාලන නිලධාරීන් ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක සමඟ පවත්වන සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී හා ප්‍රතිඵල නිරීක්ෂණ යන ක්‍රම භාවිත කරන ලදී. ඒ තුළින් රැස් කරගත් දත්ත සංඛ්‍යාත්මක සහ විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේද ඇසුරින් විශ්ලේෂණය කෙරිණි. ඒ අනුව ගුරු හිඟය පියවා ගැනීම සඳහා කලාපීය මට්ටමින් ගුරු සංචලතාව, පන්ති ඒකාබද්ධ කිරීම, පාසල් සංවර්ධන සමිති අරමුදල් මගින් තාවකාලික ගුරුවරුන් බඳවා ගැනීම වැනි උපක්‍රම බහුලව පරිපාලනය විසින් භාවිත කරන බව අනාවරණය විය. ඒ වගේම සිසුන් විසින් උපකාරක පන්ති යාම, අන්තර්ජාලය ඔස්සේ ඉගෙනීම වැනි විකල්ප ක්‍රම යොදා ගනිමින් තම ඉගෙනීම් කටයුතු සිදු කරන බව අනාවරණය විය. කෙසේ වෙතත් මෙම තාවකාලික උපක්‍රම නිසා ගුරුවරුන් අධික කාර්යබහුලත්වයට පත්වීම, අධ්‍යාපනයේ ගුණාත්මක බව ගිලිහී යාම වැනි ගැටලු මතුවී ඇත. මෙම හේතු මත ග්‍රාමීය පාසල්වල ගුරු හිඟයට ස්ථිර විසඳුමක් ලෙස ප්‍රාදේශීය පදනම මත ගුරු පත්වීම් ලබාදීම, දුෂ්කර සේවා දිරිදීමනා විධිමත් කිරීම හා ස්මාර්ට් පන්ති කාමර හරහා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද හඳුන්වා දීම අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනයෙන් නිගමනය විය.

ප්‍රමුඛ පද: කළමනාකරණ උපක්‍රම, ගුරු හිඟය, ග්‍රාමීය පාසල්, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශය

මෙම අධ්‍යයනය සඳහා පී. ආර්. කේ. ඒ. විතාරණගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සංකේත ත්‍යාග ක්‍රමය භාවිත කරමින් බුද්ධ ධර්මය විෂය තුළදී පැවරුම් ඉටු කිරීමට මැළිකමක් දක්වන්නා වූ සිසුන් දිරිමත් කිරීමේ කාර්ය මූලික පර්යේෂණයක්

පී.එම්.එන්. මධුභාෂිණි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20399@arts.pdn.ac.lk

සංකේත ත්‍යාග ක්‍රමය භාවිත කරමින් 6 ශ්‍රේණියේ තෝරාගත් සිසුන්ගේ පැවරුම් සිදු කිරීම සඳහා වූ මැළිකම මඟහැරවීමේ ක්‍රියාමූලික පර්යේෂණයක් මෙහි අන්තර්ගතය. මාගේ ගුරු පුහුණු කාල සීමාව තුළ දී මහනුවර දිස්ත්‍රික්කයේ දෙනුවර කලාපයට අයත් පාසලක 6 ශ්‍රේණිය සඳහා බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමේ දී මම ලබාදුන් පැවරුම් නිසි පරිදි සම්පූර්ණ නොකරන, ඒ සඳහා මැළිකමක් දැක්වූ සිසුන් සිව්දෙනෙකු හඳුනාගනිමින් එම සිසුන් දිරිමත් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කළෙමි. මම පන්ති කාමරය තුළ පැවති මෙම ගැටලුව හඳුනා ගනිමින් ක්‍රියාමූලික පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ අභිසාරී පිරිසැලසුමට යටත්ව මෙම සිසුන් සිව්දෙනා ඇසුරින් සුවිශේෂී අරමුණු හතරක් යටතේ පූර්ව-පශ්චාත් පරීක්ෂණ හා මැදිහත්වීම් ත්‍රිත්වයක් තුළින් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය, ප්‍රත්‍යාවේක්ෂණය හා සංශෝධනය යන චක්‍රීය ක්‍රියාවලිය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කළෙමි. දත්ත රැස් කිරීම සඳහා පූර්ව-පශ්චාත් පරීක්ෂණ, පැවරුම් ලකුණු, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ ප්‍රත්‍යාවේක්ෂණ ජර්නලය උපකාර විය. ප්‍රමාණාත්මක දත්ත Ms Excel ප්‍රතිශත විශ්ලේෂණය මඟින් ද, ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණය මඟින් ද විග්‍රහ කර ඒකාබද්ධ කළෙමි. පැවරුම් ක්‍රියාවලියේ දී සිසුන්ගේ අවධානය වෙනතකට යොමුවීම, නිවෙස්වලින් ලැබුණු සහයෝගය ප්‍රමාණවත් නොවීම සහ මා හට තිබූ කාලවේලාව සීමා වීම වැනි ප්‍රායෝගික ගැටලුවලට මුහුණ දීමට සිදු විය. මා විසින් සිදු කරන ලද චක්‍රීය මැදිහත්වීම්වලින් පසු, මූලිකව 0% මට්ටමක පැවති පැවරුම් සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය 90%ක් දක්වා වර්ධනය වූ අතර එම සිසුන්ගේ කම්මැලි ස්වභාවය සාධනීය මට්ටමකින් මඟහැරී ගිය බවක් තහවුරු විය. කෙසේ වුවද, දීර්ඝකාලීනව එකම සංකේත ත්‍යාග ලබා දීමේ දී සිසුන් හට එය උදාසීන වීමේ අවදානම මාගේ පර්යේෂණයේ ඇති ප්‍රධාන සීමාවකි. මෙමඟින් ත්‍යාග පිළිබඳ ඇති උනන්දුව ගිලිහී ගොස් පර්යේෂණයේ ඵලදායීතාවය අඩු විය හැකි බවක් මම වටහා ගත්තෙමි. එබැවින් මෙම සීමාව මඟහරවා ගැනීමට ද්‍රව්‍යමය තෑගි වෙනුවට ප්‍රශංසා කිරීම් සහ විෂය තුළ නායකත්වය වැනි සමාජයීය අභිප්‍රේරක භාවිත කිරීම, ත්‍යාග ක්‍රමවේදය වරින්වර වෙනස් කිරීම වැනි විකල්ප උපායමාර්ග මම යෝජනා කරමි. මාගේ මෙම සොයාගැනීම් කනිෂ්ඨ ද්විතියික අංශවල න්‍යායාත්මක විෂයන් සඳහා චර්යාත්මක මාර්ගෝපදේශකත්වයක් ලෙස නවක ගුරුවරුන් හට වැදගත් වනු ඇතැයි මම විශ්වාස කරමි.

ප්‍රමුඛ පද: කාර්ය මූලික පර්යේෂණය, පැවරුම්, බුද්ධ ධර්මය, සංකේත ත්‍යාග ක්‍රමය,

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

සතිමත්භාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් පාදක උපක්‍රම භාවිතයෙන් බුද්ධ ධර්මය විෂයට අදාළ ගාථා මතක තබා ගැනීමේ කුසලතාව වර්ධනය කිරීම පිළිබඳ ක්‍රියාමූලික පර්යේෂණයක්.

ඩබ්ලිව්.එම්,ඩී.එස්. මධුශානි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20409@arts.pdn.ac.lk

අධ්‍යාපන ක්‍රියාවලියේ දී මතකය වැදගත් සාධකයකි. 06 ශ්‍රේණියේ සිසුන් ද්විතීයික අධ්‍යාපනයට පිවිසීමේ දී බුද්ධ ධර්මය විෂයේ පාලි ගාථා මතක තබා ගැනීම දරුවන්ට අපහසුතාවයක් ගෙන දේ. පාලි වචන උච්චාරණයට ඇති නුහුරුව සහ අවධානය යොමු කිරීමේ අපහසුව නිසා නිවැරදි අක්ෂර විනාශය හා රිද්මය සහිතව ගාථා කටපාඩම් කිරීමේ කුසලතාව ඔවුන්ගෙන් ගිලිහී ගොස් ඇත. එය අධ්‍යාපන ක්‍රියාවලියේ මතකය කෙරෙහි බලපාන ප්‍රධාන ගැටලුවකි. සතිමත්භාවය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම් ඇසුරින් 06 ශ්‍රේණියේ සිසුන්ගේ බුද්ධ ධර්ම විෂයට අදාළ පාලි ගාථා මතක තබා ගැනීමේ කුසලතාව වර්ධනය කිරීම මෙම ක්‍රියාමූල පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. එහිදී ගාථා මතක තබා ගැනීමට ඇති බාධා හඳුනා ගැනීම, උපක්‍රම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ එහි සාර්ථකත්වය ඇගයීම සිදු කරන ලදී. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියාමූල පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යාවේක්ෂණය යන පියවරයන්ගෙන් යුත් මැදිහත්වීම් තුනක් යටතේ මෙය මෙහෙයවන ලදී. එක් මැදිහත්වීමක් ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත විය. අරමුණුගත නියදිකරණය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ මා ගුරු පුහුණුව ලැබූ පාසලේ 06 ශ්‍රේණිය සිසුන්ට පෙර පරීක්ෂණයක් ලෙස බුද්ධ ධර්මය විෂයේ ගාථාවක් ලිවීමට හා කියවීමට ලබා දී එයින් සිසුන් 06 දෙනෙක් තෝරාගන්නා ලදී. මෙහිදී පාලි ගාථා කටපාඩම් කරවීම සඳහා සතිමත්භාවය සම්බන්ධ ක්‍රියාකාරකම් 06ක් වන ආශ්වාස ප්‍රශ්වාස කිරීමේ භාවනා ක්‍රමය 1-10/10-1 දක්වා ගණන් කිරීමේ ක්‍රමය, ආකර්ෂණීය ලෙස ගාථාව ලියා පාඩම් කරවීම, අමතක වන වචන විශේෂ කර ලිවීම, රිද්මය අනුව ගායනා කරවීම, සංඥා මඟින් ගාථාව සම්පූර්ණ කරවීම වැනි ක්‍රියාකාරකම් භාවිත කර ගාථා 03 ක් දරුවන්ට කටපාඩම් කරන ලදී. දත්ත රැස්කිරීම සඳහා පෙර පරීක්ෂණ, පසු පරීක්ෂණ, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල් යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කෙරිණි. ඒ අනුව පළමු මැදිහත්වීම යටතේ එක් ගාථාවක් ක්‍රියාකාරකම් 02 ක් යොදා ගනිමින් පුරුදු කළ අතර එයින් ඔවුන්ගේ මතක ශක්තිය හා නිවරදි උච්චාරණය වර්ධනය වීමක් දැකගත හැකි විය. ඒ අනුව විස්තරාත්මක විශ්ලේෂණය මඟින් අනාවරණය වූයේ මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වීමෙන් පාලි ගාථා මතක තබා ගැනීම, නිවැරදි උච්චාරණයෙන් ගායනා කිරීම හා ලිවීමේ කුසලතාව වර්ධනය වූ බවයි. ඒ අනුව පාලි ගාථා මතක තබා ගැනීමේ කුසලතාව වැඩි දියුණු කිරීමට යොදාගත හැකි සාර්ථක ක්‍රමවේද අතර සතිමත්භාවය සම්බන්ධ ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද: කුසලතා වර්ධනය, ක්‍රියාකාරකම් පාදක උපක්‍රම, ගාථා, සතිමත්භාවය, බුද්ධ ධර්මය

මෙම අධ්‍යයනය සඳහා විශාකා ලිඳකුඹුරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ශිෂ්‍යත්ව විභාගය සමත්ව ග්‍රාමීය පාසල්වල සිට නාගරික නේවාසික පාසල් වෙත සංක්‍රමණය වී අධ්‍යාපනය ලැබීම, එම සිසුන්ගේ මනෝ සමාජයීය යහ පැවැත්ම කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්.

ඕ.ජී. මධුශංක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20423@arts.pdn.ac.lk

ශ්‍රී ලංකා පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රාථමික අධ්‍යාපනයේ ඉතා වැදගත් සන්ධිස්ථානයක් වන ශිෂ්‍යත්ව විභාගය ග්‍රාමීය සිසුන්ට ප්‍රමුඛ පෙළේ නාගරික පාසල්වලට ඇතුළත් වීම සඳහා පවතින ප්‍රධාන මාවත වේ. මෙලෙස වාර්ෂිකව සැලකිය යුතු ශිෂ්‍ය ප්‍රජාවක් නාගරික පාසල් වෙත සංක්‍රමණය වන අතර, ඔවුන් විවිධ මනෝ සමාජයීය ගැටලුවලින් පීඩාවන්ට ලක් වීමේ ප්‍රවණතාවක් පවතින බව නිරීක්ෂණය විය. වාර්ෂිකව අබණ්ඩව මෙම සංක්‍රමණය සිදු වුවද මේ පිළිබඳ පර්යේෂණාත්මක සොයා බැලීම් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ ඉතා අල්පය. ග්‍රාමීය නාගරික සංස්කෘතිකමය වෙනස් වීම තෝරාගත් පාසලක සිසුන්ගේ මනෝ සමාජයීය යහ පැවැත්මට බලපාන ආකාරය සහ ඔවුන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග අධ්‍යයනය කර යෝග්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ අරමුණු වේ. ඒ අනුව මහනුවර පිරිමි ජාතික පාසලක ග්‍රාමීය සංක්‍රමණයෙන් පසු නේවාසිකව අධ්‍යාපනය ලබන 8 සහ 9 ශ්‍රේණියේ සිසුන් හතළිස් දෙනෙකු සම්බන්ධ කර ගනිමින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක අනුමිතික සැලසුමට අනුව ප්‍රත්‍යයක අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම පර්යේෂණයේ ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම සඳහා, නිර්ණායක මත පදනම්ව තෝරාගත් සිසුන් හතළිස් දෙනකුට ලයිකට් පරිමාණ ප්‍රශ්නාවලියක් ලබා දුන් අතර ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා උපරිම විචල්‍යතා ක්‍රමය සහිත අරමුණුසහගත නියැදිකරණ යටතේ සිසුන් දස දෙනෙකු සම්මුඛ සාකච්ඡාව සඳහා තෝරාගන්නා ලදී. ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම භාවිතයෙන් ද, ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය යොදා ගනිමින් විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණ සොයා ගැනීම්වලට අනුව සංක්‍රමණික ක්‍රියාවලිය සිසුන්ගෙන් 55%කට ධනාත්මකව ද, 40%කට සෘණාත්මකව ද, 5%කට මධ්‍යස්ථව ද බලපා ඇති බව අනාවරණය විය. එහිදී සමවයසේ මිතුරන් සමඟ සම්බන්ධතා ගොඩනැගීම, නව පරිසරයට අනුගත වීම, තාක්ෂණික උපකරණ භාවිතය, ස්වයං විශ්වාසය බිඳ වැටීම, අනන්‍යතාවය ගිලිහීයාම වැනි අභියෝගවලට ශිෂ්‍යයන් මුහුණ දෙන අතර සංක්‍රමණික බලපෑමේ දිශානතිය තීරණය වීම සහ අභියෝගයන්ට මුහුණ දීමේ ස්වභාවය කෙරෙහි පූර්ව සමාජානුයෝජනය, ශිෂ්‍ය අභ්‍යන්තර සාධක, නව පරිසරයේ අත්දැකීම්, පවුල මූලික සාධක යන පසුබිම් විචල්‍යයන් හතර ප්‍රධාන වශයෙන් බලපාන බව පර්යේෂණයෙන් සොයාගන්නා ලදි. ශිෂ්‍යත්ව විභාගය සමත්ව නාගරික නේවාසික පාසලකට ඇතුළත් කර ඉගැන්වීම ශිෂ්‍ය සාර්ථකත්වයට ප්‍රමාණවත් නොවන බවත්, ඒ සඳහා දෙමාපිය සහ ගුරුවරුන්ගේ සක්‍රිය මැදිහත්වීම සහ යහපත් මනෝ සමාජීය යහපැවැත්මක් ගොඩනැගීම සඳහා පුළුල් කාර්යභාරයක් සිදුවිය යුතු බව මෙම අධ්‍යයනයෙන් නිගමනය වේ. ඒ සඳහා සාධනීය විසඳුම් ලෙස දෙමාපියන් දැනුම්වත් කිරීම, ගුරුවරුන් සඳහා විශේෂ මාර්ගෝපදේශිත වැඩසටහන්, යහපත් මිතුරු සබඳතා ගොඩනැගීමේ සහ ශිෂ්‍ය කුසලතා සංවර්ධනය වැඩසටහන් සංවිධානය කිරීමේ අවශ්‍යතාවය පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : ග්‍රාමීය නාගරික ශිෂ්‍ය සංක්‍රමණය, නේවාසික පාසල් ජීවිතය, ශිෂ්‍යත්ව විභාගය, ශිෂ්‍යයන්ගේ මනෝ සමාජයීය යහපැවැත්ම

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

තෝරාගත් පාසලක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සුහුරු පන්ති කාමර සංකල්පය දායක වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

එම්.එම්.ඒ. මුණසිංහ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20452@arts.pdn.ac.lk

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තාක්ෂණයේ වේගවත් විකාශනයත් සමඟ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නවීන ක්‍රමවේදයක් ලෙස 'සුහුරු පන්ති කාමර' සංකල්පය හඳුන්වා දිය හැකිය. මෙය ඉගෙනුම් පරිසරය තාක්ෂණය සහිතව නවීකරණය කර, සිසුන්ට සහ ගුරුවරුන්ට ඉගෙනීම සහ ඉගැන්වීම වඩාත් විධිමත් හා ක්‍රියාකාරී කරවීමේ අරමුණින් ක්‍රියාත්මක වේ. සුහුරු පන්ති කාමරය තුළ භාවිත වන තාක්ෂණික උපකරණ සහ මෘදුකාංග යොදා ගැනීම සඳහා ගුරුවරුන්ගේ හැකියාව, පාසල් වටපිටාවේ පදනම් පහසුකම් මෙන්ම ආරක්ෂිත හා පවත්නා තාක්ෂණික සහය සහිත වාතාවරණයක් තිබිය යුතුය. නමුත් වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී බොහෝ පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සුහුරු පන්ති කාමර ස්ථාපිත කර තිබුණ ද ඒවා විධිමත්භාවයකින් භාවිත කරන ආකාරය දැක ගත නොහැකිය. මේ නිසා සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සුහුරු පන්ති කාමර සාක්ෂරතාවය බොහෝ සෙයින් බලපෑම් ඇති කරයි. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ සුහුරු පන්ති කාමර සංකල්පය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට දායක වන ආකාරය පිළිබඳව ගවේෂණය කිරීමයි. ඒ යටතේ පාසල තුළ සුහුරු පන්ති කාමරවල පවතින වත්මන් තත්ත්වය අනාවරණය කරගැනීම, ඒ පිළිබඳ ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ සංජානනයන් හඳුනාගැනීම මෙන්ම සුහුරු පන්ති කාමර භාවිතයේදී මුහුණ දීමට සිදුවන ප්‍රායෝගික ගැටලු විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදී. පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් බාලක පාසලක් යොදාගත් අතර, පර්යේෂණ නියැදිය ලෙස ගුරුවරුන් 05 දෙනෙකු සහ 09 ශ්‍රේණියේ සිසුන් 40 දෙනෙකු තෝරාගන්නා ලදී. දත්ත රැස් කිරීමේ ප්‍රධාන මෙවලම් ලෙස ගුරුවරුන් සමඟ පවත්වන ලද ව්‍යුහගත/අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ සිසුන් වෙනුවෙන් පවත්වන ලද කණ්ඩායම් සාකච්ඡා මෙන්ම පන්ති කාමර නිරීක්ෂණ ක්‍රමවේදය ද භාවිත කරන ලදී. රැස් කරගත් දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණයට ලක් කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව සුහුරු පන්ති කාමර භාවිතය නිසා සිසුන්ගේ පාඩම් කෙරෙහි පවතින අවධානය සහ උනන්දුව වර්ධනය වී ඇති අතර, ගුරුවරුන්ට වඩාත් නිර්මාණශීලි ලෙස විෂය කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබී ඇති අතර තාක්ෂණික මෙවලම් නඩත්තු කිරීමේ දුර්වලතා, අඛණ්ඩ විදුලි සැපයුමක් නොමැති වීම සහ ගුරුවරුන්ට පවතින තාක්ෂණික පුහුණුවේ මදිකම සුහුරු පන්ති කාමර භාවිතයේ පවතින ප්‍රධාන ගැටලු ලෙස හඳුනාගන්නා ලදී.

ප්‍රමුඛ පද: ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, සුහුරු පන්ති කාමර

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

සමවයස් සහයෝගී ඉගෙනුම් ක්‍රමය භාවිතයෙන් හය ශ්‍රේණියේ තෝරා ගත් සිසුන්ගේ සංඛ්‍යා ගුණ කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම පිළිබඳ කාර්යමූලික පර්යේෂණයක්

එස්.එච්.එස්.එන්. නිලුපුලී
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20469@arts.pdn.ac.lk

ගණිතය විෂය එදිනෙදා ජීවිතයේ ගැටලු විසඳීමේ දී සෑම අවස්ථාවකම භාවිත වන ඉතා ප්‍රායෝගික විෂයකි. එහි මූලික ගණිත කර්මයක් වන ගුණ කිරීම පිළිබඳ අවබෝධය සහ ප්‍රායෝගික භාවිතය සිසුන්ගේ පසුකාලීන ගණිත ඉගෙනුමට ඉතා වැදගත් වනු ඇත. සම්ප්‍රදායික ගුරු-කේන්ද්‍රීය ක්‍රමය යටතේ සිසු අවශ්‍යතාවන්ට ගැළපෙන ඉගැන්වීම් සීමා වීම නිසා ගුණ කිරීම පිළිබඳ අපේක්ෂිත සාධනයේ දුර්වලතා පවතී. ඒ සඳහා සිසුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය, අන්තර් සන්නිවේදනය මත පදනම් වූ සමවයස් සහයෝගී ඉගෙනුම් ක්‍රමය භාවිතයෙන් හය ශ්‍රේණියේ තෝරා ගත් සිසුන්ගේ සංඛ්‍යා ගුණ කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම කොතෙක්දුරට සාර්ථක වේදැයි අධ්‍යයනය කිරීමේ අරමුණින් මම මෙම පර්යේෂණය සිදු කළෙමි. මේ යටතේ මා විසින් ඉහළ සාධන මට්ටමවල සිසුන් සමඟ යුගල සහ කණ්ඩායම් කර සහයෝගයෙන් වීසඳීමට ගුණ කිරීමේ ගැටලු ලබා දීම, ගුණිත ක්‍රීඩා සහ සාකච්ඡා ඇතුළත් ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සිදු කළෙමි. අභ්‍යාස පොත් නිරීක්ෂණ, වාර විභාග ලකුණු සහ පෙර පරීක්ෂණ මගින් පහළ සාධන මට්ටමේ සිසුන් සිව් දෙනෙකු පර්යේෂණයේ නියැදිය ලෙස මම තෝරා ගත්තෙමි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස කාර්යමූලික පර්යේෂණ පිරිසැලැස්ම මා විසින් භාවිත කළ අතර මැදිහත්වීම් චක්‍ර තුනක් යොදා ගැනිණි. දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, සජීවී නිරීක්ෂණ, ගුරු-සිසු ප්‍රත්‍යාවේක්ෂණ ජර්නල සහ ලිඛිත ලේඛන යොදා ගැනිණි. ඒ ඇසුරෙන් රැස්කර ගත් දත්ත මම ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව විශ්ලේෂණය කළෙමි. ප්‍රමාණාත්මක දත්ත වගු හා ප්‍රස්තාර ඔස්සේ විස්තරාත්මක සංඛ්‍යාන මගින් විශ්ලේෂණය ද ගුණාත්මක දත්ත රාමු පදනම් විශ්ලේෂණය මගින් ද විශ්ලේෂණය කළෙමි. මෙම විශ්ලේෂණ මගින් අනාවරණය වූයේ මැදිහත්වීම්වලට පෙර සිසුන්ගේ සාමාන්‍ය ලකුණු මැදිහත්වීම්වලින් පසුව ඉහළ ගිය බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන්ගේ ගුණ කිරීමේ අවබෝධය, ගැටලු විසඳීමේ හැකියාව, ආත්ම විශ්වාසය සහ ගණිතය කෙරෙහි ධනාත්මක ආකල්ප සැලකිය යුතු ලෙස වර්ධනය වූ බව තහවුරු කරන ලදී. ඒ අනුව මෙම පර්යේෂණයෙන් නිගමනය කරනු ලැබුවේ ගුණ කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා සමවයස් සහයෝගී ඉගෙනුම් ක්‍රමය පහළ සාධන මට්ටම්වල සිසුන්ට මෙන්ම ඔවුන්ට සහය වූ ඉහළ සාධන මට්ටම්වල සිසුන්ට ද ඵලදායී උපායක් ලෙස යොදා ගත හැකි බවයි.

ප්‍රමුඛ පද: කාර්යමූලික පර්යේෂණය, ගණිතය විෂය, ගුණ කිරීමේ හැකියාව, සමවයස් සහයෝගී ඉගෙනුම, හය ශ්‍රේණියේ සිසුන්

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණි විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ජෙෘෂ්ඨ ද්විතීයික සිසුන්ගේ අනාගත වෘත්තීය අභිලාෂ කෙරෙහි පාසල් නිවේදන හා මාධ්‍ය කටයුතු ආශ්‍රිත සැඟවුණු විෂයමාලාවේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්: මහනුවර දිස්ත්‍රික්කය ඇසුරෙන්

ආර්.ඩී.සී.ඩී. පද්මසිරි
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20489@arts.pdn.ac.lk

පාසල් ආශ්‍රිතව මාධ්‍ය හා නිවේදන කටයුතු යනු සිසුන්ගේ සන්නිවේදන කුසලතාවයන් හා ආත්ම විශ්වාසයන් වර්ධනය මෙන්ම සැඟවුණු දක්ෂතා ඉස්මතු කිරීම උදෙසා සිදු කරන විෂය සමගාමී ක්‍රියාකාරකමකි. නමුත් පාසල තුළ මාධ්‍ය ක්‍රියාකාරකම්වල අතිශය දක්ෂතා දක්වන සිසුන් පවා පාසල් අධ්‍යාපනයෙන් පසු සම්පූර්ණයෙන්ම වෙනස් සම්ප්‍රදායික වෘත්තීන් වෙත යොමුවීමේ ප්‍රවණතාවක් පවතී. අනාගත වෘත්තියක් ලෙස හෝ දෙවන වෘත්තියක් ලෙසවත් ඔවුන් මාධ්‍ය ක්ෂේත්‍රය තෝරා නොගැනීමට බලපාන සැබෑ හේතු ගවේෂණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. ඒ අනුව පාසල් තුළ ජෙෘෂ්ඨ ද්විතීයික සිසුන් ආශ්‍රිතව පවතින නිවේදන හා මාධ්‍ය කටයුතුවල වත්මන් ස්වභාවය අධ්‍යයනය කිරීමත්, ඔවුන්ගේ වත්මන් අභිලාෂවල ස්වභාවය අධ්‍යයනය කිරීමත්, ඒවාට ඇති බාධා හා අභියෝග හඳුනාගැනීමත් මේ හරහා සිදු විය. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටලුව ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ ජෙෘෂ්ඨ ද්විතීයික සිසුන්ගේ වෘත්තීය අභිලාෂ කෙරෙහි පාසල් නිවේදන හා මාධ්‍ය කටයුතු ආශ්‍රිත සැඟවුණු විෂයමාලාව බලපාන ආකාරය අධ්‍යයනයට ලක් කෙරිණි. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ පහසු නියැදිකරණය උපයෝගී කරගනිමින් මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් 1AB පාසලක් හා 1C පාසලක් මෙන්ම Type2 පාසලක් පාසල් තුනකින් 10 සහ 11 ශ්‍රේණිවල සිසුන් 60ක් සහ ගුරුවරුන් 15 දෙනෙකුගෙන් යුත් නියැදියක් වෙතින් දත්ත රැස් කරන ලදී. ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නාවලි යොදාගත් අතර ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා යොදාගන්නා ලදී. ලබාගත් ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය සහ ගුණාත්මක දත්ත බ්‍රෝන් සහ ක්ලාක්ගේ තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ විශ්ලේෂණයට ලක් විය. දත්ත විශ්ලේෂණයේදී අනාවරණය වූයේ මාධ්‍ය කටයුතු සඳහා ඉහළ කුසලතා දක්වන සිසුන්ගෙන් බහුතරයක් සිය අනාගත වෘත්තිය ලෙස සම්ප්‍රදායික රැකියා තෝරාගෙන ඇති බවයි. ඊට ප්‍රධානතම හේතුව ලෙස පාසල් සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන 'සැඟවුණු විෂයමාලාව' හඳුනා ගැනීමට හැකි විය. විශේෂයෙන්ම ගුරුවරුන් විසින් මාධ්‍ය කටයුතු වෘත්තියකට වඩා හුදෙක් පාසලේ උත්සව අවශ්‍යතා සපුරාගන්නා විනෝදාංශයක් ලෙස අර්ථකථනය කිරීමත් පිරිමි සහ ගැහැණු සිසුන් අතර රාජකාරි බෙදීමේදී දක්වන සම්ප්‍රදායික ආකල්ප ද සිසුන්ගේ දැක්ම සීමා කිරීමට ප්‍රබලව බලපා ඇති බව තහවුරු විය. සමස්තයක් ලෙස නිවේදන හා මාධ්‍ය කුසලතා වෘත්තීය අභිලාෂයන් බවට පත් නොවී යටපත් වීමට පාසලේ සැඟවුණු විෂයමාලාව අදෘශ්‍යමාන බාධකයක් ලෙස ක්‍රියා කරන බව නිගමනය කෙරිණි. මෙය අවම කිරීම සඳහා විධිමත් වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පාසල් මාධ්‍ය සමාජ තුළට බද්ධ කිරීම යෝජනා කරන ලදී.

ප්‍රමුඛ පද: ජෙෘෂ්ඨ ද්විතීයික සිසුන්, මාධ්‍ය කටයුතු, වෘත්තීය අභිලාෂ, සැඟවුණු විෂයමාලාව

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ක්‍රීඩා හා ක්‍රියාකාරකම් මගින් පුරවැසි අධ්‍යාපන විෂය කෙරෙහි සිසුන් තුළ පවතින ආකල්ප සංවර්ධනය කිරීම පිළිබඳව අධ්‍යයනයක්

පී.එච්.එම්. පතිරණ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20492@arts.pdn.ac.lk

වර්තමාන පාසල් පද්ධතිය තුළ පුරවැසි අධ්‍යාපන විෂය බොහෝ විට ගුරුවරයා කේන්ද්‍ර කරගත් සම්ප්‍රදායික දේශන ක්‍රමවේද හරහා ඉගැන්වේ. මෙහිදී සිසුන් හුදෙක් ශ්‍රවණය කරන්නන් බවට පත්වන අතර විෂය කරුණු කටපාඩම් කිරීමට පමණක් පෙළඹේ. පුරවැසි අධ්‍යාපන විෂය නායකත්වය, සාමූහිකත්වය සහ නීතිගරුක බව වැනි යහපත් ආකල්ප හා කුසලතා ප්‍රායෝගිකව වර්ධනය කළ යුතු විෂයක් වුවද, පවතින ඒකාකාරී ඉගෙනුම් ක්‍රියාවලිය හේතුවෙන් සිසුන් තුළ මේ කෙරෙහි පවතින්නේ ඍණාත්මක ආකල්පයකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් භාවිතයෙන් පුරවැසි අධ්‍යාපන විෂය කෙරෙහි සිසුන් දක්වන ආකල්ප ධනාත්මකව සංවර්ධනය කිරීමයි. මිශ්‍ර පර්යේෂණ ප්‍රවේශයක් අනුගමනය කරමින්, ක්‍රියා මූලික පර්යේෂණයක් ලෙස මෙය සැලසුම් කරන ලදී. පර්යේෂණ නියැදිය ලෙස මා ගුරු පුහුණුව ලද නාගරික බාලිකා පාසලක 7 ශ්‍රේණියේ පන්තියක සිසුන් 45 දෙනෙකු තෝරාගැනිණි. යුතුකම් හා අයිතිවාසිකම්, ඥාතිත්වය සහ පුරවැසි ගුණාංග වැනි තේමාවන් ඉගැන්වීම සඳහා ප්‍රහේලිකා, භූමිකාරංගන , ගීත බණ්ඩයකට බෝලයක් සිසුන් අතර හුවමාරු කර අහඹු ලෙස එය නවත්වා බෝලය අත ඇති සිසුවාගෙන් ප්‍රශ්න ඇසීම සහ 'රත් වූ පුටුව' (Hot Seat) වැනි සරල පන්තිකාමර ක්‍රියාකාරකම් භාවිත කරන ලදී. පූර්ව සහ පශ්චාත් ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා සහ විධිමත් නිරීක්ෂණ මගින් ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්ත රැස්කර විශ්ලේෂණය කරන ලදී. පූර්ව ප්‍රශ්නාවලිය මගින් සිසුන් තුළ පැවති ඍණාත්මක ආකල්ප, පශ්චාත් ප්‍රශ්නාවලිය වන විට ධනාත්මක දිශාවකට පරිවර්තනය වී ඇති බව තහවුරු විය. ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් පාදක කරගත් ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය මගින් විෂය කෙරෙහි පවත්න ආකල්ප ඉහල නැංවීම, ප්‍රායෝගික පුරවැසි කුසලතා වර්ධනය කිරීම සහ භෞතික සීමාවන් ජයගැනීම යන තේමා ඔස්සේ සිසුන්ගේ විෂයානුබද්ධ ආකල්පමය පරිවර්තනයක් සිදුකළ හැකි බව මා හට මේ තුළින් වැටහිණි. කණ්ඩායම් ක්‍රියාකාරකම් තුළින් සිසුන් තුළ සහයෝගීතාවය, සාමූහිකත්වය සහ නායකත්ව ගුණාංග ප්‍රායෝගිකව වර්ධනය වූ අතර, ඉගෙනුම් ක්‍රියාවලියේ පැවති ඒකාකාරී බව ඉවත් වී සිසුන් තුළ ඉහළ ඇල්මක් ඇති විය. ඩිජිටල් පහසුකම් හෝ විශාල ඉඩකඩක් නොමැති අඩු පහසුකම් සහිත ඕනෑම පන්ති කාමරයක වුවද ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන මෙවලමක් ලෙස මෙම සරල ක්‍රීඩා සහ ක්‍රියාකාරකම් සාර්ථකව භාවිත කළ හැකි බව මෙම පර්යේෂණය මගින් හඳුනා ගත හැකි විය. මෙම පර්යේෂණය තුළින් සම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය ක්‍රමවේදයෙන් මිදී, සීමිත සම්පත් කළමනාකරණය කරමින් නව්‍යකරණ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට වෘත්තීමය වශයෙන් පරිණත වීමටත් මට හැකි විය.

ප්‍රමුඛ පද: ආකල්ප සංවර්ධනය, ක්‍රීඩා සහ ක්‍රියාකාරකම්, පුරවැසි අධ්‍යාපනය, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම

මෙම පර්යේෂණය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

පාසල් කාලයේ ක්‍රීඩා හා කලා අත්දැකීම් පුද්ගල වෘත්තීය ප්‍රවීණත්වයට බලපා ඇති ආකාරය පිළිබඳ බහුවිධ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක්

එස්.ඩී.පී.එන්. ප්‍රේමවංශ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20530@arts.pdn.ac.lk

වර්තමාන ශ්‍රී ලාංකේය අධ්‍යාපන සන්දර්භය තුළ බොහෝ විට විෂය දැනුමට පමණක් මුල්තැන දෙන ඉගෙනුම් රටාවක් දැකිය හැකි වුවද, වෘත්තීය ලෝකයේ විශිෂ්ටයන් වීමට පාසල් කාලයේ ලබන විෂය සමගාමී අත්දැකීම් ප්‍රබල පාලමකි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ විවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තීය ප්‍රවීණත්වයට පත් වූ පුද්ගලයන්ගේ සාර්ථකත්වය කෙරෙහි පාසල් අවධියේ ක්‍රීඩා සහ කලා අත්දැකීම් දායක වී ඇති ආකාරය පිළිබඳ බහුවිධ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයක් සිදු කිරීමයි. වෘත්තීය ප්‍රවීණයන් පාසල් අවධියේදී අත්පත් කරගත් සුවිශේෂී කුසලතා සහ ආකල්ප හඳුනා ගැනීම, ක්‍රීඩාවෙන් ලැබූ විනය, කණ්ඩායම් හැඟීම හා පීඩනය දරාගැනීමේ හැකියාව වෘත්තීය අභියෝග ජය ගැනීමට බලපාන ආකාරය ගවේෂණය කිරීම සහ කලාවෙන් පෝෂණය වූ නිර්මාණශීලී චින්තනය හා සන්නිවේදන කුසලතා වෘත්තීය නවෝත්පාදන සඳහා දායක වන ආකාරය විශ්ලේෂණය කිරීම මෙහි සුවිශේෂී අරමුණු විය. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයක් භාවිත කරන ලද මෙම අධ්‍යයනය සඳහා බහුවිධ ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සැලසුම යොදා ගැනිණි. අරමුණුසහගත නියැදිකරණය යටතේ ජාතික මට්ටම නියෝජනය කළ ක්‍රීඩා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් 05 දෙනෙකු සහ වසර 20 ක සේවා කාලයක් සහිත ජාතික සම්මානලාභී කලා ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් 05 දෙනෙකු ලෙස සමස්ත නියැදිය පුද්ගලයන් 10 දෙනෙකුගෙන් (n=10) සමන්විත විය. ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ අතීත ආවර්ජන ක්‍රමවේදයන් ද, ද්විතීයික දත්ත සඳහා චරිතාපදාන හා ලිපි ලේඛන විමර්ශනය ද පර්යේෂණ මෙවලම් ලෙස භාවිත කරන ලදී. රැස් කරගන්නා දත්ත විස්තරාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කරන ලදී. මෙම පර්යේෂණය මගින් හුදෙක් විධිමත් අධ්‍යාපනයෙන් ඔබ්බට ගිය, සන්නිවේදනය, ගැටලු විසඳීම සහ නායකත්වය වැනි මෘදු කුසලතා වෘත්තීය විශිෂ්ටත්වය සහ ප්‍රවීණත්වය සඳහා අත්‍යවශ්‍ය වන ආකාරයත්, ඒවා පාසල් කාලයේ ක්‍රීඩා සහ කලා ක්‍රියාකාරකම් තුළින් සාර්ථකව පෝෂණය වන ආකාරයත් අනාවරණය කර ගැනීමට හැකි විය. සමාජ සචලතාවයට පාසල් කාලයේ ක්‍රීඩා හා කලා අත්දැකීම් බොහෝ අවස්ථාවලදී බලපා ඇති බව ද මෙම පර්යේෂණයේදී අනාවරණය කරගත හැකි විය. තවද, මෙම සොයාගැනීම් මත පදනම්ව වර්තමාන පාසල් විෂයමාලාව තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල ගුණාත්මක දායකත්වය පුළුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික යෝජනා ද ඉදිරිපත් කෙරේ.

ප්‍රමුඛ පද: මෘදු කුසලතා, වෘත්තීය ප්‍රවීණත්වය, සමාජ සචලතාව

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීයික සිසුන්ගේ මනෝ සමාජය ගැටලු විසඳීම සඳහා උපදේශන ගුරුවරයා භාවිත කරන ශිල්පීය ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

අයි.එස්. රාජකරුණා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20545@arts.pdn.ac.lk

වර්තමාන සමාජය හා අධ්‍යාපන පද්ධතිය වේගයෙන් වෙනස් වන පසුබිමක කනිෂ්ඨ ද්විතියික අවධියේ සිසුන් විවිධ මනෝ සමාජීය ගැටලුවලට මුහුණ දෙනු දැකිය හැක. එරික්සන් පෙන්වා දෙන පරිදි, නව යෞවනය තුළ ඔහුගේ අනන්‍යතාවයට බාධා එල්ල කළ විට සතුට ඉවත් වී මානසික ව්‍යාකූලත්වය ඇති වේ. ඒ අනුව කනිෂ්ඨ ද්විතීයික සිසුන්ගේ මනෝ සමාජය ගැටලු විසඳීම සඳහා උපදේශන ගුරුවරයා භාවිත කරන ශිල්පීය ක්‍රම අධ්‍යයනය කිරීම මූලික අරමුණ කර ගනිමින්, කනිෂ්ඨ ද්විතියික සිසුන්ගේ මනෝ සමාජීය ගැටලු අධ්‍යයනය කිරීම, එම ගැටලුවට බලපාන හේතු සාධක හඳුනා ගැනීම, එම ගැටලු විසඳීම සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම, එම ගැටලු විසඳීම සඳහා යොදාගත හැකි නව ශිල්පීය ක්‍රමය යෝජනා කිරීම සෙසු අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මේ පර්යේෂණයට දත්ත රැස් කිරීමේදී අරමුණු සහිත නියැදිකරණය ඔස්සේ පාසල් වර්ගීකරණයට අනුව, මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් දහයක් ලෙස, (1AB) පාසල් තුනක් (1C) පාසල් තුනක් හා (Type2) වර්ගයේ පාසල් හතරක් තෝරාගෙන ඒවායේ කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන් දහයක් තෝරාගෙන ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කරන ලදී. ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දත්ත විශ්ලේෂණ ක්‍රම ද්විත්වයම යොදා ගනිමින් මිශ්‍ර ක්‍රමවේදය අනුගමනය කරන ලදී. මෙහිදී බොහෝ දරුවන්ට අනවශ්‍ය ලෙස කේන්ති යාම, තනි වූ හැඟීම, සමාජ සබඳතා ගොඩනගා ගැනීමට අකමැතිවීම, ආත්ම විශ්වාසය අවමවීම යන ගැටලු ඇති බවත් අනාවරණය විය. මේ ගැටලුවලට බලපාන හේතු ලෙස, විශාල වශයෙන් පවුල් පරිසරය, ආර්ථික අපහසුතා, සමවයස් මිතුරන්ගෙන් එල්ල වන කරදර හා ජංගම දුරකථන භාවිතය අධික වීම යනාදිය අනාවරණය විය. මේ ගැටලු විසඳීමට දැනට උපදේශන ගුරුවරයා නිදහස් සටිටනය, සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත කරවීම, පෞද්ගලිකව කතා කිරීම අධික ලෙස යොදාගන්නා බව අනාවරණය වූ අතර, මේ ගැටලු විසඳීම සඳහා Water Theropy, Vison board, සුරතල් සතුන් සමඟ කාලය ගත කිරීමට ඉඩ දීම, නව තාක්ෂණය භාවිත කරමින් ඇප් එකක් හඳුන්වාදීම, කෘතඥතා දින පොතක් පවත්වාගෙන යාම වැනි නව ශිල්ප ක්‍රම තුළින් කනිෂ්ඨ ද්විතීයික සිසුන්ගේ මනෝ සමාජීය ගැටලු අවම කරගත හැකි බව නිගමනය කළ හැක.

ප්‍රමුඛ පද: උපදේශන ගුරුවරයා, කනිෂ්ඨ ද්විතීයික අංශය, මනෝ සමාජීය ගැටලු, ශිල්පීයක්‍රම

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ සිසුන් අතර ක්‍රීඩා සහභාගිත්වය සඳහා බලපාන සාධක සොයා බැලීම සහ ක්‍රීඩා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනයක්

ආර්.එම්.බී.පී. රත්නායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20581@arts.pdn.ac.lk

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වන්නේ ශාස්ත්‍රීය දැනුම ලබාදීම පමණක් නොව ශිෂ්‍යයාගේ පූර්ණ පෞරුෂ වර්ධනය උදෙසා මගපෙන්වීමයි. ඒ සඳහා ක්‍රීඩාව අත්‍යවශ්‍ය සාධකයක් වුවද, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨ සිසුන් අතර අන්තර් පීඨ තරගාවලි නියෝජනය සහ පොදු ක්‍රීඩා සහභාගිත්වය අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ශාස්ත්‍ර පීඨ සිසුන් ක්‍රීඩාවෙන් බැහැර වීමට බලපාන මූලික හේතු සාධක ඔවුන්ගේ ජීවන අත්දැකීම් ඇසුරින් ගවේෂණය කිරීමයි. සිසුන් ක්‍රීඩාව කෙරෙහි දක්වන ආකල්ප හඳුනා ගැනීම, විශ්වවිද්‍යාල අවධියේදී ක්‍රීඩා නතර කිරීමට බලපෑ පෞද්ගලික, පාරිසරික හා ප්‍රායෝගික බාධා (පහසුකම් සහ උපදේශනය පිළිබඳ ගැටලු) විග්‍රහ කිරීම සහ ක්‍රීඩා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සිසුන් සතු යෝජනා ලබා ගැනීම මෙහි සුවිශේෂී අරමුණු විය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කෙරිණි. අරමුණුසහගත නියැදිකරණ ක්‍රමවේදය මගින් පාසල් කාලයේ ක්‍රීඩා කළ වර්තමානයේ ක්‍රීඩාව නතර කළ සිසුන් 05ක්, පාසල් කාලයේ ක්‍රීඩා නොකළ වර්තමානයේ විශ්වවිද්‍යාලයේදී ක්‍රීඩා කරන සිසුන් 05ක්, පාසල් කාලයේ ද වර්තමානයේ විශ්වවිද්‍යාලයේදී ද ක්‍රීඩා කරන සිසුන් 05ක් සහ කිසිදා ක්‍රීඩා නොකළ සිසුන් 05ක් වශයෙන් කාණ්ඩ සතරකින් යුත් සිසුන් 20 දෙනෙකුගේ නියැදියක් (n=20) තෝරාගෙන පර්යේෂණය සිදු කරන ලදී. ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි භාවිත කළ අතර, ද්විතීයික දත්ත සඳහා ලිපි ලේඛන විමර්ශනය සිදු කෙරිණි. රැස් කරගන්නා දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය ඇසුරින් විශ්ලේෂණය කෙරුණි. ශාස්ත්‍රීය පීඩනය, පැවරුම් බහුල වීම සහ පීඨයේ බහුතරයක් සිසුන් මුහුණ දෙන සුවිශේෂී සමාජීය හා මනෝවිද්‍යාත්මක බාධා සිසුන් ක්‍රීඩාවෙන් බැහැර වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව මෙමගින් අනාවරණය විය. මෙම පර්යේෂණයේ අනාවරණ ශාස්ත්‍ර පීඨ සිසුන්ගේ ශාස්ත්‍රීය කාර්යබහුලත්වය මධ්‍යයේ වුවද ඔවුන්ගේ ක්‍රීඩා සහභාගිත්වය සහ පූර්ණ පෞරුෂ වර්ධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික වැඩපිළිවෙළක් සහ උපදේශන සේවාවක් විශ්වවිද්‍යාලය තුළ සැලසුම් කිරීමට මහෝපකාරී වනු ඇත.

ප්‍රමුඛ පද: අධ්‍යයන පීඩනය, ප්‍රායෝගික බාධා

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

අ.පොස. සාමාන්‍ය පෙළ සිසුන් ගණිතය විෂය සඳහා අමතර පන්තිවලට යොමු වීමට බලපාන හේතු විමර්ශනය කිරීමඨ මහනුවර දිස්ත්‍රික්කය ඇසුරින්

ආර්.එම්.එස්.එන් රත්නායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20593@arts.pdn.ac.lk

ඕනෑම රටක අධ්‍යාපන පද්ධතියක මූලිකම පදනම පාසල් අධ්‍යාපනය වන අතර, ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපනය තුළ අ.පොස සාමාන්‍ය පෙළ විභාගය සිසුවෙකුගේ අනාගත වෘත්තීය සහ උසස් අධ්‍යාපන ගමන් මග තීරණය කරන තීරණාත්මක සාධකයකි. එහිදී ගණිතය අනිවාර්ය විෂයක් වන අතර, වර්තමාන ශ්‍රී ලාංකීය අධ්‍යාපන සංස්කෘතිය තුළ පාසල් පද්ධතියෙන් නොමිලේ ලබාදෙන අධ්‍යාපනයට පරිබාහිරව, ගණිතය විෂය සඳහා අතිරේක උපකාරක පන්ති මත සිසුන් දැඩි ලෙස යැපීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. අ.පොස සාමාන්‍ය පෙළ සිසුන් ගණිතය විෂය සඳහා අමතර පන්තිවලට යොමු වීමට බලපාන මූලික හේතු හඳුනා ගැනීම හා එමගින් පාසල් පද්ධතිය තුළ ගණිතය ඉගෙනීමේ දී පවතින ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මූලික අරමුණ කරගනිමින් ගණිතය විෂය සඳහා අමතර පන්ති වෙත සිසුන් යොමු වීමට බලපාන මූලික හේතු හඳුනා ගැනීම, ඒ සඳහා සිසුන් යොමු වීමට පාසල තුළින් ඇතිකරන්නා වූ බලපෑම මෙන්ම සමාජීය අතින් ඇති කරන්නා වූ බලපෑම විමර්ශනය කිරීම සෙසු අරමුණු කොට ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතයෙන් සිදු කළ මෙම පර්යේෂණය මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලකින් සිසුන් 40 ක් පහසු නියැදිකරණය යටතේ තෝරාගෙන ප්‍රශ්නාවලියක් මඟින් දත්ත රැස් කරන ලදි. එලෙස රැස් කරගත් ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාන විශ්ලේෂණය යටතේ ගැඹුරින් අධ්‍යයනය කරන ලදී. පර්යේෂණ ප්‍රතිඵලවලට අනුව, සිසුන් අතිරේක පන්ති වෙත යොමුවීමට පාසල් පරිසරයෙන් එල්ලවන බලපෑම ඉතා ප්‍රබල බව හෙළි විය. පාසල් පන්ති කාමරය තුළ පවතින ඉගෙනුම් වටපිටාව බාධාවක් බව සිසුන්ගෙන් 57.5% ක් ප්‍රකාශ කර ඇති අතර, පාසලට වඩා උපකාරක පන්තිවල උගන්වන කෙටි ක්‍රම නිසා ගණිතය විෂය පහසුවන බව 60%ක් සඳහන් කර ඇත. එමෙන්ම උපකාරක පන්තිවල පවත්වන අඛණ්ඩ පරීක්ෂණ නිසා විභාග බිය නැතිවන බව 55% කගේ අදහසයි. මෙම අධ්‍යයනයෙන් තහවුරු වූයේ සමාජීය බලපෑමට වඩා විෂයෙහි පවතින සංකීර්ණ ස්වභාවය, විෂය කෙරෙහි ඇති බිය සහ පාසල තුළින් ලැබෙන අවධානය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සිසුන් උපකාරක පන්ති මත බහුලව යැපෙන බවයි.

ප්‍රමුඛ පද: අමතර පන්ති, ගණිතය විෂය, අ.පොස සාමාන්‍ය පෙළ සිසුන්, ද්විතීයික අධ්‍යාපනය, පාසල් පද්ධතිය, සමාජයීය බලපෑම

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල උපදේශන සේවයේ යෙදෙන ගුරුවරුන්ගේ පාසල් උපදේශනය පිළිබඳ දැනුම්වත්භාවය සම්බන්ධ අධ්‍යයනයක්

ආර්.එම්.ඩී.එස්. රත්නායක
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20591@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ විශේෂයෙන්ම කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල ඉගෙනුම ලබන යොවුන් වියේ පසුවන සිසුන් මුහුණ දෙන මනෝ සාමාජීය සහ අධ්‍යාපනික අභියෝගයන්ට සහය වීම සඳහා පාසල් උපදේශනය ආරම්භ කර ඇත.(ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය, 2024) එහෙත් සිසුන්ට ස්ථිර හා නිශ්චිත විසඳුම් ලැබීම පිළිබඳ පවතින ගැටලුවලට ප්‍රධාන හේතුවක් වන්නේ උපදේශන ගුරුවරුන්ගේ දැනුම්වත්භාවය ප්‍රමාණවත් නොවීමයි. කනිෂ්ඨ ද්විතීයික ශ්‍රේණිවල උපදේශන සේවයේ යෙදෙන ගුරුවරුන්ගේ උපදේශන දැනුම්වත්භාවයේ මට්ටම සහ එම මට්ටම වර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ගුරුවරුන්ගේ උපදේශන දැනුම්වත්භාවයේ මට්ටම අධ්‍යයනය කිරීමය. සුවිශේෂී අරමුණු ලෙස මූලික උපදේශන සංකල්ප පිළිබඳ අවබෝධය හඳුනා ගැනීම, දැනුම්වත්භාවය සම්බන්ධ ගැටලු සහ ඒවාට බලපාන හේතු විශ්ලේෂණය කිරීම සහ ගුරුවරුන්ගේ දැනුම්වත්භාවය වර්ධනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම අපේක්ෂා කෙරේ. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවේශයක් සහිත මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිත කිරීමට සැලසුම්කර ඇත. පර්යේෂණ නියැදිය ලෙස බදුල්ල දිස්ත්‍රික්කයේ කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පාසල්වල උපදේශන සේවය යෙදෙන ගුරුවරුන් 25 ක් දෙමව්පියන් 5 ක් සාරම්මන නියැදීමේ ක්‍රමය යටතේ තෝරාගැනීමට අපේක්ෂිතය. දත්ත රැස්කිරීම ප්‍රශ්නවලි සහ සම්මුඛ සාකච්ඡා යන උපකරණ ඇසුරින් සිදු කිරීමට බලාපොරොත්තු වන අතර එම දත්ත අතරින් ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේදය යටතේ වගු හා ප්‍රස්තාර මඟින් ද ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය මඟින් ද විශ්ලේෂණය කිරීමට සැලසුම්කර ඇත. මෙහිදී තේමා විශ්ලේෂණය භාවිත කිරීමට නියමිතය. උපදේශන ගුරුවරුන්ට පවතින බොහෝ භූමිකා ගැටලු සහ නිසි ප්‍රායෝගික පුහුණුවක් නොමැතිකම වැනි කරුණු මෙමගින් අනාවරණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණය අවසානයේ ගුරුවරුන්ගේ උපදේශන දැනුම් මට්ටමේ පරතරය අවම කරමින් පාසල් උපදේශන සේවාව වඩාත් සාර්ථක කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සහ යෝජනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද : උපදේශන සේවයේ යෙදෙන ගුරුවරුන්, උපදේශනය දැනුම්වත්භාවය කනිෂ්ඨ, ද්විතීයික ශ්‍රේණි

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන්ගේ සාහිත්‍ය රසාස්වාදන කුසලතාව සංවර්ධනය කිරීමෙහිලා සිංහල විෂය උගන්වන ගුරුවරුන් විසින් භාවිත කරන ශිල්ප ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්.

කේ.ඩී. සංජානා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20675@arts.pdn.ac.lk

සිසුන්ගේ සෞන්දර්යාත්මක රසවින්දනය සහ නිර්මාණශීලී චින්තනය ඉහළ නැංවීම උදෙසා පාසල් විෂයමාලාව තුළ භාවිත කළ හැකි ප්‍රබලතම ප්‍රකාශන මාධ්‍යයක් ලෙස සිංහල සාහිත්‍ය හඳුනා ගත හැකිය. ශ්‍රී ලාංකේය පාසල් පද්ධතියේ මෙයට සුවිශේෂ වටිනාකමක් හිමි වුවද, වත්මන් 11 ශ්‍රේණියේ සිසුන්ගේ රසවින්දන කුසලතා වල පැහැදිලි පසුබෑමක් දැකිය හැකිය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ 11 ශ්‍රේණියේ සිසුන්ගේ වත්මන් සාහිත්‍ය රසාස්වාදන මට්ටම, ගුරුවරුන් භාවිත කරන ශිල්ප ක්‍රම වල දායකත්වය, පවතින ගැටලු හඳුනා ගෙන ඒවාට එලදායී ශිල්පීය ක්‍රම යෝජනා කිරීමයි. මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය ප්‍රවේශය භාවිත කළ අතර පර්යේෂණ පිරිසැලැස්ම ලෙස විවරණීය අභිසාරී මිශ්‍රකම පිරිසැලැස්ම භාවිත කෙරිණි. එහිදී ප්‍රමාණාත්මක දත්ත රැස්කිරීම සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක්ද, ගුණාත්මක දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ පන්ති කාමර නිරීක්ෂණද භාවිත විය. පර්යේෂණ නියැදිය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ 1AB සහ 1C පාසල් දෙකක් තෝරා ගත් අතර, අරමුණුගත නියැදිකරණය යටතේ සිංහල විෂය උගන්වන ගුරුවරුන් 10 දෙනෙකු සහ 11 ශ්‍රේණියේ සිසුන් 20 දෙනෙකු බැගින් සමස්ත නියැදිය 30ක් (n=30) තෝරා ගැනිණි. රැස්කරගත් ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යාන ක්‍රමවේද ඇසුරින්ද, ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය මඟින්ද දත්ත අර්ථකථනයට ලක් කෙරිණි. විෂය ඉගැන්වීම සඳහා 85% ක් ගුරුවරු සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රම භාවිත කරන අතර සිසුන්ගේ වාර විභාග වල මධ්‍යන්‍ය ලකුණු 50-64 මට්ටමක පැවතීමෙන් ඔවුන්ගේ විෂය ධාරිතා මට්ටම මධ්‍යස්ථ බව හෙළි විය. සම්මුඛ සාකච්ඡාවලදී නවීන ශිල්ප ක්‍රමවලට තමන් ප්‍රිය කරන බව 95%ක සිසුන් ප්‍රකාශ කළ අතර, නාට්‍යමය ක්‍රම මඟින් මතකය 90%කින් තහවුරු වන බව හෙළි විය. එහිදී හඳුනාගත් ප්‍රධාන ප්‍රායෝගික බාධක වන්නේ විභාග කේන්ද්‍රීය පීඩනය (90%), සීමිත කාල පරිච්ඡේද (75%) සහ තාක්ෂණික මෙවලම් හිඟකමයි (70%). ගුණාත්මක දත්ත මඟින් අනාවරණය වූයේ, සිසුන්ගේ අභ්‍යාස පොත් රසවින්දනයෙන් තොරව විභාග ආකෘතියට පමණක් සීමා වී ඇති බවයි. කෙසේ නමුත් විභාග කේන්ද්‍රීය කට පාඩම් ක්‍රමයෙන් මිදී භූමිකා රංගනය, කවි විරිත් ගායනය, තාක්ෂණික මෙවලම් භාවිතය වැනි ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම මඟින් ශිෂ්‍යයන්ගේ රසාස්වාදන කුසලතා සංවර්ධනය වන බව ගුරුවරු හා ශිෂ්‍යයන් පිළිගන්නා බැවින් මෙම ක්‍රමවේද භාවිත කර ඉගැන්වීම සිසුන්ගේ සිංහල සාහිත්‍යය රසාස්වාදන කුසලතා වර්ධනය කිරීමට සුදුසු බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: රසාස්වාදන කුසලතා, ශිල්පක්‍රම, 11 ශ්‍රේණිය, සිංහල සාහිත්‍යය

මෙම අධ්‍යයනය සඳහා තීක්ෂණ අතුකෝරලගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සමාජ මාධ්‍යයක් වන TikTok පරිහරණය ග්‍රාමීය පාසල්වල සාමාන්‍ය පෙළ සිසුන්ගේ ශාස්ත්‍රීය ඉගෙනුම් කාලය සහ ශිෂ්‍ය සාධනයට ඇති කරන බලපෑම

ජී. ඩී. ටී. සෙනෙවිරත්න
අධ්‍යාපනවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20705@arts.pdn.ac.lk

වර්තමාන ඩිජිටල් යුගයේ සමාජ මාධ්‍ය, විශේෂයෙන්ම TikTok වැනි කෙටි වීඩියෝ වේදිකා, පාසල් සිසුන්ගේ දෛනික ජීවිතයේ අනිවාර්ය අංගයක් බවට පත්වී ඇත. මේ පිළිබඳ නාගරික පරිසරයන්හි සිදුකර ඇති පර්යේෂණ ඉතා බහුල වුව ද, ග්‍රාමීය හා දුෂ්කර පාසල්වල සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි මෙය කොතරම් දුරට බලපෑම් කරනවාද යන්න සම්බන්ධයෙන් සිදුකර ඇති අධ්‍යයන විරලය. මෙම පර්යේෂණ හිඩැස පිරවීම උදෙසා, විල්ගමුව අධ්‍යාපන කලාපයේ 11 ශ්‍රේණියේ සිසුන් යොදාගනිමින් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබිණි. මෙහි ප්‍රධාන අරමුණු වන්නේ, සාමාන්‍ය පෙළ සිසුන් TikTok භාවිත කරන ආකාරය හඳුනාගැනීම, එය ඔවුන්ගේ ශාස්ත්‍රීය ඉගෙනුම් කාලයට හා විභාග ලකුණුවලට බලපාන ආකාරය විමර්ශනය කිරීමයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මත පදනම් වූ මිශ්‍ර ක්‍රමවේදයක් හරහා පර්යේෂණය සිදුකරනු ලබයි. එහිදී මුලින්ම පර්යේෂණ මාතෘකාව ලෙස 'මුහුණුපොත' (Facebook) භාවිතයේ බලපෑම තෝරා ගත්ත ද, ප්‍රාථමික දත්ත රැස්කිරීමේ නියමු අධ්‍යයනයේ දී සිසුන් Facebook වෙනුවට TikTok භාවිතයට දැඩිව හුරුවී ඇති බව අනාවරණය වූ බැවින්, මාතෘකාව TikTok ලෙස සංශෝධනය කරන ලදි. ඒ අනුව, විධිමත් දත්ත රැස්කිරීම සඳහා සිසුන් සියයක් සඳහා ප්‍රශ්නාවලි මගින් ද, ගුරුවරුන් සහ දෙමාපියන් පස්දෙනෙකු බැගින් තෝරාගෙන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් ද, තොරතුරු ලබාගත් අතර, ද්විතීයික දත්ත ලෙස සිසුන්ගේ ප්‍රගති වාර්තා සහ පාසල් ලේඛන භාවිත කරන ලදි. මූලික දත්ත විශ්ලේෂණයට අනුව, බහුතරයක් සිසුන් පාසල් වේලාවෙන් පසු සහ රාත්‍රී කාලයේදී TikTok භාවිතයට පෙළඹෙන බව අනාවරණය විය. එමෙන්ම, TikTok භාවිත කරන පිරිමි සිසුන්ගේ ගණිතය, විද්‍යාව සහ සිංහල යන විෂය සාධන මට්ටම්වල කැපී පෙනෙන අඩුවීමක් නිරීක්ෂණය වුවද, ගැහැණු සිසුන්ගේ එය අධ්‍යාපනික මෙන්ම විනෝදාස්වාද අරමුණු සඳහා සමබරව භාවිත කරමින් දිනකට පැය තුනකට වඩා අධ්‍යයන කටයුතුවල නිරතවන බවක් හඳුනාගත හැකිවිය. ඒ අනුව, ඉදිරි පූර්ණ දත්ත විශ්ලේෂණය මඟින් TikTok භාවිතයේ සැබෑ බලපෑම විද්‍යාත්මකව තහවුරුකර, ග්‍රාමීය සිසුන්ගේ අධ්‍යාපනික අභිවෘද්ධිය උදෙසා ප්‍රායෝගික නිර්දේශ ඉදිරිපත් කිරීමට මෙම පර්යේෂණය මඟින් බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද: ග්‍රාමීය පාසල්, ශාස්ත්‍රීය ඉගෙනුම් කාලය, ශිෂ්‍ය සාධනය, Tik Tok පරිහරණය

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පිග්සෝ ඉගෙනුම් ක්‍රමවේදය භාවිත කිරීම මඟින් සිසුන්ගේ විද්‍යා විෂය සාධනය, ඉගෙනුම් අභිප්‍රේරණය සහ ක්‍රියාකාරී ඉගෙනුම් හැසිරීම් කෙරෙහි වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් : තෝරාගත් පාසලක් ඇසුරින්.

එස්.එම්.එල්.එම් සෙනෙවිරත්න
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20708@arts.pdn.ac.lk

ජිග්සෝ ක්‍රමවේදය යනු විශේෂ සහයෝගීතා ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස පිළිගත් ඉගෙනුම් ක්‍රමවේදයකි. ජිග්සෝ ඉගෙනුම් ක්‍රමවේදයෙන් සිසුන්ගේ විද්‍යා විෂය සාධනය, ඉගෙනුම් අභිප්‍රේරණය සහ චර්යාත්මක හැසිරීම් කෙරෙහි වන බලපෑම ඇගයීමට ලක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. සෙසු අරමුණු වන්නේ පන්ති කාමරය තුළ දැනට පවතින සහයෝගීතා ක්‍රමවේද හඳුනාගැනීම සහ ජිග්සෝ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී මතු වන අභියෝග විශ්ලේෂණය කිරීමයි. මෙය මූලිකව ප්‍රමාණාත්මක පර්යේෂණයක් වන අතර දත්ත ත්‍රිකෝණීකරණය සඳහා ගුණාත්මක දත්ත යොදාගෙන ඇත. තෝරාගත් එක් පාසලක හත්වන ශ්‍රේණියේ සිසුන් ජනගහනය වන අතර සමාන්තර පන්ති දෙකක සිසුන් 90 දෙනෙක් නියැදියේ. එයින් පර්යේෂණාත්මක කණ්ඩායම (n_1=45) සහ පාලක කණ්ඩායම (n_2=45) ලෙස කණ්ඩායම් දෙකක් වෙන් කෙරිණි. ප්‍රමාණාත්මක දත්ත සඳහා පූර්ව-අපර විෂය සාධන පරීක්ෂණ, අභිප්‍රේරණ ප්‍රශ්නාවලිය සහ නිරීක්ෂණ පත්‍රිකාවක්ද, ගුණාත්මක දත්ත සඳහා සිසුන් හා ගුරුවරුන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සහ පර්යේෂකයාගේ ප්‍රත්‍යාවේක්ෂණ සටහන්ද යොදාගන්නා ලදී. ප්‍රමාණාත්මක දත්ත spss හා Excel මෘදුකාංග භාවිතයෙන් විස්තරාත්මක සංඛ්‍යාන සහ අනුමිතික සංඛ්‍යාන විශ්ලේෂණයට ලක් කළ අතර ගුණාත්මක දත්ත තේමාත්මක විශ්ලේෂණය මඟින් විශ්ලේෂණය කරන ලදි. ගුරුවරුන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා මඟින් අනාවරනය වූයේ වර්තමානයයේදී සහයෝගීතා ඉගෙනුම් ක්‍රමවේදයක් ලෙස සාමාන්‍ය කණ්ඩායම් ක්‍රමය පමණක් භාවිත වන බවයි. පර්යේෂණාත්මක මැදිහත්වීමෙන් ජිග්සෝ කණ්ඩායමේ විෂය සාධනයේ මධ්‍යන්‍යය 13.82 සිට 16.76 දක්වා වර්ධනය වූවද, පාලක කණ්ඩායමේ අපර විෂය සාධන මධ්‍යන්‍යය 13.98 වූ අතර කණ්ඩායම් සංසන්දනය කිරීමේදී පර්යේෂණාත්මක කණ්ඩායමේ සිසුන් ඉහළ ප්‍රගතියක් අත්කරගෙන තිබුණි. ($t(88)=6.065$, $p<0.001$). පර්යේෂණාත්මක කණ්ඩායමේ ඉගෙනුම් අභිප්‍රේරණ මධ්‍යන්‍යය 57.13 සිට 71.22 දක්වා ඉහළ ගියද පාලක කණ්ඩායමේ අපර අභිප්‍රේරණ මධ්‍යන්‍යය 60.51 විය. සිසුන්ගේ ක්‍රියාකාරී ඉගෙනුම් හැසිරීමේ ධනාත්මක රේඛීය ප්‍රවණතාවක් නිරීක්ෂණවලින් තහවුරු විය. ශිෂ්‍ය සම්මුඛ සාකච්ඡා සහ ප්‍රත්‍යාවේක්ෂණ සටහන් ඇසුරින්, ක්‍රමවේදයට අනුගත වීමේ මුල් අවධියේදී කාල කලමනාකරණය, භූමිකා අපැහැදිලිභාවය, මිතුරන්ගෙන් වෙන්වීමේ ආවේදනාත්මක බලපෑම සහ සන්නිවේදන දුර්වලතා වැනි අභියෝග මතු වූ බව හඳුනාගැනිණි. එහෙත් අඛණ්ඩ ගුරු පහසුකම් සැපයීම සහ මඟපෙන්වීම හරහා පස්වන දිනය වන විට සිසුන් පුද්ගල වගකීමෙන් යුතුව සක්‍රීය ඉගෙනුමකට අවතීර්ණවූ බව නිගමනය කළ හැකිය. මෙම සොයාගැනීම් මත පදනම්ව, විද්‍යා විෂය සඳහා ජිග්සෝ මාදිලිය විධිමත්ව ක්‍රියාවට නැංවීමට අවශ්‍ය ක්‍රමවේද සහ නිර්දේශ ඉදිරිපත් කර ඇත.

ප්‍රමුඛ පද: ඉගෙනුම් අභිප්‍රේරණය, ක්‍රියාකාරී ඉගෙනුම් හැසිරීම් සහයෝගීතා ඉගෙනුම, ජිග්සෝ ක්‍රමවේදය, විද්‍යා විෂය සාධනය

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මන ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි

7 ශ්‍රේණිය සිසුන්ට ඉතිහාසය විෂය ඉගැන්වීමේදී විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ශිෂ්‍යයන්ගේ විෂය සාධනය සහ සක්‍රීය සහභාගිත්වය කෙරෙහි බලපාන ආකාරය අධ්‍යයනය

ඩබ්ලිව්.ඒ. ලසන්ත ශානික
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20726@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ද්විතීයක අධ්‍යාපනයේ ඉතිහාසය විෂය තවමත් සාම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය දේශන ක්‍රමවේද මත පදනම් වන බැවින්, සිසුන් යාන්ත්‍රිකව කරුණු කටපාඩම් කිරීමට පෙළඹෙන අතර ඔවුන්ගේ විවේචනාත්මක චින්තනය හා සක්‍රීය සහභාගිත්වය සීමා වී පවතී. මෙය අවම කර ගැනීමෙන් සිසුන්ට වඩාත් අර්ථාන්විත ඉගෙනුම් අත්දැකීමක් ලබා දිය හැකිය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ 7 ශ්‍රේණිය සිසුන්ට ඉතිහාසය විෂය ඉගැන්වීමේදී ප්‍රශ්න විචාරාත්මක, ක්‍රීඩා පාදක, සහ ප්‍රහෙලිකා වැනි නව්‍ය ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම ශිෂ්‍ය විෂය සාධනය සහ පන්තිකාමරයේ සක්‍රීය සහභාගිත්වය කෙරෙහි දක්වන බලපෑම විමර්ශනය කිරීමයි. පවතින සාම්ප්‍රදායික ක්‍රමවේද හඳුනා ගැනීම, නව්‍ය ඉගෙනුම් ක්‍රම සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සහ එමඟින් ශිෂ්‍ය විෂය සාධනය හා ආකල්ප කෙරෙහි වන බලපෑම තක්සේරු කිරීම මෙහි සුවිශේෂ අරමුණු වේ. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ එන අභිසාරී පිරිසැලසුම මෙහිදී භාවිත කෙරේ. මහනුවර අධ්‍යාපන කලාපයේ තෝරාගත් පාසලක 7 ශ්‍රේණියේ සිසුන් 40 ක් අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. ශිෂ්‍ය වාර පරීක්ෂණ ලකුණු අනුව සාම්ප්‍රදායික ක්‍රමයට උගන්වන පාලක කණ්ඩායමට සිසුන් 20 ක් හා නව්‍ය ක්‍රමවේද භාවිත කරන පරීක්ෂණාත්මක කණ්ඩායමට සිසුන් 20 ක් වශයෙන් සමාන කොටස් දෙකකට වෙන් කරන ලදි. දත්ත රැස් කිරීමට පූර්ව සහ පසු ප්‍රශ්න පත්‍ර, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ සටහන්, ගුරු සම්මුඛ සාකච්ඡා යොදා ගන්නා ලදි. ප්‍රමාණාත්මක දත්ත මධ්‍යන්‍යය සහ ප්‍රතිශත ඇසුරින් ද, ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණය මඟින් ද විශ්ලේෂණය කර පර්යේෂණ ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා ගැනීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පද: ඉතිහාස අධ්‍යාපනය, ක්‍රීඩා පාදක ඉගෙනුම, විෂය සාධනය, 7 ශ්‍රේණිය, සක්‍රීය සහභාගීත්වය.

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීක ශ්‍රේණිවල සිසුන්ගේ චිත්‍ර විෂය කෙරෙහි ඇති උනන්දුව සහ නිර්මාණශීලීත්වය වර්ධනය කිරීම සඳහා කාටුන් වීඩියෝ භාවිතය පිළිබඳ කාර්යමූලික පර්යේෂණයක්

ඩබ්.සී.එස්. සිරිවර්ධන
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20742@art.pdn.ac.lk

සෞන්දර්ය අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වන්නේ කලාව රසවිඳීමෙන්, නිර්මාණශීලීව සිතීමෙන් සහ සහජ කුසලතා දියුණු කිරීමෙන් දරුවාගේ සංවේදී, ගුණගරුක මෙන්ම සමබර පෞරුෂයක් ගොඩනැගීමයි. පාසලේ සෞන්දර්ය විෂය මාලාවෙන් ශිෂ්‍යයාට පැහැදිලිව සිටීමට පරිකල්පන ශක්තිය ලැබෙන විෂයක් ලෙස සෞන්දර්ය විෂය මාලාව හඳුන්වා දිය හැකිය. මා චිත්‍ර විෂය උගන්වන ගුරුවරියක ලෙස පන්ති කාමරය තුළ ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරතව සිටිය දී, කනිෂ්ඨ ද්විතීක ශ්‍රේණිවල සිසුන් හයදෙනෙකුට චිත්‍රයක් දෙස බලා ඇඳීමේ හැකියාව ඇති නමුත්, දෙන ලද මාතෘකාවකට අනුව නිර්මාණශීලී පරිකල්පනයෙන් චිත්‍ර ඇඳීමේ දුර්වලතාවයක් ඇති බවත්, නිදහසේ සිතා චිත්‍ර ඇඳීමේ මැලිකමක් දක්වන බවත් 6,7,8 ශ්‍රේණිවල සිසුන් ඇසුරින් සිදු කළ මූලික පෙර පරීක්ෂණයේදී වටහා ගන්නට විය. එම දුර්වලතා අවම කිරීම සඳහා කාටුන් වීඩියෝ ප්‍රබල ඉගෙනුම් උත්තේජකයක් ලෙස භාවිත කරමින්, සිසුන්ගේ උනන්දුව සහ නිර්මාණශීලීත්වය වර්ධනය අරමුණු කර ගනිමින් මෙම කාර්ය මූල පර්යේෂණය කාලෝචිත බවත් මා හට හැඟී යන්නට විය. පර්යේෂණ නියදිය සඳහා පෙර පර්යේෂණයේදී අවම ලකුණු ලබා ගත් සිසුන් හය දෙනෙකු තෝරාගෙන මැදිහත් වීම සිදුකරන ලදී. කරන ලදි. පර්යේෂණය ක්‍රමවේදය ලෙස මිශ්‍ර පර්යේෂණයට අනුව ප්‍රමුඛ ගුණාත්මක විස්තරාත්මක පිරිසැලසුම භාවිතා කරන ලදී. කාර්යමූලික පර්යේෂණය මැදිහත්වීම පියවර 2ක් ඔස්සේ සිදු වූ අතර පළමු පියවරේ ලැබුණු දත්ත මත පදන්ම්ව මැදිහත්වීමේ දෙවන පියවර ක්‍රියාත්මක කරන ලදි. සෑම පියවරක්ම සැලසුම්කරණය, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය සහ ප්‍රත්‍යාවේක්ෂණය යන චක්‍රීය ක්‍රියාවලියට යටත්ව සිදු කළෙමි. මේ සඳහා දත්ත එක් රැස් කිරීමේ ශිල්පීයක්‍රම කීපයක් ද භාවිත කරන ලදි. නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, ප්‍රායෝගික පරීක්ෂණ ලකුණු මේ අතර විය. දත්ත විශ්ලේෂණය කිරීමේදී ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමයත්, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා Excel මෘදුකාංගය භාවිත කිරීමට බලාපොරොත්තු වෙමි. මැදිහත්වීමේ පළමු පියවරේදී මූලික හැඩතල ඇසුරින් චිත්‍ර ඇඳීම, වර්ණ ගැන්වීමේ ක්‍රම කියාදීම ස්මාර්ට් පන්තිකාමරයේ දී කාටුන් වීඩියෝ පෙන්වන ලදි. මාසයක් පුරාවට රැස් කරන ලද දත්තවලට අනුව පෙර පරීක්ෂණයට සපේක්ෂව චිත්‍ර විෂය කෙරෙහි තිබෙන උනන්දුවෙහි, සිතුවම්වල නිර්මාණශීලීත්වයේ තරමක වර්ධනයක් නිරීක්ෂණය විය. සිසුන්ගේ නිර්මාණශීලී චින්තනය තවදුරටත් වර්ධනය කිරීම සඳහා දෙවන මැදිහත්වීම ක්‍රියාත්මක කරන ලදි. ඔස්කා සම්මාන සඳහා නිර්දේශ වූ ඇනිමේෂන් කාටුන් පෙන්වන ලදි. ඉන් අනතුරුව නිදහසේ සිතා තමන් කැමති ඕනෑම සිතුවමක් ඇඳීමට අවස්ථාව ලබා දුන් අතර එහිදී රැස්කරන ලද දත්තවලට අනුව දැකගත හැකිවූයේ පූර්ව පරීක්ෂණයට සාපේක්ෂව පසු පරීක්ෂණයේදී සිසුන් ලබා ගත් ප්‍රායෝගික ලකුණු මට්ටම කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති බව පෙනී යයි. ඒ අනුව සිසුන්ගේ නිර්මාණශීලී පරිකල්පනයත්, චිත්‍ර විෂයට දක්වන උනන්දුවත් වර්ධනය කළ හැකි ප්‍රබල ඉගෙනුම් ආධාරකයක් ලෙස කාටුන්, වීඩියෝ භාවිත කිරීමට හැකි බව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද: උනන්දුව, කාටුන් වීඩියෝ, කනිෂ්ඨ ද්විතියික ශ්‍රේණි, කාර්යමූලික පර්යේෂණය, නිර්මාණශීලීත්වය

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශයේ සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

07 ශ්‍රේණියේ භූගෝල විද්‍යා විෂය ඉගැන්වීම සඳහා සුහුරු පන්තිකාමර භාවිතය සහ විෂය සාධනය සඳහා වන බලපෑම

ටී.එම්.එස්.පී. තෙන්නකෝන්.
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20780@arts.pdn.ac.lk

ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමඟ සමකාලීන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සුහුරු පන්තිකාමර භාවිතය කෙරෙහි ඉහළ අවධානයක් යොමුව ඇත. දෘශ්‍යමය දත්ත සහ සිතියම් වැනි සංකීර්ණ ඒකක බහුල භූගෝල විද්‍යා විෂය, සාම්ප්‍රදායික කළු ලෑල්ල සහ පෙළපොතට පමණක් සීමා වී ඉගැන්වීමේදී සිසුන් බොහෝ අපහසුතාවලට මුහුණ දෙනු ලබයි. ඒ අනුව භූගෝල විද්‍යා විෂය ඉගැන්වීමේදී සුහුරු පන්තිකාමර භාවිතය සිසුන්ගේ විෂය සාධනයට ඇති කරන බලපෑම සොයා බැලීම මෙහි ප්‍රධාන අරමුණ වන අතර භූගෝල විද්‍යා විෂය සඳහා දැනට භාවිත වන ඉගැන්වීම් ක්‍රම, භූගෝල විද්‍යා පාඩම් සඳහා භාවිතා කළ හැකි සුහුරු තාක්ෂණික උපකරණ, සුහුරු පන්තකාමර භාවිතය ශිෂ්‍යයන්ගේ විෂය සාධනය සඳහා වන බලපෑම, සුහුරු පන්තිකාමර භාවිතයේදී ගුරුවරුන් හා ශිෂ්‍යයන් මුහුණ දෙන ගැටලු, සීමා, අභියෝග සහ සුහුරු පන්තිකාමර භාවිතය වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ප්‍රායෝගික යෝජනා අධ්‍යයනය කිරීම මෙහි සෙසු අරමුණු වේ. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක ක්‍රමවේදයන්ගේ එකතුවක් වන මිශ්‍රක්‍රම පර්යේෂණ ක්‍රමවේදය යටතේ විස්තරාත්මක අනුක්‍රමික පිරිසැලසුම භාවිත කර ඇත. පර්යේෂණ නියැදිය ලෙස මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් දෙකකින් 07 ශ්‍රේණියේ සිසුන් 60 දෙනෙකු සහ භූගෝල විද්‍යා විෂය උගන්වන ගුරුවරුන් 05 දෙනෙකු සසම්භාවී නොවන පහසු නියැදිකරණය යටතේ තෝරාගෙන තිබේ. පළමු අරමුණ සඳහා දත්ත රැස්කිරීමට ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් වන නිරීක්ෂණ ක්‍රමවේදය යොදාගත් අතර දෙවන, හතරවන සහ පස්වන අරමුණු සඳහා දත්ත රැස් කිරීමට සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය යොදා ගත් අතර තෙවන අරමුණ සඳහා අවශ්‍ය දත්ත රැස්කිරීම සඳහා ප්‍රමාණාත්මක පර්යේෂණ පිරිසැලසුමක් වන සම්පරීක්ෂණ පිරිසැලසුම යොදාගන්නා ලදි. ක්ෂේත්‍රයෙන් රැස්කරගත් දත්ත විශ්ලේෂණය කිරීමේදී, නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මඟින් ලැබුණු ගුණාත්මක දත්ත සඳහා තේමා විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කර ඇත. එමෙන්ම සම්පරීක්ෂණ පිරිසැලසුම මඟින් ලබාගත් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීම සඳහා SPSS මෘදුකාංගය යොදාගෙන ඇත. අවසාන පියවරේදී, මෙම ක්‍රමවේද දෙකෙන්ම ලැබුණු ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රතිඵල එකිනෙක සංසන්දනය කරමින් සහ ඒවායේ පවතින වෙනස්කම් ගැඹුරින් අර්ථ නිරූපණය කරමින් පර්යේෂණයේ අවසන් නිගමන සොයා ගන්නා ලදි. මෙම අධ්‍යයනය මඟින් භූගෝල විද්‍යාව වැනි දෘශ්‍යකරණය අත්‍යවශ්‍ය විෂයයන් සඳහා සුහුරු පන්තිකාමර මඟින් සිසුන්ගේ ආකර්ෂණය හා විෂය සාධනය ඉහළ නංවන ආකාරයත්, සුහුරු පන්තිකාමර භාවිතයේදී මුහුණ දීමට සිදුවන ප්‍රායෝගික අභියෝග ජයගැනීමට ගත හැකි විසඳුම් අධ්‍යයනය කිරීමටත් මෙම පර්යේෂණයෙන් අපේක්ෂිතය.

ප්‍රමුඛ පද : භූගෝල විද්‍යාව, විෂයය සාධනය, සුහුරු පන්තිකාමර

මෙම අධ්‍යයනය සඳහා සකුන්තලා යටිගම්මනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දෙමාපියන්ගේ පාලන රටාවන් නව යොවුන්විය පාසල් සිසුන්ගේ ස්වයංයාමන ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි සිදුකරන බලපෑම අධ්‍යයනය: තෝරාගත් පාසලක 8 ශ්‍රේණියේ සිසුන් ඇසුරෙන්

එස්.ජේ.එම්.ඩී. මානිශා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20783@arts.pdn.ac.lk

නව යොවුන්විය යනු ශිෂ්‍යයකුගේ ජීවිතයේ තීරණාත්මක සංක්‍රාන්ති සමයකි. වර්තමාන සමාජ රටාව තුළ දෙමව්පියන් අනුගමනය කරනු ලබන විවිධ පාලන රටා දරුවන්ගේ ස්වයංයාමන හැකියාව කෙරෙහි සෘජුවම බලපා ඇත. ලෝකය පුරා සිදු කර ඇති පර්යේෂණ බහුතරයක් ප්‍රමාණාත්මක දර්ශක හා ප්‍රශ්නාවලී මත පදනම්ව පොදු නිගමන ලබාදී ඇතත් නවයොවුන්විය සිසුන්ගේ ස්වයංයාමන ඉගෙනුම හා දෙමාපියන්ගේ බලපෑම අතර පවතින සැබෑ සංකීර්ණ හා සජීවී අන්තර්ක්‍රියාවන් මොනවාද යන්න මෙතෙක් ප්‍රමාණවත් පරිදි අනාවරණය වී නොමැති වීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවකි. ශ්‍රී ලාංකීය පවුල් සංස්ථාව තුළ ක්‍රියාත්මක වන විවිධ දෙමව්පියන්ගේ පාලන උපක්‍රම සිසුන්ගේ ස්වයං අභිප්‍රේරණය ඉලක්ක සකස් කර ගැනීම හා කාල කළමනාකරණය කෙරෙහි සෘජුවම බලපාන සියුම් මානව හැසිරීම් රටාවන් හා මනෝවිද්‍යාත්මක සාධක මොනවාද යන්න මෙමඟින් හඳුනා ගැනිණි. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර තෝරාගත් මහනුවර දිස්ත්‍රික්කයේ පාසලක් තුළ 8 ශ්‍රේණියේ සිසුන් 10ක් ඔවුන්ගේ දෙමාපියන් දසදෙනා හා පන්තිභාර ගුරුවරයා ඇතුලුව 21ක් දෙනෙක්ගේ නියදියක් යොදා ගැනිණි. දත්ත රැස්කිරීම සඳහා ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සෘජු නිරීක්ෂණ සහ ප්‍රගතිවාර්තා ඇතුළු ලිපි ලේඛන භාවිතා කර එලෙස රැස් කරගත් ගුණාත්මක දත්ත සියල්ලම තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයට අනුව විග්‍රහ කරන ලදි. පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීම්වලට අනුව ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක් අනුගමනය කරන දෙමාපියන්ගේ දරුවන් තුළන් ස්වයංයාමන ඉගෙනුම් මට්ටම් ඉහළ බව අනාවරණය විය. දරුවන් පිළිබඳ අවධානයක් නොදක්වන හා ආක්‍රමණශීලි පාලන රටාවක් ඇති දෙමව්පියන්ගේ දරුවන්ගේ ස්වයංයාමන ඉගෙනුම් මට්ටම පහළ බව තහවුරු විය. මෙම අධ්‍යයනයේ වැදගත්කම හා යෝජනා ලෙස පාසල් පද්ධතියේ ගුරුවරුන් හා දෙමව්පියන් ඒකාබද්ධ කරමින් ප්‍රජාතන්ත්‍රවාදී දෙමව්පිය උපක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම අනාවරණය කරන අතර සිසුන් ස්වාධීන ඉගෙනුම්කරුවන් බවට පත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මගපෙන්වීම සැපයීමටද මෙම පර්යේෂණය උපකාරී වේ.

ප්‍රමුඛ පද: දෙමව්පියන්ගේ පාලන රටා, නවයොවුන්විය, ස්වයංයාමන ඉගෙනුම් ක්‍රියාවලිය

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණී විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

අටවන ශ්‍රේණියේ සිසුන්ගේ මූලික ගණිතකර්ම කුසලතා වර්ධනය කිරීම

ආර්.එම්.එස්. උපමාලිකා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20798@arts.pdn.ac.lk

සමකාලීන අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ගණිත විෂය අත්‍යවශ්‍ය විෂයක් බවට පත්ව ඇත. ගණිත විෂයේ ඉහළ සාධන මට්ටම් කරා යාමට එකතු කිරීම, අඩු කිරීම, ගුණ කිරීම හා බෙදීම යන මූලික ගණිත කර්ම සිසුන්ට හැකි විය යුතුය. සිසුන්ට මූලික ගණිතකර්ම පළමුවෙන්ම හුරු කරන්නේ ප්‍රාථමික අධ්‍යාපනය තුළිනි. නමුත් කනිෂ්ඨ ද්විතීයික අංශයට අයත් අටවන ශ්‍රේණියේ සිසුන්ට මූලික ගණිතකර්ම නොහැකි වීම ගණිත විෂයේ ඉහළ සාධන මට්ටම් කරා යාමට හා ඉහළ සංකල්ප අවබෝධ කරගැනීමට ප්‍රබල බාධාවක් වී ඇත. එබැවින් අටවන ශ්‍රේණියේ සිසුන්ගේ මූලික ගණිතකර්ම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම සඳහා මැදිහත් විය හැකි ආකාරය සොයා බැලීම ප්‍රධාන අරමුණ කරගෙන මෙම ක්‍රියාමූලික පර්යේෂණය ක්‍රියාත්මක කරන ලදි. මෙම පර්යේෂණයේ සුවිශේෂී අරමුණු වූයේ අටවන ශ්‍රේණියේ සිසුන්ගේ මූලික ගණිත කර්ම ආශ්‍රිත පවතින දුර්වලතා හඳුනා ගැනීම, දැනට පවතින දුර්වලතා මගහරවා ගැනීමට මැදිහත්වීමේ වැඩසටහනක් සැලසුම් කිරීම, සැලසුම් කළ මැදිහත්වීම ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කළ මැදිහත්වීමේ ක්‍රියාවලියේ සාර්ථක අසාර්ථක බව විමසීමයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්‍රියාමූලික පර්යේෂණ පිරිසැලැස්ම භාවිත කරන ලදි. අටවන ශ්‍රේණියේ සිසුන්ට අනාවරණ පරීක්ෂණයක් පවත්වා ඉන් ලකුණු 65% ට අඩු සිසුන් හය දෙනෙක් නියැදිය ලෙස තෝරා ගැනුණි. මෙහිදී අනාවරණ පර්යේෂණයෙන් හෙළිවූ තොරතුරු, වාර විභාග ලකුණු, සජීවී නිරීක්ෂණ, අවිධිමත් සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යවේක්ෂණ ජර්නලය දත්ත රැස්කිරීමට යොදා ගැනුණි. සිසුන්ට මූලික ගණිතකර්ම නොහැකි වීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී නිසි අවධානයක් හිමි නොවීම, ස්ථානීය අගයන් පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීම, ගුණිත වගු මතකයේ නොතිබීම, අභ්‍යාසකරණයේ නොයෙදීම, නිවස තුළ ඉගෙනුම් පරිසරයක් නොතිබීම, පාසලේ ගණිත ආචාර්යවරයාගේ රැකියා තෘප්තියක් නොමැතිකම හේතු වී ඇති බවට අනාවරණය විය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ට නිසි පරිදි අවධානය ලබාදීම, නිරතුරුව ස්ථානීය අගයන් පිළිබඳ දැනුවත් කිරීම, දැලිස පත්‍රිකා කරවීම, අභ්‍යාසකරණයේ යෙදවීම, විෂය රුචිකත්වය ඇතිවන පරිදි කරුණාවන්තව හා ඉවසිලිවන්තව ඉගැන්වීම, පන්ති කාමරයේ ඉගෙනීමට සුදුසු වටපිටාවක් ඇති කිරීම මගින් සිසුන්ට ගණිත විෂයේ මූලික ගණිතකර්ම හුරු කරවීමට හා ජීවිතයට ගණිතයේ ඇති වැදගත්කම පෙන්වාදීමට හැකි බව මෙම ක්‍රියාමූලික පර්යේෂණයෙන් අනාවරණය විය.

ප්‍රමුඛ පද : ක්‍රියාමූලික පර්යේෂණය, මූලික ගණිත කර්ම

මෙම අධ්‍යයනය සඳහා වෝල්ටර් සෙනෙවිරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

තෝරා ගත් පාසල් දෙකක ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම පිළිබඳ අධ්‍යයනයක් : පොළොන්නරුව දිස්ත්‍රික්කය ඇසුරෙන්

ඩබ්ලිව්. ජී. කේ. පී. වෛද්‍යසේකර
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20808@arts.pdn.ac.lk

වර්තමාන සමාජයේ තරුණ පරපුරට බලපාන ගැටලු අතර මත්ද්‍රව්‍ය භාවිතය සමාජයමය හා ප්‍රධාන අධ්‍යාපනික ගැටලුවක් වී ඇති බව පෙනී යයි. වසර කිහිපයකට පෙරාතුව ග්‍රාමීය පාසල් වලට සාපේක්ෂව නාගරික පාසල්වල මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රවණතාවක් තිබුණද මේ වන විට ග්‍රාමීය පාසල්වල ද ශීඝ්‍රයෙන් මත්ද්‍රව්‍ය භාවිතය ව්‍යාප්ත වෙමින් පවතී. විශේෂයෙන් ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය, ඒ සඳහා බලපාන සමාජීය, ආර්ථික හා පුද්ගලික සාධක සහ එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ අවධානය යොමු කිරීමේ අවශ්‍යතාව මත මෙම පර්යේෂණය සිදු කරනු ලබයි. මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණ වන්නේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය හේතු හදුනා ගැනීම සහ ඒවා වළක්වා ගැනීමට යෝජනා ඉදිරිපත් කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා සාරම්මන නියැදිකරණ ක්‍රමය භාවිත කිරීමට අපේක්ෂා කරන අතර, පාසල් වර්ගීකරණයට අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් දෙකක් ලෙස 1 - C පාසලක් හා Type 2 පාසලක් තෝරාගෙන ඒවායේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසු සිසුවියන් (20) ක් , ගුරුවරුන් 4ක්, විදුහල්පතිවරුන් 2ක්, උපදේශන ගුරුවරුන් 2 ක්, දෙමාපියන් 10ක්, කන්දකාඩු පුනරුත්ථාපන කඳවුරෙහි ළමුන් 10 ක් , එහි නිලධාරීන් 2 ක් තෝරාගෙන ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කිරීමට අපේක්ෂා කෙරේ. ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දත්ත භාවිතයට ගනිමින් මෙම අධ්‍යයනය මිශ්‍ර ක්‍රමවේදය යටතේ සිදු කිරීමට අපේක්ෂා කරන අතර දත්ත විශ්ලේෂණය සඳහා තේමාගත දත්ත විශ්ලේෂණය හා විස්තරාත්මක සංඛ්‍යානය යොදා ගැනීම සිදු කරනු ලැබේ. තවද, මෙම අධ්‍යයනය න්‍යායාත්මක පදනම ලෙස බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ පරිසර පද්ධති න්‍යාය යොදා ගැනීමද අපේක්ෂා කෙරේ. අධ්‍යයනයේ අවසාන ප්‍රතිඵල මඟින් ජ්‍යෙෂ්ඨ ද්විතීයික සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීම සඳහා පාසල්, පවුල හා ප්‍රජාව සම්බන්ධ කරගත් ප්‍රායෝගික හා තිරසාර උපාය මාර්ග යොජනා කිරීමට අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පදඃ උපාය මාර්ග, ජ්‍යේෂ්ඨ ද්විතීයික සිසුන්, මත්ද්‍රව්‍ය, පාසල්

මෙම අධ්‍යයනය සඳහා සමරකෝන් බණ්ඩාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජාවගේ මතය පිළිබඳ අධ්‍යයනයක්

එස්.එම්.එස්. වන්දනා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20810@arts.pdn.ac.lk

ලිංගික අධ්‍යාපනය යනු ශ්‍රී ලංකාවේ විධිමත් විෂමාලාව තුළ තවමත් සිසුන් වෙත ලබා නොදෙන නමුත් පාසල් වයසින් ලබාදීමේ අවශ්‍යතාවය ඇති මාතෘකාවකි. ලිංගික අපයෝජනවලට වලට ලක්වීම, බාලවයස්කාර තරුණ තරුණියන් අතර අනපේක්ෂිත ගැබ් ගැනීම් ඇති වීම, ලිංගික සම්ප්‍රේෂණය වන රෝග සහ ආසාදනවලට ගොදුරු වීම හා අධික ලෙස අසභ්‍ය විඩියෝ නැරඹීම ලිංගික අධ්‍යාපනය පාසල් තුළ ලබා නොදීම නිසා ඇති වී ඇති අයහපත් ප්‍රතිඵල වේ. කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රජාවගේ මතය විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබා දීම පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් රාජ්‍ය නිළධාරීන්ගේ හා භික්ෂූන් වහන්සේලාගේ අදහස් හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ සුවිශේෂ අරමුණයි. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකරන ලදි. ඒ අනුව පහසු නියැදීම යටතේ තෝරා ගත් රාජ්‍ය සේවකයන් ලෙස පරිවාස නිලධාරියෙක්, ග්‍රාම නිළධාරිවරයෙක්, විදුහල්පතිවරයෙක්, රජයේ පාසලක විනය භාර ගුරුවරයෙක්, පූජ්‍ය පක්ෂය නියෝජනය කරමින් භික්ෂූන් වහන්සේලා දෙනමක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ගුණාත්මක දත්ත රැස් කිරීම සිදු කරන ලදි. සම්මුඛ සාකච්ඡාව මඟින් ලද ගුණාත්මක දත්ත විස්තරාත්මකව විශ්ලේෂණය කිරීම මඟින් හඳුනාගත්තේ කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ට වයසට හා සංවර්ධන මට්ටමට ගැලපෙන ලිංගික අධ්‍යාපනයක් ලබාදීමේ අවශ්‍යතාවය පිළිබඳ ප්‍රජාව තුළ ධනාත්මක ආකල්පයක් පවතින බවයි. ලිංගික අධ්‍යාපනය නිසි ක්‍රමවේදයකට අනුව සංස්කෘතික හා සදාචාරාත්මක වටිනාකම් ආරක්ෂා කරමින් ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රජාව අතරින් 66.67% ක් ප්‍රකාශ කර ඇත. පවතින විෂය මාලාව තුළ ඇති ලිංගික අධ්‍යාපනය සිසුන්ගේ ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවන බැවින් කනිෂ්ඨ ද්විතීයික අංශය වෙනුවෙන් වයස් මට්ටමට ගැලපෙන නව විෂය මාලාවක් වහාම සකස් කළ යුතු බව 83.33% ප්‍රජාව ප්‍රකාශ කරන ලදි. කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ට සාම්ප්‍රදායික ආකල්ප බිඳ දමමින් ලිංගික අධ්‍යාපනය ලබා දීමේ අවශ්‍යතාවය ප්‍රජාව පිළිගන්නා නමුත් එය සංස්කෘතික සිමාවන්ට අනුකූලව විය යුතු බව මෙම අධ්‍යනයේ නිගමනය වේ. සිසුන්ගේ සුරක්ෂිතභාවය , සෞඛ්‍ය සම්පන්න සංවර්ධනය සහ නිවැරදි දැනුම වර්ධනය කිරීම සඳහා සඳහා සුදුසු විෂය මාලාවක් සකස් කර එය පාසල්වල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතු වේ.

ප්‍රමුඛ පදඃ- කනිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්, ලිංගික අධ්‍යාපනය, ප්‍රජාව

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කණිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුන්ගේ ජ්‍යාමිතිය විෂය සාධන මට්ටම වැඩි දියුණු කිරීමට දෘශ්‍ය ආධාරක යොදා ගැනීම පිළිබඳ ක්‍රියාමූලික අධ්‍යයනයක්

එස්.ජී. වත්සලා
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20816@arts.pdn.ac.lk

පාසල් ගණිත විෂය මාලාවේ ජ්‍යාමිතිය ප්‍රධාන අනුකණ්ඩයක් වුවද, කණිෂ්ඨ ද්විතීයික අංශයේ සිසුහු ජ්‍යාමිතික සංකල්ප තේරුම් ගැනීමේදී සහ ඒවා ප්‍රායෝගිකව ගැටලු විසඳීමට යොදා ගැනීමේදී දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙති. මාගේ ගුරු පුහුණු කාලසීමාව තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වන විටදී සිසුන්ගේ ගණිත විෂයෙහි පවතින අඩු සාධන මට්ටම මා හට නිරීක්ෂණය කිරීමට හැකි විය. ඒ අනුව, මා විසින් සිසුන් සඳහා පවත්වන ලද පූර්ව පරීක්ෂණයක ලකුණු මට්ටම් විශ්ලේෂණය කිරීමෙන්, ඔවුන්ගේ ජ්‍යාමිතික සංකල්ප පිළිබඳ අවබෝධය සහ සාධන මට්ටම ඉතා පහළ මට්ටමක පවතින බව නිශ්චිතවම වටහා ගැනීමට මා හට හැකි විය. සාම්ප්‍රදායික දේශන ක්‍රමවේදවලින් ඔබ්බට ගොස්, වියුක්ත ජ්‍යාමිතික හැඩතල සහ ප්‍රමේයයන් සන්නිවේදනය කිරීම සඳහා දෘෂ්‍ය ආධාරක පන්තිකාමරය තුළ ක්‍රමානුකූලව භාවිත කරමින් සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවිය හැක්කේ කෙසේද යන්න පිළිබඳ මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ප්‍රමාණවත් ප්‍රායෝගික ගවේෂණ සිදු වී නොමැත. මූලිකවම විවිධ පරිගණක මෘදුකාංග භාවිතා කරමින් ජ්‍යාමිතිය ඉගැන්වීම සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කර තිබුණත්, තාක්ෂණික පහසුකම් නොමැති පාසල්වලට පොදුවේ භාවිතා කළ හැකි දෘෂ්‍ය ආධාරක භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණයක් සිදු කර නොමැත. මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක 7 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමකට ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ඇසුරින් මිශ්‍ර ක්‍රමවේදය යටතේ මා විසින් මෙම ක්‍රියාමූලික අධ්‍යයනය මෙහෙයවන ලදි. මෙහිදී පෙර පන්තිභාර ගුරුවරයා විසින් දැනටමත් උගන්වා අවසන් කර තිබූ, ජ්‍යාමිතිය විෂය පථයට අයත් සුවිශේෂ පාඩම් දෙකක් නැවත තෝරාගෙන මා විසින් දෘශ්‍ය ආධාරක ඇසුරින් ක්‍රියාකාරකම් සැලසුම් කරන ලදී. දත්ත රැස්කිරීමේ මෙවලම් ලෙස දෘශ්‍ය ආධාරක භාවිතයෙන් ඉගැන්වීමට ප්‍රථමයෙන් මා පූර්ව පරීක්ෂණයක් පැවැත්වූ අතර, ඉගැන්වීම් ක්‍රියාවලියෙන් පසුව පසු පරීක්ෂණයක් පවත්වමින් සිසුන් ලබාගත් ලකුණු ප්‍රමාණාත්මකව විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයේදී මා හට හෙළි වූයේ පූර්ව පරීක්ෂණයේ ප්‍රතිඵලවලට සාපේක්ෂව, දෘශ්‍ය ආධාරක භාවිතයෙන් පසු පවත්වන ලද පසු පරීක්ෂණයේදී සිසුන්ගේ ලකුණු මට්ටම සහ සමත් වීමේ ප්‍රතිශතය කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති බවයි.අධ්‍යයනය ජ්‍යාමිතියට අදාළ නිශ්චිත පාඩම් දෙකකට පමණක් සීමා වුවද, එමඟින් සිසුන්ගේ ජ්‍යාමිතික සංකල්ප සාධනය සාර්ථකව ඉටු කර ගැනීමට දෘශ්‍ය ආධාරක භාවිතය බෙහෙවින් ඉවහල් වන බව තහවුරු විය. ඒ අනුව ජ්‍යාමිතිය ඉගැන්වීමේදී වියුක්ත සංකල්ප සන්නිවේදනය කිරීමට දෘශ්‍ය ආධාරක භාවිත කිරීම අතිශය සාර්ථක සහ ඵලදායී ක්‍රමවේදයක් බව නිගමනය කළ හැකිය. මෙම අධ්‍යයනයෙන් ගුරුවරුන් කේන්ද්‍ර කරගත් සාම්ප්‍රදායික ඉගැන්වීම් රටාව ශිෂ්‍ය කේන්ද්‍රීය සහ ප්‍රත්‍යක්ෂ ඉගෙනුම් පරිසරයක් දක්වා පරිවර්තනය වන අතර, කණිෂ්ඨ ද්විතීයික අංශයේ ගණිත විෂය සාධන මට්ටම ඉහළ නැංවීමට මෙන්ම ගුරු පුහුණු වැඩසටහන් විධිමත් කිරීමට ද මෙම ප්‍රතිඵල වැදගත් මෙහෙවරක් ඉටු කරනු ඇත.

ප්‍රමුඛ පදඃ ජ්‍යාමිතිය, දෘශ්‍ය ආධාරක, විෂය සාධන මට්ටම, වියුක්ත සංකල්ප, ක්‍රියාමූලික අධ්‍යයනය

මෙම අධ්‍යයනය සඳහා සුභාෂිණි විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

7 ශ්‍රේණිය සිසුන්ගේ ගණිත විෂය සාධන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමවේදය භාවිතයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

කේ.ජී.පී.ඩී. වීරසිංහ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20825@arts.pdn.ac.lk

ගණිතය යනු පුද්ගලයෙකුගේ තර්කන ශක්තිය, ගැටලු විසඳීමේ හැකියාව වර්ධනය කරන ප්‍රධාන විෂයකි. වර්තමානය වන විට ගණිත විෂයට බොහෝ සිසුන් අඩු සාධන මට්ටමක් දැක්වීම ප්‍රධාන ගැටලුවකි. හත ශ්‍රේණිය සිසුන්ගේ ගණිත විෂය සාධන මට්ටම වැඩි දියුණු කිරීම සඳහා කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමවේදය භාවිතයේ බලපෑම විශ්ලේෂණය ප්‍රධාන අරමුණ කරගනිමින් සිසුන්ගේ වත්මන් සාධන මට්ටම හඳුනා ගැනීම, කණ්ඩායම් ඉගැන්වීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් සකස් කිරීම, කණ්ඩායම් ඉගැන්වීමේ ක්‍රමයේදී ගුරුවරයා මුහුණදෙන අභියෝග හඳුනාගැනීම, කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමවේදය තුලින් සිසුන්ගේ ගණිත සාධන මට්ටම වැඩිදියුණු වේදැයි විශ්ලේෂණය කිරීම සෙසු අරමුණු කරගනිමින් මෙම අධ්‍යනය සිදු කළෙමි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස්කිරීමේ ශිල්පීය ක්‍රම දෙකම ඇතුළත් කරමින් මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ අභිසාරී පර්යේෂණ පිරිසැලසුම භාවිතයෙන් සිදුකළ මෙම පර්යේෂණය සඳහා අරමුණු සහගත නියදිකරණය යටතේ ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ එක් පාසලක් හා එහි හත ශ්‍රේණියේ එක් පන්තියක් තෝරාගත් අතර ගණිත විෂය උගන්වන ගුරුවරුන් තිදෙනකු නියදිය ලෙස ගෙන, අදාළ පාර්ශවයන්ගෙන් අවසර ලබාගෙන ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ලේඛනගත දත්ත යොදාගනිමින් දත්ත රැස් කර කළෙමි. එලෙස රැස්කරගත් ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය, අනුමිතික සංඛ්‍යානය හා ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේද අධ්‍යයනය කර විශ්ලේෂණය කරන ලදී.ශිෂ්‍යන්ට පෙර ඇගයීම් පර්යේෂණයක් පවත්වා ඉන් ලැබුනු ප්‍රතිඵල මත දැනුම් මට්ටම් සමාන වන ආකාරයට පංතියේ සිසුන් පරීක්ෂණාත්මක කණ්ඩායමට සිසුන් දහ හතරක් හා පාලක කණ්ඩායමට සිසුන් 14 ක් තෝරාගෙන ගණිත විෂයෙහි පාඩම් ත්‍රිත්වයක් පාසල් කාල පරිච්ඡේද 15 ක් පරීක්ෂණාත්මක කණ්ඩායමට කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමයෙන් ද, පාලක කණ්ඩායමට සාම්ප්‍රදායික ඉගැන්වීම් ක්‍රමයෙන් ද උගන්වන ලදි. එහිදී සෘජු නිරීක්ෂණය මඟින් හා ගුරුවරු තිදෙනකු සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා මඟින් ගුරුවරු මුහුණදෙන අභියෝග ලෙස කණ්ඩායම් ක්‍රියාකාරකම අතරතුර පන්තිය පාලනය කිරීම අපහසු වීම, කණ්ඩායම් ඉගැන්වීමේදී පංතිකාමර තුල ඉඩකඩ මදිවීම, කණ්ඩායම් ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීම අපහසු වීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් සකස් කිරීමට වැඩි කාලයක් ගත වීම හඳුනා ගත්තෙමි. අවසානයේදී ඇගයීම් පරීක්ෂණයක් පවත්වා පරීක්ෂණාත්මක කණ්ඩායමේ හා පාලක කණ්ඩායමේ ලකුණු සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදුකළ අතර එහිදී පාලක කණ්ඩායමට වඩා පරීක්ෂණාත්මක කණ්ඩායමේ සාධන මට්ටම ඉහළ මට්ටමක පවතින බව හඳුනා ගැනීමට හැකිවිය. ඒ මඟින් නිගමනය කළ හැක්කේ කණ්ඩායම් ඉගැන්වීම මඟින් හත ශ්‍රේණිය සිසුන්ගේ ගණිත විෂය සාධන මට්ටම වර්ධනය කිරීම සඳහා කණ්ඩායම් ඉගැන්වීම් ක්‍රමය භාවිත කළ හැකිය.

ප්‍රමුඛ පද : කණ්ඩායම් ඉගැන්වීම, ගණිතය, සාධන මට්ටම, හත ශ්‍රේණිය

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

හය ශ්‍රේණිය ගණිතය විෂය ඉගැන්වීම සඳහා නාට්‍ය හා කතන්දර ක්‍රමය යොදා ගත හැකි ආකාරය පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසලක හය ශ්‍රේණියේ සිසුන් ඇසුරින් සිදු කරන ලද පරීක්ෂණාත්මක අධ්‍යයනයක්

යූ.එල්.ඩී. මහේෂිකා වික්‍රමසිංහ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

a20836@arts.pdn.ac.lk

ගණිතය විෂය යනු වියුක්ත සංකල්ප සහිත, හුදෙක් ඉලක්කම් හා සූත්‍ර මත පමණක් පදනම් නොවුණු තාර්කික චින්තනය හා ගැටළු විසඳීමේ හැකියාව වර්ධනය කරන ක්‍රියාවලියකි. එබැවින් ගණිතය යනු සංකීර්ණ, ඉගෙනීමට දුෂ්කර විෂයක් බවට සිසුන් විසින් මත දරන අතර එකී තත්ත්ව අවම කිරීමට සාම්ප්‍රදායික ගුරුකේන්ද්‍රීය ක්‍රමය ඉක්මවා ගිය නිර්මාණාත්මක නව ඉගැනුම් ප්‍රවේශයක අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ, හය ශ්‍රේණිය සිසුන්ගේ ගණිතමය සංකල්ප අවබෝධය සහ විෂය කෙරෙහි පවතින උනන්දුව වර්ධනය කිරීම සඳහා කතන්දර සහ නාට්‍යමය ක්‍රමවේදය ඉගැන්වීම් උපක්‍රමයක් ලෙස භාවිත කිරීමේ ඵලදායිතාව පර්යේෂණාත්මකව අධ්‍යයනය කිරීම වූ අතර සෙසු අරමුණු වූයේ හය ශ්‍රේණියේ ගණිතය විෂයේ කාර්ය සාධනයේ දැනට පවතින තත්ත්වය අවබෝධ කර ගැනීම, ගණිතය විෂය ඉගැන්වීම සඳහා නාට්‍ය හා කතන්දර ක්‍රමය උපයෝගී කරගත් ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සැලසුම් කරන ලද නාට්‍ය හා කතන්දර ක්‍රමය උපයෝගී කරගත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම, හය ශ්‍රේණිය ගණිතය විෂය ඉගැන්වීම සඳහා නාට්‍ය, කතන්දර ක්‍රමය භාවිතා කිරීමේ ඵලදායීතාවය පිළිබඳව අධ්‍යයනය කිරීම, එම ක්‍රමය භාවිතයෙන් හය ශ්‍රේණියේ ගණිතය විෂය ඉගැන්වීමේදී ගුරුවරුන් වශයෙන් මුහුණ දීමට සිදුවන දුෂ්කරතා අධ්‍යයනය කිරීමයි. ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත රැස් කිරීමේ ශිල්පීය ක්‍රම දෙකම ඇතුළත් කරමින් මිශ්‍ර ක්‍රමවේදය යටතේ, අභිසාරී පිරිසැලසුම භාවිත කර, මහනුවර දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසලක හය ශ්‍රේණිය එක් පන්තියක සිසුන් අරමුණු සහගත නියැදිකරණය මඟින් තෝරා ගෙන පර්යේෂණ කණ්ඩායමට සිසුන් 40 සහ පාලන කණ්ඩායමට සිසුන් 40 ක් තෝරා ගෙන ගණිතය විෂයයේ පාඩම් ත්‍රිත්වයක් පාසල් කාල පරිච්ඡේද 18ක් තුල උගන්වන ලදි. සෘජු නිරීක්ෂණ හා සම්මුඛ සාකච්ඡා යොදාගෙන ගුණාත්මක දත්තද, ප්‍රශ්න පත්‍ර හා ප්‍රශ්නාවලි මඟින් ප්‍රමාණාත්මක දත්ත එක්රැස් කරන ලදී. එසේම ගුණාත්මක දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේ ද, ප්‍රමාණාත්මක දත්ත විස්තරාත්මක සංඛ්‍යානය හා යුගල කළ t පරීක්ෂාව මඟින් ද විශ්ලේෂණය කරන ලදි. ශිෂ්‍යයන්ට ලබා දුන් පෙර පරීක්ෂණයේ මධ්‍යනය 54.75 ක් හා පසු පරීක්ෂණයේ මධ්‍යනය 79.5 වේ. ප්‍රශ්නාවලියෙන් නාට්‍ය හා කතන්දර භාවිතයෙන් ගණිතය ඉගැන්වීමට ප්‍රිය කළ ප්‍රතිශතය 97.81%ක් බැවින් සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරන ලදි. මෙහිදී යුගල කළ t පරීක්ෂාවෙන් ලැබුණු අගය t = -6.844ක් වන අතර පී(P) අගය සලකා බලන කල P=0.005, P<0.05ක් වීම නිසා වෙසෙසි වෙනසක් ඇති බව කිව හැකිය. ඉහත දත්ත මඟින් අනාවරණය වූයේ නාට්‍ය හා කතන්දර ක්‍රමය භාවිතයෙන් ගණිතයේ සංකීර්ණ සංකල්ප ඉගැන්වීමෙන් ශිෂ්‍යයන්ගේ ගණිත විෂය සාධනයේ සැලකිය යුතු වෙනසක් සිදුවී ඇති බවයි. එසේම මෙම ක්‍රමය භාවිතයෙන් සිසුන් තුළ විෂය කෙරෙහි පවතින බිය හා අකමැත්ත ඉවත් කර, වඩාත් සජීවී සහ රසවත් ලෙස ඉගැන්වීමටත්, කරුණු වඩාත් පැහැදිලිව හා දිගුකාලීනව මතකයේ රැඳෙන පරිදි, ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් උපක්‍රමයට යොමු කොට, සිසු අවධානය පන්ති කාමරයේ රඳවාගෙන ඉගැන්වීමටත් හැකි බව පර්යේෂණය අවසානයේ නිගමනය කළ හැකි විය. පර්යේෂණයේ සීමා ලෙස තෝරාගත් පාසලක හය ශ්‍රේණිය එක් පන්තියක් පමණක් තෝරා ගැනීම, පාඩම් තුනක් පමණක් මෙම ක්‍රමය මඟින් ඉගැන්වීම, සීමිත සම්පත් සහිත ඉගෙනුම් වාතාවරණයක් පැවතීම ගත හැකිය.

ප්‍රමුඛ පද : කතන්දර ක්‍රමය, ගණිතය විෂය, නාට්‍ය ක්‍රමය

මෙම අධ්‍යයනය සඳහා කවින්ද විජේතුංගගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

සමාජ මාධ්‍ය භාවිතය කණිෂ්ඨ - ද්විතියික සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

පී.එම්. වික්‍රමසිංහ
අධ්‍යාපන විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20839@arts.pdn.ac.lk

ආදිවාසී වැදි ජනයා දිවයිනේ විවිධ ප්‍රදේශවල වාසය කරන අනුජන කණ්ඩායමකි. මහියංගණයේ වැදි ජනයා ඔවුන් අතර වඩාත් සුවිශේෂී වේ. ඔවුන්ගේ ප්‍රධාන ආගමික උත්සවයක් වන වැදි පෙරහැර, ඓතිහාසික මහියංගණ සමන් දේවාලයේ වාර්ෂික ඇසළ උත්සවයට සම්බන්ධව දිය කැපීමේ දිනයේ පවත්වයි. බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය සිහිපත් කිරීම සඳහා එය සංකේතයක් ලෙස පිළිගැනේ. එබැවින් අතීතයේ සිට පැවත එන මෙම සංස්කෘතිකාංගය, බුදු දහම පැමිණීමත් සමග දේශීය ජනයා ඊට දැක්වූ ප්‍රතිචාරය මේ තුළින් මූර්තිමත් කෙරේ. වේගයෙන් වෙනස් වන නූතන සමාජය තුළ ආදිවාසීන් තම ආධ්‍යාත්මික විශ්වාසයන්, සමාජ අනන්‍යතාව සහ සංස්කෘතික අඛණ්ඩතාව සුරක්ෂිත කොට ගෙන ඇත්තේ කෙසේද යන ගැටලුව මත පදනම්ව මෙම අධ්‍යයනය සිදු කෙරුණි. මහියංගණ වැදි පෙරහැරේ අස්පර්ශික සමාජ සංස්කෘතික උරුමය පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එසේම වැදි ජනයාගේ ඓතිහාසික හා සංස්කෘතික පසුබිම හඳුනාගැනීම, මහියංගණ පෙරහැර හා ඓතිහාසික පරිණාමය පිළිබඳ අධ්‍යයනය කිරීමත්, මහියංගණ වැදි පෙරහැරේ වැදි ප්‍රජාවගේ සහභාගිත්වය සහ ඔවුන්ගේ සංස්කෘතිකාංග බෞද්ධ චාරිත්‍ර සම්ප්‍රදායන් සමග පවතින්නා වූ සහ සම්බන්ධතා පිළිබඳ විමසීමත් මෙම අධ්‍යනය තුළින් සිදු කෙරිණි. එසේම ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳ හඳුනා ගැනීමත් අවධානයට ලක්විය. ඒ අනුව මෙම අරමුණු සාධනය කර ගැනීමට ගුණාත්මක ක්‍රමවේදය හා ප්‍රමාණාත්මක ක්‍රමවේදය භාවිත කරමින් සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයනය හා පුස්තකාල පරිශීලනය හරහා දත්ත රැස්කිරීමත් දත්ත විශ්ලේෂණය තුළින් නිගමනවලට එළඹීමත් සිදු කෙරුණි. ඒ අනුව අලුයම පවත්වන මහියංගණ වැදි පෙරහැර තුළින් නිරූපණය වන්නේ එදා බුදුන් වහන්සේ පළමුව මහියංගණයට වැඩම කළ අවස්ථාවේ උන් වහන්සේව බිය වද්දමින් පලවා දැමීමට යක්ෂයින් සටනට ගිය ආකාරය පිළිබිඹු කිරීමයි. ප්‍රධාන සංසිද්ධියට අනුරූපව බුදුන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදු වන විට එකල වාසය කළේ වර්තමාන වැදි ජනතාවගේ ආදි මුතුන් මිත්තන් බැව් ඔවුන්ගේ විශ්වාසයයි. එමෙන්ම ඔවුන් සඳහන් කරන ආකාරයට එවක ප්‍රදේශීය පාලකයා වූයේ වර්තමානයේ පවා වැඳුම් පිදුම් ලබන සුමන සමන් දෙවියන් පිළිබඳවද මෙහිදී කරුණු අනාවරණය විය. දහවල් පවත්වන වැදි පෙරහැර තුළින් විජය රජුට දිවිදොස් වැළදුණු අවස්ථාවේ එය පහ කිරීමට වූ භාරයක් ප්‍රතිනිරූපණය කරන බැව් ආදි වාසීන් විශ්වාස කරයි. එමෙන්ම මෙම වැදි පෙරහර මුල් කර ගනිමින් ඔවුන් විසින් ඒ වෙනුවෙන් සිදු කරනු ලබන විවිධ චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳවත් මෙහිදී හඳුනාගත හැකි විය. ඒ අනුව මහියංගණ වැදි පෙරහැර තුළින් බුදුන් වහන්සේගේ පළමු ලංකාගමනය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රය සිදු කරනු ලබන විස්තර හා බැඳි සිදුවීම් මාලාවක සංස්කෘතික අඛණ්ඩතාව මෙම අස්පර්ෂණීය උරුමය තුළින් අනාවරණය වන බව පැහැදිලිය.

ප්‍රමුඛ පද: බුදුන්ගේ පළමු ලංකාගමනය, මහියංගණ වැදි පරපුර, වැදි පෙරහැර, සමාජ සංස්කෘතික උරුමය

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දේශීය ආයුර්වේද ශිල්ප ක්‍රම සහ දුර්ලභ ඖෂධීය ශාක සංරක්ෂණයෙහිලා දේසිංහගේ මහියංගණ ආයුර්වේද කෞතුකාගාරයේ දායකත්වය සහ එහි වර්තමාන ප්‍රවණතා

ආර්.ඩී.එම්.ආර්.ඩී. දිසානායක
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20166@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ පවතින එකම ආයුර්වේද කෞතුකාගාරය වන දේසිංහගේ මහියංගණ ආයුර්වේද කෞතුකාගාරය සතු ඓතිහාසික, වෛද්‍ය විද්‍යාත්මක හා අධ්‍යාපනික වටිනාකම පිළිබඳ ගවේෂණාත්මක විමර්ශනයක් සිදු කෙරිණි. පැරණි වෛද්‍ය උපකරණ, පුස්කොළ පොත්, ඖෂධ වට්ටෝරු සහ දුර්ලභ ඖෂධීය ශාක සහිත ඔසු උයනකින් සමන්විත මෙම ස්ථානය සුවිශේෂී ජාතික උරුමයක් ලෙස හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, වර්තමානයේ පවතින රාජ්‍ය අනුග්‍රහයේ අවම මට්ටම සහ ප්‍රචාරණ ක්‍රමවේදවල පවතින දුර්වලතා හේතුවෙන්, මෙම වටිනා උරුමය දෙස්-විදෙස් ජනතාවගේ අවධානයට ලක් නොවී අභාවයට යාමේ අවදානමකට ලක්ව තිබීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව ලෙස හඳුනා ගන්නා ලදී. මෙම කෞතුක භාණ්ඩ සහ ඔසු උයනේ වටිනාකම ලේඛනගත කිරීම, ඒ පිළිබඳ මහජන අවබෝධය පුළුල් කිරීම සහ සංරක්ෂණ හා ප්‍රවර්ධන උපායමාර්ග ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය අනුගමනය කළ අතර, එහිදී කෞතුකාගාර පරිශ්‍රය සහ ඔසු උයන සෘජුව නිරීක්ෂණය කිරීමත්, පාලනාධිකාරිය, කාර්ය මණ්ඩලය, දේශීය වෛද්‍යවරුන් සහ නරඹන්නන් සමඟ සිදු කළ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ඔස්සේ ප්‍රාථමික දත්ත එක්රැස් කරන ලදී. මීට අමතරව, පුස්කොළ පොත් සහ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ පවතින සාහිත්‍ය මූලාශ්‍රය ද්විතීයික දත්ත ලෙස පරිශීලනය කෙරිණි. පර්යේෂණ ප්‍රතිඵල අනුව, මෙම වටිනා උරුමයන් විනාශ වීමට පෙර ලේඛනගත කොට සංරක්ෂණය කිරීමේ සහ රජයේ මැදිහත්වීමෙන් සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීමේ දැඩි අවශ්‍යතාවක් පවතින බව තහවුරු විය. ඒ අනුව, මෙම ජාතික උරුමය අනාගත පරපුර උදෙසා සුරක්ෂිත කිරීම සඳහා කාලීන සහ ප්‍රායෝගික ක්‍රියාමාර්ග රැසක් මෙම පර්යේෂණය මගින් යෝජනා කෙරේ.

ප්‍රමුඛ පද: ආයුර්වේද කෞතුකාගාරය, ජාතික උරුමය, දේශීය වෛද්‍ය විද්‍යාව, මහියංගණය, සංරක්ෂණය

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පුරාතන ශ්‍රී ලංකාවේ දානශාලා පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එල්.එම්. ගුණරත්න
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20202@arts.pdn.ac.lk

බෞද්ධ ආරාම පද්ධතිය වර්ධනය වීමට සමගාමීව ඒ ආරමයන්හි භික්ෂූන් වහන්සේලාගේ වැඩිවීමත් සමඟ භික්ෂු අවශ්‍යතා පුළුල් විය. මෙයට විසඳුමක් ලෙස ආරාම කේන්ද්‍ර කරගෙන විවිධ වාස්තු විද්‍යාත්මක ගොඩනැගිලි ඉදිවීම දැකිය හැකිය. මහින්දාගමනයත් සමඟ පැමිණි භික්ෂූන් වහන්සේලා ප්‍රථමයෙන් වස් තුන් මසක් වැඩ වාසය කළේ මිහින්තලය කේන්ද්‍ර කරගෙන ගල්ලෙන් තුළයි. ස්වභාවික පරිසරය කේන්ද්‍ර කරගෙන නිර්මිත ලෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල මුල් අවධියේ භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බවට පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛනයන්හි සඳහන් වේ. මෙම භික්ෂූන් වහන්සේලා පිණ්ඩපාතයෙන් යැපෙමින් සරල දිවියක් ගත කළ බව පෙනී යයි. ඉන්පසු මහමෙව්නා උයන කේන්ද්‍ර කරගත් මහා විහාරය, මිහින්තලය, ජේතවනාරමය, සිතුල්පව්ව, අභයගිරිය, රිටිගල, රජගල, තිස්සමහරාමය, දීඝවාපිය වැනි ආරාම සංකීර්ණ බිහිවිය. මේ ආරාමයන්හි භික්ෂූන් වහන්සේලාගේ වැඩිවීමත් සමග විවිධ විහාර අංග නිර්මාණය විය. මේ අතරින් දානශාලා හෙවත් භෝජනශාලා නම් ගොඩනැගිල්ල භික්ෂූන් වහන්සේලාගේ දානමය අවශ්‍යතාවය සඳහා ඉදිවිය. පුරාතන ශ්‍රී ලංකාවේ අනුරාධපුරය කේන්ද්‍ර කරගෙන නිර්මාණය වූ ප්‍රධාන දානශාලා කිහිපයක් සාහිත්‍ය මූලාශ්‍රය මෙන්ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මඟින් අනාවරණය වේ. මේ මූලාශ්‍රය මඟින් මහාපාලි දානශාලාව, මිහින්තලය දානශාලාව, මිරිසවැටිය දානශාලාව, වෙස්සගිරිය දානශාලාව, ථූපාරාම දානශාලාව, ජේතවනාරාමය දානශාලාව, අභයගිරිය දානශාලාව වශයෙන් අනුරාධපුරයේ එවකට වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලාගේ දානමය අවශ්‍යතාවය සලසාලීමට භාවිත කළහ. පොලොන්නරුව යුගයේ ආලාහන පිරිවෙන ප්‍රධාන භික්ෂු මධ්‍යස්ථානයක් විය. මෙම ආලාහන පිරිවෙන කේන්ද්‍ර කරගෙන පුරාතනයේ දානශාලාවක් ක්‍රියාත්මක වී තිබේ. පුරාතන දානශාලාවන් හි භාවිතය සහ තාක්ෂණය කෙසේද යන්න පර්යේෂණ ගැටලුව ලෙස තෝරාගෙන මෙම අධ්‍යයනය සිදුකර ඇත. මෙම පර්යේෂණය උදෙසා උතුරු මැද පළාතේ දානශාලා පිළිබඳව අවධානය යොමු කර තිබේ. උතුරු මැද පළාතේ අනුරාධපුරය හා පොලොන්නරුව නගරය කේන්ද්‍ර කරගෙන පුරාතනයේ ඉදි වූ ආරාම සංකීර්ණ තුළ විවිධ වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතර දානශාලා ප්‍රධාන තැනක් ගනු ලැබීය. ශ්‍රී ලංකාවේ බුදු සමයේ ව්‍යාප්තිය සමග බෞද්ධ ආරාමයන්හී දියුණු වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහිත දාන ශාලා නිර්මාණය කර ඇති අතර ඒවා ක්‍රමවත්ව පවත්වාගෙන ගිය බව පෙනී යනු ලැබේ.

ප්‍රමුඛ පද: ආරාම සංකීර්ණ, දානශාලා, පිණ්ඩපාතය, භෝජනශාලා, වාස්තු විද්‍යාව

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සීතල යුද්ධ සමයේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය

කේ. හංෂිකා
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20214@arts.pdn.ac.lk

1945 වර්ෂයේදී දෙවන ලෝක යුද්ධය නිල වශයෙන් අවසන් කිරීමත් සමඟ ලෝක දේශපාලනය තුළ ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී කඳවුර සහ සෝවියට් දේශය ප්‍රමුඛ කොමියුනිස්ට් කඳවුර අතර ඇති වූ ද්වි-ධ්‍රැවීය මතවාදීමය අරගලය සීතල යුද්ධය ලෙස හැඳින්වේ. සීතල යුද්ධ සන්දර්භය තුළ වූ ගෝලීය බල අරගලය සහ දේශපාලනික බෙදීම්, පශ්චාත් දෙවන ලෝක යුද සමයේ යටත්විජිතකරණයෙන් නිදහස් වූ ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික හැසිරීම මෙන්ම විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්වීමෙහිලා තීරණාත්මක බලපෑමක් එල්ල කරන ලදී. එම ඓතිහාසික පසුබිම පදනම් කරගනිමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වූයේ සීතල යුද්ධ සමයේ ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් හා අභ්‍යන්තර දේශපාලන වෙනස්කම් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සම්පාදනයට කවරාකාරයෙන් බලපෑවේද යන්නයි. සීතල යුද්ධ සමයේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සකස් කිරීමේදී අභ්‍යන්තර හා ලෝක දේශපාලනයේ බලපෑම විශ්ලේෂණය කිරීම සහ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ඓතිහාසික විකාශනය සහ පරිණාමය හඳුනා ගැනීම මෙහි මූලික අරමුණු විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය ඇසුරින් සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී ජාත්‍යන්තර බලවතුන්ගේ දෘෂ්ටිවාදාත්මක ඝට්ටනයෙන් බැහැරව සිය ජාතික ස්වෛරීභාවය, ආර්ථික අභිලාෂ සහ ජාතික ආරක්ෂාව සපුරා ගැනීම පිණිස ආරම්භයේදී නොබැඳි පිළිවෙත ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ මූලිකාංගය සහ උපායමාර්ගික පදනම වූ බව හෙළි වේ. මෙරට තුළ ඇති වූ 88-89 භීෂණ සමය, දීර්ඝකාලීන උතුරේ සිවිල් යුදමය වාතාවරණය, දේශීය පරිපාලන තන්ත්‍ර මාරු වීමත් සමඟ සිදු වූ දේශපාලන දෘෂ්ටිවාදයන්ගේ වෙනස්වීම, ජාත්‍යන්තර දේශපාලනය තුළ සෙසු මිත්‍ර රාජ්‍යයන් නොබැඳි පිළිවෙතින් ඈත්වීම සහ සෝවියට් දේශයේ බිඳවැටීම වැනි සාධක ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ලද බව අනාවරණය වේ. ඒ අනුව සීතල යුද්ධ සමයේ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ස්ථිතික සිද්ධාන්තයක් නොවූ අතර ගෝලීය සහ බාහිර දේශපාලනික පසුබිම මත නිරන්තරයෙන් ගතිකත්වයට බඳුන් වූ ක්‍රියාවලියක් බව මෙම අධ්‍යනයේදී පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: කොමියුනිස්ට්වාදය, ධනවාදය, විදේශ ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාව, සීතල යුද්ධය

මෙම අධ්‍යයනය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ජනප්‍රවාදවලින් හෙළිවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන ඇසුරින් අධ්‍යයනයක්

එච්.ඩී.සී.පී. හතුරුසිංහ
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20227@arts.pdn.ac.lk

ජනප්‍රවාද යනු, කිසියම් මානව කණ්ඩායමක් විසින් හවුලේ භුක්ති විඳිනු ලබන, වාචික හෝ වෙනත් ක්‍රමවේදයකින් පරම්පරාගතව සම්ප්‍රේෂණය වන සාම්ප්‍රදායික දැනුම හා ප්‍රකාශනයන්ගේ සමස්තයයි. නූතන ඓතිහාසික ශික්ෂණයට අනුව ජනප්‍රවාද, මූලාශ්‍රයක් ලෙස යුගයේ සැලකිල්ලට ගන්නා අතර, මෙහිදී ශ්‍රී ලංකාවේ මධ්‍යකාලීන දේශපාලන හා සංස්කෘතික ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කරන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනප්‍රවාද අධ්‍යයනයට ලක් කෙරේ. සාම්ප්‍රදායික ඉතිහාසකරණයේදී රාජකීය වංශකථා සහ අභිලේඛන සාක්ෂිවලට ප්‍රමුඛතාවය හිමි වුවද, ප්‍රාදේශීය අනන්‍යතාවය සහ ජන විඥානය හැඩගැස්වීමේදී මුඛපරම්පරාගත ජනප්‍රවාද සතු ඥානවිභාගාත්මක වටිනාකම නිසි ශාස්ත්‍රීය විමර්ශනයකට ලක්වී නොමැත. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවතින සුවිශේෂී ඓතිහාසික ස්ථාන කේන්ද්‍ර කරගනිමින්, ඒවා හා බැඳුණු ජනප්‍රවාද, ප්‍රදේශීය ආඛ්‍යාන සහ පුරාවෘත්ත විශ්ලේෂණය කිරීම සහ එමගින් නිරූපණය වන ඓතිහාසික යථාර්ථය හා සමාජ-සංස්කෘතික පරිණාමය විද්‍යාත්මකව අර්ථකථනය කිරීමයි. මෙකී ඓතිහාසිකත්වය පදනම් කරගනිමින් මෙහෙයවන ලද මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ, වංශානුගත ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීමට ජනප්‍රවාද කෙතරම් දුරට දායක වේද යන්නයි. මෙම ගැටලුව විමර්ශනය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කර ඇති අතර, සාහිත්‍යය අධ්‍යයනය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් ක්ෂේත්‍ර නිරීක්ෂණ මෙන්ම ප්‍රදේශයේ ජ්‍යේෂ්ඨ පුරවැසියන් හා ප්‍රදේශීය විද්වතුන්ගෙන් ලබාගත් අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා උපයෝගී කරගන්නා ලදී. මෙහිදී විජය කුමරු හා සබැඳි ජනප්‍රවාදයක් වෙයි. විජය රජු විසින් නෙරපා හරින කුවේණිය ඉතාමත් දුකින් හා කෝපයෙන් ශාපයක් කළ බවත්, අනතුරුව ඇතුගල ඇතුළු සත්ව පර්වත පද්ධතිය නිර්මාණය වූ බවත් ජනප්‍රවාදයේ එයි. එසේම පඬුවස්නුවර, දඹදෙණිය, යාපහුව, අරන්කැලේ සහ රිදී විහාරය වැනි පුරාවිද්‍යාත්මක ස්ථාන ආශ්‍රිත ජනශ්‍රැති දේශපාලනික, ආර්ථික, ආගමික සහ පාරිසරික බලපෑම් මත පදනම්ව වර්ගීකරණය කරමින් විමසුමට ලක් කරන ලදී. පර්යේෂණයේ සොයාගැනීම්වලට අනුව, මෙම ප්‍රදේශීය ජනප්‍රවාද හුදෙක් ප්‍රබන්ධ කථා නොව, නිල ඉතිහාස ලේඛනවල මගහැරී ඇති බිම් මට්ටමේ මහජන ඉතිහාසය ප්‍රතිනිර්මාණය කරන සජීවී සාක්ෂි වේ. අවසාන වශයෙන්, ලිඛිත ඉතිහාසයේ පවතින හිඩැස් පිරවීමෙහිලා මුඛපරම්පරාගත ඉතිහාසයේ ඇති අනුපූරක දායකත්වය ඇගයීමට ලක් කරන මෙම අධ්‍යයනය, ක්ෂය වෙමින් පවතින මෙම අස්පර්ශ සංස්කෘතික උරුම විධිමත් ලෙස ලේඛනගත කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ ජාතික අවශ්‍යතාවය අවධාරණය කරයි.

ප්‍රමුඛ පද: අස්පර්ශනීය සංස්කෘතික උරුමය, කුරුණෑගල දිස්ත්‍රික්කය, ඉතිහාස ප්‍රතිනිර්මාණය

මෙම අධ්‍යයනය සඳහා රෝහිත දසනායකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කතිකාවත්වලින් හෙළිවන භික්ෂු සංස්ථාව සහ ආරාම කළමනාකරණය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච් .ආර්. උදාරා නෙත්මිණි හේරත්
ඉතිහාස අධ්‍යයනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20237@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකීය බෞද්ධ සමාජය තුළ භික්ෂු විනය සුරක්ෂිත කිරීම සහ ආරාම පාලනය ක්‍රමවත්භාවය ඇති කිරීමට කතිකාවත්වලින් ඉටු කළ සේවය අපරිමිතය. එහෙයින් භික්ෂුව හා ආරාම කළමනාකරණය උදෙසා කතිකාවත්වලින් සිදුකළ බලපෑම කවරේද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව විය. එහිදී ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීය මූලාශ්‍රය යොදා ගනිමින් භික්ෂුව හා ආරාමය විධිමත් සැලැස්මක් යටතේ කළමනාකරණය කිරීම, බුද්ධකාලීන කළමනාකරණ සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මෙහි ප්‍රධාන අරමුණු විය. මේ සඳහා අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා වූ කතිකාවත් විමර්ශනයට ලක් කර ඇත. කතිකාවත් මගින් භික්ෂූන්ගේ විනය ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් වූ භික්ෂූන් මහණ කිරීම විධිමත් කිරීම, උපසම්පදා කිරීම මෙන්ම ආරාම පරිපාලන කටයුතු විධිමත් හා කාර්යක්ෂමතාවයකින් යුත්තව පවත්වා ගෙන යාමට අවශ්‍ය මාර්ගෝපදේශකයන් අනාවරණය වේ. එසේම ශාසනික අර්බුද උත්සන්න වූ අවස්ථාවලදී භික්ෂු සංස්ථාව සංවිධානය, පාලනය, මෙහෙයවීම වැදගත් වූ හෙයින් කතිකාවත් මගින් සමකාලීන සමාජයේ පැවැති ගැටලුකාරීත්වය සාධනය කිරීමෙහිලා ප්‍රමුඛ කාර්යයක් ඉටු කර තිබේ. පසුවද ලාංකික සන්දර්භයේ භික්ෂූ විනය හා ආරාම පාලන විෂයේ කළමනාකරණ මූලධර්ම තිබූ බවත් ඉන්පසුව අනාගතයේද භික්ෂුව විනයානුකූලව ක්‍රියාකළ යුතු ආකාරය, ආරාම පාලනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග අන්තර්ගත වීමෙන්ද මනාවට පෙනී යන්නේ කළමනාකරණ ප්‍රතිපත්ති කතිකාවත්වල සඳහන්ව තිබූ බවයි. විශේෂයෙන්ම කතිකාවත්වලින් අතීත සමාජයේ භික්ෂු සංස්ථාව සහ ආරාම පාලනය කිරීමේදී කළමනාකරණ ක්‍රමවේද සාර්ථකව භාවිත කර ඇති බවත් වර්තමානයේද භික්ෂු විනය සුරක්ෂිත කිරීමෙහිලා කතිකාවත්වල සඳහන් කළමනාකරණ මූලධර්ම භාවිත කළ හැකි බවත් මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පද: ආරාම, කතිකාවත්, කළමනාකරණය, බෞද්ධ, භික්ෂුව

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ මුරගලෙහි විකාශනය, සංකේතාර්ථය හා කලාත්මක වටිනාකම පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (අනුරාධපුර හා පොළොන්නරු අවධීන් ආශ්‍රයෙන්)

ආර්.ඩී.සුභානි හර්ෂනී ජයලත්
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20264@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් ආගමික හා ආගමික නොවන ගොඩනැගිලිවල ප්‍රවේශ මාර්ගයෙහි සඳකඩපහන සහ කොරවක්ගල සමඟ ස්ථාපිත මුරගල, පුරාණ සිංහල ගෘහ නිර්මාණ ශිල්පයට අනන්‍ය වූ සුවිශේෂී ශෛලමය අංගයකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ මුරගලෙහි කැටයම් තුළින් නිරූපිත සංකේතාර්ථ ඔස්සේ සමකාලීන සමාජයේ ආගමික, සංස්කෘතික හා කලාත්මක ලක්ෂණ විද්‍යමාන වන ආකාරය පිළිබඳව පවතින දැනුම් පරතරය පිරවීමයි. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් ලෙස මුරගලෙහි ඓතිහාසික හා කලාත්මක වටිනාකම විග්‍රහ කිරීම, එහි සංකේතාර්ථ විමර්ශනය කිරීම සහ විදේශීය ආභාස හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු විය. මෙම පර්යේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක ක්‍රමවේද යොදා ගනිමින් ක්ෂේත්‍ර අධ්‍යයන, විශේෂඥ සම්මුඛ සාකච්ඡා සහ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් දත්ත රැස් කරන ලදී. අධ්‍යයනය මගින් මුරගලෙහි ආරම්භයේ පැවති කැටයම් රහිත ස්වරූපයේ සිට ක්‍රමානුකූලව නාගරාජ මුරගල දක්වා සිදුවූ විකාශනය මැනවින් නිරූපණය කරයි. එහිදී පුන්කලස, නාග රූප සහ වාමන රූප මගින් පාරිශුද්ධත්වය, සශ්‍රීකත්වය, සෞභාග්‍යය සහ ආරක්ෂාව වැනි අර්ථයන් සංකේතවත් වන ආකාරය හඳුනාගත හැකිය. තවද, අනුරාධපුර යුගයට සාපේක්ෂව පොළොන්නරු යුගයේ මුරගලෙහි කැටයම්වල සිදුවූ ශෛලීය වෙනස්කම්, ශරීරාංගවල විපර්යාස සහ ආභරණ භාවිතයේ බහුලත්වය වැනි කරුණු ද පර්යේෂණයෙන් අනාවරණය විය. මුරගල නිර්මාණය සඳහා හින්දු හා අමරාවතී සම්ප්‍රදායන්ගෙන් ලැබුණු ආභාසය ද මෙමගින් තහවුරු වේ. අවසාන වශයෙන්, මුරගල යනු හුදු ගෘහ නිර්මාණ අංගයක් පමණක් නොව, ගොඩනැගිලි කරා ළඟා වන තැනැත්තා තුළ වාසනාව, සෞභාග්‍යය සහ ආරක්ෂාව යන සංකල්ප තහවුරු කිරීමේ අරමුණින් නිර්මාණය කරන ලද සංස්කෘතික සාධකයක් බව මෙම අධ්‍යයනය මගින් නිගමනය විය.

ප්‍රමුඛ පද: අනුරාධපුර යුගය, ගෘහ නිර්මාණ ශිල්පය, මුරගල, පුරාවිද්‍යාව, පොළොන්නරු යුගය

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරධූරයේ ආරම්භය, විකාශය හා කාර්යභාරය (ලන්දේසි අවධියේ සිට 1947 දක්වා)

එච්.ඩබ්ලිව්.ජී.ටී.එන්. ජයවික්‍රම
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20294@arts.pdn.ac.lk

ආණ්ඩුකාරධූරය වනාහි දේශපාලන ක්‍රියාදාමය තුළ වැදගත් භූමිකාවක් නිරූපණය කරන නිලයකි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරධූරයේ ආරම්භය සම්බන්ධව අධ්‍යයනය කිරීමේදී එය යටත්විජිත අවධිය දක්වා ගමන් කරයි. එයින් නිරූපණය වන්නේ ලංකාවේ ආණ්ඩුකාරධූරය ස්ථාපිත වීම යුරෝපීය ආභාසයෙන් සිදු වූ බවයි. ඒ අනුව මෙම පර්යේෂණයේදී ලන්දේසීන්ගේ අවධියේ සහ බ්‍රිතාන්‍ය අවධිය යටතේ ලංකාවේ ආණ්ඩුකාරධූරයේ විකාශය සහ එම ධූරයේ කාර්යභාරය පිළිබඳව මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කරන ලදි. ඒ අනුව මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ආණ්ඩුකාරධූරයේ ආරම්භය හා විකාශය අධ්‍යයනය කිරීමත් එම ධූරයේ ඇති වූ චලිතයන් හඳුනා ගැනීමත්ය. යටත්විජිත ආණ්ඩුකාරධූරයේ ප්‍රභවය කාලානුරූපීව සහ අවස්ථානෝචිතව එහි කාර්යභාරය වෙනස් වූයේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරෙන් සිදු කරන ලද අධ්‍යයනයේදී ලන්දේසි අවධියේ ස්ථාපිත වූ ආණ්ඩුකාරධූරය ලංකාවේ ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ බලතල ක්‍රියාවට නංවනු ලැබිණි. මේ තත්ත්වය හා සමානව බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුකාරධූරයේ වගකීම හා බලය ක්‍රියාවට නැංවිණි. එය වෙනස්වීම්වලට ලක් වූයේ 1833න් පසුව ඇති කරන ලද ප්‍රතිසංස්කරණ තුළිනි. 1833න් පසු ඇති කරන ලද ප්‍රතිසංස්කරණ හමුවේ ආණ්ඩුකාරධූරය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගනු ලැබූ අතර, එමඟින් ධූරය සම්බන්ධව වෙනස්වීම් සිදු විය. 1947 තෙක් මේ තත්ත්වය ක්‍රියාකාරී වූ බවත් දැකගත හැකි වේ. එමඟින් ආණ්ඩුකාරධූරයේ බලය සීමා කිරීමකට ලක් වන අතර, ධූරයට හිමි කාර්යභාරයද වෙනස්වීම්වලට ලක් විණි. පසුකාලීනව අග්‍රාණ්ඩුකාරධූරය මෙරට ස්ථාපිත වීම හා එය දේශීය නියෝජනයක් බවට පත් වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව ආණ්ඩුකාරධූරය මෙරට දේශපාලන ඉතිහාසය තුළ ව්‍යවස්ථාදායක, විධායකයට අවශ්‍ය පදනම සැපයූ බවත් එය ප්‍රායෝගිකව දේශපාලන ක්‍රියාවලියට බලපෑම් ඇති කරන බවටත් නිගමනය කළ හැකි වේ. එමඟින් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහයක් කරා යොමු වීමට අවශ්‍ය පදනම ආණ්ඩුකාරධූරය හේතුවෙන් සැලසුණු බව සඳහන් කළ හැකි වේ.

ප්‍රමුඛ පද: ආණ්ඩුකාරධූරය, ආරම්භය, කාර්යභාරය, බ්‍රිතාන්‍ය පාලනය, විකාශය, ශ්‍රී ලංකාව

මෙම අධ්‍යයනය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

යටත්විජිත ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආරම්භය සහ විකාශනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

එස්.ඩී.යූ.ඕ. කාවින්දිකා
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20319@arts.pdn.ac.lk

නූතන ශ්‍රී ලාංකේය සමාජය තුළ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සහ සමාජ පාලනය ප්‍රමුඛ ආයතනයක් ලෙස බන්ධනාගාර සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනියි. පූර්ව යටත්විජිත ලාංකේය සමාජයේ විවිධ දඬුවම් ක්‍රම පැවතුණද නූතන ක්‍රමයේ ආරම්භය සිදු වන්නේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන සමයේදීය. ඒ අනුව 1844 අංක 18 දරණ බන්ධනාගාර ආඥාපනත මගින් මෙරට බන්ධනාගාර ක්‍රමය නෛතිකව ස්ථාපිත කෙරුණු අතර මෙම පර්යේෂණයෙන් 1844 සිට 1948 දක්වා කාලය තුළ බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව තුළ බන්ධනාගාර ආරම්භ කිරීම සහ එහි විකාශනය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබීය. බ්‍රිතාන්‍ය යටත්විජිත රජය විසින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ස්ථාපිත කිරීමේදී අපරාධ මර්දනය කිරීමේ අරමුණ ඉක්මවා යමින් සිරකරු ශ්‍රමය සූරා කෑමේ ආර්ථික උපාය මාර්ගයක් ලෙස එය යොදා ගත්තේ කෙසේද යන්න මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන අතර යටත්විජිත සමයේ බන්ධනාගාර ස්ථාපිත කිරීම මෙරට අපරාධ අඩුවීම සම්බන්ධයෙන් බලපෑ ආකාරය විශ්ලේෂණය කිරීම සහ සිරකරු ශ්‍රමය යොදා ගැනීමෙන් බ්‍රිතාන්‍ය යටත්විජිත රජය විසින් අත්පත් කරගත් සමාජ හා ආර්ථික වාසි විමර්ශනය කිරීම මූලික අරමුණු විය. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ඇසුරින් සිදුකරන ලද අධ්‍යයනයෙන් බ්‍රිතාන්‍යයන් විසින් බන්ධනාගාර පිහිටුවීමේ මූලික අරමුණ අපරාධ මර්දනය කිරීම පමණක් නොවන බවයි. එහිදී ඔවුන් විසින් යටත්විජිත ආර්ථිකය ගොඩනැගීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය පිණිස එනම් මාර්ග, වරායන්, කර්මාන්තශාලා යනාදියට අවම ශ්‍රමය අඩු පිරිවැයකින් ලබා ගැනීම සඳහා සුදුසුම පිරිසක් ලෙස බන්ධනාගාර සිරකරුවන් යොදාගෙන ඇති බව හෙලිවේ. එබැවින් සිරකරු ශ්‍රමය යොදා ගැනීමෙන් යටත්විජිත පාලනයට දැවැන්ත ආර්ථික වාසියක් ලබා ගැනීමට හැකි වූ අතරම, බන්ධනාගාර දේශීය ජනතාව භීතියට පත් කිරීමේ මෙවලමක් ලෙසද භාවිත කර තිබේ. බ්‍රිතාන්‍ය යටත්විජිත රජය විසින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ස්ථාපිත කිරීම සහ විකාශනය කිරීම එක් අතකින් අපරාධ පාලනයේ මෙවලමක් වූ අතරම අනෙක් අතින් ලාභදායී ලෙස සිරකරු ශ්‍රමය යොදා ගැනීමේ ආර්ථික උපක්‍රමයක් වූ බව පැහැදිලි විය.

ප්‍රමුඛ පද: අපරාධ මර්දන, ආර්ථික වාසි, බන්ධනාගාර, යටත්විජිත සමය, සිරකරු ශ්‍රමය,

මෙම අධ්‍යයනය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දැඩිමුණ්ඩ දේව සංකල්පය සහ වන්දනය පිළිබඳ සබරගමුව පළාත ඇසුරින් සිදු කරන ඓතිහාසික අධ්‍යයනයක්

ජී. ආර්. එම්. එන්. එස්. කුමාරි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20354@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය ජන සමාජයේ ආගමික හා සංස්කෘතික අනන්‍යතාව දීර්ඝ කාලීන ඓතිහාසික පරිණාමයකට ලක්ව ඇත්තේ බෞද්ධ දර්ශනයේ සහ දේශීය දේව විශ්වාස පද්ධතීන් අතර පවතින අන්තර් සබඳතා මතය. මෙම සාම්ප්‍රදායික ජන ආගමික පදනම තුළ විශේෂයෙන්ම සබරගමුව පළාතේ ප්‍රදේශීය ජන ජීවිතය සාහිත්‍ය මූලාශ්‍රය සහ පුරාණ විහාර දේවාල පද්ධතිය සමඟ බද්ධ වූ සුවිශේෂී වන්දනා ක්‍රමයක් ලෙස දැඩිමුණ්ඩ දේව වන්දනාව හඳුනාගත හැකිය. ප්‍රාග් බෞද්ධ යක්ෂ සංකල්ප සහ බුදු දහම අතර ඇති වූ සංස්කෘතික මිශ්‍රණය නිරූපණය කරන දැඩිමුණ්ඩ දෙවියන් සිංහල බෞද්ධ දේව මණ්ඩලය තුළ ශාසනාරක්ෂක මෙන්ම ප්‍රධාන ආරක්ෂක දේවතාවකු ලෙස විකාශනය වී ඇත. මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වූයේ සබරගමුව පළාතේ සමාජ සංස්කෘතික ව්‍යුහය තුළ දැඩිමුණ්ඩ දේව සංකල්පය ස්ථාපිත වී ඇති ආකාරය සහ එහි වන්දනාමය ස්වරූපය කවරාකාරද යන්න පිළිබඳව විමර්ශනය කිරීමයි. ඒ අනුව අදාළ කලාපය තුළ දැඩිමුණ්ඩ වන්දනාවේ ඓතිහාසික ව්‍යාප්තිය සහ සමකාලීන ප්‍රදේශීය වන්දනා රටා විශ්ලේෂණය කිරීම මෙහි මූලික අරමුණ විය. මෙම අධ්‍යයනය මගින් දැඩිමුණ්ඩ සංකල්පයේ ඓතිහාසික මූලාරම්භය, වන්දනා ක්‍රමවේද, චාරිත්‍ර වාරිත්‍ර සහ උත්සව, බෞද්ධාගම සහ අදාළ දේව විශ්වාස අතර පවතින ව්‍යුහාත්මක සබඳතාව, කලාපීය සමාජ සංස්කෘතික වැදගත්කම මෙන්ම කාලීනව සිදුවී ඇති පරිවර්තනයන් ශාස්ත්‍රීය විග්‍රහයකට ලක් විය. මෙම පර්යේෂණ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර ඒ යටතේ ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් සිදු කෙරූ පුස්තකාල පර්යේෂණ, පුරාවිද්‍යාත්මක සාධක සහ තෝරාගත් කලාප ආශ්‍රිත ක්ෂේත්‍ර නිරීක්ෂණ මෙන්ම සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරමින් විශ්ලේෂණය කෙරිණ. පරිච්ඡේදකරණය යටතේ ශ්‍රී ලංකාවේ දේව වන්දනාවේ ඓතිහාසික පසුබිම, නාම ප්‍රභවය සහ දේව මණ්ඩලයේ භූමිකාව මුලින්ම සාකච්ඡාවට ලක් වූ අතර අනතුරුව සබරගමුව පළාතේ ප්‍රධාන සහ ප්‍රදේශීය දේවාල පද්ධතිය ඒවායේ පාලන සංවිධානය සහ සමාජ දේශපාලන අනුග්‍රහය විග්‍රහ කෙරිණ. තවද වන්දනාව සහ සබැඳි චාරිත්‍ර, සිරිත් විරිත්, කලාත්මක ප්‍රකාශන මෙන්ම ඊට සහභාගී වන්නන්ගේ සමාජ ස්ථරීකරණය විමර්ශනය වූ අතර අවසාන වශයෙන් දැඩිමුණ්ඩ සංස්කෘතිය බෞද්ධාගම, පත්තිනි සහ කතරගම වන්දනාවන් සමඟ දක්වන සාපේක්ෂ සබඳතාවේ සහ එහි සුවිශේෂී ප්‍රදේශීය ලක්ෂණ සංසන්දනය කරමින් පර්යේෂණ නිගමනය සහ උපන්‍යාසය තහවුරු කිරීම සිදු කෙරිණ.

ප්‍රමුඛ පද: ජන ආගමිකත්වය, දැඩිමුණ්ඩ දේව සංකල්පය, දේව මණ්ඩලය, සබරගමුව පළාත, සිංහල බෞද්ධ

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පොලොන්නරු අවධියේ බෞද්ධ සංස්කෘතියට එල්ල වූ හින්දු බලපෑ

කේ.එම්. මල්ෂානි ලක්ශිකා
ඉතිහාස අධ්‍යයනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20380@arts.pdn.ac.lk

පොලොන්නරු යුගය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ දේශපාලනික, ආගමික සහ සංස්කෘතික වශයෙන් සුවිශේෂී පරිවර්තනයක් සිදුවූ යුගයකි. චෝල ආක්‍රමණයන්, දිගුකාලීන ද්‍රවිඩ පාලනය සහ පසුව බලයට පත් සිංහල පාලකයන් ඉන්දීය රාජකීය පවුල් සමඟ පැවැත්වූ විවාහ සබඳතා වැනි සාධක හේතුවෙන්, දේශීය බෞද්ධ සංස්කෘතිය කෙරෙහි හින්දු ආගමික ආභාසය දැඩි ලෙස බලපෑවේය. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පොලොන්නරු යුගයේ බෞද්ධ සංස්කෘතිය විකාශනය වීමෙහිලා හින්දු ආගමික බලපෑම සිදුවූ ආකාරය විශ්ලේෂණය කිරීම සහ ඒ පිළිබඳව පවතින පුරාවිද්‍යාත්මක සාක්ෂි පදනම් කරගනිමින් එම සංස්කෘතික සංසර්ගය තහවුරු කිරීමයි. අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිශීලනය කිරීමත්, ක්ෂේත්‍ර ගවේෂණයන්හි නිරත වෙමින් දත්ත රැස් කිරීමත් සිදු කෙරිණි. පර්යේෂණ ප්‍රතිඵල අනුව, ගෘහ නිර්මාණ ශිල්පය තුළ දක්නට ලැබෙන 'ගෙඩිගේ' සම්ප්‍රදාය (උදා: තිවංක පිළිමගෙය, ලංකාතිලක, ථූපාරාමය), බෞද්ධ විහාර තුළ දක්නට ලැබෙන හින්දු දේව රූප කැටයම්, සඳකඩපහනෙහි දක්නට ලැබෙන කලාත්මක වෙනස්වීම් (ගව රූපය ඉවත් වීම) සහ බෞද්ධ විහාර සංකීර්ණ ආශ්‍රිතව හින්දු දේවාල ඉදිවීම වැනි කරුණු මගින් මෙම බලපෑම මනාව තහවුරු වේ. තවද, බෞද්ධ ජනතාව අතර දේව වන්දනාව ප්‍රචලිත වීම තුළින් ආගමික බහුත්වවාදී පසුබිමක් පොළොන්නරු යුගය තුළ ගොඩනැගී තිබූ බව පෙනේ. අවසාන වශයෙන්, හින්දු ආගමික බලපෑම පොලොන්නරු යුගයේ බෞද්ධ සංස්කෘතියේ විකාශනය කෙරෙහි සුවිශේෂී සහ තීරණාත්මක බලපෑමක් සිදු කළ බවත්, එම යුගය මෙරට සංස්කෘතික ඉතිහාසයේ බහු ආගමික සංසර්ගය ඉහළින්ම ප්‍රකට කළ වැදගත් අවධියක් බවත් මෙම පර්යේෂණය මගින් නිගමනය විය.

ප්‍රමුඛ පද: චෝල ආක්‍රමණ, පිළිම ගෙවල්, පොලොන්නරු යුගය, බෞද්ධ සංස්කෘතිය, හින්දු ආභාසය

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිරිසඟබෝ රාජ චරිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එල්.එම්. සංදීපනී ස්වර්ණමාලී ලංසකාර
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20384@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සිරිසඟබෝ රජු යනු අතිශය ජනප්‍රිය මෙන් ම ආගමික භක්තියෙන් පුදනු ලබන ඓතිහාසික චරිතයකි. එහෙත් මෙම චරිතය වටා ගොඩනැගී ඇති ආඛ්‍යානය ප්‍රාථමික මූලාශ්‍රයවල සිට පසුකාලීන සාහිත්‍ය කෘති සහ ජනප්‍රවාද දක්වා පැමිණීමේ දී විවිධ වෙනස්කම්වලට භාජනය වී ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ සිරිසඟබෝ කතා පුවත කලින් කලට සංවර්ධනය වී හෝ වෙනස් වී ඇති බව අමතක කොට වර්තමාන ස්ථාන නාම හා මෑත කාලීන ජනප්‍රවාද අනුව යමින් පමණක් ඉතිහාසය ගොඩනැගීමට හා විවිධ ප්‍රදේශවලට ඓතිහාසිකත්වයක් ලබාදීමට ඇතැම් උගතුන් ගත් උත්සාහයක් ද යන්න විමර්ශනය කිරීම යි. ඒ අනුව දීපවංශය හා මහාවංශය වැනි ප්‍රාථමික මූලාශ්‍රයවල එන සිරිසඟබෝ චරිතයත් පසුකාලීන ව ලියවුණු කෘතිවල එන චරිතයත් අතර පරස්පරතා සහ කතා පුවතේ වර්ධනය විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ යි. මෙම අධ්‍යයනය සම්පූර්ණයෙන් ම ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් මත පදනම් වන අතර ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය භාවිතයෙන් දත්ත රැස්කර විශ්ලේෂණය කර ඇත. මෙම පර්යේෂණයට අනුව දීපවංශය හා මහාවංශය වැනි පැරණි මූලාශ්‍රයවල මේ රජු පිළිබඳ ව සඳහන් වන තොරතුරු වලට වඩා පසුකාලීන කෘති හා ප්‍රදේශීය ජනප්‍රවාද මඟින් ඊට බොහෝ අතිශයෝක්ති සහගත සිදුවීම් එක්කර ඇති බව තහවුරු වේ. විශේෂයෙන් ම ඇතැම් ප්‍රදේශවලට සාවද්‍ය ඓතිහාසික වටිනාකමක් ලබාදීමේ අරමුණින් පසුකාලීන ව ස්ථාන නාම හා බැඳුණු ජනප්‍රවාද නිර්මාණය වී ඇති බව අනාවරණය විය. එහෙත් සිරිසඟබෝ කතා පුවත යනු හුදෙක් ඓතිහාසික සිද්ධියක් පමණක් නොවන බවත් කාලානුරූපී ව වර්ධනය වී ඇති බෞද්ධ පරමාදර්ශී ප්‍රතිරූපයක් බවත් නිගමනය කළ හැකි ය. එබැවින් හුදෙක් වර්තමාන ස්ථාන නාම සහ මෑත කාලීන ජනප්‍රවාද මත පමණක් පදනම් ව ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීම ශාස්ත්‍රීය වශයෙන් ගැටලු සහගත වන බව පෙනේ.

ප්‍රමුඛ පද: සිරිසඟබෝ රජු, මහාවංශය, ජනප්‍රවාද, ඓතිහාසික මූලාශ්‍රය, ප්‍රදේශීය අනන්‍යතාව

මෙම අධ්‍යයනය සඳහා මහින්ද සෝමතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලි ඓතිහාසික යුගයට සිදු කළ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර සහ පොළොන්නරු යුග ඇසුරෙන්)

ඩබ්. ඩී. ගයානි මධුශංකා
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20406@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය ඉතිහාසයෙහි මහින්දාගමනයට පූර්ව අවධිය ප්‍රාග් බෞද්ධ යුගය ලෙස හඳුනාගත හැකි අතර, එම යුගයේ ආගමික ඇදහිලි හා විශ්වාස පැවති බව මහාවංසය, දීපවංසය වැනි වංශකථා මඟින් සනාථ වේ. ඒ අනුව මෙම ආගමික ඇදහිලි හා විශ්වාස මෙරටට බුදු දහම ලැබීමෙන් පසු, බුදු දහම හා සම්බන්ධ වී අනුරාධපුර හා පොළොන්නරු යන ඓතිහාසික යුගවලට සිදු කළ බලපෑම කෙබඳු වේ ද යන ගැටලුව නිරාකරණය කර ගැනීමේ මුඛ්‍ය අරමුණින්, ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලිවල මහින්දාගමනයේ බලපෑමෙන් ඇති වූ නව්‍ය ප්‍රවණතා අධ්‍යයනයත් අරමුණු කර ගනිමින් සිදු කළ මෙම පර්යේෂණයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත රැස් කොට, විස්තරාත්මක විධි ක්‍රමය යටතේ එම දත්ත විශ්ලේෂණය කරන ලදී. ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලි යනු ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමට පෙර පැවති ආගමික ඇදහිලි වේ. එය ජෛන ආගම, බ්‍රාහ්මණ ආගම වැනි සංස්ථාපිත ආගමික ඇදහිලිවලින් හා දේව, යක්ෂ, ස්වභාවික වස්තු වන්දනය වැනි අසංස්ථාපිත ආගමික ඇදහිලිවලින් ද සමන්විත වේ. මෙරටට බුදු දහම ලැබීමත් සමඟ අනුරාධපුර යුගයේ දී එකී ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලි වලට බෞද්ධ බලපෑම එල්ල වූ අතර, ඇතැම් ඇදහිලි කාලානුරූපී ව එම බලපෑමෙන් මිදී ස්වාධීන ලෙස නැවත මතු වී ඇත. තවත් සමහර ඇදහිලි බෞද්ධ ආභාසය ලබමින් පරිණාමයට ලක් ව ඇත. ජෛන හා බ්‍රාහ්මණ ආගම් වරින් වර නැවත මතු වීමත්, වෘක්ෂ වන්දනය, මළවුන් පිදීම, දේව වන්දනය ආදිය බුදු සමය බද්ධ වී දේව හා අමනුෂ්‍ය කොටස් වලට පිං දීම දක්වා පරිවර්තනය වීමත් මඟින් ඒ බැව් සනාථ වේ. මීට අමතර ව, පොළොන්නරු යුගයේ හින්දු ආගමේ මතුවීම ප්‍රබල වූ අතර, ශිව දෙවියන් වන්දනා කිරීම හා ජෛන ආගමික අදහස් මතු වීම ද විශේෂයෙන් දැකිය හැකිය. මේ අනුව, අනුරාධපුර හා පොළොන්නරු යුගවල ඇතැම් ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලි නැවත මතු වී ඇති අතර බොහොමයක් ප්‍රාග් බෞද්ධ ආගමික ඇදහිලි හා විශ්වාස බුදු දහම හෝ හින්දු දහමේ බලපෑම මත පරිණාමයට ලක් වී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ආගමික ඇදහිලි, ප්‍රාග් බෞද්ධ යුගය, අනුරාධපුර, පොළොන්නරුව, මහින්දාගමනය

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමියන්ගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ එන්. එම්. පෙරේරාගේ භූමිකාව පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ඩබ්ලිව්. පී. ආර්. මධුවන්ත
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20412@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ නූතන දේශපාලනයේ වාමාංශික ව්‍යාපාරය, කම්කරු අයිතිවාසිකම් දිනාගැනීම සඳහා වූ අරගලය සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සන්දර්භයේ වර්ධනය සම්බන්ධයෙන් ආචාර්ය එන්. එම්. පෙරේරා විසින් ඉටුකරන ලද කාර්යභාරය සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. විශේෂයෙන් ම මාක්ස්වාදී, රැඩිකල්වාදී අදහස් මූලික කරගත් වාමාංශික දේශපාලන ධාරාව යටතේ වාමාංශික නායකයෙකු ලෙස ශ්‍රී ලාංකික දේශපාලනයේ දිශානතිය, වෘත්තීය සමිති ව්‍යාපාර සහ පක්ෂ දේශපාලනය යනාදියට සැලකිය යුතු බලපෑමක් ඔහු සිදුකර ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ මූලික අරමුණු වූයේ 1930 සිට 1970 දක්වා ශ්‍රී ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ එන්. එම්. පෙරේරාගේ දේශපාලන ප්‍රවේශය, දේශපාලන භූමිකාව, දේශපාලන දර්ශනය සහ ක්‍රියාකාරීත්වය විචාරශීලී ව අධ්‍යයනය කිරීම යි. එමෙන් ම වාමාංශික අදහස්වල වර්ධනය, කම්කරු ව්‍යාපාරයේ සංවිධානය සහ පාර්ලිමේන්තු දේශපාලනයට ඔහුගේ දායකත්වය ඉස්මතු කිරීම ද මෙහි අරමුණු අතර විය. එන්. එම්. පෙරේරාගේ දේශපාලන දර්ශනය සහ ක්‍රියාකාරීත්වය වාමාංශික ව්‍යාපාරයේ වර්ධනයට සහ සමකාලීන දේශපාලන ප්‍රවාහයට ඇති කළ බලපෑම කුමක් ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස හැන්සාඩ් වාර්තා, පාර්ලිමේන්තු විවාද වැනි ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයක මූලාශ්‍රයවලින් ලබාගත් දත්ත විශ්ලේෂණය කරමින් නිගමනවලට එළඹෙන ලදී. දේශපාලන බලය අත්පත් කරගැනීමේ සාම්ප්‍රදායික ප්‍රවේශයකට වඩා ජනතා අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වූ දේශපාලන දර්ශනයක් ගොඩනැගීම සඳහා ඔහුගේ දායකත්වය වැදගත් වූවා සේ ම නූතන දේශපාලන සංවාදවලට ඔහුගේ දර්ශනයෙන් හා දේශපාලන ක්‍රියාකාරීත්වයෙන් ලැබුණු දායකත්වය රාජ්‍ය මන්ත්‍රණ සභාවට සහ පාර්ලිමේන්තුවට සිදුකළ මැදිහත්වීම්, කම්කරු ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ගිය ව්‍යාපාර වැදගත් ය. එහි දී එන්. එම්. පෙරේරාගේ දේශපාලන ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේ වාමාංශික දේශපාලන ව්‍යාපාරය ස්ථාපිත කිරීම, කම්කරු දේශපාලනය ශක්තිමත් කිරීම, පක්ෂ සන්ධාන දේශපාලනයේ වර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සම්ප්‍රදාය ගොඩනැගීම සඳහා මූලික පදනමක් සපයා ඇති බව පැහැදිලි විය. තව ද විපක්ෂ නායකයෙකු හා මුදල් අමාත්‍යවරයෙකු ලෙස දේශපාලනික වශයෙන් ඔහුගේ මැදිහත්වීම ශ්‍රී ලංකාවේ දේශපාලන ගමන් මඟ කෙරෙහි දීර්ඝකාලීන බලපෑමක් කළ බව හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පද: එන්.එම්.පෙරේරා, වාමාංශික දේශපාලනය, ලංකා සමසමාජ පක්ෂය, නායකත්වය, භූමිකාව

මෙම පර්යේෂණය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

රාගම බැසිලිකාවේ වාස්තු විද්‍යාත්මක සහ සමාජ සංස්කෘතික කාර්යභාරය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

එන්. ඒ. ජේ. මදුමාධවී,
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20417@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී දීර්ඝ කාලයක් තිස්සේ ලංකාව විවිධ ජාතීන්ගේ යටත්විජිතයක් ව පැවති බව පෙනේ. ශ්‍රී ලංකාවට පැමිණි යටත්විජිතවාදීන්ගේ වාණිජ අරමුණු සමඟ බැඳෙමින් පැවති අනෙක් ප්‍රධාන ම අරමුණ වූයේ ඔවුන්ගේ ආගම් මෙරට ව්‍යාප්ත කිරීම යි. යුරෝපීයයන් ඔවුන්ගේ කිතු දහම ලංකාවේ ස්ථාපිත කිරීමට දැඩි පරිශ්‍රමයක් දැරීය. මේ සඳහා ක්‍රියාත්මක මිෂනාරී ව්‍යාපාරයේ ප්‍රධාන ම උපක්‍රමයක් වූයේ මිෂනාරී න්‍යාය පත්‍රය යුරෝපීය අනන්‍යතාවට පමණක් සීමා නොවී කිතු දහම දේශීය ජනතාවට සමීප කිරීමට දේශීයන්ට වඩා හුරු පුරුදු දේශීය අනන්‍යතාවට අනුගත වන ආකාරයට ක්‍රියාත්මක කිරීම යි. රාගම බැසිලිකාවේ වාස්තු විද්‍යාව හා සමාජ සංස්කෘතික කාර්යභාරයේ යටත් විජිතවාදය, මිෂනාරී න්‍යාය පත්‍රය, දේශීයකරණය සම්මිශ්‍රණය වී ඇති ආකාරය විමර්ශනය කිරීම හා වර්තමානයේ පවා නොනැසී පවතින ආගමික හා සංස්කෘතික උරුම ස්ථානයක් ලෙස බැසිලිකාවේ පශ්චාත් යටත් විජිත වැදගත්කම අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. රාගම බැසිලිකාව මෙරට ක්‍රිස්තියානි උරුමයේ වැදගත් ස්ථානයක් හිමිකර ගත්ත ද එහි යටත්විජිත සම්භවය, වාස්තු විද්‍යාත්මක සංකේතවාදය, ප්‍රදේශීය ප්‍රජාව කෙරෙහි බලපෑම පිළිබඳ සීමිත ඓතිහාසික විමර්ශනයක් සිදු වී ඇත. පවතින අධ්‍යයන බොහොමයක් ද කොළඹ, මහනුවර ප්‍රධාන යටත්විජිත දේවස්ථාන කෙරෙහි අවධානය යොමු කර ඇත. එබැවින් මෙම පර්යේෂණය යටත්විජිත බල ව්‍යුහය, මිෂනාරී න්‍යාය පත්‍රය, දේශීය සංස්කෘතික සම්මිශ්‍රණයේ අවකාශය ලෙස රාගම බැසිලිකාවේ ක්‍රියාකාරීත්වය කුමක් ද යන ගැටලුව මත කේන්ද්‍රගත විය. ප්‍රස්තුත විෂය සඳහා ප්‍රාථමික, ද්විතීයක මූලාශ්‍රය අධ්‍යයනයෙන් මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ආදියෙන් තොරතුරු රැස් කළ අතර විස්තරාත්මක විධික්‍රමය යටතේ ඒවා විශ්ලේෂණය කරමින් දත්ත සංවිධානාත්මක අයුරින් ඉදිරිපත් කෙරුණි. එහි දී රාගම බැසිලිකාව හුදු ආගමික ගොඩනැගිල්ලක් පමණක් නොව යටත්විජිත බල ව්‍යුහය, මිෂනාරී න්‍යාය පත්‍රය හා දේශීය සංස්කෘතිය ප්‍රමුඛ කරගත් විශිෂ්ට සම්මිශ්‍රණයක සංකේතයක් ලෙස ක්‍රියා කරන බව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: යටත්විජිතකරණය, රාගම බැසිලිකාව, වාස්තු විද්‍යාව, සමාජ සංස්කෘතික කාර්යභාරය

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ පුරාණ කැටයම් තුළින් හෙළි වන කාන්තා නිරූපණය පිළිබඳ අධ්‍යයනයක් (අනුරාධපුර අවධිය ආශ්‍රයෙන්)

යූ.ඊ. මුණසිංහ
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20453@arts.pdn.ac.lk

පුරාණ කැටයම් කලාව ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ වඩාත් ම වැදගත් කලාත්මක හා සංස්කෘතික ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකි ය. එය හුදු සෞන්දර්යාත්මක අගයක් ඉසිලීමට පමණක් සීමා නොවී, අතීත සමාජ, ආර්ථික, ආගමික හා සංස්කෘතික ලක්ෂණ දෘශ්‍යමාන කරන සජීවී මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි. අනුරාධපුර යුගයට අයත් කැටයම් අතර ස්ත්‍රී නිරූපණ සුවිශේෂී ස්ථානයක් හිමිකර ගන්නා අතර, ඒවා මඟින් එදා පැවති සමාජ වටිනාකම් හා ආගමික සංකල්ප පිළිබිඹු වේ. දේවතා, යක්ෂ, නාග, උපස්ථායිකා සහ අර්ධ දිව්‍ය චරිත ආදී විවිධ සන්දර්භ ඔස්සේ කාන්තා රූප නිරූපණය කර තිබුණ ද, ඒ පිළිබඳ කෙරෙන සෘජු ශාස්ත්‍රීය අධ්‍යයන සාපේක්ෂ ව සීමිත ව පවතී. මෙම පර්යේෂණය මඟින් මිහින්තලය, රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය සහ ඉසුරුමුණිය යන ඓතිහාසික ස්ථාන කේන්ද්‍ර කරගනිමින්, එහි නිරූපිත කාන්තා ස්වරූප විශ්ලේෂණය කෙරෙයි. විශේෂයෙන් ම, එම රූපවල දක්නට ලැබෙන ඇඳුම් පැළඳුම්, ආභරණ, කේශ විලාසිතා සහ ශාරීරික ලක්ෂණ පිළිබඳ ව විමර්ශනය කිරීම මඟින් පුරාණ ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාවගේ සමාජ තත්ත්වය, ඔවුන් ඉටුකළ භූමිකා සහ ඔවුන් සතු සංකේතාත්මක වැදගත්කම හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. පුරාණ ලක්දිව කාන්තාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී, අනුරාධපුර යුගයේ හමු වන ස්ත්‍රී කැටයම් කෙතරම් දුරට මූලාශ්‍රය ලෙස උපකාරී වන්නේ ද යන්න මෙම පර්යේෂණ ගැටලුව මඟින් විමසනු ලැබේ. පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදයක් අනුගමනය කළ අතර, ඒ යටතේ ප්‍රාථමික හා ද්විතීයක සාහිත්‍ය මූලාශ්‍රය, පුරාවිද්‍යාත්මක සාක්ෂි, ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා දත්ත රැස්කිරීම සඳහා භාවිත කරන ලදී. සාහිත්‍ය මූලාශ්‍රයවල සීමිත ව සඳහන් කරුණු සනාථ කිරීමේ දී, කැටයම් කලාවේ පවතින ඓතිහාසික වටිනාකම සහ විශ්වසනීයත්වය මෙම අධ්‍යයනය මඟින් මනාව තහවුරු කරයි. පර්යේෂණ ප්‍රතිඵල අනුව, අනුරාධපුර යුගයේ කැටයම්වලින් නිරූපිත කාන්තා රූප අතීත ශ්‍රී ලාංකේය සමාජයේ කාන්තාවන්ගේ සෞන්දර්යාත්මක, ආගමික, සමාජීය හා සංස්කෘතික භූමිකා පිළිබිඹු කරන ජීවමාන ඓතිහාසික සාක්ෂි ලෙස නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: පුරාණ ශ්‍රී ලංකාව, අනුරාධපුර යුගය, කැටයම් කලාව, කාන්තා නිරූපණ, සංස්කෘතික උරුමය

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම පිළිබඳ විමර්ශනයක්

බී.එස්.ටී. පෙරේරා
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20497@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළයට අයත් තඹගමු පත්තුවේ පල්ලෙබැද්ද ග්‍රාමයේ ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරය වනාහි මෙරට බෞද්ධ ඉතිහාසය සහ සංස්කෘතික උරුමය නිරූපණය කරන සුවිශේෂී ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානයකි. තව ද මෙම විහාරස්ථානය අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා දීර්ඝ ඓතිහාසික විකාශනයකට උරුමකම් කියන පූජනීය මෙන් ම පුරාවිද්‍යාත්මක ස්ථානයකි. එහෙයින් මෙම පර්යේෂණයෙන් ශ්‍රී ලංකාවේ ආගමික, සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක උරුම පිළිබඳ ශාස්ත්‍රීය අවබෝධය ගැඹුරු කිරීම සඳහා ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරයේ ඓතිහාසිකත්වය කවරේද යන්න විමසීම පර්යේෂණ ගැටලුව විය. සෙල්ලිපි, ගුහා ලෙන්, අනෙකුත් පුරාවිද්‍යාත්මක නටඹුන් හා සාහිත්‍ය මූලාශ්‍රය විශ්ලේෂණය කිරීමෙන් ශ්‍රී සංඛපාල පූරාණ රජමහා විහාරයේ ඓතිහාසික ආරම්භය, සංවර්ධනය සහ වැදගත්කම විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. මේ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, සෘජු නිරීක්ෂණ වැනි ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම පුස්තකාල පරිශීලනය, පුරාවිද්‍යාත්මක වාර්තා, පොත්පත්, විද්වත් ලිපි වැනි ද්විතීයක මූලාශ්‍රය ද උපයෝගී කරගනු ලැබීය. එනම් ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරයේ ඓතිහාසිකත්වය විමර්ශනය කිරීම සඳහා යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක විශ්ලේෂණ ඒකාබද්ධ කරන බහුවිධ ප්‍රවේශයක් විය. පර්යේෂණයේ දී හඳුනාගත් පරිදි දුටුගැමුණු රජුගේ දසමහා යෝධයන්ගෙන් කෙනෙකු වූ ඵුස්සදේව යෝධයා මෙම විහාරස්ථානයේ ආරම්භක පසුබිම හා සම්බන්ධ බව තහවුරු විය. තව ද මෙම විහාරස්ථානයට අයත් අනුරාධපුර මුල් යුගයට අයත් පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි මඟින් එම කරුණ තවදුරටත් තහවුරු කෙරේ. ක්‍රමයෙන් සංවර්ධනය වූ මෙම විහාරය පරසතුරු ආක්‍රමණ, රටේ අභ්‍යන්තර කෝලාහල සහ ස්වභාවික විෂම බලපෑම් හේතු කොටගෙන අභාවයට ගිය ද නැවත මහනුවර රාජධානි සමයේ දී රාජාධිරාජසිංහ රජුගේ රාජකීය අනුග්‍රහය යටතේ කරතොට ධම්මාරාම හිමියන්ගේ මැදිහත්වීමෙන් නව පුනර්ජීවනයක් ලබා ඇත. මහනුවර යුගයට අයත් සිතුවම් හා මූර්ති කලා ලක්ෂණ විහාරස්ථානයේ කලාත්මක හා සංස්කෘතික වැදගත්කම තවදුරටත් මතු කරයි. මෙම පර්යේෂණය මඟින් ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරය යනු හුදෙක් ප්‍රදේශීය වටිනාකමකින් යුත් සිද්ධස්ථානයක් පමණක් නොව ලක්දිව බෞද්ධ ශිෂ්ටාචාරයේ සහ දේශපාලන ඉතිහාසයේ හැරවුම් ලක්ෂ්‍යයක් නිරූපණය කරන ජාතික උරුමයක් බව තහවුරු කරයි. මෙමඟින් අනාවරණය කරගත් කරුණු විහාරස්ථානයේ සංරක්ෂණ ක්‍රියාවලියට මෙන් ම ඉදිරි ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක පර්යේෂණ සඳහා මනා මඟ පෙන්වීමක් සපයනු ඇත.

ප්‍රමුඛ පද: ශ්‍රී සංඛපාල පුරාණ රජමහා විහාරය, සෙල්ලිපි, ඵුස්සදේව යෝධයා, මහනුවර යුගය, කරතොට ධම්මාරාම හිමි

මෙම අධ්‍යයනය සඳහා මධුරාවල සෝභිත හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාවේ දේශපාලන සන්දර්භය කෙරෙහි ඩඩ්ලි සේනානායකගේ භූමිකාව පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ඒ. එස්. ශක්ති ප්‍රබෝධ
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20515@arts.pdn.ac.lk

1948 වසරේ දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයෙන් නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධාන ම අභියෝගය වූයේ ස්ථාවර පශ්චාත් යටත්විජිත රාජ්‍යයක් සහ දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම යි. මෙම තීරණාත්මක සමයේ සිව් වතාවක් අග්‍රාමාත්‍ය ධුරය හෙබ වූ ඩඩ්ලි සේනානායකගේ භූමිකාව ලංකා දේශපාලන ඉතිහාසයේ සුවිශේෂී සංධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම අධ්‍යයනය මඟින් ඔහුගේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන අනන්‍යතාව සහ එමඟින් මෙරට දේශපාලන පරිවර්තනය කෙරෙහි ඇති කළ බලපෑම ඓතිහාසික ප්‍රවේශයකින් යුතු ව විග්‍රහ කෙරේ. ඩඩ්ලි සේනානායකගේ ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය සහ දේශපාලන අනන්‍යතාව පශ්චාත් යටත්විජිත ශ්‍රී ලංකාවේ දේශපාලන පරිවර්තන කෙරෙහි බලපෑවේ කෙසේද යන පර්යේෂණ ගැටලුව පාදක කර ගනිමින් පර්යේෂණය සිදු කරන ලදී. රාජ්‍ය මන්ත්‍රණ සභිකයකු ව සිටිය දීත් අග්‍රාමාත්‍ය ධුරය හොබවනු ලැබූ කාලයේ දීත් ඩඩ්ලි සේනානායක සිදු කළ කෘෂිකාර්මික හා වාරිමාර්ග ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම, වාර්ගික හා ආගමික නොසන්සුන්තා කළමනාකරණයේ දී සිදු කළ මැදිහත්වීම සහ ලංකාවේ පසුකාලීන දේශපාලනය කෙරෙහි සේනානායකගේ බලපෑම අධ්‍යයනය කිරීම අරමුණු විය. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පශ්චාත් යටත්විජිත ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය අධ්‍යයනයට බඳුන් කරන ලදී. ඔහු ඇති කළ මෙම දේශපාලන පරිවර්තනය, පශ්චාත් යටත්විජිත ලංකාවේ රාජ්‍ය නිර්මාණ ක්‍රියාවලිය හැඩගැස්වීමේ දී තීරණාත්මක බලපෑමක් කළ බව මෙම පර්යේෂණය ඔස්සේ නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: ශ්‍රී ලංකාව, පශ්චාත් යටත්විජිත, ඩඩ්ලි සේනානායක, ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය, දේශපාලන අනන්‍යතාව

මෙම අධ්‍යයනය සඳහා නෙලුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

බ්‍රිතාන්‍ය පාලන අවධියේ වතු අධිකාරීත්වය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (නිලධාරීන්, පාලන විධික්‍රම හා කම්කරුවන්ගේ ක්‍රියාකාරිත්වය ඇසුරෙන්)

ඩී.එම්.පී. රණසිංහ
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20555@arts.pdn.ac.lk

බ්‍රිතාන්‍ය යටත්විජිත පාලන අවධිය යනු ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජ, දේශපාලන සහ සංස්කෘතික පරිවර්තන සිදු වූ තීරණාත්මක අවධියකි. ඔවුන් ලංකාවේ ආරම්භ කළ වතු වගාව යටත්විජිත පාලකයන්ගේ ආර්ථික අරමුණු ඉටු කරගැනීමේ ප්‍රධාන ම මාර්ගය බවට පත්කර ගන්නා ලදී. එහි දී දේශීයයන් වතු ශ්‍රමයට යොමු කරගැනීමට තිබූ අපහසුතාව නිසා බ්‍රිතාන්‍ය වැවිලිකරුන් විසින් දකුණු ඉන්දියානු ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් අතර වතු ආර්ථිකයේ සාර්ථකත්වය රඳා පැවතියේ එම ප්‍රජාවේ ක්‍රියාකාරීත්වය මත ය. වතු ආර්ථිකයේ වර්ධනයත් සමඟ නිෂ්පාදන ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා වතු කේන්ද්‍ර කර ගනිමින් පාලන ව්‍යුහයක් බිහි කළ අතර එහි කේන්ද්‍රය වූයේ යුරෝපීය වැවිලිකරුවන් ය. ඔවුන් විසින් වතුවල මූල්‍යමය හා උපාය මාර්ගික ඉලක්ක තීරණය කළ අතර වතු අභ්‍යන්තරයේ කාර්යක්ෂමතාව සහ ක්ෂේත්‍ර කටයුතු අධීක්ෂණය කිරීම සඳහා වතු අධිකාරීවරයාගේ සිට වතු කම්කරුවා දක්වා පරිපාලන ධුරාවලියක් නිර්මාණය කරගනු ලැබී ය. එබැවින් මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වූයේ වතු අධිකාරීත්වයේ නිලධාරී යාන්ත්‍රණය පිළිබඳ ව හා වතු අධිකාරීත්වයේ නෛතික බලය පිළිබඳ ව ඓතිහාසික අධ්‍යයනයක යෙදීම යි. මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව ලෙස ශ්‍රී ලංකාවේ වතු පාලනාධිකාරිය සහ යටත්විජිත රාජ්‍ය යාන්ත්‍රණය අතර පැවති අන්තර් සම්බන්ධතාව වතු කම්කරු ප්‍රජාවගේ දෛනික ජීවිතය කෙරෙහි සිදුකර ඇති බලපෑම කුමක්ද යන්න යොදා ගන්නා ලදි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය පරිශීලනය කරමින් වතු වගාවේ ආරම්භය සහ එහි ඓතිහාසික පසුබිම පිළිබඳ වත් වතු අධිකාරවරයාගේ සිට වතු කම්කරුවා දක්වා විහිදුණු බල ධුරාවලිය පිළිබඳ වත් රාජ්‍යය සහ වතු නිලධාරීන් අතර සබඳතාව පිළිබඳ වත් වතු අධිකාරී පාලන ක්‍රම කම්කරුවා කෙරෙහි බලපෑ ආකාරය පිළිබඳ වත් අධ්‍යයනය කරන ලදි. එහි දී මෙම පර්යේෂණය මඟින් බ්‍රිතාන්‍යයන් ඇති කළ ලංකාවේ වතු පරිපාලන ව්‍යුහය යනු පොදුගලික කළමනාකරණයක් නොව රාජ්‍ය අනුග්‍රහය, නීතිය, දැඩි ධුරාවලිගත නිලධාරී බලය සහ ණය උගුල් වැනි උපක්‍රමශීලී මෙවලම් එකිනෙක බද්ධ කරමින් වතු කම්කරු ප්‍රජාව වතු පරිශ්‍රයේ රඳවා තබාගත් පාලන ව්‍යුහයක් බව හඳුනාගත හැකි ය.

ප්‍රමුඛ පද: බ්‍රිතාන්‍ය සමය, වතු ආර්ථිකය, අධිකාරීත්වය, බල ධුරාවලිය, කම්කරු ප්‍රජාව

මෙම අධ්‍යයනය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වයඹ පළාතේ අම්බලම් පිළිබඳව ඓතිහාසික පර්යේෂණයක්

ආර්.එම්.එස්. රනෙහිපුර
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20561@arts.pdn.ac.lk

පුරාණ ශ්‍රී ලංකාවේ ගමනාගමනයේ දී බහුල ලෙස භාවිත කළ අම්බලම, වර්තමානයේ පුරාවිද්‍යාත්මක ස්මාරකයක් බවට පත් වී තිබේ. "උත්තර ශාලා" , "අම්බර" , "ඉසිඹුහල්" , "මාවත් මඩු", "Traveller's Rest" , "Way Side Inn" ආදී විවිධ නම්වලින් මූලාශ්‍රයවල ව්‍යවහාර වන අම්බලම, සමකාලීන සමාජයේ විශාල කාර්යභාරයක් ඉටු කළ ස්ථානයකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ වයඹ පළාතේ කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් එහි පවතින අම්බලම්වල ඓතිහාසික පසුබිම, වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සහ අතීත කාර්යභාරය විමර්ශනය කිරීම යි. මෙහි දී "අතීත අම්බලම බහුකාර්ය මධ්‍යස්ථානයක් ද" යන පර්යේෂණ ගැටලුව ඔස්සේ පුරාණ ශ්‍රී ලාංකේය ග්‍රාමීය සමාජ ව්‍යුහයේ අම්බලම වැදගත් සමාජ ආයතනයක් ලෙස ක්‍රියා කළ ආකාරය පිළිබඳ ව අවධානය යොමු කෙරේ. වර්තමානය වන විට ප්‍රායෝගික උපයෝගීතාවක් නොමැති වීම හේතුවෙන් අම්බලම යන අංගය අභාවයට ගිය ද ඒවායේ වත්මන් කාර්යභාරයේ වෙනස්වීම් විමසීමත් මෙහි සෙසු අරමුණු වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය ඇසුරින් දත්ත රැස්කර ඇත. අම්බලම පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රය සාපේක්ෂ ව අල්ප වුව ද, ඒවා ආශ්‍රයෙන් හමු වන පුරාවිද්‍යාත්මක ගෘහනිර්මාණ මූලාශ්‍රය ද, ප්‍රදේශවාසීන් සමඟ සිදුකළ සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් වාචික දත්ත ද අධ්‍යයනය සඳහා බෙහෙවින් පිටිවහල් විය. පර්යේෂණයේ සොයා ගැනීම් අනුව පැහැදිලි වන්නේ අම්බලම යනු හුදෙක් නවාතැනක් පමණක් නොව එය ග්‍රාමීය මට්ටමෙන් සමාජ සාකච්ඡා පැවැත් වූ ආගමික වත් පිළිවෙත් ඉටු කළ, ප්‍රදේශීය වෙළෙඳාම, අධිකරණ හා පාලන තීන්දු තීරණ ගත් මෙන් ම වැදගත් ජන සන්නිවේදන කාර්ය රැසක් ඉටුකළ සැබෑ බහුකාර්ය මධ්‍යස්ථානයක් වූ බව යි. එහෙත් වර්තමාන තාක්ෂණික දියුණුව සහ පුරාවිද්‍යා බලධාරීන්ගේ අවධානය නිසි ලෙස නොලැබීම හේතුවෙන් වයඹ පළාතේ අම්බලම් බහුතරයක් විනාශ වෙමින් පවතී. එබැවින් මෙම සුවිශේෂී අංගය මතු පරපුර උදෙසා සුරක්ෂිත කිරීම සඳහා විද්‍යාත්මක පදනමකින් යුතු ප්‍රායෝගික සංරක්ෂණ යෝජනාවලියක අවශ්‍යතාව මෙම ශාස්ත්‍රීය අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ.

ප්‍රමුඛ පද: ප්‍රාථමික මූලාශ්‍රයක්, වයඹ පළාත, අම්බලම්, බහුකාර්ය මධ්‍යස්ථාන, ඓතිහාසික පසුබිම

මෙම අධ්‍යයනය සඳහා රෝහිත දසනායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ඇළ මාර්ග හා බැඳුණු මෙරට වාරි තාක්ෂණය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්. (අනුරාධපුරයෙහි සහ පොළොන්නරුවෙහි තෝරා ගත් ඇළ මාර්ග හතරක් ආශ්‍රයෙන් - යෝධ ඇළ, ඇළහැර ඇළ, මිණිපේ ඇළ, අංගමැඩිල්ල ඇළ)

ආර්.එල්.කේ.එම්.රත්නායක
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20580@arts.pdn.ac.lk

පුරාතන ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය පිළිබඳ අධ්‍යයනයේ දී, වියළි කලාපීය වාරි ඇළ මාර්ග පද්ධතියේ පවතින තාක්ෂණික ප්‍රවීණතාව සුවිශේෂී වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වූයේ, ඇළ මාර්ග ආශ්‍රිත වාරි තාක්ෂණික ක්‍රමවේදවල පවතින සංකීර්ණත්වය විමර්ශනය කිරීමත්, මෙතෙක් අවධානයට ලක් නොවූ තාක්ෂණික අගය හෙළිදරව් කිරීමත් ය. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය අධ්‍යයනය කිරීමේ දී අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් ඇළ මාර්ග කොතෙක් දුරට මූලාශ්‍රය ලෙස උපකාරී වන්නේ ද යන්න මෙම පර්යේෂණ ගැටලුව මඟින් විමසනු ලැබේ. අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කළ අතර, ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර ගවේෂණ සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා දත්ත රැස්කිරීම සඳහා භාවිත කරන ලදී. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව, පැරණි වාරි ඉංජිනේරුවන් ඇළ මාර්ගවල නැග්ම, බැස්ම, ගමන් මඟ, ජල ප්‍රවාහ වේගය, ගැඹුර, බෑවුම් ප්‍රතිශතය සහ දිශානතිය වැනි තාක්ෂණික සාධක මැනවින් කළමනාකරණය කර ඇත. යෝධ ඇළ, ඇළහැර ඇළ, අංගමැඩිල්ල ඇළ සහ මිණිපේ ඇළ වැනි ප්‍රධාන ඇළ මාර්ග කේන්ද්‍ර කරගනිමින් සිදු කළ මෙම අධ්‍යයනය මඟින්, ඓතිහාසික වාරි ශිෂ්ටාචාරයේ ඇළ මාර්ගවල දායකත්වය, අන්තර් නිම්න ජල සම්පාදනය සහ අමුණු භාවිතය පිළිබඳ ව පුළුල් ලෙස විමර්ශනය කෙරේ. වියළි කලාපීය භූ විෂමතාව, දේශගුණික තත්ත්ව සහ ජල කළමනාකරණ මූලධර්ම මැනවින් සංකලනය කරමින් මෙම නිර්මාණ සිදු කර ඇති බව තහවුරු වේ. වියළි කලාපීය වැව් පද්ධතියේ තිරසාරභාව සඳහා මෙම ඇළ මාර්ග ජාලය අපූර්ව ජෛව හා තාක්ෂණික ක්‍රමවේද භාවිත කරමින් නිර්මාණය කර ඇත. අවසාන වශයෙන්, මෙම ඇළ මාර්ග ජාලය හුදු ජල ප්‍රවාහන මාධ්‍යයක් පමණක් නොව, ඉහළ වාරි ඉංජිනේරු තාක්ෂණයක් පෙන්නුම් කරන විශිෂ්ට නිර්මාණයක් බවත්, වර්තමාන ජල අර්බුදයට විසඳුම් සෙවීමේ දී මෙම පුරාතන වාරි සංකල්ප සක්‍රීය ව උපයෝගී කරගත හැකි බවත් මෙම පර්යේෂණය මඟින් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: වාරි තාක්ෂණය, ඇළ මාර්ග, වියළි කලාපය, ජල කළමනාකරණය, වාරි ඉංජිනේරු ශිල්පය

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මහනුවර යුගයේ සූපවේදය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (ඉවුම් පිහුම්, ශිල්පීය ක්‍රම, අමුද්‍රව්‍ය සහ ආහාර චාරිත්‍ර)

ආර්.එම්.එන්.එල් රත්නායක
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20584@arts.pdn.ac.lk

උඩරට රාජධානි සමය හෙවත් මහනුවර යුගය ලාංකේය ඉතිහාසයේ සුවිශේෂී කාල පරිච්ඡේදයක් වන අතර ඒ නිසා ම මෙම යුගයේ සුවිශේෂී භූගෝලීය පිහිටීම, දේශපාලනික ස්වාධීනත්වය සහ බාහිර යටත්විජිත බලපෑම් හමුවේ සාපේක්ෂ ව හුදකලාව පැවතීම හේතුවෙන් කැපී පෙනෙන සමාජ, සංස්කෘතික ලක්ෂණ පෙන්නුම් කරයි. මේ අතර උඩරට සමාජයේ ආහාරපාන රටාවට ද හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ආහාර යනු හුදෙක් මිනිසාගේ මූලික අවශ්‍යතාවක් පමණක් නොව, එය යම් නිශ්චිත යුගයක සංස්කෘතික අනන්‍යතාව, සමාජ ව්‍යුහය, ආර්ථික තත්ත්ව සහ ආගමික විශ්වාස නිරූපණය කරන ප්‍රධාන ඓතිහාසික මූලාශ්‍රයකි. මහනුවර යුගයේ දේශපාලන සහ සමාජ ඉතිහාසය පිළිබඳ ව පුළුල් ලෙස පර්යේෂණ සිදු ව තිබුණ ද ඒ සඳහා සූප ශාස්ත්‍රය භාවිත කර ඇත්තේ ඉතාමත් අවම වශයෙනි. මෙම පර්යේෂණය මඟින් මහනුවර යුගයේ සමාජ සංවිධානය, දේශපාලනය, සංස්කෘතිය සහ ආගමික කටයුතු පිළිබඳ ව අධ්‍යයනය සඳහා ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස සූපවේදය යොදා ගනිමින් මහනුවර යුගයේ භාවිත වූ ප්‍රධාන ඉවුම්, පිහුම් ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම, විවිධ සමාජ කණ්ඩායම් විසින් පරිභෝජනය කරන ලද පොදු අමුද්‍රව්‍ය සහ ආහාර ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීම සිදු කරයි. ආහාර ආශ්‍රිත චාරිත්‍ර චාරිත්‍ර සහ ඒවායේ සංස්කෘතික හා ආගමික වැදගත්කම් පරීක්ෂා කරමින් ඉවුම්, පිහුම් පිළිවෙත්වලින් මහනුවර යුගයේ පුළුල් සමාජ, දේශපාලනික සහ ආර්ථික සන්දර්භය පිළිබිඹු වන ආකාරය මෙම පර්යේෂණය මඟින් ඇගයීමට ලක්විය. පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතීයක මූලාශ්‍රය පරිශීලනය, සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස්කිරීම, විශ්ලේෂණාත්මක ඇගයීම් මඟින් නිගමනවලට එළඹීමේ ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරනු ලැබිණි. මේ අනුව සූපවේදය යනු හුදෙක් මුළුතැන්ගෙට පමණක් සීමා වූ කාර්යයක් පමණක් නොව මහනුවර යුගයේ දෛනික ජීවිතය, සමාජ ධුරාවලිය, ආර්ථික හුවමාරු රටා සහ සංස්කෘතික අන්තර් ක්‍රියා පිළිබඳ ව වටිනා අවබෝධයක් ලබාදෙන මෙම යුගයේ ඉතිහාසය අධ්‍යයනය කළ හැකි ප්‍රධාන ම මෙන් ම ඓතිහාසික මූලාශ්‍රයක් බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: මහනුවර යුගය, සූපවේදය, ඓතිහාසික මූලාශ්‍රය, ආහාර චාරිත්‍ර, සංස්කෘතික අනන්‍යතාව

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

යටත්විජිත ශ්‍රී ලංකාවේ තැපැල් සේවයේ ආරම්භය සහ විකාශය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ආර්. එම්. පී. පී. පී. රත්නායක
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20585@arts.pdn.ac.lk

මානව සම්භවයේ ආරම්භයේ සිට ම විවිධ ක්‍රම මාර්ගයෙන් සන්නිවේදනය සිදු වී ඇත. අතීතයේ සිට ම සමූහයා අතර සන්නිවේදනය සඳහා ශ්‍රී ලංකාවේ ද විවිධ ක්‍රම භාවිත කර තිබේ. ලිපි මාර්ගයෙන් අදහස් හුවමාරු කරගැනීම සන්නිවේදනයේ සංවර්ධිත අවස්ථාවක් වන අතර යුරෝපා රටවල තැපැල් සේවාව ඒ සඳහා ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාවේ තැපැල් සේවය පණිවිඩ හුවමාරු ක්‍රමයක් ලෙස මුලින් ම ලන්දේසීන් විසින් ආරම්භ කර ඇති අතර එම සේවාව නිල රාජ්‍ය පාලන කටයුතුවලට පමණක් සීමා විය. පසුව බ්‍රිතාන්‍යයන් ලංකාව අත්පත් කරගැනීමෙන් අනතුරු ව තැපැල් සේවය විධිමත් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව මෙම පර්යේෂණයෙන් තැපැල් සේවයේ ආරම්භය හා විකාශය පිළිබඳ ව අධ්‍යයනය කරන ලදී. තැපැල් සේවය ආරම්භයට සහ වර්ධනයට බලපෑ අභ්‍යන්තර හා බාහිර සාධක හඳුනා ගැනීම හා බ්‍රිතාන්‍යය යුගයේ තැපැල් සේවාව ලංකාවේ සමාජ මතවාද ව්‍යාප්තියට සිදු කළ බලපෑම අධ්‍යයනය මෙම පර්යේෂණයේ මූලික අරමුණු විය. බ්‍රිතාන්‍ය පාලන කාලයේ ශ්‍රී ලංකාවේ තැපැල් සේවාව වර්ධනය වීම ලංකා සමාජයේ මතවාද ව්‍යාප්තියට බලපෑවේ කෙසේ ද යන්න මූලික පර්යේෂණ ගැටලුව ලෙස ගැනුණු අතර ම, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය අධ්‍යයනයට බඳුන් කරන ලදී. මූලාශ්‍රයවලින් ලද තොරතුරු ඇසුරින් ලංකාවේ තැපැල් සේවාවේ ආරම්භය, තැපැල් සේවා දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා එහි වර්ධනය මෙන් ම සමකාලීන ලංකා සමාජයේ වූ මතවාද සමාජගත වීම සඳහා තැපැල් සේවයෙන් සිදු වූ දායකත්වය යන අංශ අධ්‍යයනය කළ අතර එහි දී බ්‍රිතාන්‍ය පාලන සමයේ ස්ථාපිත කළ තැපැල් සේවය, හුදෙක් රාජ්‍ය පරිපාලන මෙවලමක් පමණක් නොව විවිධ මතවාද ජාලගත කිරීමේ ප්‍රධාන ම සන්නිවේදන මාධ්‍ය ලෙස හඳුනාගන්නා ලදී. එමෙන් ම තැපැල් සේවය බ්‍රිතාන්‍යයන්ගේ අවශ්‍යතා අරමුණු කරගෙන ස්ථාපිත කළ ද ලාංකිකයන් ද තැපැල් සේවය දේශීය අනන්‍යතා, ආගමික දෘෂ්ටිවාද සහ නිදහස්කාමී ජාතිකවාදී මතවාද ව්‍යාප්ත කිරීමේ මෙවලමක් ලෙස භාවිත කර තිබෙන බව පැහැදිලි විය.

ප්‍රමුඛ පද: ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍යය පාලනය, තැපැල් සේවය, සන්නිවේදනය, මතවාද ව්‍යාප්තිය.

මෙම අධ්‍යයනය සඳහා නෙළුම් ජයතිලකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමිග

නායක්කර් පාලන සමයෙහි දී ප්‍රදානය කළ සන්නස් මඟින් හෙළිවන සමකාලීන ඉඩම් භුක්ති ක්‍රමය පිළිබඳ අධ්‍යයනයක්

බද්දේගම චින්තක හිමි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20600@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ අවසාන ස්වදේශීය රාජධානිය වූ මහනුවර රාජ්‍යයේ පාලකයින් වශයෙන් දකුණු ඉන්දියානු නායක්කර් වංශිකයන් බලයට පත්වීමෙන් පසු ව එහි දේශපාලනික, සමාජයීය මෙන් ම ආර්ථික ක්ෂේත්‍රවල සැලකිය යුතු වෙනස්කම් රැසක් සිදු විය. මෙකී පරිවර්තන මධ්‍යයේ සාම්ප්‍රදායික ඉඩම් භුක්ති ක්‍රමය නායක්කර් පාලකයන්ගේ අවශ්‍යතා අනුව හැඩගැසුණේ කෙසේ ද යන්න සහ එකල පැවති ඉඩම් පරිපාලන නීතිරීති මොනවාද යන්න පිළිබඳ මෙම අධ්‍යයනයෙහි දී විමසා බැලීමට අපේක්ෂා කෙරේ. මහනුවර රාජධානියේ පැවති සියලු ඉඩකඩම්වල නාමික අයිතිකරුවා වූයේ රජු ය. හිමිකරුවා ලෙස රජු විසින් විවිධ පුද්ගලයන් හා ආයතන වෙත ඉඩම් ප්‍රදානය කිරීම සඳහා භාවිත කරන ලද නිල සහ ප්‍රධාන ම ලේඛන මාධ්‍යය වූයේ සන්නස් ප්‍රදානය යි. තඹ පත්‍ර, රිදී පත්‍ර හෝ පුස්කොළ මත ලියැවුණු මෙම සන්නස් මඟින් එකල පැවති ඉඩම් භුක්ති ක්‍රමයේ විවිධ ස්වරූප මැනවින් නිරූපණය වේ. නායක්කර් රජවරුන් දේශීය බෞද්ධ ජනතාවගේ සහ මහා සංඝරත්නයේ විශ්වාසය දිනාගැනීම සඳහා විහාරාරාම වෙත විශාල වශයෙන් ඉඩම් පූජා කළ බවත් එමඟින් ආගමික ඉඩම් භුක්තිය තවදුරටත් ශක්තිමත් වූ බවත් සන්නස් මඟින් නිසැක ව ම සනාථ වේ. එසේ ම රාජ්‍ය සේවය වෙනුවෙන් නිලධාරීන්ට තාවකාලික ව පවරන ලද 'නින්දගම්', 'බණ්ඩාරගම්' මෙන් ම රජුට සුවිශේෂී සේවා සැපයූ පුද්ගලයන්ට ප්‍රදානය කළ 'පරවේණි ඉඩම්' පිළිබඳ ව ද සන්නස් පත්‍රිකාවල සඳහන් නීතිමය කොන්දේසි රැසක් හඳුනාගත හැකිය. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් නායක්කර් සමයට අයත් වන සන්නස්, රාජකීය ලේඛන සහ එකල ලියැවුණු වෙනත් ලිපි ලේඛන භාවිත කළ අතර ද්විතීයක මූලාශ්‍රය ලෙස මහනුවර යුගයේ ආර්ථික ඉතිහාසය පිළිබඳ ලියැවුණු ග්‍රන්ථ සහ පර්යේෂණ පත්‍රිකා උපයෝගී කර ගෙන ඇත. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සිදුකළ මෙම අධ්‍යයනයේ අවසාන නිගමනය වන්නේ නායක්කර් සමයේ නිකුත් කළ සන්නස් යනු හුදෙක් ඉඩම් අයිතිය තහවුරු කළ ඔප්පු විශේෂයක් පමණක් නොව මහනුවර යුගයේ පැවති වැඩවසම් සමාජ හා ආර්ථික රටාව, කුල ක්‍රමය, රාජ්‍ය පරිපාලනය සහ නීතිමය පසුබිම වටහා ගැනීමට ඇති ඉතාමත් විශ්වසනීය සහ සජීවී ඓතිහාසික මූලාශ්‍රය විශේෂයක් වන බව යි.

ප්‍රමුඛ පද: නායක්කර් සමය, මහනුවර රාජධානිය, සන්නස්, ඉඩම් භුක්තිය, විහාරගම්, රාජකාරි ක්‍රමය.

මෙම අධ්‍යයනය සඳහා මහින්ද සෝමතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමය පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

පිනිදියගේ ඉසුරු ජගත් කුමාර
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20605@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමය පිළිබඳ ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා ශිලාලේඛනමය සාක්ෂි විමර්ශනය කිරීම අරමුණු කරගත් ශාස්ත්‍රීය අධ්‍යයනයකි. මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමය පිළිබඳ පවතින විවිධ මතවාද සහ මතභේද හමුවේ එම උරුමයේ ඓතිහාසික පැවැත්ම තහවුරු කරන විධිමත් හා විද්‍යාත්මක සාක්ෂි සංග්‍රහ කර විශ්ලේෂණය කිරීමේ අවශ්‍යතාව යි. ඒ අනුව යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමයට අදාළ පුරාවිද්‍යාත්මක ස්ථාන, ශිලාලේඛන, ඓතිහාසික වාර්තා සහ සාහිත්‍ය මූලාශ්‍රය ඇසුරින් එහි බෞද්ධ උරුමයේ ස්වභාවය හා වැදගත්කම විග්‍රහ කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කර ඇති අතර මහාවංසය, දීපවංසය, ශිලාලේඛන, පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වාර්තා, ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ ලිපි සහ අනෙකුත් ද්විතීයක මූලාශ්‍රයවලින් දත්ත රැස්කර විස්තරාත්මක හා විශ්ලේෂණාත්මක ක්‍රමවේද ඔස්සේ අධ්‍යයනය සිදු කර ඇත. පර්යේෂණයේ දී දඹකොළපටුන, නාගදීපය, කඳුරුගොඩ විහාරය, වල්ලිපුරම් ඇතුළු බෞද්ධ පුරාවිද්‍යාත්මක ස්ථාන මෙන් ම වල්ලිපුරම් රන් සන්නස සහ අනෙකුත් ශිලාලේඛන මඟින් යාපනය ප්‍රදේශයේ බෞද්ධ සංස්කෘතියේ පැවැත්ම සනාථ වන ආකාරය විමර්ශනය කර ඇත. එසේ ම පුරාණ වරාය, ස්ථාන නාම, ජාත්‍යන්තර වෙළඳ සබඳතා සහ පුරාවිද්‍යාත්මක සාක්ෂි අතර පවත්නා අන්තර් සම්බන්ධතාව ද විග්‍රහ කරමින් යාපනය අර්ධද්වීපයේ බෞද්ධ උරුමයේ ඓතිහාසික පදනම පැහැදිලි කර ඇත. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව යාපනය අර්ධද්වීපය ශ්‍රී ලංකාවේ බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතික උරුමය සම්බන්ධයෙන් සුවිශේෂී වැදගත්කමක් දරන ප්‍රදේශයක් වන අතර පුරාවිද්‍යාත්මක, ශිලාලේඛනමය සහ සාහිත්‍යමය සාක්ෂි මඟින් එහි බෞද්ධ උරුමයේ ඓතිහාසික පදනම තහවුරු වන බව අනාවරණය වේ. එබැවින් මෙම උරුමය සංරක්ෂණය කිරීම, විධිමත් ලෙස ලේඛනගත කිරීම සහ අනාගත පර්යේෂණ සඳහා පුළුල් අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනය මඟින් අවධාරණය කරයි.

ප්‍රමුඛ පද: පුරාවිද්‍යාව, ඓතිහාසික උරුමය, බෞද්ධ උරුමය, යාපනය අර්ධද්වීපය, ශිලාලේඛන.

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමියන්ගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ගම්පොළ යුගයේ කැටයම් කලාව පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (ඇම්බැක්කේ දේවාලය සහ ගඩලාදෙණිය විහාරය ඇසුරින්)

ආර්.ඩී. ඉරුෂි අමන්දා සමරතුංග
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20652@arts.pdn.ac.lk

ශ්‍රී ලංකා ඉතිහාසයේ දේශපාලනික හා සංස්කෘතික සංක්‍රාන්ති සමයක් ලෙස ගම්පොළ යුගය (ක්‍රි.ව. 1341-1415) සුවිශේෂී වේ. මෙම පර්යේෂණය මඟින් ගම්පොළ යුගයේ කැටයම් කලාව සහ ඒ ඔස්සේ පිළිබිඹු වන සමාජ-සංස්කෘතික පරිවර්තන පිළිබඳ විමර්ශනයක් සිදු කෙරිණි. මෙරට ඉතිහාසයේ ආරම්භයේ සිට ම මිනිසාගේ අනන්‍යතාව හා බැඳුණු කලාවක් ලෙස පැවති කැටයම් කලාව, ගම්පොළ යුගයේ දී කලාත්මක දෘෂ්ටි කෝණයකින් මෙන් ම සමාජ දෘෂ්ටි කෝණයකින් ද විශ්ලේෂණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ යි. විශේෂයෙන් ම, ඇම්බැක්කේ දේවාලයේ දැව කැටයම් සහ ගඩලාදෙණිය විහාරයේ ශෛලමය කැටයම් මඟින් ප්‍රකට කෙරෙන දකුණු ඉන්දීය කලා ආභාසය සහ දේශීය බෞද්ධ සන්දර්භය අතර වූ සහසම්බන්ධය විවරණය කිරීම මෙහි ප්‍රධාන අභිප්‍රාය විය. ගම්පොළ යුගයේ කැටයම් වලින් එකල පැවති සමාජ හා සංස්කෘතික තත්ත්ව පිළිබිඹු කරන්නේ ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය විශ්ලේෂණය, ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ විශේෂඥ සම්මුඛ සාකච්ඡා යන ක්‍රමවේද යොදා ගන්නා ලදී. ක්‍රි.ව. 1344 දී සිව්වැනි බුවනෙකබාහු රජුගේ අනුග්‍රහයෙන් ගණේෂ්වරාචාරි නම් ද්‍රවිඩ ශිල්පියාගේ මූලිකත්වයෙන් නිර්මාණය වූ ගඩලාදෙණිය විහාරයේ කැටයම් විජයනගර් කලා ලක්ෂණ මනාව ප්‍රකට කරයි. අනෙක් පසින්, තුන්වැනි වික්‍රමබාහු රජ සමයේ ඉදිකළ ඇම්බැක්කේ දේවාලය ලාංකික දැව කැටයම් කලාවේ කුටප්‍රාප්තිය සනිටුහන් කරයි. එහි හේවිසි මඩුවේ කුළුණු 32හි නෙළා ඇති හංස පූට්ටුව, භේරුණ්ඩ පක්ෂියා සහ දෛනික ජීවන දර්ශන වැනි නිර්මාණ මඟින් එකල පොදු ජන ජීවිතය සහ සංස්කෘතික ව්‍යුහය මනා ව නිරූපණය වේ. පර්යේෂණ ප්‍රතිඵල අනුව, ගම්පොළ යුගයේ කැටයම් කලාව හුදු සංස්කෘතික අංගයක් පමණක් නොව, ආගමික සහජීවනය, විදේශීය සබඳතා සහ ජනතාවගේ දෛනික ජීවන රටාවේ ස්වභාවය සන්නිවේදනය කරන ප්‍රබල මාධ්‍යයක් බව මෙම පර්යේෂණය මඟින් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: ගම්පොළ යුගය, කැටයම් කලාව, ඇම්බැක්කේ දේවාලය, ගඩලාදෙණිය ශ්‍රී සද්ධර්මතිලක විහාරය, සංස්කෘතික වෙනස්වීම්.

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ගිරයඃ
සංස්කෘතික භූමිකාව සහ තාක්ෂණික පරිවර්තනය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ඩී.එස්.සඳරුවන්,
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20668@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකික සංස්කෘතික උරුමයේ ගිරය යනු හුදෙක් පුවක් කැපීම සඳහා පමණක් භාවිත වූ සරල ගෘහස්ථ උපකරණයක් නොවේ. එය අතීත ජන සමාජයේ දෛනික ජීවිතය, කලාත්මක කුසලතාව සහ විශ්වාස පද්ධතිය මැනවින් නිරූපණය කරන කැඩපතකි. උඩු අත සහ යටි අත යන ලෝහමය කොටස් ද්විත්වය කවාකාර හිසකින් සම්බන්ධ කරමින් නිමවා ඇති මෙම මෙවලම බුලත් විට හැපීමේ සාම්ප්‍රදායික සංස්කෘතියේ වැදගත් අංගයක් විය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සුවිශේෂී අංගයක් ලෙස ගිරයේ ඓතිහාසික, සංස්කෘතික සහ තාක්ෂණික වැදගත්කම කුමක් ද යන්නයි. ගිරයේ උපත පිළිබඳ පුවත මහා සම්මත රජුගේ අග මෙහෙසිය වූ මැණික්පාල බිසවගේ ග්‍රහදෝෂාන්ධකාරය දුරු කිරීමේ දෙහි කැපීමේ චාරිත්‍රය දක්වා ඈතට දිවයයි. විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා විසින් යකඩ සහ වානේ උණුකර, මෝස්තර ශිල්පීය ක්‍රමවේදයට අනුව ගිරවෙකුගේ හැඩය සහිත ව ප්‍රථම ගිරය නිර්මාණය කළ බව ජනශ්‍රැතියේ සඳහන් වේ. භාවිතයේ විශේෂතා කාර්යභාරය සහ හැඩය අනුව සාම්ප්‍රදායික සමාජයේ ගිරය ප්‍රධාන වර්ග කිහිපකට බෙදා දක්වා ඇත. එනම්, ආභරණයක් ලෙස ගෙල ලා බඳින පොඩි ගිර, අදෘශ්‍යමාන ග්‍රහදෝෂ වැළැක්වීමට ගැහැණු දරුවන් පළඳින වැලකුම් ගිරය, ප්‍රසූතිකාගාරයේ දී පෙකණි වැල කැපීමට ගන්නා වැදුම් ගිරය, විවාහ මංගල්‍යයේ දී කිරිකඩ සේලයේ ගැටගසන පත්තිනි ගිරය සහ කාන්තාවන් කොණ්ඩය බැඳීමට ගන්නා කුමාරිහාමි ගිරය නම් වේ. පුවක් සහ ඖෂධ වර්ග කැපීමට අමතර ව, දේශීය යාතුකර්ම, යන්ත්‍ර මන්ත්‍ර සහ නිමිති ශාස්ත්‍රය වැනි ආගමික හා සමාජයීය සන්දර්භවල ගිරය සතු සංස්කෘතික භූමිකාව අතිශය සුවිශේෂී වේ. මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය සහ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කර විශ්ලේෂණය කරනු ලබයි. මිනිසා ලෝහ ශිල්පය ප්‍රගුණ කිරීමත් සමඟ වානේ, යකඩ, පිත්තල, රන් සහ රිදී වැනි විවිධ ලෝහ මාධ්‍යවලින් ගිරය නිර්මාණය විය. සෞන්දර්යාත්මක මොණර කැටයමින් සහ ගුරුළු පාද වැනි හැඩවලින් යුක්ත වූ මෙම සාම්ප්‍රදායික මෙවලම නූතන කාර්මික හා තාක්ෂණික පරිණාමය හමුවේ ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. අතීතයේ සිට ම ශ්‍රී ලාංකේය අනන්‍යතාවේ සංකේතයක් වූ ගිරය, වර්තමාන ප්‍රවණතා සහ ජීවන රටාවල වෙනස්වීම් හමුවේ කෞතුකාගාර භාණ්ඩයක් බවට පත්වීමේ අවදානමකට ලක් ව ඇත. එබැවින්, මෙම දේශීය මෙවලම සතු සාම්ප්‍රදායික තාක්ෂණික ඥානය සහ සෞන්දර්යාත්මක වටිනාකම මතු පරපුර උදෙසා සංරක්ෂණය කිරීම ප්‍රධාන වගකීමකි.

ප්‍රමුඛ පදඃ ගිරය, සංස්කෘතික උරුමය, සාම්ප්‍රදායික තාක්ෂණය, ජනශ්‍රැතිය, ලෝහ ශිල්පය

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

බෝධි සංස්කෘතිය හා ඒ හා බැඳි සමාජ පරිසරය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ටී.ජී. මල්කි සඳරුවනි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20670@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවට අනන්‍ය වූ සමාජ ක්‍රමයක් ලාංකේය සන්දර්භයේ මුල් බැසගෙන තිබේ. මෙම සංස්කෘතිය හැඩ ගැසීම කෙසේ සිදු වී ද යන්න අධ්‍යයනයේ දී, බෞද්ධ සමාජයේ බෝධිය වටා ගෙතී ඇති සමාජ ක්‍රමය සුවිශේෂී ව දිස්විය. මේ අනුව ලාංකේය සමාජය හා ඒ හා බැඳි සමාජ සංස්කෘතියට බෝධියෙන් සිදු කළ බලපෑම හඳුනාගැනීම සඳහා මෙම පර්යේෂණය සිදු කෙරිණි. මේ සඳහා පර්යේෂණ ගැටලුව ලෙස ලාංකේය සමාජයට බෝධි සංස්කෘතියෙන් වූ බලපෑම කවරේ ද යන පර්යේෂණ ගැටලුව යොදාගත් අතර ඒ ඔස්සේ පර්යේෂණය සිදු කෙරුණි. පර්යේෂණය සිදු කිරීම සඳහා යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක දත්ත භාවිත කෙරූ අතර ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය පාදක විය. මෙම පර්යේෂණය සිදු කිරීමේ දී ලාංකේය සමාජ ක්‍රමයේ හැරවුම් ලක්ෂ්‍යය ලෙස දේවානම්පියතිස්ස රාජ්‍ය සමයේ සිදු වූ මහින්දාගමන සිදුවීම වැදගත් සිදුවීමක් බව හා එහි දී සංඝමිත්තා තෙරණිය වැඩම වූ ශ්‍රී මහා බෝධි රෝපණය සමඟ ඒ වටා ගෙතුණු සමාජ පරිසරයක් නිර්මාණය වීම සිදු වූ බව හඳුනාගත හැකි ය. මෙම බෝධි රෝපණයෙන් දේශපාලන, සමාජ, ආර්ථික ක්ෂේත්‍රවලට බලපෑමක් සිදු ව ඇත. සමාජයේ ද අන්තර් පුද්ගල සබඳතා ගොඩ නැඟීමට හා ජන විශ්වාස අතර බෝධිය ප්‍රමුඛත්වය ගෙන තිබේ. ජන විශ්වාස අතර දරුඵල ලබා ගැනීමට, කරදර උපද්‍රව සිදු වූ විට, කෘෂිකර්මාන්ත සාර්ථක කර ගැනීම ආදී අවස්ථාවල දී බෝධියෙන් ආශිර්වාදය පැතීම පුරාතන කාලයේ සිට පැවත එයි. ග්‍රාමීය සමාජ ක්‍රමය ස්ථාවරත්වයට වැදගත් වී ඇති බව හඳුනාගත හැකි ය. බෝධිය හුදෙක් ආගමික ඇදහිල්ලකට එහා ගිය ජීවන රටාව සමඟ මුසු වුවකි . මෙම පර්යේෂණය සිදුකිරීමෙන් බෝධි වෘක්ෂ වන්දනාව ප්‍රාග් බෞද්ධ යුගවල පැවති වෘක්ෂ වන්දනා ක්‍රමවලින් බිඳී, බෞද්ධ අර්ථකථනයක් ඇති ව විකාශනය වූ ඇදහිලි ක්‍රමයකි. පැරණි යුගවල සිට පැවත ආ බව හඳුනාගත් අතර මෙම විකාශනය හුදෙක් ආගමික ඇදහිල්ලකට පමණක් සීමා නොවූ බව පැහැදිලි විය. මිනිසුන්ගේ ජන ජීවිතය සමඟ බැඳී පැවති බෝධි සංස්කෘතිය අඛණ්ඩ ව විකාශනය වූ බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: බෝධිය, ශ්‍රී ලංකාව, සංස්කෘතිය, වෘක්ෂ වන්දනාව, සමාජය

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වෙල්ගම් විහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව්.එම්.ටී.ඒ.ආර්. වීරසිංහ
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20684@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික අනන්‍යතාව මනාව විදහාපාන සුවිශේෂී පූජා භූමියක් ලෙස ත්‍රිකුණාමලයේ පිහිටි වෙල්ගම් වෙහෙර හඳුනාගත හැකිය. අනුරාධපුර යුගය දක්වා දිවෙන දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම විහාරස්ථානය, විශේෂයෙන්ම චෝල පාලන සමයේදී රාජ රාජ පෙරුම්පල්ලි යන ගෞරවනාමයෙන් චෝල පාලකයින්ගේ අනුග්‍රහයට පාත්‍රව ඇත. එසේම මෙකල දිවයිනේ ජීවත් වූ දෙමළ බෞද්ධයන්ගේද නොමඳ අනුග්‍රහය ලැබූ දේශීය ඉතිහාසයේ විරල ගණයේ මූලාශ්‍ර හමුවන ආගමික මධ්‍යස්ථානයකි. මෙම පර්යේෂණයේ මූලික වශයෙන් වෙල්ගම් විහාරයෙහි ඓතිහාසිකත්වය පිළිබඳ අධ්‍යයනය කරන අතර ඒ යටතේ අතීතයේ පැවති අෂ්ඨ මූලායතන අතරින් එක් මූලායතනයක් ලෙස ක්‍රියාකළ විල්ගම්මූලය තත් විහාරස්ථානය කේන්ද්‍ර කරගනිමින් සිදු වූයේද යන පර්යේෂණ ප්‍රශ්නය පාදක කරගෙන මෙම පර්යේෂණය සිදු කෙරේ. වෙල්ගම් වෙහෙර සුවිශේෂී වන්නේ ලක්දිව විශාලතම දෙමළ සෙල්ලිපි ප්‍රමාණයක් හමුවන එකම බෞද්ධ විහාරස්ථානය වීම හේතුවෙනි. මෙහි දක්නට ලැබෙන සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් කැටයම් වූ ශිලා ලේඛන මඟින් පැහැදිලි වන්නේ, සිංහල හා දෙමළ යන ද්විත්ව ජන කණ්ඩායම් මෙම විහාරය තම ආගමික කටයුතු සඳහා සමගියෙන් භාවිත කර ඇති බවයි. තවද, මෙම පූජා භූමියේ ගෘහ නිර්මාණ ශිල්පයෙහි දේශීය සම්ප්‍රදාය සමඟ දකුණු ඉන්දීය චෝල කලා ලක්ෂණ මුසු වී ඇති ආකාරය, මහ පිළිමගෙය සහ අනෙකුත් පුරාවිද්‍යාත්මක නටබුන් මඟින් සජීවී ලෙස විදහා දක්වයි. සිංහල-දෙමළ බෞද්ධ සබඳතා සහ සංස්කෘතික සංකලනය පිළිබඳ සාක්ෂි හමු වේ. ථේරවාදී සහ මහායාන බෞද්ධ සම්ප්‍රදායන්හි සංකලනය පිළිබඳ සාක්ෂි සපයයි. එසේම විදේශීය ආභාෂ විශේෂයෙන් දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායන්ගේ බලපෑම පිළිබඳ ලැබෙන මෙම දුර්ලභ සාක්ෂි, ලාංකීය ඉතිහාසයේ වැදගත් ප්‍රවේශ තහවුරු කිරීමට ඉවහල් වේ. මෙහි ගෘහ නිර්මාණ ශිල්පය, ශිලා ලේඛන, මූර්ති සහ කැයටම් ආදී පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර සහ සාහිත්‍යමය මූලාශ්‍ර අධ්‍යයන ක්ෂේත්‍ර ගවේෂණය සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් තොරතුරු රැස්කිරීමත්, දත්ත විශ්ලේෂණය මඟින් නිගමනවලට එළඹීමත් සිදුකෙරේ. අතීත ශ්‍රී ලංකාවේ සංස්කෘතික සහජීවනය වර්තමාන සමාජයට පූර්වාදර්ශයක් ලෙස ලබා දීමත්, ජාතික සමගිය උදෙසා ඉතිහාසය අර්ථවත් ලෙස භාවිත කිරීමත් මෙම පර්යේෂණයේ ප්‍රධාන අපේක්ෂාව වේ. ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමය පිළිබඳ වඩාත් පුළුල් හා සාධනීය දැක්මක් සමාජගත කිරීමෙහිලා වෙල්ගම් විහාරය සුවිශේෂී දායකත්වයක් ලබා දෙන බව මෙමඟින් පැහැදිලි වේ.

ප්‍රමුඛ පද: චෝල බලපෑම, පුරාවිද්‍යාත්මක සාධක, බෞද්ධ උරුමය, රාජ රාජ පෙරුම්පල්ලි, ශිලා ලේඛන අධ්‍යයනය

මෙම අධ්‍යයනය සඳහා සුමුදු ධර්මරත්නගෙන් ලැබුනු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

හෙළ වෙස් මුහුණු කලාව පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (අම්බලන්ගොඩ ප්‍රදේශය ඇසුරෙන්)

එච්.ඩබ්ලිව්. සඳුනි සෞභාග්‍යයා
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20692@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික කලාවන් පිළිබඳ අවධානය යොමුකරන විට දේශීය ජනයාගේ දැතින් නිර්මාණය වූ ප්‍රෞඩත්වය විදහා දක්වන උරුමයක් ලෙස වෙස් මුහුණු කර්මාන්තය සුවිශේෂී වේ. ලොව කුමන ජාතියකට හෝ ඉපැරණි වෙස් මුහුණු සම්පතක් උරුමව තිබීම එකී ජාතිය ලොව පෞරාණිකත්වයට පත් වූ ජන කොටසක් බව සපථ කිරීමේ සළකුණක් බව මානව විද්‍යාඥයන්, ඉතිහාසඥයන් ආදීන් විසින් පෙන්වා දෙනු ලබයි. වෙස් මුහුණු කලාව සම්බන්ධ පර්යේෂණ ඉතිහාසය තුළ මෙම අධ්‍යයනය සුවිශේෂී වන්නේ මෙම අධ්‍යයනයෙන් අම්බලන්ගොඩ ප්‍රදේශය මූලික කරගත් වෙස් මුහුණු කලාවේ ඓතිහාසිකත්වය හා සංස්කෘතිකාංගයක් ලෙස එහි ඇති වටිනාකම විවරණය වීමයි. මේ සම්බන්ධ සිදුකර ඇති ඓතිහාසික පර්යේෂණ අල්ප බැවින් එම හිඩැස සම්පූර්ණ කිරීමට මෙම පර්යේෂණය වැදගත් වේ. මෙහි ප්‍රධාන අරමුණ වූයේ වෙස් මුහුණු කලාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ ගවේෂණය කිරීමත් වෙස් මුහුණු කලාවේ නිර්මාණශීලිත්වය හා කලාත්මක බව ගවේෂණය කරමින් ඒ හා බැඳි සංස්කෘතිකාංග පිළිබඳ හෙළිදරව් කර ගැනීමත්ය. පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයක් වශයෙන් වෙස් මුහුණු කර්මාන්තයේ ඓතිහාසිකත්වය හා සංස්කෘතිකාංගයක් වශයෙන් එහි ඇති උපයෝගීතාව කිනම් ආකාරයකින් සුවිශේෂී වන්නේද ? යන්නයි. පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම, ක්ෂේත්‍ර ගවේෂණවල නිරත වෙමින් තොරතුරු ලබා ගැනීම සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මඟින්ද තොරතුරු රැස් කරන ලදි. වෙස් මුහුණු කලාවේ ඓතිහාසික ප්‍රභවය හා විකාශනය යටතේ එහි උපත , දේව මුහුණු , මනුෂ්‍ය මුහුණු යක්ෂ මුහුණු , සත්ත්ව මුහුණු ආදී චරිත හා වර්ග වශයෙන් ලංකාවේ පවතින විවිධ වෙස් මුහුණු වර්ග හා ඒවායින් ප්‍රකාශ වන භාවමය සන්නිවේදනය පිළිබඳ අවධානය යොමුකරමින් වෙස් මුහුණු නිර්මාණකරණ ක්‍රියාවලිය යටතේ විවිධ අංශ කෙරෙහි විශේෂයෙන් දැව වර්ග තෝරා ගැනීම සහ සැකසීම ,කැටයම් කිරීමේ තාක්ෂණය සහ ඊට අදාළ මෙවලම් , වර්ණ ගැන්වීම, භාවිත කරන ලද සාම්ප්‍රදායික ශිල්ප ක්‍රම හා නවීන ශිල්ප ක්‍රම සහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ සාම්ප්‍රදායික වෙස් මුහුණු ගුරුකුල පිළිබඳත් අවධානයට යොමු කර තිබේ . එමෙන්ම ලාංකේය වෙස් මුහුණ කලාව සාම්ප්‍රදායික සංස්කෘතිකාංගවල ප්‍රකාශනයක් වී ඇත. එහිදී කෝලම් නාටක ,ශාන්ති කර්ම , සොකරි නාටක ආදිය හා සබැඳි වෙස් මුහුණුවලින්, සංස්කෘතිකාංග සඳහා වෙස් මුහුණුවල වැදගත්කම පැහැදිලි වේ. වර්තමානයේ අම්බලන්ගොඩ ප්‍රදේශයෙහි වෙස් මුහුණු කලාව නව ප්‍රවණතා ද අත්පත් කරගනිමින් දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනාගත් වටිනා වාණිජ භාණ්ඩයක් මෙන්ම සංස්කෘතික උරුමයක් ලෙස ලබා ඇති වටිනාකමත්, හෙළ වෙස් මුහුණු කලාව නූතන තරගකාරී සමාජ රටාව නිසා විවිධ වූ අභියෝගවලට ලක් වූ ආකාරයත් එහි සුරක්ෂිතතාව පිණිස ගන්නා ලද ක්‍රමෝපාය යනාදි විවිධ පැතිකඩ මෙම පර්යේෂණය මඟින් අනාවරණය කෙරේ.

ප්‍රමුඛ පදඃ අම්බලන්ගොඩ, නිර්මාණකරණය, වෙස් මුහුණු, සංචාරක ආකර්ෂණය සංස්කෘතිකාංග

මෙම පර්යේෂණය සඳහා මදුරාවල සෝභිත හිමියන්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අභිලේඛන තුළින් හෙළිවන ඓතිහාසික තොරතුරු පිළිබඳ අධ්‍යයනයක්

එල්. ටී. ජී. එන්. ශ්‍රීමාලි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20750@arts.pdn.ac.lk

පුරාණ රුහුණු රාජධානියේ වැදගත් භූමි ප්‍රදේශයක් ලෙස හම්බන්තොට දිස්ත්‍රික්කය ශ්‍රී ලංකා ඉතිහාසයෙහි සුවිශේෂී ස්ථානයක් උසුලයි. මෙම ප්‍රදේශය පුරාණ ජනාවාස, ආගමික මධ්‍යස්ථාන, වාරි කර්මාන්ත සහ වෙළෙඳ සබඳතා වැනි විවිධ සංස්කෘතික උරුමවලින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමෙහිලා හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් හමුවන අභිලේඛන සුවිශේෂී සාධක සපයන්නේ ද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වේ. ඓතිහාසික මූලාශ්‍ර ලෙස හම්බන්තොටින් හමුවන අභිලේඛනවල අන්තර්ගත ඓතිහාසික වැදගත්කම හෙළි කිරීම, පුරාතන ලංකාවේ සමාජ, දේශපාලන, ආගමික, ආර්ථික හා සංස්කෘතික අංශ අභිලේඛන ආශ්‍රයෙන් ගොඩනැගෙන ආකාරය අධ්‍යයනය කිරීම සහ හම්බන්තොට දිස්ත්‍රික්කය මූලික කරගත් රාජවංශ, රාෂ්ට්‍රමය සහ සංස්කෘතික ඉතිහාසය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. මීට අමතර ව, අභිලේඛන සංරක්ෂණය උදෙසා ගත යුතු පියවර පිළිබඳත් මෙහිදී සාකච්ඡා කෙරේ. පර්යේෂණය සඳහා ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර චාරිකා මගින් තොරතුරු එක්රැස් කිරීම සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම යන ක්‍රමවේද භාවිත කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵල අනුව, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් හමුවන අභිලේඛනවලින් දේශපාලන, ආගමික, ආර්ථික, සමාජ සහ සංස්කෘතික වශයෙන් වූ අතිමහත් ඓතිහාසික තොරතුරු රාශියක් අනාවරණය වන බව තහවුරු විය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමෙහිලා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අභිලේඛන අතිශය වැදගත් සහ සුවිශේෂී සාධක සපයන මූලාශ්‍රයක් බව මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පදඃ අභිලේඛන, ඉතිහාසය, හම්බන්තොට දිස්ත්‍රික්කය, රුහුණු රාජධානිය, සංස්කෘතික උරුම

මෙම පර්යේෂණය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

පුරාණ ශ්‍රී ලංකාවේ ප්‍රාථමික කර්මාන්තයක් වන ලාක්ෂා කර්මාන්තය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

එච්.ඩබ්.ආර්.කේ. සෞම්‍යා සුරවීර
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20762@arts.pdn.ac.lk

පුරාණ ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත ආර්ථික රටාව තුළ විවිධ ප්‍රාථමික කර්මාන්ත වැදගත් භූමිකාවක් ඉටු කළ අතර, ඉන් ලාක්ෂා කර්මාන්තය සුවිශේෂී ස්ථානයක් හිමිකර ගනී. මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ, පුරාණ ලංකාවේ ප්‍රාථමික කර්මාන්ත අතුරින් ලාක්ෂා කර්මාන්තය වඩාත් සුවිශේෂී කර්මාන්තයක් ලෙස හඳුනාගත හැකි ද යන්න විමසා බැලීමයි. ලාක්ෂා කර්මාන්තයේ ඓතිහාසික වැදගත්කම හෙළි කිරීම, එහි සාම්ප්‍රදායික ස්වරූප සහ වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු විය. අධ්‍යයනය සඳහා ගුණාත්මක ප්‍රවේශයක් සහිත ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලදි. ඒ යටතේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පරිශීලනය කිරීම, ක්ෂේත්‍ර චාරිකා මගින් තොරතුරු එක්රැස් කිරීම සහ ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සිදු කෙරිණි. රැස්කරගත් දත්ත ඓතිහාසික හා විවේචනාත්මක විශ්ලේෂණයකට ලක් කෙරුණු අතර, එමගින් ලාක්ෂා කර්මාන්තයේ ඓතිහාසික පසුබිම පුළුල් ලෙස විමර්ශනය කරන ලදි. පර්යේෂණ ප්‍රතිඵල අනුව, අතීතයේ කෘෂීන්ගෙන් ලබාගත් ලාකඩ ඇසුරින් දියුණු වූ මෙම කර්මාන්තය හුදු ජීවනෝපාය මාර්ගයක් පමණක් නොව, රාජකීය සහ ආගමික අවශ්‍යතා සඳහා දායක වූ ඉහළ සෞන්දර්යාත්මක හා තාක්ෂණික වටිනාකමකින් යුත් කර්මාන්තයක් බව තහවුරු වේ. කෙසේ වුවද, වර්තමානයේ අමුද්‍රව්‍ය හිඟකම සහ නවීන විකල්ප හේතුවෙන් මෙම කර්මාන්තය අභාවයට යෑමේ තර්ජනයට ලක්ව ඇති අතර, මාතලේ ප්‍රදේශයේ පාරම්පරික ශිල්පීන් සුළු පිරිසක් විසින් සංචාරක ව්‍යාපාරය ඉලක්ක කරගනිමින් මෙය තවමත් ජීවමානව පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව, ඉහළ රාජ්‍ය අනුග්‍රහයක් ලැබූ මෙම සුවිශේෂී සංස්කෘතික උරුමය අනාගත පරපුර උදෙසා රැකගැනීමට විධිමත් රාජ්‍ය මැදිහත් වීමක් වර්තමානයේ අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනය මගින් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: ඓතිහාසික අධ්‍යයනය, ප්‍රාථමික කර්මාන්ත, රාජ්‍ය අනුග්‍රහය, ලාක්ෂා කර්මාන්තය, සංස්කෘතික අනන්‍යතාව

මෙම අධ්‍යයනය සඳහා සහන් මහේෂ්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

නායක්කර් වංශික පාලකයන්ගේ බෞද්ධාගමික ප්‍රතිපත්ති පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඉමේෂා වීරක්කොඩි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20818@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අවසාන ස්වාධීන රාජධානිය වූ කන්ද උඩරට වසර තුන්සියයකට අධික කාලයක් සිය ස්වාධීනත්වය රැක ගැනීමට සමත්විය. මුලින් ප්‍රාදේශීය රාජයක් වශයෙන් පැවති උඩරට, ස්වාධීන රාජධානියක් බවට පත් කරන ලද්දේ සේනාසම්මත වික්‍රමබාහු රජුය. දහඅටවන සියවස වන විට ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාවලිය ආශ්‍රිතව ඇති වූ බල අරගල සහ විදේශීය ආක්‍රමණ හමුවේ මෙරට ස්වදේශීය රාජ්‍යත්වය මෙන්ම සිංහල බෞද්ධ සංස්කෘතියද දැඩි පරිහානියකට ලක්ව තිබුණි. මෙවැනි තීරණාත්මක සංක්‍රාන්ති සමයක මහනුවර සිංහාසනයට පත් වූ දකුණු ඉන්දීය සම්භවයක් සහිත නායක්කර් වංශික රජවරුන් මෙරට ආගමික හා දේශපාලන ඉතිහාසය වෙනස් කළ තීරණාත්මක සාධකයක් බවට පත් විය. දහඅටවන සියවසේ මහනුවර රාජධානිය පාලනය කළ නායක්කාර් වංශික රජවරුන් අනුගමනය කළ බෞද්ධාගමික ප්‍රතිපත්ති, ඒවායේ අරමුණු සහ දිගුකාලීන බලපෑම පිළිබඳ විමර්ශනාත්මක විශ්ලේෂණයක් මෙමගින් සිදු කරනු ලදි. දේශීය රදල බලවේග සහ සංඝ සමාජයෙන් එල්ල වූ දේශපාලන හා සංස්කෘතික අභියෝග හමුවේ, විදේශීය සම්භවයක් සහිත මෙම පාලකයන් ස්වකීය දේශපාලන පැවැත්ම සහ රාජ්‍යත්වයේ වලංගුභාවය තහවුරු කරගැනීම සඳහා බුදුදහම උපක්‍රමශීලී අන්දමින් මෙවලමක් කර ගත්තේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ රාජ්‍යත්වය සහ ආගම අතර පැවති සංකීර්ණ සබඳතාවත්, දේශීය ආගමික හා සංස්කෘතික අනන්‍යතාව ශක්තිමත් කිරීමට ඔවුන් ගත් උපාය මාර්ගත් විමසා බැලීමය. මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය සහ පුස්තකාල පරිශීලනය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කර ඇත. පර්යේෂණයේ සොයා ගැනීම්වලට අනුව නායක්කර් පාලකයන්ගේ හින්දු ආගමික පසුබිම සහ දකුණු ඉන්දීය සබඳතා හේතුවෙන් මතුවූ අභ්‍යන්තර දේශපාලන විරෝධතා සමනය කරගැනීමට ඔවුන් දැඩි ලෙස බෞද්ධ රාජ්‍ය ප්‍රතිපත්ති වෙත නැඹුරුවී ඇත. වැලිවිට සරණංකර හිමියන්ගේ මූලිකත්වයෙන් උපසම්පදාව නැවත පිහිටුවීම, දළදා පෙරහැර උත්කර්ෂවත් අයුරින් පැවැත්වීම, බෞද්ධ අධ්‍යාපනය නංවාලීම සහ විහාරස්ථාන ප්‍රතිසංස්කරණය වැනි කාර්ය සඳහා රාජ්‍ය අනුග්‍රහය උපරිමයෙන් ලබා දී ඇත. නායක්කර් රජවරුන්ගේ මෙම ප්‍රතිපත්ති හුදු දේශපාලන උපක්‍රමයක් පමණක් නොව, එමඟින් පරිහානියට පත්ව තිබූ සිංහල බෞද්ධ සංස්කෘතිය සහ ජාතික අනන්‍යතාව පුනර්ජීවනය වීමටත්, සමකාලීන සමාජ-සංස්කෘතික ව්‍යුහයෙහි දිගුකාලීන සාධනීය ප්‍රතිඵල ඇති කිරීමටත් හේතුවී තිබේ.

ප්‍රමුඛ පදඃ නායක්කර් වංශය, බෞද්ධ ප්‍රතිපත්ති, මහනුවර රාජධානිය, රාජ්‍යත්වය සහ ආගම, සංස්කෘතික පුනර්ජීවනය

මෙම අධ්‍යයනය සඳහා මහින්ද සෝමතිලකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ශිල්පීය සංකේතයක් ලෙස පුන්කලසේ විකාශනය සහ එහි භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා)

පී. එම්. එස්. විජේරත්න
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20855@arts.pdn.ac.lk

පුන්කලස කලා ඉතිහාසය සහ සංකේත විද්‍යාව ආශ්‍රිතව නිරන්තරයෙන් දෘශ්‍යමාන වන ශිල්පීය අංගයකි. ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික මුහුණුවර තුළ අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා එහි කැපීපෙනෙන විකාශනයක් සිදු වූ බැවින් එම කාලපරිච්ඡේදයෙහි පුන්කලසේ භාවිතය අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය ඔස්සේ සිදුකරන ලදි. ජනප්‍රිය භාවිතයක් පැවතියද පුන්කලස පිළිබඳ ලාංකේය පර්යේෂණවල වියුක්තතාවක් පවතී. එබැවින් ශිල්පීය අංගයක් ලෙස පුන්කලසේ පවතින වැදගත්කම කවරේදැයි විමංසනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව ලෙස ගනු ලැබීය. මෙහි පර්යේෂණ අරමුණු වූයේ ශිල්පීය අංගයක් ලෙස පුන්කලසේ ඓතිහාසික අගය හෙළිකිරීම, ශිල්පීය විකාශනයේදී එහි සිදු වූ ස්වරූපීයමය වෙනස හඳුනාගැනීම සහ නව දැනුමක් උත්පාදනය කිරීමෙන් නවක පර්යේෂකයන්ට පූර්වාදර්ශයක් සැපයීමයි. මෙම අධ්‍යයනය ඓතිහාසික ක්‍රමවේදය භාවිත කරමින් සිදුකරන ලද අතර ප්‍රාථමික, ද්විතීයික මූලාශ්‍රය දත්ත සහ පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර අධ්‍යයන දත්ත ඒ සඳහා පදනම් කරගනු ලැබීය. ඒ අනුව මෙම පර්යේෂණයෙන් පුන්කලසේ ලාංකේය උපත සිදුවූ ආකාරය සහ එහි අන්වර්ථ නාම , කැටයම්, මූර්ති, සිතුවම් සහ සැරසිලි යන විවිධ මාධ්‍ය තලවල පුන්කලස නිරූපණය කර ඇති ආකාරය , ආගමික, සංකේතාත්මක, ජීවමය සහ ඓතිහාසිකමය වශයෙන් පුන්කලසට හිමිව ඇති වැදගත්කම යනාදී තොරතුරු බොහොමයක් හෙළි කරගත හැකිවිය. එසේම පුන්කලස නුදෙක් සෞභාග්‍යය, සශ්‍රීකත්වය නිරූපණය කරන කලා අංගයක් පමණක් නොව රාජ්‍ය සහ ආගමික සම්බන්ධතාව, සංස්කෘතික අනන්‍යතාව, සමාජ ඒකාබද්ධතාව, ආරක්ෂිත බව, ජය නිරූපණය කරන බහුමාන සංකේතයක් ලෙස භාවිත වී ඇති බව ද මෙහිදී අනාවරණය විය. අවසාන වශයෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයේ සංකේතාත්මක වටිනාකම් නිරූපණය කරන ප්‍රබල ශිල්පීය අංගයක් ලෙස පුන්කලස අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා අඛණ්ඩ ව විකාශනය වී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: පුන්කලස, බහුමාන සංකේතයක්, මංගල ලකුණක්, ශිල්පීය අංගයක්, සංස්කෘතික උරුමය,

මෙම අධ්‍යයනය සඳහා මදුරාවල සෝභිත හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

උණවේරුව ප්‍රදේශයේ පවතින සේසත් පිළිබඳ ඓතිහාසික පර්යේෂණයක්

එච්.සී.එච්. මධුමාලි
ඉතිහාස අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20sp943@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ඓතිහාසික හා සංස්කෘතික උරුමය තුළ සේසත යනු රාජකීයත්වය, අධිකාරීත්වය, සෞභාග්‍යය සහ ගාම්භීරත්වය විදහා පෑම පිණිස පුරාණයේ සිටම භාවිත වූ අතිශය වැදගත් නිර්මාණාත්මක සංකේතයකි. මුල් කාලීනව "අවි අතු" ලෙසින් හඳුන්වනු ලැබූ මෙහි ඓතිහාසික පසුබිම දේවානම්පියතිස්ස රජු දවස ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩමවීම දක්වා ඈත අතීතයකට දිව යයි. වර්තමානය වන විට සේසත් නිෂ්පාදනය මාතලේ උණවේරුව වැනි ප්‍රදේශවල පාරම්පරික කලා ශිල්පයක් ලෙස සුරැකිව පවතින අතර, එය විහාරාරාම, සංස්කෘතික උත්සව සහ නිවෙස් අලංකරණය සඳහා බහුලව යොදා ගැනේ. එසේ වුවද, සේසතේ ඓතිහාසික පරිණාමය, එහි සංකේතාත්මක අර්ථ නිරූපණවල සිදු වූ වෙනස්වීම් සහ රාජ්‍ය පාලන ක්‍රියාවලිය මෙන්ම ආගමික සන්දර්භය තුළ එය ඉටුකළ සුවිශේෂී කාර්යභාරය පිළිබඳ මෙතෙක් පුළුල් පර්යේෂණාත්මක විමර්ශනයක් සිදුව නොමැති අතර පවතින සාහිත්‍ය මූලාශ්‍රවල ද තොරතුරු දක්වා ඇත්තේ ඉතා කෙටියෙනි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ එම ඓතිහාසික හිස්තැන පිරවීම සහ අනුරාධපුර යුගයේ සිට වර්තමානය දක්වා සේසතේ ව්‍යූහාත්මක, සංකේතාත්මක මෙන්ම ක්‍රියාකාරීත්වයේ පරිණාමය විමර්ශනය කිරීමයි. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රගත දත්ත, ක්ෂේත්‍ර අධ්‍යයන සහ සම්මුඛ සාකච්ඡා ඇසුරින් කරුණු විශ්ලේෂණය කරමින් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට අනුව මෙම අධ්‍යයනය මෙහෙයවන ලදි. මෙහිදී ප්‍රධාන පරිච්ඡේද හතරක් යටතේ සේසතේ නාමික පරිණාමය, සිංහල රාජ්‍යත්වය තුළ එහි භාවිතය, සමාජීය හා ආගමික සන්දර්භයේදී සේසතට හිමි වූ ස්ථානය මෙන්ම උණවේරුව ගම්මානය කේන්ද්‍ර කරගත් පාරම්පරික සේසත් කර්මාන්තයේ ශිල්පීය ක්‍රම, එහි අඛණ්ඩ පැවැත්ම සහ වර්තමානයේ මුහුණ දෙන අභියෝග පිළිබඳ දීර්ඝ වශයෙන් කරුණු අනාවරණය කෙරිණි. මෙමඟින් සේසතේ හැඩය, වර්ණය හා භාවිතය කාලය සමඟ වෙනස් වූ ආකාරය අධ්‍යයනය කරමින් සිංහල බෞද්ධ සංස්කෘතියේ දේශපාලනික සහ ආගමික බලපෑම් පැහැදිලි කිරීමත්, මෙරට අස්පර්ශනීය සංස්කෘතික උරුම ආරක්ෂා කර ගැනීම සඳහා අනාගත පර්යේෂකයන්ට අවශ්‍ය මූලාශ්‍රගත දත්ත සැපයීමත් සිදු විය.

ප්‍රමුඛ පද: අස්පර්ශනීය, උණවේරුව, ඓතිහාසික පරිණාමය, පාරම්පරික කලා ශිල්ප, රාජකීය සංකේත, සේසත්

මෙම අධ්‍යයනය සඳහා රෝහිත දසනායකගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

கச்சாய் துறைமுகமும் அது தொடர்பான தொழில் முயற்சிகளும்: ஒரு வரலாற்று ஆய்வு

இராசேந்திரம் டிலக்சனா
வரலாற்றுத்துறை, பேராதனைப் பல்கலைக்கழகம்.
a20139@arts.pdn.ac.lk

வட இலங்கையின் வரலாற்றில் முதன்மை வாய்ந்த கடல்சார் மையங்களுள் யாழ் மாவட்டத்தில் அமைந்துள்ள கச்சாய் துறைமுகம் வரலாற்றுச் சிறப்பு மிக்க இயற்கைத் துறைமுகமாகும். வடபகுதியின் கடல்வழி வணிக நடவடிக்கைகள், போக்குவரத்து, மீன்பிடி மற்றும் பிராந்திய பொருளாதார வளர்ச்சியில் இத்துறைமுகத்தின் பங்களிப்பு அளப்பெரியது. வன்னி பெருநிலப் பரப்பிற்கும் யாழ்ப்பாணத்திற்கும் இடையே தொடர்புகளைப் பேணுகின்ற முக்கியக் கடல் மார்க்கமாகவும் பண்டைய காலம் முதல் காலனித்துவ ஆட்சிக்காலம் மற்றும் அதனைத் தொடர்ந்து வந்த காலப்பகுதிகளிலும் உள்ளூர் மற்றும் வெளிநாட்டு வாணிபத் தொடர்புகளுக்கான முதன்மை நிலையமாகவும் இப்பகுதி செயற்பட்டது. இதன் மூலம் அப்பகுதியில் பல்வேறுபட்ட தொழில் முயற்சிகள் உருவாகியதோடு சமூக பொருளாதார மாற்றங்களும் ஏற்பட்டன. வரலாற்றுத் தொன்மை வாய்ந்த கச்சாய் துறைமுகம் சார்ந்து மேற்கொள்ளப்படுகின்ற பல்வேறுபட்ட தொழில் முயற்சிகள் பற்றியும், அவை அப்பகுதிவாழ் மக்களினுடைய வாழ்வாதாரத்தில் எவ்வாறான பங்களிப்புகளை வழங்கி வருகின்றன என்பதையும் வரலாற்று ரீதியாக ஆராய்வது இன்றியமையாததாகும். தொழில் முயற்சிகளின் உருவாக்கத்திற்கும் பிராந்திய பொருளாதார வளர்ச்சிக்கும் கச்சாய் துறைமுகத்தின் வகிபங்கு எத்தகையது? என்ற ஆய்வு வினாவை அடிப்படையாகக் கொண்டு துறைமுகத்துடன் இணைந்த பல்வேறுபட்ட தொழில் முயற்சிகளை அடையாளப்படுத்தி, அப்பிரதேசவாழ் மக்களின் வாழ்வாதாரத்தில் எவ்வாறான பங்களிப்பை வழங்கி வருகின்றது என்பதை ஆராய்வதே இவ்வாய்வினுடைய முதன்மை நோக்கமாகும். இவ்வாய்வானது முதன்மை மற்றும் துணை வரலாற்று ஆதாரங்களை அடிப்படையாகக் கொண்டு பண்புசார் தரவுகளையும், புள்ளிவிபரவியல் சார் தரவுகளையும் இணைத்து கலப்பு ஆய்வு முறையில் வரலாற்று விபரிப்பு மற்றும் பகுப்பாய்வு அணுகுமுறையினூடாக பகுப்பாய்வு செய்யப்பட்டுள்ளது. இவ்வாய்வினூடாகக் கண்டறியப்பட்ட முதன்மையான கண்டடைவுகளாக, பண்டைய காலம் முதல் இலங்கையின் கடல்சார் வர்த்தக மையங்களில் ஒன்றாகக் கச்சாய் துறைமுகம் விளங்கியமை அடையாளப்படுத்தப்பட்டுள்ளது. கச்சாய் துறைமுகம் அப்பகுதிவாழ் மக்களுக்குப் பலதரப்பட்ட தொழில் முயற்சிகளை வழங்கி வருவதுடன், துறைமுகத்தை நம்பியே அம்மக்களின் வாழ்க்கைமுறை இன்று வரை அமைய பெற்றுள்ளமை இவ்வாய்வின் மூலம் நிறுவப்பட்டுள்ளது. கச்சாய் துறைமுகம் வெறும் கடல்சார் மையமாக மட்டுமன்றி அப்பிராந்திய மக்களுக்குப் பல்வேறுபட்ட தொழில் முயற்சிகள் மற்றும் பொருளாதாரத்தை வழங்கி வருகின்ற அரும்பெரும் சொத்தாக விளங்கி வருகிறது. இப்பின்னணியில் கச்சாய் துறைமுகத்துடன் தொடர்புபட்ட தொழில் முயற்சிகள் ஊக்குவிக்கப்பட்டு பிரதேச மக்களிடையே சுயதொழில் வாய்ப்புகள் உருவாக்கப்படுவதுடன், பிராந்தியத்தின் அடையாளமும் பாதுகாக்கப்பட வேண்டும் முதலான பரிந்துரைகளை இந்த ஆய்வு முன்வைத்துள்ளது.

திறவுச்சொற்கள்: கச்சாய் துறைமுகம், கடல்வழி வணிகம், யாழ்ப்பாணம், வடஇலங்கை

இந்த ஆய்வை மேற்கொள்ளும் பணியில் எனக்கு வழங்கப்பட்ட ஆலோசனைகள், வழிகாட்டுதல் மற்றும் மேற்பார்வைக்காக விரிவுரையாளர் எஸ். ஏ. சி. பெரோஸியா அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

பிரித்தானியர் காலத்திலிருந்து தற்காலம் வரை இலங்கை தேசவழமைச் சட்டத்தில் பெண்களின் உரிமை நிலையின் மாற்றங்கள்: ஒரு வரலாற்று விமர்சனப் பகுப்பாய்வு

பாலசுப்பிரமணியம் லக்சனா
வரலாற்றுத்துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20385@arts.pdn.ac.lk

இலங்கையின் பாரம்பரிய சட்ட அமைப்புகளில் முக்கியமான இடத்தைப் பெறும் தேசவழமைச் சட்டம் வட இலங்கையில் வாழ்ந்த தமிழ்ச் சமூகத்தின் வழக்காறுகள், சமூக நடைமுறைகள் மற்றும் மரபுரீதியான பழக்கவழக்கங்களை அடிப்படையாகக் கொண்டு உருவான தனியார் சட்டமாகும். இச்சட்டம் திருமணம், குடும்ப உறவுகள், சொத்துரிமை, பரம்பரை உரிமை மற்றும் சீதனம் போன்ற பல்வேறு அம்சங்களை ஒழுங்குபடுத்துகின்றது. பெண்களின் சமூக, பொருளாதார மற்றும் சட்ட நிலையை வரையறுப்பதில் தேசவழமைச் சட்டம் வரலாற்று ரீதியாகக் குறிப்பிடத்தக்க பங்காற்றியுள்ளது. எனினும், சமூக மாற்றங்கள், காலனித்துவ ஆட்சியின் தாக்கம், கல்வி விரிவாக்கம், பெண்களின் சமூகப் பங்கேற்பு, மனித உரிமைச் சிந்தனைகளின் வளர்ச்சி மற்றும் நவீன சட்டச் சீர்திருத்தங்கள் ஆகியவற்றின் காரணமாகப் பெண்களின் உரிமை நிலைகள் காலப்போக்கில் பல்வேறு மாற்றங்களுக்கு உட்பட்டுள்ளன. இந்நிலையில், பிரித்தானியர் காலத்திலிருந்து தற்காலம் வரை தேசவழமைச் சட்டத்தின்கீழ் பெண்களின் உரிமை நிலைகளில் என்ன மாற்றங்கள் ஏற்பட்டுள்ளன என்ற ஆய்வு வினாவை அடிப்படையாகக் கொண்டு, அவற்றின் வரலாற்றுப் பரிணாமத்தையும் சமகால முக்கியத்துவத்தையும் ஆராய்வதே இவ்வாய்வின் பிரதான நோக்கமாகும். இவ்வாய்வு முதன்மை மற்றும் துணைநிலை ஆதாரங்களை அடிப்படையாகக் கொண்ட வரலாற்று ஆய்வு முறையையும் விமர்சன பகுப்பாய்வு அணுகுமுறையையும் பயன்படுத்தி மேற்கொள்ளப்பட்டுள்ளது. ஆய்விற்காக நீதிமன்றத் தீர்ப்புகள், சட்ட ஆவணங்கள், அரச வெளியீடுகள், ஆய்வுக் கட்டுரைகள், நூல்கள் மற்றும் தொடர்புடைய வரலாற்று ஆவணங்கள் பயன்படுத்தப்பட்டுள்ளன. சேகரிக்கப்பட்ட தரவுகள் காலவரிசை மற்றும் கருப்பொருள் அடிப்படையில் பகுப்பாய்வு செய்யப்பட்டுள்ளன. ஆய்வின் மூலம் தேசவழமைச் சட்டம் பெண்களுக்குச் சீதனம், சொத்துரிமை மற்றும் பரம்பரை உரிமைகள் தொடர்பாகக் குறிப்பிட்ட பாதுகாப்புகளையும் சட்ட அங்கீகாரங்களையும் வழங்கியிருந்தமை கண்டறியப்பட்டுள்ளது. அதேவேளை, திருமணமான பெண்களின் சொத்து நிர்வாகம் மற்றும் சில சட்ட நடவடிக்கைகளில் காணப்பட்ட கட்டுப்பாடுகள் அவர்களின் முழுமையான சட்ட மற்றும் பொருளாதார சுயாதீனத்தை வரையறுத்திருந்தன என்பதும் வெளிப்படுத்தப்படுகின்றது. மேலும், பிரித்தானியர் காலத்தில் சட்டமயமாக்கப்பட்ட இவ்வமைப்பு பின்னர் ஏற்பட்ட சமூக மற்றும் சட்டமாற்றங்களின் தாக்கத்தால் மறுபரிசீலனை செய்யப்பட்டு, பெண்களின் உரிமைநிலை முன்னைய காலங்களுடன் ஒப்பிடுகையில் விரிவடைந்துள்ளதும் கண்டறியப்பட்டுள்ளது. இருப்பினும், சமகால பாலின சமத்துவக் கோட்பாடுகளின் அடிப்படையில் தேசவழமைச் சட்டத்தின் சில ஏற்பாடுகள் தொடர்ந்தும் விமர்சனத்திற்கு உட்படுத்தப்படுகின்றன என்பதும் இவ்வாய்வின் மூலம் உறுதிப்படுத்தப்படுகின்றது. எனவே, தேசவழமைச் சட்டத்தின் வரலாற்றுப் பரிணாமத்தைப் புரிந்துகொள்வதற்கும் பெண்கள் உரிமைகள் தொடர்பான சமகால சட்ட மற்றும் சமூக விவாதங்களை விளங்கிக்கொள்வதற்கும் எதிர்காலச் சட்டச் சீர்திருத்தங்களின் தேவையை மதிப்பிடுவதற்கும் இந்த ஆய்வு பங்களித்துள்ளது.

திறவுச்சொற்கள்: சொத்துரிமை, தேசவழமைச் சட்டம், பரம்பரை உரிமை, பெண்களின் உரிமைகள்,

இந்த ஆய்வை மேற்கொள்ளும் பணியில் எனக்கு வழங்கப்பட்ட ஆலோசனைகள், வழிகாட்டுதல் மற்றும் மேற்பார்வைக்காக விரிவுரையாளர் எஸ். ஏ. சி. பெரோஸியா அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

சோழ அதிகாரத்தின் சின்னமாகப் பொலன்னறுவையின் கட்டடக்கலை: ஓர் வரலாற்று ஆய்வு

ரவீந்திரன் சர்மிளா
வரலாற்றுத்துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20683@arts.pdn.ac.lk

வரலாற்றுத் தொன்மையினையும் கலாசாரப் பாரம்பரியத்தினையும் கொண்ட இலங்கையில் சில இராசதானிகளின் தோற்றமும் அவற்றின் வரலாற்றுப் பின்னணியும் இன்றியமையாத வரலாற்றுப் பரிணாமங்களாகக் காணப்படுகின்றன. இவற்றுள் அனுராதபுர இராசதானியைத் தொடர்ந்து சோழர்களால் தலைநகராக உருவாக்கப்பட்ட இராசதானியே பொலன்னறுவை இராச்சியமாகும். அவ்வகையில், ஆதிக்கப் போட்டியில் சோழர்கள் ஈடுபட்டிருந்த வேளையில் கைப்பற்றப்பட்டதே இலங்கைத் தீவாகும். முதலாம் இராஜராஜ சோழனால் பொலன்னறுவை தலைநகராகப்பட்டு சோழர்களின் மும்முடிச் சோழ மண்டலத்தில் ஒரு மண்டலமாக இணைக்கப்பட்டது. எந்தவொரு அரசும் நீண்டு நிலைத்திருப்பதில்லை. இருப்பினும் அவை விட்டுச் சென்ற தடையங்கள் அழிவடைந்த அரசின் வரலாற்றினை எடுத்தியம்பும். சோழர் ஆட்சி இன்று இல்லாமல் போனாலும் அவ் அரசு விட்டுச் சென்ற கலைப்பாரம்பரியங்கள் அதன் வரலாற்றை நினைவுபடுத்துகின்றன. இதில் முக்கியத்துவம் வாய்ந்ததாகக் கருதப்படுவதே கட்டடக்கலை மரபாகும். அதன்படி இந்த ஆய்வு வெறும் பழைய கட்டங்களைப் பற்றியது மட்டுமல்ல ஒரு தேசத்தைக் கைப்பற்றிய ஒரு பேரரசு தனது அதிகாரத்தை மக்கள் மனதில் ஆழமாகப் பதிய வைக்க கட்டடக்கலையினை எவ்வாறு சாமர்த்தியமாகப் பயன்படுத்தியது எனபதை இனங்காண்பதாகும். அந்தவகையில் இவ்வாய்வின் பிரதான நோக்கமாக, இலங்கையின் அரசியல் அதிகாரத்தின் அடையாளமாகக் கட்டடக்கலை இருந்துள்ளது என்பதனைப் பொலன்னறுவையின் சோழர் கட்டுமானங்களோடு இணைத்து ஆராய்வது அமைந்துள்ளது. சோழர்களால் எழுப்பப்பட்ட பொலன்னறுவை கட்டுமானங்கள் வெறும் மத வழிபாட்டுத் தலங்களாக மட்டும் இருந்தனவா, அவை திட்டமிடப்பட்ட அரசியல் மேலாதிக்கத்தின் அடையாளமாகச் செயல்பட்டனவா? எனும் ஆய்வுப் பிரச்சினையின்கீழ் ஆராயப்பட்டுள்ளது. இதன்படி இந்த ஆய்வானது வரலாற்று ஆய்வு முறையியலை அடிப்படையாகக் கொண்டு முதலாம் தர, இரண்டாம் தர மூலாதாரங்களினைத் துணைகொண்டு மேற்கொள்ளப்பட்டுள்ளது. கள ஆய்வு, கல்வெட்டுச் சான்றுகள், தொல்லியல் சான்றுகள்இ நூல்கள் என்பன இவாய்வுக்குப் பெருந்துணையாய் இருந்துள்ளன. அதன்படி பொலன்னறுவையில் சோழர்களால் கட்டப்பட்ட திராவிடக் கலைப்பாணியிலான கட்டடக் கோயில்கள் வெறும் மத வழிபாட்டுத் தலங்கள் மட்டுமல்ல அவை சோழப்பேரரசின் அரசியல் மேலாதிக்கததினையும் இறையாண்மையினையும் உலகிற்குத் தெரிவிக்கும் வகையில் திட்டமிட்டு உருவாக்கப்பட்ட அதிகாரக் குறியீடுகள் ஆகும். எனவே, பொலன்னறுவையின் சோழர்காலக் கட்டடக்கலை அமைப்புகள் சமயக் கண்ணோட்டங்களிற்கு அப்பாற்பட்டு சோழர்களின் அரசியல் மேலாதிக்கத்தினையும் மண்ணின் மீதான அவர்களின் ஆளுமைமிக்க உரிமையினையும் பிரகடனப்படுத்திய அதிகாரக் குறியீடுகளே என்பதனை இந்த ஆய்வு உறுதி செய்கின்றது.

திறவுச்சொற்கள் : அரசியல் அதிகாரம், கட்டடக்கலை, சமயக் கட்டடங்கள்இ சோழர் ஆட்சி, பொலன்னறுவை இராச்சியம்.

ந்த ஆய்வை மேற்கொள்ளும் பணியில் எனக்கு வழங்கப்பட்ட ஆலோசனைகள், வழிகாட்டுதல் மற்றும் மேற்பார்வைக்காக விரிவுரையாளர் ளு. யு. ஊ. குநசழணலைய அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன்.

பிரித்தானிய மிஷனரி பாடசாலைகளுக்கு எதிராகத் தோன்றிய சுதேச பாடசாலைகள்: யாழ்ப்பாண பிரதேசத்தை மையமாகக் கொண்ட ஓர் ஆய்வு

தேனுஜா சுப்பிரமணியம்,
வரலாற்றுத்துறை, பேராதனைப் பல்கலைக்கழகம்.
a20756@arts.pdn.ac.lk

இலங்கைக்கு வருகைதந்த மேலைத்தேயத்தவர்களுள் பிரித்தானியர் முதன்மையானவர்கள். இவர்களின் இலங்கைக்கான வருகையின் பிரதான நோக்கம் மதப்பரம்பலும் வர்த்தக நடவடிக்கையுமே ஆகும். அவர்கள் மதநடவடிக்கைகளின் பிரதான களமாக யாழ்ப்பாண பிரதேசத்தைத் தெரிவு செய்தார்கள். பிரித்தானியர் ஆட்சிக்காலத்தில் யாழ்ப்பாணப் பிரதேசத்தில் கிறிஸ்தவ மி'னரிகளினால் அறிமுகப்படுத்தப்பட்ட மேற்கத்தேய கல்வி முறையானது உள்ளூர் பண்பாடு மற்றும் மதவிழுமியங்களுக்கு பெரும் சவாலாக அமைந்தது. இச்சூழலில் மிஷனரி கல்விக்கு எதிராகவும் சுதேசமத மற்றும் கலாசார அடையாளங்களைப் பாதுகாக்கவும் யாழ்ப்பாணப் பிரதேசத்தில் சுதேச பாடசாலைகள் தோன்றின. மிஷனரி பாடசாலைகளின் கல்விச் செல்வாக்கு மற்றும் மதமாற்ற நடவடிக்கைகளுக்கு எதிராக யாழ்ப்பாணத்தில் சுதேச பாடசாலைகள் எவ்வாறு உருவெடுத்தன என்பதையும் அவை உள்ளூர் சமூகத்தில் ஏற்படுத்திய தாக்கங்களையும் விரிவாக ஆராய்வதே இவ்வாய்வின் முதன்மை நோக்கமாகும். பிரித்தானிய மிஷனரி பாடசாலைகளுக்கு எதிராக தோன்றிய சுதேச பாடசாலைகளின் செயற்பாடு எத்தகையன? என்பதை ஆய்வு பிரச்சினையாகக் கொண்டுள்ள இந்த ஆய்வு, முதலாம் மற்றும் இரண்டாம்நிலைத் தரவுகளை விபரணவியல் முறையியலில் வரலாற்று அணுகுமுறையின்கீழ் பகுப்பாய்வு செய்யப்பட்டுள்ளது. அதன்படி, ஸ்ரீலஸ்ரீ ஆறுமுக நாவலரின் தலைமையில் தோற்றுவிக்கப்பட்ட சுதேச கல்விப் புரட்சி திருப்புமுனையாக அமைந்ததுடன் தொடர்ந்து யாழ்ப்பாண பிரதேசத்தில் பல சுதேச பாடசாலைகள் உருவாகவும் வழிவகுத்தது என்பது கண்டறியப்பட்டன. யாழ்ப்பாணத்தில் கால்பதித்த மிஷனரிகள் சுதேச இந்துப் பிள்ளைகளை மதமாற்றம் செய்ய முயன்றன. இத்தகைய மிஷனரி கல்வி ஆதிக்கத்திற்கு எதிராகவும் பாரம்பரிய சைவப் பண்பாட்டையும் தமிழ் மொழியையும் பாதுகாக்கவும் யாழ்ப்பாண பிரதேசத்தை மையமாகக் கொண்டு தொழிற்பட்ட சுதேச பண்பாட்டு ரீதியான இந்த எதிர்ப்பியக்கமானது மிஷனரி கல்விக்கு மாற்றீடாகத் தோற்றம் பெற்றதோடு மட்டுமன்றி தமிழ்மொழியை பாதுகாத்தல், சைவ சமய விழிப்புணர்வு மற்றும் தேசியவாத சிந்தனைத் தோற்றம் என்பவற்றிலும் காத்திரமான பங்களிப்பை வழங்கியது என்பதை இந்த ஆய்வு நிறுவுகிறது. அத்துடன், மிஷனரிகளின் மதமாற்ற முயற்சிகளை வெற்றிகரமாகக் கட்டுப்படுத்தின என்பது கண்டறியப்பட்டுள்ளது. எனவே, யாழ்ப்பாணத்தில் மிஷனரி கல்விக்கு எதிராகத் தோன்றிய சுதேச பாடசாலைகள் அப்பிராந்தியத்தின் கல்வி மறுமலர்ச்சியில் ஒரு தீர்க்கமான திருப்புமுனையை ஏற்படுத்தின.

திறவுசொற்கள்:- ஆறுமுகநாவலர், கல்வி மறுமலர்ச்சி, கிறிஸ்தவ மிஷனரிகள், சுதேச பாடசாலைகள், மதமாற்றம்

இந்த ஆய்வை மேற்கொள்ளும் பணியில் எனக்கு வழங்கப்பட்ட ஆலோசனைகள், வழிகாட்டுதல் மற்றும் மேற்பார்வைக்காக விரிவுரையாளர் ளு.யு.ஊ. குநசழணலைய அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்

பச்சிலைப்பள்ளி பிரதேசத்தின் ஐரோப்பிய காலப் பண்பாட்டு எச்சங்கள் ஓர் வரலாற்று ஆய்வு

செல்வராசா தபோசன்
வரலாற்றுத்துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20767@arts.ac.lk

இலங்கையின் வரலாற்றுப் போக்கில் யாழ்ப்பாணக் குடாநாட்டைப் பெருநிலப்பரப்புடன் இணைக்கும் மூலோபாய முக்கியத்துவம் வாய்ந்த நுழைவாயிலாகப் பச்சிலைப்பள்ளி பிரதேசம் விளங்குகின்றது. இப்பிரதேசம் ஐரோப்பியர்களின் ஆதிக்கத்திற்கு உட்பட்டிருந்தது. இன்றும் இப்பகுதியில் எஞ்சியிருக்கும் எச்சங்கள் பிராந்தியத்தின் காலனித்துவ வரலாற்றைப் பறைசாற்றும் பண்பாட்டுச் சின்னங்களாகக் காணப்படுகின்றன. இந்த ஆய்வானது பச்சிலைப்பள்ளி பிரதேசத்தின் ஐரோப்பியர் கால வரலாற்றுப் பின்னணியை மையமாகக் கொண்டு மேற்கொள்ளப்பட்டுள்ளது. ஆய்வு வினாவாக, வரலாற்று அடிப்படையிலான ஐரோப்பியர் காலப் பண்பாட்டு எச்சங்களின் வகிபங்கு எத்தகையது? என்பதை ஆராய்வதையும். ஐரோப்பியர் காலப் பண்பாட்டு எச்சங்கள் வெளிப்படுத்தும் வரலாற்றை ஆவணப்படுத்தலையும் முதன்மை நோக்காகக் கொண்டுள்ளது. பச்சிலைப்பள்ளி பிரதேசமானது ஐரோப்பியர்களின் வெறுமனே ஒரு தற்காப்பு எல்லைப் பகுதி மட்டுமல்ல. அது யாழ்ப்பாணக் குடாநாட்டின் ஒட்டுமொத்த அரசியல் பொருளாதார இருப்பைத் தீர்மானித்த மிக முக்கிய மூலோபாயக் கேந்திர நிலையமாகும் என்ற கருதுகோளின் அடிப்படையில் இந்த ஆய்வு நகர்கிறது. இந்த ஆய்வு வரலாற்று ஆய்வு முறைமையினைப் பின்பற்றி எழுதப்பட்டுள்ளது. இதற்கான தரவுகள் இருவகை ஆதாரங்கள் மூலம் திரட்டப்பட்டன. முதல்நிலை ஆதாரங்களாக நிறுவனரீதியான மத குருமார்கள் (06), துறைசார் வல்லுநர்கள், ஆவணக்காப்பகப் பொறுப்பாளர்கள் (05), ஒல்லாந்தர் மற்றும் பிரித்தானிய காலத்து உத்தியோகபூர்வ வரைபடங்கள், அரச ஆவணக் காப்பகப் பதிவுகள், இலங்கைத் தொல்பொருள் திணைக்கள அறிக்கைகள் மற்றும் ஆய்வாளர் நேரடியாக மேற்கொண்ட கள ஆய்வுகள், நிழற்படப் பதிவுகள் ஆகியனவும் இரண்டாம்நிலை ஆதாரங்களாக காலனித்துவ வரலாறு தொடர்பான நூல்கள், ஆய்வுப் பத்திரிகைகள் மற்றும் உள்ளூர் மக்களின் வாய்மொழி வரலாறுகள் போன்றனவும் காணப்படுகின்றன. பச்சிலைப்பள்ளியின் ஐரோப்பிய காலப் பண்பாட்டுச் சின்னங்கள் வெறும் சிதைவுகள் அல்ல, அவை பிராந்தியத்தின் இறையாண்மையையும் உலகளாவிய வர்த்தகத் தொடர்புகளையும் காட்டும் சான்றுகளாகும். இந்தச் சின்னங்களைத் தொல்பொருள் திணைக்களம் பாதுகாப்பதோடு கலாசார சுற்றுலாவிற்காக மேம்படுத்துவது பிராந்தியத்தின் பொருளாதாரத்திற்கும் வரலாற்றுப் பாதுகாப்புக்கும் வழிவகுக்கும் என இந்த ஆய்வு பரிந்துரை செய்கின்றது.

திறவு சொற்கள்: உலகளாவிய வரத்தகத்தொடர்பு, உள்நாட்டு யுத்தம், காலனித்துவ ஐரோப்பிய பண்பாட்டு எச்சங்கள், பச்சிலைப்பள்ளி, பொருளாதாரம்

இந்த ஆய்வை மேற்கொள்ளும் பணியில் எனக்கு வழங்கப்பட்ட ஆலோசனைகள், வழிகாட்டுதல் மற்றும் மேற்பார்வைக்காக விரிவுரையாளர் ளூ.யு.ஊ. குநசழணலைய அவர்களுக்கு எனது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

LAW

DIGITAL EDUCATION INEQUALITY IN SRI LANKA: A HUMAN RIGHTS ANALYSIS OF STATE RESPONSIBILITY WITH SPECIAL REFERENCE TO UP-COUNTRY STUDENTS

S. Rameshbabu
Department of Law, University of Peradeniya.
a19llb071@arts.pdn.ac.lk

The rapid expansion of digital technologies in education, particularly during the COVID-19 pandemic, has significantly transformed Sri Lanka's educational landscape. While digital learning ensured educational continuity during pandemic-related disruptions, it also exposed and exacerbated existing socio-economic inequalities. These inequalities are particularly evident in Up-Country regions, where inadequate internet connectivity, limited access to digital devices, weak infrastructure, and persistent poverty restrict meaningful participation in digital education. As Jan Dijk conceptualises it, 'Digital Educational Inequality' extends beyond access to digital technologies and includes disparities in opportunities, skills, and outcomes associated with their effective utilisation. This study examines digital educational inequality from constitutional and human rights perspectives and evaluates whether it requires positive state intervention. Thus, it addresses two research questions: (1) Does digital education inequality in Sri Lanka's Up-Country region violate the constitutional principle of equality in access to education? (2) What legal and policy reforms are required for the Sri Lankan State to ensure equitable digital access to education? Adopting a doctrinal legal research methodology, the study analyses constitutional provisions, judicial decisions, international human rights instruments, policy frameworks, and relevant scholarly literature. The findings demonstrate that digital education inequality extends beyond technological disadvantage and significantly undermines equality, non-discrimination, and educational justice. The principal legal finding is that Sri Lanka has positive constitutional and international human rights obligations to ensure equitable access to digital education by addressing structural barriers that disproportionately disadvantage Up-Country students. However, existing legal and policy frameworks remain inadequate to achieve substantive educational equality. Therefore, the study concludes that digital educational inequality must be recognised as a constitutional and human rights issue requiring comprehensive legal reforms, targeted infrastructural investment, inclusive educational policies, and strengthened state accountability to ensure equal educational opportunities for all students.

Keywords: digital education, educational inequality, human rights, state responsibility, Up-country students.

I wish to acknowledge Kithmini Aviruppola for her guidance and supervision.

MAINTENANCE RIGHTS OF NON-MARITAL COHABITING PARTNERS IN SRI LANKA: A HUMAN RIGHTS BASED COMPARATIVE ANALYSIS

T. Agitha
Department of Law, University of Peradeniya
agithathanabalasingam@gmail.com

The advancement of society requires the law to evolve in response to emerging social needs. Although many jurisdictions have recognised maintenance rights for non-marital cohabiting partners, the Sri Lankan legal framework has not developed in line with these changes. The objectives of this research are to examine the current legal position on maintenance rights for non-marital cohabiting partners in Sri Lanka, to analyse how the absence of statutory protection affects individuals in these relationships and raises concerns from a human rights perspective, and to explore how India and Australia recognise and enforce maintenance rights for cohabiting partners and identify best-practice legal approaches that Sri Lanka can adopt to strengthen maintenance protections for non-marital partners in line with international human rights standards. India is selected because it shares a similar colonial legal heritage and socio-economic context with Sri Lanka while providing legal recognition to cohabiting partners, whereas Australia is selected for its progressive legal framework that recognises maintenance rights for cohabiting partners. The research adopts a doctrinal legal research method and relies on secondary data sources. Sri Lanka has acknowledged the existence of cohabiting relationships in certain contexts, including through judicial recognition of cohabitation and repute and the protection afforded under the Prevention of Domestic Violence Act No. 34 of 2005. However, the Maintenance Act No. 37 of 1999 restricts maintenance rights to legally recognised spouses only. This exclusion raises concerns from a human rights perspective, particularly in situations where a financially dependent partner is left without legal or economic protection following the breakdown of a relationship. Based on these observations, a significant gap exists in Sri Lanka, making research in this area necessary. This research compares India and Australia to identify best practices and provides recommendations for legal reform.

Keywords: cohabiting partners, maintenance rights, human rights perspective, Sri Lanka, legal reform

I wish to acknowledge Niroshi Liyana Muhandiram for her guidance and supervision.

EXTERNAL SOVEREIGN DEBTS AND ECONOMIC SELF-DETERMINATION: CAN LENDER RESPONSIBILITY BE RECOGNISED UNDER INTERNATIONAL LAW?

P. R. Binduhewa
Department of Law, University of Peradeniya
a20llb011@arts.pdn.ac.lk

International law recognises self-determination as a right of peoples, and economic self-determination exists as an integral component of this right. It ensures the autonomy of states by enabling them to determine their economic policies, manage their resources, and pursue their economic development. While sovereign borrowing is not inherently problematic, controversies arise when it becomes unsustainable in situations where the debt cannot be repaid without structural adjustments to the borrower's economy or is illegitimate, meaning that the debt does not benefit the public. International law does not clearly determine the liability of lenders in such contexts, leading to uncertainty. Can it be attributed to the lenders as an internationally wrongful act? remains a question arising from two research questions. The first is: *To what extent do illegitimate or unsustainable external sovereign debts affect the economic self-determination of borrower states under international law?* The second is, *To what extent does international law recognise the concept of 'lender responsibility'?* The objective of this research is to explore the possibility and adequacy of existing international law in ensuring the economic self-determination of states against detrimental lending practices. A library- and online-based research method was adopted using a multidisciplinary approach. According to the findings of the research, the impairment of economic self-determination can be assessed through objective indicators, including excessive debt-to-GDP ratios, excessive debt-service-to-revenue ratios, persistent primary fiscal surpluses, reduced fiscal space, declining public investment ratios, and deteriorating creditworthiness. The author suggests two criteria for determining the wrongfulness of 'lender responsibility': the foreseeability of debt distress and excessive conditionality. In conclusion, the research affirms the application of international law to detrimental lending practices as a violation of the economic self-determination of borrower states while attributing responsibility to lenders without leaving them in impunity.

Keywords: external sovereign debt, economic self-determination, international financial institutions, lender responsibility, debt sustainability

I wish to acknowledge Kalana Senaratne for his guidance and supervision.

EXAMINATION OF LAWS ADDRESSING THE EXCLUSION OF WOMEN FROM RELIGIOUS PLACES IN SRI LANKA: A JURISPRUDENTIAL ANALYSIS BASED ON EQUALITY AND FEMINIST LEGAL THEORY

A. A. S. Gunarathne
Department of Law, University of Peradeniya
a20llb020@arts.pdn.ac.lk

The exclusion of women from places of religious worship remains a significant issue in many societies, including Sri Lanka, where questions of equality and religious freedom often intersect. Although the Constitution of Sri Lanka guarantees both the right to equality and freedom of religion, uncertainty remains regarding how these rights should be balanced when women are denied access to religious spaces. This study examines the laws addressing the exclusion of women from religious places in Sri Lanka through the perspectives of equality and feminist legal theory. The research seeks to determine the extent to which claims concerning the exclusion of women from places of religious worship can be recognised within the existing legal framework. It further examines how Sri Lankan law addresses the relationship between gender equality and freedom of religion and whether existing constitutional, statutory, and personal laws adequately respond to such claims. This study adopts a doctrinal and qualitative research methodology. Primary sources include the Constitution of Sri Lanka, statutory provisions, personal laws, and relevant case law. Secondary sources consist of books, journal articles, reports, and scholarly writings. The jurisprudential theories of John Rawls and Catharine A. MacKinnon are used as the main analytical frameworks. The tentative findings suggest that certain features of Sri Lanka's legal framework, including constitutional protections, personal laws, and limitations within the fundamental rights regime, may indirectly contribute to the continuation of gender-based exclusion. The study also anticipates that the law lacks a clear mechanism for balancing religious freedom with women's right to equality. The research concludes that greater legal clarity and reform may be necessary to ensure that women enjoy meaningful access to religious spaces while maintaining respect for legitimate religious freedoms.

Keywords: gender-based exclusion, religious places of worship, gender equality, freedom of religion, feminist legal theory

I wish to acknowledge Shalini Samaranayake for her guidance and supervision.

A CRITICAL ANALYSIS OF THE LEGAL AND ADMINISTRATIVE CONFLICTS ARISING FROM THE ALIENATION OF LAND REFORM COMMISSION LANDS TO OTHER INSTITUTIONS

M. H. S. A. Hemal
Department of Law, University of Peradeniya
a20llb024@arts.pdn.ac.lk

Land reform is fundamentally an instrument of state intervention designed to alter the institutional framework governing land tenure, ownership, and utilisation. The Land Reforms Act No. 1 of 1972 provided the legal basis for the land reform process in Sri Lanka. Since the introduction of Section 27(A) by the Land Reforms (Special Provisions) (Amendment) Act No. 39 of 1981, the Land Reforms Commission's absolute ownership of its lands has become a significant legal concern. The main objective of this research is to examine the errors made when transferring land under the Land Reforms (Special Provisions) (Amendment) Act No. 39 of 1981, the resulting legal and administrative disputes, and how these have restricted the use of limited land resources in the public interest. The research problem is why it has been impossible to verify the Land Reforms Commission's ownership of lands transferred under Section 27(A) of the Land Reforms Act No. 39 of 1981. Using a qualitative methodology, this study combines a principled analysis of primary legal sources, including constitutional frameworks, Gazette notifications, and writ applications, with empirical data collected through semi-structured interviews with Land Reforms Commission officials. The findings show that ownership conflicts have arisen primarily as a result of administrative evasion of the stringent statutory provisions of Section 27(A) through Gazette notifications. Writ applications submitted by regional plantation companies show that thousands of acres of land are now locked in state corporations due to this procedural ambiguity. To accomplish the goal of using land for profitable investments to achieve the country's economic and social growth, this study indicates that immediate and effective legal and administrative reforms to resolve the current title dispute are necessary.

Keywords: Land reform law, State land, Public interest, Land Reform Commission

I wish to acknowledge Hirantha de Silva for his guidance and supervision.

ILLEGIBLE PRESCRIPTIONS AS A VIOLATION OF THE RIGHT TO HEALTH: ARGUING FOR A SPECIFIC REGULATORY LAW IN SRI LANKA (BEYOND MEDICAL NEGLIGENCE) WITH COMPARATIVE INSIGHTS FROM INDIA AND USA

K. M. C. S. Kumari
Department of Law, University of Peradeniya
a20llb030@arts.pdn.ac.lk

A prescription is not merely a chit enabling patients to purchase medicine; it helps patients make informed decisions regarding their own health. Therefore, illegible prescriptions written by medical practitioners have emerged as a significant legal and public health concern because illegible handwriting causes loss of information and prevents patients from making informed decisions. Legible prescriptions are essential for respecting patients' right to health and ensuring access to safe healthcare. In Sri Lanka, the medical prescription-writing process is primarily governed by the National Medicines Regulatory Authority Act, 2015, and the Guidelines on Ethical Conduct for Medical Practitioners Registered with the Sri Lanka Medical Council, 2009. This study examines the inadequacy of the protection provided under the above legislation, specifically highlighting how it undermines patient informed consent. It further examines the importance of developing legislative reforms, recognising the receipt of a legible prescription as a mandatory element of the right to health and the need for effective protection mechanisms to monitor this regime. The research employs a qualitative, doctrinal methodology while analysing constitutional provisions, statutory enactments, and judicial decisions relating to medical prescriptions. A comparative analysis is conducted with the legal systems of India and the USA, which have adopted more progressive laws governing prescription standards. The findings of the research suggest that the existing legal framework on medical prescriptions lacks the capacity to identify the receipt of illegible prescriptions as a violation of the right to health by interfering with a patient's capacity to make an informed decision. The study concludes by addressing these legislative gaps through recommendations such as strengthening legal provisions relating to medical prescriptions and adopting a stronger enforcement mechanism with a more patient-centred, human rights-based approach.

Keywords: illegible prescription, right to health, informed consent, legal framework

I wish to acknowledge Radhini Gawarammana for her guidance and supervision.

MISCARRIAGE OF JUSTICE CAUSED BY CONSTITUTIONAL SILENCE ON SEXUAL IDENTITY: A JURISPRUDENTIAL ANALYSIS BASED ON JOHN RAWLS' IDEAS OF JUSTICE

M. S. R. Lalachandra
Department of Law, University of Peradeniya
a20llb033@arts.pdn.ac.lk

This research examines the miscarriage of justice arising from the constitutional guarantees of equality under Articles 12(1) and 12(2) of the Constitution of Sri Lanka and the continued enforcement of Sections 365 and 365A of the Penal Code, which still penalise homosexual persons for unnatural offences and acts of gross indecency. It argues that constitutional silence on sexual identity has contributed to legal inconsistency and continued discrimination. Although certain legislation has explicitly recognised sexual orientation as a protected ground, this has resulted in a conflict between statutory protections and penal provisions. This research seeks to examine how certain individuals are affected by these distinctions and to critically examine John Rawls' theory of justice, particularly the veil of ignorance. The study highlights that lawmakers often overlook minority interests because they are generally representative of the majority. This research is based solely on a qualitative methodology using primary and secondary sources. Primary sources include legislation and case law from Sri Lanka, the United States, the United Kingdom, India, South Africa, and Uganda, while secondary sources include academic literature. The study finds that more than approximately 12% of citizens in Sri Lanka are homosexual. Globally, many countries have legalised homosexuality as a right, and judicial interpretations in several jurisdictions recognise it as a protected right, while countries that were once under British colonial influence continue, to a lesser extent, to criminalise it. Biological evidence suggests that hormonal differences contribute to this identity, which individuals recognise as they reach puberty. It is further noted that this identity is not considered to have any adverse impact on society or public health, and that cultural ideas and social norms influence the prohibition of such rights. This inconsistency is examined as involving multiple rights violations, where the violation of one right leads to further interconnected infringements. This study concludes that an inclusive environment should be created for homosexual people in order to enable them to develop and contribute meaningfully to a more informed and progressive society.

Keywords: homosexuality, unnatural offences, Acts of gross indecency, sexual orientation, veil of ignorance

I wish to acknowledge Hirantha de Silva for his guidance and supervision.

CRIME SCENE PRESERVATION IN SRI LANKA: ADDRESSING THE STATUTORY GAP AND ITS IMPACT ON EVIDENCE INTEGRITY AND CHAIN OF CUSTODY

K.W.A. Ama Poojani
Department of Law, University of Peradeniya
a20llb044@arts.pdn.ac.lk

The purpose of this study is to examine the significance of crime scene preservation in the criminal justice system of Sri Lanka and to evaluate the impact of the existing statutory gap on evidence integrity and the chain of custody. This study offers a critical analysis of the current legal framework governing crime scene preservation and investigates whether the existing laws and procedures are sufficient to ensure the proper handling, protection, and management of crime scene evidence. With the objective of identifying legal and practical weaknesses, this research examines how inadequate crime scene preservation affects criminal investigations and judicial outcomes in Sri Lanka. The study also seeks to explore lessons that may be drawn from comparative jurisdictions, particularly the United Kingdom and the United States, where more developed legal and procedural mechanisms exist for crime scene management and evidence preservation. This research adopts a qualitative methodology based on doctrinal legal research and qualitative content analysis. Primary sources include relevant Sri Lankan statutes, judicial decisions, and legal provisions relating to criminal investigations and evidence management, while secondary sources include books, journal articles, research papers, and reports. Semi-structured interviews with police officers, forensic experts, and legal professionals are also employed in a complementary manner to obtain practical insights into the challenges associated with crime scene preservation. The findings of this study are expected to reveal that the absence of a comprehensive statutory framework governing crime scene preservation in Sri Lanka contributes to inconsistencies in investigative practices, increases the risk of evidence contamination and loss, and weakens the integrity and admissibility of forensic evidence. This research provides valuable insights for policymakers, law enforcement authorities, forensic practitioners, and legal professionals by highlighting the need for legal reforms and standardised procedures to strengthen evidence management, preserve the chain of custody, and enhance the effectiveness and reliability of the criminal justice system in Sri Lanka.

Keywords: chain of custody, crime scene, evidence integrity, preservation

I wish to acknowledge Samadhi Lewke Bandara Karunarathne for her guidance and supervision.

PARENTAL SHARENTING AND THE BEST INTEREST OF THE CHILD: A CRITICAL ANALYSIS OF THE EXISTING SRI LANKAN LEGAL FRAMEWORK

R. M. B. P. Rupasena
Department of Law, University of Peradeniya
a20llb050@arts.pdn.ac.lk

The widespread use of social media has led to the increasing practice of 'parental sharenting', where parents share information about their children online. This raises concerns regarding children's privacy, autonomy, digital identity, and other related issues. The primary objectives of this research are to examine the existing legal framework in Sri Lanka regarding parental sharenting and to evaluate its adequacy in addressing parental sharenting to safeguard the best interests of the child. This research adopts a qualitative approach based on primary and secondary sources, including domestic legislation, judicial decisions, international instruments, and comparative legal developments. Particular attention is given to international children's rights standards, such as the CRC, and comparative approaches adopted in jurisdictions such as France, which has taken direct measures to address this issue. The findings reveal that although Sri Lanka provides certain protections through constitutional provisions, child protection laws, and data protection legislation, the legal framework lacks specific provisions regulating parents' online disclosure of children's personal information, does not clearly define parental responsibilities or remedies relating to sharenting, and fails to adequately recognise children's evolving capacities and digital rights. The study concludes that legal and policy reforms are necessary to ensure the best interests of the child.

Keywords: sharenting, best interest of the child, child rights

I wish to acknowledge Hirantha de Silva for his guidance and supervision.

THE NEED TO STRENGTHEN DIRECTORS' DUTIES ON ENVIRONMENTAL RESPONSIBILITY FOR SUSTAINABLE CORPORATE SUCCESS: A COMPARATIVE LEGAL ANALYSIS WITH INDIA AND THE UNITED KINGDOM

A. M. V. Sandeepani
Department of Law, University of Peradeniya
a20llb056@arts.pdn.ac.lk

The growing global focus on environmental sustainability highlights the crucial role of corporate governance in addressing environmental challenges as a fundamental aspect of corporate operations rather than merely voluntary practices. Directors, as the pivotal decision-makers of a company, have a fiduciary duty towards the company, and modern corporate governance emphasises duties towards the most influential stakeholder, namely the environment. The inadequacy of directors' duties towards the environment in Sri Lanka leads to inconsistent corporate environmental practices. The objectives of the research are to analyse the provisions of the Companies Act No. 7 of 2007 as the main legal instrument governing companies in relation to the environmental duties of directors, compare them with those of comparative jurisdictions, especially the United Kingdom's enlightened shareholder value approach and India's corporate social responsibility mechanism, and recommend legal reforms to strengthen directors' duties. The research employs a qualitative research approach incorporating both primary and secondary sources. It involves a comprehensive analysis of existing laws and semi-structured interviews with experts in the field. A comparative analysis is conducted with the United Kingdom and India to assess how these jurisdictions impose duties on directors to consider environmental responsibility. The findings reveal that strengthening directors' duties towards environmental responsibility through an explicit legal obligation is vital to foster sustainable corporate success, mitigate environmental harm, and promote long-term economic resilience. Based on the findings, the research concludes that Sri Lankan company law should be reformed in line with international best practices to foster long-term sustainable corporate success while considering legal and economic realities.

Keywords: directors' duties, environmental responsibility, sustainable corporate success

I wish to acknowledge Shiran Harsha Widanapathirana for his guidance and supervision.

THE EXCEPTIONAL CIRCUMSTANCES REQUIREMENT IN PRE-CONVICTION BAIL: A CONSTITUTIONAL ANALYSIS OF THE PRESUMPTION OF INNOCENCE IN SRI LANKA

S. M. N. S. B. Seneviratne
Department of Law, University of Peradeniya
a20llb061@arts.pdn.ac.lk

The presumption of innocence is a fundamental constitutional safeguard guaranteed under Article 13(5) of the 1978 Constitution of Sri Lanka, ensuring that every person is treated as innocent until proven guilty according to law. However, several special penal statutes in Sri Lanka impose an 'exceptional circumstances' requirement for granting pre-conviction bail, thereby creating significant restrictions on personal liberty before conviction. This research examines the extent to which such a requirement constitutes a justifiable limitation on the presumption of innocence, addressing two central questions: how Sri Lankan statutes and courts interpret and apply the 'exceptional circumstances' requirement in granting pre-conviction bail, and to what extent this requirement constitutes a justifiable and proportionate limitation on the presumption of innocence. This study adopts a qualitative doctrinal legal research methodology, primarily based on the analysis of legal sources, including constitutional provisions, statutes, judicial decisions, and scholarly literature. The findings reveal that this requirement creates a blanket presumption of absconding and re-offending, making incarceration the norm by shifting the burden of proof to the defendant to justify release, thereby undermining the presumption of innocence. Additionally, this requirement acts as an anticipated punishment, particularly in cases involving delayed trials or eventual acquittals. The lack of a statutory definition of the term 'exceptional circumstances' creates legal uncertainty and enables its use as a tool of coercion through political misuse, thereby undermining the rule of law. The study concludes that the exceptional circumstances requirement operates as a disproportionate and unjustifiable limitation on the constitutional presumption of innocence and advocates comprehensive statutory and judicial reforms, including legally restoring the burden of proof to the prosecution by requiring the prosecution to affirmatively prove the necessity of incarceration on a case-by-case basis, together with the codification of non-custodial bail alternatives and the implementation of strict temporal limits on pre-trial investigations. It also advocates the development of clearer judicial standards through a more rights-based interpretative approach, ensuring constitutional guarantees.

Keywords: bail, exceptional circumstances, pre-conviction, presumption of innocence

I wish to acknowledge Pulasthi Hewammanna for his guidance and supervision.

THE NEED FOR AN INDEPENDENT REGULATORY AUTHORITY IN ISSUING AND REVOKING BROADCASTING LICENSES IN SRI LANKA: A COMPARATIVE ANALYSIS

L.R.N.N. Wijayarathna
Department of Law, University of Peradeniya
a20llb072@arts.pdn.ac.lk

A critical, independent, and investigative press is the lifeblood of any democracy. The Minister of Mass Media has the authority to issue radio and television licences under the Sri Lanka Broadcasting Corporation Act No. 37 of 1966 and the Sri Lanka Rupavahini Corporation Act No. 6 of 1982. The criteria for consideration and the decision-making process are not explained. It is an entirely discretionary process, and licences may be suspended or revoked at any time. There is no right of appeal in such an event. After receiving their licences from the Ministry of Mass Media, all radio and television broadcasters should obtain their frequencies. Frequency allocation is also influenced by political considerations. The state occupies the dual role of media owner and regulator. This conflict enables the state to control the media by promoting its own message while limiting or marginalising opposing voices. The objectives of this research are to identify and analyse the existing legal framework governing ministerial discretion in the issuance and revocation of broadcasting licences in Sri Lanka and to examine the implications of this legal framework and propose recommendations for establishing an independent regulatory authority using comparative insights from the United Kingdom. A comparison with the United Kingdom demonstrates that the independent regulatory authority, the Office of Communications (Ofcom), plays a crucial role in issuing and revoking licences without interference from the state or political parties. The British Parliament established the Office of Communications (Ofcom) under the Communications Act 2003. The powers of government ministers to intervene in Ofcom's licensing and broadcasting functions are strictly limited to specific cases. Semi-structured interviews were conducted with experts, including media-related legal professionals, senior journalists, academics, and former Telecommunications Regulatory Commission of Sri Lanka (TRCSL) and Sri Lanka Broadcasting Corporation (SLBC) officials in Sri Lanka. Establishing an independent regulatory authority would reduce political interference and enhance transparency and public trust in the licensing process. This research examines the implications of the existing legal framework and proposes recommendations for establishing an independent regulatory authority using comparative insights from the United Kingdom.

Keywords: broadcast regulation, media freedom, independent regulator, ministerial discretion, Ofcom

I wish to acknowledge Kalana Senaratne for his guidance and supervision.

ANTHROPOCENTRIC BIAS IN THE SRI LANKAN LEGAL FRAMEWORK REGULATING THE USE OF ANIMALS IN SCIENTIFIC RESEARCH: A COMPARATIVE STUDY WITH INDIA AND SWITZERLAND

A. S. Hudha
Department of Law, University of Peradeniya
ashudha2001@gmail.com

The country's lawmakers always give priority to human rights. However, animal welfare should also be given a crucial status in the legal system. Balancing both could ensure the progress of society. In Sri Lanka, although laboratory animals have been used in research, legislation has not evolved over time. The objectives of the research are to analyse how animals used in scientific research are protected under the Sri Lankan legal framework, identify anthropocentric bias in those laws through jurisprudential analysis, and propose legal reforms derived from India and Switzerland to strengthen their protection. This research adopts a qualitative legal approach, primarily based on doctrinal analysis. A comparative approach is also employed. Data are obtained from primary and secondary sources, and expert interviews are conducted to gain relevant insights. The primary legislation regarding animal cruelty, the Prevention of Cruelty to Animals Ordinance No. 13 of 1907, is outdated and fails to address the various forms of cruelty that animals undergo in the modern world, including those used in research. The proposed Animal Welfare Bill, which includes laboratory animals, is yet to be enacted by Parliament. Moreover, the regulation of animal experimentation becomes ineffective because of the exemptions contained in the Bill. Therefore, animal research is currently governed through existing guidelines, such as the Guidelines for the Care and Use of Animals in Laboratory-Based Research. This shows that the Sri Lankan legal framework treats animals primarily as serving human interests. To justify this claim from a jurisprudential perspective, this research uses Peter Singer's utilitarianism, which rejects speciesism and argues for the equal consideration of interests, and John Finnis' New Natural Law Theory, which states that law must ensure moral duties and protect the common good through practical reasonableness. Based on these observations, a significant gap exists in Sri Lanka, making research in this area necessary. Therefore, this research compares Switzerland and India to identify best practices and provides recommendations for legal reform.

Keywords: Scientific research, Anthropocentric bias, Sri Lanka, Legal reform

I wish to acknowledge Pamoda Jayasundara for her guidance and supervision.

PALI
AND
BUDDHIST STUDIES



A CRITICAL STUDY ON ILLNESSES AND MEDICAL TREATMENTS PREVALENT IN THE TIME OF BUDDHA, BASED ON SELECTED SECTIONS OF THE MAHĀVAGGAPĀLI, AND ITS COMMENTARY

K.G.E.Prabuddhika
Department of Pali and Buddhist Studies, University of Peradeniya
a19546@arts.pdn.ac.lk

This research examines how *Mahāvaggapāli* and its commentary present different models of illnesses and medical treatments prevalent at the time of the Buddha. The *Bhesajjakkhandhaka* and *Cīvarakkhandhaka* are the sixth and eighth chapters of the *Mahāvaggapāli* of the *Vinaya Pitaka*. The *Samantapāsādikā* can be regarded as the authoritative commentary on the *Vinaya Pitaka*. All three of these texts preserve a systematised medical knowledge rooted in the early Buddhist monastic community. This study focuses on a critical textual analysis of the above-mentioned sections with the primary intention of recognising, classifying and evaluating the illnesses and medical treatments recorded therein as an indication of health care practices prevalent in the time of the Buddha in India. This research investigates the particular illnesses and treatments mentioned in the Buddhist canonical texts and provides a systematic categorisation of them. Nevertheless, a structured categorisation and identification of illnesses and their treatments recorded in the above three texts remain unexplored. Therefore, this study fills that gap through a structured analysis of relevant canonical references. Utilising a qualitative text-based research methodology, this research undergoes a closed textual analysis of relevant sections of the *Bhesajjakkhandhaka* and *Cīvarakkhandhaka* to elucidate the early history of medical practices during the time of the Buddha. This study reveals a wide-ranging disease classification that includes gastrointestinal disorders, neurological and psychosomatic conditions, dermatological conditions, infectious and inflammatory diseases, musculoskeletal and rheumatic disorders, toxicological and envenomation cases, and seasonal and constitutional ailments. It also consists of medical treatments for several diseases, including ethnomedical practices, respiratory therapies, dietary regulations, minor surgical interventions, topical applications and oral pharmacotherapy. Moreover, these two chapters, along with their commentary, constitute a substantial body of proto-clinical knowledge demonstrating a pragmatic and holistic medical system within the early Buddhist monastic context and thereby contribute meaningfully to the field of Buddhist studies and to the history of Buddhist medicine in ancient India.

Keywords: *Bhesajjakkhandhaka*, Buddhist medication, *Mahāvaggapāli,* monastic healthcare

I wish to acknowledge Ven.. W. Sarankara for his guidance and supervision.

AN EXAMINATION OF THE DEPICTION OF HELL IN KANDYAN BUDDHIST MURAL PAINTINGS AND ITS ROLE IN PROMOTING MORALITY AND FEAR: SPECIAL REFERENCE TO SELECTED TEMPLES OF THE KANDYAN PERIOD

N.G. Thakshila Darshani
Department of Pali and Buddhist Studies, University of Peradeniya
a20120@arts.pdn.ac.lk

The Buddhist philosophical teaching that elucidates the ethical outcomes central to human life is a fundamental teaching of *kamma* and its subsequent effects (*vipāka*). In the Buddhist discourses (Bhayabherava Sutta (MN), Verañjaka Sutta (MN), Cūḷakammavibhaṅga Sutta (MN), Puggala Sutta (SN)), the concept of *Apāya,* which includes states like niraya (hell), *duggati* (woeful realms), and*vinipāta* (states of downfall), is presented as the result of immoral behaviour of human beings. Regarding the Petavatthu Pāli, it shows how immoral action leads to suffering in lower realms, strengthening ethical discipline through fear of bad rebirth and resulting in human beings. The Buddhist mural paintings emerged as an effective visual instrument for explaining difficult Buddhist teachings to human beings. In this research, examining how hell-related murals in the Kandyan tradition have been used to promote moral consciousness and ethical behaviour in society is the primary goal. This qualitative study uses both primary and secondary sources as its research methodology. A field study is also included as part of the research. There are studies regarding the Buddhist doctrinal teachings on *Apāya,* with their visual representation in Kandyan art. However, these literary works have not addressed *kamma* and its consequences in detail. This study's focus has been placed on how these mural representations influence moral behaviour and reflect modern social reality. The results of the study of images of hell in Kandyan murals differ depending on the area and historical period, frequently expressing moral and societal concerns. This study reveals that Kandyan Buddhist mural paintings are powerful tools for the development of morality because they connect theoretical knowledge, fostering the growth of morality in the human mind.

Keywords: *Kamma, Apāya,* Buddhist mural Paintings*,* ethical behaviour

I wish to acknowledge R.G.D. Jayawardane for his guidance and supervision.

මුල් බුදුසමයාගත ඉගැන්වීම් මානසික සුවය උදෙසා මනෝචිකිත්සාවක් ලෙස යොදාගත හැකි ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරෙන්)

පී. ඒ. ආර්. එම්. දිල්ෂානි
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a19146@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ඇසුරෙන් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ මුල් බුදුසමයාගත ඉගැන්වීම් මානසික සුවය උදෙසා මනෝචිකිත්සාවක් ලෙස යොදාගත හැකි ආකාරය ත්‍රිපිටකාගත ඉගැන්වීම් ඇසුරෙන් කරුණු පරීක්ෂා කරමින්, මෙම ඉගැන්වීම්වල ඇති ප්‍රායෝගික වටිනාකම් භාවිත කිරීමට මිනිසා හුරු කරවීමයි. එහිදී මූලික වශයෙන් කරුණු අධ්‍යයනය සඳහා මජ්ඣිම නිකායාගත සබ්බාසව සූත්‍රය, සල්ලේඛ සූත්‍රය, සතිපට්ඨාන සූත්‍රය, විතක්කසණ්ඨාන සූත්‍රය, වත්ථූපම සූත්‍රය ආදි සූත්‍ර ඇසුරු කරගනිමින්, ඒවායේ අන්තර්ගත ඉගැන්වීම් මානසික සුවය උදෙසා මනෝචිකිත්සාවක් වශයෙන් යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය සිදු කොට ඇත්තේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පදනම් කරගනිමින්ය. මිනිස් මනසේ ඇති වන විවිධ සෘණාත්මක සිතුවිලි සහ කාර්යබහුලත්වය හේතුවෙන් මිනිසාගේ මනස පීඩාවට පත් වී ඇත. එවැනි සිතුවිලි වළක්වාලමින් සුවපත් ජීවිතයක් ගත කිරීම වර්තමානයේ අභියෝගය බවට පත්ව ඇත. ඒ අනුව මිනිසාට බලපා ඇති විවිධ කායික හා මානසික ගැටලු විසඳා ගැනීම උදෙසා බෞද්ධ ඉගැන්වීම් මනෝචිකිත්සාවක් වශයෙන් භාවිත කළ හැක්කේ කෙසේද යන මූලික පර්යේෂණ ගැටලුව මෙහිදී සාකච්ඡාවට භාජන කොට ඇත. බුදුදහමේ සූත්‍ර ඉගැන්වීම් මගින් මනසේ සන්සුන්භාවය හා නිරෝගිතාවට මනෝචිකිත්සාවේ බලපෑම අධ්‍යයනය කිරීම සහ සූත්‍රානුකූල මනෝචිකිත්සක ක්‍රමයක් වර්තමාන සමාජයේ මානසික ගැටලු සඳහා යෙදිය හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු ලෙස සඳහන් කළ හැකිය. මෙම අධ්‍යයනය ඇසුරෙන් තහවුරු කරගැනීමට හැකි වූ ආකාරයට මනස පාලනයට හා පුද්ගල අපගාමී චර්යා රටා ක්‍රමිකව බැහැර කරගැනීම උදෙසා පුද්ගලයා මානසික වශයෙන් කිසියම් පරිවර්තනයකට ලක් විය යුතු ය. එම මානසික පරිවර්තනය උදෙසා බුදුදහමේ ඉගැන්වෙන උපදේශන හා චිකිත්සක ක්‍රම මනෝචිකිත්සාවක් වශයෙන් භාවිත කරමින් පුද්ගලයා ලෞකික හා ලෝකෝත්තර අරමුණු ජයගන්නා ආකාරය ගැඹුරින් සාකච්ඡාවට භාජන කරන ලදි.

ප්‍රමුඛ පදඃ මනෝචිකිත්සාව, මානසික ගැටලු, මුල් බුදුසමයාගත ඉගැන්වීම්, ලෝකෝත්තර අරමුණු

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

මෙහෙණින් වහන්සේ මුහුණ දෙන නූතන අභියෝග පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කළුතර දිස්ත්‍රික්කය ඇසුරින්)

ඒ. කේ. ටී. ආර්. අමුගොඩ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20030@arts.pdn.ac.lk

වර්තමානය වන විට මෙහෙණින් වහන්සේ විවිධ වූ අභියෝගවලට මුහුණ දෙන ආකාරයක් අපට හඳුනාගත හැකිය. මෙම පර්යේෂණය මගින් 2000 - 2025 දක්වා කාල පරාසය තුළ මෙහෙණින් වහන්සේ මුහුණ දෙන නූතන අභියෝග පිළිබඳ අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. මෙම අධ්‍යයනයේ කරුණු ගවේෂණය කිරීම සඳහා මූලික වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කරන ලද අතර ඒ සඳහා ක්ෂේත්‍රය වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ මෙහෙණි ආරාම යොදා ගන්නා ලදී. ඒ අනුව අවුරුදු 20 - 60 වයස් කාණ්ඩවලට අයත් මෙහෙණින් වහන්සේ තිස් නමක් පමණ සම්මුඛ සාකච්ඡාවට භාජන කොට ලබාගත් දත්ත අනුව කළුතර දිස්ත්‍රික්කයේ ජීවත් වන මෙහෙණින් වහන්සේ මුහුණ දෙන අභියෝග අංශ කිහිපයක් ඔස්සේ අධ්‍යයනය කිරීමට හැකි විය. එහිදී මෙහෙණින් වහන්සේ මුහුණ දෙන අභියෝග සමාජ අභියෝග හා ආරාම අභියෝග වශයෙන් ප්‍රධාන අංශ දෙකකින් හඳුනා ගැනීමට හැකි විය. මෙහිදී සමාජ අභියෝග වශයෙන් සමාජයේ මෙහෙණි ශාසනය පිළිබඳ පවතින සීමිත අවබෝධය හා ප්‍රමාණවත් සමාජ පිළිගැනීමක් නොමැති වීම සමාජය තුළ ආකල්පමය වශයෙන් අභියෝගයකට ලක්ව ඇති බව අනාවරණය විය. එසේම ආරාම නඩත්තු හා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් හිඟය, දායක ආධාර මත පමණක් රඳා පැවතීමද, නායක මෙහෙණින් වහන්සේගේ පවතින ගැටලු නිසා උසස් ආධ්‍යාපනික අවස්ථා සීමිත වීම, පිරිමි පාර්ශ්වයෙන් එල්ලවන අපහසුතාද සමාජ අභියෝග ලෙස හඳුනා ගැනීමට හැකි විය. ආරාමික අභියෝග වශයෙන් ආරාමවල පවතන යටිතල පහසුකම් අවම මට්ටමක පැවතීම හේතුවෙන් මෙහෙණින් වහන්සේගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ගැටලු පවතින බවද සෞඛ්‍ය ගැටලු හා ගිලන් බවට පත් මෙහෙණින් වහන්සේ රැකබලා ගැනීම සම්බන්ධයෙන් ගැටලු පවතින බවද අධ්‍යයනය මගින් තහවුරු විය. මෙම පර්යේෂණයට අනුව මෙහෙණින් වහන්සේ මුහුණ දෙන අභියෝගවලට මූලික හේතුව වී ඇත්තේ ඔවුන් තුළ පවතින අවම ආධ්‍යාපනික මට්ටම බව අනාවරණය විය. ඒ අනුව මෙම ගැටලු අවම කිරීම සඳහා ආරාම පරිපාලන ක්‍රමවේද සංවර්ධනය කිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහයෝගය ලබා ගැනීම, විනය හා පරිපාලන ගැටලු සඳහා සංඝ සභා මට්ටමින් විසඳුම් සැපයීම හා මෙහෙණින් වහන්සේගේ ආධ්‍යාපනික මට්ටම ඉහළ නැංවීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරේ.

ප්‍රමඛ පදඃ ආරාමික අභියෝග, කළුතර දිස්ත්‍රික්කය, නූතන සමාජය, මෙහෙණින් වහන්සේ, සමාජීය අභියෝග

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

බෞද්ධ භාවනාව සහ අපෝහක චර්යා චිකිත්සාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

පී. අයි. දිසානායක
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20160@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය මගින් බෞද්ධ භාවනාව සහ අපෝහක චර්යා චිකිත්සාව (Dialectical Behaviour Therapy - DBT) අතර පවතින සමානතා සහ විෂමතා පිළිබඳ අධ්‍යයනය කෙරේ. වර්තමාන සමාජය තුළ මානසික ආතතිය, චිත්තවේගීය අස්ථාවරතාව, පෞරුෂ ආබාධ සහ විවිධ මානසික ගැටලු ඉහළ යාමත් සමග එම ආබාධ වළක්වා ගැනීම උදෙසා විවිධ ප්‍රතිකාර හා කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ අවධානය වැඩි වී ඇත. එම පසුබිම තුළ බටහිර මනෝචිකිත්සාවේ ප්‍රධාන ප්‍රවේශයක් වන අපෝහක චර්යා චිකිත්සාව සහ බෞද්ධ මනෝචිකිත්සාවේ ප්‍රවේශයක් වන භාවනාව අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මෙම අධ්‍යයනය ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකර ඇති අතර ද්විතීයක මූලාශ්‍රය ඇසුරෙන් දත්ත රැස්කර විශ්ලේෂණය කර ඇත. මෙහිදී අපෝහක චර්යා චිකිත්සාව සහ බෞද්ධ භාවනාව අතර පවතින සමානතා සහ විෂමතා මොනවාද යන්න ප්‍රධාන පර්යේෂණ ගැටලුව ලෙස යොදාගෙන ඇත. අපෝහක චර්යා චිකිත්සාව චිත්තවේගීය අස්ථාවරතාව, ආතතිය, ස්වයංපීඩාකාරී හැසිරීම් සහ පෞරුෂ ආබාධ කළමනාකරණය සඳහා සංවර්ධනය කරන ලද සායනික මනෝචිකිත්සක ප්‍රවේශයකි. බෞද්ධ භාවනාව පුද්ගලයාගේ සිත සංවර්ධනය කර සීල, සමාධි සහ පඤ්ඤා වර්ධනය කිරීම අරමුණු කරගත් ආධ්‍යාත්මික හා මනෝවිද්‍යාත්මක පුහුණුවකි. පර්යේෂණයෙන් තහවුරු කරගැනීමට හැකි වූයේ අපෝහක චර්යා චිකිත්සාවෙහි මූලික සංරචකයක් වන සතිමත්භාවය (Mindfulness) බෞද්ධ සතිපට්ඨාන භාවනාව සමග සමීප සම්බන්ධතාවක් පවතින බවයි. බෞද්ධ භාවනාව සහ අපෝහක චර්යා චිකිත්සාව යන ක්‍රමවේද දෙකම පුද්ගලයාගේ සිතුවිලි, චිත්තවේග සහ හැසිරීම් පිළිබඳ අවධානය වර්ධනය කරමින් මානසික සුවතාව ප්‍රවර්ධනය කරයි. කෙසේ වෙතත්, අපෝහක චර්යා චිකිත්සාවෙහි ප්‍රධාන අරමුණ මානසික රෝග ලක්ෂණ අවම කර දෛනික ජීවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වන අතර බෞද්ධ භාවනාවේ අවසාන අරමුණ දුක්ඛ නිරෝධය සහ නිර්වාණය සාක්ෂාත් කර ගැනීම වේ. එසේම අපෝහක චර්යා චිකිත්සාව විද්‍යාත්මක හා සායනික පදනමක් මත සංවර්ධනය වී ඇති අතර බෞද්ධ භාවනාව බුදුදහමේ ආධ්‍යාත්මික මූලධර්ම මත ගොඩනැගී ඇත. අවසාන වශයෙන් මෙම අධ්‍යයනයෙන් හෙළි වූයේ අපෝහක චර්යා චිකිත්සාව සහ බෞද්ධ භාවනාව අතර අරමුණු හා පදනම්වල යම් යම් වෙනස්කම් පැවතියද, චිත්තවේග පාලනය, ආතතිය කළමනාකරණය, ස්වයං අවබෝධය සහ මානසික සුවතාව වර්ධනය කිරීමේදී සැලකිය යුතු සමානකම් පවතින බවයි. එබැවින් බටහිර මනෝචිකිත්සාව සහ බෞද්ධ මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් ඒකාබද්ධ කරගැනීම මගින් වඩාත් ඵලදායී මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේද සංවර්ධනය කළ හැකි බව මෙම පර්යේෂණයෙන් තහවුරු කර ඇත.

ප්‍රමුඛ පද: අපෝහක චර්යා චිකිත්සාව, චිත්තවේග පාලනය, බෞද්ධ භාවනාව, මානසික සුවතාව, සතිමත්භාවය

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය පොත්තේවෙල ඤාණලක්ඛන හිමියන්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (මැදවච්චිය ප්‍රදේශයේ දහම් පාසල් කිහිපයක් ඇසුරින්)

එස්. ඩී. කේ. එස්. දිසානායක
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
priyangikak0107@gmail.com

ශ්‍රී ලාංකේය සමාජය තුළ ගුණගරුක සදාචාර සම්පන්න හා මානුෂීය ගුණධර්මවලින් හෙබි ධර්මානුකූල ජීවන රටාවකට හුරු වූ යහපත් පුරවැසියකු බිහිකිරීමෙහිලා බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනයෙන් ඉටුවන්නේ සුවිශේෂ මෙහෙවරකි. එහෙත් නාගරික ප්‍රදේශවල ක්‍රියාත්මක වන දහම් පාසල් අධ්‍යාපනය මේ වන විට භෞතික සහ සමාජීය වශයෙන් විවිධ අභියෝග හා ගැටලු රාශියකට මුහුණ පා ඇති බව නූතන අධ්‍යයන මගින් හඳුනා ගත හැකිය. මෙම පර්යේෂණයෙහි ප්‍රධාන ගැටලුව වන්නේ දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල බෞද්ධ දහම් පාසල් අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවයක් තිබේ ද යන්න අධ්‍යයනය කිරීමයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රදේශීය කොට්ඨාසයට අයත් තෝරාගත් දහම් පාසල් කිහිපයක් පදනම් කරගෙන දහම් පාසල් අධ්‍යාපනයෙහි වර්තමාන සැබෑ ස්වභාවය, ගුණාත්මකභාවයට බලපාන ප්‍රායෝගික සාධක, අධ්‍යාපනික, සමාජීය හා ආර්ථික ගැටලු සඳහා ලබා දිය හැකි විසඳුම් පුළුල් ලෙස විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මත පදනම් මිශ්‍ර ක්‍රමවේදයක් භාවිත කර ඇත. ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සඳහා මැදවච්චිය ප්‍රදේශයෙහි දහම් පාසල් 10ක් නියැදි ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද අතර ද්විතීයක දත්ත රැස් කිරීම සඳහා පුස්තකාලය පරිශීලනය සිදු කරන ලද අතර දහම් පාසල් ගුරුභවතුන්, දෙමාපියන් සහ සිසුන් ඇතුළත් වන පරිදි ව්‍යූහගත ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා යන ක්‍රම මගින් දත්ත ලබා ගන්නා ලදි. විශේෂයෙන්ම දහම් පාසල්වල භෞතික සම්පත් හිඟය, ගුරු සම්පත් හිඟය සහ සනීපාරක්ෂක පහසුකම් වැනි මූලික අවශ්‍යතා අහිමිවීම ආදී ගැටලු රාශියක්ම සිසුන්ගේ සහභාගිත්වය අඩාල වීමට සෘජුව බලපා ඇත. ඒ අතර වර්තමාන තරගකාරී පාසල් අධ්‍යාපන රටාව හා සති අන්ත උපකාරක පන්ති හේතු කොටගෙන දහම් පාසල් කෙරෙහි සිසුන්ගේ ඇති උනන්දුව හීන වී යෑම බරපතළ අභියෝගයකි. මැදවච්චිය ප්‍රදේශයේ දහම් පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම, ගුරුවරුන් සඳහා අඛණ්ඩ නවීන ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ජාතික මට්ටමේ විධිමත් වැඩපිළිවෙළක් හඳුන්වාදීම හා විෂය නිර්දේශ වර්තමානයට ගැළපෙන සේ යාවත්කාලීන කිරීම මගින් දහම් පාසල් අධ්‍යාපනයෙහි අත්‍යවශ්‍යතාව පිළිබඳ ආකල්ප වෙනසක් ඇති කිරීමේ අරමුණින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ජාතික කාලීන අවශ්‍යතාවක් බව මෙම පර්යේෂණය මගින් අවධාරණය කෙරේ.

ප්‍රමුඛ පද: ආධ්‍යාපනික ගැටලු, ගුණාත්මකභාවය, දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශ, බෞද්ධ දහම් පාසල්, මැදවච්චිය

මෙම අධ්‍යයනය සඳහා ඩබ්. එම්. ඩී. එම්. විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කළු දේවතා බණ්ඩාර සංකල්පය හා බැඳි ඇදහිලි සහ විශ්වාස පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව කොට්ඨාසයේ ඉහළගම ග්‍රාමය ඇසුරින්)

ජේ. ඒ. එස්. කෞෂල්‍යා
පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20322@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතිය තුළ ප්‍රදේශීය දේව විශ්වාස හා බෞද්ධ ආගමික සම්ප්‍රදාය අතර පවතින සම්බන්ධතාව නිරූපණය කරන දේව සංකල්පයක් ලෙස කළු දේවතා බණ්ඩාර සංකල්පය හඳුනාගත හැකිය. මෙම පර්යේෂණය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව කොට්ඨාසයේ ඉහළගම ග්‍රාමය ආශ්‍රිත කළු දේවතා බණ්ඩාර සංකල්පය හා බැඳි ඇදහිලි සහ විශ්වාස පිළිබඳ අධ්‍යයනය කෙරිණි. ඉහළගම ප්‍රදේශයේ ජනතාව අතර මෙම දේව සංකල්පය සම්බන්ධයෙන් පවතින ඇදහිලි, විශ්වාස, පූජා චාරිත්‍ර සහ ඒවායේ සමාජීය හා සංස්කෘතික වැදගත්කම විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ විය. මෙම පර්යේෂණයේ මූලික ගැටලුව වූයේ කළු දේවතා බණ්ඩාර සංකල්පයේ ඓතිහාසික පසුබිම, එයට අදාළ ජන විශ්වාස සහ ඇදහිලි මෙන්ම එම විශ්වාස ප්‍රදේශීය ජන ජීවිතයට බලපාන ආකාරය හඳුනා ගැනීමයි. ඒ අනුව ජනතාව මෙම දේව සංකල්පය භාවිත කරන ආකාරය, එමගින් ඔවුන්ගේ ආගමික, සමාජීය හා මානසික අවශ්‍යතා සපුරාලන ආකාරය පිළිබඳ විමර්ශනය කරන ලදි. මෙය ගුණාත්මක පර්යේෂණයකි. මෙහිදී ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ සාහිත්‍ය මූලාශ්‍රය විශ්ලේෂණය මගින් දත්ත රැස් කරන ලදි. ප්‍රදේශයේ භික්ෂූන් වහන්සේ, කපු මහත්වරුන් සහ ප්‍රදේශවාසීන්ගෙන් ලබාගත් තොරතුරු පර්යේෂණ දත්ත ලෙස භාවිත කරන ලදි. පර්යේෂණයේදී අනාවරණය වූයේ කළු දේවතා බණ්ඩාර සංකල්පය ඉහළගම ප්‍රදේශයේ ජනතාවගේ ආගමික හා සංස්කෘතික අනන්‍යතාවෙහි වැදගත් අංගයක් වන බවයි. බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු ජන ඇදහිලි ග්‍රාමීය ජනතාවගේ අනන්‍යතාව තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ආකල්ප සහ විශ්වාස පද්ධති පෝෂණය කිරීමටත් මහත් සේ ඉවහල් වේ. විශේෂයෙන්ම ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආරක්ෂක දේවතාවෙකු ලෙස ජන විඥානය තුළ ස්ථාපිත වී ඇති කළු දේවතා බණ්ඩාර දෙවියන් වන්දනය කිරීම මගින් ප්‍රදේශීය ජනතාව තම එදිනෙදා ගැටලුවලට මානසික සහනයක් ලබා ගනිති. තවද, මෙම ඇදහිලි සහ විශ්වාස මගින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජීය ස්ථාවරත්වය, සංස්කෘතික උරුමය සුරැකීම සහ මානසික යහ පැවැත්ම ක්‍රමිකව උදා කරගන්නා ආකාරය මෙම පර්යේෂණය මගින් නිගමනය කළ ගත හැකි විය.

ප්‍රමුඛ පද: ඉහළගම, කළු දේවතා බණ්ඩාර, ජන විශ්වාස, ප්‍රදේශීය දේව සංකල්ප, බෞද්ධ සංස්කෘතිය

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය පොත්තේවෙල ඤාණලක්ඛන හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

මරණින් පසු ජීවිතය හා සම්බන්ධ ආගමික පූජා චාරිත්‍ර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ලාංකේය බෞද්ධ සමාජය ඇසුරෙන්)

ජී. ජී. එස් කුමාරි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20352@arts.pdn.ac.lk

මරණින් පසු ජීවිතය පිළිබඳ සංකල්පය ලෝකයේ බොහෝ ආගම්වල මෙන්ම බෞද්ධ දර්ශනය තුළද වැදගත් ස්ථානයක් ගනී. බෞද්ධ දර්ශනයට අනුව මරණය යනු ජීවිතයේ අවසානයක් නොව, කර්මය හා පටිච්චසමුප්පාදය මත පදනම් වූ පුනර්භව ක්‍රියාවලියේ එක් අවස්ථාවකි. ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජය තුළ මෙම දාර්ශනික පදනම ආශ්‍රිතව විවිධ ආගමික පූජා චාරිත්‍ර හා වත්පිළිවෙත් වර්ධනය වී ඇත. මියගිය පුද්ගලයන් වෙනුවෙන් පුණ්‍යානුමෝදනාව සඳහා මතක දාන පැවැත්වීම, පිරිත් සජ්ඣායනය සහ සංවත්සර පින්කම් වැනි චාරිත්‍ර ඒ අතර ප්‍රධාන වේ. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකරන ලද මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ, ත්‍රිපිටකාගත දේශනා (ඛුද්දක නිකාය පේතවත්ථුපාළිය, ඛුද්දක නිකාය තිරෝකුඩ්ඩ සූත්‍රය) වැනි මූලාශයද, ඒ ආශ්‍රිත පර්යේෂණ පත්‍රිකාද විශ්ලේෂණය කරන ලදි. මෙම පර්යේෂණය ලාංකේය බෞද්ධ සමාජයේ මරණින් මතු ජීවිතය උදෙසා සිදුකරන ආගමික පූජා චාරිත්‍රවල කාර්යභාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට දායක වන අතර සමාජීය, මනෝවිද්‍යාත්මක හා සංස්කෘතික කාර්ය ඉටුකරන බහුවිධ සංසිද්ධියක් බවට හඳුනාගත හැකිය. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වන්නේ ලාංකේය බෞද්ධ සමාජයේ මරණින් මතු ජීවිතය හා සම්බන්ධ චාරිත්‍ර බෞද්ධ ඉගැන්වීම් මත පදනම් වුවද, ඒවා ජනශ්‍රැතික හා සංස්කෘතික බලපෑම් සමග සම්මිශ්‍රණය වී ඇති බවයි. එම බලපෑම් හේතුවෙන් මිථ්‍යාදෘෂ්ටික අදහස් සමාජය තුළ මුල්බැස ඇති ආකාරය නිරීක්ෂණය වූ කරුණකි. එම මිථ්‍යාදෘෂ්ටික අදහස් වෙනුවට සම්‍යක්දෘෂ්ටික අදහස් සමාජගත කිරීමට බෞද්ධ ඉගැන්වීම් උපයෝගි කරගත හැක්කේ කෙසේද යන්න මෙම පර්යේෂණයෙහි මූලික ගැටලුවයි. තවද මෙම චාරිත්‍ර මගින් මියගිය පුද්ගලයාට පින් අනුමෝදන් කිරීමේ ආගමික අරමුණට අමතරව ජීවත්වන ඥාතීන්ගේ ශෝකය, බිය සමනය කිරීම සහ සංස්කෘතික අනන්‍යතාව පවත්වාගෙන යාම වැනි කාර්ය ද ඉටු කරන බව පැහැදිලි වේ. එබැවින් මරණින් මතු ජීවිතය හා සම්බන්ධ ආගමික පූජා චාරිත්‍ර ලාංකේය බෞද්ධ සමාජයේ ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම් පිළිබිඹු කරන වැදගත් සංසිද්ධියක් ලෙස හඳුනාගත හැකිය.

ප්‍රමුඛ පද: පුණ්‍යානුමෝදනාව, පුනර්භවය, පූජා චාරිත්‍ර, මරණින් පසු ජීවිතය, ලාංකේය බෞද්ධ සමාජය

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය පොත්තේවෙල ඤාණලක්ඛන හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

පුද්ගල චරිත සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

එම්. ජී. එච්. එම්. කුමාරි
පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20361@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය මගින් අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ පුද්ගල චරිත සංවර්ධනය උදෙසා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගීතාවයි. ඒ අනුව නූතන තරගකාරී සමාජ ක්‍රමය තුළ මානව සාරධර්ම පරිහානිය ප්‍රමුඛතම සමාජ සංස්කෘතික අර්බුදයක් බවට පත්ව ඇත. නූතන සමාජයේ සාපරාධී චර්යා රටා සහ විවිධ මනෝ සාමාජීය ව්‍යාධි කෙරෙහි පුද්ගල චරිතයේ සදාචාරාත්මක පරිහානිය සෘජුව බලපාන බව නිරීක්ෂණය වේ. සමාජ ගැටලු වර්ධනය වීමෙහිලා මූලික හේතුව පුද්ගල චරිත පරිහානිය බව පෙනී යන හෙයින් වත්මන් සමාජය තුළ චරිත සංවර්ධනයේ අවශ්‍යතාව දැඩිව පවතී. පුද්ගල චරිත සංවර්ධනය උදෙසා සූත්‍ර පිටකයේ අන්තර්ගත විවිධ සූත්‍ර මගින් ලැබෙන බෞද්ධ උපදේශ සුවිශේෂී වේ. පුද්ගල චරිත සංවර්ධනය යනු පුද්ගලයාගේ සද්ගුණවත් චර්යාව අභිමානවත් ආකාරයට සංවර්ධනය කිරීමයි. ථෙරවාද සූත්‍ර පිටකාගත දේශනාවල අන්තර්ගත බෞද්ධ ඉගැන්වීම් පුද්ගල චරිත සංවර්ධනය සඳහා උපයෝගී වන ආකාරය පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයෙහි මූලික අරමුණයි. බෞද්ධ සූත්‍ර දේශනාවල අන්තර්ගත ඉගැන්වීම් චරිත සංවර්ධනයට උපයෝගී වන්නේ කෙසේද යන පර්යේෂණ ගැටලුව මෙහිදී සාකච්ඡා කරන ලදි. මෙම පර්යේෂණය සඳහා මජ්ඣිම නිකායාගත අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, විතක්කසන්ඨාන සූත්‍රය, ද්වේධාවිතක්ක සූත්‍රය ආදී සූත්‍රධර්මවල අන්තර්ගත මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් චරිත සංවර්ධනය සඳහා ප්‍රායෝගිකව යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරන ලදි. ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සූත්‍ර පිටකාගත දේශනා යොදාගන්නා ලද අතර ද්විතීයක මූලාශ්‍රය අධ්‍යයනය කරමින් දත්ත විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහිදී අප හඳුනාගත් ආකාරයට චරිත සංවර්ධනයේ පදනම වන්නේ අභ්‍යන්තර මානසික සංවර්ධනය සහ පවිත්‍රතාවයි. බෞද්ධ දේශනාවල අන්තර්ගත බෞද්ධ ආචාරධර්මානුකූලව ක්‍රියා කිරීම මගින් පුද්ගල චරිත සංවර්ධනය සඳහා සෘජු දායකත්වයක් ලැබෙන අතර එමගින් පුද්ගලයා ලෞකික, ලෝකෝත්තර යන දෙඅංශයෙන්ම උසස් සංවර්ධනයක් ඇතිකරගන්නා බව හඳුනාගන්නා ලදි. බෞද්ධ ආචාර ධර්ම පද්ධතිය සහ බෞද්ධ භාවනා ක්‍රම චිත්ත පරිශුද්ධිය වර්ධනය කිරීම උදෙසා සෘජුවම දායකවන බව මෙම පර්යේෂණය මගින් තහවුරු විය.

ප්‍රමුඛ පදඃ ආචාර ධර්ම, පුද්ගල චරිත සංවර්ධනය, බෞද්ධ ඉගැන්වීම්, සදාචාරාත්මක පරිහානිය, සූත්‍ර පිටකය

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය වැලිවිට සරණංකර හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

උඩරට පෞරාණික විහාර දේවාලවල සාම්ප්‍රදායික සතර මංගල්‍යය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. ඩී. නිමේෂා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20471@arts.pdn.ac.lk

අලුත් සහල් මංගල්‍යය, අලුත් අවුරුදු මංගල්‍යය, ඇසළ පෙරහැර මංගල්‍යය, කාර්තික මංගල්‍යය යන මංගල්‍යය සතරකින් සමන්විත වන සාම්ප්‍රදායික සතර මංගල්‍යය යනු ලාංකේය ජන ජීවිතය හා බැඳි සුවිශේෂ සංස්කෘතිකාංගයක් ලෙස හඳුනාගත හැකිය. හින්දු දහමේ බලපෑමත් සමග බෞද්ධ සංස්කෘතියට එක්ව ඇති මෙය ලක්දිව ඉපැරණි බෞද්ධ සිද්ධස්ථාන කේන්ද්‍ර කරගනිමින් විවිධාකාරයෙන් සිදු කරනු දක්නට ලැබේ. මෙකී සාම්ප්‍රදායික සතර මංගල්‍යය පිළිබඳ මේ වනවිට විවිධ පර්යේෂණ සිදු වී ඇතත් ඒවා බොහොමයක් මහනුවර ශ්‍රී දළදා මාලිගාව, රුහුණු මහා කතරගම දේවාලය හා දෙවිනුවර උපුල්වන් දේවාලය ආදී සිද්ධස්ථානවලට පමණක් සීමා වී තිබේ. මහනුවර ශ්‍රී දළදා මාලිගාව කේන්ද්‍ර කොට ඇති උඩරට පළාතෙහි පෞරාණික විහාර දේවාලවල මෙම සාම්ප්‍රදායික සතර මංගල්‍යය ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීමේදී එහි අන් සිද්ධස්ථානවලට වඩා සුවිශේෂතාවක් පවතින බව පෙනී යන අතර මේ සම්බන්ධයෙන් මෙතෙක් විධිමත් පර්යේෂණයක්ද සිදු වී නොමැත. එම පර්යේෂණ හිඩැස සම්පූර්ණ කිරීම සඳහා මෙම පර්යේෂණය සිදු කෙරේ. ශ්‍රී දළදා මාලිගාව ප්‍රමුඛ පෞරාණික විහාර දේවාලවල මෙකී සතර මංගල්‍යය ක්‍රියාත්මක වන ආකාරය සහ ඒ හා බැඳි වත්පිළිවෙත් මෙන්ම එයට අදාළ සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමවේදවල පවත්නා සුවිශේෂතාව කවරේද යන මූලික පර්යේෂණ ගැටලුව මෙමගින් විමර්ශනය කෙරේ. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය, ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය, පාඨමය විශ්ලේෂණ ක්‍රමවේදය හා ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යොදා ගැනිණි. මෙම පර්යේෂණය සාම්ප්‍රදායික සතර මංගල්‍යවල ඓතිහාසිකත්වය සහ දළදා මාලිගාව ප්‍රමුඛ උඩරට පෞරාණික සිද්ධස්ථානවල සතර මංගල්‍යය ක්‍රියාත්මක වන ආකාරය හා ඒ හා බැඳි වත්පිළිවෙත් හා රාජකාරී ක්‍රමවල පවත්නා සුවිශේෂතාව හඳුනා ගැනීම වැනි අරමුණු කිහිපයකින් සමන්විත වේ. මෙම පර්යේෂණය මගින් පැහැදිලි වන ආකාරයට උඩරට ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වන මෙම සාම්ප්‍රදායික සතර මංගල්‍යය මහනුවර ශ්‍රී දළදා මාලිගාව කේන්ද්‍රගතව සිදු කෙරෙන අතර එය නිසියාකාරව පැවැත්වීම උඩරට පෞරාණික සිද්ධස්ථාන භාරකරුවන්ගේ සහ රාජකාරිකරුවන්ගේ ප්‍රධාන වගකීමයි. වර්තමානයේ මෙම සිද්ධස්ථානවලට අයත් සාම්ප්‍රදායික රාජකාරිකරුවන් මගින් එම රාජකාරී කටයුතු නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් මෙකී සාම්ප්‍රදායික සතර මංගල්‍යය හා සබැඳි වත්පිළිවෙත් රැසක් අභාවයට ගොස් ඇති බව හඳුනාගත හැකිය. මෙම පර්යේෂණය මගින් මෙකී සාම්ප්‍රදායික සතර මංගල්‍යවල අඛණ්ඩ පැවැත්ම සඳහා උත්තේජනයක් ලබා දෙමින් එය මතු පරපුරට දායද කිරීමේ වැදගත්කම ඉස්මතු කෙරේ.

ප්‍රමුඛ පද: දළදා මාලිගාව, පෞරාණික විහාර, සතර මංගල්‍යය, වත්පිළිවෙත්, හින්දු ආගම

මෙම අධ්‍යයනය සඳහා වැලිවිට සරණංකර හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

උඩරට පෞරාණික දේවාල සංස්කෘතිය හා බැඳුණු සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (උඩුනුවර ගඩලාදෙණිය විෂ්ණු දේවාලය ඇසුරින්)

ආර්. ඒ. පී. ඒ. ප්‍රේමරත්න
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20526@arts.pdn.ac.lk

ක්‍රි.පූ. 4 වන සියවසෙහි පණ්ඩුකාභය රාජ සමය දක්වා ඈතට විහිදෙන ලාංකේය දේවාල සංස්කෘතිය තුළ දේවාලය යනු සිංහල බෞද්ධ දෙවිවරුන් වන්දනා කිරීම සඳහා වෙන් වූ සුවිශේෂ ආගමික සිද්ධස්ථානයකි. මෙකී උඩරට පෞරාණික දේවාල සංස්කෘතියේ පැවැත්ම තීරණය කරන ප්‍රබල සාධකයක් ලෙසට ඒ හා බැඳි සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමය හඳුනාගත හැකි අතර මෙම පර්යේෂණය මගින් එකී දේවාල සංස්කෘතිය තුළ වැඩවසම් සමාජ ක්‍රමය මත ව්‍යාප්ත වූ රාජකාරී ක්‍රමයෙහි ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කෙරිණි. මෙහිදී උඩරට පළාතේ පිහිටි සාම්ප්‍රදායික දේවාල සංස්කෘතියට මූලිකත්වය ලබාදෙමින් උඩුනුවර ගඩලාදෙණිය විෂ්ණු දේවාලය කේන්ද්‍ර කර ගනිමින් එම දේවාලය සතු දේවාලගම් භුක්ති විඳින රාජකාරිකරුවන් හා ඔවුන්ගේ රාජකාරී ක්‍රමවේදය ආශ්‍රයෙන් මෙම පර්යේෂණය සිදු කෙරිණි. දේවාල සංස්කෘතිය තුළ පවතින සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමය අධ්‍යයනය කරමින් එය දේවාලයේ පැවැත්මට සහ බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රගමනය සඳහා ලබාදෙන දායකත්වය මෙන්ම එහි වර්තමාන ස්වභාවය පිළිබඳද විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ දේවාල සංස්කෘතිය හා බැඳි එම සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමය එම දේවාලයේ පැවැත්මට හා නඩත්තු කටයුතුවලට බලපාන්නේ කෙසේද යන්නයි. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ඓතිහාසික මූලාශ්‍රය සහ සම්මුඛ සාකච්ඡා උපයෝගි කරගනිමින් දත්ත ගොනු කර ඇත. මෙහිදී පර්යේෂණ සොයාගැනීම්වලට අනුව දේවාල සංස්කෘතිය තුළ පවතින සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමය කුලය මත රඳා පවතින්නක් බවත් දේවාලයෙහි පරිපාලනය, නඩත්තුව හා වත්පිළිවෙත් පවත්වාගෙන යාම එයට අදාළ රාජකාරිකරුවන් මගින් සිදු වන බවත් පෙනේ. මෙකී සියලු රාජකාරී නිලකරුවන් ඇතුල් කට්ටලය සහ පිට කට්ටලය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. දේවාලයෙහි පරිපාලනය සහ වත් පිළිවෙත් ආදිය ඇතුල් කට්ටලයටත් සෙසු නඩත්තු කටයුතු හා භාණ්ඩ සැපයුම් ආදි අවශ්‍යතා සැපිරීම පිට කට්ටලයටත් පැවරේ. මේ අනුව ලාංකේය දේවාල සංස්කෘතිය තුළ දේවාලයේ බොහෝ කටයුතු මෙම ඉඩම් භුක්ති ක්‍රමය හා බැඳුණු රාජකාරී ක්‍රමය මත රඳා පවතී. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි අතීතයේ දේවාලයෙන් තමා විසින් භුක්ති විඳින ඉඩකඩම්වලට සරිලන පරිදි මෙම සේවාවන් දේවාලය වෙත ලබා දුන්නද වර්තමානය වන විට නවීන සංකීර්ණ සමාජ ක්‍රමයත් සමග රාජකාරී ක්‍රමය තුළ යම් පරිහානියක් දක්නට ලැබෙන බව පැහැදිලි වේ.

ප්‍රමුඛ පදඃ ඉඩම් භුක්තිය, කුල ක්‍රමය, දේවාල සංස්කෘතිය, රාජකාරිකරුවන්, සාම්ප්‍රදායික රාජකාරී ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා වැලිවිට ශ්‍රී සරණංකර හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ථෙරවාද විනය පිටකයෙන් හෙළිවන කායික ස්වස්ථතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එච්. එම්. ටී. ඩී. ප්‍රියදර්ශනී
පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20532@arts.pdn.ac.lk

ථෙරවාද විනය පිටකාගත ඉගැන්වීම් පරීක්ෂා කිරීමේදී තහවුරු වන්නේ විනය දේශනාවේ මූලික අරමුණු දෙකක් සාධනය වන බවයි. එහි එක් අංශයකින් පෙනී යන්නේ භික්ෂූන් වහන්සේගේ කායික සංවරය ගොඩනංවමින් විමුක්ති මාර්ගයට අවශ්‍ය මානසික පරිසරය නිර්මාණය කිරීම සහ අනෙක් අංශයෙන් ආරාමික පරිසරයක ජීවත් වන භික්ෂූන් වහන්සේ ආරාමික පිරිසක් වශයෙන් සාමූහිකව ජීවත් විය යුතු පරිසරයක් පවත්වා ගෙන යෑමයි. ඒ අනුව මෙම පර්යේෂණය ඇසුරින් සාකච්ඡා කරනු ලබන්නේ මානසික ශික්ෂණය ගොඩනඟා ගැනීමට පසුබිමක් සපයන විනය පිටකය පාදක කරගෙන කායික ස්වස්ථතාව එහි නිරූපණය කර ඇති ආකාරය අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය මූලික වශයෙන් ථෙරවාද විනය පිටකයෙහි පුද්ගලයෙකුගේ යහපැවැත්ම පිළිබඳ අර්ථ නිරූපණය වන ආකාරය හඳුනා ගනිමින් එය පුද්ගලයාගේ යහපැවැත්ම කෙරෙහි කෙතරම් දුරට පුද්ගලයාගේ විමුක්ති මාර්ගයට උපස්ථම්භක වන්නේද යන්න පිළිබඳ කරුණු පරීක්ෂා කරන ලදි. බුදුදහමට අනුව සෞඛ්‍ය සම්පන්න ජීවන පැවැත්ම විමුක්ති මාර්ගය අවබෝධ කිරීමට උපකාර වන ආකාරය විනය පිටකාගත දේශනාවල මෙන්ම සූත්‍ර පිටකයෙහිද දක්වා ඇත. ඒ අනුව මෙම පර්යේෂණය විනය පිටකය ඇසුරු කරමින් පුද්ගලයෙකු පවත්වා ගත යුතු කායික ස්වස්ථතාව පුද්ගලයාගේ ආධ්‍යාත්මික ජීවිතය සමග කෙසේ බද්ධ වී පවතීද යන පර්යේෂණ ගැටලුව මූලික කර ගනිමින් කරුණු පරීක්ෂා කොට ඇත. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලද අතර දත්ත විශ්ලේෂණ විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය භාවිතයට ගන්නා ලදි. එහිදී පර්යේෂකයාගේ මූලික අවධානය ථෙරවාද විනය පිටකය කෙරෙහි යොමු වූ අතර ඇතැම් අවස්ථාවලදී සූත්‍ර පිටකාගත කරුණු අධ්‍යයනය කිරීමටද උත්සහ කෙරිණි. මෙහි පර්යේෂණ ප්‍රතිඵල ලෙස කායික සුවය නෛර්යාණික ප්‍රතිපදාවේ පැවතිය යුතු අතර මානසික සංවර්ධනය සඳහා පදනමක් සපයන බව අධ්‍යයනය කරන ලදි.

ප්‍රමුඛ පද: කායික සෞඛ්‍යය, ථෙරවාද විනය, නිර්වාණය, මානසික ශික්ෂණය, ස්වස්ථතාව

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

බුදුදහම හා බැඳි ප්‍රදේශීය පූජා චාරිත්‍ර පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ජනපදය ඇසුරින්)

එම්. පී. කේ. ප්‍රියංගිකා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20541@arts.pdn.ac.lk

බුදුදහම ශ්‍රී ලාංකේය ජන ජීවිතයේ සංස්කෘතිය සහ සමාජ ව්‍යූහය සමග අතිශයින්ම සමීපව බැඳී ඇති ආගමික සම්ප්‍රදායකි. බෞද්ධ ආගමික ජන ජීවිතය තුළ පූජා චාරිත්‍ර වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇති අතර ඒවා පුද්ගලයාගේ ආධ්‍යාත්මික අවශ්‍යතාව සපුරාලීම පමණක් නොව සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාද ඉටු කරයි. ඉතිහාසය පුරාම ශ්‍රී ලාංකේය සමාජය තුළ බෞද්ධ පූජා චාරිත්‍ර විවිධ ප්‍රදේශීය ජන විශ්වාස, දේව සංකල්ප සහ පාරම්පරික සිරිත්විරිත් සමග මිශ්‍රව විකාසය වී ඇත. ඒ අනුව ප්‍රදේශීය වශයෙන් පූජා චාරිත්‍රවල ස්වභාවය, අරමුණු සහ ක්‍රියාකාරිත්වය තුළ විවිධත්වයක් දැකිය හැකිය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ජනපදයද එවැනි ප්‍රදේශීය සංස්කෘතික ලක්ෂණ පැහැදිලිව නිරූපණය කරන ප්‍රදේශයකි. එහි ජනතාවගේ දෛනික ජීවිතය, ආගමික කටයුතු, කෘෂිකර්මාන්තය වැනි විවිධ වෘත්ති සහ සමාජ සම්බන්ධතා සමග බෞද්ධ පූජා චාරිත්‍ර සමීපව සම්බන්ධ වී ඇත. එමෙන්ම බෞද්ධ ආගමික සම්ප්‍රදායවලට අමතරව දේව විශ්වාස හා ජනතාවගේ ආගමික සංකල්පද මෙම චාරිත්‍රවලට බලපාන ආකාරය නිරීක්ෂණය කළ හැකිය. මෙම අධ්‍යයනය මගින් ප්‍රදේශීය බෞද්ධ සංස්කෘතියේ සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීමත් එම සංස්කෘතික වටිනාකම් ලේඛනගත කිරීමත් සිදුකර ඇත. පදවිය ජනපදයේ පවතින බෞද්ධ පූජා චාරිත්‍රවල ස්වභාවය, ඒවායේ පරිණාමය සහ බෞද්ධ පූජා චාරිත්‍ර හා ප්‍රදේශීය සංස්කෘතිකාංග අතර පවත්නා අන්තර් සම්බන්ධතාව කුමක්ද යන ගැටලුවට පිළිතුරු සෙවීමද මෙහිදී සිදු කෙරිණි. ඒ අනුව බෞද්ධ පූජා චාරිත්‍ර, දේව විශ්වාස හා බැඳුණු පූජා චාරිත්‍ර, ඒවායේ අභිචාරාත්මක ලක්ෂණ සහ ජනතාව එමගින් අපේක්ෂා කරන අරමුණු විමර්ශනය කිරීම පර්යේෂණය ප්‍රධාන අරමුණු වේ. පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරන ලද අතර ක්ෂේත්‍ර අධ්‍යයනය, සහභාගිත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය මගින් දත්ත රැස්කිරීම සිදු කෙරිණි. පර්යේෂණයෙන් අනාවරණය වනුයේ පදවිය ජනපදයේ පූජා චාරිත්‍ර බෞද්ධ ආගමික සම්ප්‍රදාය පමණක් නොව ප්‍රදේශීය ජන විශ්වාස හා දේව සංකල්ප සමගද සංකීර්ණ ලෙස බැඳී පවතින බවයි. එමෙන්ම මෙම පූජා චාරිත්‍ර මගින් ආගමික අවශ්‍යතා සපුරාලීම, මානසික සහනය ලබා ගැනීම, සමාජ ඒකාබද්ධතාව වර්ධනය කිරීම සහ සංස්කෘතික උරුමය පවත්වාගෙන යෑම සිදුවන බව අනාවරණය විය. නවීකරණය හා සමාජීය වෙනස්කම් මත පූජා චාරිත්‍රවල අරමුණු හා ක්‍රියාකාරීත්වය යම් පරිවර්තනයකට ලක්ව ඇතත් ඒවා තවදුරටත් ප්‍රදේශීය ජන ජීවිතයේ අත්‍යවශ්‍ය සංස්කෘතික අංගයක් ලෙස පවතින බවද මෙම අධ්‍යයනයෙන් තහවුරු කිරීමට හැකි විය.

ප්‍රමුඛ පද: ජන විශ්වාස, දේව විශ්වාස, පදවිය ජනපදය, ප්‍රදේශීය සංස්කෘතිය, බෞද්ධ පූජා චාරිත්‍ර

මෙම අධ්‍යනය සඳහා දම්මිමාලා විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

විකාල භෝජන ශික්ෂා පදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ථෙරවාද ත්‍රිපිටකය ඇසුරෙන්)

පෝප්පිටියේ චන්දානන්ද හිමි
පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20599@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ඇසුරින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ථෙරවාද විනය පිටකයට අනුව පැවිදි සමාජයේ කායික සැහැල්ලුව මෙන්ම ආත්ම දමනය උදෙසා පැනවූ විකාල භෝජන ශික්ෂා පදයේ ඓතිහාසික හා විනයානුකූල පදනම පරීක්ෂා කරමින්, එහි අන්තර්ගත ස්වයං විනය සහ භෝජන මත්තඤ්ඤුතා නමැති බෞද්ධ මනෝවිද්‍යාත්මක ප්‍රායෝගික වටිනාකම් භාවිත කිරීමට සමාජය හුරු කරවීමයි. එහිදී මූලික වශයෙන් කරුණු අධ්‍යයනය කිරීම සඳහා මහායාන හෝ වෙනත් දාර්ශනික සම්ප්‍රදායවලින් බැහැරව හුදෙක් ථෙරවාද පාලි ත්‍රිපිටකයේ විනය පිටකයේ පාචිත්තියපාළිය, මජ්ඣිමනිකායේ ලටුකිකොපම සහ කීටාගිරි සූත්‍ර සහ අදාළ අටුවා ග්‍රන්ථ ඇසුරු කරගනිමින්, ඒවායේ අන්තර්ගත ඉගැන්වීම් හැසිරීම් කළමනාකරණය සඳහා යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමවේදය මත පදනම්ව සිදුකොට ඇත. වර්තමාන කාර්යබහුල සංකීර්ණ ගිහි සමාජයේ මිනිසා නිරන්තරයෙන් අත්විඳින ආශාව සහ හැසිරීම් පාලනය කරගැනීමේ අපහසුතාව මගින් පෙර නොවූ ආකාරයකින් මිනිස් ජීවිතය පීඩාවට පත් කර ඇත. වර්තමානයෙහි මෙම ශික්ෂා පදය හුදෙක් බාහිර ආගමික වත්පිළිවෙතක් ලෙස පමණක් අර්ථකථනය වීමේ ප්‍රවණතාවක් පවතින බැවින් එම ශික්ෂා පදයෙන් ඉදිරිපත්වන ආධ්‍යාත්මික වටිනාකම් ගවේෂණය කිරීම මෙහි අරමුණු වේ. ඒ අනුව නූතන සංකීර්ණ ගිහි සමාජයේ හැසිරීම් කළමනාකරණයට සහ ප්‍රායෝගික ජීවිතය සාර්ථක කරගැනීම සඳහා විකාල භෝජනය උපයෝගි කරගත හැක්කේ කෙසේ ද යන මූලික පර්යේෂණ ගැටලුව මෙහිදී සාකච්ඡාවට භාජන කෙරිණි. අපගේ මෙම අධ්‍යයනය ඇසුරින් තහවුරු කරගැනීමට හැකි වූ ආකාරයට මෙය හුදෙක් නිරාහාරව සිටීම අරමුණු කොටගත් දඬුවමක් හෝ බාහිර නීතියක් නොවන අතර තෘෂ්ණාව කළමණාකරණය උදෙසාත් ඉන්ද්‍රිය සංවරය සහ ස්වයං විනය පුහුණු කිරීමේ ප්‍රායෝගික මාධ්‍යයක් ලෙසත් ක්‍රියා කරයි. පුද්ගලයා ලෞකික හා ලෝකෝත්තර අරමුණු ජයගැනීම උදෙසා පැවිදි සමාජයෙන් ඔබ්බට ගොස් අෂ්ටාංග උපෝසථ සීලය සමාදන් වීම මගින් ගිහි සමාජයේ මානසික සංවර්ධනයට වුවද මෙම ශික්ෂා පදය භාවිත කිරීමෙන් ලෞකික හා ලෝකෝත්තර අරමුණු සාධනය කරගත හැකි ආකාරය පෙන්නුම් කෙරේ.

ප්‍රමුඛ පද: කායික සැහැල්ලුව, භෝජන මත්තඤ්ඤුතා, විකාල භෝජනය, ස්වයං විනය, හැසිරීම් කළමනාකරණය

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

අපරාධ හා බැඳුණු චිත්තවේග කළමනාකරණය සඳහා බෞද්ධ භාවනාවේ උපයෝගිතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ආර්.ඩී. රාජපක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20616@arts.pdn.ac.lk

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ පටන් වර්තමානය දක්වා සමාජයේ පැවැත්මට ප්‍රබල තර්ජනයක් එල්ල කරන සාධකය අපරාධයයි. නූතන ලෝකයේ විද්‍යාව හා තාක්ෂණික දියුණුව ඉහළ ගියද නීතියෙන් පමණක් අපරාධ වැඩි වීම පාලනය කළ නොහැකි වී ඇත. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ අපරාධකරුවන්ගේ චිත්තවේග සහ ආවේග කළමනාකරණය සඳහා බෞද්ධ භාවනාවේ දායකත්වය සහ උපයෝගිතාව පරීක්ෂා කිරීමයි. වත්මන් පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ පවතින ප්‍රායෝගික දුර්වලතා මගහරවා ගනිමින් අපරාධය අවම කිරීමට බෞද්ධ භාවනාව සාර්ථක ලෙස කොපමණ දුරට උපයෝගි කරගත හැකි ද යන්න මෙහි මූලික පර්යේෂණ ගැටලුවයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව ද්විතීයක ශාස්ත්‍රීය සාහිත්‍ය මූලාශ්‍රය පාදක කරගනිමින් සංධාර විශ්ලේෂණ ක්‍රමවේදය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. අපරාධකාරී සිතුවිලි ජනිත කරවන ලෝභ, ද්වේෂ හා මෝහ යන අකුසල මූල බෞද්ධ භාවනාව මගින් සාර්ථකව කළමනාකරණය කළ හැකි ය. එහිදී මෛත්‍රී භාවනාව වෛරය පාලනය කර දයාව වර්ධනය කිරීමටද ආනාපානසති භාවනාව සිතේ ඒකාග්‍රතාව දියුණු කර ක්ෂණික ආවේග කළමනාකරණයටද උපයෝගී වේ. එමෙන්ම විපස්සනා භාවනාව මගින් අපරාධකාරී සිතුවිලිවලට වහල් නොවී ඒවා අතහැර දැමීමට අවශ්‍ය ප්‍රඥාව පුද්ගලයා තුළ ගොඩනංවනු ලබයි. මේ මගින් වත්මන් බන්ධනාගාර පුනරුත්ථාපන ප්‍රතිපත්තිවලට භාවනාව විධිමත් ලෙස ඇතුළත් කරමින් රැඳවියන්ගේ ආතතිය සහ ආක්‍රමණශීලී බව අවම කර ඔවුන් යළි යහපත් මනුෂ්‍යයන් ලෙස සමාජගත කළ හැකිය. අවසාන වශයෙන් නීතිය මගින් මිනිසාගේ කය තාවකාලිකව සිරගත කළද බෞද්ධ භාවනා අභ්‍යාස මගින් පුද්ගල මනස තුළ දීර්ඝකාලීන ආකල්ප වෙනසක් සහ ස්වයං විනයක් ගොඩනැංවිය හැකි බව නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: අපරාධ විද්‍යාව, චිත්තවේග කළමනාකරණය, පුනරුත්ථාපනය, බෞද්ධ භාවනාව, බෞද්ධ මනෝවිද්‍යාව

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය පොත්තේවෙල ඤාණලක්ඛණ හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කාන්තා හිංසනය වළක්වා ගැනීම සඳහා වූ බෞද්ධ මාර්ගෝපදේශනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: ථෙරී ගාථා පාළිය සහ තෝරා ගත් ජාතක කතා ඇසුරෙන්

ඩී. එම්. සකුණි සත්සරා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20687@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ඇසුරින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ කාන්තා හිංසනය වළක්වා ගැනීම උදෙසා බෞද්ධ දේශනාවල උපයෝගිතාවයි. කාන්තා හිංසනය යනු ශාරීරික, මානසික හෝ ආර්ථික වශයෙන් කාන්තාව පීඩාවට පත් කිරීමයි. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් අවධාරණය කරනු ලබන ආකාරයට ගෝලීය මහජන සෞඛ්‍ය සහ සමාජීය ගැටලුවක් බවට එය පත්ව ඇත. වර්තමානයේ මේ සඳහා විවිධ නීතිමය සහ මනෝසමාජීය උපදේශන ක්‍රමවේද පැවතියද, ඊට ප්‍රායෝගික විසඳුම් සෙවීම උදෙසා බෞද්ධ මූලාශ්‍රයගත උපදේශනය උපයෝගී කර ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ථෙරී ගාථා පාළියෙහි හා ජාතක කථාවල ඇතුළත් කාන්තා හිංසනය පිළිබඳ විවිධ අවස්ථා උදාහරණ ලෙස භාවිත කරමින් වර්තමාන සමාජය තුළ කාන්තා හිංසනය වළක්වා ගැනීම සඳහා යොදා ගත හැකි බෞද්ධ මාර්ගෝපදේශන කවරේද යන්න මෙහිදී මූලික වශයෙන් අවධාරණය කරනු ලැබේ. බෞද්ධ මාර්ගෝපදේශන වර්තමාන කාන්තාවන්ගේ මානසිකත්වය සවිබල ගැන්වීම උදෙසා ප්‍රායෝගිකව උපයෝගී කරගත හැකිය යන්න පර්යේෂණ උපන්‍යාසය වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය සහ තේමා විශ්ලේෂණය භාවිත කර ඇත. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ථෙරී ගාථා පාළිය, ථෙරී ගාථා අට්ඨකථාව, ජාතක පාළිය සහ ජාතක අට්ඨකථාවද, ද්විතීයක මූලාශ්‍රය ලෙස විවිධ ශාස්ත්‍රීය කෘති සහ පර්යේෂණ ලිපිද භාවිත කර ඇත. බුද්ධකාලීනව පැවති පිතෘමූලික සමාජය තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට සහ අවඥාවට ලක් වූ සෝමා, පුණ්ණා, ඉසිදාසි වැනි තෙරණියන්ගේ ජීවන අත්දැකීම්ද, අන්ධභූත, සම්බුලා, චුල්ලධර්මපාල, වෙස්සන්තර, කුස, කුරුධම්ම, උම්මග්ග, මහාපදුම සහ මහාසීලව යන තෝරාගත් ජාතක කථාවලින් කාන්තා හිංසනය නිරූපණය වී ඇති ස්වභාවද මෙහිදී විමර්ශනය කර ඇත. කාන්තා හිංසනයෙන් මිදීම පිණිස සීල, සමාධි, ප්‍රඥා හා වීර්යය වැනි සංකල්ප යොදා ගත හැකි ආකාරය මෙහිදී විශ්ලේෂණය කෙරේ. මේ අනුව මෙම පර්යේෂණය වර්තමානයේ කාන්තාව මුහුණ දෙන විවිධ හිංසා වළක්වා ගනිමින් යහපත් කුල කාන්තාවක බිහිවීම පිණිස බෞද්ධ මාර්ගෝපදේශ ඉදිරිපත් කර ඇත.

ප්‍රමුඛ පදඃ කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, බෞද්ධ මාර්ගෝපදේශනය, මානසික ඔරොත්තු දීම්, විමුක්ති මාර්ගය

මෙම අධ්‍යයනය සඳහා කේ. එම්. ටී. ජී. දීපාලෝකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

අල්පේච්ඡතාව හා එහි ප්‍රායෝගික වටිනාකම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්: තෝරාගත් සූත්‍ර දේශනා හා විනය පිටකය ඇසුරෙන්

කේ. එම්. එස්. එන්. සේනාරත්න
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20697@arts.pdn.ac.lk

බෞද්ධ සදාචාර දර්ශනය හා ප්‍රතිපදා මාර්ගය තුළ අල්පේච්ඡතාව (අප්පිච්ඡතා) යනු පුද්ගල ශික්ෂණය සහ සමාජීය යහපැවැත්ම නියාමනය කරනු ලබන ප්‍රධාන මූලධර්මයකි. ශ්‍රී සුමංගල ශබ්දකෝෂය තුළ ස්වල්ප වූ ආශා ඇති බව යන්නෙන් මෙය අර්ථ ගැන්වේ. මෙකී ගුණාංගය, හුදෙක් භෞතික දරිද්‍රතාව නොව සවිඥානික මධ්‍යස්ථභාවයෙන් යුතුව සම්පත් පරිහරණයයි. වර්තමාන ගෝලීයකරණ ප්‍රවණතාව ඔස්සේ වෙළඳපොළ ආර්ථිකය මගින් කෘත්‍රිමව නිර්මාණය කරනු ලබන අධිපාරිභෝජනවාදී සංස්කෘතියේ අධික ආශාව (මහිච්ඡතාව) හේතුවෙන් හටගැනෙන ආර්ථික ණයගැතිභාවයට හා මානසික අතෘප්තිකරභාවයට අල්පේච්ඡතාව නිසි පිළිතුරකි. මෙම පසුබිම යටතේ සූත්‍ර දේශනා හා විනය මූලාශ්‍රයේ අන්තර්ගත අල්පේච්ඡතා මූලධර්ම නූතන පාරිභෝජනවාදී සමාජයේ ආර්ථික හා මානසික අර්බුදවලට විසඳුම් සැපයිය හැකි ප්‍රායෝගික චර්යාත්මක ආකෘතියක් ලෙස ආදේශ කරන්නේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙහි මූලික අරමුණ වන්නේ අල්පේච්ඡතා මූලධර්ම විමර්ශනය කරමින් නූතන පාරිභෝගිකයාගේ මූල්‍ය හා මානසික අර්බුදවලට විසඳුම් දිය හැකි ප්‍රායෝගික චර්යාත්මක ආකෘතියක් හඳුන්වා දීමයි. මෙය සන්දර්භ හා සංසන්දනාත්මක විශ්ලේෂණ විධික්‍රම භාවිත කරමින් සිදු කරනු ලබන ගුණාත්මක පර්යේෂණයකි. මෙකී අධ්‍යයනය තුළ අල්පේච්ඡතා සංකල්පය දීඝනිකායේ සිඟාලෝවාද, අංගුත්තරනිකායේ අරියවංස, ව්‍යග්ඝපජ්ජ හා අණන, මජ්ඣිමනිකායේ සතිපට්ඨාන හා සල්ලේඛ, සංයුත්තනිකායේ රාසිය හා බුද්දකනිකායේ ධම්මික යන සූත්‍ර දේශනාවලින් මෙන්ම විනය පිටකයේ මහාවග්ගපාළියේ මහා ඛන්ධකය තුළ සිව්පසය සම්බන්ධ පැනවීම් සහ ප්‍රත්‍යය කළමනාකරණ ප්‍රතිපදා ඔස්සේ මැනවින් විමර්ශනයට ලක් කරනු ලැබේ. විනය පිටකයේ අන්තර්ගත ප්‍රත්‍යවේක්ෂා විනයානුගත බෞද්ධ අභ්‍යාස, නූතන පාරිභෝගික ජීවන රටාවේ ආවේගශීලී මිලදී ගැනීම් පාලනය කරගැනීමට උපකාරී වන ආකාරය මෙහිදී පෙන්නුම් කෙරේ. මේ තුළ පුද්ගලයා යථාලාභ සන්තුට්ඨියට පත් වේ. මෙමගින් පුද්ගලයා අනවශ්‍ය මූල්‍ය ණයගැතිභාවයෙන් හා ආර්ථික පීඩනයෙන් නිදහස් වනවා සේම තරගකාරී පාරිභෝජන රටාව හේතුවෙන් ඇතිවන මානසික ආතතියෙන් මිදේ. මෙය ස්ථාවර මූල්‍ය විනයක් සහ තිරසාර මානසික සුවතාවක් ළඟා කරගැනීමට හේතුවන බව තහවුරු වේ.

ප්‍රමුඛ පද: අල්පේච්ඡතාව, අධිපාරිභෝජනවාදය, චර්යාත්මක ආකෘතිය, ප්‍රත්‍යවේක්ෂා විනය, මහිච්ඡතාව

මෙම අධ්‍යයනය සඳහා වෙලැම්පැලේ රතනසාර හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ගැටුම් හා ගැටුම් කළමනාකරණය සඳහා වූ බෞද්ධ මාර්ගෝපදේශය පිළිබඳ අධ්‍යයනයක්: තෝරාගත් සූත්‍ර දේශනා හා ජාතක කථා ඇසුරෙන්

ඩබ්. ජේ. කේ. වී. දිලිනි තරුෂිකා
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20773@gmail.com

සාමකාමී සහ ස්ථාවර සමාජ පැවැත්මක් සඳහා මානව ඉතිහාසයේ රාජ්‍ය මැදිහත් වීම මත පදනම් වූ විවිධ බලහත්කාරී හෝ දණ්ඩනීය ගැටුම් කළමනාකරණ උපක්‍රම භාවිත කර තිබේ. එම ක්‍රමවේද ප්‍රචණ්ඩත්වයට හා ද්විපාර්ශ්වික හානියට හේතු වී ඇත. නූතන සමාජ විද්‍යාඥයන් විසින් දෙපාර්ශ්වයට ජය අත්වන න්‍යායාත්මක ක්‍රමවේද හඳුන්වා දෙනු ලැබ තිබේ. බාහිර ගැටුම්වලට මූලික හේතුව අභ්‍යන්තර මනෝවිද්‍යාත්මක සාධක බව *මනෝපුබ්බංගමා ධම්මා* දේශනාවෙන් පැහැදිලි වේ. තෝරාගත් සූත්‍ර දේශනා සහ ජාතක කථා මගින් දැක්වෙන බෞද්ධ උපදෙස් වත්මන් සමාජයේ පවතින ගැටුම් කළමනාකරණය සඳහා ප්‍රායෝගිකව අදාළ කරගත හැක්කේ කෙසේ ද යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වේ. ගැටුම් උද්ගතවීමට බලපාන මූලික හේතු හා ඒවායේ ස්වභාවය ජාතක කථා සහ සූත්‍ර දේශනාවලින් කෙසේ නිරූපණය වේද යන්න මෙහි ද්විතීයක ගැටලුවයි. එමෙන්ම මෙහි ප්‍රධාන අරමුණ වන්නේ බෞද්ධ මාර්ගෝපදේශය සමාජයට ප්‍රායෝගිකව ගළපාගත හැකි ආකාරය පෙන්වා දීමයි. සූත්‍ර දේශනා මගින් ගැටුම්වලට හේතු විමර්ශනය කර වර්ගීකරණය, ජාතක කථාවල අන්තර්ගත ප්‍රායෝගික බෞද්ධ මූලධර්ම හා උපායමාර්ග ඉදිරිපත් කිරීම මෙහි උපඅරමුණු වේ. එමෙන්ම ගුණාත්මක ප්‍රවේශයක් ගන්නා මෙම පර්යේෂණයේ සැලසුම විශ්ලේෂණාත්මක සහ විවරණාත්මක වේ. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සූත්‍ර පිටකය සහ ජාතක අට්ඨකථාවද ද්විතීයක මූලාශ්‍රය ලෙස බෞද්ධ අධ්‍යයනය, සමය අධ්‍යයනය හා ගැටුම් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රීය ග්‍රන්ථ සහ පර්යේෂණ නිබන්ධද යොදා ගැනිණි. මෙහිදී දීඝනිකායේ අග්ගඤ්ඤ, සක්කපඤ්හ, මජ්ඣිමනිකායේ මහාදුක්ඛක්ඛන්ධ, මධුපිණ්ඩික, අරණවිභංග, ඛුද්දකනිකායේ කලහවිවාද වැනි සූත්‍ර දේශනා මගින් ගැටුමේ ස්වභාවය, වර්ධනය සහ හේතු විද්‍යාත්මකව අධ්‍යයනය කෙරෙන අතර කුලාවක, උම්මග්ග, සේරිවාණිජ, මහාකපි සහ වර්ණරෝහ වැනි ජාතක කථාවල දැකවෙන ගැටුම් අවස්ථා වෙන්කර හඳුනාගෙන බෝධිසත්ත්වයන් යොදාගත් ක්‍රමවේද සංසන්දනාත්මක තේමා විශ්ලේෂණය ඔස්සේ විමර්ශනය කිරීමට කටයුතු කෙරේ. පර්යේෂණ උපන්‍යාසය නම් පෙළ සාහිත්‍යයෙහි සංගෘහිත බෞද්ධ උපදේශනය වර්තමාන සමාජයේ පවතින චිත්තවේගීය සහ සමාජීය ගැටුම් කළමනාකරණය උදෙසා සාර්ථක සහ ප්‍රායෝගික විකල්ප ක්‍රමවේදයක් ලෙස භාවිත කළ හැකි බවයි. ආදාහනග්‍රාහී නොවීම, කායික වාචික සංවරය හා විවෘත සාකච්ඡාව ආදි බෞද්ධ මාර්ගෝපදේශවල පවතින වලංගුභාවය හා ප්‍රායෝගික අගය මෙම පර්යේෂණය මගින් සනාථ කෙරේ.

ප්‍රමුඛ පද: ගැටුම් කළමනාකරණය, චිත්තවේගීය ගැටුම්, ජාතක කථා, සමාජීය ගැටුම්, සූත්‍ර දේශනා

මෙම අධ්‍යයනය සඳහා වෙලැම්පැලේ රතනසාර හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

තිරසාර ආර්ථික සංවර්ධනයක් උදෙසා බුදුදහමේ මාර්ගෝපදේශිත කරුණු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

ඩබ්. ආර්. එස්. වික්‍රමනායක
පාලි හා බෞද්ධ අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20831@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ඇසුරෙන් සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන්නේ තිරසාර ආර්ථික සංවර්ධනයක් උදෙසා බුදු දහමේ මාර්ගෝපදේශිත කරුණු යොදාගත හැකි ආකාරය ත්‍රිපිටකාගත ඉගැන්වීම් ඇසුරින් කරුණු පරීක්ෂා කරමින් එම බෞද්ධ ආර්ථික මූලධර්ම ප්‍රායෝගික මාර්ගෝපදේශයක් ලෙස භාවිත කළ හැකි ආකාරය පෙන්වා දීමයි. එහිදී මූලික වශයෙන් කරුණු අධ්‍යයනය කිරීම සඳහා දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රය, කූටදන්ත සූත්‍රය, සිඟාලෝවාද සූත්‍රය, අංගුත්තර නිකායේ අණන සූත්‍රය, පත්තකම්ම සූත්‍රය යනාදී සූත්‍ර ඇසුරු කර ගනිමින් ඒවායේ අන්තර්ගත ඉගැන්වීම් තිරසාර ආර්ථික සංවර්ධනය උදෙසා යොදාගත හැකි ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ. මෙම අධ්‍යයනය සිදුකොට ඇත්තේ ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමවේදය පදනම් කොටගෙනය. සංවර්ධනය යනු පාරිසරික සම්පත් අනාගතය සඳහා ආරක්ෂා කරමින් භාවිතයට ගැනීමයි. එම සංවර්ධනය ආර්ථික වර්ධනය පමණක් ඉලක්ක කර ගැනීම හේතුවෙන් පාරිසරික විනාශය, සමාජ අසමානතා, සම්පත් ක්ෂයවීම වැනි ගැටලු මතු වී ඇත. වර්තමාන ලෝකය තිරසාර ආර්ථික සංවර්ධනය යන නව සංකල්පයට වැඩි අවධානයක් යොමු කර ඇත. එබැවින් තිරසාර ආර්ථික සංවර්ධනය සඳහාත් සාමකාමී, ස්වයංපෝෂිත, ධාර්මික, සමාජයක් බිහි කිරීම සඳහාත් බෞද්ධ දර්ශනයෙන් ලැබෙන දායකත්වය කෙසේද යන්න මූලික පර්යේෂණ ගැටලුවයි. මෙම අධ්‍යයනය මගින් තහවුරු කරගැනීමට හැකි වූ ආකාරයට සාධාරණව ධනය ඉපැයීම, බුද්ධිමත්ව ධනය පරිභෝජනය කිරීම සහ අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීම උදෙසා පුද්ගලයාම කිසියම් මානසික පරිවර්තනයකට ලක්විය යුතු ය. බුදුදහමේ ඉගැන්වෙන මෙම මාර්ගෝපදේශකත්වය මගින් වර්තමාන ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අර්බුද, සම්පත් කළමනාකරණ ගැටලු, සමාජීය අභියෝග සඳහා මෙම ආර්ථික මූලධර්ම ප්‍රායෝගිකව යොදාගත හැකි වේ. එමෙන්ම තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කරලීම සඳහා නවීන සංවර්ධන ප්‍රතිපත්ති හා සැලසුම් සමග බෞද්ධ මාර්ගෝපදේශ ඒකාබද්ධ කිරීමේ වැදගත්කම මෙහිදී ගැඹුරින් සාකච්ඡා කෙරිණි.

ප්‍රමුඛ පද: තිරසාර සංවර්ධනය, තිරසාර ආර්ථික සංවර්ධනය, බුදුදහම, මානව සංවර්ධනය, ශ්‍රී ලංකාව

මෙම අධ්‍යයනය සඳහා ධම්මිමාලා විජේසුන්දරගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපුර්වකව සිහිපත් කරමි.

බුදුසමයාගත ඉගැන්වීම් ඇසුරින් තහවුරු වන පවුල හා පවුල් සංස්ථාව තුළ අන්‍යෝන්‍ය බැඳීම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

එම්. එන්. වික්‍රමසිංහ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20834@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ඇසුරින් සිදු කිරීමට අපේක්ෂා කරන ලද්දේ බුදුසමයාගත ඉගැන්වීම් තුළ පවුල හා පවුල් සංස්ථාවේ පැවැත්ම සඳහා අන්‍යෝන්‍ය සබඳතාවල වැදගත්කම පිළිබඳ ත්‍රිපිටකාගත ඉගැන්වීම් ආශ්‍රයෙන් කරුණු අධ්‍යයනය කරමින්, එම ඉගැන්වීම්වල ඇති ප්‍රායෝගික වටිනාකම් භාවිත කිරීමට මිනිසා හුරු කරවීමයි. එහිදී මූලික වශයෙන් කරුණු අධ්‍යයනය කිරීම සඳහා දීඝ නිකායාගත සිඟාලෝවාද සූත්‍රය, අංගුත්තර නිකායාගත නකුල පිතු සූත්‍රය, ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, උග්ගහ සූත්‍රය හා සත්තභරියා සූත්‍රය, සංයුත්ත නිකායාගත මාතුපෝසක සූත්‍රය, බුද්දක නිකායාගත පරාභව සූත්‍රය, වසල සූත්‍රය, මංගල සූත්‍රය යනාදී සූත්‍ර ඇසුරු කරගනිමින් ඒවායේ අන්තර්ගත ඉගැන්වීම් පවුල් සංස්ථාවේ පැවැත්ම උදෙසා උපයෝගි කරගත හැකි ආකාරය නිරීක්ෂණය කරන ලදි. ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමවේදය උපයෝගි කරගනිමින් සිදු කර ඇති මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කිරීමට අපේක්ෂිත පර්යේෂණ ගැටලුව නම් බුදුසමයාගත ඉගැන්වීම් ඇසුරින් ඉදිරිපත් වන පවුල් සංස්ථාවක් සතුව පවතින අන්‍යෝන්‍ය බැඳීම් සාර්ථක පවුල් සංස්ථාවක් උදෙසා උපයෝගි වන ආකාරය කෙබඳුද යන්නයි. ඒ අනුව අපගේ අධ්‍යයනය ඇසුරින් තහවුරු කරගත් ආකාරයට සාම්ප්‍රදායික පවුල් සංස්ථාවට වඩා වර්තමාන පවුල් සංස්ථාව ගෝලීයකරණ ප්‍රවණතා හමුවේ අභියෝග කිහිපයකට බඳුන් වී ඇත. නූතන පවුල් සංස්ථාව පවත්වාගත යුතු අන්‍යෝන්‍ය බැඳීම් බිඳ වැටීම උදෙසා ආර්ථික, සමාජීය හා දේශපාලනික ගැටලු සෘජුව හා වක්‍රව බලපා ඇති ආකාරය හඳුනා ගන්නා ලදි. ඒ අනුව බෞද්ධ දේශනාවල ඉගැන්වෙන මෙත්තා, කරුණා, මුදිතා හා උපෙක්ඛා වැනි ආධ්‍යාත්මික සංකල්ප ප්‍රායෝගික මිනිස් ජීවිතවලට සමීප කරගැනීම ඇසුරින් යහපත් පවුල් සංස්ථාවකට අවශ්‍ය චිත්තවේගී බැඳීම් අත්‍යවශ්‍ය අංගයක් බව මෙම අධ්‍යයනය ඇසුරින් තහවුරු කර ඇත. මීට අමතරව යහපත් පවුල් සංස්ථාවක් පවත්වා ගැනීම උදෙසා අන්‍යෝන්‍ය ගෞරවය හා යුතුකම් ඉටු කිරීම වැනි මානව ගුණාංග පවුල් සංස්ථාවේ ගැටලු කළමනාකරණය උදෙසා යොදාගත හැකි බව හඳුනාගනිමින් බෞද්ධ දේශනාවල අන්තර්ගත ආචාරධර්මීය මගපෙන්වීම් ප්‍රායෝගික ජීවිතයට යොදාගත හැකි ආකාරය ගැඹුරින් සාකච්ඡාවට භාජන කරන ලදි.

ප්‍රමුඛ පදඃ පවුල් සංස්ථාව, අන්‍යෝන්‍ය බැඳීම, බුදුසමයාගත ඉගැන්වීම්, චිත්තවේගී බැඳීම්, මානව ගුණාංග

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ආනන්තරිය පාප කර්ම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පාලි ත්‍රිපිටකය ඇසුරින්)

එල්. ටී. ඩී. හේවා විතාරණ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20869@arts.pdn.ac.lk

මෙම පර්යේෂණයේ මූලික අරමුණ ආනන්තරිය පාප කර්මය පිළිබඳ ථෙරවාද බුදුසමයාගත ඉගැන්වීම් අධ්‍යයනය කිරීමයි. ආනන්තරිය පාපකර්මය පිළිබඳ ඉගැන්වීම් ථෙරවාද හා ජෛන සම්ප්‍රදාය යන ආගමික පසුබිම් දෙක තුළ දැකිය හැකි ඉගැන්වීමක් වුවද, මෙම අධ්‍යයනය ඇසුරින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ථෙරවාද බුදුදහමේ දැක්වෙන ඉගැන්වීම් පමණි. අප විසින් සිදු කරනු ලැබූ සාහිත්‍ය විමර්ශනයට අනුව ආනන්තරිය පාප කර්මය පිළිබඳ ප්‍රාමාණික විමර්ශනයක් මෙතෙක් සිදු කර නොමැත. ඒ අනුව මෙම පර්යේෂණයේ මූලික අරමුණ ආනන්තරිය පාප කර්ම පිළිබඳ පාලි ත්‍රිපිටක සාහිත්‍ය හා ඊට අනුබද්ධ අටුවා ග්‍රන්ථවල සඳහන් වන ඉගැන්වීම්ද පදනම් කරගනිමින් ආනන්තරිය පාප කර්මයේ ආචාරධර්මීය පසුබිම හා එම කර්මය සිදුකිරීම ඔස්සේ පුද්ගලයාගේ ආධ්‍යාත්මික දියුණුව සිදු වන බලපෑම කුමක්ද යන ගැටලුව පරීක්ෂා කිරීමයි. බුදුදහමේ ඉගැන්වෙන මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදුන්ගේ රුධිරය සෙලවීම හා සංඝභේදය සිදු කිරීම වශයෙන් ආනන්තරිය පාප කර්ම සියල්ල හෝ එකක් හෝ සිදු කළේ නම්, ඔහු හෝ ඇය කටුක වේදනා විඳිමින් සසර දිගු කාලයක් දුක් පීඩාවලට ලක් වන බව බුදුදහමේ දක්වා ඇත. බුදුදහමට අනුව මිනිස් ජීවිතයක් ලැබූ කිසිවෙකු අතින් කවර ආකාරයේ පාප කර්මයක් සචේතනිකව සිදු වුවද, සිදු නොකර ගත යුතු පාප කර්ම පහක් වශයෙන් ආනන්තරිය පාප කර්ම හඳුනාගෙන ඇත. හේතු වශයෙන් බෞද්ධ සම්ප්‍රදාය පෙන්වා දෙන්නේ ආනන්තරිය පාප කර්මවල විපාක ඉතා ප්‍රබල බවත්, එහි විපාක අතරක් නොමැතිව වර්තමාන භවයේ පටන් ඕනෑම අවස්ථාවක විපාක දීමේ හැකියාවක් පවතින බවත්ය. ඒ අනුව අපගේ පර්යේෂණය ඇසුරින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරනු ලැබූ මූලික පර්යේෂණ ගැටලුව නම් පුද්ගලයෙකුගේ සාංසාරික ජීවිතය දිගු කරමින් එම පුද්ගලයාගේ විමුක්ති මාර්ගය ක්‍රමයෙන් ඔහුගෙන් දුරස් කිරීමට ආනන්තරිය පාප කර්මය ප්‍රබල වන්නේ නම් එම ආනන්තරිය පාප කර්මය නියතිවාදී සංකල්පයකට සමීප කළ හැකිද යන්නයි. පර්යේෂණය සඳහා කරුණු පරීක්ෂා කිරීම උදෙසා ගුණාත්මක දත්ත පාදක විධික්‍රමය යොදා ගනු ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණය ඇසුරින් ආනන්තරීය පාප කර්මය හා බැඳි පුද්ගල සදාචාර පරිහානියේ ස්වභාවය ත්‍රිපිටකාගත ඉගැන්වීම් ඇසුරින් සාකච්ඡාවට භාජනය කරන ලදි.

ප්‍රමුඛ පදඃ පියා මැරීම, බුදුන්ගේ රුධිරය සෙලවීම, මව මැරීම, රහතුන් මැරීම, සංඝභේදය

මෙම අධ්‍යයනය සඳහා ඩී. එම්. කේ. ධර්මසිරිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ධම්මපදයෙහි අන්තර්ගත සදාචාරාත්මක ඉගැන්වීම් නූතන සමාජ යහපැවැත්ම සඳහා බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් වග්ග කිහිපයක් ඇසුරින්)

ජී. ජී. ආර්. එල්. ජයසිංහ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20958@gmail.com

මෙම පර්යේෂණය ඇසුරින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ ධම්මපදයෙහි අන්තර්ගත සදාචාරාත්මක ඉගැන්වීම් නූතන සමාජ යහපැවැත්ම සඳහා බලපාන ආකාරය තෝරාගත් වග්ග කිහිපයක සදාචාරාත්මක ඉගැන්වීම් ඇසුරින් කරුණු පරීක්ෂා කරමින්, එම ඉගැන්වීම්වල ඇති ප්‍රායෝගික වටිනාකම් භාවිත කිරීමට මිනිසා හුරු කරවීමයි. එහිදී මූලික වශයෙන් කරුණු අධ්‍යයනය කිරීම සඳහා ධම්මපදයෙහි යමක සහ පකීණ්ණක වග්ග ඇසුරු කර ගනිමින් ඒවායේ අන්තර්ගත සදාචාරාත්මක ඉගැන්වීම් නූතන සමාජ යහපැවැත්ම සඳහා බලපාන ආකාරය නිරීක්ෂණය කරනු ලැබේ. විශේෂයෙන්ම මෙම අධ්‍යයනය සිදුකොට ඇත්තේ ගුණාත්මක දත්ත පාදක පර්යේෂණ ක්‍රමය පදනම් කොට ගෙනය. දත්ත රැස්කිරීම පුස්තකාලය පරිශීලනය යටතේ සිදු කරනු ලැබේ. තවදුරටත් විද්‍යුත් මූලාශ්‍රය භාවිතයෙන්ද දත්ත රැස් කර ගනු ලැබේ. විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමය යොදා ගැනේ. සමාජය යනු අන්තර් පුද්ගල සම්බන්ධතා මත ගොඩනැගුණු සංකීර්ණ පද්ධතියකි. සමාජයේ වෙසෙන පුද්ගලයන්ගේ අන්‍යෝන්‍ය විශ්වාසය, ගෞරවය සහ සහයෝගය බිඳවැටීම නිසා සමාජ යහපැවැත්මට බාධා එල්ල වී සමාජ අපගමන බහුල වී ඇත. එවන් සමාජ අහිතකර තත්ත්ව මගහරවා ගනිමින් යහපත් සමාජයක් නිර්මාණය කිරීම වර්තමානයේ ඇති ප්‍රබල අභියෝගය බවට පත්ව ඇත. ඒ අනුව ධම්මපදයෙහි අන්තර්ගත සදාචාරාත්මක ඉගැන්වීම් නූතන සමාජ යහපැවැත්ම සඳහා බලපාන්නේ කෙසේද යන මූලික පර්යේෂණ ගැටලුව මෙහිදී සාකච්ඡාවට භාජන කොට ඇත. අපගේ මෙම අධ්‍යයනය ඇසුරින් තහවුරු කර ගැනීමට හැකි වූ ආකාරයට සමාජ ගැටලු නිරාකරණය කර, සමාජ යහපැවැත්ම ගොඩනැගීම උදෙසා පුද්ගල දෛනික ක්‍රියාකාරීත්වය සදාචාරාත්මක පරිවර්තනයකට ලක්විය යුතුය. එම සදාචාරාත්මක පරිවර්තනය උදෙසා ධම්මපදයෙහි අන්තර්ගත සදාචාරාත්මක ඉගැන්වීම් පුද්ගල කායික මානසික සංවරය ඇති කිරීම සඳහා ප්‍රායෝගික ජීවන දර්ශනයක් ලෙස මාර්ගෝපදේශය සපයමින් පුද්ගලයා ලෞකික හා ලෝකෝත්තර අරමුණු ජයගන්නා ආකාරය ගැඹුරින් සාකච්ඡාවට භාජන කර ඇත.

ප්‍රමුඛ පද: ධම්මපදය, නූතන සමාජය, යහපැවැත්ම, සදාචාරය, සමාජ ගැටලු

මෙම අධ්‍යයනය සඳහා ඩී. ජී. එස්. එල්. සමරක්කොඩිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

තිරසාර සමාජ සංස්ථාවක් උදෙසා බෞද්ධ ඉගැන්වීම්වල උපයෝගිතාව පිළිබඳ අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් සූත්‍ර කිහිපයක් ඇසුරින්)

තපෝවනයේ ධම්මදීප හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20ai918@arts.pdn.ac.lk

නූතන ලෝකය මුහුණ දී ඇති පාරිසරික, ආර්ථික සහ සමාජීය අර්බුදවලට පිළියම් සෙවීම උදෙසා හඳුන්වා දෙන ලද බටහිර තිරසාර සංවර්ධන සංකල්පවල පවතින භෞතිකවාදී සීමා සහ න්‍යායාත්මක ප්‍රතිවිරෝධතා හේතුවෙන් ගෝලීය අර්බුද තවදුරටත් උග්‍ර වී ඇත. එබැවින්, මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ දීඝ නිකාය සහ අංගුත්තර නිකායවල එන කූටදන්ත, චක්කවත්ති සීහනාද, අග්ගඤ්ඤ, සිඟාලෝවාද සහ ව්‍යග්ඝපජ්ජ යන සූත්‍ර ධර්මවල අන්තර්ගත ඉගැන්වීම් නූතන ප්‍රතිපත්ති සම්පාදනයට ගැළපෙන ප්‍රායෝගික තිරසාර සමාජ ආකෘතියක් ලෙස යොදාගන්නේ කෙසේද යන්න විමර්ශනය කිරීමයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රමය (*Qualitative Method*) යොදාගනිමින්, ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ඉහත සූත්‍ර සහ අට්ඨකථාද, ද්විතීයක මූලාශ්‍රය ලෙස නූතන ශාස්ත්‍රීය ග්‍රන්ථ ද තේමාත්මකව විශ්ලේෂණය කරන ලදි. ආර්ථික වර්ධනය පමණක් අරමුණු කරගත් ධනවාදී ආකෘතිය වෙනුවට, ආර්ථික කාර්යක්ෂමතාව, සමාජ සාධාරණත්වය සහ පාරිසරික සුරක්ෂිතතාව යන ත්‍රිවිධ පදනම මානව සදාචාරය සමග මනාව සමතුලිත කළ බෞද්ධ ආර්ථික දර්ශනයක් පවතින බව පර්යේෂණ සොයාගැනීම් මගින් තහවුරු විය. මධ්‍යම ප්‍රතිපදාව, සම්මා ආජීවය සහ පංච නියාම ධර්ම වැනි බෞද්ධ න්‍යාය ප්‍රායෝගිකව සමාජගත කිරීමෙන් පමණක්, ආත්මාර්ථකාමීත්වය සහ අධි-පරිභෝජනයෙන් තොර වූ, සැබෑ සාමකාමී සහ තිරසාර මානව සමාජයක් ගොඩනැගිය හැකි බව මෙමගින් නිගමනය කරනු ලැබේ.

ප්‍රමුඛ පදඃ තිරසාර සංවර්ධනය, නූතන අර්බුද, බෞද්ධ ආර්ථික දර්ශනය, සමාජ සදාචාරය, සූත්‍ර පිටකය

මෙම අධ්‍යයනය සඳහා පූජ්‍ය ඉන්දරතන හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

පාලි වාක්‍ය වින්‍යාසයේ ව්‍යූහාත්මක හා ක්‍රියාකාරිත්ව හේතු පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් (ත්‍රිපිටකයේ තෝරාගත් කොටස් තුනක් ඇසුරින්)

මාමල්ගහ සුමේධ හිමි
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20ai935@arts.pdn.ac.lk

ථෙරවාද ත්‍රිපිටකය ලියවී ඇති පාලි භාෂාව මධ්‍ය ඉන්දු ආර්ය භාෂා පවුලට අයත් විභක්ති මත පදනම් වන බැවින් සාපේක්ෂව එහි වාක්‍ය වින්‍යාසය නිදහස් ස්වභාවයක් ගනී. එහෙයින් වාක්‍යයේ පද අනුපිළිවෙළ වෙනස්වීම එහි අර්ථය කෙරෙහි බාධා නොවේ. එසේ නම් ත්‍රිපිටකයේ වාක්‍යවල පද අනුපිළිවෙළ සකස්වීමේදී හේතු වූයේ ව්‍යාකරණයද, නැතහොත් එහි භාවිතයද යන්න ගැටලුවකි. මේ පිළිබඳ පර්යේෂණය කළ විල්හෙල්ම් ගයිගර් සහ ඒ. කේ. වෝඩර් වැනි වියතුන් ත්‍රිපිටකයෙහි සම්මත වාක්‍ය වින්‍යාසයක් හඳුනාගත හැකි බව දක්වා ඇති අතර, ඕ. එච්. ද ඩී. විජේසේකර, මාර්ක් ඇලන් සහ අනාලයෝ හිමි වාක්‍ය වින්‍යාසය කෙරෙහි මතකය හා සජ්ඣායනය ආදී මුඛ සම්ප්‍රේෂණ අවශ්‍යතා බලපෑ බව පෙන්වා දෙති. මෙම අධ්‍යයන බොහොමයක්, සූත්‍ර පිටකයට පමණක් සීමා වී ඇති අතර ත්‍රිපිටකය ආශ්‍රයෙන් කරන ලද පර්යේෂණ විරලය. මෙම ව්‍යූහාත්මක හා ක්‍රියාකාරීත්ව හේතු පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනය වැදගත් වන බැවින් එම හිඩැස සම්පූර්ණ කිරීමට විනය පිටකයේ වේරඤ්ජ කණ්ඩයෙනුත්, සූත්‍ර පිටකයේ මූලපරියාය වග්ගයෙනුත්, අභිධර්ම පිටකයේ චිත්තුප්පාද කණ්ඩයෙනුත් තෝරාගත් වාක්‍ය ඇසුරින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණය මෙහෙයවන ලදි. පළමුවෙන්ම තෝරාගත් වාක්‍ය එකිනෙක ගෙන, පදවල ව්‍යාකරණමය සම්බන්ධතාව විමසමින් වාක්‍ය වින්‍යාසය කෙරෙහි ව්‍යාකරණය බලපෑ අයුරු අධ්‍යයනය කරන ලදි. දෙවනුව සන්නිවේදන අවශ්‍යතා සහ මුඛ පරම්පරාගත සම්ප්‍රේෂණ අවශ්‍යතා ආදී ක්‍රියාකාරිත්ව හේතු බලපා ඇති අයුරු විමසන ලදි. එසේම එම වාක්‍යයට අදාළව අටුවා මතද පරීක්ෂා කරන ලදි. තෙවනුව ව්‍යාකරණය සහ ක්‍රියාකාරී හේතු අතරින් කුමක් වඩාත් බලපා ඇතිද යන්න තුලනාත්මකව අධ්‍යයනය කරන ලදි. අවසාන වශයෙන් ඒ ඒ පිටකවල වාක්‍ය වින්‍යාසය අතර වෙනස තුලනාත්මකව අධ්‍යයනය කිරීමද සිදු කරන ලදි. මෙම පර්යේෂණයේදී අනාවරණය වූයේ සූත්‍ර පිටකයේදී සන්නිවේදන අවශ්‍යතාව, මුඛ සම්ප්‍රේෂණය, මතකය සහ සජ්ඣායනය මත වාක්‍ය වින්‍යාසය නම්‍යශීලී වී ඇති බවයි. විනය පිටකයේදී අර්ථයේ නිරවුල් බව පවත්වා ගැනීමේ නෛතික ප්‍රකාශන වාක්‍ය රටාවක් තුළ වාක්‍ය වින්‍යාසය සරලව භාවිත වී ඇත. එසේම අභිධර්ම පිටකය තුළදී නාම-මූලික වාක්‍ය සඳහා ප්‍රමුඛත්වය දෙමින් ඒකාකාරී වාක්‍ය පද පිළිවෙළක් අනුගමනය කර ඇති බව අනාවරණය විය. ඒ අනුව පාලි ත්‍රිපිටකයේ වාක්‍යය වින්‍යාස ව්‍යාකරණ රීති මත ව්‍යූහාත්මකව හැඩගැසුණක් නොව, අදාළ පිටකවල ප්‍රකාශන අරමුණු සහ භාවිත සන්දර්භය මත හැඩගැසී ඇති බව නිගමනය විය.

ප්‍රමුඛ පදඃ ක්‍රියාකාරිත්ව හේතු, ත්‍රිපිටකය, ව්‍යාකරණ, ව්‍යූහාත්මක හේතු, වාක්‍ය වින්‍යාසය

මෙම අධ්‍යයනය සඳහා මුතුකෙලියාවේ ඉන්දරතන හිමිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

PHILOSOPHY



THE ROLE OF THOMAS KUHN IN THE DEVELOPMENT OF SCIENCE: A CRITICAL PERSPECTIVE

A.Vithuya
Department of Philosophy, University of Peradeniya
a20035@arts.pdn.ac.lk

Thomas Kuhn is considered one of the most influential thinkers of the 20th century. His ideas had a major impact on the development of science. He challenged the belief that science progresses in a continuous, linear way by introducing the concept of a paradigm shift. This study critically examines Kuhn's main ideas, their philosophical background, and their contribution to the growth of science. Although many studies have discussed Kuhn's theory of paradigm shifts, this research mainly focuses on how his ideas have influenced the development of modern science. The study addresses the following research problem: What is Thomas Kuhn's role in the development of science, and what are the strengths and limitations of his theory of paradigm shifts? The main objective of this study is to explain Kuhn's contribution to modern scientific development. The research uses descriptive, conceptual, and historical methods. The study finds that Kuhn's idea of scientific revolutions introduced a new and revolutionary way of understanding scientific progress and brought important changes to modern scientific research. His concept of paradigm shifts has influenced not only science but also many other fields, including social sciences, education, technology, and medicine. Finally, the study concludes that although Kuhn's paradigm shift theory has greatly contributed to understanding scientific development, it cannot fully explain the objectivity of science or provide clear standards for why a new paradigm is better than an old one.

Keywords: paradigm, paradigm shift, scientific revolution, modern scientific development

I wish to acknowledge P.M. Jamahir for his guidance and supervision.

A PHILOSOPHICAL INVESTIGATION OF THE INFLUENCE OF SCHOPENHAUER'S AND NIETZSCHE'S CONCEPTIONS ON FREUD'S THOUGHT

I.C. Dewpura Arachchi
Department of Philosophy, University of Peradeniya
imalshadewpuraarachchi@gmail.com

This study examines the influence of Arthur Schopenhauer's and Friedrich Nietzsche's philosophical conceptions of the unconscious on the development of Sigmund Freud's psychoanalytic theory. It explores whether Freud's understanding of the unconscious emerged solely from clinical observation or was significantly shaped by earlier philosophical traditions. A qualitative research approach was adopted, employing philosophical analysis, comparative analysis, intellectual history, and critical hermeneutics. Primary texts analysed in this study include Schopenhauer's *The World as Will and Representation*, Nietzsche's *Beyond Good and Evil* and *On the Genealogy of Morality*, and Freud's *The Interpretation of Dreams* and *The Ego and the Id*. The analysis identifies strong conceptual similarities between Schopenhauer's notion of the irrational and unconscious Will and Freud's concept of the id, as well as between Nietzsche's discussions of repression, sublimation, and unconscious drives, and Freud's psychoanalytic framework. These findings indicate that Freud's theory of the unconscious did not emerge in isolation but was substantially influenced by philosophical ideas developed within nineteenth-century German thought. However, Freud transformed these philosophical concepts into a systematic psychological and clinical framework, giving them new theoretical and practical significance. The study concludes that psychoanalysis is best understood as an interdisciplinary development rooted in both philosophy and psychology, demonstrating the enduring contribution of philosophical thought to the evolution of modern theories of the human mind.

Keywords: Schopenhauer, Nietzsche, Freud, unconscious, psychoanalysis

I wish to acknowledge Jayantha Bogoda for his guidance and supervision.

GENDER IDENTITY AND HUMAN FREEDOM AMONG FEMALE UPCOUNTRY TAMIL TEA PLANTATION WORKERS IN CONTEMPORARY SRI LANKA: A STUDY BASED ON SARTRE'S PHILOSOPHY OF FREEDOM AND RESPONSIBILITY

Danusha Rajamanikkam
Department of Philosophy, University of Peradeniya
a20116@arts.pdn.ac.lk

The female upcountry Tamil tea plantation workers, who have contributed to Sri Lanka's national economy for more than two centuries, have been confined from birth within multiple layers of oppressive identities such as 'plantation worker', 'line-room resident', and 'low-wage earner'. Previous studies have largely portrayed these women merely as economic statistics or as symbols of poverty. In this context, the present study examines the lived experiences of female upcountry Tamil tea plantation workers through the concepts of 'existence precedes essence' and 'freedom and responsibility' proposed by the twentieth-century existentialist philosopher Jean-Paul Sartre, together with his existential view that human beings must create meaning for their own lives in an absurd world. The study raises the question of whether Sartre's radical conception of freedom offers liberation to these women living within the structures of poverty, patriarchy, and socio-cultural constraints, or whether it instead imposes an existential burden upon them. Conceptual analysis, historical analysis, and exposition are employed as the research methodologies. Sartre's 'Being and Nothingness' serves as the primary source, supplemented by primary, secondary, and tertiary data, as well as interviews. The findings of this study reveal that, despite structural constraints, the subtle acts of agency and everyday choices exercised by female upcountry Tamil tea plantation workers transcend the condition of 'Bad Faith' imposed upon them and enable the formation of a new identity grounded in 'Authenticity'. Consequently, this study establishes that female upcountry Tamil tea plantation workers should not be viewed merely as passive victims but rather as autonomous agents who recognise their freedom and responsibility and actively construct meaning in their own lives.

Keywords*:* existentialism, human freedom, female Upcountry Tamil workers, bad faith, authenticity, subjectivity

I wish to acknowledge P.M. Jamahir for his guidance and supervision.

THE REPRESENTATION OF AGEING AS A 'DECLINE NARRATIVE' IN SRI LANKAN TV ADVERTISEMENTS: A PHILOSOPHICAL STUDY WITH REFERENCE TO CRITICAL GERONTOLOGY

S.D.V.D.S. Dissanayake
Department of Philosophy, University of Peradeniya
a20167@arts.pdn.ac.lk

Ageing is a socially constructed and interpreted phenomenon that television advertising portrays in either a positive or negative way, through age-related themes or older and middle-aged characters. This research examines the extent to which Sri Lankan television advertisements represent ageing as either a decline narrative or a progress narrative and investigates whether advertisements contribute to the discrimination of middle-aged and older adults. Primarily, a qualitative approach is used in this study. Both primary and secondary sources are used, where the primary data consist of the selected advertisements themselves, and the secondary data consist of other relevant literature. A simple random sampling method was used to select ads published after 2000, and their analysis was based on critical Gerontology. The selected ads were divided into two categories. The first category of ads consisted of age-related concepts such as physical ageing, life wisdom, and life in retirement. The second category included middle-aged and elderly characters, portrayed either positively or negatively, directly or indirectly. A considerable number of the selected ads portrayed ageing and older, middle-aged characters negatively, presenting the idea that growing old means inevitable physical decline or that visible signs of ageing are sources of embarrassment. They portrayed older characters as easily deceived and mocked them for their physical conditions and lack of familiarity with contemporary trends. The few advertisements that portrayed ageing and older characters positively emphasised the wisdom older adults can share, their ability to live independently and spend their retirement productively using their skills, and their positive reflections on their life experiences. In conclusion, Sri Lankan television advertisements predominantly portray ageing as a narrative of decline by reinforcing the idea that ageing necessarily entails physical and other forms of decline, while some ads portray ageing positively yet simultaneously use ageing as a marketing strategy.

Keywords: ageing, tv advertisements, decline narrative, progress narrative, critical gerontology

I wish to acknowledge Jayantha Bogoda for his guidance and supervision.

A PHILOSOPHICAL APPROACH TO THE CONTRIBUTION OF ARTIFICIAL INTELLIGENCE TO THE SOCIAL SCIENCES

Jeganathan Mithushika
Department of Philosophy, University of Peradeniya
a20295@arts.pdn.ac.lk

The 21st century is known as the era of the digital revolution. During this period, the development of information technology has transformed all aspects of human life. In particular, artificial intelligence (AI) has emerged with the ability to perform human activities through machines. With the development of AI, activities traditionally performed by humans have become automated, changing fields such as social organisation, employment, education, and politics. In particular, the traditional nature of social sciences is changing. Technologies such as AI, machine learning, deep learning, and natural language processing help analyse large amounts of data (Big Data) quickly and accurately; thus, data-driven studies have increased in the social sciences. Human society is constantly changing. In this context, new tools are needed to understand social changes. With the help of AI, issues such as social equality are being studied by analysing human behaviour on social media, monitoring cultural changes, and examining related matters. Thus, artificial intelligence has become an important research tool in the social sciences. Similarly, the global economy is a force that changes a country's politics. Artificial intelligence is working as a force that is changing the global economy. Especially in the economy, increasing technological productivity is automating some jobs and creating new ones. In addition, artificial intelligence plays an important role in the political field, including election monitoring, voter behaviour research, and policy design. Artificial intelligence has also created special applications in education and psychology. Depending on students' abilities, online learning platforms, artificial intelligence instructors, etc., are used. In psychology, they are used to detect human emotions, monitor mood, and study behavioural patterns. The development of artificial intelligence raises fundamental questions in philosophy. That is, does AI think from an epistemological perspective? Is artificial intelligence structured on an ontological basis, and are its results ethical? Such questions encourage us to think deeply about the relationship between humans, machines, and artificial intelligence. Artificial intelligence also contributes to urban planning, healthcare, and conflict resolution by improving data-driven decision-making.

Keywords: artificial intelligence, Social Sciences, Philosophy, epistemology, personalised learning, adaptive assessment.

I wish to acknowledge Mufizal Aboobucker for his guidance and supervision.

THE INFLUENCE OF PLATO'S POLITICAL THOUGHT ON SRI LANKA'S MODERN POLITICAL SYSTEM: A CRITICAL PERSPECTIVE

U. Kamsini
Department of Philosophy, University of Peradeniya
a20303@arts.pdn.ac.lk

Plato's concepts of the "Ideal State" and "Philosopher King" in *The Republic* are foundational models that explain the relationship between knowledge, morality, and political power. This study critically re-reads post-colonial Sri Lanka's political system, particularly the 1972 and 1978 Constitutions and the Executive Presidency, through the lens of Plato's philosophy. It evaluates the extent to which his theories of justice, meritocracy, and moral leadership are reflected in, or depart from, Sri Lanka's governance, and whether they offer solutions to contemporary political crises and low accountability. Using a qualitative method with a theoretical and historical comparative approach, this study analyses Plato's *Republic*, Sri Lankan constitutional laws, amendments, and academic literature. The findings reveal that Plato's philosopher-king theory and Sri Lanka's Executive Presidency share significant similarities regarding the concentration of power. However, contrary to the knowledge-based, moral governance Plato envisioned, Sri Lanka's practical reality features personalised power, heavy political centralisation, and weak institutions. Furthermore, Plato's ideas on elite dominance and class structures conflict with Sri Lanka's pluralistic, multi-ethnic, and democratic society. Ultimately, the study emphasises Plato's timeless insight: good governance cannot rely solely on legal structures; it also requires moral leadership, concern for public welfare, and a responsible civic culture. It concludes that Sri Lanka's political future depends on constitutional reforms that reject Plato's anti-democratic views while successfully integrating merit, morality, and public-centred governance with modern democratic institutions.

Keywords: Plato, ideal state, Philosopher King, Sri Lankan constitution

I wish to acknowledge M. S. M. Anes for his guidance and supervision.

HINDU RELIGIOUS VALUES AND YOUTH MENTAL HEALTH: A STUDY IN THE CONTEMPORARY SOCIAL CONTEXT

T. Kemasalini
Department of Philosophy, University of Peradeniya
a20325@arts.pdn.ac.lk

The current era of globalisation and rapid technological growth has created various socio-psychological challenges among the youth. The Kalmunai region in Eastern Sri Lanka is no exception to this trend. In this context, the primary objective of this study is to explore how traditional Hindu life values and spiritual practices can improve the mental health of young people. The main goals of this research are to identify the contemporary mental health challenges faced by the youth in the Kalmunai region, such as stress, loneliness, and the risks of substance abuse, and to evaluate how Hindu values such as *Purusharthas* (core life goals), *Karma Yoga* (selfless action), and meditation provide the mental resilience to face these challenges. This study is based on a mixed-methods approach, combining both quantitative and qualitative methods. Primary data were collected through questionnaires from 30 Hindu youths within the Kalmunai Divisional Secretariat division. Additionally, interviews were conducted with religious leaders and psychological counsellors. The findings reveal that stress and loneliness have significantly increased among the youth in the Kalmunai region due to the excessive use of social media, the spread of drugs, and economic crises. However, the data clearly show that young people who regularly practice meditation, yoga, and congregational worship (collective prayers) possess a high level of mental peace and positive thinking that help them withstand challenges. In conclusion, this study asserts that Hindu values act as an excellent psychological shield, protecting the mental health of the younger generation, which is being misguided by contemporary challenges. Therefore, this study recommends that temples and spiritual (Araneri) schools in the Kalmunai region should move beyond merely conducting rituals and become mental health and counselling centres for youth.

Keywords: Hindu values, youth mental health, Kalmunai, contemporary challenges, stress management

I wish to acknowledge P. M. Jamahir for his guidance and supervision.

S.V. KASINATHAN'S CONTRIBUTION TO UNDERSTANDING LATER WITTGENSTEIN: ANALYSIS OF HIS WORK, 'WITTGENSTEIN': LANGUAGE, MEANING, AND MIND

Pirabalini Pirabakaran
Department of Philosophy, University of Peradeniya.
a20505@arts.pdn.ac.lk

S. V. Kasinathan is a significant figure among those who introduced Western philosophical thoughts to the Tamil intellectual sphere. Although his book *Wittgenstein: Language, Meaning, Mind* stands as a pivotal work explaining Wittgenstein's later philosophy, a systematic and analytical study of its specific contribution to understanding Wittgenstein has not been undertaken until now. The primary objective of this study was to examine Wittgenstein's later thoughts on language, meaning, and mind. Furthermore, it critically and analytically approached S. V. Kasinathan's book, determined the extent to which it accurately reflected Wittgenstein's original ideas, and evaluated its overall philosophical contribution. This research was based on a qualitative methodology. Wittgenstein's *Philosophical Investigations* and *The Blue and Brown Books* were utilised as primary sources, while Kasinathan's text and other philosophers' works served as secondary sources. In addition to textual analysis, the interview method was employed for data collection, and the data were analysed using comparative and critical research methods. While Wittgenstein's ideas have been extensively researched in Western philosophy, studies of analytic philosophy and Wittgenstein's later thought remain extremely scarce in the Tamil context. This study found that S.V. Kasinathan's book bridges a crucial research gap in the Tamil philosophical landscape by accurately explaining complex concepts such as Wittgenstein's 'rule-following' and 'private language' in Tamil. This study concluded that S.V. Kasinathan's book makes a highly significant academic contribution to a comprehensive and in-depth understanding of Later Wittgenstein's philosophical thought in Tamil. This work serves as a foundation for further extensive research in analytic philosophy in Tamil.

Keywords: Wittgenstein, Kasinathan, language, meaning, mind

I wish to acknowledge M. S. M. Anes for his guidance and supervision.

A CRITICAL REVIEW OF THE CONTEMPORARY RELEVANCE OF K.N. JAYATILLEKE'S BUDDHIST PHILOSOPHICAL ANALYSIS OF WORLD PEACE

Rev. Wanduramba Suseela
Department of Philosophy, University of Peradeniya
a20617@arts.pdn.ac.lk

This study explores how K.N. Jayatilleke's Buddhist ideas on world peace. Currently, global peace faces a severe crisis due to structural flaws in organisations like the UN, selfish power struggles and violence. Therefore, the main research problem of this study is whether Jayatilleke's Buddhist approach to international law can practically work in the modern world. Using a qualitative method, the research analyses his writings, primary Buddhist texts and international agreements. By adopting a Buddhist perspective, it critiques Western and Kautilyan political realism, weighing the value and real-world limits of applying his ideas to international humanitarian law and crisis management. A key focus in this study is *Dhammādhipateyya*, which places universal morality above a nation's absolute power to counter traditional power politics. The research also investigates the psychological roots of war, such as greed (*lobha*), hatred (*dosa*), delusion (*moha*), and stubbornly clinging to personal views *(Diṭṭhi Upādāna),* as well as socio-economic issues like poverty. Importantly, the paper re-imagines the Five Precepts *(Pañcasīla)* as a strong ethical guide for international relations and suggests Buddhist moderation to resolve extreme political divides. It presents the *Cakkavattī*ideal and the Seven Conditions of Welfare as democratic alternatives to the UN Security Council's flawed veto system. The findings reveal that Jayatilleke's philosophy acts as a profound moral guide for international law. While practical implementation faces realistic challenges because law enforcement requires hard power, military dominance remains widespread, and powerful nations constantly crave more power *(Bhava Taṇhā)*, these hurdles do not invalidate its normative value. Despite these hurdles, his framework is not just an unrealistic religious theory. It provides a solid foundation for global governance based on human rights, economic fairness and non-violent diplomacy, making it an essential legal approach for the 21st century.

Keywords: Dhammādhipateyya, global governance, international law, Pañcasīla, world peace

I wish to acknowledge Namali Kumari Handegama for her guidance and supervision.

THE IMPACT OF MOVIES ON THE ARTISTIC INTERESTS OF YOUNG PEOPLE: A STUDY BASED ON THE VAVUNIYA DIVISIONAL SECRETARIAT DIVISION

T. Nitharshana
Department of Philosophy, University of Peradeniya
a20787@arts.pdn.ac.lk

In the modern globalised environment, the media plays a crucial role in shaping human lifestyles and cultural choices. Among various forms of media, movies, as both an art form and a mass medium, exert a profound influence on the thoughts, preferences, and artistic behaviours of the younger generation, who are considered the driving force of society. This study primarily analyses in detail how movies influence the artistic interests, choices, and engagement of youth in the Vavuniya Divisional Secretariat Division, a region that is currently undergoing post-war social, economic, and cultural reconstruction. This study employed a mixed-methods approach, combining both qualitative and quantitative research methods. Primary data were systematically collected and analysed through questionnaires and interviews using a random sampling method among youth aged 18 to 29 years residing in the Vavuniya area. The findings reveal that movies play a leading role in the daily artistic consumption and entertainment choices of youth in the Vavuniya region. Specifically, commercial South Indian cinema has significantly influenced their clothing styles, hairstyles, spoken language, and music preferences. Furthermore, the study found that the growing interest among youth in artistic fields such as dance, drama, short filmmaking, cinematography, and video editing is strongly inspired by cinema's visual aesthetics and technological advancements. However, the influence of movies has both positive and negative dimensions. On the one hand, movies encourage artistic creativity, the development of media technology skills, and greater awareness of global arts among youth. On the other hand, they have contributed to the emergence of a strong hero-worship culture and a noticeable decline in interest in local traditional art forms among the youth of Vavuniya. In conclusion, this study strongly recommends establishing appropriate guidance and formal platforms for film education in the Vavuniya region. Such initiatives would help channel the influence of movies in a constructive direction, foster the creative talents of youth, and safeguard local cultural values.

Keywords**:** movie impact, youth, artistic interests, visual aesthetics, creative talents

I wish to acknowledge P.M. Jamahir for his guidance and supervision.

ETHICAL ISSUES CAUSED BY SCHOOL DROPOUTS AMONG YOUTH: A PHILOSOPHICAL STUDY BASED ON THE MARUTHANKERNEE DIVISIONAL SECRETARIAT, JAFFNA

R. Thulasy
Department of Philosophy, University of Peradeniya
a20789@arts.pdn.ac.lk

Formal education plays an indispensable role in shaping the noble moral values of human life and fostering social responsibility. In this context, the primary objective of this study was to philosophically analyse school dropout rates and the resulting ethical issues among marginalised youth within the Maruthankenee Divisional Secretariat of the Jaffna District. A qualitative research methodology was adopted for this study. Data, comprising both primary and secondary sources, were analysed using ethical theories in philosophy. The study reveals that poverty in the Maruthankenee region, the attraction of temporary livelihoods in the fishing industry, post-war social challenges, and a lack of awareness, along with the increasing number of immature early marriages, serve as the primary reasons for school dropouts. From a philosophical perspective, when youth discontinue their education, they fail to undergo proper socialisation, leading to a deterioration in their virtue ethics. According to this study's findings, mere law enforcement is insufficient to support the moral development and educational continuity of youth in the Maruthankenee region. It was recommended that integrated counselling and guidance from governmental and non-governmental organisations, social awareness against early marriages, and ethical education systems that improve livelihoods are essential. This study emphasises that a moral social structure can be rebuilt in this region only by protecting the educational rights of the youth.

Keywords: school dropout, ethical issues, Maruthankenee, early marriage, philosophical study

I wish to acknowledge Mufizal Aboobucker for his guidance and supervision.

A PHILOSOPHICAL INQUIRY ABOUT THE IMPACT OF LOCKDOWN DURING THE COVID - 19 PANDEMIC ON NEW TRENDS IN SRI LANKAN MUSIC

W.G.S.S. Wijenayaka
Department of Philosophy, University of Peradeniya
a20848@arts.pdn.ac.lk

The COVID-19 pandemic lockdowns exerted a profound ontological pressure on society's cultural fabric, disrupting established aesthetic paradigms and shifting the Sri Lankan music industry away from formal, traditional values. While existing literature extensively examines the economic and social disruptions of the global crisis, this study addresses a significant academic gap by offering a targeted philosophical analysis of the pandemic's deep aesthetic and structural impact on local artistic expression. Employing a qualitative research design grounded in a comparative analysis framework, this study gathered data from a diverse array of primary and secondary sources, including academic literature, online multimedia content, and qualitative interviews with industry experts. The investigation chronologically charts the musical evolution across the pre-pandemic, mid-pandemic, and post-pandemic eras (beginning from 2015) to track technical, creative, and thematic mutations. The findings reveal that physical isolation and institutional lockdowns forced an unprecedented reliance on digital spaces, turning online platforms into primary sites for both musical creation and aesthetic consumption. This digital migration fundamentally reshaped creative methodologies, altering lyricism, arrangement, and production values to mirror collective anxieties, resilience, and resistance. Ultimately, the study concludes that these changes represent a permanent, long-term transformation in audience tastes and interpretative frameworks rather than a transient phase. This research provides a foundational documentation of contemporary Sri Lankan cultural history, demonstrating how structural crises fundamentally recalibrate artistic meaning and societal aesthetic standards.

Keywords: ontological, social disruptions, lockdowns, crisis, chronological

I wish to acknowledge Jayantha Bogoda for his guidance and supervision.

මානව ස්වච්ඡන්දතාවඃ කෘත්‍රිම බුද්ධියේ වර්ධනයට සාපේක්ෂව ස්වච්ඡන්දතාවට එල්ල විය හැකි බලපෑම් පිළිබඳ දාර්ශනික විමසුමක්

ආර්. ඩබ්. එම්. පී. ජී. සී. යූ. බණ්ඩාර
දර්ශන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20081@arts.pdn.ac.lk

නව තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුව මානව ජීවියාට එල්ල කරන්නා වූ අභියෝග සුළුපටු නොවෙයි. මිනිසාගේ අද්විතීය තාර්කික ශක්තීන් ජයගැනීමට සමත් 'බුද්ධිය' කාවද්දන ලද යන්ත්‍ර පිළිබඳ ක්ෂේත්‍රය ආවරණය කරමින් කෘත්‍රිම බුද්ධියේ නැඟිසිටීම එහි සුවිශේෂ සංධිස්ථානයකි. කෘත්‍රිම බුද්ධියේ වර්ධනයත් සමඟින් මානවයන්ගේ නිර්මාණශීලීත්වය, සහකම්පනය සහ මානව හරයන් සියල්ල වේගවත් ගණනය කිරීම් සහ යාන්ත්‍රික දත්ත සමූහයක් හමුවේ සාධාරණීයකරණය කර ගැනීමේ අවශ්‍යතාව මතු වෙමින් පවතියි. එවන් පසුබිමක කෘත්‍රිම බුද්ධියත් සමඟ නිරන්තර ගනුදෙනුවේ යෙදෙන වත්මන් මානවයින්ගේ ස්වච්ඡන්දතාව සීමා විය හැක්කේ කෙසේ ද යන ගැටලුව මත මෙම පර්යේෂණය පදනම් විය. මෙහි දී ස්වච්ඡන්දතාව සහ නියතිවාද යන දාර්ශනික විවාදය තාක්ෂණික රාමුවක් තුළට රැගෙන, කෘත්‍රිම බුද්ධිය හමුවේ මිනිසාගේ ස්වයංනීර්ණය සහ ගෞරවය පවත්වා ගැනීමේ අවශ්‍යතාව සදාචාරාත්මක සීමාවක් තුළ පැහැදිලි කිරීම පර්යේෂණයේ මූලික අරමුණ විය. උක්ත අරමුණු සාධනය කර ගැනීමට ගුණාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලද අතර මෙය මාර්ටින් හයිඩෙගර්, යූගර් හබර්මාස් සහ යුවාල් නෝආ හරාරීගේ දාර්ශනික විශ්ලේෂණ මත පදනම් වේ. මෙම අධ්‍යයනයෙන් මූලිකව ම අනාවරණය කරගනු ලැබුවේ මිනිසුන් ලෝකය දෙස බලන සෞන්දර්යයාත්මක, විචාරාත්මක, සහ තර්කානුකූල දෘෂ්ටින්ගෙන් ක්‍රමයෙන් ඉවත්ව යන ආකාරයත් දෙයක් මැනීමට, ගණනය කිරීමට සහ කිසියම් දෙයකින් උපරිම ඵලදායීතාවක් ලබා ගත හැකි චින්තන රාමුවකට කොටු වෙමින් පවතින ආකාරයත් ය. තවද මෙමගින් කෘත්‍රිම බුද්ධිය විවිධ මානව ක්ෂේත්‍රයන්හී තීරණ ගැනීම්, හැසිරීම් පිළිබඳ අනාවැකි ඉදිරිපත් කිරීම් සහ ක්‍රියාමාර්ග මාර්ගෝපදේශ කිරීම් ඔස්සේ මානව තීරණ ගැනීමේ ක්‍රියාවලියට ද බලපෑම් සිදු කරමින් පවතින ආකාරයක් හඳුනා ගැනීමට හැකි විය. සමස්තයක් ලෙස කෘත්‍රිම බුද්ධියේ වර්ධනය සහ පාලනයකින් තොර භාවිතය මානව ස්වච්ඡන්දතාවට අනාගතයේ දැඩි අභියෝගයක් විය හැකි බව පැහැදිලි විය. එබැවින් කෘත්‍රිම බුද්ධිය ආචාරධාර්මික මාර්ගෝපදේශ යටතේ මානව පාලනය තහවුරු කරමින් සමතුලිතව කළමනාකරණය කර ගැනීමේ වැදගත්කම මෙම පර්යේෂණය මගින් නිගමනය කෙරුණි.

ප්‍රමුඛ පදඃ කාර්මික විප්ලවය, කෘත්‍රිම බුද්ධිය, තාක්ෂණික නියතිවාදය, මානුෂවාදය, ස්වච්ඡන්දතාව

මෙම අධ්‍යයනය සඳහා සුමේධ වීරවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

කෘත්‍රිම බුද්ධි ක්ෂේත්‍රයේ වර්ධනය සහ අනාගත අභියෝග : රැකියා ක්ෂේත්‍රයට සිදුවන සදාචාරාත්මක බලපෑම පිළිබඳ දාර්ශනික විමර්ශනයක්

වී.ටී.එම්.ධනංජනී
දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20114@arts.pdn.ac.lk

දහඅටවන සියවසේ ආරම්භ වූ තාක්ෂණික විප්ලවය ශීඝ්‍ර ලෙස සංවර්ධනය වී ඇත. විසි එක්වන සියවස වන විට කෘතිම බුද්ධිය එහි පෙරගමන්කරුවා බවට පත්වී ඇත. මුල් කාලයේ යන්ත්‍රසූත්‍ර භෞතික ශ්‍රමයට ආදේශක වූ අතර නුදුරු දිනකදී බුද්ධිමය ශ්‍රමයට කෘත්‍රිම බුද්ධිය ආදේශකයක් වනු ඇත. කෘත්‍රිම බුද්ධි තාක්ෂණයේ වර්ධනය ඔස්සේ අනාගත අභියෝග ගණනාවක් නිර්මාණය වී ඇත. එම අභියෝග අතරින් රැකියා ක්ෂේත්‍රයට සිදුවන සදාචාරාත්මක බලපෑම පිළිබඳ දාර්ශනික විමර්ශනයක් මෙම පර්යේෂණය මඟින් සිදුකර ඇත. කෘත්‍රිම බුද්ධිය රැකියා ක්ෂේත්‍රයට සදාචාරාත්මක අභියෝගයක් වන්නේ ද? යන පර්යේෂණ ගැටලුව යටතේ කාල් මාක්ස් කාර්මික විප්ලවයේදී යන්ත්‍රෝපකරණ මඟින් මිනිස් ශ්‍රමය ප්‍රතිස්ථාපනය වීම සහ ශ්‍රමිකයා පරදෙස්කරණයට ලක්වීම පිළිබඳ ඉදිරිපත් කළ දාර්ශනික විවේචන විමර්ශනය කරමින්, විසිඑක්වන සියවසේ ගෝලීය වශයෙන් සමාජීය, ආර්ථික හා දේශපාලනික සංස්ථාවන් ඩිජිටල්කරණය වන පසුබිමක රැකියා ක්ෂේත්‍රයට කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ වීමෙන් සාම්ප්‍රදායික රැකියා අහිමිවීම සහ නව රැකියා අවස්ථා හිමි වීම, මිනිස් ශ්‍රමයේ වටිනාකම, අභිමානය සහ ආත්ම ගරුත්වය අභියෝගයට ලක්වීම, තාක්ෂණික ක්ෂේත්‍රයේ හිමිකාරීත්වය සහිත සුළු පිරිස සහ සාමාන්‍ය ශ්‍රමික ප්‍රජාව අතර නිර්මාණය වන ආර්ථික අසමානතාව, තීරණ ගැනීමේදී කෘතිම බුද්ධි පද්ධතියේ මානුෂීය හැඟීම් නොතිබීම සහ විරැකියාව ඔස්සේ මිනිසා සිය ජීවිතයේ මුහුණ දෙන සදාචාරාත්මක අභියෝග පිළිබඳව විමර්ශනය කිරීම අරමුණු වේ. යථෝක්ත කරුණු සාධනය කර ගැනීම සඳහා ගුණාත්මක පර්යේෂණ දත්ත ක්‍රමය භාවිත කරමින් පුස්තකාල, අන්තර්ජාල පරිශීලනයෙන් ලබාගන්නා ලද තොරතුරු ඔස්සේ දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. මෙම පර්යේෂණය මඟින් අනාවරණය වූයේ කෘත්‍රිම බුද්ධිය රැකියා ක්ෂේත්‍රයට සදාචාරාත්මක බලපෑමක් සිදුකරන අතර විරැකියාවෙන් සාධාරණත්වය බිඳවැටී ධනවත් පිරිසක් හා සාමාන්‍ය ශ්‍රමික පිරිස අතර පරතරය පුළුල් වන බවයි. රැකියා ස්ථානයේ තීරණ ගැනීමේ බලය කෘත්‍රිම බුද්ධියට පැවරීම ඔස්සේ සාමාන්‍ය ශ්‍රමිකයාගේ ස්වාධීනත්වය, ගරුත්වය අහිමිවීම සිදුවේ. කෘත්‍රිම බුද්ධිය මගින් කාර්යක්ෂමතාව ඉහළ නැංවුවද නව සදාචාරාත්මක රාමුවක් යටතේ අනාගත රැකියා වෙළඳපොළ සුරැකීම සඳහා තාක්ෂණය සෑම විටම මිනිසාට යටත්ව, මානව කේන්ද්‍රීය සදාචාරාත්මක රාමුවක, ජාත්‍යන්තර මට්ටමින් ප්‍රතිපත්ති, මූලධර්ම යටතේ කෘත්‍රිම බුද්ධි තාක්ෂණය රැකියා ක්ෂේත්‍රයට ඵලදායි ලෙස යොදා ගතයුතු බව අවධාරණය විය.

ප්‍රමුඛ පදඃ කෘත්‍රිම බුද්ධිය, තාක්ෂණික විප්ලවය, සදාචාරාත්මක අභියෝග, කාල් මාක්ස්, රැකියා ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනය සඳහා සුමේධ වීරවර්ධනගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදී සංකල්පය සිනමාරූපීකරණය: ''අහස් ගව්ව" සහ ''බඹරු ඇවිත්" සිනමා නිර්මාණ ඇසුරෙන් කෙරෙන දාර්ශනික විමර්ශනයක්

එම්.ජී.අයි. දිල්හාරා
දර්ශන අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20142@arts.pdn.ac.lk

සිනමාව යනු විනෝදාස්වාද මාධ්‍යයක් පමණක් නොව සමාජයේ පවතින ද්‍රව්‍යමය යථාර්ථයන් සහ දෘෂ්ටිවාදයන් ප්‍රතිනිර්මාණය කරන ප්‍රබල ප්‍රකාශනයකි. මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදය මගින් සමාජ විකාශනය සහ විඥානය තීරණයට ආර්ථික හා භෞතික සාධකයන්ගේ බලපෑම පැහැදිලි කරයි. ලාංකික සිනමාවේ සංධිස්ථාන සනිටුහන් කළ ''අහස් ගව්ව" (1974), ''බඹරු ඇවිත්" (1978) සිනමාපට ද්විත්වය මෙහිදී ප්‍රධාන වේ. පර්යේෂණයේ මූලික පර්යේෂණ ගැටලු වන්නේ, දාර්ශනික න්‍යායයක් ප්‍රායෝගිකව කලා නිර්මාණයක් තුළින් දැක්විය හැකිද? සහ මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදී සංකල්පය සිනමාරූපී ප්‍රකාශනයක් ලෙස ප්‍රතිනිර්මාණය වී ඇත්තේ කෙසේද? යන ඒවාය. පර්යේෂණයේදී අරමුණු කරන්නේ, සිනමාව හුදු කලාවක් පමණක් නොව මතවාදී මෙවලමක් ලෙස හඳුනාගැනීම සහ හැත්තෑව දශකය මෙන්ම නූතන ලාංකීය සමාජයේ සමාජ ආර්ථික අර්බුද ඉදිරිපත් වන සිනමා ප්‍රකාශන හරහා ලාංකීය සමාජය මාක්ස්ගේ දර්ශනය කියවා ගන්නා ආකාරය දාර්ශනිකව අධ්‍යයනය කිරීමයි. මෙය ගුණාත්මක පර්යේෂණයකි. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර මගින් ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කරමින් විචාරාත්මකව හා තුලනාත්මකව විග්‍රහ කරමින් පර්යේෂණය සිදුවේ. හැත්තෑව දශකයේ ලාංකීය නාගරික තාරුණ්‍යය මුහුණ දුන් රැකියා විරහිතභාවයත්, ආර්ථික පීඩනයත්, ඒ හරහා ගොඩනැගෙන පංති අරගලකාරී ස්වභාවයත් ''අහස් ගව්ව" සිනමා පටය හරහා පෙන්වයි. ධීවර ජනාවාස ආශ්‍රිතව ගොඩනැගුණු පංති අරගලය, ධනේශ්වර සූරාකෑම සහ ධනපතියාට එරෙහි නිර්ධනයන්ගේ නැගී සිටීම ''බඹරු ඇවිත්" සිනමා පටය හරහා පෙන්වා දී ඇත. එහිදී මාක්ස්ගේ ඓතිහාසික භෞතිකවාදී දර්ශනය ඉතා සාර්ථකව ප්‍රායෝගික ලෝකයේ පවතින ආකාරය මෙම සිනමාපට හරහා ගෙනහැර ඇති බව පැහැදිලි විය. මෙම නිර්මාණ හුදු ආර්ථික විග්‍රහයකට සීමා නොවී පීඩිත පංතියේ ආචාර විද්‍යාත්මක ගැටලු සහ දාර්ශනික මනෝවිද්‍යාත්මක මානයන්ද ඉතා සියුම්ව ස්පර්ශ කර ඇති බව හඳුනාගත හැකි විය. පතිරාජයන්ගේ සිනමාවේ එන භෞතිකවාදී ප්‍රවේශය වර්තමාන ලාංකීය සමාජ - ආර්ථික අර්බුද, දේශපාලන කැළඹීම් නිරූපණය කරන මෑත කාලීන සිනමා නිර්මාණ සමඟද සංසන්දනාත්මකව විමසා බලන ලදී. එහිදී පැහැදිලි වූයේ අතීතයේ මෙන්ම වර්තමානයේ දේශපාලන - සමාජීය අර්බුද සිනමාරූප හරහා එළිදැක්වීමේදී ද්‍රව්‍යමය පදනම, පංතිමය සාධක බලපාන බවය. අවසාන වශයෙන් නිගමනය කළ හැක්කේ, දර්ශනයක් සිනමාව තුළින් සාර්ථකව නිරූපණය කළ හැකි බවත්, පතිරාජයන්ගේ සිනමාව එකල මෙන්ම මෙකල සමාජ ව්‍යුහය සහ ඓතිහාසික පරිණාමය භෞතිකවාදී දෘෂ්ටිකෝණයකින් ප්‍රශ්න කිරීමට මගපෙන්වන සැබෑ දාර්ශනික මැදිහත්වීමක් බවත්ය.

ප්‍රමුඛ පද: ඓයිතිහාසික භෞතිකවාදය, පංති අරගලය, සිනමාරූපීකරණය

මෙම අධ්‍යයනය සඳහා සෙව්වන්දි සමදරාගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

යථානුභූතවාදය : ඔගස්ට් කොම්තේ, අර්නස්ට් මහ් හා තාර්කික යථානුභූතවාදය අතර තුලනාත්මක දාර්ශනික විග්‍රහයක්.

ජේ. එම්. එන්. ලක්ෂිකා.
දර්ශන දෙපාර්තමේන්තුව, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20379@arts.pdn.ac.lk

යථානුභූතවාදය නමැති විධික්‍රමවේදයෙන් ගම්‍ය වන මුඛ්‍ය තර්කණය වන්නේ, ස්වාභාවික විද්‍යාවන් තුළ යොදා ගැනෙන ආනුභූතික විධික්‍රමය සමාජ විද්‍යාවන්ට ද යොදා ගත හැකිය හා යුතුය යන්නයි. මෙම පර්යේෂණය මගින් ඔගස්ට් කොම්තේගේ සමාජ යථානුභූතවාදය, අර්නස්ට් මහ්ගේ ආනුභූතික විචාරවාදය සහ තාර්කික යථානුභූතවාදය විද්‍යාව පිළිබඳ දරන ආකල්පය, දැනුමේ මූලාශ්‍ර සහ පාරභෞතිකය ප්‍රතික්ෂේප කිරීමේ ක්‍රමවේදයන් අතර පවතින සන්සන්දනාත්මක වෙනස්කම් සහ අඛණ්ඩතාවයන් කවරේ ද යන්න තුලනාත්මකව අධ්‍යයනය කරයි. යථානුභූතවාදී සම්ප්‍රදාය යනු බටහිර විද්‍යා දර්ශනය හැඩගැස් වූ, ඓතිහාසිකව විවිධාංගීකරණය වූ, සංකල්පීය ධාරාවන්ගෙන් සහ අභ්‍යන්තර ආතතීන්ගෙන් සමන්විත ව්‍යාපාරයක් බව මෙම අධ්‍යයනය මඟින් තර්ක කෙරේ. මෙම පර්යේෂණය ගුණාත්මක ප්‍රවේශයක් ගන්නා අතර මූලික වශයෙන්ම ප්‍රාථමික සහ ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය අරමුණු කර ගත් තුලනාත්මක දාර්ශනික පර්යේෂණයකි. එමෙන්ම ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර ඔස්සේ රැස් කර ගන්නා තොරතුරු තුලනාත්මක දත්ත විශ්ලේෂණ විධික්‍රමය සහ සන්දර්භීය කියවීම හරහා අධ්‍යයනය කරන ලදි. කොම්තේ විද්‍යාව සහ ඥාන විකාශනය ඓතිහාසික-සමාජයීය ප්‍රගමන රාමුවක් තුළ ව්‍යුහගත කරන විට, මහ් විසින් භෞතික විද්‍යාවේ පවතින නිරපේක්ෂ සංකල්පීය පූර්ව නිගමන දාර්ශනික විවේචනයකට ලක් කරමින් විද්‍යාව යනු සංවේදනයන් ක්‍රමවත් කරන චින්තනමය ආර්ථිකයක් ලෙස මනෝ-භෞතිකවාදීව අර්ථ දක්වයි. අනෙක් අතට, තාර්කික යථානුභූතවාදීන් මෙම සම්ප්‍රදාය භාෂාත්මක සහ තර්ක ශාස්ත්‍රීය විශ්ලේෂණයක් දක්වා පරිවර්තනය කරමින්, සත්‍යාපන මූලධර්මය හරහා පාරභෞතික ප්‍රකාශන සංකල්පීය වශයෙන් අර්ථශූන්‍ය බව පෙන්වා දෙයි. මෙම න්‍යාය පද්ධතීන් ත්‍රිත්වයම අත්දැකීම්වාදී පදනමක පිහිටියද, පාරභෞතිකය ප්‍රතික්ෂේප කිරීමේ දාර්ශනික උපායමාර්ගය පිළිවෙළින් ඓතිහාසික-සමාජයීය, මනෝ-භෞතිකයේ සිට භාෂාත්මක තර්කයක් දක්වා පරිණාමයකට පත්ව ඇති බව දක්නට ලැබේ. මෙම සංසන්දනාත්මක ප්‍රවේශය මගින් යථානුභූතවාදී සම්ප්‍රදායේ අභ්‍යන්තර න්‍යායික සීමාවන් මෙන්ම සමකාලීන විද්‍යා දර්ශනය කෙරෙහි එහි පවතින සුසමාදර්ශීය බලපෑමද මැනවින් අනාවරණය කරයි.

ප්‍රමුඛ පද: යථානුභූතවාදය, ආනුභූතික විචාරවාදය, තාර්කික යථානුභූතවාදය, පාරභෞතිකය, චින්තනමය ආර්ථිකය

මෙම අධ්‍යනය සඳහා ජයන්ත බෝගොඩගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අපරාධකරුවන් සෞන්දර්යාත්මක කිරීම තුළින් යෞවන පරපුරට සිදුවන ආචාර ධාර්මික බලපෑම : මිෂෙල් ෆූකෝගේ දර්ශනය ඇසුරින්

එච්. පී. ජී. එම්. පතිරණ
දර්ශන අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20491@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය හා පෞද්ගලික ජනමාධ්‍ය අතර පවතින දැඩි තරගකාරීත්වය සහ වෙළෙඳපොළ ලාභය මුල් කරගත් වාර්තාකරණ ප්‍රවණතා හේතුවෙන්, අපරාධ වාර්තාකරණය සංවේගාත්මක ලෙස ඉදිරිපත් කරමින් අපරාධකරු වීරත්වයෙන් යුතුව සෞන්දර්යාත්මක ව නිරූපණය කිරීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. මෙකී පසුබිම තුළ මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මාධ්‍ය මගින් අපරාධකරු සෞන්දර්යාත්මක කිරීම තුළින් වයස අවුරුදු 16-30 අතර වන යෞවන පරපුරේ ආචාරධාර්මික අවබෝධය කෙරෙහි සිදුවන බලපෑම ප්‍රංශ දාර්ශනික මිෂෙල් ෆූකෝගේ දර්ශනය ඇසුරින් විවේචනාත්මක ව විමර්ශනය කිරීමයි. මීට අමතරව ලාංකේය මාධ්‍ය ව්‍යුහය හඳුනා ගැනීම සහ අපරාධකරු සෞන්දර්යාත්මක කිරීමට ගන්නා විශේෂ උපක්‍රම හඳුනා ගැනීම ද මෙහි සෙසු අරමුණු වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස මුද්‍රිත පුවත්පත්, ගුවන්විදුලි සහ රූපවාහිනී මාධ්‍ය ඔස්සේ පළ වූ අපරාධ වාර්තාකරණයන් සන්දර්භ විශ්ලේෂණයට ලක් කරමින් ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍ර ඇසුරින් සිදු කළ ගුණාත්මක දාර්ශනික විමර්ශන ප්‍රවේශයක් භාවිත කර ඇත. අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව ජනමාධ්‍ය සතු බලය හා දැනුම (Power and Knowledge) අතර සබඳතාව මගින් ගොඩනගන මාධ්‍ය කතිකාව (Discourse) හරහා යෞවනයන් තුළ අපරාධ ක්‍රියාවන් සාමාන්‍යකරණය වීම, වගකීම් විරහිත වීම හා නීතිය පිළිබඳ අවබෝධය දුර්වල වීම සිදු වේ. තව ද නාට්‍යමය ශීර්ෂ පාඨ, පසුබිම් සංගීතය හා කෘත්‍රිම බුද්ධි (AI) වීඩියෝ මගින් අපරාධකරු ආකර්ෂණීය කිරීම නිසාත්, අපරාධකරුවන්ගේ අනන්‍යතාව හෙළි කිරීම නිසාත් යෞවනයන් ඔවුන් ව අනුකරණය කිරීමට පෙළඹේ. මෙහි දී ඇල්බට් බන්ධුරාගේ සමාජ ඉගෙනුම් න්‍යාය හා සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝ විශ්ලේෂණ වාදය උපයෝගී විය. මෙම පර්යේෂණය මගින් නිගමනය කරනු ලබන්නේ අපරාධකරුවා සෞන්දර්යාත්මක කිරීම යෞවන පරපුරේ සදාචාරාත්මක පරිහානියට සෘජුව ම දායක වන බැවින්, මාධ්‍ය නිදහස සුරකිමින් මාධ්‍ය ආචාරධර්ම, නීති රීති හා සමාජ වගකීම් දැඩි ලෙස ප්‍රායෝගික ව තහවුරු කළ යුතු බවත්, යෞවනයන් තුළ විවේචනාත්මක මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීම අත්‍යවශ්‍ය බවත් ය.

ප්‍රමුඛ පද: අපරාධකරු, ජනමාධ්‍ය, මිෂෙල් ෆූකෝ, යෞවන පරපුර, සෞන්දර්යාත්මක කිරීම

මෙම අධ්‍යයනය සඳහා සෙව්වන්දි සමදරා හේවාවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන පරිභෝජනවාදය සහ පුද්ගල තෘප්තියඃ මුල් බුදුසමය ඇසුරෙන් කෙරෙන දාර්ශනික විමර්ශනයක්

පූජ්‍ය නාගහකන්දේ අමිතවංශ හිමි
දර්ශනය අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20597@arts.pdn.ac.lk

නූතන මානව ශිෂ්ටාචාරය විද්‍යාත්මක හා තාක්ෂණික වශයෙන් භෞතික සංවර්ධනයේ ඉහළම තලයට ළඟා වී සිටියද, ආධ්‍යාත්මික හා මානසික වශයෙන් නූතන මිනිසා පෙර නොවූවිරූ තරමේ ගැඹුරු අසහනයකට සහ හුදෙකලාභාවයකට මුහුණ දී සිටී. විශේෂයෙන්ම ධනවාදී සංස්කෘතික ආධිපත්‍යය මත පදනම් වූ නූතන පරිභෝජනවාදය විසින් භෞතික සම්පත් අසීමිතව සමුච්චය කිරීම යනු මිනිස් සතුටේ පරම නිෂ්ටාව ලෙස නිර්වචනය කරමින්, මිනිසා තුළ කෘත්‍රිම ආශාවන් සහ සදාකාලික අතෘප්තියක් අඛණ්ඩව නිෂ්පාදනය කරනු ලබයි. මෙම පර්යේෂණය මගින් මූලික වශයෙන් විමර්ශනය කරනු ලබන්නේ පරිභෝජනවාදී දෘෂ්ටිවාදය විසින් පොරොන්දු වන මෙම අසීමිත භෞතික පරිභෝජනය හරහා සැබෑ පුද්ගල තෘප්තිය ළඟා කරගත හැකිද යන්න සහ ඊට විකල්පයක් ලෙස මුල් බුදුසමයාගත දර්ශනය තුළින් ලබාදෙන ප්‍රායෝගික ආලෝකය කුමක්ද යන්නයි. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පරිභෝජනවාදී දෘෂ්ටිවාදයේ පවතින දාර්ශනික හා මනෝවිද්‍යාත්මක පදනම විවේචනාත්මකව හැදෑරීම සහ ධනය හා තෘප්තිය පිළිබඳ බෞද්ධ ආර්ථික දර්ශනයේ හරය තුලනාත්මකව විශ්ලේෂණය කිරීමයි. මෙම අධ්‍යයනය ගුණාත්මක පුස්තකාල පර්යේෂණයක් ලෙස සිදුකෙරෙන අතර දීඝ, මජ්ඣිම සහ අංගුත්තර නිකාය ආදී ප්‍රාථමික පාලි මූලාශ්‍රයන් ද අන්තෝනියෝ ග්‍රාම්ස්චි, එරික් ෆ්‍රොම් සහ කාල් මාක්ස් වැනි බටහිර දාර්ශනිකයන්ගේ ද්විතීයික විග්‍රහයන් ද මෙහිදී පුළුල්ව භාවිත කෙරේ. පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීම්වලට අනුව පරිභෝජනවාදය යනු මිනිසා නිරන්තර අනාරක්ෂිතභාවයකට, දැඩි තරගකාරිත්වයකට, ඊර්ෂ්‍යාවකට සහ භාණ්ඩ කෙරෙහි වන දැඩි උපාදානයට ඇද දමන මායාවකි. ඊට ප්‍රතිවිරුද්ධව මුල් බුදුදහම ගිහියාගේ භෞතික ධනය ප්‍රතික්ෂේප නොකරන අතර ඒ වෙනුවට 'සම්මා ආජීවය' පදනම් කරගත් ආචාර ධාර්මික ආර්ථික මාදිලියක් යෝජනා කරයි. සැබෑ පුද්ගල තෘප්තිය හෙවත් 'සන්තුට්ඨිය' ළඟා කරගත හැක්කේ එරික් ෆ්‍රොම් පෙන්වා දෙන භෞතික වස්තූන් 'සතු කරගැනීමේ මාදිලියෙන්' මිදී අල්පේච්ඡතාව සහ මධ්‍යම ප්‍රතිපදාව මත පදනම් වූ ආධ්‍යාත්මික සංවර්ධනයක් ඔස්සේ බව මෙමගින් තහවුරු විය. අවසන් නිගමනය ලෙස නූතන පාරිභෝගික සමාජය මුහුණ දෙන අතිසංකීර්ණ පැවැත්මේ අර්බුදයට සහ මානසික ව්‍යාධියට තිරසාර, ප්‍රායෝගික මෙන්ම දාර්ශනික විසඳුමක් ලෙස බෞද්ධ ආර්ථික දර්ශනය වඩා යෝග්‍ය බව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පදඃ පරිභෝජනවාදය, පුද්ගල තෘප්තිය, සංස්කෘතික ආධිපත්‍යය, මධ්‍යම ප්‍රතිපදාව, සන්තුට්ඨිය

මෙම අධ්‍යයනය සඳහා වීරවර්ධනලාගේ සුමේධ මංජුලගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ආතති කළමනාකරණය සහ අභ්‍යන්තර සමතුලිතතාව සඳහා 'වූ වෙයි' (Wu Wei) සංකල්පය පිළිබඳව දාර්ශනික විමසුමක්

කොටපොල සුදස්සන හිමි
දර්ශන අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
Sudassanatherok@gmail.com

නූතන ගෝලීයකරණ සන්දර්භය තුළ මානවයා මුහුණ දෙන ප්‍රධානතම මනෝ-සාමාජීය අභියෝගය වන්නේ අත්‍යන්ත වේගවත් බව සහ නිරන්තර පරමාර්ථ ලුහුබැඳීම හේතුවෙන් ජනිත වන්නා වූ ව්‍යුහාත්මක ආතතිය සහ අභ්‍යන්තර අසමතුලිතතාවයි. මෙම පසුබිම තුළ පැනනගින ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ තාඕ දර්ශනයේ කේන්ද්‍රීය මූලධර්මයක් වන 'වූ වෙයි' *(Wu Wei)* නූතන ජීවන රටාවේ මානසික ආතතිය සමනය කරගැනීම සඳහා ප්‍රායෝගික විසඳුමක් ලෙස අර්ථකථනය කළ හැකි ද? යන්න විමර්ශනය කිරීමයි. දාර්ශනික හරයන් සහ මනෝවිද්‍යාත්මක න්‍යායන් සුසංයෝග කරමින් 'වූ වෙයි' සංකල්පයේ ප්‍රායෝගික යෝග්‍යතාව මෙහිදී අධ්‍යයනය කෙරේ. පර්යේෂණ ප්‍රශ්න ලෙස වූ වෙයි හි දාර්ශනික අර්ථය කුමක්ද? එය නූතන මනෝවිද්‍යාත්මක ක්‍රමවේද සමග සම්බන්ධ කළ හැකිද? සහ වූ වෙයි හරහා පුද්ගල ආතතිය අවම කරන්නේ කෙසේද? යන්නයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ 'තාඕ ත ප්‍රකරණය' වැනි ප්‍රාථමික මූලාශ්‍රගත දත්ත ඇසුරින් 'වූ වෙයි' සංකල්පයේ පාරභෞතික පදනම හඳුනාගනිමින් එය නූතන මනෝවිද්‍යාත්මක ක්‍රමවේද වන සතිමත් බව හා පිළිගැනීමේ හා කැපවීමේ චිකිත්සාව *(Mindfulness, ACT)* සමඟ තුලනාත්මකව විමර්ශනය කර ආතතිය කළමනාකරණය සඳහා වූ සාධක පදනම් කරගත් නිර්දේශ ඉදිරිපත් කිරීමයි. පීඩාකාරී සිතුවිලි පිළිගෙන, වර්තමානයේ සිහියෙන් ක්‍රියා කිරීමෙන් මානසික පීඩනය දුරු කර ජීවිතය ස්වභාවික රිද්මයට හැඩගැස්වීම මෙහි හරයයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ප්‍රාථමික සහ ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය පදනම් කරගත් විමර්ශනාත්මක සහ ගුණාත්මක ප්‍රවේශයක් අනුගමනය කරනු ලබන අතර මෙහි විෂය පථය නාගරික හා කාර්යබහුල ජීවන රටාවන්හි හටගන්නා පොදු මානසික ආතතියට පමණක් සීමා වෙමින් සායනික මනෝචිකිත්සක ප්‍රතිකාරයන්ගෙන් බැහැරව පවතියි. නූතන මානවයා මුහුණ දෙන ආතතිය හුදෙක් සායනික ගැටලුවකට එහා ගිය අරමුණු ලුහුබැඳීම පදනම් කරගත් දාර්ශනික අර්බුදයක් බව මෙම පර්යේෂණයෙන් අනාවරණය වේ. ඒ අනුව තාඕවාදී 'වූ වෙයි' *(Wu Wei)* සංකල්පය නූතන මනෝවිද්‍යාත්මක පසුබිමක් තුළ අර්ථකථනය කිරීමෙන් කෘත්‍රිම මැදිහත්වීම්වලින් තොරව සහජ ස්වභාවය පවත්වා ගැනීම, නූතන ලෝකයේ ආතති කළමනාකරණය සහ පුද්ගල අභ්‍යන්තර සමතුලිතතාව උදෙසා ප්‍රායෝගික මෙන්ම තිරසර විසඳුමක් ලෙස යොදාගත හැකි බව මෙම අධ්‍යයනය මනාව සනාථ කරයි.

ප්‍රමුඛ පද: අභ්‍යන්තර සමතුලිතතාව, ආතති කළමනාකරණය, තාඕ දර්ශනය, වූ වෙයි, ස්වයංසිද්ධතාව

මෙම අධ්‍යයනය සඳහා වීරවර්ධනලාගේ සුමේධ මංජුලගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ ආගමික සන්දර්භය තුළ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සදාචාරාත්මක යුක්ති අයුක්ති භාවය පිළිබඳ විමර්ශනයක්

පූජ්‍ය බදුල්ලේ සුබිත හිමි
දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20613@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය සමාජ-දේශපාලනික ඉතිහාසය පුරා ආගමික පූජ්‍ය පක්ෂය සතු සමාජීය ආධිපත්‍යය සහ පූජනීයත්වය, අනෙකුත් ලෞකික සංස්ථාවන්ගෙන් වෙන් කරවනසුලු සුවිශේෂ සංස්කෘතික මූලධර්මයන් මත ස්ථාපිත කර ඇත. බහු-ආගමික ව්‍යුහයක් සහිත රාජ්‍යයක නීතියේ ආධිපත්‍යය සැමට සමානව ක්‍රියාත්මක විය යුතු වුවද, ප්‍රායෝගිකව පූජ්‍ය පක්ෂය විෂයයෙහි සිවිල් නීතිය බලාත්මක කිරීමේදී බරපතල ව්‍යවහාරික සදාචාරාත්මක අර්බුදයන් මතු වේ. මෙම පර්යේෂණය මඟින් " ආගමික සන්දර්භය තුළ පවතින සුවිශේෂීතාවන් නීතියේ සමානාත්මතාවයට බලපාන්නේ කෙසේද? " සහ " නීතිය හා ආගම අතර පවතින සදාචාරාත්මක ගැටලු නිරාකරණය කළ හැකි දාර්ශනික පදනම කුමක්ද?" යන පර්යේෂණ ගැටලු විමර්ශනය කෙරේ. මෙහිදී ප්‍රවාහන නීති යටතේ ආරක්ෂිත හිස්වැසුම් පැළඳීම, පූජ්‍ය පක්ෂය වාහන පැදවීම සහ ආගමික ස්ථානවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතය, ආගමික ස්ථාන දේපළ ගැටලු, ළමා පැවිද්ද, තරුණ භික්ෂූන්ගේ සිවුරු හැරයාම වැනි ප්‍රායෝගික සිදුවීම්වලදී නීතිය ක්‍රියාත්මක කිරීමට යාමේදී රාජ්‍ය යාන්ත්‍රණය හා පුද්ගලයා මුහුණ දෙන සංස්කෘතික පීඩනය අධ්‍යයනයට ලක් කෙරේ. මෙම අධ්‍යයනයේ සීමාව ලාංකේය බහු - ආගමික සන්දර්භය තුළ ක්‍රියාත්මක වන සියලුම ආගමික පූජ්‍ය පක්ෂයන් කෙරෙහි යොමු වී ඇත. පර්යේෂණ ක්‍රමවේදය ලෙස නීතිමය අර්ථකථන වේදය සහ දාර්ශනික විශ්ලේෂණ ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර විමර්ශනය කර තිබේ. දාර්ශනික රාමුව ලෙස ජෝන් රෝල්ස්ගේ සාධාරණත්වය පිළිබඳ න්‍යාය සහ නීතිමය ප්‍රඥාවාදය උපයෝගී කරගනිමින්, ආගමික ආයතන සතු සංස්කෘතික බලය හමුවේ සිවිල් නීතිය අකර්මණ්‍ය වන ආකාරය විවේචනාත්මකව විග්‍රහ කෙරේ. පර්යේෂණ ප්‍රතිඵල මඟින් පෙනී යන්නේ, පූජ්‍ය පක්ෂයට සංස්කෘතිකව හිමි වන සමාජීය මුක්තිය හේතුවෙන් පොදු නීතිය උල්ලංඝනය වන අවස්ථාවලදී පවා නීතිය ක්‍රියාත්මක කිරීම ප්‍රායෝගිකව අභියෝගයට ලක්වන බවයි.නීති සංශෝධනයක් නොමැති වීම නිසා කළයුතු කාර්ය නොදැනීම නිසාවෙන් පූජ්‍ය පක්ෂය ට සිදුවන අසාධාරණයද මෙහි අධ්‍යයනය කෙරේ. විශ්වීය මානව හිමිකම් සහ සමාජ සමානාත්මතාවය පිළිබඳ මූලධර්මයන් ද පරස්පරතාවකට ලක් කරයි. අවසාන වශයෙන් මෙම අධ්‍යයනය නිගමනය කරනු ලබන්නේ, සමාජ සාධාරණත්වය උදෙසා නීතියේ ආධිපත්‍යය සුරකින අතරම, ආගමික ශික්ෂාපද සහ නූතන සිවිල් නීති පද්ධතිය අතර ප්‍රායෝගික සහ සමබර සහසම්බන්ධතාවක් නීතිය හා ආගමික දර්ශනය ඇසුරින් ගොඩනැඟීමේ අත්‍යවශ්‍යතාව වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයට අතිශයින්ම වැදගත් වන බවයි.

ප්‍රමුඛ පදඃ නීතියේ ආධිපත්‍යය, ආගමික සදාචාරවේදය, නීති දර්ශනය, සාධාරණත්වය, මානව හිමිකම්.

මෙම අධ්‍යයනය සඳහා වීරවර්ධනලාගේ සුමේධ මංජුලගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සමාජ මාධ්‍ය මගින් සිදු කරන වෙළඳ ප්‍රචාරණය තුළින් නවීන සමාජය මත ඇති කරන බලපෑම : ජීන් බෝද්‍රියාගේ දෘෂ්ටිකෝණයෙන්

බුද්ධිමා ශ්‍යාමලී හේරත් උපුල්දෙණිය
දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20799@arts.pdn.ac.lk

සමාජ මාධ්‍ය නවීන සමාජයේ ප්‍රබල සන්නිවේදන සහ වෙළෙඳ ප්‍රචාරණ මාධ්‍යයක් බවට පත්ව ඇති අතර එය භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීමේ සීමාව ඉක්මවා මිනිසුන්ගේ චින්තනය, පාරිභෝජන රටාවන් සහ සමාජ වටිනාකම් හැඩගැස්වීමේ බලපෑම්කාරී මාධ්‍යයක් ලෙස ක්‍රියා කරයි. මෙම පර්යේෂයේ අරමුණ වනුයේ ජීන් බෝද්‍රියාගේ ප්‍රතිනිරූපණ, අනුකරණය, අධියථාර්ථය, සංඥා වටිනාකම, පාරිභෝගික සමාජය යන සංකල්ප පදනම් කරගෙන සමාජ මාධ්‍ය මගින් සිදු කරන වෙළඳ ප්‍රචාරණය තුළින් අධියථාර්ථමය නිරූපණයන් සහ පාරිභෝගික සමාජයක් නිර්මාණය වන ආකාරය සහ ඒ තුළින් නවීන සමාජය මත ඇති කරන බලපෑම විමර්ශනය කිරීමයි. ඒ අනුව සමාජ මාධ්‍ය වෙළෙඳ ප්‍රචාරණය මගින් අධියථාර්ථය හැඩගැසෙන්නේ කෙසේද, පාරිභෝගික සමාජයක් නිර්මාණය වන්නේ කෙසේද සහ එම ක්‍රියාවලිය නවීන සමාජයේ වටිනාකම්, අනන්‍යතාව සහ පරිභෝජන හැසිරීම් කෙරෙහි බලපාන්නේ කෙසේද යන ප්‍රශ්න මෙම අධ්‍යයනයේ කේන්ද්‍රීය අවධානයට ලක් කෙරේ. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සිදු කරන අතර දාර්ශනික සහ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් වන අතර දත්ත මූලාශ්‍ර ලෙස ජීන් බෝද්‍රියාගේ කෘතීන්, ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ ග්‍රන්ථ සහ සමාජ මාධ්‍ය වෙළෙඳ ප්‍රචාරණය සම්බන්ධ සිද්ධි අධ්‍යයනයන් භාවිත කර ඇත. අධ්‍යයනය ඔස්සේ සමාජ මාධ්‍ය වෙළඳ ප්‍රචාරණය යථාර්ථයට වඩා ආකර්ෂණීය නිරූපණයන් ඉදිරිපත් කිරීම මගින් අධියථාර්ථීය අත්දැකීම් නිර්මාණය කරන බව අනාවරණය විය. එම ක්‍රියාවලිය තුළ භාණ්ඩවල භාවිත වටිනාකමට වඩා ඒවායේ සංකේත වටිනාකම ප්‍රමුඛත්වයට පත්වන අතර පරිභෝජනය පුද්ගල අනන්‍යතාව, සමාජ තත්ත්වය සහ සාර්ථකත්වය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් බවට පත්වන බව අනාවරණය විය. තවද සමාජ සන්සන්දනය, ව්‍යාජ අපේක්ෂාවන්, පරිභෝජන ආශාවන් වර්ධනය කරමින් නවීන සමාජයේ වටිනාකම්, හැසිරීම් රටාවන් සහ සමාජ සබඳතා කෙරෙහි බලපෑම් කරන බව හඳුනා ගන්නා ලදී. ඒ අනුව බෝද්‍රියාගේ දෘෂ්ටිකෝණයෙන් සමාජ මාධ්‍ය තුළ වෙළඳ ප්‍රචාරණය භාණ්ඩ ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් පමණක් නොව යථාර්ථය ගොඩනැගීමට දායක වන සමාජයීය ක්‍රියාවලියක් ලෙස ක්‍රියා කරන බව මෙම අධ්‍යයනය තුළින් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පදඃ අධියථාර්ථය, ජීන් බෝද්‍රියා, පාරිභෝගික සමාජය, සමාජ මාධ්‍ය, වෙළඳ ප්‍රචාරණය

මෙම අධ්‍යයනය සඳහා සෙව්වන්දි සමදරා හේවාවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල ජන සමාජය තුළ කිලි සංකල්පය තුළින් කාන්තාවට වන බලපෑම පිළිබඳ සාංදෘෂ්ටිකවාදී පරාරෝපණ න්‍යාය ඇසුරින් කෙරෙන දාර්ශනික විග්‍රහයක්

ශෂිනි කෞශල්‍යා වික්‍රමසිංහ
දර්ශන අධ්‍යයන අංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20842@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය මඟින් සිංහල ජන සමාජය තුළ පවතින කිලි සංකල්පය හේතුවෙන් කාන්තාව පරාරෝපණයට ලක් වන ආකාරය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇයගේ පැවැත්මට සිදු වන බහුමානීය බලපෑම් පිළිබඳව සාංදෘෂ්ටිකවාදී පරාරෝපණ න්‍යාය ඔස්සේ විග්‍රහ කෙරිණි. මූලික බුදු සමය තුළ ජීව විද්‍යාත්මක සාධක මත පදනම් වූ කිලි සංකල්පය ප්‍රතික්ෂේප වුවද හින්දු සංස්කෘතියේ ආභාසය සහ ලෞකික දේව ඇදහිලි සමඟ බද්ධ වෙමින් ලාංකේය සංස්කෘතිය තුළ විකෘති වූ කිලි තහංචි පද්ධතියක් නිර්මාණය වී ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සහ පර්යේෂණ ගැටළුව වන්නේ කිලි සංකල්පය මඟින් සිංහල බෞද්ධ කාන්තාව ආගමික, සාමාජීය සහ ආර්ථික ව්‍යුහයන්ගෙන් පරාරෝපණය වන්නේ කෙසේද සහ එමගින් ඇයගේ පැවැත්මට සිදුවන සාමාජීය, මානසික සහ ආර්ථික බලපෑම කුමක්ද යන්න විශ්ලේෂණය කිරීමයි. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගත් අතර, මූලාශ්‍ර ලෙස සාංදෘෂ්ටිකවාදීන්ගේ කෘතීන්, ශාස්ත්‍රීය ලිපි, පර්යේෂණ ග්‍රන්ථ සහ කිලි සංකල්පය තුළින් කාන්තාවට වන බලපෑම සම්බන්ධ සිද්ධි අධ්‍යයනයන් භාවිත කර ඇත. පර්යේෂණ සොයා ගැනීම්වලට අනුව ස්ත්‍රියගේ ජීව විද්‍යාත්මක ක්‍රියාවලීන් හේතු කර ගනිමින් ඇයව ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන්ද, ගෘහස්ථ ශ්‍රම සූරා කෑම හා ආර්ථික නිදහස අහිමි කිරීම හරහා ආර්ථික අවකාශයෙන්ද බැහැර කර ඇත. මෙලෙස සිදු වන බහුවිධ පරාරෝපණයන් හේතුවෙන් කාන්තාවගේ සාමාජීය පැවැත්ම දැඩි ලෙස සීමා වේ. කිලි සංකල්පය වැනි දීර්ඝ කාලීන මතවාදීමය හැඩගැස්වීම් නිසා කාන්තාව කිලි තහංචි ස්වේච්ඡාවෙන්ම වැළඳ ගනිමින් ජීන් පෝල් සාත්‍ර පෙන්වා දුන් ව්‍යාජ පැවැත්මකට නතු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස කාන්තාව තම ශරීරය කෙරෙහි වරදකාරීත්වයක් සහ පිළිකුලක් ඇති කර ගනිමින් ස්වයං පැවැත්ම තුළින් පරාරෝපණයකට ලක් වී ඇත. ඒ අනුව මෙම පර්යේෂණයෙන් නිගමනය කරන්නේ කිලි සංකල්පය යනු හුදෙක් සමාජ සිරිතක් පමණක් නොව එය කාන්තාව තමාගේ සැබෑ පැවැත්මෙන් බැහැර කර ඇයව පුරුෂාධිපත්‍ය සමාජ ක්‍රමයක් තුළ රඳවා තැබීමට භාවිත වන ප්‍රබල සංස්කෘතිකමය මෙවලමක් බවයි.

ප්‍රමුඛ පද: කාන්තාව, කිලි සංකල්පය, සාංදෘෂ්ටික පරාරෝපණය, සිංහල ජන සමාජය

මෙම අධ්‍යයනය සඳහා සෙව්වන්දි සමදරා හේවාවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන ලෝකයේ ව්‍යාපාරික ආචාරධර්ම සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටලු පිළිබඳ දාර්ශනික අධ්‍යයනයක්

එම්.කේ.ඩී.ඒ.ඊ වීරසිංහ
දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20971@arts.pdn.ac.lk

නූතන ලෝකය වාණිජ ක්‍රියාකාරකම්වලින් පැන නගින සංකීර්ණ හා සදාචාරාත්මක උභතෝකෝටික ගැටලුවල වැඩිවීමක් දක්නට ලැබෙන බැවින්, ව්‍යාපාර ආචාරධර්ම පිළිබඳ සමකාලීන දාර්ශනික කතිකාව වඩාත් තීරණාත්මක ක්ෂේත්‍රවලින් එකක් බවට පත්ව ඇත. මෙම පර්යේෂණය මගින් ප්‍රධාන වශයෙන් නූතන ගෝලීය සන්දර්භය තුළ ව්‍යාපාරික ආචාර ධර්මවල මතුවෙමින් පවතින ගැටලුවල දාර්ශනික මානයන් විමර්ශනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එමෙන්ම සමකාලීන ව්‍යාපාරික භාවිතයන් මගින් ඇතිකරනු ලබන සදාචාරාත්මක අභියෝග විසඳීමට කවරාකාරයේ ආචාරධර්ම රාමු සැබැවින්ම සමත් දැයි පරීක්ෂා කිරීම ද තවත් එක් අරමුණකි. මෙම පර්යේෂණය මගින් ආචාර ධර්මවල ප්‍රායෝගික මානයන් පරීක්ෂා කිරීම, ව්‍යාපාර සහ සදාචාරාත්මක මූලධර්ම අතර සම්බන්ධතාව විමර්ශනය කිරීම, ව්‍යාපාර ආචාර ධර්මවල ස්වභාවය, අන්තර්ගතය සහ මෙහෙයුම් ගතිකත්වය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. ආචාරාත්මක ව්‍යාපාරික සංස්කෘතියක් මගින් මිනිසාට ලබාගත හැකි ප්‍රතිලාභ මෙන්ම ඒ කෙරෙහි ඇති තර්ජන හා අභියෝග විශ්ලේෂණය කිරීම මගින් සදාචාරාත්මක තිරසාරත්වය සහතික කිරීම සඳහා පවතින ආචාර ධර්ම ඌනතාවයන් ගවේෂණය කිරීමට ද අවස්ථාව සැලසෙයි. දත්ත විශ්ලේෂණය සඳහා විශ්ලේෂණාත්මක සහ විස්තරාත්මක ප්‍රවේශයක් සමග පුස්තකාල පාදක සමාලෝචනය සහ අන්තර්ජාල මූලාශ්‍ර භාවිත කරමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් මෙම අධ්‍යයනයේදී භාවිත කිරීමට අපේක්ෂිතය. බටහිර සහ පෙරදිග දාර්ශනික සම්ප්‍රදායන් දෙකම මත ගොඩ නැගී ඇති ආචාරධර්ම රාමු මෙහිදී සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණය සමාජීය, නෛතික සහ සදාචාරාත්මක මානයන් හරහා ව්‍යාපාරික ආචාරධර්ම ක්‍රියාත්මක වන ආකාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන බව පෙන්වා දිය හැකිය. මෙහිදී කළ හැකි උපකල්පනයක් වන්නේ ව්‍යාපාරික ආචාරධර්ම නිසි ලෙස තේරුම් ගෙන ක්‍රියාත්මක කළ විට මානව පැවැත්මට හිතකර මෙන්ම ප්‍රතිඵල වැඩියෙන් ළඟාකර ගත හැකි බවය. පිළිගත් ව්‍යාපාරික ආචාර ධර්මවලට සමාජ හැසිරීම් නියාමනය කිරීමට සහ සාධාරණ වාණිජ හැසිරීම් ප්‍රවර්ධනය කිරීමට හැකියාව ඇති අතර, ඒවා අනිසි ලෙස භාවිත කිරීම හෝ නොසලකා හැරීම සැලකිය යුතු සදාචාරාත්මක පිරිහීමකට සහ සමාජ අස්ථාවරත්වයට හේතු විය හැකිය. නූතන ව්‍යාපාරික චර්යාව මෙහෙයවීම සඳහා ආචාර ධර්ම රාමුවක් අත්‍යවශ්‍ය බවත්, මානව වර්ගයාගේ අනාගත ගමන් පථය සදාචාරාත්මකව සුසංයෝගී ආකාරයකින් තීරණය කිරීම සඳහා ව්‍යාපාරික ආචාර ධර්ම සවිඥානික හා වටිනාකම් මත පදනම් වූ යෙදුවුමක් අත්‍යවශ්‍ය බවත් මෙම අධ්‍යයනය මගින් පැමිණිය හැකි නිගමනයකි.

ප්‍රමුඛ පද: ව්‍යාපාර ආචාරධර්ම, තිරසරභාවය, සදාචාරාත්මක ගැටලු, ප්‍රායෝගික ආචාර ධර්ම

මෙම අධ්‍යයනය සඳහා සමන්ත ඉලංගකෝන්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මිනිස් මනසේ ව්‍යූහය, සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් සහ කාර්ල් යුංග් අතර කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.පී.අයි.එච්. වික්‍රමරත්න
දර්ශනය දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20sp944@arts.pdn.ac.lk

සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් සහ කාර්ල් යුංග් යනු මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ දැවැන්තයින් දෙදෙනෙකු වුව ද, මිනිස් මනසේ ව්‍යූහය සම්බන්ධයෙන් ඔවුන් දැක්වූ අදහස් එකිනෙකට වෙනස් වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ, මනෝවිශ්ලේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් වූ මොවුන් දෙදෙනා මිනිස් මනස සම්බන්ධයෙන් දක්වන අදහස් එකිනෙකට වෙනස් වන්නේ කෙසේ ද, කවර ආකාරයකින් ද සහ ඊට බලපෑ හේතූන් කවරේ ද යන්නයි. ෆ්‍රොයිඩ්ගේ විග්‍රහයෙන් ඔබ්බට ගොස් යුංග්ගේ ස්වාධීන අදහස් විකාශනය වීමට බලපෑ සාධක හඳුනා ගැනීම මෙහි උප ගැටලුවක් ලෙස සාකච්ඡා කෙරේ. ඒ අනුව, මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ෆ්‍රොයිඩ් සහ යුංග් මිනිස් මනසේ ව්‍යූහය පිළිබඳ ඉදිරිපත් කළ විග්‍රහයන් තුලනාත්මකව අධ්‍යයනය කරමින්, ඔවුන් එකිනෙකාගෙන් වෙනස් වන ආකාරය සහ යුංග්ගේ වෙනස් වීමට බලපෑ හේතු අනාවරණය කර ගැනීමයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණයක් වන අතර, එහිදී සාහිත්‍ය විමර්ශන ක්‍රමවේදය භාවිත කර ඇත. පර්යේෂණය සඳහා අවශ්‍ය ප්‍රාථමික සහ ද්විතීයික දත්ත රැස් කිරීම වෙනුවෙන් විෂය පථයට අදාළ කෘති, ශාස්ත්‍රීය ලිපි, පොත්පත් සහ අන්තර්ජාල මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. මෙම පර්යේෂණයේ සොයාගැනීම්වලට අනුව, ෆ්‍රොයිඩ් සහ යුංග් යන දෙදෙනාම අවිඥානික මනසේ වැදගත්කම පිළිගත්ත ද, මනසේ ව්‍යූහය පිළිබඳ ඔවුන්ගේ අදහස් මූලික වශයෙන් අසමාන වේ. යුංග් විසින් ෆ්‍රොයිඩ්ගේ .පුද්ගල අවිඥානය. පිළිබඳ අදහසින් ඔබ්බට ගොස් .සාමූහික අවිඥානය. පිළිබඳ සංකල්පය ඉදිරිපත් කර ඇත. එමෙන්ම ෆ්‍රොයිඩ්ගේ මනස පුද්ගලික කාමුක ගැටුම් වල භාජනයක් නම්, යුංග් විසින් පෙන්වන මනස යනු, මානව වර්ගයාගේ පොදු ප්‍රඥාව සහ සංකේතාත්මක උරුමය ඇතුළත් වඩා පුළුල් සහ ආධ්‍යාත්මික මානයකින් යුත් ව්‍යූහයක් ලෙස නිගමනය කළ හැක. ඒ අනුව, මෙම අධ්‍යයනයේ අවසන් නිගමනය වන්නේ, යුංග් මුල් කාලයේදී ෆ්‍රොයිඩ්ගේ අනුගාමිකයෙකු වුවද, පසුකාලීනව ඔහු ස්වාධීන මතයන් කරා ගමන් කිරීමට පෙරදිග දාර්ශනික බලපෑම් සහ ඔහු ලැබූ විවිධ අත්දැකීම් සෘජුවම දායක වී ඇති බවයි. අවසාන වශයෙන්, දෙදෙනාම මනසේ ගැඹුරු ස්වභාවය පිළිගත්ත ද, මිනිස් මනසේ ව්‍යූහය සහ එහි ක්‍රියාකාරිත්වය පිළිබඳ ඔවුන්ගේ ප්‍රවේශයන් මූලික වශයෙන් වෙනස් මඟක් ගෙන ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: සිග්මන්ඩ් ෆ්‍රොයිඩ්, කාර්ල් යුංග්, මනසේ ව්‍යූහය, සාමූහික අවිඥානය, මනෝවිශ්ලේෂනවාදය

මෙම අධ්‍යයනය සඳහා ජයන්ත බෝගොඩ ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

கார்ல் மார்க்ஸின் உழைப்புப்பிரிவினை 'உழைப்பு முதல் உடைமை உருவாக்கம் வரை' ஒரு மெய்யியல் பகுப்பாய்வு

இராசரத்தினம் ஜதுர்ஷா
மெய்யியல் துறை, பேராதனைப் பல்கலைக்கழகம்.
a20259@arts.pdn.ac.lk

மனித வரலாற்றின் போக்கினைத் தீர்மானிக்கும் அடிப்படைச் சக்தியாக "உழைப்பு" விளங்குகின்றது. உழைப்பு என்பது வெறும் பிழைப்பிற்கான கருவி மட்டுமல்லஇ அது மனிதன் தனது ஆளுமையையும் படைப்பாற்றலையும் புறவுலகில் வெளிப்படுத்தும் ஒரு மானிடச் செயற்பாடாகும். அந்தவகையில் உழைப்பு நவீன உற்பத்தி முறைகளின் வளர்ச்சியில் எவ்வாறு ஒரு சிலரின் தனிச்சொத்தாக மாறுகிறது என்பதை கார்ல் மார்க்ஸின் தத்துவங்களின் வழியே ஆராய்வதே இவ் ஆய்வின் முதன்மை நோக்கமாகும். முதலாளித்துவ உற்பத்தி அமைப்பில் நிலவும் தீவிர உழைப்புப் பிரிவினை என்பது வெறும் வேலைப் பகிர்வாக மட்டும் அமையாமல், மனிதனை அவனது சொந்த உழைப்பின் பயனில் இருந்தும் அவனது மனிதத் தன்மையிலிருந்தும் முற்றிலும் அந்நியப்படுத்தும் ஒரு வலிமையான கருவியாகச் செயல்படுகிறது. உழைப்பு எவ்வாறு மெல்ல மெல்ல உடைமை என்ற குறுகிய கருத்தாக்கத்திற்குள் சிறைப்பட்டு மனிதர்களுக்கிடையிலான இயல்பான பிணைப்பைச் சிதைத்தது என்பதைத் தூய மெய்யியல் நோக்கில் ஆராயும் நோக்குடன் இவ் ஆய்வு மேற்கொள்ளப்பட்டுள்ளது. இவ் ஆய்வு பண்புசார் ஆய்வு முறையியலை அடிப்படையாகக் கொண்டு அமைகிறது. விளக்கவுரை முறை, எண்ணக்கருப் பகுப்பாய்வு மற்றும் வரலாற்று முறையியல் என்பன இவ் ஆய்வினைச் செம்மையாக மேற்கொள்ளப் பயன்படுத்தப்பட்டுள்ளன. இவ் ஆய்விற்கான பிரதான மூலங்களாக இரண்டாம் நிலைத்தரவுகள் மற்றும் மூன்றாம் நிலைத்தரவுகள் பயன்படுத்தப்பட்டுள்ளன. உழைப்புப் பிரிவினையின் தீவிர வளர்ச்சியானது மனித உழைப்பை வெறும் பண்டமாக மாற்றி, "சொத்து" என்ற அதிகார வர்க்கக் கட்டமைப்பை உருவாக்குவதுடன், மனிதனை அவனது உழைப்பிலிருந்து அந்நியப்படுத்தி சமூக மற்றும் உணர்வு ரீதியான மனித ஒருமைப்பாட்டைச் சிதைக்கிறது என்பது இவ் ஆய்வின் முக்கிய கண்டுபிடிப்பாகும். இன்றைய முதலாளித்துவச் சூழலில் மனிதர்கள் இயந்திரங்களாக மாற்றப்பட்டு வரும் நிலையில், மனித உழைப்பின் உண்மையான மதிப்பினை உணர்த்தி, சிதைந்து வரும் சமூக ஒருமைப்பாட்டை மார்க்ஸியச் சிந்தனையின் அடிப்படையில் மீளக் கட்டியெழுப்புவதற்கான சாத்தியமான தீர்வுகள் மற்றும் தத்துவார்த்தப் பரிந்துரைகளுடன் இவ் ஆய்வு முடிவடைகிறது.

திறவுச் சொற்கள்: உழைப்பு, உழைப்புப் பிரிவினை, உடைமை உருவாக்கம், அந்நியமாதல், சமூக ஒருமைப்பாடு

எம். எஸ். எம். அனஸ் அவர்களின் வழிகாட்டலையும், மேற்பார்வையையும் பெற்றுக்கொண்டேன் என்பதை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகிறேன்.

விசேட தேவையுடைய மாணவர்களை உள்ளடக்கக் கல்வியில் உள்ளீர்கும் போது அவர்களுக்கு ஏற்படும் உளவியல் தாக்கங்கள்: கரைத்துறைப்பற்று பிரதேச செயலகத்திற்குட்பட்ட பாடசாலைகளை மையமாகக் கொண்ட ஆய்வு

விஜயகுமார் மகிழினி
மெய்யியல் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20426@arts.pdn.ac.lk

உள்ளடக்கக் கல்வி என்பது விசேட தேவையுடைய மற்றும் சாதாரண மாணவர்களை ஒரே கற்றல் சூழலில் இணைத்துக் கல்வி வழங்கும் அணுகுமுறையாகும். எனினும், கரைத்துறைப்பற்று போன்ற கிராமியப் பகுதிகளில் இந்த அணுகுமுறை விசேட தேவையுடைய மாணவர்களின் உளவியல் நிலையில் மீது ஏற்படுத்தும் தாக்கங்கள் போதியளவு ஆதாரங்கள் பதிவு செய்யப்படவில்லை. இந்த ஆய்வின் நோக்கம் உள்ளடக்கக் கல்வியில் உள்ளீர்கப்படும் போது மாணவர்களுக்கு ஏற்படும் சுயமதிப்பு, சமூகப் புறக்கணிப்பு, கற்றலில் ஈடுபாடின்மை, பதற்றம் மற்றும் தனிமைப்படுதல் ஆகிய உளவியல் தாக்கங்களை அடையாளம் காண்பதாகும். இதற்காகக் கரைத்துறைப்பற்று கல்வி வலயத்திற்குட்பட்ட 10 பாடசாலைகளில் இருந்து 30 மாணவர்கள், 06 ஆசிரியர்கள் மற்றும் 10 பெற்றோரைத் தெரிவு செய்து கலப்பு முறை ஆய்வு மேற்கொள்ளப்பட்டது. நேர்காணல் மற்றும் அவதானிப்பு ஆகியவை தரவு சேகரிப்புக் கருவிகளாகப் பயன்படுத்தப்பட்டன. முடிவுகள், சரியான ஆசிரியர் பயிற்சி, வளங்கள் மற்றும் சக மாணவர் ஏற்புடன் உள்ளடக்கக் கல்வி செயற்படுத்தப்படும் போது சுயமதிப்பு மற்றும் சமூகத் தொடர்புகள் கணிசமாக மேம்படுவதைக் காட்டுகின்றன. மாறாக, போதிய ஆதரவு இல்லாமை, பாகுபாடான அணுகுமுறை மற்றும் பாடத்திட்டங்கள் மாற்றியமைப்பு இல்லாத போது பதற்றம், தாழ்வு மனப்பான்மை மற்றும் பாடசாலை வருகைக் குறைவு அதிகரிக்கிறது. எனவே உள்கட்டமைப்பில் மட்டும் அல்லாது ஆசிரியர்களின் மனப்பாங்கு, சக மாணவர்களின் ஒத்துழைப்பு மற்றும் தொடர்ச்சியான உளவியல் ஆதரவு ஆகியவற்றிலும் தங்கியுள்ளது.

திறவுச் சொற்கள்: உள்ளடக்கக் கல்வி, விசேட தேவை, உளவியல் தாக்கம், கரைத்துறைப்பற்று, சுயமதிப்பு

முபிஸால் அபூபக்கர் அவர்களின் வழிகாட்டலையும், மேற்பார்வையையும் பெற்றுக்கொண்டேன் என்பதை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகிறேன்.

இலங்கையின் சமகால அரசியலில் தேசிய இனப்பிரச்சினையும் மார்க்சிய வர்க்கக் கோட்பாடும் ஒரு ஆய்வு

எஸ். நிசாலினி
மெய்யியல் துறை, பேராதனைப் பல்கலைக்கழகம்.
a20961@arts.pdn.ac.lk

இலங்கையின் சமகால அரசியலில் தேசிய இனப்பிரச்சினையின் தோற்றம், பரிணாமம் மற்றும் அதன் அரசியல், பெருளாதார, சமூக பரிமாணங்களை மார்க்சிய வர்க்கக் கோட்பாட்டின் அடிப்படையில் ஆய்வு செய்வதை நோக்கமாகக் கொண்டுள்ளது. இலங்கை பல இன, மத, மொழி சமூகங்களைக் கொண்ட நாடாக இருந்தாலும், அரசியல், பொருளாதார மற்றும் சமூகக் காரணிகளின் தாக்கத்தால் தேசிய இனப்பிரச்சினை நீண்டகால அரசியல் நெருக்கடியாக உருவெடுத்துள்ளது. இவ்வாய்வு இனப்பிரச்சினையை வெறும் இன அடையாள மோதலாக மட்டும் அல்லது வர்க்க உறவுகள், உற்பத்தி உறவுகள், பொருளாதார ஆதிக்கம் மற்றும் அரசியல் அதிகார அமைப்புக்களுடன் பின்னிப்பிணைந்து, சமூக நிகழ்வாக அணுகுகிறது. இந்தக் கோட்பாட்டின் ஒளியில் இலங்கையின் தேசிய இனப்பிரச்சினையை அணுகும் போது, இன முரண்பாடுகள் வெறும் இன அடையாள வேறுபாடுகளின் விளைவாக மட்டுமன்றி பொருளாதார ஏற்றத்தாழ்வுகள், வளங்களின் கட்டுப்பாடு, அரசியல் அதிகாரத்தின் மையப்படுத்தல் மற்றும் ஆளும் வர்க்கத்தின் அரசியல் நலன்களுடன் தொடர்புடைய சமூக, அரசியல் நிகழ்வாகவும் விளங்குகின்றன. இன அடையாள அரசியல் பல சந்தர்ப்பங்களில் வர்க்க முரண்பாடுகளை மறைக்கும் கருவியாகப் பயன்படுத்தப்பட்டுள்ளதையும் இவ்வாய்வு சுட்டிக்காட்டுகிறது. இவ்வாய்வு தரமான ஆய்வு முறையைப் பின்பற்றி நூல்கள், ஆய்வுக் கட்டுரைகள், வரலாற்று ஆவணங்கள், அரசியல் அறிக்கைகள் மற்றும் இரண்டாம் நிலைத்தரவுகளின் உள்ளடக்கப் பகுப்பாய்வின் மூலம் மோற்கொள்ளப்பட்டுள்ளது. இலங்கையின் தேசிய இனப்பிரச்சனையை முழுமையாகப் புரிந்து கொள்வதற்கு இன அடையாள அரசியலுடன் இணைந்து வர்க்க அரசியல், பொருளாதார அமைப்புக்களை, அதிகார உறவுகளையும் கருத்தில் கொள்ள வேண்டியதன் அவசியம் வலியுறுத்தப்படுகிறது. தேசிய நல்லிணக்கம், சமூக நீதி, சமத்துவம் மற்றும் ஜனநாயக அரசியல் மறுசீரமைப்பையும் மார்க்சிய வர்க்கப் பகுப்பாய்வு வழங்கும் முக்கியத்துவத்தை இவ்வாய்வு கூறுகின்றது.

திறவுச் சொற்கள்: இலங்கை, சமகால அரசியல், தேசிய இனப்பிரச்சனை, மார்க்சிய வர்க்கக் கோட்பாடு, இன அரசியல், வர்க்கப் பகுப்பாய்வு

முபிஸால் அபூபக்கர் அவர்களின் வழிகாட்டலையும், மேற்பார்வையையும் பெற்றுக்கொண்டேன் என்பதை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகிறேன்.

பெண்கள் இல்லங்களில் சிறுமியர்கள் எதிர்நோக்கும் உளவியல் ரீதியான பாதிப்புக்கள்: திருகோணமலையிலுள்ள சாரதா பெண்கள் இல்லத்தை சிறப்பு உதாரணமாகக் கொண்ட ஆய்வு.

சி. தர்சினி
மெய்யியல் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20968@arts.pdn.ac.lk

பெண்கள் இல்லங்களில் வாழும் சிறுமியர்கள் எதிர்கொள்ளும் உளவியல் ரீதியான சவால்கள் மற்றும் அவற்றின் தாக்கம் குறித்த விரிவான புரிதலைப் பெறுவதே இவ்வாய்வின் பிரதான நோக்கமாகும். குறிப்பாக, இவ்வாய்வு திருகோணமலையிலுள்ள சாரதா பெண்கள் இல்லத்தைச் சேர்ந்த சிறுமியர்களை மையமாகக் கொண்டு மேற்கொள்ளப்பட்டது. இது தரமான ஆய்வின் அடிப்படையில், அரைக்கட்டமைக்கப்பட்ட நேர்காணல்கள் மற்றும் அவதானிப்பு முறைகளைப் பயன்படுத்தி தரவுகள் சேகரிக்கப்பட்டன. இவ்வில்லத்தில் சிறுமியர்கள் எதிர்கொள்ளும் உளவியல் பாதிப்புகள் பற்றி இதுவரை முழுமையாக ஆராயப்படவில்லை. இதுவே ஆய்வு இடைவெளியாக உணர்த்தியது. ஆய்வின் முடிவுகள், இல்லங்களில் வாழும் சிறுமியர்களிடையே சமூகத் தனிமை, தாழ்வு மனப்பான்மை மற்றும் எதிர்காலம் குறித்த நிச்சயமற்ற தன்மை போன்ற உளவியல் தாக்கங்கள் காணப்படுவதை வெளிப்படுத்துகின்றன. அதேவேளையில், இல்லங்களினால் வழங்கப்படும் பாதுகாப்பு மற்றும் வழிகாட்டல்கள் அவர்களின் உளநலத்தை மேம்படுத்துவதில் நேர்மறையான பங்களிப்பை வழங்குகின்றன என்பதும் கண்டறியப்பட்டது. இப்பாதிப்புகளைக் குறைப்பதற்கும், அச்சிறுமியர்களின் உள ஆரோக்கியத்தை உறுதிப்படுத்துவதற்கும் இல்லங்களின் முகாமைத்துவத்தில் முறையான உளவளத் துணை ஆலோசனைகளை உள்வாங்குவதும், சமூக ஒருங்கிணைப்பு நடவடிக்கைகளை ஊக்குவிப்பதும் அவசியமானது என இவ்வாய்வு பரிந்துரைக்கிறது.

திறவுச் சொற்கள்: பெண் இல்லங்கள், உளவியல் பாதிப்பு, சாரதா பெண்கள் இல்லம், சிறுமியர் நலன், சமூக ஒருங்கிணைப்பு

எம். எஸ். எம். அனஸ் அவர்களின் வழிகாட்டலையும், மேற்பார்வையையும் பெற்றுக்கொண்டேன் என்பதை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகிறேன்.

POLITICAL SCIENCE



STATUS OF ECONOMIC RIGHTS OF POST–WAR FEMALE HEADS OF HOUSEHOLDS: A CASE STUDY OF POONAKARY DIVISION, NORTHERN SRI LANKA

Y.K. Ajanika
Department of Political Science, University of Peradeniya
a20299@arts.pdn.ac.lk

The civil war in Sri Lanka resulted in a large number of female-headed households (FHHs), particularly in the Northern and Eastern Provinces of Sri Lanka. Although the war ended in 2009, many of these women continue to face economic and social challenges in their daily lives. This study examines the status of economic rights of FHHs in the Poonakary Divisional Secretariat of the Kilinochchi District. It aimed to explore their sources of income, livelihood challenges, issues related to land and property rights and the socio-cultural factors that affect them enjoying their economic rights. The study is based on Naila Kabeer's (1999) Women's Empowerment Framework (Resources, Agency and Achievements). The study employed a qualitative research approach with a descriptive research design. Data were collected through in-depth interviews and focus group discussions with FHHs in the Poonakary area. The collected data were analysed using thematic analysis to identify the main themes related to the economic rights and livelihood experiences of the participants. The findings show that many FHHs continue to face serious economic difficulties due to unstable sources of income and limited employment opportunities. Many of them also lack legal ownership of land and property, making it difficult for them to obtain bank loans and financial support for livelihood activities. In addition, patriarchal social norms and gender discrimination continue to limit their economic independence and access to markets. Government institutions and non-governmental organisations provide different forms of assistance to them. However, most of these programmes focus on short-term relief rather than long-term economic empowerment. These findings suggest that stronger and more sustainable measures are needed to protect the economic rights of FHHs in the post-war context. The study recommends improving access to land ownership and introducing livelihood-based financial assistance programmes. It also recommends creating better market opportunities to improve the long-term economic well-being of FHHs in the Poonakary area.

Keywords: female-headed households, economic rights, post-war livelihoods, land rights, women's empowerment.

I wish to acknowledge N. Sivakumar for his guidance and supervision.

THE MANNAR WIND FARM PROJECT AND THE PROTECTION OF SOCIAL AND ENVIRONMENTAL RIGHTS IN SRI LANKA: A HUMAN RIGHTS PERSPECTIVE

K. Arthika
Department of Political Science, University of Peradeniya
a20312@arts.pdn.ac.lk

Global and national initiatives towards renewable energy sources have intensified to mitigate climate change. In this context, Sri Lanka aims to meet 70% of its electricity demand through renewable energy sources by 2030. As a major component of this national policy, a large-scale wind farm project has been implemented on Mannar Island. Although the government asserts that this project is beneficial for the country's economic growth, it poses significant challenges to the unique ecological balance and the livelihood rights of the people in the Mannar district. The primary objective of this study was to examine the impacts of this wind power project on social and environmental protection in Mannar, to identify the gaps between the implementation of the project and international human rights standards, and to provide recommendations for protecting these rights. It tested the hypothesis that the failure of the project to adequately safeguard social and environmental rights leads to adverse impacts on human rights. This study utilised a mixed-method research approach incorporating both qualitative and quantitative data. The data were analysed using descriptive and statistical analysis methods. The findings revealed that the wind power project has caused significant disruptions to traditional fishing activities in the coastal areas of Mannar. Furthermore, the project has posed severe threats to biodiversity and internationally significant migratory bird routes. It has also caused health-related impacts on local communities. Most importantly, the study found that people's freedom of expression regarding this project has not been adequately protected, and both environmental and human rights have been marginalised. In conclusion, although this project is essential for economic growth, governmental initiatives must encompass environmental and social justice. Finally, the study recommends that social protection policies be integrated with human rights standards to establish accountability and promote sustainable development.

Keywords: Mannar wind farm project, renewable energy, environmental protection, social protection, human rights

I wish to acknowledge S. Baskaran for his guidance and supervision.

THE PATRIARCHY IN SRI LANKA'S LAWS OF MARRIAGE LAWS: WITH SPECIAL REFERENCE TO KANDYAN LAW

K. Rajendran
Department of Political Science, University of Peradeniya
a20336@arts.pdn.ac.lk

Legal pluralism is a central theme of the reconceptualisation of law/societal relations. Accordingly, Sri Lanka has a diverse legal system that acknowledges customary laws as a key part of its legal and cultural identity. The Kandyan marriage law governs marriage, inheritance, and property rights for certain groups within the population. However, some of its rules have faced criticism for upholding patriarchal systems that restrict women's economic rights, social independence, and access to justice. Also, men in Binna Marriages face challenges like losing family inheritance and social freedom. Even with growing efforts for gender equality and legal changes, there is still a lack of thorough research that critically analyses these patriarchal legal norms using Marxist feminist theory and the Critical Legal Studies (CLS) lens. The study primarily aimed to critically analyse the patriarchy inherent in Sri Lanka's Kandyan Marriage Law and its effects on the economic and social status of women. This study investigated how patriarchal frameworks are institutionalised through legislation to limit women's rights to economic resources, including property ownership and inheritance, thus perpetuating their economic dependency. Using a mixed-methods research approach, this study combined both qualitative and quantitative methods. Primary data were gathered through semi-structured interviews, focus group discussions, and structured questionnaires targeting women under Kandyan law, legal professionals, and advocates for gender rights. Secondary data included laws, court rulings, policy documents, and academic literature. The primary finding of the research was that patriarchy plays a vital role in shaping the basic forms and legal content of the Kandyan legal tradition. The conclusion of the previous studies was that women faced complex issues due to patriarchal versions of the legal content of Kandyan marriage law. However, the data suggested that men also face complex legal issues arising from the same legal content.

Keywords: Kandyan marriage law, patriarchy, gender, Marxist feminism, women's rights

I wish to acknowledge Sumudu Walakuluge for his guidance and supervision.

THE CHALLENGES OF ANTI-CORRUPTION ACTIVITIES OF THE NATIONAL PEOPLE'S POWER GOVERNMENT IN SRI LANKA

K. Aarani
Department of Political Science, University of Peradeniya
a20337@arts.pdn.ac.lk

Corruption in Sri Lanka is not simply an individual administrative failure; rather, it is a deeply rooted systemic problem that has persisted for a long time. Rising corruption has seriously undermined the country's economic growth and public trust. While the 2022 economic crisis had multiple causes, political corruption and administrative failures played a major role. Public anger over the corrupt conduct of those in power became a driving force behind the National People's Power (NPP) party coming to power in 2024. The NPP government was elected on three main policy pillars: improved transport infrastructure, social protection and cost-of-living relief, and a digital economy combined with anti-corruption measures. Although the government has introduced several reforms in these areas, implementing them has exposed significant challenges rooted in the existing institutional culture. This study examined the NPP government's anti-corruption actions, the challenges it faces, the reasons behind those challenges, and the effectiveness of its reform initiatives. The study employed both qualitative and quantitative methods, with purposive sampling used for data collection. The findings were analysed through thematic analysis and basic statistical techniques, using Institutional Theory and Collective Action Theory as theoretical frameworks. The study concluded that while the NPP government has made greater anti-corruption efforts than its predecessors, it continues to face serious institutional and political barriers. The paper also presents policy recommendations to strengthen and accelerate anti-corruption reforms in Sri Lanka.

Keywords: National People's Power, anti-corruption, political challenges, institutional challenges

I wish to acknowledge S. Baskaran for his guidance and supervision.

THE ROLE OF JAFFNA NUFFIELD SCHOOL AND THE CHALLENGES IT FACES IN PROTECTING THE RIGHTS OF CHILDREN WITH DISABILITIES

Ketheeswaran Losika
Department of Political Science, University of Peradeniya.
a20393@arts.pdn.ac.lk

Although human rights are universal, children with disabilities continue to face barriers in accessing their rights to education, equality, and participation. Despite the existence of national and international laws, challenges persist due to institutional and structural obstacles. This study aimed to examine the role of Jaffna Kaithady Nuffield School, established in 1956 as a Tamil-medium school for deaf and visually impaired children in Sri Lanka's Northern Province, in safeguarding these children's rights, as well as the challenges it faces. Using a qualitative methodology, primary data were collected through interviews with 32 participants, including educational staff, subject-matter experts, parents, and civil society members, selected through purposive sampling. In addition, books, research articles, and legal provisions were used and analysed as secondary data using thematic analysis. Based on the Human Rights Approach and the Capability Approach, this analysis reveals that although Nuffield School has undertaken various measures to ensure students' rights to education, accommodation, protection, and participation, it faces major challenges in fully guaranteeing these children's rights due to inadequate funding, resource shortages, inefficient administration, and social attitudinal barriers. Therefore, the study recommends that merely relying on legal protections is insufficient. Only through adequate resource allocation and appropriate training and support can these children's rights be effectively realised, thereby creating an equitable learning environment and a just society.

Keywords: children with disabilities, Nuffield school, children's rights, institutional challenges, participation

I wish to acknowledge S. Baskaran for his guidance and supervision.

LIVELIHOOD CHALLENGES OF FEMALE EX-COMBATANTS: A STUDY FOCUS ON KILINOCHCHI DISTRICT, SRI LANKA

M. Kajalaksi
Department of Political Science, University of Peradeniya
a20434@arts.pdn.ac.lk

The end of the civil war in Sri Lanka in 2009 marked the beginning of a new phase for former female combatants. However, many female ex-combatants continue to face difficulties in rebuilding their lives and securing sustainable livelihoods in post-war society. In the Kilinochchi District, many of these women struggle with limited employment opportunities, financial insecurity, social stigma and other challenges that affect their daily lives. This study aimed to explore the livelihood challenges faced by female ex-combatants in the Kilinochchi District. It also examined how political, social and economic factors influence their livelihoods and identified the livelihood strategies they adopt. The study employed a qualitative research approach to gain a deeper understanding of the experiences of female ex-combatants. Data were collected through semi-structured interviews, focus group discussions and document analysis. Participants were selected using purposive sampling based on their experiences. The collected data were analysed using thematic analysis to identify key themes and patterns related to livelihood challenges and their coping strategies. The study found that many female ex-combatants continue to face difficulties in accessing stable employment, financial resources as well as government support in Kilinochchi District. Social stigma, gender discrimination and the long-term effects of war also influence their livelihood opportunities. Political and economic conditions in the post-war context further limit their access to resources and development opportunities. To cope with these challenges, many female ex-combatants rely on self-employment, small businesses, agriculture, daily wage labour and support from family and community networks. The findings of this study improve our understanding of the livelihood challenges faced by female ex-combatants in post-war Sri Lanka.

Keywords: ex-combatants, female ex-combatants, livelihood, rehabilitation and social stigma

I wish to acknowledge N. Sivakumar for his guidance and supervision

THE ROLE OF SOCIAL MEDIA AND ELECTION CAMPAIGNING IN SRI LANKA: A STUDY OF THE 2024 PRESIDENTIAL ELECTION

M.S.F. Sajeeha
Department of Political Science, University of Peradeniya
a20645@arts.pdn.ac.lk

Social media has become a major factor in modern elections by facilitating communication between candidates and voters and enhancing civic participation. As interest in digital electoral politics continues to grow worldwide, the 2024 Sri Lankan Presidential Election provides an important case study, representing the peak of voter demands for political change following the Aragalaya movement. This study examines the influence of social media on the electoral process during the 2024 Presidential Election. Specifically, it investigated the nature and content of digital campaign messages and evaluated how social media campaigns influenced voter behaviour. To provide a theoretical foundation, the study drew on Agenda-Setting Theory to explain how social media agendas shaped public discourse. The study employed Social Identity Theory to investigate how ethnic, religious, and linguistic identities were mobilised in digital campaigns. A mixed-methods approach was adopted, collecting qualitative data through semi-structured interviews with 15 voters, candidates, campaign insiders and content creators, alongside a survey of 50 respondents and a content analysis of Facebook and TikTok posts related to the major presidential candidates. The data were analysed using thematic analysis, descriptive statistics, and correlation analysis. The findings indicated a positive relationship between social media use and voter preferences in the 2024 Presidential Election, demonstrating that digital platforms played a significant role in shaping political engagement and electoral decision-making. The study contributes to the growing literature on digital electoral politics by providing insights into the role of social media in strengthening democratic participation and influencing electoral outcomes in post-economic-crisis Sri Lanka.

Keywords: social media, voter behaviour, digital electoral politics, Agenda-Setting Theory, Social Identity Theory

I wish to acknowledge S. Baskaran for his guidance and supervision.

LAND RIGHTS VIOLATIONS AND SOCIAL JUSTICE OF PLANTATION COMMUNITIES IN SRI LANKA: A STUDY BASED ON SURIYAKANDA AREA IN RATNAPURA DISTRICT

R. Tilakshana
Department of Political Science, University of Peradeniya
a20795@arts.pdn.lk

The plantation community in Sri Lanka contributes significantly to the national economy. However, it experiences systemic exclusion from secure land tenure due to historical, legal, and administrative failures. In the Suriyakandha area in the Ratnapura District, the promised "7 perch Land Scheme" has remained largely unimplemented, forcing workers to live in overcrowded "line rooms" which perpetuate social and economic marginalisation. Between 2015 and 2025, the community's access to formal land ownership was constrained by rigid state land policies, estate management control and legal conflicts associated with the 1992 Plantation Lease Act. Accordingly, this study aimed to examine the legal and administrative violations of land rights experienced by the residents of the Suriyakandha region. Guided by international frameworks including the UDHR and ICESCR, alongside national land laws, John Rawls' Theory of Justice provided the framework to examine how the denial of secure land rights undermines social justice and human dignity beyond economic dimensions of poverty. Adopting a qualitative empirical research design, primary data were collected through structured interviews and field observations involving 30 stakeholders, including residents, civil society, trade unions, government officials, political leaders and an estate owner. Secondary data gathered from land legislation, policy documents and institutional reports were analysed using thematic analysis. Findings revealed that landlessness and restrictive lease arrangements perpetuated the structural marginalisation of the plantation community. Lacking legal land titles, residents face exclusion from Grama Niladhari divisions, limiting their access to education, healthcare, and basic infrastructure. The study concludes that the continued denial of secure land tenure constitutes a serious violation of social justice and human rights. It recommends comprehensive land policy reforms, amendments to the 1992 Plantation Lease Act, and issuing permanent land titles to restore dignity, equality, and full citizenship rights.

Keywords: land rights, John Rawls, social justice, line rooms, 1992 Lease Act

I wish to acknowledge S. Baskaran for his guidance and supervision.

විද්‍යුත් ජනමාධ්‍ය හා පාරිභෝජනවාදය: ශ්‍රී ලංකාවේ ස්වාධීන රූපවාහිනිය හා සිරස මාධ්‍ය ජාලය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

එච්.පී.යූ. අංජලිකා
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20032@arts.pdn.ac.lk

නූතන ධනවාදය ක්‍රියාත්මක වන්නේ පාරිභෝජනවාදය තුළිනි. පාරිභෝජනවාදය යනු වැඩි වැඩියෙන් භාණ්ඩ හා සේවා පරිභෝජනය කිරීමට මිනිසුන් උනන්දු කරවන වෙළෙඳ උපක්‍රමයකි. මේ වෙළඳ උපක්‍රමයත්, ධනවාදයත් අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. කෙසේ වුවත්, ශ්‍රී ලංකා දේශපාලන විද්‍යා සාහිත්‍ය තුළ විද්‍යුත් ජනමාධ්‍ය සහ පාරිභෝජනවාදය අතර ඇති සමීප සම්බන්ධතාව ගැන ප්‍රමාණවත් අධ්‍යයන සිදුව නැත. මේ අධ්‍යයනයේ අරමුණ එම හිඩස පිරිමසාලීම ය. මේ සඳහා අධ්‍යයන විධික්‍රමය ලෙස තෝරා ගන්නේ රාජ්‍ය මාධ්‍ය ආයතනයක් වන ස්වාධීන රූපවාහිනිය හා පෞද්ගලික මාධ්‍ය ආයතනයක් වන සිරස මාධ්‍ය ජාලවල 2026 වර්ෂයේ මැයි මාසයේ රාත්‍රී ප්‍රවෘත්ති විකාශයට අදාළ කාල පරිච්ඡේදය තුළ විකාශනය වූ වෙළඳ දැන්වීම්වල අන්තර්ගතය විශ්ලේෂණය කිරීම ය. අධ්‍යයනයෙන් හෙළි වූයේ රාජ්‍ය හෝ පෞද්ගලික භේදයකින් තොරව සියලු මාධ්‍ය ආයතන වෙළඳපොළ අවශ්‍යතා මත යම් යම් භාණ්ඩ හා සේවාවන් ප්‍රචාරණය කිරීමට කටයුතු කර තිබෙන බව ය. මෙනයින් පැහැදිලි වූයේ, ජනමාධ්‍යයෙන් අපේක්ෂිත තොරතුරු සම්පාදනය යන මුඛ්‍ය ක්‍රියාවට වඩා වෙළඳ ප්‍රචාරණයට වැඩි ඉඩක් දී තිබෙන බව ය. මේ පිළිබඳ වඩාත් පුළුල් පරාසයක් ආවරණය වන පරිදි තවත් අධ්‍යයන සිදු කළ යුතුව තිබේ.

ප්‍රමුඛ පද: ධනවාදය, පාරිභෝජනවාදය, විද්‍යුත් ජනමාධ්‍ය

මෙම අධ්‍යයනය සඳහා උපුල් අබේරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ පළාත් පාලනය හා කාන්තා නියෝජනය: කෝටා ක්‍රමයේ සඵලදායිබව සම්බන්ධ ගවේෂණාත්මක අධ්‍යනයක් (මහව ප්‍රාදේශීය සභාව ආශ්‍රයෙන්)

එච්.එන්.එච්.පී. ජයසිංහ
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20276@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රියාවලිය තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීම සඳහා 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනත මඟින් හඳුන්වා දුන් 25%ක අනිවාර්ය කාන්තා කෝටා ක්‍රමය වැදගත් සන්ධිස්ථානයකි. මෙම පර්යේෂණයේ දී සාහිත්‍යයේ පවතින හිඩැස මත ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන තුළ ක්‍රියාත්මක වන කෝටා ක්‍රමයේ සඵලදායිතාව සහ එමඟින් කාන්තා දේශපාලන සහභාගිත්වයේ ගුණාත්මක වර්ධනයට සිදුව ඇති බලපෑම ගවේෂණය කිරීම අරමුණයි. කෝටා ක්‍රමය මඟින් කාන්තාවන් සංඛ්‍යාත්මකව දේශපාලනයට පිවිසීමේ අවස්ථාව හිමි වුව ද, ඔවුන් සැබෑ ලෙස ම තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව දායක වන්නේ ද? පවතින පීතෘමූලික දේශපාලන සංස්කෘතිය, මූල්‍ය දුෂ්කරතා සහ සමාජීය බාධක හමුවේ මෙම කෝටා ක්‍රමය අපේක්ෂිත සඵලදායිතාව අත්පත්කරගෙන තිබේ ද? යන්න විමර්ශනයකට ලක් කිරීම මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුවයි. ඩෘඩ් ඩැලරප් විසින් කෝටා ක්‍රමය විග්‍රහ කිරීම සඳහා ඉදිරිපත් කළ ප්‍රමාණය වැඩිකිරීම හා ක්‍රියාත්මකවීම වර්ධනය කිරීම යන න්‍යායික රාමුව දත්ත විග්‍රහයේ දී භාවිත කර ඇත. මේ සඳහා යොදාගත් අධ්‍යයන ක්‍රමවේදය වන්නේ, මිශ්‍ර ක්‍රමවේදයයි. අධ්‍යයන නියැදිය සඳහා මහව ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය මැතිවරණවලට ඉදිරිපත් වූ අපේක්ෂක අපේක්ෂිකාවන් සහ එම මැතිවරණවලින් ජයග්‍රහණය කරන ලද අපේක්ෂක අපේක්ෂිකාවන් 30ක් ලෙස ගෙන ප්‍රාථමික දත්ත රැස් කරන ලදි. ප්‍රාථමික දත්ත ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමයත්, ද්විතීයික දත්ත ලෙස පොත්පත්, විද්වත් ප්‍රකාශන හා සඟරා, මැතිවරණ වාර්තා හා පුවත්පත් ලිපි වැනි ද්විතීයික මූලාශ්‍රය මඟින් තොරතුරු රැස් කරන ලදි. මෙම තොරතුරු තේමාත්මක විශ්ලේෂණය, විස්තරාත්මක විශ්ලේෂණය යන විශ්ලේෂණාත්මක ක්‍රමවේද යොදාගනිමින් විශ්ලේෂණය කරන ලදි. අධ්‍යයන ප්‍රතිඵල 2018, 2025 පළාත් පාලන මැතිවරණයේදී කෝටා ක්‍රමය හේතුවෙන් පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සංඛ්‍යාත්මක ලෙස සාර්ථකව ඉහළ ගොස් ඇති නමුත්, පීතෘමූලික දේශපාලන සංස්කෘතිය, ආයතනික ව්‍යුහයන්ගේ සහයෝගය මදිකම සහ දේශපාලන අත්දැකීම් අවමවීම හේතුවෙන් ඔවුන්ගේ සඵලදායී දායකත්වය සීමා වී ඇත. කෝටා ක්‍රමය මඟින් නාමික නියෝජනයක් තහවුරු කළ ද, සැබෑ දේශපාලන සක්‍රීයභාවය උදෙසා ඔවුන්ට පාලන තන්ත්‍රය පිළිබඳ පුහුණුව, ආර්ථික ස්වාධීනත්වය සහ දේශපාලන පක්ෂ මඟින් ලැබෙන සහයෝගය ඉහළ නැංවිය යුතු බව නිගමනය විය.

ප්‍රමුඛ පද: පළාත් පාලනය, කාන්තා නියෝජනය, කෝටා ක්‍රමය, සඵලදායිතාව, මහව ප්‍රාදේශීය සභාව

මෙම අධ්‍යයනය සඳහා උපුල් අබේරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ සිනමා නිර්මාණ තුළින් නිරූපිත දේශපාලනය: තෝරාගත් සිනමා කෘති කිහිපයක් ඇසුරින් සිදුකරන අධ්‍යයනයක්

ආර්.එම්.එච්.එස් ජයසුන්දර
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20282@arts.pdn.ac.lk

පශ්චාත් යුධ ශ්‍රී ලාංකීය සන්දර්භය තුළ සිනමාව යනු හුදු විනෝදාස්වාද මාධ්‍යයක් පමණක් නොව සමාජයක දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික හැඩගැස්ම තීරණය කරන ප්‍රබල දෘෂ්ටිවාදී මෙවලමක් ලෙස ක්‍රියා කරයි. යුද්ධයේ නිමාවත් සමඟ ඇති වූ දේශපාලන විපරිවර්තනය රාජ්‍යය සහ ප්‍රභූ දේශපාලනය විසින් මෙහෙයවනු ලැබූ ජාතිකවාදී ප්‍රවණතා සහ ලිබරල්වාදී ආර්ථික ප්‍රතිසංස්කරණ සිනමා කර්මාන්තයේ ව්‍යුහය කෙරෙහි සෘජුවම බලපෑම් කර ඇත. එවැනි පසුබිමක රසවින්දනය හා වාණිජ පරමාර්ථ කේන්ද්‍ර කරගනිමින් නිෂ්පාදනය වන සිංහල සිනමා නිර්මාණ මගින් සිංහල අධිපතිවාදී සහ නව ලිබරල්වාදී දෘෂ්ටිවාද මත පදනම් වූ ජාතිවාදී අදහස් අඛණ්ඩව ප්‍රතිනිෂ්පාදනය වීමේ ප්‍රවණතාව විමර්ශනය කෙරේ. අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පශ්චාත් යුධ වාණිජ සිංහල සිනමාව තුළ සිංහල අධිපතිවාදී සහ ජාතිවාදී ආඛ්‍යාන නිරූපණය වන ආකාරයත් එමඟින් සංස්කෘතික ආධිපත්‍යය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ප්‍රභූ දේශපාලනය, සාමය සහ සමාජ ව්‍යාපාර වැනි සන්දර්භ ඔස්සේ දේශපාලන ප්‍රභූන්ගේ මතවාදයන් සිනමාවෙන් ආවරණය වන ආකාරය සහ අධ්‍යක්ෂකවරුන් මෙම අධිපතිවාදී දෘෂ්ටිය ස්ථාපිත කිරීමට හෝ අභියෝගයට ලක් කිරීමට යොදාගත් ආඛ්‍යාන උපාය මාර්ග සහ සිනමාත්මක සංකේත ගවේෂණය කිරීමයි. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය සහ තේමාත්මක විශ්ලේෂණය භාවිත කරමින් ගාමිණී, සිංහබාහු සහ ඔබ නැතුව ඔබ එක්ක යන සිනමා කෘති ත්‍රිත්වය ප්‍රාථමික ආදර්ශක ලෙසද, විෂයට අදාළ ශාස්ත්‍රීය ලේඛන ද්විතීයික දත්ත ලෙසද, මහජන මතය ග්‍රහණය කරගැනීම සඳහා අදාළ චිත්‍රපටවල යූටියුබ් (YouTube) පරිශීලක අදහස් ඩිජිටල් සන්නිවේදන දත්ත ලෙස ද, උපයෝගී කරගෙන ඇත. ඇන්ටෝනියෝ ග්‍රාම්ස්චිගේ සංස්කෘතික ආධිපත්‍යය, ලුවී අල්තුසර්ගේ දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ සහ ඩේවිඩ් හාවිගේ නව ලිබරල්වාදය න්‍යායන් මත කළ මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට අනුව පශ්චාත් යුධ ලාංකේය වාණිජ සිනමාව නව ලිබරල් වෙළඳපොළ ක්‍රමවේදය තුළ දේශපාලන ප්‍රභූන්ගේ සහ අධිපතිවාදී ජාතිකවාදයේ පැවැත්ම තහවුරු කරන ප්‍රබල දෘෂ්ටිවාදී උපකරණයක් බව අනාවරණය වන අතර සමස්තයක් ලෙස පශ්චාත් යුධ ලාංකීය දේශපාලන විපරිවර්තනය කෙරෙහි සිනමාවේ මැදිහත්වීම තක්සේරු කිරීමට මෙම පර්යේෂණය මඟින් සුවිශේෂී ශාස්ත්‍රීය දායකත්වයක් සපයයි.

ප්‍රමුඛ පද: සංස්කෘතික ආධිපත්‍යය, දෘෂ්ටිවාදී රාජ්‍ය උපකරණ, නව ලිබරල්වාදය, පශ්චාත් යුධ සිනමාව, සිංහල අධිපතිවාදය

මෙම අධ්‍යයනය සඳහා H.A.S.U. ගීතාංජලීගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල-බෞද්ධ ආධිපත්‍යය සමඟ අභියෝගයට ලක්වන සුළුතර අයිතිවාසිකම් සඳගිරි සෑය සහ හන්තාන උඩුවෙලවත්ත ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයක්

එම්.එල් ජයතුංග
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20290@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ වටපිටාව තුළ සිදුවන බෞද්ධාගමික ස්මාරක ඉදිකිරීම් සහ ඒ වටා ගොඩනැගෙන දේශපාලනික ප්‍රවණතාවලින් සුළුතර ජන කොටස්වල මූලික හා භූමි අයිතිවාසිකම්වලට එල්ල වන බලපෑම වර්තමාන සමාජ-දේශපාලන කතිකාවේ වැදගත් මානයක් ගෙන ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ, මහනුවර හන්තාන උඩුවෙලවත්ත තේ වතුයායේ 'සඳගිරි සෑය' චෛත්‍යය ඉදිකිරීම් සිද්ධිය ආශ්‍රයෙන්, රාජ්‍ය අනුග්‍රහය ලබන සිංහල-බෞද්ධ ආධිපත්‍යවාදී ව්‍යාපෘති හරහා වතුකරයේ ද්‍රවිඩ ජනතාවගේ දේශපාලන, සංස්කෘතික සහ භූමි අයිතිවාසිකම් අභියෝගයට ලක්වන ආකාරය විමර්ශනය කිරීමයි. පරම්පරා ගණනාවක් පුරා තමන් ජීවත් වූ ජීවන අවකාශය තුළ මෙම ආගමික ස්මාරකය ඉදිකිරීම හේතුවෙන් වතුකර ද්‍රවිඩ ජනතාව ද්විතීයික පුරවැසියන් බවට පත්වීම, ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග, ජල මූලාශ්‍ර සහ මංමාවත් වෙනස්වීමට ලක්වීම වැනි ගැටලු මෙහිදී ප්‍රධාන වශයෙන් සාකච්ඡාවට බඳුන් කෙරේ. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක ක්‍රමවේදය භාවිත කළ අතර, හන්තාන උඩුවෙලවත්ත ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් අරමුණු සහගත නියැදීම් ක්‍රමය යටතේ ප්‍රතිචාරකයින් 25 දෙනෙකු තෝරාගනු ලැබ ඇත. ද්‍රවිඩ වතු වැසියන්, බෞද්ධ වන්දනාකරුවන්, සිංහල වෙළෙන්දන් සහ ත්‍රිරෝද රථ රියදුරන් ඇසුරින් අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, අවකාශීය සිතියම්ගතකරණය සහ නිරීක්ෂණ මඟින් ප්‍රාථමික දත්ත රැස් කෙරෙන අතර පොත්, පුවත්පත්, සඟරා ද්විතීයික දත්ත ලෙස භාවිත කෙරේ. තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය මඟින් දත්ත විශ්ලේෂණය කරනු ලබයි. මෙම පර්යේෂණය මඟින් අනාවරණය වූයේ, හන්තාන සඳගිරි සෑය ඉදිකිරීම් ව්‍යාපෘතිය හරහා වතුකරයේ 'අවකාශීය ආධිපත්‍යයක්' නිර්මාණය කර ඇති බවයි. මේ හේතුවෙන් පාරම්පරික වතු වැසියන්ගේ දෛනික ජීවන අවකාශය සීමා වී ඇති අතර, සාම්ප්‍රදායික මංමාවත් සහ ජල මූලාශ්‍ර අහිමි වීමෙන් ඔවුන්ගේ වතු ආර්ථික ජීවනෝපායට සෘජු බලපෑම් එල්ල වී ඇත. චෛත්‍යය වැනි පූජනීය සංකේත භාවිතය හරහා සුළුතර ජනතාව කෙරෙහි සියුම් මානසික පීඩනයක් එල්ල වන අතර, ඔවුන් තමන්ගේ ම භූමිය තුළ 'දෙවැනි පෙළ පුරවැසියන්' බවට පත් කර ඇත. තවද, මෙම ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට වතුකරයේ දේශපාලන නියෝජිතයින් සහ වෘත්තීය සමිති අසමත් වී ඇති බව පෙනී යයි. අවසාන වශයෙන්, ජාතික සැලසුම්කරණයේ දී සහ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී බහුතරවාදී අවශ්‍යතාවලට පමණක් ප්‍රමුඛතාව ලැබීම නිසා වතු වැසියන්ගේ සිවිල් හා සංස්කෘතික අයිතිවාසිකම් ව්‍යුහාත්මකව යටපත් වී ඇති බව මෙම අධ්‍යයනයෙන් තහවුරු වේ.

ප්‍රමුඛ පද: සිංහල-බෞද්ධ ආධිපත්‍යය, වතුකරයේ ද්‍රවිඩ ප්‍රජාව, අවකාශීය දේශපාලනය, සුළුතර අයිතිවාසිකම්, සඳගිරි සෑය

මෙම අධ්‍යයනය සඳහා H.A.S.U. ගීතාංජලීගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කුඩා තේ වතු සම්බන්ධ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම: සූරියකන්ද ප්‍රදේශය ආශ්‍රිත අධ්‍යයනයක්

එන්.පී.වයි.එස් කුසුම්සිරි
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20369@arts.pdn.ac.lk

මේ අධ්‍යයනය ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු ක්ෂේත්‍රය ආශ්‍රිත රාජ්‍ය ප්‍රතිපත්තිය හැදෑරීම කෙරෙහි යොමු වූවකි. සාම්ප්‍රදායිකව දේශපාලන විද්‍යාඥයන් විසින් රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය කෙරෙහි බලපාන දේශපාලන, සමාජ, ආර්ථික සහ සංස්කෘතික සාධක සමඟ හා කොන්දේසි හදාරනු ලබයි. එහෙත් මේ පර්යේෂණය ඊට වෙනස් ය. මෙහි දී ප්‍රධාන වශයෙන් ම උත්සාහ කරනු ලැබුවේ කුඩා තේ වතු සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්තියෙන් අපේක්ෂිත ප්‍රතිඵල බිහි කර තිබේදැ'යි කුඩා තේ වතු හිමියන්ගේ දෘෂ්ටිකෝණයෙන් අවබෝධයට ය. මේ පර්යේෂණය ගවේෂණාත්මක අධ්‍යයනයකි. එහි දී සූරියකන්ද ප්‍රදේශයේ කුඩා තේ වතු හිමියන් පහළොස් දෙනෙකු (15) සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ගුණාත්මක දත්ත රැස්කර ගන්නා ලදි. එම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා තේමාත්මක විශ්ලේෂණ (Thematic Analysis) ක්‍රමවේදය භාවිත කෙරිණි. මෙම තේමා විශ්ලේෂණයේදී හෙළි වූයේ, පවතින රාජ්‍ය ප්‍රතිපත්තිය විසින් අපේක්ෂිත ප්‍රතිඵල බිහිකර නොමැති බවයි. ඊට බලපෑ ප්‍රධාන හේතු කිහිපයක් පර්යේෂණයෙන් සොයාගන්නා ලදි. රාජ්‍ය ප්‍රතිපත්තියෙන් කුඩා තේ වතු හිමියාට සාර්ථක වගා ක්‍රම සඳහා ප්‍රමාණවත් අවබෝධයක් ලබා නොදීම ඉන් ප්‍රධාන වේ. එමෙන් ම පාංශු රක්ෂණය සහ උසස් අස්වනු තාක්ෂණය නිසි පරිදි ලබා නොදීම හේතුවෙන් කුඩා තේ වත්තකින් ලබා ගත හැකි උපරිම ප්‍රතිලාභය අහිමි වන බව හෙළි විය. අධ්‍යයනයට අනුව කුඩා තේ වතු ආශ්‍රිත රාජ්‍ය ප්‍රතිපත්තිවලින් නිසි ඵල අත්පත් කර ගැනීමට ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වෙනස්කම් සිදුවිය යුතුය. ඒ අනුව මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන්ට සහ පාර්ශ්වකරුවන්ට මේ පිළිබඳව නිසි අවබෝධයක් මෙන්ම පැහැදිලි කැපවීමක් ඇති වන ආකාරයට කටයුතු සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වන බව මෙම පර්යේෂණය මඟින් නිගමනය කරයි.

ප්‍රමුඛ පද: රාජ්‍ය ප්‍රතිපත්තිය, කුඩා තේ වතු හිමියන්, සූරියකන්ද, ගුණාත්මක දත්ත, තේමා විශ්ලේෂණය.

මෙම අධ්‍යයනය සඳහා උපුල් අබේරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ක්ෂුද්‍ර මූල්‍ය හා දේශපාලනය: බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රයෙන් අධ්‍යයනයක්

ආර්.එම්.කේ.ටී රාජපක්ෂ
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20548@arts.pdn.ac.lk

මේ අධ්‍යයනය බැලූ බැල්මට දේශපාලනික යැයි නොපෙනෙන ක්ෂුද්‍ර මූල්‍යකරණය ආශ්‍රිත දේශපාලනය පිළිබඳව අවධානය යොමු කරයි. දේශපාලනය යනු බලය, සම්පත් හා අවස්ථා බෙදාහැරීම සම්බන්ධ අරගලයකි. රාජ්‍ය ප්‍රතිපත්ති සහ දේශපාලනය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාහිත්‍යයෙන් හෙළිවන ආකාරයට ප්‍රතිපත්තියට දේශපාලනය බලපානවා සේම ප්‍රතිපත්තියද දේශපාලන ක්‍රියාවලියට බලපායි. ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රචලිත කිරීම ලිබරල් ආණ්ඩු විසින් දුගී ජනතාව ලබාගත් ණය කපා හැරීම සම්බන්ධයෙන් මතුවන දේශපාලනික පීඩනයෙන් මිදීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගයක් ලෙස හඳුනාගත හැකිය. කෙසේ වෙතත් එම ක්‍රියාමාර්ගය ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපොළට පිවිසෙන ග්‍රාමීය ජනතාව මත ඇති කරන සමාජ, ආර්ථික හා දේශපාලනික බලපෑම් ප්‍රමාණවත්ව අධ්‍යයනය කර නොමැත. මේ අධ්‍යයනයේ විශේෂ අවධානය යොමු කරනු ලැබුවේ, එම කරුණු කෙරෙහි ය. අධ්‍යයනය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුවලට සම්බන්ධ වූ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනතාව සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා විස්සකින් ලබාගත් ගුණාත්මක දත්ත භාවිතයට ගනු ලැබුණි. එම දත්ත විශ්ලේෂණයෙන් හෙළි වූයේ, ක්ෂුද්‍ර මූල්‍යය ප්‍රකාශිත ආකාරයට ගොවීන්ට සහ අඩු ආදායම්ලාභී ජනතාවට ණය වෙළඳපොළට පහසු ප්‍රවේශයක් ලබා දීම වෙනුවට ඔවුන් ණය උගුලකට යොමු කර ඇති බවයි. තවද, ක්ෂුද්‍ර මූල්‍ය ණය නියමිත පරිදි ආපසු ගෙවීම වාර්තා වුව ද, එය බොහෝ විට කුඩා කණ්ඩායම් තුළ පවතින සමාජ පීඩනය සහ සාමූහික වගකීම් ක්‍රමවේදයන් හේතුවෙන් සිදුවන බව අනාවරණය විය. එමෙන් ම, ණයගැතිභාවය හේතුවෙන් දරිද්‍රතාවය තවදුරටත් තීව්‍ර වීම, ආර්ථික අනාරක්ෂිතභාවය වැඩිවීම සහ ඒ ආශ්‍රිත සුබසාධන වියදම් දැරීමේ අවශ්‍යතාව ඉහළ යෑම වැනි නව ගැටලු රාජ්‍යයට ද, නිර්මාණය වී ඇති බව මෙම අධ්‍යයනයෙන් හෙළි විය. අනාගත පර්යේෂකයින් කුඩා කණ්ඩායම් ක්‍රමය, සාමූහික ඇපකර ක්‍රමවේද සහ ඒවායේ දේශපාලනික බලපෑම් පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කළ යුතුය.

ප්‍රමුඛ පද: ක්ෂුද්‍ර මූල්‍ය ණය, දේශපාලනය, ණය උගුල, දරිද්‍රතාව, බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මෙම අධ්‍යයනය සඳහා උපුල් අබේරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ කතෝලික ප්‍රජාවේ දේශපාලනය හා කතෝලික සභාව: මැල්කම් රංජිත් යුගය ආශ්‍රිත අධ්‍යයනයක්

ඒ.එස්. සංජීව
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20677@arts.pdn.ac.lk

රටක ආගමික ආයතනයක් යනු, හුදු ආධ්‍යාත්මික මධ්‍යස්ථානයක් පමණක් නොවන එම සමාජය නියෝජනය කරනු ලබන දේශපාලනික සංස්කෘතික හා ආර්ථික ගතිකත්වය නිරූපණය කරනු ලබන සමාජ බලවේගයක් වනු ඇත. එලෙස 16 වැනි සියවසේ යුරෝපීය යටත් විජිතකරණයත් සමඟ කතෝලික සභාව ලංකාව තුළ ස්ථාපනය වන්නට විය. පෘතුගීසි යුගයෙන් පසුව ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාකළ කතෝලික සභාව මැල්කම් රංජිත් යුගය වන විට ලංකා දේශපාලන බලවේගයට සෘජු අභියෝගයක් කළ කණ්ඩායමක් විය. ශ්‍රී ලංකාවේ ආගම සහ දේශපාලනය අතර සම්බන්ධතාව මැල්කම් රංජිත් කාදිනල් යුගයේ කතෝලික සභාව තුළින් අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත මත පදනම්ව ගවේෂණාත්මක අධ්‍යයනයක් සිදු කරනු ඇත. ලේඛන විශ්ලේෂණය, මාධ්‍ය විශ්ලේෂණය හා ලේඛන ආශ්‍රයෙන් විවේචන විශ්ලේෂණයත් පර්යේෂණය විශ්ලේෂණ ක්‍රම සඳහා යොදාගත් අතර ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, ග්‍රන්ථ, මාධ්‍ය සාකච්ඡා, දත්ත රැස්කිරීම සඳහා යොදා ගැනුණි. මෙම පර්යේෂණය ගැටලු ප්‍රකාශය ලෙස කතෝලික පල්ලියේ නායකත්වය ගත් තීරණ කතෝලික ජනතාව කෙරෙහි ඇති කරනු ලැබූ දේශපාලන බලපෑම කුමක්ද? යන්න සාකච්ඡාවට බඳුන් කිරීමයි. මැල්කම් රංජිත් කාදිනල් යුගයේ කතෝලික ජන ප්‍රජාවගේ දේශපාලන චර්යාව කෙරෙහි කාදිලිවරයාගේ නායකත්වය බලපෑම් කළ බව දැකගත හැකිය. ඒ අනුව මැල්කම් රංජිත් යුගය සුළුතර ජනවාර්ගික අයිතිවාසිකම් අමතක කර මහින්ද රාජපක්ෂ යුගයේ සිට අද දක්වා සිංහල වර්ගවාදී දේශපාලනයට උදව් කරන ස්වරූපයක් කතෝලික ප්‍රජාවේ දේශපාලන චර්යාවන් මගින් දැකගත හැකිය. ශ්‍රී ලංකාවේ දේශපාලනය අධ්‍යයනය කිරීමේදී අතීතයේ සිට ම දේශපාලනය හා ආගම අතර ඇති සම්බන්ධතාව හඳුනා ගැනීම වැදගත් වේ. බෞද්ධ පදනමක් යටතේ නිර්මාණය වූ ශ්‍රී ලංකාව වැනි රටක භික්ෂූන්ගේ දේශපාලන මැදිහත්වීම ජාතිවාදී ව්‍යාපාර ආශ්‍රිතව නිර්මාණය වූ දේශපාලන සංස්කෘතිය හඳුනා ගනිමින් පසුකාලීනව කතෝලික ආගම ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත වීමත් සමග කතෝලික සභාවේ ආරම්භය හා දේශපාලන ගමන් මාර්ගය හඳුනා ගැනීමත් මූලිකව වැදගත් වේ. මේ සමඟ කතෝලික නියෝජිතයා වූ මැල්කම් රංජිත් කාදිනල්වරයා පල්ලියේ නායකත්වය යටතේ ගත් තීරණ කතෝලික ජනතාව කෙරෙහි සිදු කරන්නට වූ දේශපාලන බලපෑම හා ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ක්‍රියා කළ ආකාරය මේ අනුව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ආගම, දේශපාලනය, මැල්කම් රංජිත් කාදිනල්වරයා, කතෝලික සභාව, ජනවාර්ගිකත්වය

මෙම අධ්‍යයනය සඳහා උපුල් අබේරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනවල පවතින පුද්ගලවාදී නැඹුරුව: තෝරාගත් සංශෝධන දහයක් ඇසුරින් විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එච්.ටී සෙව්වන්දි
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20719@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය මගින් ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනවල පවතින පුද්ගලවාදී නැඹුරුව පිළිබඳ තෝරාගත් සංශෝධන දහයක් ඇසුරින් විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කර ඇත. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනවල පුද්ගලවාදී නැඹුරුව පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටක නීතියේ ආධිපත්‍යය, ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යූහය හා පොදු යහපත ස්ථාපිත කරන උත්තරීතර නීතියයි. එසේ වූවද, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකර ඇති ඇතැම් සංශෝධන මගින් මහජන යහපත හෝ ආයතනික ශක්තිමත්භාවය ස්ථාපිත කිරීම වැනි සාධනීය වෙනස්කම් සිදුකිරීම වෙනුවට බලය මෙහෙය වන දේශපාලන නායකත්වයේ පටු දේශපාලන අභිමතාර්ථ ඉටුකරගැනීම උදෙසා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිත කර ඇති ආකාරය මෙහිදී විමර්ශනයට ලක් කර ඇත. එමෙන් ම විධායක බලය එක් පුද්ගලයකු වටා කේන්ද්‍රගතවීමේ ප්‍රවණතාව හා එමගින් ආයතනික ස්වාධීනත්වයට එල්ල වූ බලපෑම පිළිබඳ අධ්‍යනය කිරීම මෙහි අනුඅරමුණු වේ. ඒ අනුව, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු, දෙවන, තෙවන, සිව්වන, පස්වන, අටවන, දසවන, පහළොස්වන, දහඅටවන සහ විසිවන යන තීරණාත්මක සංශෝධන දහය පාදක කර ගනිමින් පුළුල් පරාසයක් සහිත විග්‍රහයක් සිදුකර ඇත. එහිදී ව්‍යවස්ථා සංශෝධනවල ප්‍රජාතන්ත්‍රවාදී හෝ පරිපාලනමය ස්වභාවය පිළිබඳ සිදු කළ අධ්‍යයනයන් පැවතියද, සංශෝධනවල පුද්ගලවාදී නැඹුරුව විමර්ශනය කිරීම සඳහා පද්ධතිමය වශයෙන් සිදු කළ පර්යේෂණවල සැලකිය යුතු අඩුවක් ඇති බව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පවතින සාහිත්‍ය විමර්ශනය කිරීමේදී අනාවරණය විය. මේ අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් ප්‍රාථමික දත්ත ඇසුරින් සිදු කර ඇත. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස ව්‍යවස්ථා සංශෝධන, හැන්සාඩ් වාර්තා, ශාස්ත්‍රීය ලිපි, පුවත්පත් වාර්තා, ග්‍රන්ථ යනාදිය උපයෝගී කරගෙන අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය ඇසුරින් අධ්‍යයනය කර ඇත. ව්‍යවස්ථාපිත ස්ථාවරත්වය බිඳ දමමින් බලයේ සිටින පාලකයන්ගේ ධුර කාල සීමාවන් දීර්ඝ කර ගැනීමට, බලය ඒකරාශී කරගැනීමට හා ව්‍යවස්ථාදායකය, අධිකරණය වැනි ස්වාධීන ආයතන දුර්වල කිරීමට මෙම සංශෝධන දේශපාලනික මෙවලම් ලෙස යොදාගෙන ඇති බව පර්යේෂණයේ නිගමනවලට අනුව පැහැදිලි විය. එමෙන් ම මෙම අධ්‍යයනය මගින් නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීමේ වැදගත්කම අවධාරණය කරන අතර ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත ඉතිහාසය සම්බන්ධයෙන් පවතින ශාස්ත්‍රීය දැනුමට පුද්ගලවාදය ඇසුරින් නව මානයක් එක් කරමින් අනාගත ව්‍යවස්ථා සම්පාදකයින්ට පුද්ගල කේන්ද්‍රීය දුර්වලතාවලින් තොර වූ ශක්තිමත් ව්‍යවස්ථාමය රාමුවක් බිහි කිරීමට මාර්ගෝපදේශ සපයන ලදි.

ප්‍රමුඛ පද: 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ව්‍යවස්ථා සංශෝධන, පුද්ගලවාදී නැඹුරුව, ව්‍යවස්ථාපිත ස්ථාවරත්වය, විධායක බලය කේන්ද්‍රගත වීම

මෙම අධ්‍යයනය සඳහා M.W.A.G. අතුල විතානවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ ඡන්දබල ප්‍රදේශයක දේශපාලන පක්ෂවල භූමිකාවඃ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ඡන්දබල ප්‍රදේශය ඇසුරෙන් සිදුකරන අධ්‍යයනයක් (2019-2025)

එම්.ජී.ජී.එන්. සෙව්වන්දි
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20720@arts.pdn.ac.lk

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ ඡන්දදායක චර්යාව හැඩගැස්වීමෙහිලා දේශපාලන පක්ෂවල භූමිකාව පිළිබඳව විමර්ශනය කිරීම අරමුණු කෙරිණි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාසයක් වන තිස්සමහාරාම මැතිවරණය කොට්ඨාසය කේන්ද්‍ර කරගනිමින් 2019-2025 කාල පරාසය තුළ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය ඡන්දායක තීරණවලට බලපාන ආකාරය පිළිබඳ මෙහි දී අවධානය යොමු කරන ලදි. ජාතික මට්ටමේ දේශපාලන ප්‍රවණතා යටතේ සැඟවී ඇති ඡන්දදායකයන්ගේ තීරණවලට බලපාන සාධකවලට වඩා ක්ෂුද්‍ර සාධක සහ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන බලපෑම් පිළිබඳව සාහිත්‍යයේ පවතින හිඩැස පූර්ණය කිරීම මෙම පර්යේෂණය මගින් අපේක්ෂා කෙරිණි. මෙම අධ්‍යයනය සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක දත්ත රැස්කිරීමේ මිශ්‍ර ක්‍රමවේදය අනුගමනය කෙරිණි. ඒ සඳහා ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන අධ්‍යයන ක්ෂේත්‍ර උපයෝගී කරගත් අතර විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය මගින් තොරතුරු විශ්ලේෂණය කෙරිණි. මෙම පර්යේෂණයේ අපේක්ෂිත සොයා ගැනීම් ලෙස 2019-2025 කාලය තුළ දේශපාලන පක්ෂවල සංවිධාන ව්‍යුහය, ප්‍රචාරණ උපාය මාර්ග සහ යහපාලන මැදිහත්වීම් ඡන්දදායකයන්ගේ මැතිවරණ තීරණය කෙරෙහි කෙසේ බලපා ඇත්තේදැයි අවධාරණය කෙරිණි. තවද අධ්‍යයනය මගින් දේශපාලන පක්ෂවලට සහ ප්‍රතිපත්ති සම්පාදකයින්ට තම ප්‍රාදේශීය නායකත්වයේ කාර්ය සාධනය ඇගැයීමට සහ ප්‍රජා අවශ්‍යතාවලට සරිලන පරිදි මැතිවරණ ප්‍රතිපත්ති සකස් කිරීමට අවශ්‍ය නිර්දේශ සහ මගපෙන්වීම් ලබා දෙයි. එසේ ම පක්ෂ භූමිකාවේ ප්‍රාදේශීය සංවර්ධනය සහ ඡන්ද චර්යාව අතර පවතින සංකීර්ණ සම්බන්ධතාව පිළිබඳව නව දැනුම් සම්භාරයක් එක් කිරීමට දායක විය. පර්යේෂණය අවසානයේ දී තිස්සමහාරාම මැතිවරණ බල ප්‍රදේශයේ ඡන්දදායක චර්යාව කෙරෙහි දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය සහ එම මැදිහත්වීම් සෘජුව ම බලපාන ආකාරය පිළිබඳව අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පදඃ ඡන්දදායක චර්යාව, දේශපාලන පක්ෂ, ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රාදේශීය දේශපාලනය

මෙම අධ්‍යයනය සඳහා M.W.A.G. අතුල විතානවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

කෘත්‍රිම බුද්ධිය, මානව අයිතිවාසිකම් හා බටහිර ආධිපත්‍යය (තෝරාගත් පරිශීලක යෙදවුම් ත්‍රිත්වයක් ඇසුරින් සිදු කෙරෙන තුලනාත්මක අධ්‍යයනයක්)

ඩබ්ලිව්.ඩී.එස්.එස්. වන්නිගම
දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20812@arts.pdn.ac.lk

නූතන තොරතුරු යුගයේ කෘත්‍රිම බුද්ධිය ගෝලීය බල අසමතුලිතතාව නැවත ප්‍රතිනිර්මාණය කරන බලවත් භූ දේශපාලනික යාන්ත්‍රණයක් බවට පත්ව ඇත. මෙම පර්යේෂණය දත්ත අධිරාජ්‍යවාදය (Data colonialism), නිරීක්ෂණ ධනවාදය (Surveillance Capitalism) සහ නවලිබරල්වාදය ((Neoliberalism) යන න්‍යායන් සහ සංකල්ප ඇසුරින් Google gemini, Amazin alexa සහ Face app යන තෝරාගත් බටහිර (AI) යෙදවුම් ත්‍රිත්වයේ සංසන්දනාත්මක විශ්ලේෂණයක් මගින් කෘත්‍රිම බුද්ධිය හා මානව අයිතිවාසිකම් අතර සංකීර්ණ බල සම්බන්ධය අධ්‍යයනය කරයි. නවලිබරල් ආර්ථික - දේශපාලනික ව්‍යුහය යටතේ බහුජාතික සමාගම් AI යෙදවුම් මගින් අධිපතිවාදී මෘදු බලය වර්ධනය කර ගැනීම, ගෝලීය දකුණු රටවල දත්ත සම්පත් අනාරක්ෂිත ලෙස සූරා ගැනීම සහ සංස්කෘතික, දේශපාලනික අධිපත්‍ය ස්ථාපිත කිරීමේ රටාවන් මෙහි මූලික අවධානයට ලක්වේ. මෙහිදී ප්‍රධාන වශයෙන් මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ගෝලීය වශයෙන් නොයෙක් නෛතික ප්‍රතිපාදන පැවතියත් බටහිර අධිපතිවාදී කෘත්‍රිම බුද්ධි යෙදවුම් මගින් පුද්ගලිකත්වයේ අයිතිය, තොරතුරු ස්වයං නිර්මාණය කිරීමේ අයිතිය සහ වෙනස්කම් නොකිරීමේ අයිතිය ඇතුළු මානව අයිතිවාසිකම් පද්ධතිමය ලෙස අභියෝගයට ලක්වන්නේ කෙසේද? යන්න අධ්‍යයනය කරන ලදී. ක්‍රමවේදය සම්බන්ධයෙන් ගුණාත්මක ප්‍රවේශයක් මූලික වශයෙන් අනුගමනය කරන ලද අතර ද්විතීයික දත්ත මූලාශ්‍රය යොදා ගැනුණි. ද්විතීයික දත්ත ලෙස ශාස්ත්‍රීය ලිපි, පොත්, වාර්තා හා සිද්ධි අධ්‍යයනයන් භාවිත කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා තේමාත්මක විශ්ලේෂණය, අන්තර්ගත විශ්ලේෂණය සහ App reviews භාවිත කර ඇත. ප්‍රධාන සොයා ගැනීම් පෙන්වා දෙන්නේ නිරීක්ෂණ ධනවාදයේ ආකෘතිය තුළ මෙම AI යෙදවුම් පුද්ගලික දත්තවලට අඛණ්ඩ නිරීක්ෂණය හා ව්‍යාපාරික වශයෙන් අලෙවි කිරීමේ යාන්ත්‍රණයක් ගොඩ නගමින් දත්ත අධිරාජ්‍යවාදයේ ප්‍රකාශනයක් නිරූපණය වන බවයි. නවලිබරල්වාදය යටතේ රාජ්‍යයන් සහ බහුජාතික සමාගම් අතර ඇති සහයෝගීතාව මගින් බටහිර දැනුම් පද්ධති, සංස්කෘතික අදහස් සහ ජීවරූපික දත්ත ගෝලීයකරණය කිරීමෙන් පුද්ගලිකත්වයේ අභියෝග, අනන්‍යතාවන් විකෘති කිරීම සහ සංස්කෘතික ආධිපත්‍යයක් ස්ථාපිත කිරීම සිදුවන බව පෙනී යයි. නෛතික රාමුවල සීමිත බව සහ බල අසමතුලිතතාව නිසා මානව හිමිකම් ආරක්ෂාව තාක්ෂණික ප්‍රාග්ධනවාදී බලවේගවලට යටත් වී ඇත. මෙම සොයා ගැනීම් මත පදනම්ව පර්යේෂණය යෝජනා කරන්නේ දත්ත ස්වෛරීභාවය සංස්කෘතික වශයෙන් සංවේදී AI app සංවර්ධනය සහ ගෝලීය දකුණු රටවල් සඳහා ස්වාධීන රෙගුලාසි ක්‍රමවේදයන් ගොඩ නැගීම අවශ්‍ය බවයි. කෘත්‍රිම බුද්ධිය මගින් මානව හිමිකම් සහ තාක්ෂණික යුක්තිය සහිත ගෝලීය බල සමතුලිතතාවක් වර්ධනය කිරීම යුගයේ ප්‍රධාන සදාචාරාත්මක සහ දේශපාලනික අභියෝගයක් බව මෙම අධ්‍යයනය අවධාරණය කරයි.

ප්‍රමුඛ පද: දත්ත අධිරාජ්‍යවාදය, නිරීක්ෂණ ධනවාදය, නව ලිබරල්වාදය, කෘතිම බුද්ධිය, මානව අයිතිවාසිකම්

මෙම අධ්‍යයනය සඳහා H.A.S.U. ගීතාංජලීගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

தேசிய மக்கள் சக்தி கட்சியின் கொள்கைகளும் தேர்தல் வாக்குறுதிகளும்: சிறுபான்மை இளைஞர்களது நோக்குநிலை

எம்.என்.எப்.பாசிலியா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20177@arts.pdn.ac.lk

இலங்கையின் சமகால அரசியல் சூழலில் ஏற்பட்டுள்ள மாற்றங்கள் மற்றும் புதிய அரசியல் எழுச்சிகளை மையமாகக்கொண்டு இந்த ஆய்வு வடிவமைக்கப்பட்டுள்ளது. 2022ஆம் ஆண்டின் கடுமையான பொருளாதார-அரசியல் நெருக்கடியானது தேசிய மக்கள் சக்தியின் எழுச்சிக்கு வழிவகுத்தது. இச்சூழலில் இந்த ஆய்வு இலங்கையின் பல்லினத் தன்மையைக் கருத்திற்கொண்டு, தமிழ் மற்றும் முஸ்லிம் போன்ற சிறுபான்மை சமூகங்களின் அரசியல் உரிமைகள், மொழி உரிமைகள் மற்றும் மாகாண சபை முறைமை போன்ற அதிகாரப் பகிர்வு தொடர்பான விடயங்களை இப்புதிய அரசியல் இயக்கம் எவ்வாறு அணுகுகிறது என்பதை 2024 ஜனாதிபதி மற்றும் பொதுத்தேர்தல் காலப்பகுதியை அடிப்படையாகக் கொண்டு, தேசிய மக்கள் சக்தியின் கொள்கைகள் மற்றும் தேர்தல் வாக்குறுதிகள் தொடர்பாக இலங்கையின் சிறுபான்மை இளைஞர்களின் நோக்குநிலை பகுப்பாய்வு செய்யப்பட்டுள்ளது. இந்த ஆய்வின் நோக்கங்களாக தேசிய மக்கள் சக்தியின் உருவாக்கம் எவ்வாறு இடம்பெற்றது மற்றும் அதன் பின்னணி என்ன என்பதை கண்டறிதல், தேசிய மக்கள் சக்தியின் பிரதான கொள்கைகள் மற்றும் தேர்தல் வாக்குறுதிகளை ஆழமாக புரிந்துகொள்ளல் மற்றும் தேசிய மக்கள் சக்தி கட்சியின் கொள்கைகள் மற்றும் தேர்தல் வாக்குறுதிகள் தொடர்பான சிறுபான்மை இளைஞர்களது நோக்குநிலையை அடையாளம் காணல் என்பன காணப்படுகின்றன. இந்த ஆய்விற்காக கலப்பு ஆய்வு அணுகுமுறை பயன்படுத்தப்பட்டுள்ளதோடு இந்த ஆய்வுக்கான தரவுகள் நேர்காணல் மற்றும் வினாக்கொத்து மற்றும் இரண்டாம் நிலை தரவு மூலாதாரங்களின் ஊடாக சேகரிக்கப்பட்டு பகுப்பாய்வு செய்யப்பட்டுள்ளன. இந்த ஆய்வில் பாரம்பரிய சிறுபான்மை அரசியல் கட்சிகளின் பலவீனமான செயற்பாடுகள் மீதான அதிருப்தி காரணமாக, சிறுபான்மை இளைஞர்கள் தேசிய மக்கள் சக்தியின் ஊழல் ஒழிப்பு மற்றும் பொருளாதார மறுசீரமைப்பு கோரிக்கைகளால் பெரிதும் ஈர்க்கப்பட்டுள்ளனர். எனினும், பாரம்பரிய இனப்பிரச்சினைக்கான அரசியல் தீர்வு மற்றும் மாகாண சபை முறைமை போன்ற அதிகாரப் பகிர்வு விடயங்களில் அக்கட்சியின் தெளிவற்ற மற்றும் மௌனமான அணுகுமுறை, சிறுபான்மை இளைஞர்கள் மத்தியில் முழுமையான நம்பிக்கையை ஏற்படுத்தாது ஒருவித தயக்கத்தையும் அரசியல் ரீதியான முரண்பட்ட நிலைப்பாட்டையும் தோற்றுவித்தது என கண்டறியப்பட்டுள்ளன. அந்தவகையில், தேசிய மக்கள் சக்தி சிறுபான்மை இளைஞர்களின் நம்பிக்கையைப் பெற வேண்டுமாயின், வெறும் பொருளாதார மற்றும் ஊழல் ஒழிப்பு கோஷங்களுக்கு அப்பால், மொழி உரிமை, அதிகாரப் பகிர்வு மற்றும் சிறுபான்மையினரின் தனித்துவமான அரசியல் சமூக உரிமைகள் குறித்த தனது தெளிவான கொள்கை நிலைப்பாட்டை பகிரங்கமாக பிரகடனப்படுத்த வேண்டும் என இந்த ஆய்வு சிபாரிசு செய்கிறது.

திறவுச் சொற்கள்: சிறுபான்மை இளைஞர்கள், இலங்கை அரசியல், அதிகாரப் பகிர்வு, ஊழல் ஒழிப்பு

மாலினி பாலமயூரன் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

தித்வா புயலுக்குப் பின்னரான மீளெழுச்சி நடவடிக்கைகளில் உள்ளூராட்சி மன்றங்களின் வகிபங்கு: உடுநுவர பிரதேச சபையை மையமாகக் கொண்ட ஆய்வு

ஆர்.எப். ஹுப்ஸா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20211@arts.pdn.ac.lk

அண்மைக்காலமாக உலகளாவிய ரீதியில் அதிகரித்துவரும் காலநிலை சார் இயற்கை அனர்த்தங்கள், வளர்ந்து வரும் நாடுகளின் சமூக - பொருளாதாரக் கட்டமைப்பில் பாரிய பின்னடைவுகளை ஏற்படுத்துகின்றன. இந்தப் பாதிப்புகளைக் குறைத்து இயல்பு நிலைக்குத் திரும்புவதற்கு, தடுத்தல், தயார்நிலை, துலங்கல் மற்றும் மீளெழுச்சி ஆகிய நான்கு கட்டங்களைக் கொண்ட 'அனர்த்த முகாமைத்துவச் சுழற்சி' அவசியமாகிறது. சர்வதேச செண்டாய் கட்டமைப்பின் 'சிறந்த முறையில் மீளக் கட்டியெழுப்பல்' கொள்கையின்படி, அனர்த்தத்திற்குப் பின்னரான மீளெழுச்சிச் செயன்முறைகளில் பாதிக்கப்பட்ட சமூகங்களுடன் நெருங்கிய பிணைப்பைக் கொண்டுள்ள உள்ளூராட்சி மன்றங்களின் பங்கு இன்றியமையாததாகும். இலங்கை தனது புவியியல் அமைவிடம் காரணமாக இயற்கை அனர்த்தங்களை எதிர்கொள்ளும் வாய்ப்பினை அதிகம் கொண்டுள்ளது. 2025 ஆம் ஆண்டு நவம்பர் மாதம் இலங்கையைத் தாக்கிய 'தித்வா' புயலானது 2004 இல் ஏற்பட்ட சுனாமிக்குப் பின்னரான மிக மோசமான இயற்கைப் பேரழிவாகப் பதிவாகியுள்ளது. இந்தப் பின்னணியில் இந்த ஆய்வானது உடுநுவர பிரதேச சபையை மையமாகக் கொண்டு, 'தித்வா' புயலுக்குப் பின்னரான மீளெழுச்சி நடவடிக்கைகளில் உள்ளூராட்சி மன்றங்களின் வகிபங்கை ஆராய்கின்றது. இலங்கையின் அனர்த்த முகாமைத்துவ சட்ட மற்றும் கொள்கைக் கட்டமைப்பிற்கு அமைவாக, 'தித்வா' புயலுக்குப் பின்னரான மீளெழுச்சி நடவடிக்கைகளில் உடுநுவர பிரதேச சபையின் வகிபங்கு, சட்டபூர்வ பொறுப்புகள் மற்றும் அது எதிர்கொண்ட சவால்களைக் கண்டறிவதை இந்த ஆய்வு நோக்கமாகக் கொண்டுள்ளது. இந்த ஆய்வானது பண்பு ரீதியான கருப்பொருள் பகுப்பாய்வாகக் காணப்படுவதுடன், இதற்கான தரவுகள் முதலாம் மற்றும் இரண்டாம் நிலைத் தரவுகளிலிருந்து பெறப்பட்டுள்ளன. ஆய்வு முடிவுகளின்படி, உடுநுவர பிரதேச சபை அவசரகால நிவாரணம் மற்றும் ஆரம்பகட்ட கழிவு முகாமைத்துவத்தில் வினைத்திறனுடன் பங்களித்த போதிலும், அதன் உட்கட்டமைப்பு சீரமைப்பு மற்றும் வாழ்வாதார மீட்புப் பணிகள் மந்தகதியிலேயே காணப்பட்டன. கொள்கை அளவிலான அதிகாரங்களுக்கும் உள்ளூர் நடைமுறைகளுக்கும் இடையே பெரும் இடைவெளி நிலவுகிறது. குறிப்பாக, நிதிப் பற்றாக்குறை, தொழில்நுட்ப, மனிதவளக் குறைபாடு ஆகிய சவால்கள் பிரதேச சபையின் மீளெழுச்சித் திறனைக் கட்டுப்படுத்தியுள்ளன. எதிர்கால அனர்த்தங்களில் மீள்திறன் மீளெழுச்சியை உறுதிசெய்ய அதிகாரப் பரவலாக்கல், நிதி ஒதுக்கீடு அதிகரிப்பு, தொழில்நுட்பத் திறன் அவசியமென இந்த ஆய்வு பரிந்துரைக்கிறது.

திறவுச் சொற்கள்: அனர்த்த முகாமைத்துவம், கழிவு முகாமைத்துவம், தித்வா புயல், மீளெழுச்சி நடவடிக்கைகள், உள்ளூராட்சி மன்றம்

மாலினி பாலமயூரன் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

உள்ளூர் மட்டத்தில் திண்மக்கழிவு முகாமைத்துவம் : யட்டிநுவர பிரதேச சபையை மையப்படுத்திய ஒரு ஆய்வு

எம்.எச்.எப்.ஹஸ்னா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20224@arts.pdn.ac.lk

நகரமயமாக்கல் மற்றும் நுகர்வோர் கலாசார மாற்றங்கள் காரணமாக, திண்மக்கழிவு முகாமைத்துவம் என்பது உலகளாவிய மற்றும் தேசிய மட்டத்தில் முக்கியமானதொரு சுற்றுச் சூழல் மற்றும் பொதுச் சுகாதார சவாலாக மாறியுள்ளது. இருப்பினும், கொள்கை அமுலாக்கத்தில் உள்ள இடைவெளிகள் காரணமாக, இலங்கையின் பெரும்பாலான பிரதேச சபைகள் நிலையான கழிவு மேலாண்மையை உறுதிப்படுத்துவதில் தோல்வியடைந்துள்ளன. இத்தகைய பின்னணியில், நாளாந்தம் உருவாகும் திண்மக்கழிவுகளில் குறிப்பிடத்தக்க ஒரு பகுதி மட்டுமே உள்ளூராட்சி மன்றங்களால் முறையாகச் சேகரிக்கப்படுகின்றன. எஞ்சிய கழிவுகள் திறந்தவெளிக் கொட்டுகை மூலம் அகற்றப்படுவதனால், நிலம், நீர் மற்றும் காற்று மாசுபட்டு பொதுச் சுகாதாரத்திற்கு அச்சுறுத்தலாக அமைகின்றன. இத்தகைய சூழலில், மத்திய மாகாணத்தின், கண்டி மாவட்டத்தில் அமைந்துள்ள யட்டிநுவர பிரதேச சபையை ஆய்வுப் பிரதேசமாகத் தெரிவுசெய்து, அங்கு நடைமுறையில் உள்ள திண்மக்கழிவு முகாமைத்துவத் திட்டங்களின் தற்போதைய நிலைமையையும், அவை எதிர்கொள்ளும் சமூக, பொருளாதார மற்றும் நிறுவன ரீதியான சவால்களையும் விரிவாக ஆராய்வதே இந்த ஆய்வின் முதன்மை நோக்கமாகும். இந்த ஆய்வின் கோட்பாட்டுக் கட்டமைப்பாக ஜப்பான் நாட்டில் 2004 ஆம் ஆண்டு முன்வைக் கப்பட்ட 3R கோட்பாடு (Reduce, Reuse, Recycle) மற்றும் மூலத்திலேயே கழிவுகளை வகைப்படுத்துதல் ஆகிய எண்ணக்கருக்கள் பயன்படுத்தப்பட்டுள்ளன. ஆய்வு முறையியல் ரீதியாக இந்த ஆய்வு, பண்புசார் ஆய்வு அணுகுமுறையைப் பின்பற்றி 15 முக்கிய பங்குதாரர்களுடனான நேர்காணல்கள் மற்றும் நேரடி அவதானிப்புகள் மூலம் முதன்மைத் தரவுகளைச் சேகரித்ததுடன், மையக்குழு கலந்துரையாடல்களையும் நடாத்தி, அத்தரவுகளைக் கருப்பொருள் பகுப்பாய்விற்கு உட்படுத்தியுள்ளது. ஆய்வுக் கண்டுபிடிப்புகளின்படி, பொதுமக்களின் குறைந்த சுற்றுச்சூழல் விழிப்புணர்வு, மூலத்திலேயே கழிவுகளைப் பிரிக்கும் பழக்கமின்மை, போதிய நிதி மற்றும் மனிதவளப் பற்றாக்குறை, தொழில்நுட்ப பீதியாகப் பின்தங்கிய நிலை மற்றும் முறையான சட்ட அமுலாக்கமின்மை ஆகியன இப்பிரதேசத்தின் திண்மக்கழிவு முகாமைத்துவத்தைப் பாதிக்கும் பிரதான காரணிகளாகும். எனவே, இந்த ஆய்வு சட்ட ரீதியாக அமுலாக்கத்தை வலுப்படுத்தல், மக்கள் பங்கேற்பை அதிகரித்தல், 3R கோட்பாட்டை உள்ளூர் மட்டத்தில் உள்ளூர்மயப்படுத்தல், மீள்சுழற்சி முறைகளை அறிமுகப்படுத்தல் ஆகிய மூலோபாயங்களின் மூலம் நிலையான மற்றும் சுற்றுச் சூழலுக்கு உகந்த திண்மக்கழிவு முகாமைத்துவ மாதிரியை உருவாக்குவதற்கான கொள்கை ரீதியான பரிந்துரைகளை முன்வைக்கின்றது.

திறவுச் சொற்கள்: திண்மக்கழிவு முகாமைத்துவம், யட்டிநுவர பிரதேச சபை, உள்ளூர் ஆளுகை, பண்புசார் ஆய்வு, 3R கோட்பாடு

மாலினி பாலமயூரன் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் வாகரைப் பிரதேசத்தில் சிறுவர் உரிமைகளை பாதுகாப்பதில் அரசு சார்பற்ற நிறுவனங்களின் வகிபங்கு: றுழசடன ஏளைழைெ டுயமெய நிறுவனத்தினை மையப்படுத்திய விசேட ஆய்வு.

எம்.லக்சிகா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20381@arts.pdn.ac.lk

இவ்வாய்வானது மட்டக்களப்பு மாவட்டத்தின் வாகரைப் பிரதேச செயலகப் பிரிவில் சிறுவர் உரிமைகளைப் பாதுகாப்பதில் றுழசடன ஏளைழைெ டுயமெய நிறுவனத்தின் வகிபங்கினை மதிப்பீடு செய்வதை நோக்கமாகக் கொண்டுள்ளது. யுத்தத்தினால் பாதிக்கப்பட்ட மற்றும் பின்தங்கிய பொருளாதார சூழலைக் கொண்ட இப்பிரதேசத்தில் சிறுவர் துஃபிரயோகம், சிறுவர் உழைப்பு, பாடசாலை இடைவிலகல் மற்றும் போதிய போஃக்கின்மை போன்ற சவால்கள் சிறுவர் உரிமைகளுக்கு அச்சுறுத்தலாகக் காணப்படுகின்றன. இந்நிலைமைகளைக் கட்டுப்படுத்துவதில் அரச சார்பற்ற நிறுவனங்களின் பங்களிப்பை ஆராய்வது அவசியமானதாகும். இவ்வாய்விற்காகப் பண்புசார் ஆய்வு அணுகுமுறை பயன்படுத்தப்பட்டுள்ளது. முதன்மைத் தரவுகள், அரைக் கட்டமைக்கப்பட்ட நேர்காணல், அவதானிப்பு, நேர்காணல்கள் மற்றும் களஆய்வு மூலம் வாகரைப் பிரதேச சிறுவர்கள், பெற்றோர்கள், சமூக ஆர்வலர்கள் மற்றும் நிறுவன அதிகாரிகளிடமிருந்து பெறப்பட்டுள்ளன. இரண்டாம் நிலைத் தரவுகள் நிறுவன அறிக்கைகள், னுழஉரஅநவெ ளுரசளநல மற்றும் நூல்களிலிருந்தும் திரட்டப்பட்டன. ஆய்வின் கண்டுபிடிப்புகளின்படி, வேர்ல்ட் வி'ன் நிறுவனமானது வாகரைப் பிரதேசத்தில் சிறுவர் பாதுகாப்புக் குழுக்களை பலப்படுத்துதல், பாலியல் மற்றும் உடல் ரீதியான துஃபிரயோகங்களுக்கு எதிரான விழிப்புணர்வுப் பிரசாரங்களை முன்னெடுத்தல் மற்றும் முன்பள்ளி ஆசிரியர்களுக்கான பயிற்சிகளை வழங்குதல் ஆகியவற்றில் முக்கிய பங்கு வகித்துள்ளது. மேலும், வறுமை காரணமாக பாடசாலை தவிர் சிறுவர்களை மீண்டும் கல்வியில் இணைப்பதற்கும் மாணவர்களுக்கான கற்றல் உபகரணங்களை வழங்குவதற்கும் இந்நிறுவனம் கணிசமான பங்களிப்பை வழங்கியுள்ளது. இருப்பினும், நிதியுதவித் திட்டங்களின் தற்காலிகத் தன்மை, கிராமிய மட்டத்தில் அரச அதிகாரிகளுக்கும் (சிறுவர் பாதுகாப்பு உத்தியோகத்தர்கள்) அரச சார்பற்ற நிறுவனங்களுக்கும் இடையிலான ஒருங்கிணைப்புக் குறைபாடு மற்றும் சில பெற்றோர்களின் விழிப்புணர்வின்மை போன்ற சவால்கள் இன்னும் நீடிக்கின்றன என்பது கண்டறியப்பட்டுள்ளது. எனவே, வாகரைப் பிரதேசத்தில் சிறுவர் உரிமைகளை முழுமையாகப் பாதுகாப்பதற்கு, தொண்டு நிறுவனங்களின் திட்டங்கள் நீண்டகாலத் திட்டங்களாக மாற்றியமைக்கப்பட வேண்டும் என்றும் அரச நிறுவனங்களுடன் தொண்டு நிறுவனங்கள் இணைந்து கூட்டுப் பொறிமுறையொன்றின் கீழ் செயற்பட வேண்டும் என்றும் இவ்வாய்வு பரிந்துரைக்கிறது.

திறவுச் சொற்கள்: சிறுவர் உரிமைகள், அரச சார்பற்ற நிறுவனங்கள், றுழசடன ஏளைழைெ டுயமெயஇ வாகரைப் பிரதேசம், சிறுவர் பாதுகாப்பு

நவரத்தினம் சிவகுமார் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

உள்ளூராட்சிசபைகளுக்குத் தெரிவுசெய்யப்பட்ட பெண் அரசியல் பிரதிநிதிகளின் வினைத்திறனும் சவால்களும்: கிண்ணியா நகரசபையினை மையப்படுத்திய ஆய்வு

எஸ்.லுஜித்தா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம
a20394@arts.ac.lk

இலங்கையின் அரசியல் வரலாற்றில் பெண்களின் பங்களிப்பு என்பது நீண்டகாலமாகவே மிகக் குறைந்த மட்டத்திலேயே காணப்பட்டு வந்தது. பெண்கள் சமூகத்தின் அரைபங்கிற்கும் அதிகமாக இருப்பதாலும், பெண்களால் பெண்களுடைய பிரச்சினைகளை சரியாக புரிந்து கொண்டு பொருத்தமான தீர்மானங்களை எடுக்கும் வகையில் பெண்களுடைய பிரதிநிதித்துவத்தினை அதிகரிகக வேண்டும். என்பதாலும் அவர்களை அரசியல் துறையில் அதிகரிக்க எதிர்பார்க்கப்பட்டது. இதன் விளைவாக குறிப்பாக 2017 ஆம் ஆண்டு அறிமுகப்படுத்தப்பட்ட உள்ளூராட்சி தேர்தல் முறைமையில் பெண்களுக்கு குறைந்தபட்சம் 25% ஒதுக்கீடு வழங்கப்பட்டமை, பெண்களின் அரசியல் அதிகாரமளிப்பில் ஒரு முக்கிய முன்னேற்றமாகும். இந்த மாற்றம் பெண்களின் எண்ணிக்கையை உயர்த்தியிருந்தாலும் எண்ணிக்கை உயர்வு மற்றும் அதிகார செயற்திறன் ஆகிய இரண்டிற்கும் இடையே வேறுபாடு காணப்படுகிறது. இதனால், பெண் அரசியல் பிரதிநிதிகளின் வினைத்திறன் மற்றும் அவர்கள் எதிர்கொள்ளும் சவால்கள் கிண்ணியா நகரசபையின் நிர்வாகத்தில் பெண்களின் வினைத்திறனை ஆராய்தல். உள்ளூராட்சி நடவடிக்கைகளில் பெண்ணுறுப்பினர்கள் வினைத்திறணாக பங்கேற்பதை பாதிக்கும் சமூக, அரசியல் மற்றும் கலாசார காரணிகளை அடையாளம் காணுதல் ஆகியவற்றை கண்டறிவதை ஆய்வு நோக்கமாக கொண்டு அமைகின்றது இவ் ஆய்வில் முதலாம் நிலைத் தரவுகளாக கிண்ணியா நகரசபையின் பெண் பிரதிநிதிகள்(05), ஆண் உறுப்பினர்கள் (10), சபை அதிகாரிகள்(05) மற்றும் பொதுமக்களிடம் இருந்து முறையான வினாக்கொத்துகள்(50) மற்றும் ஆழமான அரைக் கட்டமைக்கப்பட்ட நேர்காணல்கள் மூலம் பெறப்படும். இரண்டாம் நிலைத் தரவுகள் சபையின் கூட்ட அறிக்கைகள், உள்ளூராட்சித் துறை சார்ந்த நூல்கள், மற்றும் இணையப் பதிவுகளில் இருந்து திரட்டப்படும். தரவு பகுப்பாய்வு முறையாக கருப்பொருள் பகுப்பாய்வு என்பன ஆய்வு வடிவமைப்புக்களாகும். இவ்ஆய்விற்கு பாலின மற்றும் அரசியல் பிரதிநிதித்துவக் கோட்பாடு பயன்படுத்தப்படுகின்றது. சமூகத்தில் பெண்கள் மக்கள் தொகையில் ஒரு பெரிய பகுதியை கொண்டிருந்தாலும், அரசியல் முடிவெடுக்கும் அமைப்புகளில் அவர்கள் போதுமான அளவில் இடம்பெறவில்லை என்ற நிலையை இந்த கோட்பாடு விமர்சிக்கிறது. இந்த ஆய்வு பெண் அரசியல் பிரதிநிதிகளின் வினைத்திறன் மற்றும் அவர்கள் எதிர்கொள்ளும் சவால்கள் ஆகியவற்றை கண்டறிவதையும் எதிர்கால ஆய்வினை மேற்கொள்வோருக்கு வழிகாட்டியாகவும் அமைகின்றது.

திறவுச் சொற்கள்: பெண்கள், பிரதிநிதித்துவம், உள்ளூராட்சிமன்றம், இடஒதுக்கீடுஇ வினைத்திறன்

நவரத்தினம் சிவகுமார் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

பொதுச்சேவை வழங்கலில் பொதுத்துறை நிர்வாகிகளுக்கும் அரசியல் நிர்வாகிகளுக்கும் இடையிலான அதிகார உறவுகள்: கல்நேவ பிரதேச சபையை மையப்படுத்திய ஆய்வு

எம்.எப். நதா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20456@arts.pdn.ac.lk

உள்ளூராட்சி நிறுவனங்கள் மக்களுக்கு அத்தியாவசிய பொதுச்சேவைகளை வழங்கும் முக்கிய ஆளுகை அமைப்புக்களாகக் காணப்படுகின்றன. இந்நிறுவனங்களின் செயற்பாட்டு வெற்றியானது அரசியல் தலைவர்களுக்கும் பொதுத்துறை நிர்வாகிகளுக்குமிடையிலான அதிகார உறவினால் பெருமளவு தீர்மானிக்கப்படுகிறது. இந்தப் பின்னணியில், 2011-2026 வரையான காலப்பகுதியை அடிப்படையாகக் கொண்டு கல்நேவ பிரதேச சபையில் அரசியல் நிர்வாகிகளுக்கும் பொதுத்துறை நிர்வாகிகளுக்கும் இடையிலான அதிகார உறவுகளும் அவை பொதுச்சேவை வழங்கலில் ஏற்படுத்தும் தாக்கங்களும் இந்த ஆய்வில் ஆராயப்படுகின்றன. இந்த ஆய்வு பண்புசார் அணுகுமுறையின் கீழ் கட்டமைக்கப்பட்டுள்ளது. ஆய்வுக்கான தரவுகள் நேர்காணல் மற்றும் இரண்டாம் நிலைத் தரவு மூலாதாரங்கள் ஊடாகவும் பெறப்பட்டு, சேகரிக்கப்பட்ட தரவுகள் கருப்பொருள் பகுப்பாய்வு முறையின் அடிப்படையில் பகுப்பாய்வு செய்யப்பட்டன. அரசியல் சூழ்நிலைகளின் மாற்றத்திற்கேற்ப நிர்வாக மற்றும் அரசியல் தரப்பினருக்கு இடையிலான அதிகார உறவுகளும் மாற்றமடைந்துள்ளமை கண்டறியப்பட்டுள்ளது. அதன்படி 2018ஆம் ஆண்டுக்கு முன்னர் நிலவிய அரசியல்-நிர்வாக நடைமுறையுடன் ஒப்பிடுகையில், 2018-2023 காலப்பகுதியில் மக்களால் தேர்ந்தெடுக்கப்பட்ட பிரதிநிதிகளும் அதிகாரிகளும் இணைந்து பணியாற்றிய சூழலில் அரசியல் தலையீடுகள் மற்றும் அதிகார எல்லைகளில் காணப்பட்ட தெளிவின்மை போன்ற சவால்கள் பொதுச்சேவை வழங்கலின் வினைத்திறனைப் பாதித்திருந்தன. தொடர்ந்து 2023-2025 இடைப்பட்ட உள்ளூராட்சித் தேர்தல்கள் நடைபெறாத காலப்பகுதியில் தேர்ந்தெடுக்கப்பட்ட மக்கள் பிரதிநிதிகள் இல்லாததால் நிர்வாகத் தீர்மானங்களை எடுப்பதிலும் பொதுச்சேவைகளை வழங்குவதிலும் அதிகாரிகளின் வகிபாகம் அதிகரித்து அது அதிகார உறவுகளில் புதியதொரு பரிமாணத்தை ஏற்படுத்தியது. மேலும் 2025 புதிய அரசியல் தலைமைக்குப் பின்னரான காலப்பகுதியில் புதிய அரசியல் சூழல் மற்றும் கொள்கை மாற்றங்களுக்கு ஏற்ப நிர்வாக மற்றும் அரசியல் தரப்பினருக்கிடையிலான அதிகார உறவுகள் மேலும் மாற்றமடைந்துள்ளமை வெளிப்பட்டது. எனவே, உள்ளூர் ஆளுகையை வலுப்படுத்துவதற்கு அரசியல் மற்றும் நிர்வாகத் தரப்பினரின் அதிகார எல்லைகளை தெளிவுபடுத்துவதுடன் பரஸ்பர ஒத்துழைப்பை மேம்படுத்தும் நிறுவனச் சூழலை உருவாக்குவதும் அவசியம் என்பதை இந்த ஆய்வு பரிந்துரைக்கின்றது.

திறவுச் சொற்கள் : உள்ளூர் ஆளுகை, பொதுச்சேவை வழங்கல், பொதுத்துறை நிர்வாகி, அரசியல் நிர்வாகி, அதிகார உறவுகள்

மாலினி பாலமயூரன் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

ஜப்பான் - இலங்கை இரு தரப்பு உறவின் மீது தேசிய மக்கள் சக்தி (NPP)அரசாங்கத்தின் ஆளுகை சீர்திருத்தத்தின் தாக்கம் : வாய்ப்புகளும் வரையறைகளும்

எம்.எம்.நிவ்லா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20467@arts.pdn.ac.lk

ஜப்பான் மற்றும் இலங்கை ஆகிய இரு நாடுகளுக்குமிடையிலான வரலாற்று ரீதியான இருதரப்பு உறவானது 1952 சான் பிரான்சிஸ்கோ அமைதி மாநாடு மற்றும் அதிகாரபூர்வ அபிவிருத்தி உதவி ஆகியவற்றின் மூலம் வலுப்பெற்றிருந்த போதிலும், 2019-2022 காலப்பகுதியில் முக்கியமான ஜப்பானிய முதலீட்டுத் திட்டங்கள் ஒரு தலைப்பட்சமாக இரத்துச் செய்யப்பட்டமையால் கடுமையான இராஜதந்திர விரிசலைச் சந்தித்தது. இவ்வாறு கொள்கை உறுதியற்ற தன்மை, ஊழல் நிறைந்த நிர்வாகக் குறைபாடுகளால் ஜப்பானிய முதலீட்டாளர்கள் மத்தியில் இலங்கையின் நம்பகத்தன்மை வீழ்ச்சியுற்றிருந்த பின்னணியில், தற்போதைய NPP அரசாங்கத்தின் முறைமை மாற்றம் மற்றும் அதனோடு இணைந்த நிர்வாகச் சீர்திருத்தங்கள் முக்கியத்துவம் பெறுகின்றன. இந்த ஆட்சி மாற்றமானது அரகலய போராட்டம் மற்றும் பொருளாதார நெருக்கடியின் விளைவாக உருவானது. இந்த நெருக்கடிச் சூழலில் வழமையான வெளியுறவு, இராஜதந்திரம் பின்னடைவைச் சந்தித்திருந்த நிலையில், ஆட்சிக்கு வந்த NPP அரசாங்கம் அனைத்து நாடுகளுடனும் சமநிலையைப் பேணும் ஆரடவை-யடபைஎநவெ அணுகுமுறையை முன்னெடுத்தது. இவ்வெளியுறவுக் கொள்கை மாற்றமே ஜப்பான் போன்ற நாடுகள் இலங்கையுடன் மீண்டும் இருதரப்பு உறவுகளில் நெருக்கமாக ஈடுபட முதன்மைக்காரணமாக அமைந்துள்ளதென்பதை ஆராய்வதே இவ்வாய்வின் முக்கிய நோக்கமாகும். நவபண்டைய யதார்த்தவாதக் கோட்பாடு பயன்படுத்தப்பட்டுள்ளதுடன் பண்புசார் ஆய்வு அணுகுமுறையை அடிப்படையாகக் கொண்டு, முதல்நிலைத் தரவுகளும் இரண்டாம்நிலைத் தரவுகளும் இவ் ஆய்விற்காகப் பயன்படுத்தப்பட்டுள்ளன. இவ்வாய்வின்படி NPP அரசாங்கத்தின் ஊழல் ஒழிப்பு நடவடிக்கை உள்ளிட்ட ஆளுகை சீர்திருத்தங்கள், ஜப்பானின் குழுஜீ கொள்கையின் ஓர் பண்புக்கூறாகிய "தரமான உட்கட்டமைப்பு" என்பதுடன் பெரிதும் ஒத்துப் போகின்றன எனலாம். மேலும், NPP அரசாங்கம் பின்பற்ற முயற்சிக்கும் ஆரடவை-யடபைஎநவெ வெளிநாட்டுக் கொள்கை இந்து சமுத்திரத்தை மையப்படுத்தி இடம்பெறும் வல்லரசுகளின் போட்டிகளுக்குள் சிக்காமல் சமநிலையை பேணுவதற்கான வாய்ப்புக்களைக் கொண்டுள்ளதால் ஜப்பானுடன் இழந்து காணப்படுகின்ற நம்பகத்தன்மையை மீண்டும் கட்டியெழுப்ப ஒரு வாய்ப்பாக மாற்றுகிறது என இவ்வாய்வு உறுதிப்படுத்துகிறது.

திறவுச் சொற்கள்: NPP, ஜப்பான்-இலங்கை உறவு, இந்தோ-பசுபிக் மூலோபாயத்திட்டம், நிர்வாகச் சீர்திருத்தம், மூலோபாயப் பங்குடைமை

எம்.எம்.இஜாஸ் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

ஜப்பானின் இந்தோ–பசுபிக் மூலோபாயத் திட்டம் இலங்கையின் வெளிநாட்டு கொள்கை நிலைப்படுத்தலில் ஏற்படுத்தும் தாக்கம் : ஒரு சிறப்பு ஆய்வு (2024 – 2026)

எம்.ஏ.எப். நுஸ்ரத்
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
fnuzrath46@gmail.com

21ஆம் நூற்றாண்டின் புவிசார் அரசியலில் மூலோபாய முக்கியத்துவமிக்க பிராந்தியமாக இந்தோ – பசுபிக் பிராந்தியம் எழுச்சியடைந்துள்ள நிலையில் பிராந்திய வல்லரசுகளுக்கிடையிலான புவிசார் அரசியல் போட்டியும் தீவிரமடைந்துள்ளன. இப்பிராந்திய வல்லரசுகள் குழுஜீ, டீசுஐ போன்ற மூலோபாயத் திட்டங்களினூடாக தமது ஆதிக்கத்தை நிலைநாட்டுவதற்கு இலங்கை போன்ற கடல்சார் மூலோபாய முக்கியத்துவமிக்க நாடுகளின் பங்களிப்பு இன்றியமையாததாக உள்ளது. மறுபுறம் இலங்கை தனது தேசிய நலன்களை அடைந்து கொள்ள, தன்னை ஒரு 'இந்து சமுத்திர கரையோர நாடாக' நிலைப்படுத்துவற்கு அதிக ஈடுபாடு காட்டி வருவதோடு, வல்லரசுகளுக்கு இடையிலான அதிகாரப் போட்டியில் சிக்கிக்கொள்ளாமல் தன்னை பாதுகாத்துக்கொள்ளும் நோக்கில் பல் அணிசேர்வு (ஆரடவை - யடபைஅெநவெ) எனும் கொள்கையையும் கைக்கொள்ள முற்பட்டுள்ளது. இத்தகைய பின்னணியில் NPP அரசாங்கம் தனது "பல் அணிசேர்வு" வெளியுறவு அணுகுமுறையைக் கொண்டு ஜப்பானுடன் குழுஜீ மூலோபாயத் திட்டத்தில் இணைந்து செயற்படுவதில் தனது ஈடுபாட்டை வெளிப்படுத்தியுள்ள நிலையிலும், ஏலவே சீனாவின் டீசுஐ திட்டத்தில் நெருக்கமாக இணைந்து செயற்படுகின்ற நிலையிலும், அது இலங்கையின் வெளிநாட்டுக் கொள்கை நிலைப்படுத்தலில் எத்தகைய தாக்கங்களை ஏற்படுத்தக் கூடும் என்பதில் கவனம் செலுத்தியதாகவே இவ் ஆய்வு அமையப்பெற்றுள்ளது. அதனடிப்படையில் இவ் ஆய்விற்கான தரவுகள் நேர்காணல் மூலமாகவும் இரண்டாம் நிலைத் தரவுகளினூடாகவும் பெறப்பட்டுள்ளன. இவ்வாய்வு பண்புசார் அணுகுமுறையின் கீழ் கட்டமைக்கப்பட்டுள்ளதோடு இவ்வாய்வில் ர்நனபபெ கோட்பாடு பயன்படுத்தப்பட்டுள்ளது. அதனடிப்படையில் இம்மூலோபாயத் திட்டத்தினூடாக, இலங்கை அடையப்பெறும் வாய்ப்புகள் மற்றும் சவால்களானது, NPP அரசாங்கம் பல் அணிசேர்வு எனும் கொள்கையை கையாளும் விதத்திலேயே தங்கியுள்ளது என இவ்வாய்வில் கண்டறியப்பட்டுள்ளது. எனவே குழுஜீ மூலோபாயத்திட்டத்துடன் இணைந்து செயற்படுவதனூடாக வாய்ப்புகளை அதிகரித்து சவால்களை குறைத்துக்கொள்ள வேண்டுமாயின் இலங்கை பல் அணிசேர்வு எனும் கொள்கையை மதிநுட்பமாக கையாண்டு பிராந்திய வல்லரசுகளிடையே சமநிலையைப் பேண வேண்டுமென இவ் ஆய்வு பரிந்துரைக்கின்றது.

திறவுச் சொற்கள் : குழுஜீ மூலோபாயத் திட்டம், இந்து சமுத்திர கரையோர நாடு, பல் அணிசேர்வு, ர்நனபபெ கோட்பாடு

எம்.எம்.இஜாஸ் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும் பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

இலங்கை முஸ்லிம் தனியார் சட்டத் திருத்தம் பற்றிய விவாதம்: ஓர் விமர்சனப் பார்வை

எம்.எல். லத்பான் ரோசின்
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
a20628@arts.pdn.ac.lk

இலங்கையில் வாழும் சிறுபான்மைச் சமூகங்களின் மிக நீண்ட காலப் பிரச்சினைகளில் ஒன்று முஸ்லிம் விவாக மற்றும் விவாகரத்து சட்டத் திருத்தமாகும். கடந்த 70 ஆண்டுகளுக்கு மேலாக எவ்வித ஆக்கபூர்வமான தீர்வுகளின்றி இது தொடர்ச்சியாக இழுபறியிலுள்ளது. இதனை வெறுமனே சட்டச் சிக்கலாகவோ, மார்க்க முரண்பாடாகவோ அல்லது பெண்ணுரிமைப் பிரச்சினையாகவோ மட்டும் பார்ப்பது முழுமையாகாது. மாறாக 2009ஆம் ஆண்டிற்குப் பின்னர் நாட்டில் மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் கையாண்ட மாறுபட்ட அரசியல் அணுகுமுறைகள், அவற்றின் வகிபாகங்கள் மற்றும் கொள்கை மாற்றங்கள், உண்மையான சீர்திருத்த முயற்சிகளை எவ்வாறு பாதித்துள்ளது என்பதை ஆராய்வதே இவாய்வின் முதன்மை வாதமாகும். முஸ்லிம் சமூகம் சார்ந்த சமூகச் செயற்பாடாக ஆஆனுயு உள்ளதால் சமூக இயக்கக் கோட்பாட்டின் பிரிவான "அரசியல் வாய்ப்புக் கட்டமைவை" (POS) ஆய்வின் கோட்பாட்டுச் சட்டகமாகக் கொண்டு பண்புசார் ஆய்வு முறையில் இந்த ஆய்வு மேற்கொள்ளப்பட்டுள்ளது. இதற்காக அரசியல்வாதிகள், பல்கலைக்கழக விரிவுரையாளர்கள், பெண்ணிய மற்றும் சமூக செயற்பாட்டாளர்கள், அமைப்புகள் மற்றும் ஆளுங்கட்சிப் பிரதிநிதிகள் ஆகியோரிடம் பெறப்பட்ட நேர்காணல் மூலமான தரவுகளும் நூல்கள், ஆய்வறிக்கைகள், சட்டமூலங்கள், பாராளுமன்ற குழு அறிக்கைகள் மூலமான தரவுகளும் திரட்டப்பட்டு அவை முறையாக கருப்பொருள் பகுப்பாய்வுக்கு உட்படுத்தப்பட்டுள்ளது. ஆய்வின் கண்டுபிடிப்புகளின் படி, வெவ்வேறு அரசாங்கங்களின் மாறுபட்ட கொள்கைகள், தந்திரக் கையாளுகை மிக்க அணுகுமுறைகள், மிக முக்கியமாக இச்சீர்திருத்தச் செயன்முறையை இழுபறி நிலைக்குத் தள்ளியுள்ளது என்பது அரசியல் வாய்ப்புக் கட்டமைவு கோட்பாட்டின் பண்புக் கூறுகளினூடாகத் தெளிவாகின்றது. குறிப்பாக 2009-2015 மஹிந்த ராஜபக்ஷ காலப்பகுதியின் அதிகாரத்துவமிக்க மூடிய அரசியல் சூழல், அடுத்து வந்த 2015-2019 நல்லாட்சி அரசாங்கத்தின் ஆளுங்கட்சி பேணிய உயர்குழாம் கூட்டணி, 2019-2022 கோட்டாபய ராஜபக்ஷ காலத்தில் ஒரே நாடு ஒரே சட்டம் என்ற பேரினவாத கொள்கையின் கீழ் உருவான அரசின் அடக்கு முறை, 2022-2024 ரணில் விக்ரமசிங்க அரசாங்கத்தில் சிறுபான்மை உரிமைகளுக்கான அரசியல் வாய்ப்புகள் மூடப்பட்டு சீர்திருத்தம் காலம் கடத்தப்பட்டது. எனினும் தற்போதைய தேசிய மக்கள் சக்தி (NPP) அரசாங்கம் முஸ்லிம் சமூகத்தின் உள்ளக இணக்கப்பாட்டினூடாகவே சீர்திருத்தம் நிகழ வேண்டும் என்ற நிதானப் போக்கைக் கொண்டுள்ளது. சுருங்கக்கூறின், சீர்திருத்தம் தொடர்ச்சியாக தாமதமாவதற்கு சட்டச் சிக்கல்கள் காரணமல்ல மாறாக அரசியல் முறைமையின் திறந்த தன்மையில் ஏற்படும் ஏற்ற இறக்கங்கள், அரசின் அடக்குமுறைகள் மற்றும் சிறுபான்மைத் தலைமைகளுடனான தேர்தல் கூட்டணிகளுமே பிரதான காரணங்களாகும். ஒவ்வொரு அரசாங்கங்களின் அரசியல் வாய்ப்புக் கட்டமைப்பின் நகர்வுகளுக்கு ஏற்ப MMDA போன்ற முஸ்லிம் சமூக இயக்கச் செயற்பாடுகள் எவ்வாறு மாற்றமடைந்து வந்துள்ளன என்பதை ஒப்பிட்டு புரிந்து கொள்ள இவ்வாய்வு பெருமளவு பங்களிக்கிறது.

திறவுச் சொற்கள்: முஸ்லிம் தனியார் சட்டம் (MMDA), அரசாங்கங்களின் அணுகுமுறை, அரசியல் வாய்ப்புக் கோட்பாடு, தேசிய பாதுகாப்பு, இலங்கை அரசியல்

எம்.எம்.இஜாஸ் அவர்களின் வழிகாட்டுதலினையும் மேற்பார்வையினையும்
பெற்றுக்கொண்டேன் என்பதனை நான் நன்றியுடன் வெளிப்படுத்த விரும்புகின்றேன்.

.

இலங்கையின் தேசிய எரிசக்திக் கொள்கையில் சீனா-இந்தியா புவிசார் அரசியல் போட்டியின் தாக்கம் (2016-2025)

என்.எப்.உஸ்னா
அரசறிவியற் துறை, பேராதனைப் பல்கலைக்கழகம்
husnafathima514@gmail.com

Women's increasing participation in paid employment has contributed to changes in family economic structures. However, the extent to which women's financial contribution influences gender role expectations within marriage remains unclear, particularly in the multicultural Sri Lankan society. This study explored how wives' fixed monthly income shapes husbands' expectations regarding economic responsibility, household roles and decision-making within married couples. A qualitative research design was employed using purposive sampling. Semi-structured face-to-face interviews were conducted separately with eight married couples in which both partners earned a fixed monthly income. Data were analysed through thematic analysis and interpreted using the Household Bargaining Model. The findings revealed that women's fixed income made a significant contribution to household financial stability by supporting family expenses, financial planning and loan repayments. Nevertheless, men continued to be viewed as the primary economic providers, while women's earnings were commonly perceived as supplementary rather than central to household income. Traditional gender role expectations remained largely unchanged, with women continuing to carry the primary responsibility for household work and child care, despite full-time employment. Although some men participated in domestic tasks, their involvement was generally understood as supportive rather than representing equal responsibility. Decision-making related to household and career matters was mostly shared between spouses and did not significantly increase women's independent authority. The study concludes that women's financial contribution strengthens family well-being but only partially challenges traditional gender roles, which remain strongly shaped by cultural and social expectations within multicultural Sri Lankan families.

Keywords: wife's fixed income, husband's expectations, household bargaining power

I wish to acknowledge Ramila Usoof for her guidance and supervision.

A COMPARATIVE STUDY OF SHARING BEHAVIOUR AMONG CHILDREN AGED 6-11 YEARS LIVING IN INSTITUTIONAL CARE AND BIOLOGICAL HOMES

S.M.S.T. Sakalasooriya
Department of Psychology, University of Peradeniya
a20647@arts.pdn.ac.lk

Sharing behaviour is an important aspect of children's prosocial development and social functioning. It includes costly sharing, in which children sacrifice their own resources to benefit others, and non-costly sharing, in which sharing occurs without personal loss. Although children's sharing behaviour has been widely studied, no previous research has directly compared costly and non-costly sharing between children living in institutional care and those living with their biological parents in Sri Lanka. This study examined differences in overall sharing behaviour, costly sharing, and non-costly sharing among children aged 6-11 years across these caregiving environments. A quantitative between-subjects quasi-experimental design was employed. The sample consisted of 80 children aged 6-11 years, including 40 children in four institutional care settings in the Kandy District and 40 children living with their biological parents. Participants were selected using purposive sampling. Sharing behaviour was assessed using a sticker-sharing task in which children selected five favourite stickers, received five standardised neutral stickers, and were invited to share as many as they wished to share with a hypothetical friend. Independent-samples *t*-tests were conducted to analyse the data. The study found differences in overall sharing behaviour, costly sharing, and non-costly sharing between the two groups, with children living with their biological parents showing higher levels of sharing. Age and birth order were also found to influence the children's sharing behaviour. These findings enhance the understanding of how caregiving environments shape prosocial development and provide evidence to support interventions promoting sharing behaviour and other prosocial behaviours among children in institutional care.

Keywords: sharing behaviour, prosocial behaviour, institutional care, biological homes, costly sharing

I wish to acknowledge N.D.G. Liyanage for his guidance and supervision.

EXPLORING THE EFFECTIVENESS OF RHYTHMIC MOVEMENT FOR EMOTIONAL WELL-BEING AMONG OLDER ADULTS IN SRI LANKAN RESIDENTIAL CARE HOMES

B.G.U.D. Sandamala
Department of Psychology, University of Peradeniya
a20661@arts.pdn.ac.lk

Population ageing is a rapidly emerging global phenomenon. Sri Lanka is one of the fastest ageing countries in South Asia. Ageing is often accompanied by emotional challenges such as loneliness, sadness, low self-esteem, and reduced life satisfaction, which may negatively affect emotional well-being. Emotional well-being is a key component of positive ageing**.** This study explored the effectiveness of a rhythmic movement intervention in enhancing emotional well-being among older adults. There is insufficient empirical evidence specifically examining the impact of rhythmic movements on emotional well-being among older adults. A mixed-methods research design was employed involving 30 older adults (n=30, 5 men and 25 women) aged between 60 and 86 years. The quantitative component utilised a pre-test and post-test design to assess changes in emotional well-being following a structured rhythmic movement intervention consisting of 14 sessions. Emotional well-being was measured using the WHO-5 Well-Being Index. Data were statistically analysed using a paired sample t-test after confirming the normality assumption (Shapiro-Wilk: W= .968, p = .474). The results indicated a statistically significant improvement in emotional well-being following the intervention. Participants' emotional well-being scores increased from (M=40.9, SD = 9.26) at pre-test to (M= 75.5, SD = 11.25) at post-test, with the difference being highly significant (t (29) = -15.1, p< .001). The qualitative component involved semi-structured interviews with ten participants selected from the intervention group. Thematic analysis revealed five themes: emotional enhancement, meaningful life reflection, mind-body well-being and physical vitality, social connectedness and social well-being, and engagement and sustained participation. Overall, the study demonstrated that rhythmic movement is an effective and accessible intervention for improving emotional well-being among older adults. The findings contribute to the growing body of literature on positive ageing and support the integration of rhythmic movements into programs designed to promote emotional well-being among older adults in Sri Lanka.

Keywords**:** older adults, rhythmic movement, emotional well-being, mixed-methods research, positive ageing

I wish to acknowledge Danesh Karunanayake for his guidance and supervision.

EXPLORING THE LIVED EXPERIENCES OF RESPONSIBILITIES, RIGHTS AND SELF-ESTEEM AMONG OLDER ADULTS AFTER RETIREMENT

U.V.S.L. Sandaruwani
Department of Psychology, University of Peradeniya
a20671@arts.pdn.ac.lk

With the rapid growth of the ageing population in Sri Lanka, understanding older adults' experiences after retirement has become increasingly important. While previous studies have mainly examined caregiving, well-being, identity or independence separately, limited qualitative research has explored the lived experiences of responsibilities, rights and self- esteem among retired older adults in Sri Lanka. A qualitative research approach was adopted using semi-structured interviews with 14 older adults aged 60 years and above who had retired from the government sector and were living with their families. Participants were selected through purposive sampling, and the data were analysed using thematic analysis. The findings revealed that retirement changes rather than reduces older adults' responsibilities, with family responsibilities, grandchild care, and some participants also reported that engaging in religious and community or social responsibilities became meaningful aspects of later life. Experiences of respect and participation in family decision-making contributed to a sense of self-worth. Continued engagement with family, religious and social activities, together with satisfaction from fulfilling their family responsibilities, witnessing their children's success further enhanced their life satisfaction. Overall, meaningful responsibilities, perceived rights within the family and continued social participation appeared to strengthen self- esteem among participants. These findings contribute to a better understanding of positive ageing in the Sri Lankan context and highlight the importance of promoting supportive family relationships, respect for older adults' rights and opportunities for meaningful participation in later life.

Keywords: older adults, retirement, responsibilities, rights, self-esteem

I wish to acknowledge Ramila Usoof for her guidance and supervision.

PERCEIVED DETERMINANTS OF IDENTITY AND WELL-BEING AMONG UNDERGRADUATES WHO ARE LIVING WITH ROOMMATES

H.A.Y. Ashani Senavirathna
Department of Psychology, University of Peradeniya
a20701@arts.pdn.ac.lk

University life is a transitional period characterised by social, emotional, and personal changes. Living with roommates is a common experience among undergraduates and may influence students' identity development and well-being through daily interactions, social support, adjustment experiences, interpersonal relationships and shared living arrangements. Understanding students' perceptions of these experiences is important for exploring how identity and well-being are shaped within university residential environments. This study explored the perceived determinants of identity and well-being among undergraduates living with roommates. A qualitative research design was employed to gain a deeper understanding of students' lived experiences. Data were collected through semi-structured interviews with fourteen undergraduate students selected using purposive sampling. The sample consisted of seven male and seven female students representing the different years of study from different faculties. The data were analysed using thematic analysis to identify patterns and themes related to identity and well-being. The study found several perceived determinants of identity and well-being among undergraduates living with roommates. It showed that supportive relationships with roommates, effective communication, mutual respect, acceptance of individual differences, and successful adjustment to shared living environments were associated with greater self-expression, personal growth, a stronger sense of belonging, and enhanced emotional well-being. On the other hand, interpersonal conflicts, privacy concerns, difficulties in maintaining personal boundaries, and cultural or personality differences were found to negatively influence students' emotional experiences and sense of self. Furthermore, the study highlighted the importance of coping strategies in managing stress and maintaining psychological well-being within shared residential settings. The findings contribute to a deeper understanding of the perceived determinants of identity and well-being among undergraduates living with roommates and provide valuable insights for universities in developing supportive residential environments that foster students' personal development, social adjustment, and psychological well-being.

Keywords: perceived determinants, identity development, well-being, roommate relationships, undergraduates

I wish to acknowledge Asanka Bulathwatta for his guidance and supervision.

PSYCHOLOGICAL FACTORS INFLUENCING ROAD ACCIDENTS: A QUALITATIVE STUDY AMONG LONG-DISTANCE SLTB BUS DRIVERS AGED 30-50 IN SRI LANKA

K.N.C. Sewmini
Department of Psychology, University of Peradeniya
a20711@arts.pdn.ac.lk

Long-distance public transportation in Sri Lanka poses severe physical and mental challenges to bus drivers, making the study of their psychological well-being and coping mechanisms critical for road safety. This study investigated how age and years of service influence occupational stress, fatigue management, risk perception, and substance use among Sri Lanka Transport Board (SLTB) bus drivers. Utilising a qualitative thematic analysis, the study examined interview data from ten (10) SLTB drivers aged 30 to 50, with varying work experience, operating across major long-distance routes. The findings revealed that while all drivers experience severe physical fatigue and cognitive overload due to prolonged driving, significant behavioural variations emerge based on age and experience. Younger drivers (aged 30–35) exhibited an optimism bias, engaged in higher risk-taking, and coped with drowsiness using fast music, energy drinks, or smoking. Conversely, experienced drivers (aged 40+) practised defensive driving, reduced speeds when stressed, and utilised traditional coping methods like chewing betel nut or drinking ginger tea. Occupational stress across all cohorts was heavily driven by private bus competition, rigid depot targets, and severe personal financial or family anxieties. The data also indicated the clandestine use of illicit substances, such as cannabis and pills, among some night-shift drivers to combat sleepiness. Ultimately, this study highlighted that younger drivers relied on high-risk, artificial stimulants to manage fatigue, whereas older drivers faced health-related anxieties. To mitigate road accidents and enhance driver well-being, it is recommended to implement an integrated joint timetable for private and public buses, introduce ergonomic driver cabins, enforce speed limiters, and provide mandatory medical screenings alongside mental health counselling.

Keywords**:** driver fatigue, occupational stress, risk perception, road safety, SLTB

I wish to acknowledge Danesh Karunanayake for his guidance and supervision.

EXPLORING PSYCHOLOGICAL DETACHMENT FROM WORK, AMONG EXECUTIVE-LEVEL EMPLOYEES LIVING IN EMPLOYER-PROVIDED ACCOMMODATION

A.V.D.I.M. Shasheema
Department of Psychology, University of Peradeniya
a20731@arts.pdn.ac.lk

Psychological detachment from work means being able to stop thinking about work during free time. It is important for employee health, recovery, and doing well at work. Many studies have looked at detachment among regular employees, but very few have focused on executives who live in housing provided by their employer. These executives face a unique problem because they cannot physically leave their workplace at the end of the day. This makes it hard for them to mentally switch off and recover from work stress. This study explored how executives living in employer-provided housing managed to detach from work and the strategies they used to separate their work and home lives. The study used three main theories: Boundary Theory, which looked at how people manage different roles; the Effort-Recovery Model, which explained why rest is important; and Conservation of Resources Theory, which showed how losing personal resources like privacy and time leads to stress. Semi-structured interviews were conducted with 10-15 executives who live in on-site housing provided by their organisations. Thematic analysis was used to understand their experiences and the strategies they use. Previous research on FIFO workers, military personnel, and urban employer housing showed that living where you work blurs the line between job and home. Studies on smartphone use also showed that constant connectivity makes it harder to disconnect. Based on this, it was found that executives struggled to detach because they lacked physical boundaries, were always connected through technology, and lived closer to colleagues. To cope, they used strategies like small rituals, changing their mindset, or taking short breaks. This study adds to the limited research on employer-provided housing and offers practical suggestions for organisations to better support executive well-being.

Keywords*:* psychological detachment, employer-provided accommodation, executive well-being, work-home boundaries, boundary management

I wish to acknowledge Nethmi Liyanage for her guidance and supervision.

EXPLORING THE MENTAL WELL-BEING OF CLUB SANDWICH GENERATION CAREGIVERS IN SRI LANKA

T.M.G.G.L.M. Thennakoon
Department of Psychology, University of Peradeniya
a20777@arts.pdn.ac.lk

The club sandwich generation refers to individuals who simultaneously provide care for their ageing parents, adult children and grandchildren. Balancing these multiple caregiving responsibilities can significantly affect caregivers' mental well-being and quality of life. Despite the increasing prevalence of multigenerational caregiving in Sri Lanka, limited research has explored the experiences and mental well-being of club sandwich generation caregivers. Therefore, this study aimed to explore the mental well-being of club sandwich generation caregivers in Sri Lanka. The study specifically sought to explore caregivers' lived experiences and responsibilities, identify the emotional and psychological challenges they faced, understand the coping strategies they employed and examine the perceived role of family and social support in maintaining their well-being. A qualitative phenomenological research design was employed to gain an in-depth understanding of the participants' lived experiences. The study population consisted of adults who simultaneously provided care for their elderly parents, children and grandchildren. Using purposive sampling, twelve participants were recruited from the Poojapitiya area in the Kandy District. Data were collected through semi-structured face-to-face interviews and analysed using Braun and Clarke's (2012) thematic analysis approach. Based on previous literature and the objectives of the study, the participants reported emotional and psychological challenges such as stress, role overload, emotional exhaustion and difficulties in balancing multiple responsibilities. Caregivers also described meaningful experiences related to family commitment, personal fulfilment and intergenerational connectedness. It was found that coping strategies such as problem-solving, religious practices, emotional regulation and social support contribute to resilience and well-being. The findings contribute to the limited literature on club sandwich generation caregivers in Sri Lanka and provide insights to inform the development of interventions and policies aimed at promoting caregiver well-being.

Keywords: club sandwich generation, caregivers, mental well-being, qualitative research, Sri Lanka

I wish to acknowledge Danesh Karunanayake for his guidance and supervision.

EXPLORING EMOTIONAL INTELLIGENCE AND RESILIENCE AMONG UNIVERSITY UNDERGRADUATES FROM DIFFERENT SCIENCES AT THE UNIVERSITY OF PERADENIYA.

W.M.A.K. Weerasekara
Department of Psychology, University of Peradeniya
a20822@arts.pdn.ac.lk

The transition to university is a critical developmental period that exposes students to various academic, social and psychological challenges. In addition to academic competence, students require emotional intelligence and resilience to effectively manage stress, maintain well-being and succeed in higher education. These competencies are also essential for successful social functioning and future employment. Limited studies have explored emotional intelligence and resilience across broader academic disciplinary groups, particularly among students from the Humanities, Social Sciences, Hard Sciences and Applied Sciences within the Sri Lankan higher education context. This study aims to explore and compare emotional intelligence and resilience among undergraduates from the Humanities, Social Sciences, Hard Sciences and Applied Sciences at the University of Peradeniya. A quantitative cross-sectional research design was adopted. The data were collected using a structured online questionnaire through Google Forms. Quota sampling was used, and the sample size was 200. Emotional intelligence was measured using the Schutte Self-Report Emotional Intelligence Test (SSEIT), while resilience was measured using the Wagnild and Young Resilience scale. The data were analysed using the Jamovi statistical software. Descriptive statistics will be used to summarise demographic information. Pearson correlation and ANOVA will be used to test the study hypotheses. A positive relationship between emotional intelligence and resilience is expected. It is also anticipated that differences in emotional intelligence and resilience will be observed across academic disciplines due to differences in academic environments and learning experiences. The findings are expected to contribute to a better understanding of students' psychological resources and provide evidence to support student well- being initiatives and academic support programmes within higher education in Sri Lanka.

Keywords: emotional intelligence, resilience, university undergraduates, emotional intelligence across academic disciplines, resilience across disciplines

I wish to acknowledge Kanthi Hettigoda for her guidance and supervision.

THE INFLUENCE OF SOCIAL SUPPORT ON THE PSYCHOLOGICAL WELLBEING OF WIDOWS AND WIDOWERS

H.R. Ishara Harshanee Wijedasa
Department of Psychology, University of Peradeniya
a20844@arts.pdn.ac.lk

Widowhood can affect psychological well-being through grief and loneliness. Social support helps widows and widowers cope. This study examines the influence of social support on the psychological well-being of widows and widowers in the Newsmiyar Ihala Grama Niladhari Division. A qualitative exploratory design was adopted. Fourteen participants (seven widows and seven widowers), aged 50-60 years and widowed for one to five years, were selected using convenience sampling. Data were collected through semi-structured interviews with open-ended questions, supported by audio recordings and field notes. The data were analysed using thematic analysis. The findings show that participants experienced intense grief, loneliness, emotional pain, and difficulties in adjusting to daily life following the loss of their spouse. Children emerged as the primary source of emotional, practical and financial support, while neighbours, friends, religious institutions, and community organisations also played important supportive roles. Religious activities, social participation, and engagement in work or income- generating activities were identified as effective coping strategies that promoted resilience and psychological recovery. Participants who received consistent social support reported improved psychological well-being, increased self-confidence, greater independence in managing daily responsibilities, and a stronger sense of purpose. However, some participants continued to experience social isolation due to limited support. The study concludes that social support plays a crucial role in enhancing the psychological well-being of widows and widowers by reducing emotional distress, strengthening coping abilities, fostering resilience, and facilitating adjustment after bereavement. The findings highlight the importance of strengthening family, community and religious support systems to improve the psychological well-being and quality of life of widowed individuals.

Keywords: social support, psychological well-being, widowhood, widows, widower.

I wish to acknowledge H.M. Gunasekara for her guidance and supervision.

EXPLORING PSYCHOLOGICAL RESPONSES TO CAREER UNCERTAINTY OF FINAL YEAR ARTS UNDERGRADUATES OF UNIVERSITY OF PERADENIYA

L.U.K.K. Wijerathne
Department of Psychology, University of Peradeniya
a20854@arts.pdn.ac.lk

Career uncertainty is a common challenge among university undergraduates in Sri Lanka, especially among Arts students whose academic pathways are not directly linked to specific career paths. In the Sri Lankan context, limited employment opportunities, changing labour market demands, and strong societal expectations regarding stable careers have created pressure on undergraduates. This study explores the psychological responses to career uncertainty of Arts undergraduates of the University of Peradeniya. A qualitative research design was used to understand students' lived experiences in more depth. Data were collected through semi-structured interviews with ten final-year Arts undergraduates, selected using purposive sampling from the University of Peradeniya. The data were analysed using thematic analysis. The findings show that career uncertainty is linked with some psychological responses, including anxiety, stress, frustration, low self-confidence, and concerns about future employment stability. Participants also reported social and family pressure regarding career expectations. Despite these difficulties, participants described both adaptive and maladaptive coping strategies. Such as seeking emotional support from family and friends, improving their skills, and staying hopeful about the future. Some participants also reported maladaptive coping strategies, such as excessive social media use and alcohol consumption. Overall, the study shows that career uncertainty of final-year Arts undergraduates at the University of Peradeniya is not only a career-related issue but also a serious psychological challenge shaped by social and economic conditions. The findings highlight the need for stronger career guidance services and psychological support within universities to help students during this transitional period.

Keywords: career uncertainty, psychological responses, final-year Arts undergraduates, University of Peradeniya, coping strategies

I wish to acknowledge Manjula Gunasekera for her guidance and supervision.

SINHALA



THE SINHALA TRANSLATION OF TENNESSEE WILLIAMS' PLAY "THE ROSE TATTOO" ALONG WITH A CRITICAL INTRODUCTION

E.D.U.C. Rathnasekara
Department of Sinhala, University of Peradeniya
a20572@arts.pdn.ac.lk

Translation is the process of conveying the message of the source language in the target language. This research includes two components: a translation of Tennessee Williams' play *The Rose Tattoo* into Sinhala and a critical essay related to the process of translating the play into Sinhala. Dialogues, regional accents and deep emotional expressions of the characters in the play are poetic in nature. The challenge was to maintain the equivalence when translating the poetic elements and forms of the play and the speech styles into Sinhala. For this, attention was paid to prepare the sentence structure in a natural Sinhala pronunciation while adhering to dramatic rules. The importance of this was to solve the linguistic problems that arise when translating a foreign play, connecting global literature to the culture of the country and preserving the social significance of this play. The aim of the research was to evaluate the play by translating it into Sinhala to investigate the linguistic and cultural issues. In particular, the original story based on Italian culture was adapted through cultural substitution and descriptive translation strategies to make it understandable for Sri Lankan audience. The hypothesis was developed to address the problems of translating the linguistic, cultural, and dramatic features of the drama into Sinhala while preserving the quality and meanings of the translation. A translator of a play should balance linguistic accuracy, dramatic rules and cultural differences, using in-depth criticism and creative strategies. The necessary theoretical material and dictionaries were obtained from library and internet sources. The original text was translated into Sinhala using creative balancing strategies. A creative intervention was made to preserve the original aesthetic quality and emotional intensity based on the theories of translation and criticism. Although the emotional intensity and human experience of *The Rose Tattoo* can be successfully transmitted to Sinhala, it requires creative intervention and cultural sensitivity in addition to the translator's language skills.

***Keywords**:* drama, translation, culture, Tennessee Williams, *The Rose Tattoo*

I wish to acknowledge Liyanage Amarakeerthi for his guidance and supervision.

සිංහල වස්කවි සාහිත්‍යය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සිංහල පද්‍ය සාහිත්‍යයෙහි අන්තර්ගත වස්කවි ආශ්‍රයෙන් කෙරෙන පර්යේෂණයකි)

එම්. ඒ. නෙත්මි අයේත්‍රා අමාෂිනී
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20028@arts.pdn.ac.lk

සිංහල පද්‍ය ශානරයක් වශයෙන් ගැනෙන වස්කවි නම් ගූඪ, ගුප්ත පද්‍ය ශානරය භාවිත වන්නේ යම් ජීවී හෝ අජීවී වස්තුවකට අවැඩක්, විපතක්, අනිෂ්ට විපාකයක් සිදු කිරීමට ය. මෙම අයහපත් ස්වරූපය හේතුවෙන් වස්කවිය සමාජයේ වඩාත් ප්‍රචලිත වී නැත. එහෙත් වස්කවි සම්බන්ධයෙන් ඇති යම් ප්‍රකට සාධක සහ ශාස්ත්‍රීය කරුණු පාදක කරගෙන සිංහල වස්කවියේ ස්වභාවය සහ ආකෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණයි. වස්කවියේ ගණ පිහිටීම, විරිත් භාවිතය ආදි ශාස්ත්‍රීය පසුබිමත්, වස්කවි බිහිවීමට බලපෑ සමාජ පසුබිමත් කේන්ද්‍ර කරගෙන වස්කවියේ සන්දර්භය කවරාකාර ස්වරූපයක් දරන්නේ ද? යන පර්යේෂණ ගැටලුවට විසඳුම් නිර්ණය කර ගැනීමට ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් වස්කවියේ ආරම්භය හා විකාශනය, සමාජීය වටිනාකම, වස්කවියේ න්‍යායික ලක්ෂණ අනෙකුත් පද්‍ය ශානර ආකෘතීන් සමඟ සැසඳෙන ආකාරය සහ අතීත හා නූතන ප්‍රවණතා වැනි කරුණු අනාවරණය කරමින් පර්යේෂණය සිදු කරන ලදි. වස්කවිය හා සෙත්කවිය මඟින් සිදුවන කාර්යය දෙයාකාර වුවත් ඒවායේ ශාස්ත්‍රීය පසුබිම සහ ආකෘතිය එකෙනෙක සමාන වේ. කාව්‍ය ශාස්ත්‍රයේ දී කවීන් භාවිත කරන සුබ සහ අසුබ ශාස්ත්‍ර අතරින් වස්කවියේ අසුබ ශාස්ත්‍ර භාවිත වුවත් සිව්පද ආකෘතිය, අලංකාර, කාව්‍ය රීතීන් ආදිය අනෙකුත් පද්‍ය ශානර හා සමාන බව වස්කවි අධ්‍යයනයේ දී සනාථ වේ. මහනුවර සහ මාතර සාහිත්‍ය යුගයන්හි දී ශාස්ත්‍රීය වශයෙන් වාඩාත් ප්‍රබල වස්කවි බිහි වූ බවට සාක්ෂ්‍ය පවතියි. ප්‍රබල ශාස්ත්‍රීය මුහුණුවරක් නොගත්තත් නූතන සමාජයේ ද වස්කවි නිර්මාණ දැක ගත හැකි ය. එහෙත් යම් දෙයකට හෝ අයෙකුට නිශ්චිතව ම ප්‍රබල අයහපතක් සිදු කිරීමට තරම් ප්‍රභල වස්කවි අද්‍යතනයේ බිහි නොවන බව පර්යේෂණයෙන් එළඹෙන නිගමන මත පැහැදිලි වන කරුණකි. කෙසේ වුවත් මෙම වස්කවි යන පද්‍ය ශානරය සිංහල පද්‍ය සාහිත්‍යයේ වඩාත් ප්‍රබල සහ ශාස්ත්‍රීය වශයෙන් වඩාත් ප්‍රමුඛස්ථානයක පවතින බැවින් මෙවැනි පද්‍ය ශානර වියැකී යාමට නොදී වස්කවි නම් වූ පද්‍ය ශානරයක් තිබුණ බවට හෝ සාධක ගෙනහැර දැක්වීම නූතන පරම්පරාවට සහ මෙවැනි ගුප්ත ශාස්ත්‍ර හා පදනම් ව පර්යේෂණ සිදු කරන්නන් හට සේ ම පද්‍ය සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනය කරන්නන්ට ද ඉතා වැදගත් වේ.

ප්‍රමුඛ පද : අලංකාර, ගණ, නූතන ප්‍රවණතා, වස්කවි, විරිත්

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ පැවැති පැරණි තවලම් සම්ප්‍රදාය සහ එහි නූතන ස්වරූපය
(බදුල්ල දිස්ත්‍රික්කයේ ඉලුක්පැලැස්ස ගම්මානය ඇසුරින් සිදු කළ සංස්කෘතික අධ්‍යයනයක්)

ජී. දිල්මි අප්සරා
සිංහල අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20040@arts.pdn.ac.lk

මානව ශිෂ්ටාචාරයේ ප්‍රගමනයත් සමඟ අත්‍යවශ්‍ය සාධකයක් බවට පත් වූ ප්‍රවාහන ක්ෂේත්‍රයේ අතීත භාණ්ඩ ප්‍රවාහන ක්‍රමවේද අතර 'තවලම්' සම්ප්‍රදායට ප්‍රමුඛ තැනක් හිමිවේ. තවලම යනු කඳුහෙල් හා වනලැහැබ් වැනි දුෂ්කර භූමිභාග ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ගවයා උපයෝගී කරගනිමින් සකසා ගත් දේශීය ප්‍රවාහන මාධ්‍යයකි. අනුරාධපුර යුගයේ පටන් විවිධ ප්‍රවාහන ක්‍රම මෙරට ක්‍රියාත්මක වුවද, ඌව පළාතේ භූ විෂමතාව හා මාර්ග දුෂ්කරතා හේතුවෙන් තවලම් ප්‍රවාහනය ඉතා ජනප්‍රිය හා අත්‍යවශ්‍ය මෙවලමක් බවට පත්විය. ගවයා ආශ්‍රිත ජනශ්‍රැති අංග පිළිබඳ විද්වතුන්ගේ අවධානය යොමු වුවද, පැරණි භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තවලම් සම්ප්‍රදාය විෂයෙහි පුළුල් පර්යේෂණ සිදු වී නොමැති බව පෙනේ. බදුල්ල දිස්ත්‍රික්කයට අයත් ඉලුක්පැලැස්ස ග්‍රාමය තුළ අතීතයේ මෙම තවලම් සම්ප්‍රදාය උච්ච මට්ටමක පැවතිණි. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වන්නේ, ඉලුක්පැලැස්ස ග්‍රාමයෙහි පැවති තවලම් සම්ප්‍රදායේ අතීත ස්වරූපය සහ නූතන විපර්යාසයන් අධ්‍යයනය කිරීමයි. වියැකී යන මෙම උරුමය පිළිබඳ අවබෝධයක් අනාගත පරපුරට ලබා දීම මෙහි අනු අරමුණ වේ. ඉලුක්පැලැස්ස ග්‍රාමයෙහි තවලම් සම්ප්‍රදාය කාලානුරූපීව වෙනස් වී ඇත්තේ කෙසේද යන්න අධ්‍යයනය කිරීම පරයේෂණ ගැටලුව විය. දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර, ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා සහ පුස්තකාල පරිශීලනය දත්ත රැස් කිරීමේ මූලික උපක්‍රම විය. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනිණි. අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණුවලට අනුව, පුරාණ ඉලුක්පැලැස්ස ග්‍රාමයෙහි තවලම් ගමන් සඳහා විශේෂිත චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි විශ්වාස හා අභිචාර විධි අනුගමනය කරමින් ගවයාට ඉහළ ගෞරවයක් ලබා දෙමින් ඈත අතීතයේ මෙම තවලම් සම්ප්‍රදාය විශාල වශයෙන් පැවති අතර, නවීන තාක්ෂණික දියුණුව, පාරම්පරිකව තවලම් කර්මාන්තය ඉදිරියට කරගෙන යෑමට නවක තරුණ පිරිසෙහි ඇති අකමැත්ත ආදිය හේතුවෙන් තවලම් කර්මාන්තයේ නියැළෙන පිරිස අඩුවී ඇති බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද, නිසිලෙස මාර්ග සංවර්ධනය නොවූ දුෂ්කර මාවත් ඔස්සේ සිදු කරන භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා තවලම උපයෝගී කරගත හැකි බව ඉලුක්පැලැස්ස ගම්මානයේ ක්ෂේත්‍ර අධ්‍යයනයේදී අනාවරණය විය. ඒ අනුව නූතන තාක්ෂණික දියුණුව හමුවේ මෙම සම්ප්‍රදාය ඉලුක්පැලැස්ස ග්‍රාමයෙහි වර්තමානය වන විට ඉතා සීමිතව, ක්ෂය වෙමින් පවතින සම්ප්‍රදායක් වී ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: අතීත තත්ත්වය, ඉලුක්පැලැස්ස ග්‍රාමය, ප්‍රවාහනය, තවලම් සම්ප්‍රදාය, නූතන විචල්‍යතා

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සමාජ මාධ්‍යයෙහි සිංහල භාෂා භාවිතය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ෆේස්බුක් සහ යූටියුබ් ආශ්‍රයෙන්)

ඩබ්. ඩී. අප්සරා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20041@arts.pdn.ac.lk

ගෝලීය හා තාක්ෂණයෙහි වර්ධනයත් සමඟ සීඝ්‍ර දියුණුවක් අත් කර ගත් ක්ෂේත්‍රයක් වශයෙන් ජන සන්නිවේදන ක්ෂේත්‍රය පෙන්වා දිය හැකි ය. මීට අයත් ශිල්ප ක්‍රම සහ භාවිතයන් විප්ලවීය වෙනසකට ලක් වීමත් සමඟ එකිනෙකා අතර තොරතුරු හුවමාරු කිරීමෙහි ලා විවිධ මෙවලම් යොදා ගැනුණි. එසේ තොරතුරු හුවමාරු කිරීමේ ජනප්‍රිය මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය හඳුනා ගත හැකි ය. මෙහි අන්තර්ගත ගොඩනැගීමට වඩාත් ඉවහල් වනුයේ ඊට අයත් භාෂාවයි. ජනයාගෙන් සම්මත කොට ගත් සිංහල භාෂාවත් ඊට අදාළ ව්‍යාකරණ පද්ධතිය, ශබ්ද, පද රටා ඇතුළත් සමස්ත භාෂා ජාලය සමාජ මාධ්‍යයෙහි ද සුවිශාල පෙරළියක් ඇති කරන්නට හේතු විය. සිංහල භාෂකයන්ගේ සමාජ මාධ්‍ය භාෂා භාවිතය පිළිබඳ ෆේස්බුක් සහ යූටියුබ් යන සමාජ මාධ්‍ය ආශ්‍රයෙන් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙහි මුඛ්‍ය අරමුණ විය. සමාජ මාධ්‍ය භාෂා භාවිතයේ දී අනන්‍යතා ලක්ෂණ කොතෙකුත් දුරට වලංගු වේ ද යන්න අධ්‍යයනය, තේමාත්මක විවිධත්වය අනුව භාෂා භාවිතය කෙබඳු ආකාර ද යන්න අධ්‍යයනය සහ සිංහල භාෂාවේ නව ප්‍රවණතා පිළිබඳ අනාගත අධ්‍යයනවලට පෙළඹවීම අනු අරමුණු විය. සමාජ මාධ්‍යයෙහි භාවිත වන සිංහල භාෂාව සම්මත ව්‍යාකරණයට දක්වන නැඹුරුව සහ ප්‍රකට කරන ලක්ෂණ කවරාකාර ද යන ගැටලුව නිරාකරණය කර ගැනීමේ අරමුණින් සිදු කෙරුණු මෙම පර්යේෂණයේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත රැස් කරන්නට යෙදුණු අතර විස්තරාත්මක විධික්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කෙරිණි. ෆේස්බුක් සහ යූටියුබ් අවකාශයන්හි භාවිත වන සිංහල භාෂාව, සම්මත ව්‍යාකරණ නීතිවලින් විශේෂයෙන් උක්ත ආඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය, පද බෙදීම ආදියෙන් පැහැදිලි ලෙස ම බැහැර වන බව හඳුනා ගත හැකි විය. ශබ්ද හා පද ආශ්‍රිත විවිධ ප්‍රවණතා ලක්ෂණ ද, කේත මිශ්‍රණ හා කේත මාරු වීම් පිළිබඳව අවධාරණය කර ගත හැකි විය. සම්මත ව්‍යාකරණයට දක්වන නැඹුරුව අවම මට්ටමක පවතින අතර වාචික භාෂා ස්වරූපය ඒ අයුරින් ම ලිවීමට පෙළඹීමත් විමර්ශනයෙන් අනාවරණය විය. ෆේස්බුක් සහ යූටියුබ් පරිශීලනයේ දී භාෂකයන්ගේ සම්මත ව්‍යාකරණ රීති අභිබවමින් සරල සහ ලිහිල් භාෂා රටාවකට අනුගත වී ඇති බවත්, ඒ ඔස්සේ සමාජ මාධ්‍ය පරිශීලකයන් සම්මත සිංහල ව්‍යාකරණයට අයත් උක්ත ආඛ්‍යාත සම්බන්ධය, අක්ෂර වින්‍යාසය සහ පද බෙදීම වැනි මූලික නීති පැහැදිලිව ම නොසලකා උපසංස්කෘතික භාෂා භාවිතයක් නිර්මාණය කොට ගෙන ඇති බවත් අධ්‍යයනයෙන් නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද : යූටියුබ්, සමාජ මාධ්‍ය, සම්මත ව්‍යාකරණය, සිංහල භාෂා භාවිතය, ෆේස්බුක්

මෙම අධ්‍යයනය සඳහා දිලිනි ආරියවංශගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ගාල්ල දිස්ත්‍රික්කයේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සමඟ බැඳි වත්පිළිවෙත් සහ ඒවායෙහි නූතන විචල්‍යතා පිළිබඳ අධ්‍යයනයක් (ඕවිලාන ග්‍රාමයේ වේල්ස් අප්පුහාමි ගුරු පරම්පරාව ආශ්‍රයෙන්)

ජේ. ඒ. අරුනෝද්‍යා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20050@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ අතීතයේ සිට වර්තමානය දක්වා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා බැඳි වත්පිළිවෙත් සිදුකෙරේ. ලෞකික ජීවිතයේ විවිධ අපේක්ෂා සාක්ෂාත් කර ගැනීම සඳහා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා බැඳි වත්පිළිවෙත් සිදුවී ඇත. බුදුන්, දෙවියන්, යක්ෂයන් හා අමනුෂ්‍යයන් පුදමින් මේ කටයුතු සිදුකෙරේ. එහිදී ගුරුකම් පිළිබඳව වෙනත් ප්‍රදේශ ගැන පර්යේෂණ සිදු වී ඇති නමුත් ගාල්ල දිස්ත්‍රික්කයේ මේ සම්බන්ධයෙන් සිදුව ඇති පර්යේෂණ අල්පය. එම නිසා ගාල්ල දිස්ත්‍රික්කයේ ඕවිලාන ග්‍රාමයේ එක් ගුරු පරම්පරාවක් වන වේල්ස් අප්පුහාමි ගුරු පරම්පරාව පදනම් කොට ගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහිදී යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් හා බැඳුණු වත්පිළිවෙත් අතීතයේ පැවතුණ ආකාරයත්, වර්තමානයේ පවතින ආකාරයත් අධ්‍යයනයට ලක්විය. මෙම පර්යේෂණයේ මූලිකම අරමුණ වූයේ වේල්ස් අප්පුහාමි ගුරු පරම්පරාවට අනන්‍ය ලෙස සිදු කරන යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සමග බැඳි වත්පිළිවෙත් සහ ඒවායෙහි නූතන විචල්‍යතා කිනම් ආකාර ද යන්න විමර්ශනය කිරීමයි. එමෙන්ම ජනතාව ගුරුකම් කෙරෙහි දක්වන ඇල්ම හා විශ්වාසය අධ්‍යයනය, ගුරුකම් ආශ්‍රිත දැනුම සංරක්ෂණය කිරීම මෙහි අනු-අරමුණු විය. පර්යේෂණය සඳහා ගුණාත්මක ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර ක්ෂේත්‍ර අධ්‍යයන, සම්මුඛ සාකච්ඡා, පුස්තකාල පරිශීලනය, විද්‍යුත් මූලාශ්‍රය යනාදිය දත්ත රැස් කිරීමේ මූලික උපක්‍රම විය. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදි. අධ්‍යයනයේදී අනාවරණය වූ කරුණුවලට අනුව මෙම ගුරු පරම්පරාවට ආවේණික ව අතීතයේ සිට අනන්‍ය ලෙස පවත්වාගෙන ගිය, ගුරුකම් සමඟ බැඳි වත්පිළිවෙත් රාශියක් තිබූ බවට සාධක ලැබිණි. එහිදී තොවිල් හා බහිරව පූජාව අතීතයේ ප්‍රධාන වශයෙන්ම සිදුකර ඇත. දෙහි කැපීම, තෙල් මැතිරීම, වතුර මැතිරීම, සුනියම් ශාන්තිකර්මය, කළු කුමාර සමයම යනාදී ගුරුකම් අතීතයේ සිට වර්තමානය තෙක් නොකඩවා කරයි. වර්තමානය වන විට මේවායෙහි නූතන විචල්‍යතා ද ඇතිව තිබේ. ඒ සඳහා ආර්ථික සාධක, පරිසර සාධක, සමාජීය සාධක යනාදිය බලපා ඇති බව අනාවරණය විය. එසේම වර්තමානය වන විට වාණිජකරණයට ලක් වී ඇති බවත්, මේ කටයුතු ඉදිරියට කරගෙන යෑම සඳහා පරම්පරාවේ වෙනත් කෙනෙකු ඉදිරිපත් නොවීම නිසා මෙය අභාවයට යමින් පවතින බවත් පර්යේෂණයේ අවසන් නිගමනය ලෙස ඉදිරිපත් කළ හැකිය.

ප්‍රමුඛ පද: අතීත තත්ත්වය, ගුරුකම්, නූතන විචල්‍යතා, යන්ත්‍ර-මන්ත්‍ර, වත්පිළිවෙත්

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ආදිවාසී භාෂාව ඉගෙනීම සහ භාවිතය කෙරෙහි ආදිවාසීන්ගේ ආකල්ප පිළිබඳ විමර්ශනයක් (දඹාන ආදිවාසී ගම්මානය ඇසුරෙන්)

ඒ. එම්. සෙව්වන්දි චතුරිකා අත්තනායක
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20057@arts.pdn.ac.lk

මානව චින්තනයේ සංකීර්ණත්වය සහ අසීමිත බව අරමුණු කෙරෙන මාධ්‍යය භාෂාවයි. භාෂාව මිනිස් සන්නිවේදනයේ මූලික මෙවලමයි. මිනිස් සමාජයක සංස්කෘතිය, අනන්‍යතාව, ඉතිහාසය හා උරුමය පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කරනු ලබන ප්‍රධාන මාධ්‍යය භාෂාවයි. ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව අතර ද මෙම තත්ත්වය පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. නූතන වාග් විද්‍යාත්මක විග්‍රහයට අනුව වර්තමාන ආදිවාසී භාෂාව යනු මූලභූත වැදි භාෂාව සහ ඒ සමඟ සංස්පර්ශගත වූ සිංහල භාෂාව අතර සම්බන්ධතාවෙන් ගොඩනැඟුණු ක්‍රියෝල් භාෂාවකි. එහෙත් නූතනයේදී ආදිවාසීන්ගේ ප්‍රධාන අනන්‍යතා සාධකයක් වන ආදිවාසී භාෂාව වඳ වී යමින් පවතී. ඒ අනුව ආදිවාසී භාෂාව ඉගෙනීම සහ භාවිතය සම්බන්ධයෙන් ආදිවාසීන්ගේ ආකල්ප විමර්ශනය කරමින් කාලීන පර්යේෂණයක් සිදු කිරීම වැදගත් වේ. 'ආදිවාසී භාෂාව ඉගෙනීම සහ භාවිතය කෙරෙහි ආදිවාසී ප්‍රජාව දක්වන ආකල්ප කවරාකාරද?' යන පර්යේෂණ ගැටලුව මත පදනම් සිදුකළ මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ආදිවාසී භාෂාව ඉගෙනීම සහ භාවිතය කෙරෙහි ආදිවාසී ප්‍රජාව දක්වන ආකල්ප විමර්ශනය කිරීමයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතයෙන් සිදුකළ අතර සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණ සහ පුස්තකාල භාවිතයෙන් දත්ත රැස් කරන්නට විය. විස්තරාත්මක ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කරන්නට විය. පර්යේෂණයෙන් ආදිවාසී භාෂාව සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව ආදිවාසී ප්‍රජාවේ බහුතරය විසින් පිළිගනු ලබන බවත්, ආදිවාසී භාෂාව ඉගැන්වීම පිළිබඳ සියලු ආදිවාසී ප්‍රජාව ධනාත්මක ආකල්පයක් දරන බවත් අනාවරණය විය. එසේම ආදිවාසී භාෂාව භාවිතය කෙරෙහි ආදිවාසී තරුණ පරම්පරාව අඩු උනන්දුවක් දක්වන බව ද පාරම්පරික සංස්කෘතියට ගරු කරන ආදිවාසීන් ආදිවාසී භාෂාව භාවිතය පිළිබඳ උද්යෝගශීලී ආකල්පයක් දරන බව ද අනාවරණය විය. ආදිවාසී භාෂාව සංරක්ෂණයට පාරම්පරික ආදිවාසීන් විවිධ ක්‍රියාමාර්ග යෙදවීමට අපේක්ෂිත ය. නූතනය වන විට ආදිවාසී භාෂාව සැලකිය යුතු අවදානමක පවතී. ඒ අනුව නූතන ආදිවාසී භාෂා තත්ත්වය සම්බන්ධයෙන් සාධනීය ආකල්පයක් දැරිය නොහැකි බව නිගමනය කළ හැකිය. පර්යේෂණයේ නිගමන අනුව කඩිනම් ක්‍රියා මාර්ග යොදා ගනිමින් ආදිවාසී භාෂාව සංරක්ෂණය කළ යුතු බව අනාවරණය විය.

ප්‍රමුඛ පද: ආදිවාසී ආකල්ප, ආදිවාසී භාෂාව, ක්‍රියෝල් භාෂාව, භාෂා සංරක්ෂණය, සිංහල භාෂාව

මෙම අධ්‍යයනය සඳහා දිලිනි ආරියවංශගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

යාචක සන්නිවේදනයේ නූතන විචල්‍යතා පිළිබඳ අධ්‍යයනයක් (මහනුවර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල තෝරාගත් යාචක පිරිස් ඇසුරෙන් සිදු කරන ක්ෂේත්‍ර අධ්‍යයනයක්)

ඩී.එච්.එම්. ජනිත් ශාරද බණ්ඩාර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20071@arts.pdn.ac.lk

යාචක ප්‍රජාව වනාහි ශ්‍රී ලංකාවේ ආන්තිකරණයට ලක් වූ ජන කොට්ඨාසයකි. සාම්ප්‍රදායික සමාජය තුළ යාචක සන්නිවේදනය ප්‍රධාන වශයෙන්ම වාචික අයැදීම්, ශාරීරික ඉරියව් සහ අනුකම්පාව උපදවන බාහිර ස්වරූපයන් මත පදනම් විය. කෙසේ වුවද නූතන තාක්ෂණික, ආර්ථික සහ සමාජීය පරිවර්තන හමුවේ යාචක සන්නිවේදනය නව මුහුණුවරක් සහ සංකීර්ණ විචල්‍යතා කරා ගමන් කර ඇත. සාම්ප්‍රදායික යාචක සන්නිවේදනයට සාපේක්ෂව නූතනයේදී යාචක සන්නිවේදනයේ ඇති වී තිබෙන විචල්‍යතා කවරාකාරද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ යාචක සන්නිවේදනයේ නූතන ප්‍රවණතා අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. යාචකයන් සන්නිවේදනයේදී බාහිර සමාජය කෙරෙහි සංවේදිතාව ඇති කිරීම සඳහා භාවිත කරන විශේෂ සන්නිවේදන විධි හා භාෂා ප්‍රයෝග පිළිබඳව ද මෙහිදී අධ්‍යයනය කෙරිණි. යාචක සන්නිවේදනය නූතනයේදී විචල්‍යතාවලට ලක්ව ඇති ආකාරය අධ්‍යයනය කිරීම පර්යේෂණාත්මකව වැදගත් වෙයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය මගින් දත්ත රැස්කර ගනිමින් සිදුකළ පර්යේෂණයෙහි දත්ත විශ්ලේෂණයේදී විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. මෙම පර්යේෂණයේදී අනාවරණය වූ මූලික කරුණ නම් සාම්ප්‍රදායික යාචක සන්නිවේදන ක්‍රම නූතනය වන විට විචල්‍යතාවලට බඳුන් වී ඇති බවයි. මුද්‍රිත සන්නිවේදන විධික්‍රම භාවිතය, තාක්ෂණික උපකරණ භාවිතය, වාචික අයැදීම් ස්වරූප වෙනස්වීම්වලට ලක්වීම ආදිය අනාවරණය වූ යාචක සන්නිවේදන විචල්‍යතා විය. අතීතයේ යාචක සන්නිවේදනයේදී උපයෝගී කරගත් සන්නිවේදන ක්‍රමෝපායන් නූතන යුගය සමග විචල්‍යතාවලට බඳුන් වී ඇති බව අධ්‍යයනයෙන් තහවුරු විය.

ප්‍රමුඛ පද: යාචක සන්නිවේදනය, විචල්‍යතා, නූතන ප්‍රවණතා, සම්ප්‍රදායික

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල ජන උත්සවවල භාවිත වන සුදු පිරුවට පිළිබඳ අධ්‍යයනයක්: බෙවර්ලි ජේ. ස්ටෝලන්යේගේ ආදර්ශය ඇසුරෙන් කෙරෙන ක්ෂේත්‍ර පර්යේෂණයක්

ජී. එම්. ඒ. යූ. බංඩාර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20072@arts.pdn.ac.lk

ජන උත්සව යනු විශ්වීය නමුත් එකිනෙක සමාජයන්ට ආවේණික සංස්කෘතික අනන්‍යතාව, ආගමික විශ්වාස, සමාජ සබඳතා සහ සම්ප්‍රදායික දැනුම් පද්ධති නිරූපණය කරන ප්‍රධාන සංස්කෘතික ප්‍රකාශනයකි. ශ්‍රී ලාංකේය සිංහල ජන සංස්කෘතිය තුළ විවිධ ජන උත්සව හා චාරිත්‍රවල දී සුදු පිරුවට බහුල වශයෙන් භාවිත වන අතර එය හුදු භෞතික උපකරණයක් පමණක් නොව, ගැඹුරු සංස්කෘතික හා සංකේතාත්මක අර්ථ සන්නිවේදනය කරන සංස්කෘතික මෙවලමක් ලෙස හඳුනාගත හැකිය. එහෙත් සිංහල ජන උත්සව සන්දර්භය තුළ සුදු පිරුවටෙහි භාවිතය, කාර්යභාරය සහ සංකේතාත්මක අර්ථ පිළිබඳ ක්‍රමානුකූල ශාස්ත්‍රීය අධ්‍යයන සීමිත වීම මෙම පර්යේෂණය සඳහා පදනම සපයයි. මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වන්නේ සිංහල ජන උත්සවවල භාවිත වන සුදු පිරුවටෙහි සංස්කෘතික වැදගත්කම, එහි සංකේතාත්මක අර්ථ නිරූපණය සහ විවිධ උත්සවමය හා චාරිත්‍රානුකූල සන්දර්භවලදී එය ඉටු කරන කාර්යභාරය විමර්ශනය කිරීමයි. "සිංහල ජන උත්සවවල භාවිත වන සුදු පිරුවට මඟින් නිරූපණය වන සංකේතාත්මක අර්ථ කවරාකාරද" යන මූලික ගැටලුව මෙහි දී සාකච්ඡා කෙරේ. බෙවර්ලි ජේ. ස්ටෝලන්යේගේ *Festival in America* ආදර්ශය න්‍යායික පදනම ලෙස යොදා ගනිමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් යොදා ගෙන ඇත. ඒ සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත මෙන්ම ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි, සඟරා හා විද්‍යුත් මූලාශ්‍ර ඇතුළත් ද්විතීයක දත්ත රැස් කරනු ලැබිණි. රැස් කරන ලද දත්ත විස්තරාත්මක විශ්ලේෂණයට ලක් කරමින් බෞද්ධාගමික උත්සව, ශාන්තිකර්ම, කෘෂිකාර්මික උත්සව සහ ද්වාරකර්ම ආශ්‍රිත චාරිත්‍රවල දී සුදු පිරුවට ඉටු කරන කාර්යභාරය විමර්ශනයට ලක් කෙරිණි. මෙම අධ්‍යයනය මඟින් සුදු පිරුවට සිංහල ජන උත්සවවල සංස්කෘතික හා ආධ්‍යාත්මික අර්ථ පද්ධතියක සක්‍රීය සංරචකයක් ලෙස ක්‍රියා කරන බව අනාවරණය විය. එය පාරිශුද්ධත්වය, පිරිසිදුකම, සරලත්වය, ආධ්‍යාත්මික උන්නතිය සහ ජයග්‍රහණය වැනි ධනාත්මක/ සුභාවාදී අර්ථ නිරූපණය කරන අතර, ඇතැම් සන්දර්භවල දී ශෝකය, මරණය, හිස් බව සහ හුදකලා බව යන ඍණාත්මක/ අශුභවාදී අර්ථ ද සංකේතවත් කරයි. ඒ අනුව සුදු පිරුවටේ භාවිතය මඟින් සිංහල ජන උත්සවවල පවතින සංස්කෘතික වටිනාකම්, සමාජ විශ්වාස සහ ආධ්‍යාත්මික සම්ප්‍රදායන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගත හැකි බව මෙම පර්යේෂණය මඟින් තහවුරු විය.

ප්‍රමුඛ පද: ජන සංස්කෘතිය, බෙවර්ලි ජේ. ස්ටෝලන්යේ, සිංහල ජන උත්සව, සුදු පිරුවට, සංස්කෘතික අනන්‍යතාව, සංකේතවේදය

මෙම අධ්‍යයනය සඳහා ආචාර්ය නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

සාකල්‍යවත් ස්ත්‍රී චරිතාපදාන රචනයෙහි ලා ස්ත්‍රියට ඇති අවකාශය සහ අභියෝග පිළිබඳ ස්ත්‍රීවාදී අධ්‍යයනයක්
(සිංහලෙන් රචිත සහ සිංහලට පරිවර්තිත ස්ත්‍රී චරිතාපදාන කෘති කිහිපයක් ඇසුරින්)

ආර්. අයි. බී. එස්. එන් බණ්ඩාර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20079@arts.pdn.ac.lk

පුරුෂ මූලික සමාජයක ස්ත්‍රිය පීඩාවට පත් කරන ව්‍යූහ වෙතින් ඇය නිදහස් කිරීම උදෙසා ගොඩනැගී ඇති න්‍යායික කතිකාව ස්ත්‍රීවාදය වේ. ප්‍රබන්ධමය නොවන සාහිත්‍ය විශේෂයක් වන චරිතාපදාන යනු, කිසියම් පුද්ගලයෙකුගේ ජීවිතයේ ආරම්භයේ සිට හෝ යම් නිශ්චිත කාල සීමාවක් දක්වා සිදු වූ වැදගත් සිදුවීම් ඇතුළත් කොට ලියන ලද ලියවිලි ය. සාකල්‍යවත් ස්ත්‍රී චරිතාපදාන රචනයෙහි ලා ස්ත්‍රියට ඇති අවකාශය සහ ඒ සඳහා ඇති අභියෝග පිළිබඳ ස්ත්‍රීවාදී අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. පවතින සමාජ හා සංස්කෘතික වටාපිටාව යටතේ ස්ත්‍රිය නිර්මාණය වන ආකාරය, ස්ත්‍රී චරිතය රාමුගත වන අවස්ථා සහ සාකල්‍යවත් ස්ත්‍රී චරිතාපදානයක් රචනා කිරීම උදෙසා මහා සංස්කෘතියෙන් ලැබී ඇති ඉඩ කඩ ආදිය අධ්‍යයනය කිරීම මෙහි දී සිදු විය. සාකල්‍යවත් ස්ත්‍රී ජීවිතය කෙබඳු ද, ස්ත්‍රී ජීවිත කථා චරිතාපදානගත කිරීමේ අවශ්‍යතාව, එවැන්නක් රචනා කිරීමට තරම් අවශ්‍ය අමුද්‍රව්‍ය නිර්මාණය වී පවතී ද යන කරුණු අනාවරණය කරගැනීම වැදගත් වේ. ඒ සඳහා ස්ත්‍රීන් බොහෝ දෙනෙකු හඹා යන ජීවිතයෙහි සාර්ථකත්වය පිළිබඳ පරමාදර්ශ චරිතාපදානයක් හෝ ස්වයං චරිතාපදානයක් ලියන්නට තරම් සුදුසු මූලාශ්‍රය/අමුද්‍රව්‍ය බිහි නොවන්නේ ඇයි යන ගැටලුව විමර්ශනය කිරීම උදෙසා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල, ප්‍රශ්නාවලි, සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය පරිහරණය ඔස්සේ තෝරාගත් චරිතාපදාන හා ස්වයං චරිතාපදාන කිහිපයකට සීමා කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරිණි. එහි දී පවතින පුරුෂ මූලික සමාජ හා සංස්කෘතික වටාපිටාව විසින් ස්ත්‍රිය සහ ඇගේ භූමිකාව යම්කිසි නිශ්චිත රාමුවක සිරකර තබනු ලැබ ඇති බව විද්‍යමාන විය. බහුතරයක් ස්ත්‍රීන් තම සාර්ථකත්වය හඹා ගිය ද ඔවුන්ගේ ජීවිත කථා සාකල්‍යවත් චරිතාපදානයක් හෝ ස්වයං චරිතාපදානයක් ලෙස ලේඛනගත කිරීමට තරම් ප්‍රමාණවත් හෝ ගැඹුරු අමුද්‍රව්‍ය අප සමාජයෙහි නිර්මාණය නොවන බව අනාවරණය විය. පවතින මහා සංස්කෘතිය ස්ත්‍රියට තම ජීවිත කථාව සම්පූර්ණයෙන් හා නිදහස්ව නිර්මාණය කර ගැනීමට සහ ප්‍රකාශ කිරීමට ඉඩකඩ සීමා කර ඇති බව පසක් විය. ඒ අනුව ස්ත්‍රියගේ සැබෑ සාර්ථකත්වය ළඟා කර ගැනීමට නම් පුරුෂ මූලික ආකෘතිය ස්ත්‍රියගේ ජීවිතයට අසාධාරණ ලෙස ප්‍රවිෂ්ට වීම වැළැක්විය යුතු බවත් සාකල්‍යවත් ස්ත්‍රී චරිතාපදාන නිර්මාණය කිරීමෙහි ලා කාලානුරූපීව මිනිස් ආකල්ප වෙනස් කළ යුතු බවත් මෙහි දී යෝජනා කෙරේ.

ප්‍රමුඛ පද: අමුද්‍රව්‍ය, චරිතාපදාන, මහා සංස්කෘතිය, සාකල්‍යවත් ස්ත්‍රිය, සාර්ථකත්වය

මෙම අධ්‍යයනය සඳහා ලියනගේ අමරකීර්තිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වක ව සිහිපත් කරමි.

වීදිය බණ්ඩාර හා ජන වීරත්වය : ඓතිහාසික ජනශ්‍රැති පර්යේෂණයක්

ඩබ්ලිව්. ඒ. එච්. චමෝදි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20095@arts.pdn.ac.lk

16 වන සියවසයේ කෝට්ටේ රාජධානි සමයේ පැවති දේශපාලනික පරිහානියත්, ඊට සමගාමීව ක්‍රියාත්මක වූ පෘතුගීසි ආක්‍රමණයත් හමුවේ ස්වකීය ජනතාව වෙනුවෙන් සටන් කළ චරිතයක් ලෙස වීදිය බණ්ඩාර හඳුනා ගත හැකිය. ජන වීරත්වය මත පදනම්ව වීදිය බණ්ඩාර පිළිබඳ සිදුකෙරෙන ඓතිහාසික ජනශ්‍රැති පර්යේෂණයක් වන මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ඓතිහාසික මූලාශ්‍රය සහ අද්‍යතන ජනශ්‍රැති මූලාශ්‍රයවල වීර චරිතයක් වශයෙන් වීදිය බණ්ඩාර නිරූපණය වන ස්වරූප විමර්ශනය කිරීමයි. "වීදිය බණ්ඩාර චරිතය වීර චරිතයක් වශයෙන් ඓතිහාසික මූලාශ්‍රයවල සහ ජනශ්‍රැතියෙහි නිරූපණය වන්නේ කවරාකාරයෙන්ද?" යන ගැටලුව පාදක කරගත් මෙම පර්යේෂණයෙහි දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය හා සම්මුඛ සාකච්ඡා යොදා ගැනුණි. න්‍යායික ප්‍රවේශය ලෙස ජනශ්‍රැති විද්‍යාවෙහි එන ඓතිහාසික ජනශ්‍රැති ප්‍රවේශය භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූයේ වීදිය බණ්ඩාර චරිතය අද්‍යතන ජනශ්‍රැතියෙහි විවිධ ස්වරූපවලින් ජන වීරත්වයට පත් වී ඇති බවයි. දේශීය ඓතිහාසික මූලාශ්‍රය සහ විදේශීය ලේඛන පරීක්ෂා කිරීමේ දී ප්‍රධාන වශයෙන් එම දේශීය හා විදේශීය ලේඛකයන්ගේ දේශපාලනික, ආගමික පසුබිම සහ අරමුණු මත වීදිය බණ්ඩාර චරිතයේ වීරත්වය නිරූපණය කර ඇති ආකාරයෙහි වෙනස්කම් ඇති බව හඳුනාගත හැකිවිය. ජනශ්‍රැතික මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේ දී වීදිය බණ්ඩාර ජීවත්ව සිටි සමයේදී ඔහු දේශපාලනික, පරිපාලනමය හා යුදමය වශයෙන් කැපී පෙනුණු නායකයෙකු ලෙස පමණක් සමාජය විසින් හඳුනාගෙන තිබූ බව ද ඔහුගේ මරණයත් සමඟ එම චරිතයේ ස්වභාවය විපර්යාසයකට ලක් ව ඇති බව ද පෙනී යයි. වීදිය බණ්ඩාර වටා ගොඩනැගුණු ජනප්‍රවාද, ජනකතා, ජන විශ්වාස සහ ජනශ්‍රැතිකාංග පද්ධතියක් බිහි වී ඇත්තේ ඔහුගේ මරණයෙන් පසුව බව මෙම පර්යේෂණයේදී අනාවරණය කරගත හැකි වූ අතර ඔහුගේ ජන වීරත්වය නිරූපණය කර ඇති ස්වරූපය ඒ ඒ මූලාශ්‍රයවලට හේතු වූ අරමුණු සහ සමාජ, දේශපාලනික සහ ආගමික පසුබිම මත තීරණය වී ඇති බව ද නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: ඓතිහාසික මූලාශ්‍රය, ජන වීරත්වය, ජනශ්‍රැතිය, වීදිය බණ්ඩාර

මෙම අධ්‍යයනය සඳහා දිනූෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වහකෝට්ටේ කිතුනු ජනාවාසකරණය පිළිබඳ ජනශ්‍රැති පර්යේෂණයක් : රිචඩ් එම්. ඩෝසන්ගේ ඓතිහාසික ජනශ්‍රැති න්‍යාය භාවිතයෙන් කෙරෙන විමර්ශනයක්

ආර්. ඒ. ඩී. එන්. ධනංජනා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20134@arts.pdn.ac.lk

මහනුවර යුගයේ සිදුවූ යුරෝපීය සංක්‍රමණ හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ වහකෝට්ටේ නම් ග්‍රාමයේ පෘතුගීසි ජාතික ජනයාගේ සංකේන්ද්‍රස්ථානය නිර්මාණය විය. උඩරට රාජධානියේ බෞද්ධ ආගමික ගම්මාන රැසක් මධ්‍යයේ ස්ථාපිත වහකෝට්ටේ ප්‍රදේශය දේශීයකරණ ඵළඹුම ඔස්සේ සංස්කෘතික වශයෙන් දෙමුහුන්භාවයට පත් වී ඇත. වහකෝට්ටේ කිතුනු ජනාවාස බෞද්ධ සංස්කෘතික ජාතිකත්වය යටතේ දේශීයකරණයට අනුගත වී තිබෙන්නේ කවරාකාරයෙන්ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. දෙවන රාජසිංහ රජු දවස අත්අඩංගුවට ගත් පෘතුගීසි කතෝලික ජනයාට අභයභූමියක් වශයෙන් වහකෝට්ටේ හඳුන්වාදීමත් සමඟ ජනාවාසකරණයේ සුවිශේෂතා ඇති විය. එහිදී වහකෝට්ටේ ජනාවාසකරණය සහ සම්බන්ධ තොරතුරු අධ්‍යයනය සඳහා පර්යේෂණය සීමා විය. මෙම ක්ෂේත්‍රය ජනශ්‍රැති පර්යේෂණ න්‍යායාත්මක පසුබිමක් යටතේ විග්‍රහ කිරීම්දී ඩෝසන්ගේ ඓතිහාසික න්‍යාය භාවිතයට ගැනුණි. කිතුනු ජනයාගේ ආරම්භය, කිතුනු ජනාවාසකරණයේ ප්‍රවර්ධනය, විකාශනය සහ දෙමුහුන් සංස්කෘතික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය මෙහි ප්‍රධාන අරමුණ විය. අනු අරමුණු අතර විදේශ සංස්කෘතියක් සහ නව ආගමික පසුබිමක් දේශීය බෞද්ධ සංස්කෘතියට අනුගතව නිර්මාණය කරගත් ආකාරයත්, වහකෝට්ටේ කිතුනු දේවස්ථානය සහ එම ප්‍රදේශයේ ආගමික පසුබිම ජන ව්‍යූහයට බලපෑ ආකාරයත් විමර්ශනයට ලක් විය. ගුණාත්මක ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය, නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා සහ ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් දත්ත රැස් කිරීම සිදු විය. විස්තරාත්මක විධික්‍රමය යටතේ විශ්ලේෂණය කර දත්ත සංවිධානාත්මක අයුරින් ඉදිරිපත් කෙරිණි. වහකෝට්ටේ කිතුනු ජනාවාසකරණය හා සම්බන්ධ පෙළපත් නාමකරණයේ විශේෂත්වය පිළිබඳත්, එය බෞද්ධ සංස්කෘතිය සමඟ මිශ්‍ර වී නිර්මාණය කර ගත් සංස්කෘතික නව්‍යතාවල මුල් කාලීන සහ අද්‍යතන ලක්ෂණ පිළිබඳත් තොරතුරු තුලනාත්මක ලෙස ඉදිරිපත් කළ හැකි විය. පෘතුගීසි ජාතිකයන්ට අනන්‍ය වූ බාහිර ස්වරූප ලක්ෂණ වර්තමාන වහකෝට්ටේ කතෝලික ජනයාට ප්‍රවේණියෙන් උරුම වී ඇති අතර එම සුවිශේෂ ජනාවාසකරණයේ පර්යේෂණාත්මක විග්‍රහය ඇමෙරිකානු ජනශ්‍රැති පර්යේෂක රිචඩ් එම්. ඩෝසන්ගේ ඓතිහාසික න්‍යාය ඔස්සේ විමර්ශනයට ලක්විය. අන්තෝනි මුනිඳුන්ගේ දේවස්ථානය මූලික කරගෙන ආරම්භක ජනාවාසකරණයේ ප්‍රවර්ධනය සිදු වී ඇත. උඩරට රදළ පෙළපත් වැසියන් සමඟ විවාහ වීමෙන් පෙළපත් නාමකරණයේ ඇතිවූ නව මුහුණුවර, ජනාවාස කේන්ද්‍රවීම සහ ග්‍රාමීය සැකැස්ම නිර්මාණය යනාදී සියල්ල දේශීයකරණය සඳහා මුහුවීමේ උත්සාහයක් බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : ඓතිහාසික න්‍යාය, ජනාවාසකරණය, දේශීයකරණය, වහකෝට්ටේ

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පැවිද්දන් විසින් රචිත සීගිරි ගීවලින් ප්‍රකට වන සමාජ හා දාර්ශනික සංකල්ප පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඊ. ඒ තිෂුරි ධනේෂි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20136@arts.pdn.ac.lk

ජාතියේ ප්‍රෞඩත්වය විදහා දක්වන "සීගිරිය" අග්‍රගණ්‍ය කලා නිර්මාණයකි. ක්‍රි.ව 08, 09, 10 සියවස්හි සීගිරි සිරිය නැරඹීමට පැමිණි ජනී ජනයා අතර භික්ෂූන් අමතක කළ නොහැකි ය. එබැවින් පැවිද්දන් රචිත සීගිරි ගීයෙන් ප්‍රකට වන පුරාණ ලංකාවේ තෝරාගත් අංශ කිහිපයක් හා යතිවර සීගිරි ගීයේ දාර්ශනික චින්තනාවල ආගමික, සෞන්දර්යාත්මක, පුද්ගලානුබද්ධ, ආචාරධර්මීය හා උපදේශාත්මක දර්ශනය ආදිය විවරණයට ලක් කිරීමේ අරමුණෙන් මෙම පර්යේෂණය සිදු කෙරිණි. එමෙන් ම යතිවර සීගිරි ගීය ආගමික රාමුවෙන් බැහැරට ගොස් ඇති ආකාරය හා යතිවර සීගිරි ගීවලින් පිළිබිඹු වන කාන්තා චරිතය හා බැඳි සමාජ සබඳතා, ලෞකිකත්වය ආදි මනෝ භාවයන් විශ්ලේෂණය මෙන්ම සීගිරි ගී යුගයේ පැවති සමාජ සංස්කෘතික ස්වභාවය අධ්‍යයනය කිරීම ද මෙහි අනු අරමුණු විය. කැටබිතෙහි යතිවර ගීයෙන් ප්‍රකට වන සමාජ ස්වරූපය හා ඉන් පිළිබිඹු වන දාර්ශනික කවි චින්තාවන්හි ස්වරූපය කවරාකාර ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. සීගිරි කැටපත් පවුරෙහි භික්ෂු, භික්ෂුණීන් විසින් රචිත සීගිරි ගීවලට පමණක් මෙම පර්යේෂණය සීමා වේ. මහාචාර්ය සෙනරත් පරණවිතාන විසින් රචිත Sigiri Grafittiy (1956) පළමු හා දෙවන වෙළුම් ප්‍රධාන වශයෙන් මේ සඳහා උපයෝගී කර ගැනුණි. දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර එහි දී පුස්තකාල පරිශීලනය සිදු කෙරිණි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. පැවිද්දන් විසින් රචිත සීගිරි ගී ඔස්සේ පුරාණ ලංකාවේ සමාජ සංස්ථාවේ ස්වරූපය කෙසේ ද යන්නත්, එකල ස්ත්‍රිය සමාජයේ ඉහළින් ම වැජඹුණු බවත්, දේශපාලනික තොරතුරු අතර රජු කෙරෙහි පැවැති අසීමිත ගෞරවය හා අධ්‍යාපනික කටයුතු කෙරෙහි හිමි වූයේ ඉතා වැදගත් ස්ථානයක් බවත්, එමෙන් ම යතිවර සීගිරි ගීයේ දාර්ශනික පැතිකඩ ඔස්සේ එම ගීවල අන්තර්ගත ආගමික දෘෂ්ටිය හා ඇතැම් අවස්ථාවල දී යතිවරයා ආධ්‍යාත්මිකත්වයෙන් මිදී ලෞකිකත්වය කරා නැඹුරුවීමට දරා ඇති මානසිකත්වයේ ස්වරූපයක් මතුවන බවත් මෙහි දී අනාවරණය විය. යතිවරයා ලෞකිකත්වය කෙරෙහි ඇලුම් කර ඇති බවත්, යතිවර ඇසින් එකල සමාජය, කාන්තාව, දේශපාලනය, අධ්‍යාපනය දෙස හෙළූ දෘෂ්ටිය කෙබඳු ද යන්න මෙන් ම යතිවර සීගිරි ගීයේ සැඟවුණු දාර්ශනික වැදගත්කම් ද මතු කිරීමට හැකි වීම ද මෙහි සුවිශේෂත්වය බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: දාර්ශනික චින්තනය, පුරාණ සමාජය, යතිවරයා, සීගිරි ගී, සෞන්දර්යාත්මක දෘෂ්ටිකෝණය

මෙම අධ්‍යයනය සඳහා මංගල දිසානායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ලාංකේය සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාවෙහි නිරූපිත පුද්ගල අනන්‍යතා සහ එහි සමාජීය බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රදේශය ඇසුරින්)

ටී.ඒ.සී. දිල්රුක්ෂි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20146@arts.pdn.ac.lk

වසර සිය ගණනක් පැරණි දේශීය අනන්‍යතාව විදහා දක්වන සංස්කෘතික උරුමයක් ලෙස ලාංකේය සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාව හැඳින්විය හැකිය. මෙය ප්‍රධාන වශයෙන් නර්තනය, නාට්‍ය කලාව සහ අභිචාරමය වත්පිළිවෙත් සමඟ බද්ධ ව පවති. වෙස් මුහුණු පුද්ගලයෙකුගේ ප්‍රකෘති මුහුණෙහි පළඳින අතර එය පැළඳීමෙන් පියවි මුහුණ වැසේ. කල්පිත චරිත නිරූපිත වෙස්මුහුණු සහ පුද්ගලත්ව නිරූපිත වෙස්මුහුණු යනුවෙන් වෙස්මුහුණු ප්‍රභේද දෙකකි. මෙම වෙස්මුහුණුවල විවිධ අනන්‍යතා නිරූපණ දැකගත හැකිය. මෙම පර්යේෂණය මගින් අම්බලන්ගොඩ ප්‍රදේශය ආශ්‍රිත සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාව මගින් නිරූපණය වන පුද්ගල අනන්‍යතා සහ ඒවා මගින් සැබෑ සමාජය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සිදුකෙරිණි. ලාංකේය සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාවෙහි නිරූපිත පුද්ගල අනන්‍යතා සමාජයේ එම සැබෑ අනන්‍යතා උසුලන පුද්ගලයන්ට බලපෑම් කරන ආකාරය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. ඒ අනුව වෙස්මුහුණු මගින් නිරූපණය කෙරෙන පුද්ගල අනන්‍යතා පදනම් කරගෙන සැබෑ ලෝකයේ එම අනන්‍යතා උසුලන පුද්ගලයන් කෙරෙහි ඇති විය හැකි බලපෑම කවරාකාරද? යන්න පර්යේෂණ ගැටලුව විය. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය මගින් දත්ත රැස් කර ඇත. පර්යේෂණ විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමය භාවිත කෙරිණි. ඒ අනුව අවසාන වශයෙන් අනාවරණය වූයේ ලාංකේය සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාවේ නිරූපිත පුද්ගල අනන්‍යතා මගින් සමාජයේ එම අනන්‍යතා උසුලන ඇතැම් පුද්ගල අනන්‍යතාවලට අගතියක් සිදු ව ඇති බවයි. එහිදී කෝලම් වෙස්මුහුණු සහ දහ අට සන්නි වෙස් මුහුණු මගින් මෙලෙස පුද්ගල අනන්‍යතා සඳහා අයහපත් බලපෑමක් සිදු ව ඇති බව අනාවරණය විය.

ප්‍රමුඛ පද: පුද්ගල අනන්‍යතා, සමාජීය බලපෑම, සාම්ප්‍රදායික වෙස්මුහුණු කලාව

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සති පිරිත් සජ්ඣායන සංස්කෘතියේ නූතන විචල්‍යතා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කොළඹ හා රත්නපුර දිස්ත්‍රික්ක ආශ්‍රයෙන්)

බී. වී. පී. කේ. ගුණසේකර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණි විශ්වවිද්‍යාලය
a20204@arts.pdn.ac.lk

පාලි ත්‍රිපිටකයේ ඇතුළත් බුද්ධ දේශනාවලින් තෝරා ගත් සූත්‍ර කොටස් ආරක්ෂාව උදෙසා පිරිත් ගාථා ලෙස සජ්ඣායනය කර කියවීමේ බෞද්ධාගමික චාරිත්‍රය පිරිත නමින් හඳුන්වනු ලැබේ. ඒවා අතර රතන සූත්‍රය, මංගල සූත්‍රය ඇතුළත් මහ පිරිත ද බොජ්ඣංග සූත්‍ර ඇතුළත් දින හතක් පුරා සිදු කරන සති පිරිත ප්‍රධාන ප්‍රභේදයක් වේ. සති පිරිත් සජ්ඣායනය ලාංකික ථේරවාදී සම්ප්‍රදාය අනුව විහාරස්ථානයේ රැස්වෙන භික්ෂු පිරිසක් විසින් ත්‍රිපිටක පාඨ සහ සූත්‍ර සජ්ඣායනය කිරීමෙන් සිදු කරන වැදගත් චාරිත්‍රයකි. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ සති පිරිත් සජ්ඣායන සංස්කෘතියේ නූතන විචල්‍යතා කොළඹ හා රත්නපුර දිස්ත්‍රික්ක ආශ්‍රය කර ගනිමින් විශ්ලේෂණාත්මකව හඳුනා ගැනීමයි. පර්යේෂණ ගැටලුව වූයේ දිස්ත්‍රික්ක දෙකේ සති පිරිත් සජ්ඣායන සංස්කෘතියේ දක්නට ලැබෙන නූතන විචල්‍යතා කවරාකාර ද යන්නයි. දත්ත රැස් කිරීම, ගුණාත්මක ක්‍රමවේදය මත පදනම්ව පුස්තකාල භාවිතය, සෘජු නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාල මූලාශ්‍රය සහ ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය, විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය මඟින් සිදු කරන ලදි. නූතන විචල්‍යතා හඳුනා ගැනීම සඳහා ප්‍රදේශය, නිකාය, පිරිත් ස්වරය, දේවදූත සංකල්පය, ශබ්ද පූජාව, වාද්‍ය භාණ්ඩ භාවිතය, මණ්ඩප ව්‍යූහය ආදිය විශ්ලේෂණාත්මක කරුණු ලෙස හඳුනා ගන්නා ලදි. කොළඹ දිස්ත්‍රික්කයේ සජ්ඣායනාව නාගරීකරණය සහ නවීන තාක්ෂණය සමඟ බහුමාධ්‍ය ස්වරූපයක් ගෙන ඇති අතර රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය සරල ස්වරූපය අනුව නවීන වෙනස්කම් සිදු වී ඇත. නූතන විචල්‍යතා ලෙස අන්තර්ජාල සජීවී විකාශය, කාලය කෙටි කිරීම, පාලි අර්ථ පැහැදිලි කර ධර්ම කථා ඇතුළත් කිරීම, නවීන ශබ්ද සහ ආලෝක උපකරණ භාවිතය, සංගීත රටා එකතු වීම, වාද්‍ය භාණ්ඩ යොදා ගැනීම සහ මණ්ඩපය සැරසිලිවල නවීන මෝස්තර යෙදීම ආදිය හඳුනා ගන්නා ලදී. කොළඹ සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල සති පිරිත් සජ්ඣායන සංස්කෘතිය මඟින් නූතනත්වය සමඟ අනුගත වීමේ පොදු ප්‍රවණතාවක් ප්‍රකාශ වන අතර තාක්ෂණික මාධ්‍ය භාවිතය සහ කාලීන අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම යන අංශවල සමානත්වයක් ගොඩනැගී ඇත. එම සමානත්වය හමුවේ සති පිරිත් සජ්ඣායන සම්ප්‍රදාය අඛණ්ඩව පවත්වා ගැනීම උදෙසා නූතනත්වය සහ සම්ප්‍රදාය අතර මනා සංකලනයක් පැවතීම අවශ්‍ය බව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද : කොළඹ දිස්ත්‍රික්කය, නූතන විචල්‍යතා, බෞද්ධ චාරිත්‍ර, රත්නපුර දිස්ත්‍රික්කය, සති පිරිත් සජ්ඣායනය

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ආශ්චර්යාත්මක යථාර්ථවාදයෙන් නිරූපිත සැබෑ ජීවිත යථාර්ථය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සිංහල කෙටිකතා කිහිපයක් ඇසුරෙන්)

කේ.යූ.ඩී. හර්ෂණී
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20221@arts.pdn.ac.lk

ආශ්චර්යාත්මක යථාර්ථවාදය වූ කලී වාස්තවික ලෝකයේ පවතින සමාජ, දේශපාලනික සහ සංස්කෘතික සැබෑ තත්ත්ව (සත්‍ය) අද්භූත හෝ ආශ්චර්යමත් සිදුවීම් සමඟ බද්ධ කරමින් නිරූපණය කරනු ලබන සාහිත්‍යමය ශිල්ප ක්‍රමයක් වශයෙන් හඳුනාගත හැකිය. සමකාලීන සිංහල කෙටිකතා කලාව තුළ ආශ්චර්යාත්මක යථාර්ථවාදී ශිල්ප ක්‍රම භාවිත කරමින් ලාංකේය සමාජයෙහි සැබෑ ජීවිත යථාර්ථය නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කිරීම මෙම පර්යේෂණය අරමුණ විය. සාම්ප්‍රදායික කතා වින්‍යාසයෙන් බැහැර වන ආශ්චර්යාත්මක යථාර්ථවාදය මායාව හා සැබෑව අතර වන සීමා සහිත බව බිඳ දමයි. එහිදී, ලාංකේය කෙටිකතාකරුවන් භෞතික ලෝකයෙහි දෘශ්‍යමාන සත්‍යය අභිබවා යන මනෝභාව තත්ත්ව, ආගමික හා මිථ්‍යා විශ්වාස හා පන්ති විසමතාව වැනි සංකීර්ණ වූ සමාජීය අත්දැකීම් නිරූපණය කිරීමට මෙම විචාර ක්‍රමවේදය මෙවලමක් වශයෙන් භාවිතයට ගෙන ඇත. මෙකී පර්යේෂණයට අනුව සිංහල කෙටිකතාවෙහි ආශ්චර්යය යන්න හුදෙක් චමත්කාරයක් හෝ මනඃකල්පිතයක් නොවන අතර එය මිනිස් ජීවිතයෙහි යටිපෙළ පවතින බේදවාචකය සහ සංකීර්ණ මනෝවිද්‍යාත්මක ස්වභාව වඩාත් තීව්‍ර ආකාරයෙන් ප්‍රකාශ කිරීමේ උපාය මාර්ගයකි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුව සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී තෝරාගත් කෙටිකතාවල අන්තර්ගතය, භාෂා ප්‍රයෝග සහ ව්‍යූහය ගැඹුරු සාහිත්‍යමය විශ්ලේෂණයකට සහ කියවීමකට ලක් කර ඇත. එහිදී, පැහැදිලි වන්නේ සිංහල කෙටිකතාකරුවන් බටහිර ආභාසය ලද මෙම ශිල්ප ක්‍රමය දේශීය සංස්කෘතික අනන්‍යතා සහ ජනශ්‍රැතිකාංග උදෙසා උචිත වන පරිදි ප්‍රතිනිර්මාණය කර ඇති බවය. අවසාන වශයෙන්, ආශ්චර්යාත්මක යථාර්ථවාදය යනු සැබෑ ජීවිත යථාර්ථය වසන් කරන්නක් නොව එම යථාර්ථයේ ගැඹුරු ස්ථර ස්පර්ශ කරමින් සමාජීය ගැටලු පිළිබඳව පාඨකයා තුළ වඩාත් විචාරශීලී අවබෝධයක් සහ සංවේදීතාවක් ඇති කිරීමට සමත් වන ප්‍රබල සාහිත්‍ය ප්‍රවේශයක් (විචාරවේදයක්) වන බවට හඳුනාගත හැකි බවයි.

ප්‍රමුඛ පද: ආශ්චර්යාත්මක යථාර්ථවාදය, පශ්චාත් නූතන සිංහල ප්‍රබන්ධ, පෙළ විග්‍රහය, මායාව සහ සැබෑව, සැබෑ ජීවිත යථාර්ථය

මෙම අධ්‍යයනය සඳහා මහින්ද රත්නායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකට සිහිපත් කරමි.

පේන කීම පිළිබඳ තුලනාත්මක ජනශ්‍රැති අධ්‍යයනයක්: තෝරා ගත් ජන සංස්කෘති කිහිපයක් ඇසුරෙන්

ටී. ඩබ්ලිව්. ජී. හර්ෂිකා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20222@arts.pdn.ac.lk

පේන කීම විවිධ ජන සංස්කෘතිවල ජනයා අනාදිමත් කාලයක සිට සිය අභිමතාර්ථ සපුරා ගැනිමටත්, නොපෙනෙන දේ නොදැනෙන දේ දැන ගැනීම උදෙසාත් භාවිත කළ ගුප්ත ශාස්ත්‍ර ක්‍රමයක් ලෙස දැක්විය හැකිය. ඒ අනුව මිනිසා තමා දන්නා උපක්‍රමවලින් පමණක් සිය අභිමත කාර්යයන් ඉටු කර ගැනීම නිෂ්ඵල බව තේරුම් ගත් විට එයට යොදනු ලබන ආධාරකය මෙවැනි අභිචාර වේ. ගුප්ත ශාස්ත්‍ර විද්‍යාවට අයත් පේන කීම විදේශීය හා දේශීය ජන සංස්කෘති කිහිපයක් ඇසුරෙන් විමසීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එහිදී ශ්‍රී ලංකාවේ පේන කීමේ ජනශ්‍රැති හා විදේශීය සංස්කෘතිවල පවතින විශ්වාස තුලනාත්මකව විමසීමත්, අද්‍යතන යුගයේ පවතින පේන කීම පිළිබඳ අධ්‍යයනය, දේශීය හා විදේශීය සංස්කෘති වන ඉන්දීය හා යුරෝපීය සංස්කෘති අතර සමානතා හා විචල්‍යතා හඳුනා ගැනීමත් අනු අරමුණු විය. අද්‍යතන ජන සංස්කෘතිවල පේන කීම චර්යාවක් වශයෙන් ක්‍රියාත්මක වන ස්වරූපය කවරාකාර වන්නේ ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුවයි. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක ක්‍රමවේදය යොදා ගත් අතර ගැඹුරු සම්මුඛ සාකච්ඡා වශයෙන් ප්‍රාථමික දත්ත රැස් කළ අතර ද්විතීයක දත්ත සඳහා පුස්තකාල පරිශීලනය හා විද්‍යුත් මූලාශ්‍රය භාවිත කෙරිණි. දත්ත විශ්ලේෂණයේ දී විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදි. ඓතිහාසික හා නූතන සමාජයේ මානව චර්යා අධ්‍යයනයෙහිලා මෙම පර්යේෂණය වැදගත් වන අතර එහි පවතින අනාවැකි ඵල කිරීමේ කාර්යයභාරය අධ්‍යයනයෙන් එහි තිබෙන සමාජීය වැදගත්කම් පැහැදිලි කර ගත හැකි විය. මෙම අධ්‍යයනයේ දී පේන කීම ගුප්ත ශාස්ත්‍රයක් වශයෙන් පමණක් නොව, මානසික හා සමාජීය අවශ්‍යතා සඳහා ඓතිහාසිකව මෙන්ම අද්‍යතන ජන සංස්කෘතිවල භාවිත වන්නක් බවත්, පේන කීම සම්බන්ධ විශ්වාස සහ චාරිත්‍රයන් සමාජීය, ආගමික, සංස්කෘතික බලපෑම් අනුව විකාශනය වී ඇති අතර දේශීය හා විදේශීය පේන කීමේ ආකාරයේ විවිධ සමානතා හා විචල්‍යතා ඇති බවත් අනාවරණය විය. එහිදී පේන කීමේ දී චාරිත්‍ර හා වාරිත්‍රවල, භාවිත කරන උපකරණ, පාරිසරික පසුබිම් හා සංස්කෘතීන් අනුව එහි සමානතා හා විචල්‍යතා ඇති බව අනාවරණය විය. ඒ අනුව වර්තමානය වන විටත් පේන කීම නොනැසී පවතින අතර අතීතයට සාපේක්ෂව දේශීය පේන කීම අද්‍යතනයේ බටහිර බලපෑමට ලක්ව ඇති බවත් විදේශීය පේන කීම ද අද්‍යතනයේ ප්‍රචලිතව ඇති බවත් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: අද්‍යතන යුගය, ගුප්ත ශාස්ත්‍රය, ජන සංස්කෘති, තුලනාත්මක ජනශ්‍රැති, පේන කීම

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මඩවල එස්. රත්නායකගේ නවකතාවල වස්තු විෂයක විවිධත්වය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්. එස්. හසුදුනි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20226@arts.pdn.ac.lk

නවකතාව යනු ප්‍රබන්ධ සාහිත්‍යයේ සුවිශේෂ අංගයක් වේ. ලාංකේය නවකතා කලාවෙහි ප්‍රමුඛ ලේඛකයෙකු වශයෙන් සැලකෙන මඩවල එස්. රත්නායක යනු නවකතාව නව මාවතක් ඔස්සේ විකාසනය කළ ලේඛකයෙකි. ප්‍රධාන වශයෙන් මඩවල එස්. රත්නායක සහ ඔහුගේ නවකතා පිළිබඳ මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කර ඇත. එහි දී මඩවල එස්. රත්නායකගේ නවකතාවල අන්තර්ගත වස්තු විෂයය විවිධත්ව අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. සාහිත්‍යයෙහි වස්තු විෂයය යන්න හඳුනා ගැනීම මෙහි අනු - අරමුණ විය. ඔහුගේ නවකතාවල විවිධත්ව සඳහා වස්තු විෂයය, එහි ස්වභාව එකී නවකතා මඟින් ප්‍රතීයමාන වන්නේ කවරාකාරයෙන් ද? යන්න පර්යේෂණ ගැටලුව වූ අතර, නවකතාවක ව්‍යූහය සහ ශෛලිය කෙරෙහි වස්තු විෂයයෙහි බලපෑම තත්කාලීන සමාජ, දේශපාලන, ආර්ථික පසුබිම විමසීම ශාස්ත්‍රීය වශයෙන් මෙහි වැදගත්කම ලෙස හඳුනා ගත හැකි ය. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පුස්තකාල පරිශීලනයෙන් හා අන්තර්ජාල පරිශීලනයෙන් දත්ත රැස් කර ගන්නා ලදි. පර්යේෂණ විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණි. එහි දී තත්කාලීන සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික පසුබිම, සමාජ සංස්කෘතික පීඩන හමුවේ පුද්ගල මනෝභාව, නාගරීකරණ සහ ග්‍රාමීයත්ව පසුබෑම, සමාජ අභියෝග හමුවේ පුද්ගල ජීවිතය, සමාජ සබඳතා ආදී පුළුල් වපසරියන් ඔහුගේ ප්‍රබන්ධකරණයට හසු වී තිබේ. එමෙන් ම මඩවල එස්. රත්නායක සෙසු ලේඛකයන්ගෙන් වෙනස් වන ප්‍රධාන ලක්ෂණය වන්නේ, ඔහුගේ නිර්මාණ හුදෙක් කතාන්දර ගොඩනැගීමට පමණක් සීමා නොවී ඔහු තම නවකතා මඟින් තත්කාලීන සමාජයේ යථාර්ථය සහ එහි පවතින ගැඹුරු සමාජ, දේශපාලනික හා ආර්ථික පසුබිම ඉතා විචාරාත්මකව මතු කර දැක්වීමයි. ඒ අනුව කතුවරයාගේ ජීවන අත්දැකීම් සහ සමාජ අත්දැකීම්වලට වඩා තත්කාලීන සමාජය ම තම නවකතා මඟින් ප්‍රබල ලෙස නිරූපණය කිරීමට ඔහු සමත් වී ඇති බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : තත්කාලීන සමාජය, නවකතා, මඩවල එස්. රත්නායක, වස්තු විෂයය, විවිධත්වය

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

අහිකුණ්ඨික ජනයාගේ ජන ජීවිතය පිළිබඳ මානවවංශ විවරණාත්මක අධ්‍යයනයක් (කුරුණෑගල අන්දරබැද්ද ග්‍රාමය ඇසුරින්)

එච්. එම්. වයි. එස්. හේරත්
සිංහල අධ්‍යයන අංශය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20236@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ වාසය කරන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන ප්‍රධාන ජන වර්ගවලට අමතර ව සුළු ජන වර්ග කිහිපයක් ද ලංකාවේ නිත්‍ය සාමාජිකයන් බවට පත් ව ඇත. එලෙස ජීවත් වන සුළු ජන කණ්ඩායම් අතරින් සංක්‍රමණික ජීවිතයක් ගත කරන අහිකුණ්ඨික ජනයාට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. ඕනෑම දේශයක පවත්නා ප්‍රධාන ජන සංස්කෘති අතුරින් උප සංස්කෘතියක ජීවත් වන ජන කොට්ඨාසයක් ලෙස අහිකුණ්ඨික ජනයා වඩාත් වැදගත් වේ. කුරුණෑගල අන්දරබැද්ද ප්‍රදේශය අහිකුණ්ඨික ජනයාගේ ජන සංස්කෘතිය හඳුනාගැනීමට වඩාත් සුවිශේෂ ප්‍රදේශයකි. මුල්ම කාල වකවානුවේ සිට වර්තමානය දක්වා අන්දරබැද්ද ජනයාගේ ජන ජීවිතය විකාශනය වී ඇති ආකාරය හඳුනා ගැනීම පර්යේෂණ අරමුණ බවට පත් වූ අතර වර්තමානයේ ඔවුන් මුහුණ දෙන අභියෝග, ගැටලු මෙන් ම බලපෑම් පිළිබඳවත් සමාජ, දේශපාලන, ආර්ථික තත්ත්ව ගවේෂණයත් අනු අරමුණු විය. පර්යේෂණ විධික්‍රමයේ දී මානවවංශ ක්‍රමවේදයට ප්‍රමුඛස්ථානයක් ලබා දුන් අතර මානවවංශ ක්‍රමවේදය යනුවෙන් සලකනු ලබන්නේ ක්‍රීඩා ජන කණ්ඩායමක් පිළිබඳ ව ගැඹුරින් කරනු ලබන අධ්‍යයනයකි. මෙහි දී දත්ත රැස්කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනුණු අතර ක්ෂේත්‍ර අධ්‍යයන සම්මුඛ සාකච්ඡා පුස්තකාලය හා අන්තර්ජාලය පරිශීලනය කෙරුණි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. එහි දී අනාවරණය වූයේ රිලවුන් නැටවීම, නයි නැටවීම හා පිඹුරන් ප්‍රදර්ශනයත් සාස්තර කීමත් මූලික ජීවනෝපාය කොටගත් මෙම ජන කොට්ඨාසය බහුල වශයෙන් තෙළිඟු භාෂාව භාවිත කරන බවයි. එමෙන්ම කාලි අම්මා ප්‍රමුඛ කොටගත් කන්නම්මාසාමී, මසම්මා, සල්ලිපුරම්මා මෙන්ම පුල්ලෙයාර් දෙවියන් ප්‍රමුඛ කොටගත් ඇදහිලි විශ්වාස පද්ධතියකට යටත් ව ඔවුන් ජීවත් වන බව අනාවරණය විය. ආරච්චිල ප්‍රමුඛ කොටගත් පාලන තන්ත්‍රයකට අනුව ජීවත් වන ඔවුන්ගේ දරුවන් වර්තමානයේ දී සුළු වශයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වීම ද පර්යේෂණය මඟින් අනාවරණය විය. සමිති සමාගම් පිහිටුවා ගනිමින් එකිනෙකාට උදව් උපකාර කිරීමේ සමාජ චර්යාවක් ද ඔවුන් අතර පවතින බව අනාවරණය විය. එමෙන්ම දේශපාලන බලධාරීන්ගේ අඩු අවධානය යොමුවීමත්, සමාජයෙන් පහත් යැයි සැලකීමත්, ඉඩම් හිඟයත්, ජල ගැටලුවත් ඔවුන්ගේ චර්යාවට බාධා වී ඇති බව තහවුරු විය. කෙසේ වුව ද පර්යේෂණය සඳහා සහාය දක්වමින් ඔවුන් ප්‍රකාශ කර සිටියේ ගැටලු සඳහා කඩිනම් පියවර සැපයීම ඔවුනගේ හෙට දිනය සඳහා විජයග්‍රාහී පියවරක් වන බවයි.

ප්‍රමුඛ පද: අහිකුණ්ඨික ජනයා, ජන සංස්කෘතිය, තෙළිඟු භාෂාව, මානවවංශ ක්‍රමවේදය, සමාජ චර්යාව

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සූත්‍ර පිටකයේ අන්තර්ගත භාව ප්‍රකාශනවලින් නිරූපිත 'විරාගීත්වය' පිළිබඳව 'රස සංකල්පය' ඇසුරෙන් සිදුකෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් (සූත්‍ර පිටකයේ තෝරාගත් කොටස් ආශ්‍රයෙන්)

ජී.කේ.කේ. හිරුෂිකා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20246@arts.pdn.ac.lk

කාව්‍යයෙහි රසය පිළිබඳ සංකල්පය පෙර-අපර දෙදිගම කාව්‍ය විචාර ක්ෂේත්‍රවල පුළුල් ලෙස කතිකාවට ලක් වූවකි. භෞතික හා ආධ්‍යාත්මික ලෙස දෙයාකාර වන මෙම රස සංකල්පය, ත්‍රිපිටක සාහිත්‍යයේ දී ගැඹුරු ධර්ම කරුණු සෞන්දර්යාත්මක ලෙස ප්‍රකාශනයට යොදා ගෙන ඇති ආකාරය මෙහිදී අවධානයට යොමු විය. සූත්‍ර පිටකයෙන් තෝරාගත් සූත්‍ර මෙන් ම ධම්මපද ගාථා හා ථේර ථේරී ගාථා මෙම පර්යේෂණය සඳහා පාදක විය. මෙහි විශේෂත්වය නම් රස නිෂ්පත්තියෙහි මූලික ක්‍රියාවලිය රාගය සඳහා නොව විරාගය ඉස්මතු කිරීම සඳහා භාවිතයට ගෙන තිබීමයි. ඒ අනුව, ලෞකිකත්වය ඉක්මවා ප්‍රඥාගෝචර විරාගී දර්ශනයකට රසභාව අලංකාරාදිය උපයුක්ත කර ගත හැකි ආකාරය සූත්‍ර පිටකයේ කොටස් ආශ්‍රයෙන් පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. එසේම, ශාන්ත රසය විරාගයට සමපාක්ෂික හා සමාන්තර වීම පාදක කොට ගෙන ඒ අනුසාරයෙන් විරාගය රසයක් ලෙස අගය කළ හැකි බවට තර්ක කිරීමත්, ලෞකික මෙන්ම ලෝකෝත්තර රසයක් ලෙස විරාගීත්වය හඳුනා ගත හැකි ද යන්න පරීක්ෂා කිරීමත් මෙහි අනු අරමුණු විය. පර්යේෂණ ගැටලුව වූයේ විරාගික භාවයන් සහිත ලෝකෝත්තර දර්ශනයක් ඉදිරිපත් කිරීම සඳහා සූත්‍ර පිටකයේ ඉදිරිපත් වී ඇති අදහස්වල රසභාව අලංකාරාදිය අන්තර්ගත වී ඇත්තේ කෙසේද යන්නයි. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල පරිශීලනයෙන් දත්ත රැස් කිරීම සිදුකෙරිණි. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සූත්‍ර පිටකය ද ද්විතීයක මූලාශ්‍රය වශයෙන් පර්යේෂණ, ශාස්ත්‍රීය ලිපි හා අන්තර්ජාලය යොදා ගැනුණි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමය උපයෝගී කරගත් අතර රස සංකල්පය මෙහි න්‍යායික පසුබිම විය. මෙම විශ්ලේෂණය ඔස්සේ රස සංකල්පය විරාගය ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා සූත්‍ර පිටකයේ දී ගැඹුරු ප්‍රකාශන ක්‍රමයක් ලෙස භාවිත වී ඇති බව අනාවරණය විය. එසේම, නව රසයක් ලෙස විරාගීත්වය හඳුන්වා දීමට ඇති හැකියාව ද මෙහි දී ඉස්මතු කළ හැකි වූ අතර රස සංකල්පයෙහි එන ශාන්ත රසය විරාගය දැනවීමට උපයුක්ත වන බවත්, සූත්‍ර පිටකයේ ඉදිරිපත් වී ඇති ප්‍රකාශනවල රසභාව අලංකාරාදිය ලෞකිකත්වයට වඩා එය ඉක්මවා යන විරාගික වූ ලෝකෝත්තර රසයක් ඉස්මතු වන පරිදි යෙදී ඇති බවත් නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද : භාව ප්‍රකාශන, රසය, ලෝකෝත්තර දර්ශනය, විරාගීත්වය, සූත්‍ර පිටකය

මෙම අධ්‍යයනය සඳහා දිනූෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දෙවන භාෂාව ලෙස සිංහල හදාරන ලාංකේය පාසල් සිසුන්ගේ භාෂා සාවද්‍යතා සහ එම සාවද්‍යතා අවම කර ගැනීමේ යෝජනා පිළිබඳ වාග්විද්‍යාත්මක අධ්‍යයනයක් (අල්මිනා මුස්ලිම් විද්‍යාලය - ඉබ්බාගමුව, මායිවෙල මුස්ලිම් විද්‍යාලය - මැල්සිරිපුර යන පාසල් ඇසුරෙන්)

එන්. ඒ. එන්. පබසරා ඉන්ද්‍රවංශ
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20253@arts.pdn.ac.lk

ශ්‍රීග ලංකාව වැනි බහුභාෂක සමාජයක දෙවන භාෂාවක් ලෙස සිංහල භාෂාව ප්‍රගුණ කිරීම සිසුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි. ව්‍යවහාරික වාග්විද්‍යාවේ ප්‍රභේදයක් වන දෙවන භාෂා ඉගෙනුම පදනම් කරගනිමින්, දෙවන භාෂාව ලෙස සිංහල හදාරන ලාංකේය පාසල් සිසුන්ගේ ලිඛිත සහ කථන භාෂා ස්වරූපවල පවතින සාවද්‍යතා සහ ඒවා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරාකාර වේදැයි යන ගැටලුව නිරාකරණය කරගැනීමේ අරමුණින් සිදු කරන ලද මෙම පර්යේෂණයේදී ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත රැස් කරන්නට යෙදුණු අතර විස්තරාත්මක විධි ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කරන්නට විය. අල්මිනා මුස්ලිම් විද්‍යාලය - ඉබ්බාගමුව, මායිවෙල මුස්ලිම් විද්‍යාලය - මැල්සිරිපුර යන පාසල් ආශ්‍රයෙන් සිදුකළ මෙම පර්යේෂණයේදී සිසුන්ගේ ලිඛිත සහ කථන භාෂා භාවිතයේ ඇතිවන භාෂා සාවද්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒවා වාග්විද්‍යාත්මකව වර්ගීකරණය කිරීම සහ හේතු විමර්ශනය කිරීම සඳහා සාවද්‍යතා විශ්ලේෂණය නම් වාග්විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණි. සිසුන් සිදු කළ සාවද්‍යතා ප්‍රධාන වශයෙන් ශබ්ද - ශබ්දිම ආශ්‍රිත සාවද්‍යතා, පද ආශ්‍රිත සාවද්‍යතා, වාක්‍ය ආශ්‍රිත සාවද්‍යතා සහ අර්ථ ප්‍රකරණ ආශ්‍රිත සාවද්‍යතා ලෙස හඳුනාගත හැකි අතර එම සාවද්‍යතාවලට ප්‍රධානතම හේතු සාධක ලෙස ප්‍රථම භාෂාවේ ආභාසය, සිසුන්ගේ පවතින ආකල්ප සහ සමාජ පසුබිම වැනි කරුණු බලපාන බවත් අනාවරණය විය. සිසුන්ගේ භාෂා කුසලතා වර්ධනය කිරීම සඳහා පවතින ඉගැන්වීමේ ක්‍රමවේද කාලීන අවශ්‍යතාවලට අනුකූලව යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවක් පවතින අතර භාෂා සාවද්‍යතා හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නොවී සිසුන් ක්‍රියාකාරීව සම්බන්ධ කර ගන්නා ප්‍රායෝගික ක්‍රියාකාරකම් හඳුන්වාදීම අත්‍යවශ්‍ය වේ. සිසුන්ගේ භාෂාමය අවශ්‍යතා සහ නිපුණතා මට්ටම්වලට අනුකූලවන විෂය නිර්දේශ සහ ඉගැන්වීම් ක්‍රමවේද නවීකරණය කිරීම, සිසුන්ගේ වාචික සන්නිවේදන නිපුණතාවය වර්ධනය කිරීමට වාචික අභ්‍යාස සහ සන්නිවේදන වැඩසටහන් පන්ති කාමරයේ ක්‍රියාත්මක කිරීම, සිංහල භාෂිත පාසල් ඇසුරු කිරීමට අවස්ථාව ලබාදීම, දෙවන භාෂාවක් ලෙස සිංහල ඉගැන්වීම සඳහා අවශ්‍ය විශේෂිත වූ ගුරු පුහුණු පාඨමාලා පැවැත්වීම වැනි භාෂා සාවද්‍යතා අවම කර ගැනීමේ යෝජනා මෙම පර්යේෂණයේදී ඉදිරිපත් කෙරේ.

ප්‍රමුඛ පද: දෙවන භාෂාව, භාෂා සාවද්‍යතා, ව්‍යවහාරික වාග්විද්‍යාව, සාවද්‍යතා විශ්ලේෂණය, සිංහල භාෂාව

මෙම පර්යේෂණය සඳහා දිලිනි ආරියවංශගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

අද්‍යතන පුවත්පත් විශේෂාංග ලිපි ඔස්සේ අනාවරණය වන නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් පුවත්පත් විශේෂාංග ලිපි ඇසුරෙන්)

ඒ.එම්. ජයමාලි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20265@arts.pdn.ac.lk

"ආරංචි පත්‍රය" යනුවෙන් ආරම්භයේ දී හඳුන්වන ලද පුවත්පත පසුගිය දශක කිහිපයේ දී විවිධ විපර්යාස රැසකට ලක් වී ඇත. මෙකී විපර්යාස පදනම් කරගනිමින් අද වන විට පුවත්පත හුදෙක් තොරතුරු ඉදිරිපත් කිරීම පමණක් අරමුණු නොකොට විවිධ අංගෝපාංගවලින් සමන්විත නිර්මාණාත්මක ප්‍රකාශන මාධ්‍යයක් බවට පත් ව ඇත. පුවත්පතක ප්‍රධාන වශයෙන් අන්තර්ගත වන්නේ ප්‍රවෘත්තිමය අගයකින් යුතු පුවත් වුවත් එහි ආකර්ෂණීයත්වයක් හා විවිධත්වයක් ඇති කිරීමට සමත් අංගයක් ලෙස විශේෂාංග ලිපිය හඳුන්වාදිය හැකි ය. එය සමාජය පිළිබඳ ගැඹුරු අවබෝධයක් විචාරාත්මක දැක්මක් ජනනය කිරීමට සමත් වන අතර පාඨකයාට නව දැනුමක් ලබා දීමට, විවිධ මානවලින් ලෝකය දෙස බැලීමට අවස්ථාව සලසා දේ. විශේෂාංග ලේඛකයා අන්‍ය ප්‍රවෘත්ති ලේඛකයෙකුගෙන් වෙනස් වන්නේ තම ලේඛනය වඩාත් නිර්මාණාත්මක හා කලාත්මක අකාරයකින් ඉදිරිපත් කිරීමෙනි. සාමාන්‍ය පුවත් ලිපිවලට වඩා නිදහස් ව්‍යුහයකින් යුක්ත වන විශේෂාංග ලිපියක ආරම්භයේ සිට අවසානය දක්වා පාඨකයා රඳවා තබා ගැනීමට හැකි වනුයේ රසවත්, සිත් ගන්නා සුලු සහ නිර්මාණාත්මක ශෛලියකින් ඉදිරිපත් කිරීමෙනි. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වුයේ පුවත්පතක ප්‍රධාන අංගයක් වන විශේෂාංග ලිපි, පාඨක ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා නිර්මාණාත්මක සන්නිවේදනය උපයෝගී කරගනු ලබන්නේ කවරාකාරයෙන්ද යන්න අධ්‍යයනය කිරීම යි. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත රැස් කිරීම සිදු වූ අතර එලෙස රැස් කරන ලද දත්ත විස්තරාත්මක ක්‍රමවේදය යටතේ විශ්ලේෂණය කිරීම සිදු විය. එහි දී වර්තමාන පුවත්පත් මගින් පාඨකයා ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ක්‍රමෝපාය අනුගමනය කරන බව අනාවරණය වූ අතර විශේෂාංග ලිපිය සෑම විට ම එකී කාර්යය නිර්මාණාත්මක ලක්ෂණ උපයෝගී කර ගනිමින් සිදු කරන බව පැහැදිලි විය. එබැවින් අද්‍යතන පුවත්පත් විශේෂාංග ලිපි තොරතුරු සැපයීම, අදාළ සන්දර්භය පිළිබඳ හාත්පස අවබෝධය ලබාදීම පමණක් අරමුණු නොකොට පාඨකයා ආකර්ෂණය කර ගැනීම සඳහා විවිධ ක්‍රමෝපායන් අනුගමනය කරන බව හඳුනාගත හැකි විය. එහි දී වාර්තාමය ස්වරූපයෙන් වෙනස් ව නිර්මාණාත්මක ප්‍රකාශන විධි සඳහා මූලිකත්වය දෙමින් ලිපිය අවසානය දක්වා පාඨකයා රඳවා ගැනීම සිදු වේ. එම නිර්මාණාත්මක සන්නිවේදන ලක්ෂණ ගවේෂණාත්මක සහ පරිකල්පනීය ස්වභාවයකින් යුක්ත වන අතර පාඨකයාගේ විචාරාත්මක දැක්ම නිර්මාණාත්මක චින්තනය පුබුදු කරමින් අදාළ සන්දර්භය පාඨකයා කෙරෙහි වඩාත් සමීප කිරීම සිදු වේ.

ප්‍රමුඛ පද : පුවත්පත, නිර්මාණාත්මක සන්නිවේදනය, පාඨකයා, විශේෂාංග ලිපිය

මෙම අධ්‍යයනය සඳහා සාලිය කුලරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ සර්ප විෂ වෙදකම හා බැඳි සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (පොතුහැර වෙද පරම්පරාව ඇසුරින්)

එස්. ඒ. එන්. ජයරත්න
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20273@arts.pdn.lk

ශ්‍රී ලාංකේය පාරම්පරික වෛද්‍ය විද්‍යාව ව්‍යවහාරික විද්‍යාවක සීමාවන් ඉක්මවා ගිය, දේශීය සංස්කෘතිය සහ ආත්මීය චින්තනය සමඟ බද්ධ වූ සුවිශේෂ ඥාන පද්ධතියකි. ඉන් සර්ප විෂ වෙදකම ප්‍රධාන තැනක් ගන්නා අතරම සර්ප විෂ හා බැඳි ප්‍රතිකාර ක්‍රම, භාවිත කරන අභිචාර විධි, ගුරුකම්, යන්ත්‍ර, මන්ත්‍ර, ඖෂධ, ජනශ්‍රැති යනාදි සංස්කෘතිකාංග විමර්ශනයෙහි ලා ශ්‍රී ලාංකික සර්ප විෂ වෙදකම හා බැඳි පාරම්පරික විෂමතාවක් හැඳිනගත හැකිය. මෙම පර්යේෂණයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සර්ප විෂ වෙදකම හා බැඳි සංස්කෘතිය පිළිබඳ එම පොතුහැර වෙද පරම්පරාව ඇසුරින් විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කෙරිණි. විශේෂයෙන්ම වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගත් පොතුහැර පාරම්පරික සර්ප විෂ වෙද පරම්පරාව සතු ඖෂධීය, ආගමික සහ මනෝ චිකිත්සක සුසංයෝගය පිළිබඳව මෙතෙක් ප්‍රමාණවත් විද්‍යාත්මක හෝ සංස්කෘතික විමර්ශනයක් සිදුව නොමැති වීම මෙම පර්යේෂණයට පාදක වූ ගැටලුවයි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඓතිහාසික 'පොතුහැර සර්ප විෂ වෙද පරම්පරාව' ඇසුරින් දේශීය සර්ප විෂ වෙදකමෙහි අන්තර්ගත වන සංස්කෘතික සාහිත්යික සහ ආධ්‍යාත්මික පදනම විමර්ශනය කිරීමයි. බටහිර විද්‍යාවේ සීමාවන්ට හසු නොවන එහෙත් ප්‍රායෝගිකව රෝගීන් සුවපත් කරන මන්ත්‍ර, පේ කිරීම් සහ වත්පිළිවෙත්වල පවතින මනෝ චිකිත්සක වටිනාකම සාක්ෂි සහිතව පෙන්වාදීමට මෙහිදී අපේක්ෂා කෙරිණි. පර්යේෂණ ක්‍රමවේද ලෙස මෙම අධ්‍යයනය ප්‍රාථමික දත්ත වශයෙන් පොතුහැර පරම්පරාවේ වර්තමාන උරුමකරුවන් සමඟ පැවැත්වූ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, පාරම්පරික පුස්කොළ පොත් සහ රහස් වට්ටෝරු පරිශීලනය කරන ලදි. ද්විතීයක දත්ත දේශීය වෛද්‍ය ඉතිහාසයට අයත් මූලාශ්‍රය භාවිත කරමින් සංසන්දනාත්මක විශ්ලේෂණයක් සිදු කරන ලදි. පර්යේෂණයේ දී අනාවරණය වූ පරිදි පොතුහැර සර්ප විෂ වෙදකම යනු හුදු ශාකසාර ප්‍රතිකාර ක්‍රමයක් පමණක් නොව, එය ආධ්‍යාත්මයද සුව කරන සංස්කෘතික ආයතනයක් බව හෙළි විය. බටහිර වෛද්‍ය විද්‍යාවෙන් පහත් ලෙස සැලකූ විෂනාශක කෙම් ක්‍රම සහ මන්ත්‍ර ජප කිරීම්, සැබැවින්ම රෝගියාගේ මානසික ආතතිය සහ මරණ බිය පාලනය කරන සාර්ථක මනෝ විද්‍යාත්මක උපක්‍රම බව හඳුනාගන්නා ලදි. එමෙන්ම දේශීය පරිසර පද්ධතිය සහ භූ විෂමතාව පිළිබඳ ගැඹුරු පාරිසරික ඥානයක් මෙම පරම්පරාව සතු බව සනාථ විය. එනිසා පොතුහැර සර්ප විෂ වෙදකම වැනි පාරම්පරික උරුමයන් රැක ගැනීම යනු හුදු අතීතකාමයක් නොව එය නූතන වෛද්‍ය විද්‍යාවේ පවතින යාන්ත්‍රික සීමාවන් ජයගත හැකි සිරුර සහ මනස එකලෙස සුවපත් කරන ජීවී විද්‍යාවක් බව මෙම අධ්‍යනයේ දී නිගමනය කළ හැකිව පවතී.

ප්‍රමුඛ පද: පොතුහැර වෙද පරම්පරාව, මනෝ චිකිත්සා, සර්ප විෂ ප්‍රතිකාර, සර්ප විෂ වෙදකම, හෙළ වෙදකම

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන සිංහල කවියේ පාරිසරික වර්ණනා
(කොළඹ යුගයේ තෝරාගත් කවීන්ගේ පද්‍ය ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්)

එච්.එම්.එස්.බී. ජයසූරිය
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20279@arts.pdn.ac.lk

ඓතිහාසික යුගයේ සිටම පරිසරය සහ කවිය අතර අවියෝජනීය සබඳතාවක් පැවතුණි. පෙරදිග කාව්‍ය සම්ප්‍රදායෙහි මෙන්ම අපරදිග කාව්‍යය සම්ප්‍රදායෙහිද පරිසරය හෙවත් ස්වභාව සෞන්දර්ය කවියේ ප්‍රධාන වස්තු විෂයය ලෙස භාවිත කර ඇත. සිංහල සාහිත්‍යයෙහි ද ආරම්භක අවධියේ සිටම ස්වභාවධර්මය හෙවත් පරිසරය කවීන්ගේ අවධානයට ලක්වුණි. විශේෂයෙන් සන්දේශ කාව්‍ය, මහා කව්‍ය ආදියේදී පරිසර වර්ණනාවට හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. ඓතිහාසික යුගයේදී මෙකී පරිසර වර්ණනා භාවිත කරන ලද්දේ හුදු සෞන්දර්යාත්මක අර්ථයකින් පමණි. කොළඹ කවියේදී හෙවත් නූතන කවියේදී බටහිර රොමාන්තිකවාදයේ ආභාසයත් සමඟ කවිය නව මාවතකට යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙසින් පරිසරය නමැති තේමාව හුදු සෞන්දර්යාත්මක චින්දනයට පමණක් සීමා නොවී ජීවිතාර්ථ මතු කරලීමේ ප්‍රබල කාව්‍යමය උපාය මාර්ගයක් ලෙස භාවිත කරයි. ඒ අනුව නූතන සිංහල කවියේ පාරිසරික වර්ණනා නිරූපණය වන්නේ කෙබඳු ආකාරයෙන් ද යන්න පිළිබඳ විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ කේන්ද්‍රීය මාතෘකාව වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කොළඹ යුගයේ තෝරාගත් කවීන්ගේ පද්‍ය නිර්මාණවල අන්තර්ගත පාරිසරික වර්ණනාවල සෞන්දර්යාත්මක අංශය විමර්ශනය කිරීමත් එමගින් සංකේතවත් කරන ජීවිතාර්ථ හඳුනා ගැනීමත් ය. එහි දී පරිසරය පිළිබඳ කොළඹ යුගයේ කවීන්ගේ කාව්‍යමය කියවීම කවරාකාරද යන පර්යේෂණ ගැටලුව කේන්ද්‍ර කර ගනිමින් අධ්‍යයනය සිදු විය. පර්යේෂණයේ උපන්‍යාසය වනුයේ කොළඹ යුගයේ කවීන් ස්වකීය කාව්‍ය නිර්මාණයන්හි පාරිසරික වර්ණනාවන් යොදාගෙන ඇත්තේ හුදෙක් සෞන්දර්යාත්මක චින්දනයක් සඳහා පමණක් නොව, එය ඉක්මවා ගිය ගැඹුරු ජීවිතාර්ථ, මානව අත්දැකීම් සහ සමාජීය යථාර්ථ නිරූපණය කිරීමේ අභිලාෂයෙන් බවයි. මෙකී අධ්‍යයනයේදී පුස්තකාල පරිශීලනයෙන් සහ අන්තර්ජාල ලිපි පරිශීලනයෙන් සිදු කරන ලද සාහිත්‍යය විමර්ශනයකින් අනතුරුව ප්‍රාථමික, ද්විතීයක, ගුණාත්මක දත්ත රැස්කර විස්තරාත්මක විධික්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කෙරිණි. මෙමගින් අනාවරණය වූයේ කොළඹ යුගයේ කවීන්ගේ පරිසර වර්ණනා ස්වභාවික පරිසරය සුන්දරත්වය වර්ණනා කිරීමෙන් ඔබ්බට ගොස් මිනිස් ජීවිතයේ විවිධ පැතිකඩ සංකේතාත්මකව නිරූපණය කරන බවයි. එබැවින් කොළඹ යුගයේ කාව්‍යයන්හි පරිසරය යන විෂය සෞන්දර්යාත්මක චින්දනයක් ලබා දීම සඳහා පමණක් නොව ජීවිතය හා සමාජය පිළිබඳ ගැඹුරු කතිකාවක් ඇති කිරීම පිණිස භාවිත වී ඇත.

ප්‍රමුඛ පද: ඓතිහාසික කවිය, කොළඹ යුගයේ කවීන්, නූතන සිංහල කවිය, පාරිසරික වර්ණනා

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල නවකතාවේ එන අපගාමී චරිත පිළිබඳ සහෘදයාත්මක පරිකල්පන න්‍යාය ඔස්සේ කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් නවකතා පහක් ඇසුරින්)

ආර් . ඒ . අයි . යූ ජයවර්දන
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20292@arts.pdn.ac.lk

නවකතාව නූතන සාහිත්‍ය ශානර අතර ප්‍රචලිත එක් සාහිත්‍යය ශානරයකි. නවකතාවේ මූලිකාංග අතර චරිත නිරූපණය කැපී පෙනෙන වගකීමක් ඉටු කරයි. මුල් කාලීනව සාහිත්‍යය මඟින් න්‍යාය අධ්‍යයනය කරනු ලැබුවද පසුකාලීනව න්‍යාය මඟින් සාහිත්‍යය අධ්‍යයනය කිරීම සිදු විය. එහිදී ප්‍රබන්ධකථාව අධ්‍යයනය උදෙසා සහෘදයාත්මක පරිකල්පන න්‍යාය යොදා ගත්තද අපගාමී චරිත විමර්ශනය කිරීම උදෙසා සහෘදයාත්මක පරිකල්පන න්‍යාය යොදා ගැනීම පිළිබඳ පර්යේෂණයක් සිදු කර නොමැත. මෙම පර්යේෂණය මඟින් එම ඌනත්වය පුරණය කරනු ලබයි. ඒ අනුව සිංහල නවකතාවේ එන අපගාමී චරිත පිළිබඳ සහෘදයාත්මක පරිකල්පන න්‍යාය ඔස්සේ කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් පර්යේෂණයේ තේමාත්මක පසුබිම විය. මෙම තේමාව ගවේෂණය කිරීම උදෙසා තෝරාගනු ලැබූ නවකතාවල අපගාමී ලෙස හඳුනා ගනු ලබන්නා වූ චරිත පදනම් කරගනු ලැබිණි. පර්යේෂණයේ මූලික අරමුණ වූයේ නවකතාවේ සඳහන් අපගාමී චරිත සහෘදයාත්මක පරිකල්පන න්‍යාය ඔස්සේ විග්‍රහ කිරීමයි. සිංහල නවකතාවේ එන අපගාමී චරිත පිළිබඳ විමර්ශනය කිරීම උදෙසා සහෘදයාත්මක පරිකල්පන න්‍යාය යොදාගත හැක්කේ කෙසේද යන ගැටලුවට ගොඩනගා ගත්තා වූ උපන්‍යාසය පුරණය කිරීමට මෙමඟින් අවකාශය උදා විය. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යෙදා ගන්නා ලදි. ගුණාත්මක පර්යේෂණය යටතේ ප්‍රස්තකාල භාවිතයත්, අන්තර්ජාලය පදනම් කර තොරතුරු ගවේෂණය කරනු ලැබීය. පර්යේෂණය ඇසුරින් කළ සොයා ගැනීම් ලෙස අපගාමී යැයි සැලකෙන චරිත ස්වාධීනව ගොඩනැඟීම සිදු නොවන අතර ඒ සඳහා ලිංගිකත්වය, ආර්ථිකය, දේශපාලනය සහ අධ්‍යාපනය යනාදී විවිධ සාධක බලපාන බව අනාවරණ විය. එමෙන්ම මෙම අපගාමී චරිතවලට දඬුවම් දීමට සාපේක්ෂව ඔවුන් බිහි වන හේතුසාධක විනාශ කිරීම හෝ පාලනය කිරීම මත වඩා සාර්ථක ලෙස අපගාමී තත්ත්ව පාලනය කළ හැකිය. ඒ අනුව මෙම පර්යේෂණය මඟින් පාඨකයාට ආගන්තුක වූත්, සමාජය විසින් බැහැර කරනු ලැබුවා වුත් චරිත වඩා සමීප ලෙස හා සාධාරණ ලෙස කියවා ගැනීමට හැකි වේ.

ප්‍රමුඛ පද: අපගාමීත්වය, චරිත නිරූපණය, ප්‍රබන්ධකථාව, සහෘදයාත්මක පරිකල්පනය

මෙම අධ්‍යයනය සඳහා මහින්ද රත්නායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල යොවුන් නවකතාවෙහි නිරූපිත අන්‍යත්වය පිළිබඳ අධ්‍යනයක් (තෝරාගත් යොවුන් නවකතා කිහිපයක් ඇසුරෙන්)

ඩබ්.ජී. ප්‍රසාදි කෞශල්‍යා
සිංහල අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20316@arts.pdn.ac.lk

කිසියම් සමාජ සන්දර්භයක ආධිපත්‍යය පතුරුවන සමාජ කණ්ඩායමක් විසින් ඇතැම් පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් කෙරේ වෙනස් ආකාරයකින් සැලකීම, කොන් කිරීම හෝ වෙන් කිරීමේ ක්‍රියාවලිය අන්‍යත්වය ලෙස හැඳින්වේ. එකී සමාජයෙහි ආධිපත්‍යය පතුරුවන පාර්ශ්වය තමන් (Self) ලෙසත්, සමාජයෙන් කොන් වන පිරිස අනෙකා (Other) ලෙසත් හැඳින්වේ. ලාංකේය සමාජයෙහි හඳුනාගත හැකි ජනවාර්ගිකත්වය, කුලය, පන්තිය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනාදී අනන්‍යතා ලක්ෂණ අනුව අනෙකා නිර්මාණය වීම සිදු වේ. මේ ආකාරයට සමාජයෙහි නිර්මාණය වන අන්‍යත්වය සිංහල යොවුන් නවකතාකරුවා සිය යොවුන් නවකතා නිර්මාණ මඟින් නිරූපණය කර ඇති ආකාරය අධ්‍යයනය මෙහිදී සිදු කරන ලද අතර, ඒ සඳහා කිම්බර්ලි කෘන්ෂෝ විසින් ඉදිරිපත් කර ඇති Intersectionality (අනන්‍යතා බන්ධනය) යන න්‍යායික ප්‍රවේශය භාවිත කරන ලදි. ශ්‍රී ලංකාව වනාහි බහුසංස්කෘතික සමාජ සන්දර්භයකට උරුමකම් කියන භූගෝලීය කලාපයකි. එබඳු සමාජයක සමාජ ඒකාබද්ධතාව මෙන්ම ජාතික ඒකාබද්ධතාවයද ගොඩනැංවීමේ මූලික කර්තව්‍යය හිමි වනුයේ රටේ තරුණ ප්‍රජාව වෙතටය. එනිසාවෙන් සමාජයෙහි පවත්නා මෙම අනන්‍යතා විවිධත්වය හඳුනාගෙන එයට අනුගත වෙමින් සහ ගරුකරමින් උසස් සමාජයක් වෙත පියනැගීම සඳහා ලාංකේය තරුණ පරපුර පෙළඹවීම සහ ඔවුන්ගේ ආකල්ප සංවර්ධනයට අවශ්‍ය මාර්ගෝපදේශකත්වයක් ලබා දීම මෙම පර්යේෂණයේ සන්දර්භගත ප්‍රධාන වැදගත්කම වේ. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සිංහල යොවුන් නවකතාවෙහි අනෙකා සහ අන්‍යත්වය නිරූපණය වී ඇති ආකාරය සහ එමඟින් සමාජයට වන බලපෑම පර්යේෂණාත්මකව අධ්‍යයනය කිරීම වන අතර ලාංකේය සමාජයෙහි දක්නට ලැබෙන අනන්‍යතා විවිධත්වය සහ අන්‍යත්වය සිංහල යොවුන් නවකතාවෙහි නිරූපණය වන්නේ කෙසේද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙහිදී දත්ත රැස් කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනුණු අතර ඒ යටතේ පුස්තකාල සහ අන්තර්ජාලය පරිශීලනය කෙරිණි. දත්ත විශ්ලේෂණයේදී විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. ලාංකේය සමාජයෙහි පවතින අන්‍යත්වයෙහි සිංහල යොවුන් නවකතාකරුවාට බහුල වශයෙන් විෂය වී ඇත්තේ වාර්ගිකත්වය, කුලය සහ පන්ති භේදය පදනම් කරගත් අනෙකා පමණක් බව මෙම අධ්‍යනයෙන් මූලිකවම අනාවරණය විය. ඒ අනුව ලාංකේය සමාජයෙහි පුද්ගල අනන්‍යතා විවිධත්වය මත පදනම්ව අන්‍යත්වය නිරිමාණය වී තිබුණද, Intersectionality යන න්‍යායික ප්‍රවේශයට අනුව එම පුද්ගල අනන්‍යයතා එකිනෙක බද්ධ වී පවත්නා බවත්, එම එක් එක් අනන්‍යයතා මත සමාජයේ පිරිසක් උසස් ලෙසත්, තවත් පිරිසක් පහත් ලෙසත් නිශ්චිතව නිර්ණය කළ නොහැකි බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: අන්‍යත්වය, අනන්‍යතා බන්ධනය, අනෙකා, යොවුන් සාහිත්‍යය, සිංහල යොවුන් නවකතා

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ළමා පෞරුෂ වර්ධනයෙහිලා ජන අන්දර ඔස්සේ සාක්ෂාත් වන සංස්කෘතික සන්නිවේදනය පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් ජනකතා අංශයෙන්)

ඊ. පී. ඩි. එස්. එස්. කුමාර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20343@arts.pdn.ac.lk

මානව ශිෂ්ටාචාරයෙහි දැනුම, සාරධර්ම සහ සාමූහික මතය පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යන ප්‍රබල වාහකයක් ලෙස ජනශ්‍රැතිය හඳුන්වා දිය හැකිය. එය හුදු විනෝදාස්වාදය සපයන මාධ්‍යයක්ම නොව, යම්කිසි සංස්කෘතියක අනන්‍යතාව සහ එහි සාරධර්ම රටා ළමා, තරුණ, මහලු පරම්පරාව වෙත සම්ප්‍රේෂණය කරන මූලික අධ්‍යාපනික මෙවලමකි. ජනශ්‍රැතියේ එන විවිධ ස්තර අතර ප්‍රබල සන්නිවේදනයක් අඩංගු වන්නේ ජන කතාවේය. ජන අන්දර හෙවත් ජන කතා ගැමි දනන් හට නිර්මිත හා ඔවුන් වෙතින් පැවත එන සාහිත්‍යය ජන සාහිත්‍යය හෙවත් ජන කතා වේ. මෙය බොහෝ විට සරල, අව්‍යාජ සේම අඥාත කර්තෘවරුන් අතින් නිර්මාණය වී ඇත. මෙම පර්යේෂණය ඔස්සේ ළමා පෞරුෂ වර්ධනය සඳහා ජනකතා මගින් ගෙන එන සංස්කෘතික සන්නිවේදනය වැදගත් වන ආකාරය ස්ඵුට කෙරේ. එසේම, දේශීය සංස්කෘතික අනන්‍යතාව රැක ගැනීම, සදාචාරාත්මක සහ මානුෂීය ගුණාංග වර්ධනය කිරීම, මානසික සහ චිත්තවේගීය සමබරතාව, සන්නිවේදන කුසලතා සහ භාෂාව වර්ධනය කර ගත හැකිය. පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ ජනකතා ඔස්සේ සිදුවන සංස්කෘතික සන්නිවේදනය ළමා පෞරුෂ වර්ධනයට බලපාන ආකාරය විශ්ලේෂණය කිරීමයි. එසේම, අනු අරමුණ වන්නේ, ශ්‍රී ලංකාවේ ළමා පෞරුෂ වර්ධනයට බලපාන ප්‍රධාන ජනකතා හඳුනා ගැනීම මෙන්ම ජනකතා ළමුන්ගේ සංජානනය චිත්තවේගය හා සමාජ කුසලතාව වර්ධනයට නැඹුරු සහ ඵලදායී වන ආකාරය විශ්ලේෂණය කිරීමයි. ශ්‍රී ලාංකික ජනකතා පෞරුෂ හැඩගැස්වීමේ දී සංස්කෘතික සන්නිවේදන මාධ්‍යයක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව විය. මෙහිදී පුස්තකාල ග්‍රන්ථ, සඟරා, පර්යේෂණ නිබන්ධ ආදිය පරිශීලනය ඔස්සේ තෝරා ගත් දෙස් විදෙස් ජනකතා කිහිපයකට පර්යේෂණයේ සීමා විය. මෙහි දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල පරිශීලනය මගින් දත්ත රැස් කර ගැනීම සිදු විය. දත්ත විශ්ලේෂණය පර්යේෂණයේ විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනුණි. පර්යේෂණයේ නිගමනය වන්නේ, ජන අන්දර ඔස්සේ සමාජයේ යහපැවැත්ම උදෙසා අත්‍යවශ්‍ය හර පද්ධති සිරිත් විරිත්, ආගමික පසුබිම සහ සාම්ප්‍රදායික ජීවන රටාවන් ඉතා සූක්ෂම ලෙස දරුවාගේ මනසට කාන්දු කිරීමක් සිදුවන බවයි. සත්‍යවාදීබව, වැඩිහිටියන්ට ගරු කිරීම, වැනි සංස්කෘතිමය, සාරධර්ම හුදු අවවාදවලට වඩා සාර්ථකව කතා කලාව ඔස්සේ දරුවා වෙත සන්නිවේදනය වන බව මෙම පර්යේෂණයෙන් තහවුරු විය. සමස්තයක් ලෙස ගත් කල, ජන අන්දර යනු හුදු අතීත උරුම හෝ කල්පිත සමූහයක් පමණක්ම නොවේ. අනාගත පරපුරේ පෞරුෂය ධනාත්මකව හැඩගස්වන, සමාජීය හා සංස්කෘතික සබැඳියාව තහවුරු කරන ජීවමාන සන්නිවේදන ප්‍රවාහයකි. එබැවින් දරුවෙකුගේ පෞරුෂය පූරණය කිරීමෙහිලා ජන අන්දර මගින් සිදුවන සංස්කෘතික සන්නිවේදනය අද්විතීය මෙන්ම අත්‍යවශ්‍ය සාධකයක් බව මෙම පර්යේෂණය මගින් අවධාරණය විය.

ප්‍රමුඛ පද: ළමා ජනකතා, ළමා පෞරුෂය, ළමා චර්යා, සංස්කෘතිය, සන්නිවේදනය

මෙම අධ්‍යයනය සඳහා සාලිය කුලරත්නගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන සිංහල පද්‍ය කාව්‍යවල තේමාත්මක විවිධත්වය හා භාෂාව භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (2024 -2025 තෝරාගත් නිර්මාණ ඇසුරෙන්)

ජී. ජී. එස්. ඩී. කුමාරි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20353@arts.pdn.ac.lk

කවිය යනු හැඟීම්, අදහස් හා අත්දැකීම් ප්‍රකශ කිරීම සඳහා භාෂාව ඉතා සංවිධානාත්මක ව හා සෞන්දර්යාත්මක ආකාරයකින් භාවිත කරන සාහිත්‍යමය ප්‍රභේදයකි. 1946 දී ජී.බී. සේනායකයන් විසින් "පළිගැනීම" කෙටිකතා සංග්‍රහයට ඇතුළත් කරන ලද නිදහස් කවි නූතන සිංහල කවිය නව මාවතකට යොමු කිරීමට සමත් විය. ඒ අනුව, නූතන පද්‍ය කාව්‍යන්හි ආකෘතිය මෙන් ම, තේමාවේ ද, භාෂාවේ ද පැහැදිලි වෙනසක් දැකගත හැකි ය. ඒ අනුව 2024-2025 කාලවකවානුව වන විට නූතන සිංහල පද්‍ය කාව්‍යවල තේමාත්මක විවිධත්වය හා භාෂා භාවිතය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ විය. තත්කාලීන සමාජ, දේශපාලන, ආර්ථික හා සංස්කෘතික අංශ නිරූපණය කිරීමේ දී නූතන සිංහල පද්‍ය කාව්‍යවල තේමාත්මක විවිධත්වය හා භාෂා භාවිතය කවරාකාර ද යන්න අධ්‍යයනය කිරීම මෙහි ගැටලුව පෞද්ගලික වූයේ ය. මෙකී වර්ෂවල බිහි වූ නූතන කවියේ තේමාත්මක විවිධත්වය හා භාෂාව භාවිතය පිළිබඳ අවධානය යොමු වී නොමැති බැවින් ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ වැදගත්කම වේ. වර්තමාන සිංහල පද්‍ය කාව්‍යයේ පුළුල් තේමා පරාසය, නවතම තේමා අත්දැකීම්, දේශපාලනික සහ පෞද්ගලික අත්දැකීම් හා සමාජ යථාර්ථය සමඟ බැඳී පවතින බව අනාවරණය විය. එමෙන් ම, තේමාත්මක විවිධත්වයට සාපේක්ෂව කැපී පෙනෙන භාෂාත්මක විවිධත්වයක් ද දක්නට ලැබෙන බව අනාවරණය විය. ඒ අනුව පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදාගත් අතර, ඒ යටතේ පුස්තකාලය පරිශීලනයෙන් දත්ත එකතු කිරීම සිදු කෙරිණි. පර්යේෂණ විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණි. එහි දී තත්කාලීන සමාජ දේශපාලනික, ආර්ථික, පශ්චාත් යුද සමය, පන්තිභේදය, ගෝලීයකරණය හා සංස්කෘතිය, නාගරීකරණය, නවීන ජීවිතය, සමාජ යථාර්ථය පිළිබිඹු කිරීම යනා දී සියලු ම දේ තේමා කොට ගෙන 2024-2025 නූතන පද්‍ය කාව්‍යවල තේමාත්මක විවිධත්වයක් නිර්මාණය වී ඇත. එමෙන් ම, සම්භාව්‍ය ගත් වහර, මුසු වහර, කට වහර, විශේෂයෙන් ම, ඉංග්‍රීසි වදන් භාවිතය බොහෝ පද්‍ය කාව්‍ය නිර්මාණවල පවතින බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද : තේමාත්මක විවිධත්වය, භාෂාව, නූතන, පද්‍ය කාව්‍ය, වහර

මෙම අධ්‍යයනය සඳහා බුද්ධික කෝනාරගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

පැරණි සිංහල සාහිත්‍ය කෘතිවල විද්‍යමාන 'දරුවන් පැතීමේ සංකල්පය' පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් ගද්‍ය පද්‍ය කෘති කිහිපයක් ඇසුරින්)

ආර්. එම්. ඒ. ලක්මාලි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20373@arts.pdn.ac.lk

මානව ජීවිතයේ සියලු ක්‍රියාකාරකම් සංස්කෘතියට සම්බන්ධ වේ. සංස්කෘතිය හා සාහිත්‍යය අතර අවියෝජනීය සම්බන්ධතාවක් පවති. සාහිත්‍යය යනු සමකාලීන මිනිසුන්ගේ පැවතුම්වල පිළිබිඹුවකි. මේ හේතුවෙන් සාහිත්‍ය කෘති අධ්‍යයනය කරන්නෝ එකල සමාජ ඓතිහාසික තොරතුරු ද ගවේෂණය කළෝය. විවිධ සමාජවල පවත්නා සමාජ චර්යා සමඟ සම්බන්ධ ජනවහර හා ගණාචාරවල ඇති විශේෂතා, විවිධතා සාහිත්‍යයේ විද්‍යමාන ය. පුද්ගල ජීවිතයේ පවතින විවිධ සංස්කාර විධි පිළිබඳ සාහිත්‍ය කෘති මඟින් අවබෝධ කරගත හැකි වේ. දරුවන් ප්‍රාර්ථනා කිරීමේ සංකල්පය පුද්ගල උපත හා බද්ධ වූ සංස්කෘතික ක්‍රියාවකි. ඒ අනුව සිංහල සාහිත්‍ය කෘතිවල විද්‍යමාන දරුවන් පැතීමේ සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මෙම පර්යේෂණයේ කේන්ද්‍රීය මාතෘකාව වේ. සිංහල සාහිත්‍ය කෘති මූලාශ්‍රය කර ගනිමින් දරුවන් පැතීම හා සම්බන්ධ අපේක්ෂා, සංස්කෘතික වටිනාකම්, දෘෂ්ටිවාද හා භාෂා ව්‍යවහාරය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. ඒ අනුව ''පැරණි සිංහල සාහිත්‍ය කෘතිවල විද්‍යමාන දරුවන් පැතීමේ සංකල්පය හා සම්බන්ධ අභිප්‍රාය, සංස්කෘතික වටිනාකම්, දෘෂ්ටිවාද හා එම සංකල්පය නිරූපණයේ දී භාවිත භාෂා ව්‍යවහාරය කවරාකාර ද?" යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. එම පර්යේෂණ ගැටලුව ගවේෂණය කිරීම සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තෝරාගත් පැරණි සිංහල සාහිත්‍ය ගද්‍ය පද්‍ය කෘති කිහිපයක් පමණක් උපයෝගී කර ගනිමින් විස්තරාත්මක ක්‍රමය යටතේ දත්ත විශ්ලේෂණය කරන ලදි. පැරණි සිංහල සාහිත්‍ය කෘතිවල විද්‍යමාන දරුවන් පැතීමේ සංකල්පය අධ්‍යයනය මඟින් ඉතිහාස අධ්‍යයන ක්ෂේත්‍රය, සමාජ විද්‍යාව හා සාහිත්‍ය විචාරය ආදී අංශ ගණනාවකට වැදගත් වන අතර නව දැනුමක් එක් කිරීම මෙම පර්යේෂණය වැදගත්කමයි. ඒ අනුව සිංහල සාහිත්‍ය කෘතිවල විද්‍යමාන දරුවන් පැතීමේ සංකල්පයේ දී අභිප්‍රාය වශයෙන් වංශය සුරැකීම හා සමාජ අවශ්‍යතාව නිරූපණය වී ඇති බව හඳුනා ගැනිණි. ඒ හා බද්ධ වූ ඇදහිලි විශ්වාස සහ සිරිත් විරිත් අතර අචේතනික වස්තු දේවත්වයෙන් සැලකීම, ගබ් පෙළහර පැවැත්වීම ආදි සංස්කෘතික ක්‍රියා, දෘෂ්ටිවාද ලෙස කර්මය හා වඳභාවය පිළිබඳ දෘෂ්ටිවාද පවතින බවත් එහිදී භාවිත භාෂා ව්‍යවහාරය උපමා හා විශේෂ යෙදුම්වලින් යුක්ත වී ඇති බව ද අනාවරණය විය.

ප්‍රමුඛ පද: ඇදහිලි විශ්වාස, දෘෂ්ටිවාද, දරුවන් පැතීම, සාහිත්‍යය, සිරිත් විරිත්

මෙම අධ්‍යයනය සඳහා දිලිනි ආරියවංශගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන කවිය සහ ඖචිත්‍යවාදය
(2023-2025 රජත පුස්තක සම්මානය සඳහා අවසන් වටයට නිර්දේශිත කෘති ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්)

එම්. ඒ. එන්. මධුෂාණි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20421@arts.pdn.ac.lk

කවිය යනු මානව සමාජය සමඟ භාවමය වශයෙන් බැඳී පවතින අතිශය වැදගත් සාහිත්‍යය ශානරයකි. කවිය සහ විචාරය අතර අවියෝජනීය සම්බන්ධතාවක් ඇත. මිනිසා සතු කුසලතා අනුව නිර්මාණ බිහි වීමත් සමඟ විවිධ දෘෂ්ටිකෝණ අනුව විචාර බිහි විය. පසු කලෙක විචාරවාද වශයෙන් බිහි වූයේ මෙම මතවාදයි. සංස්කෘත කාව්‍ය විචාර මූලධර්මවල ඖචිත්‍යවාදය නමින් විචාරවාදයක් බිහි වූයේ ඖචිත්‍යයෙහි අවශ්‍යතාව ප්‍රමුඛ වීම හේතුවෙනි. උචිත බව, යෝග්‍ය බව, සුදුසු බව යන අර්ථයෙන් ඖචිත්‍යය යන පදය යෙදෙයි. කාව්‍යයෙහි ගුණය තීව්‍ර කිරීමට සහ හීන කිරීමට ඖචිත්‍ය සංකල්පයට හැකියාව ඇත. සිංහල පද්‍යයේ ගමන් මග වෙනස් කර, කවිය නව මගකට ගෙන එනු ලබන්නේ නව මං සෙවූ කවි පරපුරක් විසින්ය. නූතන කවිය හා ඖචිත්‍ය සංකල්පය නූතන කාව්‍ය ක්ෂේත්‍රයෙහි වැදගත් කතිකාවකි. නූතන කාව්‍ය නිර්මාණකරුවෝ සම්ප්‍රදායික න්‍යාය ඇසුරු කළද ප්‍රායෝගිකව භාවිත කිරීමේ අඩුවක් දක්නට ඇත. ඒ අනුව නූතන කවිය සහ ඖචිත්‍යවාදය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයේදී සිදු විය. මෙහි මූලික අරමුණ වූයේ නූතන සිංහල පද්‍ය සාහිත්‍යයෙහි ඖචිත්‍යවාදය අන්තර්ගත වන්නේ කෙසේද යන කරුණ විමර්ශනය කිරීමයි. කාව්‍යක සෑම අංගයක්ම එනම් වචන, අර්ථ, රස, අලංකාර, භාෂා ශෛලිය අදාළ අවස්ථාවට, තේමාවට සහ අරමුණට ගැළපෙන ලෙස භාවිත විය යුතු බව ඖචිත්‍යවාදය මඟින් දක්වයි. 2023-2025 රජත පුස්තක සම්මානය සඳහා අවසන් වටයට නිර්දේශිත කාව්‍ය නිර්මාණ පරීශීලනය කිරීම මඟින් නූතන කවිය සහ ඖචිත්‍යවාදය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සිදු විය. සංස්කෘත කාව්‍ය විචාර මූලධර්මවල අන්තර්ගත ඖචිත්‍යවාදය වර්තමාන කාව්‍ය නිර්මාණවල ඇතුළත් වන්නේ කවර ආකාරයෙන්ද යන පර්යේෂණ ගැටලුව ගොඩනඟා ගත් අතර උපන්‍යාසය වූයේ සංස්කෘත කාව්‍ය විචාර මූලධර්මයක් වන ඖචිත්‍යවාදය වර්තමාන කාව්‍ය නිර්මාණකරුවන්ගේ රචනාවල අන්තර්ගත වන්නේ අවම වශයෙන් යන්නයි. පුස්තකාල පරිශීලනයෙන් සහ අන්තර්ජාල පරිශීලනයෙන් සිදුකරන ලද සාහිත්‍ය විමර්ශනයකින් අනතුරුව ප්‍රාථමික, ද්විතීයක ගුණාත්මක දත්ත රැස් කර විස්තරාත්මක ක්‍රමය යටතේ විශ්ලේෂණය කෙරිණි. මෙමගින් අනාවරණය වූයේ ප්‍රධාන වශයෙන්ම නූතන කාව්‍ය නිර්මාණවලදී වචන, අර්ථ, රස, භාෂාව යන අංගවලදී ඖචිත්‍ය සංකල්පය අතීතයට සාපේක්ෂව වර්තමානයේදී ක්‍රමයෙන් අවම වශයෙන් භාවිතයට ගැනීමයි. ඒ අනුව නූතන කාව්‍යය නිර්මාණ සඳහා ඖචිත්‍යවාදය පිළිබඳ අවබෝධය දුරස්ථ වූ බව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද: ඖචිත්‍ය, ඖචිත්‍යවාදය, නූතන කවිය, විචාරය, සංස්කෘත කාව්‍යය

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සුචරිත ගම්ලත්ගේ විචාර න්‍යාය ක්‍රමවේදය සහ පශ්චාත් ව්‍යූහවාදයඃ තෝරාගත් සාහිත්‍ය පඨිත කිහිපයක් ඔස්සේ සිදු කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්. ඩී. එන්. මල්ෂාන්
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20429@arts.pdn.ac.lk

මාර්ටින් වික්‍රමසිංහගේ පුරෝගාමීත්වයෙන් වර්ධනය වූ සිංහල විචාර සම්ප්‍රදාය සංවිධිතභාවයට පත් කළේ එදිරිවීර සරච්චන්ද්‍ර ය. 70-80 දශකය වන විට නූතන සමග සිංහල විචාර සම්ප්‍රදායෙහි විකල්ප විචාර ධාරා වර්ධනය වීම හඳුන ගත හැකි ය. සුචරිත ගම්ලත්ගේ ආගමනය සිදු වූයේ මෙම සන්දර්භයේදී ය. ගම්ලත්, මුල්කාලීන ව විඤ්ඤාණවාදී විචාර ධාරාව ගුරුකොට ගත් අතර, පසුකාලීනව එය, මාක්ස්වාදී අපෝහක භෞතිකවාදී විචාර විධික්‍රමය බවට පත් විය. ගම්ලත්ගේ විචාර ක්‍රමවේදය සහ ශෛලිය සිංහල විචාර සම්ප්‍රදායෙහි සුවිශේෂ අනන්‍යතාකරණයක් නිර්මාණ කෙරී ය. මෙම පර්යේෂණ අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වූයේ එකී, සුවිශේෂ විචාර අනන්‍යතාකරණය පශ්චාත් ව්‍යූහවාදය මගින් නැවත හඳුනා ගනිමින්, එය, සංස්කරණයට මෙන් ම සංරක්ෂණය අවශ්‍ය න්‍යායික යෝජනා ඉදිරිපත් කිරීම ය. පර්යේෂණ ක්ෂේත්‍රයෙහි ගම්ලත්ගේ විචාර ක්‍රමවේදය හා ශෛලිය පිළිබඳ න්‍යායික විශ්ලේෂණයක් සිදු කෙරී නොමැති බැවින්, මෙම පර්යේෂණයෙහි පර්යේෂණ ගැටලුව වූයේ, සුචරිත ගම්ලත්ගේ විචාර ක්‍රමවේදය විශේෂිත අනන්‍යතාකරණයක් බවට උන්නතය වීම පශ්චාත් - ව්‍යූහවාදී ප්‍රවේශය ඔස්සේ සංස්කරණය කොට සංරක්ෂණය කළ යුත්තේ ඇයි? යන්න ය. ගම්ලත්ගේ ශාස්ත්‍රීය සම්ප්‍රදාය අතුරින්, තෝරාගත් විචාර පඨිත කිහිපයකට මෙම පර්යේෂණය සීමා විය. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක ක්‍රමවේදය සහ විස්තරාත්මක විධික්‍රමය භාවිත කෙරිණි. එහිදී, න්‍යායාත්මක විශ්ලේෂණය ද මූලික විය. පශ්චාත් ව්‍යූහවාදයෙහි එන, ඩෙරීඩාගේ විසංයෝජනය අනුව, ගම්ලත්ගේ විචාර ක්‍රමවේදය සඳහා භාවිත ලෝක දෘෂ්ටිය ප්‍රායෝගික භාවිතයෙහි ස්ථිරසාර වූවක් නොවුණි. එය, භෞතිකවාදී මෙන් ම විඥානවාදී පදනම් මත ද ක්‍රියාත්මක වන ආකාරයක් හඳුනාගත හැකි විය. ෆූකෝගේ න්‍යායික එළඹුම්වලට අනුව, ගම්ලත්ගේ ස්වතන්ත්‍ර විචාර අනන්‍යතාකරණය දැනුම සහ බලය මත ක්‍රියාත්මක වන බල යාන්ත්‍රණයක් වේ. එමගින්, අධිපති කතිකා අභියෝගයට ලක් කිරීමත් නව කතිකා ඇති වීමත් සිදු වී තිබේ. රෝලන්ඩ් බාත්ගේ කර්තෘ ඝාතන න්‍යායට අනුව, ගම්ලත්ගේ විචාර අනන්‍යතාකරණය පඨිතය කර්තෘගෙන් වෙන් කර අතර, පඨිතයට බහුවිධ අර්ථකථන සැපයීමේ නිදහස ආරක්ෂා කරයි. නමුත්, බාත්ගේ පඨිතයෙහි අර්ථ අස්ථිතිභාව පිළිබඳ අදහස ගම්ලත්ගෙන් ගිලිහී යයි. එයට හේතුව ඔහු, ඓතිහාසික භෞතිකවාදී අර්ථකථනයට පඨිතය සීමා කිරීම නිසා ය. න්‍යායික පරස්පරතාව, විචාර අනන්‍යතාකරණය ඥානය සහ බලයෙහි නිෂ්පාදනයක් ලෙස භාවිතය, න්‍යායික රාමුවකට පඨිතයෙහි අර්ථය සීමා කිරීම යන කරුණු මත එකී විචාර අනන්‍යතාකරණය සංස්කරණය කිරීම ඔස්සේ සංරක්ෂණය කළ යුතු වේ. එබැවින්, සිංහල විචාර සම්ප්‍රදායෙහි ගම්ලත්ට ම ආවේණික වූ ස්වතන්ත්‍ර, බලපෑම් සහගත වූවක් විචාර අනන්‍යතාකරණය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පවතින බව අවධාරණය කිරීම මෙම පර්යේෂණයෙහි නිගමනය විය.

ප්‍රමුඛ පද: පශ්චාත් ව්‍යූහවාදය, විචාර අනන්‍යතාකරණය, විචාර ක්‍රමවේදය සහ ශෛලිය, සිංහල විචාර සම්ප්‍රදාය, සුචරිත ගම්ලත්

මෙම අධ්‍යයනය සඳහා සුනිල් වික්‍රමසිංහගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන සිංහල ළමා කතා සාහිත්‍යයෙහි පාඨකත්වය පිළිබඳ අධ්‍යයනයක් (බාබරා වෝල්ගේ පාඨක වර්ගීකරණය ආශ්‍රයෙන් කෙරෙන පර්යේෂණයකි)

ජී. කේ. එම්. මල්ශානි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20430@arts.pdn.ac.lk

සාහිත්‍ය නිර්මාණයක් පරිපූර්ණත්වයට පත්වන්නේ එය පාඨකයා අතට පත්වීමෙනි. එසේම නිර්මාණයක සාර්ථකත්වය තීරණය කිරීමෙහිලා පාඨක භූමිකාව අතිශය වැදගත් වේ. විවිධ සාහිත්‍ය ශානර අතර ළමා සාහිත්‍යයෙහි කේන්ද්‍රස්ථානය ළමා පාඨකයාය. විවිධ වයස් ප්‍රභේද නියෝජනය කෙරෙන පාඨක ප්‍රජාවක් ඉලක්කගත බැවින් ළමා පාඨකයා සුවිශේෂය. ළමා සාහිත්‍යයේ පාඨක විවිධත්වය පිළිබඳ ලොව ප්‍රකට ආදර්ශයක් ලෙස බාබරා වෝල් 1991 දී ඉදිරිපත් කළ වර්ගීකරණය ළමා පාඨකයා හඳුනාගැනීම සඳහා සුවිශේෂ වේ. මෙම පර්යේෂණය, බාබරා වෝල්ගේ පාඨක වර්ගීකරණය ආශ්‍රයෙන්, නූතන සිංහල ළමා කතා සාහිත්‍යයෙහි පාඨකත්වය පිළිබඳ අධ්‍යයනය කෙරිණි. බාබරා වෝල්, ළමා කෘතිවල පාඨකයාගේ භූමිකාව විශ්ලේෂණය කිරීම සඳහා ඉදිරිපත් කළ ළමා පාඨක වර්ගීකරණය ලේඛකයන් සිය කෘතියෙහි ළමයා ආමන්ත්‍රණය කරන ආකාරය සහ ඔවුන්ගේ දෘෂ්ටිකෝණය ගොඩනගන ආකාරය අවබෝධ කර ගැනීම සඳහා ප්‍රබල මෙවලමකි. සිංහල ළමා කතා, බාබරා වෝල්ගේ වර්ගීකරණයේ කුමන ලක්ෂණ පෙන්වයිද යන්න විශ්ලේෂණය කිරීමෙන් එම කතා සාර්ථකව ළමා මනසට සමීප වන්නේ කෙසේද යන්න පිළිබඳව විචාරාත්මක අවබෝධයක් ලබාගැනීමට මෙම පර්යේෂණය වැදගත් වේ. එසේම අධ්‍යයනයෙන් හෙළිවන කරුණු මත පදනම්ව ලේඛකයන්ට නවීන දරුවාගේ මනෝවිද්‍යාවට සහ අවධානයට ගැළපෙන පරිදි සිය කෘතිවල ව්‍යුහය සහ බස සකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳව නිශ්චිත මඟ පෙන්වීමක් ලෙසද මෙම පර්යේෂණය වැදගත් වේ. ළමා සාහිත්‍යයට අදාළ බාබරා වෝල්ගේ පාඨක වර්ගීකරණය, නූතන සිංහල ළමා කතා සාහිත්‍යයෙහි පාඨකත්වය සමඟ අදාළ වන්නේ කෙසේද යන්න පිළිබඳව සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. සිංහල ළමා සාහිත්‍යකරුවන්ගේ සහ පාඨකයින්ගේ රුචි අරුචිකම් අතර පවත්නා සම-විෂමතා විමර්ශනය කිරීම හා නූතන ළමා සාහිත්‍යය පාඨක රුචිකත්වයේ නව ප්‍රවණතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අනුඅරමුණු බවට පත්විය. සිංහල ළමා කතා සාහිත්‍යයෙහි ඉලක්කගත පාඨකයා සහ පාඨක භූමිකාව අදාළ නිර්මාණ මඟින් ආමන්ත්‍රණය කර ඇත්තේ කෙසේද යන්න පර්යේෂණ ගැටලුව විය. ඒ අනුව සිංහල ළමා සාහිත්‍ය රචකයන් පාඨක විවිධත්වයට වඩා වාණිජ අරමුණු කෙරෙහි වැඩි අවධානයක් යොමුකරන බැවින් අදාළ නිර්මාණවල ගුණාත්මක බව බලපෑමකට ලක්ව තිබෙන බව පූර්ව පර්යේෂණ අධ්‍යයනයේදී අනාවරණය විය. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ, දත්ත විශ්ලේෂණය කොට විස්තරාත්මක විධික්‍රමය මඟින් ඉදිරිපත් කරන ලදි. දත්ත විශ්ලේෂණය අනුව පර්යේෂණයට පාදක බාබරා වෝල්ගේ පාඨක වර්ගීකරණය සමඟ සසඳා බැලීමේදී, ලංකාවේ ළමා සාහිත්‍ය රචකයන්ගේ පාඨක විවිධත්වය යන්න කෙරෙහි එතරම් අවධානයක් යොමු කර නොමැති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ආඛ්‍යාන ශෛලිය, පාඨකත්වය, බාබරා වෝල්ගේ පාඨක වර්ගීකරණය, ළමා කතා සාහිත්‍යය, ළමා සාහිත්‍යය

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ජනකතා තුළ පිළිබිඹු වන විසම ස්ත්‍රී චරිත ආශ්‍රිත ආචාර විද්‍යාත්මක අධ්‍යයනයක්

ජේ.එම්.එච්.ආර් මැණිකේ
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20442@arts.pdn.ac.lk

පොදු ජනයාගේ සත්‍ය වූ භාවමය ජීවිතය පරිපූර්ණ හා යථාර්ථවාදී ලෙසින් එළි දැක්වෙන සිංහල ජන සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛාංගයක් වනුයේ "ජනකතාවයි". පෙර අපර දෙදිග සෑම රටකම පාහේ ජනතාව අතර ජනප්‍රිය භාවිතයක් වූ ජනකතාව මගින් මානව ජීවිතයත් මානව ජීවිතයට තදානුබද්ධ වූ ස්ත්‍රිය හා ඇගේ චරිතයේ විවිධ භූමිකා පිළිබඳවත් එහි සංස්කෘතික තොරතුරු ගවේෂණය කිරීමට නොමඳ පිටුබලයක් මින් සැපයේ. සිංහල ජනකතාව පිළිබඳ විදේශ ජනශ්‍රැතිවේදීන් විසිනිදු කරන ලද ගවේෂණ හා දේශීය විමසුම්ද පාදක කර ගනිමින් එහි ප්‍රමුඛ චරිතාංගයක් වූ ස්ත්‍රිය පිළිබඳ ආචාර විද්‍යාත්මක විමර්ශනයක් මෙම පර්යේෂණය මගින් සිදු කෙරිණි. මෙම පර්යේෂණයේ මූලික අරමුණු වූයේ විවිධ වූ ජනකතා පිළිබඳ අධ්‍යයනයේදී එහි එන විසම ස්ත්‍රී චරිත ආචාර විද්‍යාවට කවරාකාරයෙන් ධනාත්මක හා ඍණාත්මක ලෙස බලපානු ලබන්නේද යන්න අධ්‍යයනය කිරීමයි. මෙහි අනු අරමුණු බවට පත් වූයේ ජනකතාව මඟින් ස්ත්‍රීන්ට යොමු කර ඇති සමාජ භූමිකා හඳුනා ගැනීම මෙන්ම ස්ත්‍රී චරිත හා සම්බන්ධ ජනකතා විචාරය කරමින් ඒවා මගින් පරිණාමය වූ ආචාර විද්‍යාත්මක විවරණ පිළිබිඹු කිරීමයි. එහිදී ජනකතාව තුළ විසම භූමිකා දක්වන ස්ත්‍රියගේ චරිත ලක්ෂණය ආචාර විද්‍යාත්මකව සැසඳිය හැක්කේ කෙසේද? යන පර්යේෂණ ගැටලුවට ගොඩනඟා ගත් උපන්‍යාසය වූයේ ලෝක හා දේශීය ජනකතා තුළ විසම හා විවිධ චරිතාදර්ශ ප්‍රදර්ශනය කරන ස්ත්‍රී චරිත විග්‍රහ කළ හැක්කේ ආචාර විද්‍යාත්මක නිර්ණායක මගින් බවය. විධික්‍රම ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සාහිත්‍ය විමර්ශනයෙන් ද්විතීයික දත්ත රැස් කළ අතර, ඒවා විශ්ලේෂණය සඳහා ආචාර විද්‍යාත්මක මූලධර්ම හා න්‍යාය භාවිත කරන ලදි. මෙහිදී ජනකතාවල ස්ත්‍රී චරිත පිළිබඳ විසම බව මනිනු ලබන්නේ ඒ ඒ සමාජ වල පවතින ආචාර විද්‍යාත්මක නිර්ණායක මගින් වන අතර එම චරිත විග්‍රහ කිරීමෙන් විශ්වීය වශයෙන් පොදු වූ මානව සදාචාර පද්ධතියක් හඳුනාගත හැකි බව අනාවරණය විය. ඒ අනුව ජනකතාවේ නිරූපිත විසම ස්ත්‍රී චරිතවල ස්වභාවය හුදෙක් ප්‍රබන්ධයක් නොව, ඒ ඒ සංස්කෘතීන් විසින් සම්මත කරන ලද ආචාර විද්‍යාත්මක නිර්ණායක මගින් මැනිය හැකි චරිතාදර්ශ බව මෙම පර්යේෂණයෙන් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : ආචාර විද්‍යාව, චරිතාදර්ශ, ජනකතාව, ජනශ්‍රැති විද්‍යාව, විසම ස්ත්‍රී චරිත,

මෙම අධ්‍යයනය සඳහා සාලිය කුලරත්නගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

විවිධ සංස්කෘතිවලට අයත් නවකතා ස්ත්‍රිය නිරූපණය කර ඇති ආකාරය අනුව ස්ත්‍රීන්ට පවතින සීමා,අභියෝග සහ ස්ත්‍රීන්ගේ ජීවිතවල සන්තෘප්තිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් විදේශීය පරිවර්තිත නවකතා ඇසුරිනි)

ඩබ්.ඒ.ඩී. පබසරා
සිංහල අධ්‍යයනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20488@arts.pdn.ac.lk

යම් සංස්කෘතියක බිහිවන නවකතාව ඒ සංස්කෘතියෙහි ස්ත්‍රිය නිරූපණය කරන කැඩපතකි. එබැවින් එම සංස්කෘතික සන්දර්භයෙහි ස්ත්‍රීන් මත පැනවෙන සීමා, අභියෝග, ස්ත්‍රී ජීවිතවල සන්තෘප්තිය ගවේෂණයට සමාජ, දේශපාලන හා සාහිත්‍යික එළඹුමක් වශයෙන් ස්ත්‍රීවාදය බෙහෙවින් ප්‍රයෝජනවත් ය. එහිදී නවකතා ශානරය පිටුබලයකි. 'මරණ තීර්ථයේ ගැහැනිය,' 'අමිනා', 'කළු ගැහැනියගේ සිහිනය' යන නවකතා මෙම පර්යේෂණයට උපයුක්ත කොට ගැනිණි. විවිධ සංස්කෘතිවලට අයත් නවකතාවල නිරූපිත ස්ත්‍රීන්ට ආවේණික සීමා, අභියෝග ඔවුන්ගේ ජීවිතවල සන්තෘප්තිය කෙරෙහි බලපාන්නේ කෙසේ දැ යි යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. එම සීමා, අභියෝග අදාළ සංස්කෘතියෙහි ක්‍රියාත්මක වන ස්වරූප, ඒ සඳහා බලපෑ හේතු, ඔවුන් සන්තෘප්තිමත් ජීවිතයක් ලබාගැනීමෙහි ලා ක්‍රියාත්මක වන අයුරු පිළිබඳ නවකතානුසාරයෙන් අධ්‍යයනය කිරීම අරමුණ විය. මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත විශ්ලේෂණය කොට, විස්තරාත්මක විධික්‍රමය මඟින් ඉදිරිපත් කරන ලදි. ලිංගිකත්වය පදනම් කොට ගෙන බොහෝ සංස්කෘතිවල බලසබඳතා නිර්මාණය වී ඇත. පුරුෂ කේන්ද්‍රීයත්වය, ආගම, විශ්වාස හා ඇදහිලි, ස්ත්‍රිය ප්‍රජනන ක්‍රියාවලියෙහි දිගුකාලීන කොටස්කාරිය බවට පත්වීම, දාරක ස්නේහය, ඇතැම් සංස්කෘතිවල වර්ණභේදය යනාදී සාධක පදනම් කොට ගෙන ස්ත්‍රීන් මත නොයෙක් සීමා, අභියෝග ක්‍රියාත්මක වේ. කායවිච්ඡේදනය, ගෘහස්ථ හිංසනය, ස්ත්‍රියගේ ලිංගික එකඟතාව නොසැලකීම වැනි කායික මානසික හිංසන, විවාහය, දරුප්‍රසූතිය, දරුවන් පෝෂණය කිරීම, අධ්‍යාපනය ඌනනය කිරීම, දරිද්‍රතාව, ස්ත්‍රිය රැකියා වියුක්තිනියක කොට පුරුෂයාගෙන් යැපෙන්නියක බවට පත්කිරීම,ස්ත්‍රිය ද්‍රව්‍යකරණය යනාදී සීමා, අභියෝග අදාළ සංස්කෘතිවල ස්ත්‍රිය මත ක්‍රියාත්මක වන බව නවකතා ඇසුරින් අනාවරණය විය. බොහෝ ස්ත්‍රීහු එම සීමා, අභියෝග අනුමත කරමින් තම ජීවන රටාව එයට අනුරූපව සකස් කරගනිති. අතලොස්සක් වූ ස්ත්‍රීහු සන්තෘප්තිමත් ජීවිතයක් අත්පත් කරගැනීමට වෙහෙසෙති. ඔවුහු සිය ශරීරය පිළිබඳ අයිතිය සහ 'විවාහය' පිළිබඳ නිදහස අත්පත් කරගැනීම, පුරුෂ කේන්ද්‍රීය සමාජ සම්මත පිටුදැකීම, අධ්‍යාපන අවස්ථා හා වෘත්තීමය ප්‍රවේශ උදෙසා වෙහෙසීම, ආගමික විශ්වාස, ඇදහිලි, සිරිත් විරිත් මඟින් ස්ත්‍රිය මත ගොඩනගන ලද සීමා, අභියෝග ප්‍රතික්ෂේප කිරීම, මෙහි අනිටු ප්‍රතිවිපාක පිළිබඳ කතිකා නිර්මාණය වැනි ක්‍රියාමාර්ග මඟින් ස්ත්‍රී සන්තෘප්තිය අත්පත් කරගැනීමට කැපවෙති. මෙනයින් විවිධ සංස්කෘතිවල ස්ත්‍රීන් කෙරෙහි ආවේණික සීමා, අභියෝග පවතින බවත්, එමඟින් ස්ත්‍රීන්ගේ සන්තෘප්තිකර ජීවිතය ඔවුන්ට අහිමි කොට ඇති බවත් නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: පුරුෂ කේන්ද්‍රීයත්වය, බලසබඳතා, සංස්කෘතික ස්ත්‍රිය, සන්තෘප්තිමත් ජීවිතය

මෙම අධ්‍යයනය සඳහා ලියනගේ අමරකීර්තිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

කතරගම දේව සංකල්පය පිළිබඳ අන්තර් කලා අධ්‍යයනය

ඩබ්ලිව්.පී.බී. අපේක්ෂා පතිරණ
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20493@arts.pdn.ac.lk

මානව සමාජයේ ආරම්භයේ සිට ම මිනිසා විවිධ හේතු ප්‍රත්‍ය මඟින් නිෂ්පන්න දේව සමූහයා වෙත පුද පූජා තබමින් තමාට අවැසි කාර්යන් ඉටුකර ගැනීමට උත්සුක විය. එලෙස භාරතීය සම්භවයක් සහිත 'ස්කන්ධ දේව' සංකල්පය ලාංකේය සන්දර්භයෙහි 'කතරගම දේව' සංකල්පය ලෙසින් විකාශනය වීමට බලපෑ විවිධ සාහිත්‍යය සෙසු සංස්කෘතිකාංගවල පවතින විවිධත්වය සහ භාවිත විවිධ අර්ථ නිරූපණයට ලක්ව තිබීම විශේෂත්වයකි. එකිනෙකට වෙනස් සන්දර්භවල දී ආගමික මුහුණුවරකින් ද දඩුවම් ලබාදෙන විනිශ්චයකරුවෙකු ලෙස සහ වාණිජ දෙවිකෙනෙකු ලෙස ආදී විවිධ මුහුණුවරවලින් බහු අරමුණු වෙනුවෙන් ඇදහීමට ලක්වීම කෙරෙහි බලපෑ සාහිත්‍ය, කලා සහ වෙනත් සංස්කෘතික සංරචකවල භාවිත සහ සම්බන්ධතාව ශාස්ත්‍රීය අධ්‍යයනයකට යොමු කිරීම මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ විය. කතරගම දේව සංකල්පයෙහි නූතන විචල්‍යතා අවබෝධ කර ගැනීම සඳහා අන්තර් කලා අධ්‍යයනය වැදගත් වේ. කතරගම දේව සංකල්පය විවිධ සාහිත්‍ය හා කලා මාධ්‍යවල නිරූපණය වී ඇත්තේ කෙසේද යන්න පර්යේෂණ ගැටලුව විය. මෙම අධ්‍යයනය සිදුකිරීමේදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සම්මුඛ සාකච්ඡා සහ ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් ප්‍රාථමික දත්ත රැස්කිරීම සිදුකළ අතර පුස්තකාල පරිශීලනය භාවිතයෙන් ද්විතීයක දත්ත රැස් කෙරිණි. එම දත්ත විශ්ලේෂණයේදී තේමාත්මක විශ්ලේෂණය ප්‍රධාන විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කර ඇත. එහිදී අනාවරණය වූ මූලික කරුණු නම් ලාංකේය සමාජයෙහි කතරගම දෙවියන් පිළිබඳ සංකීර්ණ විශ්වාස පද්ධතියක් බිහිවීමට විවිධ සාහිත්‍ය කලා මාධ්‍යවල බලපෑමක් ලැබී තිබෙන බවයි. ස්කන්ධ කුමාර නම් හින්දු දේව සංකල්පය කතරගම දෙවියන් ලෙස ථේරවාදී බුදුසමයට අන්තර්ග්‍රහණය කරගනිමින් දේශීයකරණය කරගැනීම සිදුවී ඇති බව හඳුනාගත හැකි විය. බැතිමතුන් බුදුන්ගේ පාදස්පර්ශයෙන් පාරිශුද්ධ වූ කිරිවෙහෙර වැඳ පුදා ගෙන කතරගම දේවාලයට ප්‍රවේශ වීමෙන් කතරගම දෙවියන් කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගුණු ආගමික සමායෝගය පිළිබිඹු වෙයි. ද්‍රවිඩ ජනතාව දුෂ්කර පාදයාත්‍රා සහ දැඩි ව්‍රත මඟින් කතරගම දෙවියන් වන්දනය කිරීමත්, සිංහල ජනයාට නිදහසේ දෙවියන් වන්දනා කිරීමට අවස්ථාව හිමිවීමත් මත ජනප්‍රවාද මඟින් කතරගම දෙවියන් බෞද්ධකරණය කරගෙන තිබෙන ආකාරය හඳුනා ගත හැකිය. ඒ අනුව හින්දු දේව සංකල්පයක් වූ ස්කන්ධ කුමාර ආගමික සමායෝගයකට ලක් වූ ස්වදේශික දෙවිකෙනෙකු බව විවිධ සාහිත්‍ය කලා මාධ්‍ය මඟින් අනාවරණය වේ.

ප්‍රමුඛ පද : අන්තර් කලා අධ්‍යනය, ආගමික සමායෝගය, 'කතරගම දේව' සංකල්පය, දේශීයකරණය, නූතන විචල්‍යතා

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සමාජ ශෝධන මාධ්‍යයක් ලෙස ජන නාටකවල කාර්යභාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කෝලම් සහ සොකරි ජන නාටක ඇසුරින්)

ආර්.පී. එම්. ඩී. රාජපක්ෂ
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20550@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි පවතින විනෝදාර්ථය පිරි වඩාත් ප්‍රකට ප්‍රාසාංගික කලා මාධ්‍යයක් ලෙස ජන නාටක දැක්විය හැකිය. මෙම පර්යේෂණයේ දී මූලික වශයෙන් අධ්‍යයනය කෙරුණු කෝලම් සහ සොකරි ජන නාටකවල ප්‍රභවය සඳහා තත්කාලීන සමාජය සහ ජීවන රටාව බලපා ඇත. ඒ ඔස්සේ ජන නාටකවල නිරූපණය වන චරිත මඟින් සිදු වන සමාජ ශෝධන කාර්යය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. සමාජ ශෝධන කාර්යයයේ දී ජන නාටක දක්වන දායකත්වය කවරාකාර වේද යන්න මතුකර ගත් මූලික ගැටලුව විය. ජන නාටක සමාජ ශෝධනයෙහිලා දක්වන දායකත්වය නවීන ජන මාධ්‍ය හෝ විවිධ සාහිත්‍ය ශානර මඟින් සිදු කරන සමාජ විවේචනයට වඩා බෙහෙවින් ප්‍රබල වූයේ එය සෘජු ලෙස ගැමි ජනයාට සමීප බැවිනි. පුස්තකාල පරිශීලනය ඔස්සේ ප්‍රාථමික සහ ද්විතීයක මූලාශ්‍රය මඟින් සිදු කළ සාහිත්‍ය විමර්ශනයෙන් ද ක්ෂේත්‍ර අධ්‍යයන, අන්තර්ජාල භාවිතය සහ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත ලබා ගන්නා ලදී. එසේ ලබාගත් දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූයේ සාම්ප්‍රදායික ජන නාටකය සඳහා ම ඇතැම් ශිල්පීන් සුළු වෙනස්කම් සිදු කරමින් නව කොටස් රඟ දක්වන අවස්ථා ඇති බවයි. ඒ අනුව මිරිස්ස කෝලම් සම්ප්‍රදායෙහි රඟ දැක්වෙන කරපිට කෝලම, පංචනාරීඝට, නරසිංහ අවතාර ආදි කෝලම් මේ ආකාරයට එක්කොට ඇත. එමඟින් ශිල්පීන් අතර ද ජන නාටක නව්‍යකරණය විය යුතු බවට අදහස් පවතින බව තවදුරටත් අනාවරණය විය. එමෙන් ම මෙම ජන නාටක ද්විත්වය මඟින් ප්‍රේක්ෂකයාට හාස්‍ය රසය, උපහාස රසය ලබාදෙන අතරතුර ඒ අනුසාරයෙන් සමාජ අවබෝධයක් ලබා දීමට ද උත්සුක වූ ආකාරය හඳුනාගත හැකි විය. සමාජයේ සිදු වන විවිධ විෂමතා, විෂමාචාර, පුද්ගල දුර්වලතා ඉස්මතු කරමින් යහපත් සමාජ සංස්ථාවක් ගොඩනැගීමට අවශ්‍ය පසුබිම සකස් කරන ආකාරයක් ද විද්‍යමාන විය. මේ අනුව සමාජ පාලන උපක්‍රමයක් ලෙසින් ද ජන නාටක ක්‍රියා කළ ආකාරය මනාව හඳුනාගත හැකි විය. සමාජයේ පවත්නා දේශපාලන, ආර්ථිකමය, සංස්කෘතික පීඩන හා පුද්ගල දුර්වලතා හාස්‍ය, උපහාසය සංකලනයෙන් ගෙනහැර දක්වමින් කිසිදු ගැටලුකාරී තත්වයකින් තොරව සමාජය සංශෝධනයකට ලක් කිරීමට ජන නාටක විශාල දායකත්වයක් දැක්වූ බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : කෝලම්, ජන නාටක, සමාජ ශෝධනය, සොකරි

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මහනුවර දළදා පෙරහරේ ඇත් පන්තිය හා බැඳුණු සංස්කෘතික සම්ප්‍රදායෙහි අද්‍යතන විචල්‍යතා පිළිබඳ සංස්කෘතික අධ්‍යයනයක්

ටී. එල් දෂ්මි රසෝද්‍යා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20570@arts.pdn.ac.lk

මහනුවර දළදා පෙරහැර මහනුවර දළදා මාලිගය කේන්ද්‍රකොට පවත්වනු ලබන දෙස් විදෙස් ආකර්ශනය දිනාගත් විචිත්‍රවත් බෞද්ධ පෙරහැර මංගල්‍යයකි. මෙහි විචිත්‍රත්වය ඔප්නැංවීමටත් රාජකීයත්වය ඉස්මතු කිරීමටත් ගෞරවාන්විත බව වැඩි කිරීමටත් ඇත් පන්තිය පෙරහැරට සම්බන්ධ වේ. පෙරහැරට බොහෝ දෙනෙක් ආකර්ෂණය වීමෙහි ලා එක් ප්‍රමුඛ හේතුවක් ලෙස ඇත් පන්තිය සඳහන් කළ හැකි ය. මෙලෙස පෙරහැරට සම්බන්ධ වන අලි ඇතුන් සම්බන්ධයෙන් අතීතයේ සිට සංස්කෘතික සම්ප්‍රදාය රැසක් පැවැති අතර වර්තමානයේ ඒවා තරමක වෙනස්කම් සහිතව ක්‍රියාත්මක වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ දළදා පෙරහැරේ ඇත් පන්තිය හා සම්බන්ධ සිරිත් විරිත් හා සම්ප්‍රදායවල අද්‍යතන ස්වභාවය සහ විචල්‍යතා අධ්‍යයනය කිරීමයි. පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වූයේ, ඓතිහාසික මහනුවර දළදා පෙරහැරේ ඇත් පන්තිය ආශ්‍රිත සම්ප්‍රදායික සංස්කෘතික වටිනාකම් සහ අද්‍යතන විචල්‍යතා කවරේ ද? යන්නයි. මහනුවර දළදා පෙරහැරේ ඇත් පන්තියේ සංස්කෘතිය හා අද්‍යතන විචල්‍යතා පිළිබඳ පැහැදිලි අධ්‍යයනයක් මෙතෙක් සිදු වී නොතිබීම මෙහි පර්යේෂණ රික්තය වේ. මේ සම්බන්ධයෙන් දත්ත රැස් කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක ක්‍රමවේදය භාවිත කෙරිණි. ඒ අනුව ප්‍රස්තකාල භාවිතය, සම්මුඛ සාකච්ඡා සහ අන්තර්ජාල මූලාශ්‍රය ඇසුරින් තොරතුරු ලබාගෙන එම කරුණු විස්තරාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කෙරිණි. මෙම පර්යේෂණයේ දී දළදා පෙරහැරට අලි ඇතුන් සපයා ගැනීමේ සංස්කෘතික සම්ප්‍රදාය අතීතයට සාපේක්ෂව සම්පූර්ණයෙන් ම විචල්‍යතාවලට ලක්ව ඇති බවත්, පෙරහැරට යොදා ගන්නා අලි ඇතුන් සම්බන්ධව ඇති විශ්වාස හා ජනප්‍රවාද වර්තමානයේ ද මෙරට ජනතාව අතර යම් මට්ටමකින් පවතින බවත්, පෙරහැර අලි ඇතුන් හා සම්බන්ධ අලි ඇඳුම් නිර්මාණය කිරීම හා ඒවා ඇන්දවීමේ සම්ප්‍රදාය ද අතීතයට සාපේක්ෂව මද වශයෙන් වෙනස්කමකට ලක්ව ඇති බවත්, එම අලි ඇතුන්ට සිදුකරන විවිධ පූජා කර්මවලට අතීතයේ තරම් වර්තමානයේ යොමු නොවන බවත්, ඇතැම් පූජා නාම මාත්‍රිකව පමණක් ශේෂ වී ඇති බවත් අතීතයට සාපේක්ෂව වර්තමානයේ පෙරහැරට ඇත් සම්පත ශීඝ්‍රයෙන් අහිමිව යාමක් පවතින බවත් මේ ඔස්සේ අනාවරණය විය. මෙම වටිනා සංස්කෘතික සම්ප්‍රදාය රැකගැනීම ඔස්සේ මහනුවර දළදා පෙරහැරේ ඇත් පන්තිය හා බැඳුණු සංස්කෘතික අනන්‍යතාව ආරක්ෂා වනු ඇත.

ප්‍රමුඛ පද: ඇත් පන්තිය, මහනුවර දළදා පෙරහැර, විචල්‍යතා, සංස්කෘතික සම්ප්‍රදාය

මෙම අධ්‍යයනය සඳහා මංගල දිසානායකගෙන් හා බැදිගම්තොට සාරද හිමිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල නවකතාවේ නිරූපණය වන 71 කැරැල්ල පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් නවකතා කිහිපයක් ඇසුරෙන්)

ආර්.අයි.බී.එස්.එම්. රත්නමලල
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20571@arts.pdn.ac.lk

1971 තරුණ සන්නද්ධ නැගිටීම ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ සුවිශේෂ සන්ධිස්ථානයක් සලකුණු කළ ඓතිහාසික සිදුවීමකි. 71 තරුණ අරගලය සිංහල ප්‍රබන්ධ කලාවට තීරණාත්මක ලෙස බලපෑම් කළ දේශපාලනික සංසිද්ධියකි. සිංහල නවකතාකරුවා හුදෙක් රසවින්දනයෙන් ඔබ්බට ගොස් 71 අරගලයෙහි දේශපාලනික හා සමාජ සත්‍ය නිර්මාණාත්මකව ප්‍රබන්ධගත කර පාඨකයා වෙත සමීප කිරීමට උත්සාහ දරා ඇත. එහිදී වාර්තාමය ස්වරූපයෙන් ඔබ්බට යමින් එකී දේශපාලන මතවාද, ගැටුම් හා සමාජ යථාර්ථය ප්‍රතිනිර්මාණය කර ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ 1971 තරුණ අරගලය වස්තු විෂය කර ගනිමින් රචනා වූ සිංහල නවකතා මඟින් එම ඓතිහාසික තරුණ අරගලය නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කිරීමයි. මෙහි අනු අරමුණු වනුයේ කැරැල්ල සඳහා පාදක වූ ප්‍රාදේශීය අනන්‍යතාව, අධ්‍යාපන පසුබිම සහ වෘත්තීය නායකත්වය හඳුනාගැනීමත් රාජ්‍ය අංශය, සමාජය, අරගලයේ මුහුණුවර හා සංවිධාන ශක්තිය කෙරෙහි දක්වා ඇති ආකල්ප විචාරාත්මකව විශ්ලේෂණය කිරීමත්ය. මූලික වශයෙන් මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරමින් විස්තරාත්මක විධික්‍රමය අනුව සිදු කර ඇත. ඒ අනුව "එරික් ඉලයප්ආරච්චිගේ පේත සහ රතු පලස, ජයතිලක කම්මැල්ලවීරගේ චුම්බන කන්ද, පී. බී. ජයසේකරගේ මරියා සිලොනිකා වස්තුව සහ සමරවීර විජයසිංහගේ තැප්පා සේම ගිනි" යන නවකතා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස පරිශීලනය කරමින් කරුණු විශ්ලේෂණය කර ඇත. සාහිත්‍ය විචාර සංකල්ප අතර එන සමාජ සත්ථා යථාර්ථවාදී න්‍යායට අනුව දත්ත විශ්ලේෂණය සිදු කර ඇත. එසේම මෙහි 71 අරගලයේ ඓතිහාසික හා දේශපාලන යථාර්ථය තත්කාලීන සමාජ සංස්කෘතිය ප්‍රකට කරමින් විවිධ ආකාරයට නිරූපණය විය. පූර්ව සාහිත්‍ය විචාර කෘති මඟින් නවකතාවෙන් නිරූපණය වන 71 කැරැල්ල පිළිබඳ පුළුල් ලෙස සාකච්ඡා නොකිරීම නිසා මතු වූ රික්තකය පූරණය කිරීමට මෙම පර්යේෂණය සිදු කර ඇත. ඒ අනුව සිංහල නවකතාවේ 71 කැරැල්ල විවිධ ලේඛකයන් අතින් විවිධ ලෙස නිරූපණය වී ඇති අතර සමාජ සත්ථා යථාර්ථවාදය තහවුරු කරමින් තත්කාලීන සමාජවාදී සංස්කෘතිය ප්‍රකට කර ඇති බව මෙම පර්යේෂණය මඟින් අනාවරණය විය.

ප්‍රමුඛ පද: 71 අරගලය, මාක්ස්වාදය, සමාජ සත්තා යථාර්ථවාදය, සිංහල නවකතාව, හෙජමොනිය

මෙම අධ්‍යයනය සඳහා මහින්ද රත්නායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ස්ත්‍රී කාරකත්වය සහ ස්ත්‍රීවාදී විසංයෝජනය : අනුරාධා නිල්මිණිගේ කාව්‍ය නිර්මාණ ඇසුරින් සිදු කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයකි

එම්. ඒ. බී. ශාරදා රත්නායක
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20589@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය නූතන සිංහල කාව්‍ය ක්ෂේත්‍රයෙහි ස්ත්‍රී අනන්‍යතාව, ස්ත්‍රී පරිපීඩනය සහ විඥානය වඩාත් ප්‍රකාශනවාදී මෙන්ම දේශපාලනික මුහුණුවරකින් යුතුව ප්‍රතිනිර්මාණය කරන කිවිදියක ලෙස අනුරාධා නිල්මිණී සුවිශේෂ වේ. මෙම පර්යේෂණය ඇයගේ කාව්‍ය නිර්මාණ උපයෝගී කරගනිමින් පුරුෂ මූලික සමාජ ව්‍යූහවල ස්ත්‍රී කාරකත්වය ක්‍රියාත්මක වන ආකාරය සහ ස්ත්‍රීවාදී විසංයෝජනය පිළිබඳ සිදු කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි. ඒ අනුව, පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ස්ත්‍රිය පිළිබඳ සාම්ප්‍රදායික සාමාන්‍යකරණ ව්‍යූහ බිඳවැටීම සහ ස්ත්‍රී කාරකත්වය පෙර බිමට පැමිණෙන ආකාරය, අනුරාධා නිල්මිණිගේ කාව්‍ය නිර්මාණ ඔස්සේ ස්ත්‍රීවාදී විසංයෝජනීය කියවීමට ලක් කිරීමයි. ස්ත්‍රිය පිළිබඳ සාම්ප්‍රදායික සාමාන්‍යකරණ ව්‍යූහ බිඳ වැටීම සහ ස්ත්‍රී කාරකත්වය පෙර බිමට පැමිණෙන ආකාරය, ස්ත්‍රීවාදී විසංයෝජනීය කියවීම ඔස්සේ කියවිය යුත්තේ කෙසේද යන්න මෙම යෝජිත පර්යේෂණ මාතෘකාවෙහි ගැටලුව විය. න්‍යායික, ශාස්ත්‍රීය, විචාරාත්මක යනාදී අංශවලින් මෙම පර්යේෂණයේ සන්දර්භගත වැදගත්කම නිරූපණය කරන අතර, ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පුස්තකාලය පරිශීලනය, විද්‍යුත් හා මුද්‍රිත ලිපි, අන්තර්ජාල ලිපි පරිශීලනය ද සිදු කරමින් දත්ත රැස්කර, දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක ක්‍රමය භාවිතයට ගන්නා ලදි. එලෙස දත්ත විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, අනාවරණය වූ මූලික කරුණු වනුයේ, අනුරාධා නිල්මිණි සාම්ප්‍රදායික කාව්‍ය ආකෘතීන් සහ භාෂා භාවිතය බිඳ හෙළමින් පුරුෂ කේන්ද්‍රීය භාෂා ව්‍යූහය විසංයෝජනය කිරීමට සමත්ව ඇති බවයි. ඇයගේ කාව්‍යකරණය නූතන සිංහල කවියෙහි සාම්ප්‍රදායික ලිංගභේද, සමාජ සම්මත අභියෝගයට ලක් කරමින් ස්ත්‍රී විඥානය දේශපාලනීකරණය කිරීමට හා ප්‍රතිඅර්ථකථනය කිරීමට ඉහළ දායකත්වයක් සපයා තිබේ. ඇයගේ කවියෙහි ස්ත්‍රිය හුදෙක් අක්‍රීය වස්තුවක් නොව, තමාටම අනන්‍ය වූ දේශපාලනික සහ සාමාජීය අනන්‍යතාවක් නිර්මාණය කරගන්නා සක්‍රීය කාරකයක් ලෙස මතු කර දක්වයි. තවද, මාතෘත්වය, ප්‍රේමය හා ලිංගිකත්වය වැනි සාම්ප්‍රදායික සංකල්පයන් ස්ත්‍රී කාරකත්වය හා ස්ත්‍රීවාදී විසංයෝජන ප්‍රවේශය ඔස්සේ නැවත කියවීමකට ලක් කරමින් පිතෘ මූලික මතවාද ප්‍රශ්න කිරීමට ඇය කවිය අවියක් කරගෙන ඇති බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: අනුරාධා නිල්මිණි, කාව්‍ය ආකෘතිය හා භාෂාව, විසංයෝජනවාදය, ස්ත්‍රී කාරකත්වය, ස්ත්‍රීවාදය

මෙම අධ්‍යයනය සඳහා සුනිල් වික්‍රමසිංහගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල හටන් කාව්‍ය මඟින් පිළිබිඹු වන සමකාලීන සමාජ, දේශපාලනික පසුබිම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (සීතාවක හටන, කුස්තන්තීනු හටන, ඉංගිරිසි හටන ආශ්‍රයෙන්)

පහලවැවේ විමලසාර හිමි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
a20618@arts.pdn.ac.lk

සාහිත්‍ය කලාවන් ලොව බිහි වන්නේ හුදෙක් ඒවා ඇරඹීමේ පරමාර්ථය ඔස්සේ ම නොවේ. සමාජ අවශ්‍යතාවලට අනුරූපවීම ද පෙරදැරි කරගෙනය. ඒ අනුව හටන් සාහිත්‍යයේ ද ආරම්භය සමාජ අවශ්‍යතාවක ප්‍රතිඵලයකි. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සිංහල හටන් කාව්‍ය මඟින් පිළිබිඹු වන සමකාලීන සමාජ, දේශපාලනික පසුබිම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. සාම්ප්‍රදායික සාහිත්‍ය විචාරයේ දී හුදෙක් හටනක් ප්‍රකාශිත කෘති වශයෙන් හටන් කාව්‍ය සැලකෙතත්, එම කාව්‍ය මඟින් හටන් පිළිබඳ තොරතුරු මෙන්ම වෙනත් කුමනාකාර සමකාලීන තොරතුරු අනාවරණය වේද? යන පර්යේෂණ ගැටලුවට ගොඩනගාගත් උපන්‍යාසය වන්නේ හටන් කාව්‍යයන්ගේ වර්ණිත පද්‍ය ඉතා සියුම්ව පරීක්ෂාකර බැලීම මඟින් හුදෙක් හටන් පිළිබඳ තොරතුරු මෙන්ම සමකාලීන සමාජ, දේශපාලනික තොරතුරු රැසක් ද අනාවරණය වන බවය. හටන් සාහිත්‍ය කෘති බහුල වීම හේතුවෙන් සීතාවක හටන, කුස්තන්තීනු හටන සහ ඉංගිරිසි හටන යන කෘති ත්‍රිත්වය ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරිණි. මෙම අධ්‍යයනය සිදුකිරීමේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ දත්ත රැස්කිරීම සිදුකළ අතර පුස්තකාල පරිශීලනය භාවිත කෙරිණි. දත්ත විශ්ලේෂණයේ දී විධික්‍රමය ලෙස විස්තරාත්මක ක්‍රමවේදය යොදා ගැනිණි. පර්යේෂණයෙන් ප්‍රධාන වශයෙන් අනාවරණය වූයේ සාහිත්‍ය විචාරයේ දී හුදෙක් හටනක් ප්‍රකාශිත සහ ඉතිහාසය අනාවරණය කරන කෘති ලෙස අගය කළ හටන් කාව්‍ය සමාජ, දේශපාලනික තොරතුරු රැසක් අන්තර්ගත වන කෘති සමූහයක් ලෙස ද අගය කළ හැකි බවයි. එමෙන්ම සිංහල හටන් කාව්‍ය මඟින් අනාවරණය වන තත්කාලීන සමාජ තොරතුරු ලෙස සමාජ, ආගමික සහ ආර්ථික තත්ත්ව, යුද්ධය හා බැඳි චාරිත්‍ර වාරිත්‍ර, එවක අහාරපාන පිළිබඳව ද තත්කාලීන දේශපාලනික පසුබිම යටතේ රජු සහ රජුගේ සේනාවත්, සිදු වූ සතුරු ආක්‍රමණ මෙන්ම භාවිත යුද්ධෝපක්‍රම ලැබූ විජයග්‍රණයන් පිළිබඳව ද තත්කාලීන සමාජ, දේශපාලනික තොරතුරු රැසක් ද පිළිබිඹු වේ.

ප්‍රමුඛ පද : ඉංගිරිසි හටන, කුස්තන්තීනු හටන, සමකාලීන සමාජ දේශපාලනය, සිංහල හටන් කාව්‍ය, සීතාවක හටන

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නූතන සිංහල නවකතාවේ පශ්චාත් යථාර්ථවාදී ආකෘතික විචල්‍යතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් (2010 - 2020 කාල පරාසයට අයත් තෝරාගත් සිංහල නවකතා ඇසුරින්)

කේ.ඒ.සී.ඩී. සමරවික්‍රම
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20654@arts.pdn.ac.lk

නූතන සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයෙහි නවකතාව නමැති ශානරය සුවිශේෂ වන අතර, කාලානුරූපී සමාජ-දේශපාලනික සන්දර්භවලට අනුකූලව එහි ආකෘතික ස්වභාවය විවිධ වෙනස්කම්වලට ලක්ව ඇත. මුල් කාලීන සිංහල නවකතාව ඒකාකාරී යථාර්ථවාදී රීතිය අනුගමනය කළද, විසිඑක්වන සියවස වන විට සිංහල නවකතාකරුවන් එම සාම්ප්‍රදායික සීමාවන් ඉක්මවා යමින් පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ සහිත නව්‍ය ආකෘතික අත්හදා බැලීම්වලට යොමුව ඇති ආකාරය හඳුනාගත හැකිය. මෙම පසුබිම තුළ, 2010 - 2020 කාල පරාසයට අයත් තෝරාගත් සිංහල නවකතාවල පශ්චාත් යථාර්ථවාදී ආකෘතිය භාවිත වී ඇත්තේ කවරාකාරයෙන්ද යන්න මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව විය. 'බත්තලංගුණ්ඩුව', 'වණ්ණදාසී', 'අදිසි නදිය', 'මකරානන්දය' සහ 'ආරාමදාස' යන නවකතා මූලික කරගනිමින්, එකී කෘතිවල පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ ප්‍රවේශ වීමෙන් යථාර්ථවාදී ආකෘතියේ ඇති වූ විචල්‍යතා සහ නව්‍ය ජීවන දෘෂ්ටි ප්‍රකාශනය වී ඇති ආකාරය ගවේෂණය කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ පෙළ විශ්ලේෂණ විධික්‍රමය භාවිත කරමින්, පශ්චාත් යථාර්ථවාදී සාහිත්‍ය න්‍යාය, න්‍යායික සීමාව ලෙස යොදාගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. පර්යේෂණ අනාවරණ අනුව, තෝරාගත් කාල පරාසය තුළ සිංහල නවකතාකරුවන් සාම්ප්‍රදායික වාස්තවිකත්වය සහ තාර්කිකත්වය ඉක්මවා යමින්, චරිත හා සිදුවීම් අතර හේතුඵල සබඳතා බිඳ හෙලමින්, ෆැන්ටසිය සහ ආශ්චර්යය ද යථාර්ථයේම කොටසක් ලෙස නිරූපණය කිරීමට පෙළඹී ඇති බව කිව හැකිය. එහිදී, යථාර්ථවාදී ආකෘතිය මුළුමනින්ම බැහැර නොකරමින්, චරිත නිරූපණය, ආඛ්‍යාන ක්‍රමය සහ කථන විලාසය සඳහා පශ්චාත් යථාර්ථවාදී ලක්ෂණ මුසු කරමින්, මානව සබඳතාවල සංකීර්ණත්වය සහ එක් ස්ථායී සත්‍යයක් නොමැති බව වැනි ගැඹුරු ප්‍රකාශන සිදු කළ හැකි වන පරිදි නවකතා ආකෘතිය හැඩගස්වා ගැනීමට ලේඛකයන් සමත්ව ඇති බව නිගමනය කළ හැකිය. ඒ අනුව, සාම්ප්‍රදායික ඒකාකාරී ආකෘතියෙන් විතැන් වී සිදු කළ මෙම නව්‍ය ආකෘතික අත්හදාබැලීම් හේතුවෙන් නූතන සිංහල නවකතාවේ ආකෘතික පක්ෂය ප්‍රකාශන ශක්‍යතාව ඔස්සේ කැපී පෙනෙන නව්‍යකරණයකට ලක්ව ඇති බව සනාථ විය.

ප්‍රමුඛ පද: ආකෘතික විචල්‍යතා, ආඛ්‍යාන ක්‍රමය, පශ්චාත් යථාර්ථවාදය, යථාර්ථවාදය, සිංහල නවකතාව

මෙම අධ්‍යයනය සඳහා දිනූෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සද්ධර්මාලංකාරයේ අන්තර්ගත කථාවස්තු මඟින් පිළිබිඹු වන සංස්කෘතික සම්ප්‍රේෂණය සහ සංරක්ෂණ ප්‍රවේශය : සංස්කෘතික විසරණය හා සංස්කෘතික සංස්පර්ශය යන සංකල්ප ඔස්සේ සිදු කෙරෙන පර්යේෂණයක් (තෝරා ගත් කථාවස්තු ආශ්‍රයෙන්)

එච්. රවිඳු සම්පත්
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20659@arts.pdn.ac.lk

සංස්කෘතිය යනු ගතික ප්‍රපංචයකි. මනුෂ්‍ය ශිෂ්ටාචාරය වර්තමානය දක්වාම විකාසනය වෙමින් පවතින්නේ එම ගතිකත්වය හේතුවෙනි. ඒ අනුව අතීත ලංකා සංස්කෘතියෙහිද විවිධ යුගවල දී විවිධ කැපී පෙනෙන සංස්කෘතික වෙනස්කම් සිදු වූ අතර එම ගතිකත්වය ගම්පොළ යුගය නියෝජනය කරන කාල පරාසයේ නිරූපණය වන ආකාරය එම යුගයට අයත් සද්ධර්මාලංකාරය පරිශීලනය කිරීමේ දී හඳුනාගත හැකිය. සද්ධර්මාලංකාර කෘතිය ඔස්සේ නිරූපණය වන සංස්කෘතික සම්ප්‍රේෂණය හා සංරක්ෂණය පිළිබඳව සංස්කෘතික විසරණය හා සංස්කෘතික සංස්පර්ශය යන සංකල්ප ඔස්සේ අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ බවට පත් විය. "අනුරාධපුර යුගයට අයත් සමාජීය, ආගමික, සංස්කෘතික පරිස්ථිතිය නිරූපණය වන පාලි මූලාශ්‍රයක කථාවස්තු සද්ධර්මාලංකාරයෙහි ඇතුළත් විම පදනම් කොටගෙන ගම්පොළ යුගයේ පැවති සංස්කෘතික විචල්‍යතාවල ස්වරූපය කියැවීමට ලක් කළ හැකි වන්නේ කෙසේද" යන්න පර්යේෂණ ගැටලුව බවට පත් විය. ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත රැස් කරන ලද මෙම පර්යේෂණයේ න්‍යායික ප්‍රවේශය වශයෙන් සංස්කෘතික විසරණය සහ සංස්කෘතික සංස්පර්ශය යන සංකල්ප යොදා ගැනුණු අතර දත්ත විශ්ලේෂණයේ දී අනාවරණය වූයේ සද්ධර්මාලංකාරය පාලි රසවාහිනියේ හුදු පරිවර්තනයක් පමණක් නොව, සංස්කෘතික විසරණය සහ සංස්කෘතික සංස්පර්ශය යන තත්ත්ව ඔස්සේ ලද භාරතීය බෞද්ධ සංස්කෘතිකාංග ශ්‍රී ලංකේය ජන සමාජය වෙත සම්ප්‍රේෂණය වීමේ ප්‍රබලතම මාධ්‍යයක් ලෙස ක්‍රියා කර ඇති බවයි. තෝරා ගත් මූලාශ්‍රයෙහි එන දඹදිව කථා දේශීයකරණය කිරීමේ දී, කතුවරයා සාර්ථක සංස්කෘතික සම්ප්‍රේෂණයකට හා සංරක්ෂණයක නිරත වී ඇති අතර, පරමාදර්ශී බෞද්ධ සමාජයක හර පද්ධතීන් දේශීය අනන්‍යතාවට ගැළපෙන පරිදි අනුගත කර ඇත. ඒ අනුව සංස්කෘතික සටිටනයකින් තොරව, විදේශීය සංස්කෘතික ලක්ෂණ දේශීයකරණයට ලක් කරමින්, සාම්ප්‍රදායික දැනුම, පෙරදිග ආචාරධර්ම, සමාජ ආකල්ප සුරක්ෂිත කරන ලද ප්‍රායෝගික සංස්කෘතික සංරක්ෂණ ප්‍රවේශයක් සද්ධර්මාලංකාරයේ දේශීය සහ විදේශීය කථාවස්තු ඔස්සේ අනාවරණය වන බව නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද : සංරක්ෂණය, සංස්කෘතික විසරණය, සංස්පර්ශය, සද්ධර්මාලංකාරය, සම්ප්‍රේෂණය

මෙම අධ්‍යයනය සඳහා දිනූෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ලාංකේය දේව ධුරාවලියෙහි දෙවොල් දෙවියන්ගේ අනන්‍යතාව සහ ඒ හා සම්බන්ධ නූතන විචල්‍යතා පිළිබඳ අධ්‍යයනයක්

එස්. එන්. එල්. සඳජීවනි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20660@arts.pdn.ac.lk

ලාංකේය දේව ඇදහීම වනාහි අනාදිමත් කාලයක සිට පැවත එන සංකීර්ණ ජන ආගමික ප්‍රපංචයකි. 'දෙවොල් සංකල්පය' ද ඒ අතර වේ. අසාධාරණය වෙනුවෙන් පෙනී සිටින, වරදට දඬුවම් දෙන අයෙකු වශයෙන් සංස්කෘතික එළඹුම්වල හඳුනාගැනෙන දෙවොල් දෙවියන්, ලාංකේය දේව ධුරාවලියෙහි ප්‍රබලතම ප්‍රාදේශීය මෙන් ම අර්ධ මහේශාක්‍ය දෙවි කෙනෙකි. ඒ අනුව, දෙවොල් දෙවියන් සම්බන්ධ වත්පිළිවෙත් හා එහි නූතන විචල්‍යතා මඟින් දෙවොල් දෙවියන්ගේ අනන්‍යතාව නිරූපණය වන්නේ කෙසේද යන පර්යේෂණ ගැටලුව ඔස්සේ දෙවොල් දේව අනන්‍යතාවත්, එහි නූතන විචල්‍යතාත් අධ්‍යයනය කිරීම පර්යේෂණයේ මූලික අරමුණ විය. ඒ හා බැඳි ඇදහිලිවිශ්වාස හා පුදපූජා විධිවල ස්වභාවය විමර්ශනය කිරීමත්, අප්‍රසිද්ධව පවතින හොරවල දෙවොල් දේවාලය පිළිබඳ ගවේෂණය කිරීමත් අනු අරමුණු විය. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදුකළ අතර පුස්තකාල පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, සහභාගිත්ව නිරීක්ෂණ, ප්‍රශ්නාවලි ලබාදීම, විද්‍යුත් මූලාශ්‍රය භාවිතය යනාදිය මඟින් දත්ත රැස්කිරීම සිදු විය. ගාල්ල දිස්ත්‍රික්කයේ සීනිගම, වේරගොඩ, අම්බලන්ගොඩ, බලපිටිය, බෙන්තොට, හොරවල යන ප්‍රදේශ ඇසුරින් ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කෙරිණි. නූතනයේ වත්පිළිවෙත් විවිධ විපර්යාසයන්ට ලක්ව ඇති අතර, කපු මහත්වරු ප්‍රමුඛ බහුතරයක් දෙනා නිවැරදි මූලාශ්‍රයමය දැනීමකින් තොරව දෙවොල් දේව අනන්‍යතාව සංක්‍රමණික ප්‍රභවයකට සීමා කිරීමට පෙළඹෙන බව අනාවරණය විය. භාරහාර, සෙත් පැතීම් ආදිය වර්තමානයේ මූල්‍ය පාදකව සිදුවන අතර, සළු හා සළඹ ගෙන මුදල් එකතු කිරීමේ අංග එක්ව තිබේ. ජනයා ආභරණ ආදිය පූජා කිරීමට ද පෙළඹී සිටී. නූතන තරුණ පරපුර ශාන්තිකර්ම නැරඹීමට පැමිණෙනුයේ හුදෙක් විනෝදාත්මක අත්දැකීමක් ලබාගැනීමේ අටියෙනි. ඇතැමෙක් කිරි ආහාර ලබා ගැනීමේ පටු අරමුණෙන් සහභාගී වේ. එමෙන්ම, දෙවොල් මඩුවට හාස්‍යෝත්පාදක අංග සහ ජනප්‍රිය ගීත බණ්ඩ මුසු වී ඇත. බලය, ධනය, ගමනාගමන පහසුව යනාදියෙන් 'සීනිගම' ජනප්‍රිය වුව ද 'මහාසාම්වත්ත' වැනි ඉඩම් නාම සහ දේව පරපුරෙන් පැවත එන්නන් තවමත් ජීවත් වන 'හොරවල' ප්‍රදේශය දෙවොල් දෙවියන්ගේ සැබෑ වාසභූමිය බව ද අනාවරණය විය. ඒ අනුව, වත්පිළිවෙත් ජනප්‍රිය සංස්කෘතියට නතුව විචල්‍යයට ලක් වුව ද දෙවොල් දේව අනන්‍යතාව සංක්‍රමණික ප්‍රභවයකට සීමා කෙරෙන ඓතිහාසික පසුබිමක් ලාංකේය සමාජයෙහි නිර්මාණය වී ඇති බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: අනන්‍යතාව, දෙවොල් මඩුව, දෙවොල් දෙවි, දේව ධූරාවලිය, නූතන විචල්‍යතා

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල සන්දේශ කාව්‍යයන්හි අන්තර්ගත ඓතිහාසික සිද්ධි පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කෝට්ටේ යුගයෙහි සන්දේශ කාව්‍ය ඇසුරෙන් කෙරෙන පර්යේෂණයකි)

එච්. පී. එස්. අයි. සන්දනායක
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20664@arts.pdn.ac.lk

සිංහල සන්දේශ කාව්‍ය හුදෙක් කලාත්මක රසවින්දනයෙන් ඔබ්බට යමින් සමකාලීන යුගවල ඉතිහාසය ප්‍රතීයමාන කළ ප්‍රබල සාහිත්‍ය ශානරයකි. සන්දේශ කාව්‍ය ආරම්භය හා විකාශනය කෙරෙහි අවධානය යොමු කිරීමේදී විද්‍යමාන වනුයේ, ඒවායෙහි යම්කිසි ඓතිහාසික සිද්ධියක් පාදක වන බවයි. විශේෂයෙන් සම්භාව්‍ය ගණයෙහිලා සැලකෙන සන්දේශයන්හි රාජකීය පවුල හා බැඳුණු ප්‍රධාන ඓතිහාසික සිද්ධියක් පාදක කර ගනිමින් සන්දේශ කාව්‍ය රචනා වී ඇත. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වනුයේ, සන්දේශ කාව්‍ය රචකයන් විසින් ස්වකීය සන්දේශ කෘතිය සඳහා ඓතිහාසික සිද්ධි භාවිත කර ඇති ආකාරය හා මූලාශ්‍රයාගත තොරතුරු හා එකී කාව්‍යමය සිද්ධි අතර පවත්නා සම විෂමතාවය හඳුනා ගැනීමයි. මීට අමතරව, සම්භාව්‍ය සන්දේශ කාව්‍යවල ඓතිහාසික සිද්ධි හඳුනා ගැනීම හා ඒවා ඓතිහාසික මූලාශ්‍රය ඇසුරෙන් විමර්ශනය කරමින් එහි සාවද්‍යතා නිරවද්‍යතා පෙන්වාදීම, අතිශයෝක්ති වර්ණනා රීති සන්දේශයන්හි භාවිත කිරීම මගින් එහි ඓතිහාසික සත්‍යයට බලපා ඇති ආකාරය හඳුනාගැනීම අනුඅරමුණු විය. සිංහල සන්දේශ රචකයා ස්වකීය කාව්‍ය සඳහා පාදක වී ඇති ඓතිහාසික සිද්ධි ප්‍රතීයමාන කර ඇත්තේ කවරාකාරයෙන්ද යන පර්යේෂණ ගැටලුව විමර්ශනාත්මක විශ්ලේෂණය කිරීම සඳහා ගුණාත්මක ක්‍රමවේදය යටතේ සාහිත්‍ය විමර්ශනය ඔස්සේ දත්ත රැස් කරන ලදි. මෙහිදී කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදා ගනිමින් සංසන්දනාත්මක විධික්‍රමය ඔස්සේ පර්යේෂණය සිදුකර ඇත. පර්යේෂණය මගින් අනාවරණය වූයේ, ඓතිහාසික මූලාශ්‍රයාගත තොරතුරු සහ සන්දේශවල දැක්වෙන කාව්‍යමය සිදුවීම් අතර මූලික ව්‍යුහමය සමානතාවක් පැවතුණද, චරිත වර්ණනා සහ කාලවකවානු පිළිබඳ යම් යම් විෂමතා පවතින බවයි. සන්දේශවල තොරතුරු ඓතිහාසික වශයෙන් මූලිකවම නිරවද්‍ය වුවද එහි බහුලව භාවිත වන අතිශයෝක්ති වර්ණනා නිසා කාව්‍ය රසය තීව්‍ර කිරීම ප්‍රමුඛ වී ඇති අතර සැබෑ සිදුවීම් වටා කාව්‍යමය අලංකාරයක් ආරෝපණය වී ඇත. එමෙන්ම හාරකයා මත සන්දේශ කාව්‍ය යැවීම වැනි කල්පිත සංකල්පයක් මත පදනම් වුවද එය සමකාලීන ඓතිහාසික තත්වයක් පිළිබඳ පුළුල් කතිකාවකට මඟපාදා ගෙන ඇති බව හඳුනාගත හැකිය. ඒ අනුව, රාජ්‍ය ඒකීයභාවය, යුධ ජයග්‍රහණ, රාජ්‍ය සුරක්ෂිතතාව සහ සංස්කෘතික ආක්‍රමණ වැනි ඓතිහාසික සිද්ධි සාහිත්‍යමය රසවින්දනයක් උදෙසා නිර්මාණාත්මකව නිරූපණය කිරීමට මෙම කාව්‍ය භාවිත කර ඇත. ඒ අනුව, සිංහල සන්දේශ කාව්‍ය වනාහි සාහිත්‍ය නිර්මාණ පමණක් නොව, ප්‍රබල ඓතිහාසික අගයක් පාදක කරගනිමින් රචනා වූ සාහිත්‍ය ශානරයක් බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ඓතිහාසික මූලාශ්‍රය, ඓතිහාසික සිද්ධි, කෝට්ටේ යුගය, සන්දේශ කාව්‍ය, සම විෂමතා

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවේ තේමා භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (2020 - 2024 සම්මානලාභී නවකතා ඇසුරෙන්)

එස්.බී.අයි. මධුෂිකා සෙනෙවිරත්න
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20706@arts.pdn.ac.lk

නවකතාව වර්තමානයේ ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත්වීමට එහි ඇති නම්‍යශීලී බව, අපූර්වත්වය හා වඩාත් ස්වාධීන මාධ්‍යයක් වීම බලපා ඇත. 18වන සියවස පමණ වනවිට නවකතාවෙහි අත්‍යවශ්‍ය ගුණාංගයක් වශයෙන් යථාර්ථය නිරූපණය කිරීම සැලකීමත් සමඟ එය නවකතාවෙහි තේමාවට බලපෑම් කොට ඇත. නවකතාවක තේමාව එකී කෘතියේ අර්ථාන්විත පණිවුඩය, මූලික අදහස හෝ විමර්ශනය වූ විෂය ක්ෂේත්‍රය බවට පත් වේ. නවකතාවේ තේමා විවිධත්වය පිළිබඳ නොයෙකුත් කෘති රචනා වී තිබුණද විශේෂයෙන් ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවේ තේමා විවිධත්වය පිළිබඳ කෘති රචනා වී ඇත්තේ අල්ප වශයෙනි. එය හේතු කොටගෙන එම රික්තකය සම්පූර්ණ කිරීමේ අදහසින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. පර්යේෂණයෙහි මූලික අරමුණ වූයේ ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවේ තේමා භාවිතය හා ඒවායේ විකාශනය විශ්ලේෂණය කිරීමයි. ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවෙහි තේමා භාවිතය හා විකාශනය කවරාකාරද? යන පර්යේෂණ ගැටලුවට ගොඩනඟා ගත් උපන්‍යාසය සාධනය කරගැනීමට මෙමගින් අවකාශ උදා විය. 2020 - 2024 යන වර්ෂවලදී ස්වර්ණ පුස්තක සම්මාන ලබාගත් නවකතා පමණක් උපයෝගී කරගනිමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මෙම පර්යේෂණය සිදු කරන ලදි. එහිදී ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවෙහි තේමා භාවිතය විවිධ ලෙස නිරූපණය වන අතර ඒවායේ සබඳතාව පදනම් කොටගනිමින් විකාශන රටාවක් ගොඩනැඟී ඇති බව විද්‍යමාන විය. සමාජ - සංස්කෘතික හා ආර්ථික විවරණය, දේශපාලනමය කතිකාව, යටත්විජිතකරණයේ බලපෑම, ප්‍රේමය, බුද්ධිමය දේපළ අවභාවිතය, සිංහල - දෙමළ අන්තර් වාර්ගික සම්බන්ධතා ලෙස තේමාවෙහි විවිධත්වයක් පවතින බව ගම්‍යමාන විය. නවකතාව පිළිබඳ පවතින මතවාද පදනම් කරගනිමින් සිදුකරන විග්‍රහය මගින් ද පැහැදිලි වන්නේ ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාවේ තේමා භාවිතය විවිධ වන අතර කතුවරයා, සමාජ සන්දර්භය ආදී හේතු මත වෙනස්වීම්වලට ලක්වන බවත් ඇතැම් විට එකී තේමාවල සාපේක්ෂතාද දක්නට ලැබෙන බවත්ය. මෙම පර්යේෂණය ස්වර්ණ පුස්තක සම්මාන ලබාගත් නවකතා රසවිඳීමට පමණක් නොව එකී කෘතිවල තේමා භාවිතය හා සමාජ - සංස්කෘතික පරිසරය අතර අන්තර් ක්‍රියාව විමර්ශනය කරමින් සිදුකරන ක්‍රමානුකූල අධ්‍යයනයකට ද පිටුවහලක් වේ.

ප්‍රමුඛ පදඃ තේමා විවිධත්වය, විකාශන රටාව, යථාර්ථය, ස්වර්ණ පුස්තක සම්මානලාභී නවකතාව, සමාජ සන්දර්භය

මෙම අධ්‍යයනය සඳහා මහින්ද රත්නායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ඓතිහාසික ප්‍රවාද හා සම්භාව්‍ය සාහිත්‍යික කථාවස්තු මූලාශ්‍රය කර ගත් නූතන සිංහල නාට්‍යවලින් නිරූපිත ස්ත්‍රිය (තෝරාගත් නාට්‍ය නිර්මාණ ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්)

ආර්.කේ.ඩී.සී.එස්. සෙනෙවිරත්න
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20709@arts.pdn.ac.lk

නාට්‍යය වනාහි සාමූහික කලාවකි. නාට්‍යයක් කරළියට ඉදිරිපත් වූ විට එය ප්‍රේක්ෂකයාගේ සාමූහික අනුභූතිය බවට පත් වෙයි. 1950 වර්ෂයෙන් පසුව නිර්මාණය වූ සිංහල වේදිකා නාට්‍යය පිළිබඳ විමසීමේදී ඓතිහාසික ප්‍රවාද, සම්භාව්‍ය සාහිත්‍යයේ කථාවස්තු මූලාශ්‍රය කරගත් නාට්‍ය නිර්මාණවලින් ස්ත්‍රී චරිතය ප්‍රතිනිර්මාණය කිරීම දැකිය හැකිය. ඒ අනුව නාට්‍ය නිර්මාණකරුවා ස්ත්‍රී චරිතය ඇසුරෙන් ස්වකීය දෘෂ්ටිවාදාත්මක අදහස් නිරූපණය කරයි. එසේම නූතන සිංහල නාට්‍ය නිර්මාණ අධ්‍යයනය කිරීමේදී විවෘතව ඓතිහාසික සිදුවීම් නිර්මාණකරණයට යොදාගෙන ඇති ආකාරය දැකිය හැකිය. සම්භාව්‍ය සිංහල සාහිත්‍ය ග්‍රන්ථවලින් නිරූපිත පුරාණෝක්ති, ඓතිහාසික ප්‍රවාද මූලාශ්‍රය කරගනිමින් ස්ත්‍රී චරිතය නව්‍ය දෘෂ්ටිකෝණයකින් කියවීමට නූතන සිංහල නාට්‍ය නිර්මාණකරුවා දක්වන සාමර්ථ්‍යය කවරාකාරදැ'යි විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයෙන් සිදුකර ඇත. ඒ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ දත්ත විශ්ලේෂණය කරමින් සිංහල නාට්‍ය කලාවේ ඉතිහාසය, ඓතිහාසික ප්‍රවාද සහ සම්භාව්‍ය සාහිත්යික කෘති, නූතන සිංහල නාට්‍ය නිර්මාණ කෘති පිළිබඳ අධ්‍යයනය කර ඇත. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ පබාවතී, වෙස්සන්තර, භවකඩතුරාව නාට්‍යය සහ හෙන්රි ජයසේනගේ කුවේණි නාට්‍යය, ගුණසේන ගලප්පත්තිගේ සඳකිඳුරු නාට්‍යය ඇසුරෙන් ස්ත්‍රී කාරකගුණය සාධාරණීය කිරීමටත් ඒ පිළිබඳ දෘෂ්ටිවාදාත්මකව බැලීමටත් නාට්‍ය නිර්මාණකරුවා දක්වන සාමර්ථ්‍යය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයෙන් අරමුණු කෙරෙයි. ඒ අනුව ප්‍රේමය, ලිංගිකත්වය, නිදහස් චින්තනය වැනි සංකල්ප ඇසුරෙන් ස්ත්‍රී චරිතයේ ක්‍රියාකාරීත්වය සංකීර්ණව විවරණය කිරීමට නූතන සිංහල නාට්‍ය නිර්මාණකරුවා උත්සාහ ගෙන ඇති බව මෙම පර්යේෂණයෙන් අනාවරණය කරගත හැකිය. එහිදී අතීතයේ පුරුෂමූලික සමාජයක පැවති ස්ත්‍රිය පිළිබඳ සාම්ප්‍රදායික දෘෂ්ටිය බිඳහෙළමින් නූතන සිංහල නාට්‍ය නිර්මාණ ඇසුරෙන් ස්ත්‍රිය පිළිබඳ මතවාදාත්මක වෙනසක් ඇති කිරීමට සමත්ව ඇති බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ඓතිහාසික ප්‍රවාද, කලාව, නූතන සිංහල නාට්‍යය, සම්භාව්‍ය සාහිත්යික කථාවස්තු, ස්ත්‍රී චරිතය

මෙම අධ්‍යයනය සඳහා සේනාරත්න කාරියවසම්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ළමා නාට්‍ය කලාවේ නිරූපිත පාසල් ශිෂ්‍ය භූමිකාව පිළිබඳ තේමාත්මක අධ්‍යයනයක් (තෝරාගත් ළමා නාට්‍ය පිටපත් ඇසුරින්)

ඩී.එම්.එස්. සෙව්වන්දි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20715@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය නාට්‍ය කලා ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී බොහෝ පර්යේෂකයන් විසින් ළමා නාට්‍ය පිළිබඳ වැඩි අවධානයක් යොමුකොට ඇති බව මේ වනවිටත් රචනා වී ඇති ශාස්ත්‍රීය පොත්පත් සහ ලිපි ලේඛන මගින් තහවුරු වෙයි. එහෙත් එහි එක් ක්ෂේත්‍රයක්ව පවතින ළමා නාට්‍ය පිළිබඳ රචනා වී ඇති පර්යේෂණාත්මක අධ්‍යයනවල යම් හිඟතාවක් දැකිය හැකිය. මෙම පර්යේෂණය මගින් මූලිකවම අවධානයට ලක් කරනුයේ ශ්‍රී ලාංකේය ළමා නාට්‍ය කලාව පිළිබඳවයි. එයින් ද රාජ්‍ය ළමා නාට්‍ය උළෙල නාට්‍ය පිළිබඳ වීම විශේෂය. ළමා නාට්‍ය කලාව දරුවන්ගේ ජීවන අත්දැකීම්, සමාජය සම්බන්ධතා සහ අධ්‍යාපනික පරිසරය කලාත්මකව නිරූපණය කරන වැදගත් මාධ්‍යයක් ලෙස සැලකේ. එහි පාසල් ශිෂ්‍ය චරිත විශේෂ ස්ථානයක් ගන්නා අතර එම චරිත මගින් දරුවන්ගේ චර්යා රටා වටිනාකම් අභියෝග සහ සමාජීය අපේක්ෂාවන් නිරූපණය කරයි. වර්තමාන සමාජයේ දරුවන් මුහුණ දෙන අධ්‍යාපනික හා සමාජය ගැටලු වැඩි වශයෙන් අවධානයට ලක්ව තිබුණද ළමා නාට්‍ය මගින් පාසල් ශිෂ්‍ය භූමිකාව නිරූපණය වන ආකාරය පිළිබඳ අධ්‍යයන සාපේක්ෂව සීමිතය. එබැවින් ලාංකේය ළමා නාට්‍ය මගින් නිරූපණය කෙරෙන පාසල් ශිෂ්‍ය භූමිකාව සහ එයින් පරිබාහිර ලෝකයේ ළමා අනුභූතින් ඔස්සේ ඔවුන් අයත් සමාජ සංස්කෘතික සන්දර්භය පිළිබඳ ශිෂ්‍ය ප්‍රජාවගේ සහ වැඩිහිටි ප්‍රජාවගේ අවබෝධය පුළුල් කෙරෙන ආකාරය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සිදු කරන ලද අතර තේමාත්මක විශ්ලේෂණය ප්‍රධාන විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස භාවිත කර ඇත. අධ්‍යයනය සඳහා තෝරාගත් ළමා නාට්‍ය නිර්මාණ කිහිපයක් ආශ්‍රය කර ගනිමින් හා සම්මුඛ සාකච්ඡා මගින් පාසල් ශිෂ්‍ය චරිත නිරූපණය වන ආකාරය, ඔවුන්ගේ හැසිරීම් රටා සමාජයේ සබඳතා සහ අධ්‍යාපනික අත්දැකීම් විශ්ලේෂණය කරන ලදි. ඒ සඳහා නාට්‍ය පිටපත් අන්තර්ගතය අධ්‍යයනය කරන ලදී අධ්‍යයනයෙන් අනාවරණය වූයේ පාසල් ශිෂ්‍ය භූමිකාව විනය, මිත්‍රත්වය, සහයෝගීතාව අධ්‍යාපනික පීඩනය, පවුල් බලපෑම්, සදාචාරාත්මක වටිනාකම් සහ පෞරුෂ සංවර්ධනය වැනි තේමා රැසක් සමඟ සම්බන්ධ වී නිරූපණය වන බවයි. එමෙන්ම මෙම චරිත මඟින් දෛනික ජීවිතයේ යථාර්ථයන් මෙන්ම ඔවුන් මුහුණ දෙන සමාජය හා අධ්‍යාපනික අභියෝග ද ප්‍රතිබිම්භනය වන බව හෙළි විය. තවද ලාංකේය පාසල් ශිෂ්‍යයාගේ මනෝභාවයන් සහ ඔවුන්ගේ ජීවිතය හා සම්බන්ධ ගැටලු කලාත්මකව ප්‍රතිනිර්මාණය කිරීමට ළමා නාට්‍ය ශිල්පීන්ට හැකි වී තිබෙන බව මෙහිදී නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : තේමාත්මක අධ්‍යයනය, පාසල් ශිෂ්‍ය භූමිකාව, ළමා නාට්‍ය කලාව

මෙම අධ්‍යයනය සඳහා නිමල් විජේසිරිගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයේ නිරූපිත ස්ත්‍රී චරිතය සරච්චන්ද්‍රගේ නාට්‍යවල ප්‍රතිනිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ ස්ත්‍රීවාදී න්‍යාය ඇසුරින් සිදු කෙරෙන අධ්‍යයනයක් ('මනමේ', 'පේමතෝ ජායතී සෝකෝ', සහ 'පබාවතී' නාට්‍ය ත්‍රිත්වය ඇසුරින්)

ජී. ඒ. අයි. සෙව්වන්දි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20716@arts.pdn.ac.lk

සිංහල නාට්‍ය කලාව ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික දෘෂ්ටිය හා කලාත්මක අනන්‍යතාව පෙන්නුම් කරන මූලික සාහිත්‍යාංගයක් ලෙස හැඳින්විය හැකිය. නාඩගම්, සොකරි වැනි ගැමි නාට්‍ය ශෛලීන්ගෙන් ව්‍යුත්පන්න වූ චතුර්විධ අභිනවලින් සමන්විත සාම්ප්‍රදායික ශෛලිගත සිංහල නාට්‍ය කලාව සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයෙන්ද පෝෂණය ලබා ඇත. ලාංකේය ශෛලීගත නාට්‍ය කලාවේ සන්ධිස්ථානයක් සනිටුහන් කළ එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය කෙරෙහි අවධානය යොමු වූ මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සම්භාව්‍ය සාහිත්‍යයෙහි කතාවස්තුවල ඒකාකෘතිකව (ඝනීභූත) නිරූපිත ස්ත්‍රී චරිතය, එම මූලාශ්‍රයම පාදක කොටගත් සරච්චන්ද්‍රගේ නාට්‍යවල නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කිරීමයි. පර්යේෂණ ගැටලුව බවට පත් වූයේ සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයේ එන ස්ත්‍රී චරිතය එලෙසින්ම නිරූපණය කිරීමට අවකාශ තිබියදීත්, එයම මූලාශ්‍රය කොටගත් සරච්චන්ද්‍රගේ නාට්‍යවල ස්ත්‍රී චරිතය වෙනස් මුහුණුවරකින් ප්‍රතිනිර්මාණය කර ඇත්තේ කෙසේද යන්නයි. මෙම විමර්ශනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය උපයුක්ත කොටගත් අතර, න්‍යායික පදනම වශයෙන් අනධිකාරිවාදී ස්ත්‍රීවාදී ප්‍රවේශය (Anarcha-Feminism) යොදා ගැනුණි. මෙම ප්‍රවේශය යටතේ විග්‍රහ කිරීම උදෙසා තෝරාගත් නාට්‍ය වනුයේ මනමේ, පේමතෝ ජායතී සෝකෝ, සහ පබාවතී යන නාට්‍ය ත්‍රිත්වයයි. සම්භාව්‍ය සාහිත්‍ය මූලාශ්‍රය සහ ඒ මත පදනම් වූ නාට්‍ය අතර තුලනාත්මක කියැවීමක් සිදු කිරීම උදෙසා ස්ත්‍රීවාදී ප්‍රවේශයෙහි යෝග්‍යතාව අවධාරණය කිරීම මෙම පර්යේෂණයේ මූලික වැදගත්කමයි. නාට්‍යවලට පාදක වූ සම්භාව්‍ය ගද්‍ය ආඛ්‍යානවලදී ස්ත්‍රී චරිතය එම කතා වස්තුවලට පමණක් විශේෂිත අරමුණු අනුව ආකෘතිගත වී ඇතත්, සිය නාට්‍යවලදී එම චරිත දෙස ස්වාධීන දෘෂ්ටියකින් යුතුව නිගමනවලට එළැඹීමට ප්‍රේක්ෂකයා යොමුවන පරිදි ස්ත්‍රී චරිතවල කාරකත්වය මතු කරමින්, ඒකාකෘතිකරණයෙන් මුදවා නිරූපණය කිරීමට සරච්චන්ද්‍ර කටයුතු කර ඇති බව මෙම විශ්ලේෂණය අවසානයේ දී නිගමනය කළ හැකි විය.

ප්‍රමුඛ පද: අනධිකාරිවාදය, ස්ත්‍රී ඒකාකෘතිකරණය, ස්ත්‍රී කාරකත්වය, ස්ත්‍රීවාදය

මෙම අධ්‍යයනය සඳහා දිනූෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ජාතක කථා සාහිත්‍යයේ අන්තර්ගත ලිංගික හා මනෝ විෂයීක වෘතාන්ත පිළිබඳ මනෝ විශ්ලේෂණවාදී විවරණයක් (තෝරාගත් ජාතක කථා කිහිපයක් ඇසුරෙන්)

වී.පී.එස්. සෙව්වන්දි
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20721@arts.pdn.ac.lk

සාහිත්‍යය යනු පුද්ගල චෛතසික විවරණය කෙරෙන ප්‍රබල සමාජීය හා සංස්කෘතික නිෂ්පාදනයකි. සාහිත්‍යයෙහි එන චරිත විශ්ලේෂණය කිරීමෙන් මනුෂ්‍ය චර්යාවලට පාදක වූ චෛතසික ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීමට වැදගත් වන න්‍යායක් ලෙස, 19වන සියවසේදී සිග්මන් ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ විශ්ලේෂණවාදය හඳුනාගත හැකිය. මෙහිදී අවිඥානය, පෞරුෂ ව්‍යූහය, මනෝ ලිංගික අවධි සහ ලිබිඩෝ වැනි සංකල්ප ඔස්සේ පුද්ගල චර්යාවන් විද්‍යාත්මකව අධ්‍යයනය කෙරේ. මෙම න්‍යාය සාහිත්‍යයට ප්‍රවේශ වීමත් සමඟ පුද්ගල චරිතවල සංකීර්ණ මනෝභාවයන් හා මනුෂ්‍ය ජීවිතයේ යථාර්ථය නිරූපණය කිරීමේ හැකියාව තීව්‍ර විය. මෙම පර්යේෂණයට පාදක වූ ජාතක කථා යනු කාල-දේශ භේදයකින් තොරව මානවයාට පොදු ධර්මතා විවරණය කෙරෙන සාර්වත්‍රික සාහිත්‍යයකි. උපදේශාත්මක ස්වරූපයෙන් රචිත ජාතක කථාවලදී මනුෂ්‍ය චෛතසිකවල ක්‍රියාකාරීත්වය මනෝ විෂයීක පදනමකින් යුතුව විග්‍රහ කර තිබේ. "ජාතක කථා සාහිත්‍යයේ අන්තර්ගත ලිංගික හා මනෝ විෂයීක වෘතාන්තවල පුද්ගල මනෝභාව, හැසිරීම් සහ පෞරුෂ සංවර්ධනය පිළිබඳ මනෝ විශ්ලේෂණවාදී න්‍යායෙන් විවරණය කළ හැකි වන්නේ කවර ආකාරයෙන්ද?" යන පර්යේෂණ ගැටලුව මත පදනම් වූ මෙම පර්යේෂණයේදී මනෝ විශ්ලේෂණවාදයේ මූලික තර්කයට අනුව පුද්ගල පෞරුෂයේ ව්‍යූහය හා පෞරුෂ වර්ධනයේ විෂමතා හේතුවෙන් පුදුගලයා අමුතු හැසිරීම්වලින් යුක්ත වන ආකාරයත්, ජාතක කථාවල ඇති ලිංගික හා මනෝ විෂයීක චරිත ඒ අනුව විවරණය කළ හැකි ආකාරයත් විශ්ලේෂණය කරන ලදි. මෙහිදී ගුණාත්මක ක්‍රමවේදය යටතේ දත්ත රැස් කිරීම සිදු කරනු ලැබූ අතර, මනුෂ්‍යයාගේ අසාමාන්‍ය ලිංගික හැසිරීම් නිරූපණය කෙරෙන ජාතක කථා මනෝ විශ්ලේෂණවාදයෙහි පෞරුෂ සංවර්ධන ප්‍රවේශය ඔස්සේ න්‍යායික විශ්ලේෂණයකට ලක් කෙරිණි. ඒ අනුව ජාතක කථාවල හමුවන අසාමාන්‍ය ලිංගික චර්යා (ලිංගික අපගාමීත්වය, ව්‍යභිචාරය, අතෘප්තිකර රාගය හා කාමුකත්ව හැඟීම්, කාම පරපීඩක හා කාම අත්තකිලිමථය) සහිත පුද්ගල චරිත මනෝ විශ්ලේෂණවාදී ප්‍රවේශයකින් විවරණය කිරීම සිදු කරන ලදි. එවැනි පුද්ගල චරිත ජාතක කථාවලට ඇතුළත් වන්නේ පුද්ගල මනෝභාව පැහැදිලි කිරීමේ අරමුණින් වන අතර ගැඹුරු, සංකීර්ණ මෙන්ම විෂම මනුෂ්‍ය චරිත ස්වභාව නිරූපණය කිරීමට ජාතක කථාකරුවා මනෝ විද්‍යාත්මක ප්‍රවේශයක් උපයෝගී කරගෙන ඇති බවද පුද්ගල අසාමාන්‍ය ලිංගික හැසිරීම් සඳහා පෞරුෂ සංවර්ධනයේ විෂමතා හේතු වන බවද තෝරාගත් ජාතක කථා න්‍යායික විශ්ලේෂණයට භාජනය කිරීමෙන් අනාවරණය කරගත හැකි විය.

ප්‍රමුඛ පද : අසාමාන්‍ය චර්යා, ජාතක කථා, පෞරුෂ ව්‍යූහය, මනෝ විශ්ලේෂණවාදය, ලිංගික අපගාමීත්වය

මෙම අධ්‍යයනය සඳහා දිනුෂ කාරියප්පෙරුමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

ප්‍රාථමික අවධියේ දරුවන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා ළමා කතා භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් සිංහල හා ඉංග්‍රීසි ළමා කෘති ඇසුරින්)

එච්.එම් අරුණි ශානිකා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20725@arts.pdn.ac.lk

සාහිත්‍යය යනු මානව අත්දැකීම් ප්‍රකාශ කරමින් පුද්ගල ආකල්ප සංවර්ධනය උදෙසා දායකත්වයක් සපයන කලා මාධ්‍යයකි. ප්‍රාථමික අවධියේ පසුවන දරුවන්ගේ පෞරුෂ හැඩගැස්ම නම්‍යශීලී බැවින් ළමා සාහිත්‍යය ඇසුරෙන් යහපත් සාරධර්ම හා ස්වයං අනන්‍යතාවක් නිර්මාණය කළ හැකිය. මෙම පසුබිම මත පදනම්ව එම වයස් කාණ්ඩයේ පසුවන දරුවන්ගේ පෞරුෂ වර්ධනය උදෙසා සිංහල සහ ඉංග්‍රීසි ළමා කෘති උපයෝගී කරගැනීම මනෝවිද්‍යාත්මක හා ශාස්ත්‍රීය පදනමකින් යුතුව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එහිදී "සිංහල සහ ඉංග්‍රීසි ළමා කතා දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා කවර ආකාරයක බලපෑමක් ඇති කරයිද?" යන්න පර්යේෂණ ගැටලුව ලෙස මතු කරගන්නා ලදී. ප්‍රාථමික අවධියේ පසුවන දරුවන්ගේ චිත්තවේග, සාරධර්ම, බුද්ධිමය, ගැටලු විසඳීම සහ තීරණ ගැනීම යන පෞරුෂ ලක්ෂණ සංවර්ධනය කෙරෙහි සිංහල හා ඉංග්‍රීසි ළමා කතන්දර දායක වේ යන්න මෙහි පර්යේෂණ උපන්‍යාසය විය. ළමා කෘතිවල අන්තර්ගත චරිත සහ සිදුවීම් මඟින් දරුවාගේ මෙම පෞරුෂ සාධක වර්ධනය වන ආකාරය හඳුනා ගැනීමත්, කතා රචකයන් ඒ සඳහා යොදාගන්නා උපක්‍රම අධ්‍යයනය කිරීමත් මෙහි උපඅරමුණු විය. වර්ෂ 2000 සිට 2020 දක්වා කාලය තුළ රචිත ළමා කෘතිවලට පමණක් සීමා වූ මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ පුස්තකාල හා අන්තර්ජාල මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. එමෙන්ම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්, ගුරුවරුන් හා දරුවන් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා ඇසුරින් දත්ත රැස්කොට විස්තරාත්මක විධික්‍රමය මඟින් විශ්ලේෂණය කෙරිණි. පර්යේෂණයේ අනාවරණවලට අනුව ළමා කෘතිවල අන්තර්ගත සරල චරිත නිරූපණ සහ කතා වින්‍යාසයන් දරුවාගේ චිත්තවේගීය සමතුලිතතාවට, සදාචාරාත්මක චින්තනයට මෙන්ම ගැටලු විසඳීමේ හැකියාවට හා බුද්ධිමය පෞරුෂ සංවර්ධනයට සෘජු බලපෑමක් ඇති කරන බව හඳුනාගැනුණි. එසේම සිංහල සහ ඉංග්‍රීසි ළමා සාහිත්‍යයෙහි පවතින උපදේශනාත්මක ගැටලු නිරූපණයන් දරුවාගේ තීරණ ගැනීමේ කුසලතා ඔප්නැංවීමට දායක වන බව නිරීක්ෂණය විය. ඒ අනුව ළමා සාහිත්‍යය යනු රසවින්දනයෙන් ඔබ්බට ගිය දරුවාගේ සමස්ත පෞරුෂ වර්ධනය උදෙසා ප්‍රාථමික අධ්‍යාපන පද්ධතියට විධිමත් ලෙස ඒකාබද්ධ කළ යුතු අත්‍යවශ්‍ය ප්‍රායෝගික මෙවලමක් බව හඳුනා ගැනීමට ලැබුණි. එමඟින් ප්‍රාථමික අවධියේ පසුවන දරුවන්ගේ සමස්ත පෞරුෂ සංවර්ධනය කෙරෙහි සිංහල හා ඉංග්‍රීසි ළමා කතා භාවිතය ධනාත්මකව බලපාන බව අවසාන වශයෙන් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද : පෞරුෂ සංවර්ධනය, ප්‍රාථමික අවධිය, විස්තරාත්මක විශ්ලේෂණය, ළමා සාහිත්‍යය

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුතිපූර්වකව සිහිපත් කරමි.

"රිදී විහාර අස්න" පුස්කොළ පොත සංස්කරණය සහ එහි භාෂා රීතිය පිළිබඳ අධ්‍යයනයක්

එච්. ජී. සී. ශෙහාන්
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20732@arts.pdn.ac.lk

සිංහල ලේඛන කලාවේ වැදගත් අංගයක් වශයෙන් පුස්කොළ පොත් ලේඛන කලාව දැක්විය හැකිය. දිගු ඉතිහාසයක් සහිත ව්‍යාඛ්‍යාන, සාහිත්‍යය, ආගමික, වෛද්‍ය, රාජ්‍ය ලේඛන කෘති පැවත එන්නේ පුස්කොළ ලේඛන මාධ්‍යයෙනි. දුටුගැමුණු රජු රුවන්වැලි සෑය කරවීම සඳහා අවශ්‍ය රිදී ලබාගත් ලෙනෙහි අංග සම්පූර්ණ විහාරයක් කරවා පූජා කිරීම "රිදී විහාර අස්න" පුස්කොළ පොතෙහි අන්තර්ගතය වේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ශාස්ත්‍රීය ග්‍රන්ථ සංස්කරණ ක්‍රමවේදය අනුව රිදී විහාර අස්න පුස්කොළ පොතෙහි මුල් පිටපතකට සමීප සංස්කරණයක් සිදු කිරීමයි. රිදී විහාර අස්න පුස්කොළ පොත සංස්කරණය කිරීමෙන් අනතුරුව කෘතියක් වශයෙන් ලේඛන සම්ප්‍රදායට එකතුවීම මෙම පර්යේෂණයේ වැදගත්කම වේ. සංස්කරණය සඳහා අවශ්‍ය පුස්කොළ පිටපත් හා මුද්‍රිත ග්‍රන්ථ පුස්තකාල මඟින් සපයාගෙන ග්‍රන්ථ සංස්කරණ ක්‍රමවේදය, පුස්කොළ ලේඛනය පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ පරිශීලනයෙන් තොරතුරු විශ්ලේෂණය කරමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය අනුගමනය කරන ලදි. රිදී විහාර අස්නෙහි භාෂා රීතිය කවරාකාරද? යන පර්යේෂණ ගැටලුව විය. මෙම පුස්කොළ පොත රචනා කිරීම සඳහා උපයුක්ත කරගත් භාෂා රීතිය සෙසු අස්න සාහිත්‍ය කෘතිවල ලක්ෂණ සමඟ සැසඳීමෙන් භාෂා රීතිය පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබීය. පුස්කොළ ලේඛන කලාව පිළිබඳ ව ප්‍රමාණවත් විවරණයක් සැපයීම හා පිටපත් පිළිබඳ තොරතුරු ඇතුළත් ප්‍රස්තාවනාව ද සමඟින් සංස්කරණය අස්න සිදු කර ඇත. සීමිත අස්න කෘති සංඛ්‍යාව අතර රිදී විහාර අස්න පුස්කොළ පොත වැදගත් වේ. ඓතිහාසික වටිනාකමක් සහිත රිදී විහාර පුදබිම කෙරෙහි ශ්‍රද්ධාව වර්ධනය පිණිස වර්ණනාත්මක හා සරල භාෂා ව්‍යවහාරයෙන් පුස්කොළ පොත රචනා කර තිබේ. පුස්කොළ පොත්වල අන්තර්ගත ව ඇති වැදගත් තොරතුරු වර්තමාන සමාජයට දායාද කිරීමටත් මේ සමඟ අවකාශ ලැබුණි.

ප්‍රමුඛ පද: පුස්කොළ පොත, භාෂා රීතිය, රිදී විහාර අස්න, සංස්කරණය

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සිංහල නවකතාවෙන් නිරූපිත ස්ත්‍රී චරිතයේ ලිංගිකත්ව මනෝභාවය පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක අධ්‍යයනයක් (තෝරාගත් නවකතා ඇසුරින්)

කේ.යූ. රුවිනි වාසනා
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20815@arts.pdn.ac.lk

මිනිස් මනසේ පවතින සංකීර්ණ මනෝභාව, චර්යා රටා හා අප්‍රකාශිත අවිඥානික ආශා නිරූපණයවන සාහිත්‍ය නිර්මාණ අතරින් නවකතාව ප්‍රබල මාධ්‍යයකි. එම සන්දර්භයෙහි පිහිටා සිංහල නවකතාවෙන් නිරූපිත ස්ත්‍රී චරිතයේ ලිංගිකත්ව මනෝභාවය පිළිබඳ මනෝවිශ්ලේෂණාත්මක අධ්‍යයනයක් යන මාතෘකාව පිළිබඳ මෙම පර්යේෂණයෙන් කරුණු අධ්‍යයනය කර තිබේ. එහිදී ස්ත්‍රියගේ අප්‍රකාශිත අවිඥානිකත්වයේ ලිංගික ක්‍රියාත්මක වීම හා එහි සාහිත්‍යමය නිරූපණය මනෝවිශ්ලේෂණාත්මක ආකෘතියක් ඔස්සේ සිංහල නවකතාවෙන් ප්‍රකට වන්නේ කෙසේද යන ගැටලුව ගවේෂණය කරනු ලැබිණි. එම ගැටලුව විසඳා ගැනීම සඳහා ගුණාත්මක ක්‍රමවේදය යොදා ගැනුණු අතර පුස්තකාල පරිශීලනය හා අන්තර්ජාල පරිශීලනය යටතේ ප්‍රාථමික, ද්විතීක, තෘතීයක මූලාශ්‍රය දත්ත රැස්කර දත්ත විස්තරාත්මක ක්‍රමය ඔස්සේ විශ්ලේෂණය සිදු කෙරිණි. සිග්මන් ෆ්‍රොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ න්‍යාය කෙරෙහි අවධානය යොමු කරමින් එකී විග්‍රහයට අනුව සිංහල නවකතාවෙන් නිරූපිත ස්ත්‍රී චරිතයේ මනෝභාවය ඔස්සේ මතුවන ලිංගිකත්වය මනෝවිශ්ලේෂණාත්මක ආකෘතියක් මගින් විශ්ලේෂණය කිරීම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර ස්ත්‍රී චරිතවල අභ්‍යන්තර ආවේග, තහනම් වූ ආශා, මනෝ විරෝධතා විමර්ශනය කිරීම, නවකතාවේ ආඛ්‍යානයට ලිංගිකත්වය පදනම් වූ තේමා ඇතුළත් වීමෙන් එතෙක් පැවති නවකතාවලට වඩා සාපේක්ෂව නවකතාකරුවන්ගේ ස්ත්‍රී ලිංගිකත්වය පිළිබඳ පුළුල් මනෝවිද්‍යාත්මක අවබෝධය තක්සේරු කිරීමත්, ලිංගිකත්වය හා සමාජ අධිකාරීත්වය අතර සම්බන්ධය විමර්ශනය කිරීම ආදිය අනු අරමුණු විය. ස්ත්‍රීන්ගේ මානසික සිතුවිලි හා ශාරීරික හැසිරීමේ අන්තර් සබඳතාව සමාජ සම්මත හමුවේ අවරෝධනය කිරීම හේතුවෙන් පැන නගින මානසික ගැටුම්, අනියම් සබඳතා, එහි සාහිත්‍යමය හා සමාජීය නිරූපණය පිළිබඳ මෙහිදී මනෝවිශ්ලේෂණාත්මකව විමර්ශනය කෙරේ. ස්ත්‍රියකගේ අප්‍රකාශිත අවිඥානික ලිංගික චේතනා මනෝවිශ්ලේෂණාත්මකව ආරක්ෂණ යාන්ත්‍රණ ඔස්සේ ප්‍රකාශයට පත්වන ආකාරයද අධ්‍යයනය කරයි. නූතන නවකතාකරුවන් ස්ත්‍රී ලිංගිකත්වය පිළිබඳ පුළුල් මනෝවිද්‍යාත්මක අවබෝධයකින් යුතුව චරිත නිර්මාණය කර ඇති බවත් අනාවරණය කරගත හැකිය. ස්ත්‍රී ලිංගිකත්ව ප්‍රකාශනය සදාචාරාත්මක රාමුවකට පමණක් සීමා කළ හැකි වූවක් නොව, එය ගැඹුරු මනෝවිද්‍යාත්මක ක්‍රියාකාරීත්වයකින් හා සමාජීය පීඩනයන්ගේ ප්‍රතිඵලයක් ලෙස නිරූපණය වන බව නවකතා ආශ්‍රයෙන් සිදු කරන දත්ත විශ්ලේෂණය ඔස්සේ නිගමනයකට එළඹිය හැකිය.

ප්‍රමුඛ පද: අවිඥානිකත්වය, මනෝවිශ්ලේෂණය, සිංහල නවකතාව, ස්ත්‍රිය, ලිංගිකත්ව මනෝභාවය

මෙම අධ්‍යයනය සඳහා ලියනගේ අමරකීර්තිගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ස්ත්‍රිය පිළිබඳ අදහස් ප්‍රකාශනයේ දී සීගිරි කවියාගේ භාෂා භාවිතය පිළිබඳ අධ්‍යයනයක් (තෝරාගත් සීගිරි පද්‍ය ඇසුරෙන්)

ඩබ්.එම්.බී.එන්.කේ. වීරසේකර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20823@arts.pdn.ac.lk

සිංහල සාහිත්‍ය ඉතිහාසයේ සීගිරි කුරුටු ගී සුවිශේෂ ස්ථානයක් හිමිකර ගන්නා කාව්‍ය සම්ප්‍රදායක් ලෙස සැලකේ. ක්‍රි.ව. 8 - 10 සියවස් අතර කාල පරාසයකට අයත් බවට විද්වත් මත පවතින මෙම ගී සමුදාය සිංහල පද්‍ය සාහිත්‍යයේ ආරම්භක අවධිය නියෝජනය කරන්නකි. සීගිරි ගී බොහොමයක ප්‍රධාන තේමාව බවට පත් වී ඇත්තේ සීගිරි පර්වත බිත්තියේ ඇඳ ඇති ලලනා රූපය. ඒ අනුව මෙකී කාව්‍ය නිර්මාණවලින් ස්ත්‍රිය පිළිබඳ සීගිරි කවියාගේ අදහස් විද්‍යමාන වී තිබේ. මූලික වශයෙන් සීගිරි කවියා ස්ත්‍රිය පිළිබඳ අදහස් ප්‍රකාශනයට භාෂාව භාවිත කර ඇති ආකාරය සම්බන්ධ ව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කර ඇත. සීගිරි පද්‍යවලදී විවිධ අංශ යටතේ ස්ත්‍රිය පිළිබඳ අදහස් ප්‍රකාශනයට භාෂාව භාවිත කර ඇති ආකාරය පිළිබඳ ව විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණ විය. ස්ත්‍රිය පිළිබඳ අදහස් ප්‍රකාශනයේ දී සීගිරි කවියා භාෂා භාවිතය සිදුකර ඇත්තේ කවරාකාරයෙන්ද? යන පර්යේෂණ ගැටලුව ඔස්සේ සිදු කෙරුණු මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික හා ද්විතීයක මූලාශ්‍රය භාවිත කරමින් ගුණාත්මක පර්යේෂණ ක්‍රමය ඔස්සේ දත්ත රැස් කර ගන්නා ලදි. මෙහිදී රැස් කර ගන්නා ලද තොරතුරුවලින් අනාවරණය වූයේ ස්ත්‍රිය නිරූපණයේ දී සීගිරි කවියා දීර්ඝ වර්ණනා ශෛලියකින් බැහැර වී ඇති අතර රූපකාර්ථකරණය සහ සංකේතීකරණය මූලික කරගත් සංක්ෂිප්ත භාෂා භාවිතයක් සිදු කර ඇති බවයි. එනම් සීමිත වචන මාලාවකින් උපරිම අර්ථ ධ්වනිත කරන රූපක හා සංකේත භාවිතයට මුල් තැන දී ඇති බව පැහැදිලි වේ. තවද ස්ත්‍රිය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමේ දී ගිහි කවීන්ගේ සහ පැවිදි කවීන්ගේ ආකල්පමය ප්‍රවේශයන් අතර පෘථුල වෙනසක් දක්නට නොලැබුණ ද ගිහි කවීන්ට සාපේක්ෂ ව පැවිදි කවීන් ස්ත්‍රී රූපය සහ තමන් ලැබූ චිත්ත ආකර්ෂණය ගීයට නැගීමේ දී සංයමයකින් යුක්ත ව භාෂාව හසුරුවා ඇති බව අනාවරණය වේ.

ප්‍රමුඛ පද: වර්ණනාත්මක භාෂාව, සීගිරි කවියා, සීගිරි කුරුටු ගී, සීගිරි ගී භාෂාව, ස්ත්‍රී නිරූපණය

මෙම අධ්‍යයනය සඳහා දිලිනි ආරියවංශගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

භික්ෂුණී ශාසනයේ ලාංකේය මුහුණුවර : අද්‍යතන භික්ෂුණී ශාසනය හා දසසිල් මාතාවන්ගේ ජීවන රටාව මඟින් හෙළි වන භික්ෂුණී සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරා ගත් මෙහෙණි ආශ්‍රම කිහිපයක් ඇසුරෙන් සිදු කරන අධ්‍යයනයකි)

ඩබ්.එම්.එස්.එස්.කේ වීරසේකර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20824@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය සංස්කෘතිය මූලික වශයෙන් ම ගොඩ නැඟී ඇත්තේ බුදු දහම පදනම් කොට ගත් සන්දර්භයක් මත ය. මෙම සංස්කෘතියේ දී ස්ත්‍රියට හිමි වනුයේ සුවිශේෂ වූ වැදගත් ස්ථානයකි. මෙකී ස්ත්‍රියගේ පූර්ණ ආගමික ජීවිතය නිරූපණය කරන ශාසනික පද්ධතිය 'භික්ෂුණී ශාසනය' වශයෙන් හඳුන්වනු ලබයි. ඒ අනුව, මූලික වශයෙන් ලාංකේය භික්ෂුණී ශාසනය, දසසිල් මාතාවන් හා ඔවුන්ගේ ජීවන රටා පිළිබඳ ව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කර ඇත. මෙහිදී අද්‍යතන දසසිල් මාතාවන්ගේ හා භික්ෂුණීන්ගේ ජීවන රටා අධ්‍යයනය කරමින් නූතන භික්ෂුණී ශාසනය, සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය. ලාංකේය භික්ෂුණී ශාසනය හා අද්‍යතන දසසිල් මාතාවන්ගේ ජීවන රටාව මඟින් පිළිබිඹු වන භික්ෂුණී සංස්කෘතිය කවරාකාර වේද යන පර්යේෂණ ගැටලුව ඔස්සේ සිදු කෙරුණු මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික, ද්විතීයක හා විද්‍යුත් මූලාශ්‍රය භාවිත කරමින් ගුණාත්මක පර්යේෂණ ඔස්සේ දත්ත රැස් කර ගන්නා ලදි. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස සම්මුඛ සාකච්ඡා, සහභාගීත්ව නිරීක්ෂණ යනාදිය යොදා ගත් අතර ද්විතීයක මූලාශ්‍රය ලෙස පුස්තකාල පොත්පත්, සඟරා සහ අන්තර්ජාලය ආදිය භාවිත කෙරිණි. මෙසේ රැස් කරන ලද තොරතුරු මඟින් අනාවරණය වූයේ අද්‍යතන භික්ෂුණී සංස්කෘතිය අධ්‍යාපනික හා සමාජීය වශයෙන් ප්‍රගතිශීලීව පරිවර්තනය වී ඇති නමුත් ආයතනික පිළිගැනීම, ආර්ථික ස්ථාවරත්වය, සමාජීය සම්මානනය යනාදිය පිළිබඳ ගැටලු තවදුරටත් පවතින බවයි. එමනිසා අද්‍යතන භික්ෂුණී සංස්කෘතිය තවදුරටත් අභියෝගයන්ට ලක්ව පවතින සංස්කෘතික සම්ප්‍රදායක් බව අනාවරණය විය. ඒ අනුව මෙම පර්යේෂණයේ දී දසසිල් මාතා සහ භික්ෂුණී යනුවෙන් විභේදනය වී ඇති භික්ෂුණී ශාසනයේ අද්‍යතන ස්වරූපය හඳුනා ගත හැකි වූ අතර බාධක රැසක් මධ්‍යයේ වුව ද තම ශාසනික සංඝ පද්ධතිය පවත්වා ගනිමින් ඉදිරියට ගමන් කරන පිරිසක් ලෙස අද්‍යතන භික්ෂුණී සමාජය ක්‍රියා කරන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද: දසසිල් මාතාව, නූතන ආකෘතිය, භික්ෂුණී ශාසනය, සංස්කෘතිය

මෙම අධ්‍යයනය සඳහා චාමිණී ගුරුගේගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නාට්‍ය පඨිත පරිවර්තනය සහ ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය : අභියෝග සහ ගැටලු පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

ඩබ්. එම්. එස්. කේ. වීරසුන්දර
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20827@arts.pdn.ac.lk

නාට්‍ය යනු, ලිඛිත පඨිතයකට සීමා නොවන සජීවී, සෞන්දර්යාත්මක, කලා ශානරයකි. පරිවර්තනය යනු, එක් භාෂා ස්වරූපයකින් පවතින අන්තර්ගතයක්, වෙනත් භාෂා ස්වරූපයකින් දැක්වීම වන අතර, භාෂාන්තර පරිවර්තනයේදී භාෂාව සහ සංස්කෘතිය ප්‍රමුඛව අභියෝග ඇති වේ. නාට්‍ය පරිවර්තනයේදී ඒවා තීව්‍ර වන්නේ, එහි සුවිශේෂත්වය නිසාය. මෙම අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට ෆර්ඩිනන්ඩ් ඩී. සොසුයියෝ හඳුන්වා දුන් ව්‍යූහවාදී න්‍යායික සංකල්ප යොදා ගැනීම පිළිබඳව මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කෙරිණ. සොසුයියෝගේ ව්‍යූහවාදී විග්‍රහය, නාට්‍ය පරිවර්තනයේ භාෂාත්මක/ සංස්කෘතික අභියෝග සඳහා විසඳුම් සෙවීමට යොදා ගන්නා බැවින් එය 'ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය' ලෙස නම් කෙරිණ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික මූලාශ්‍රය ලෙස, පැරණි හා නූතන සිංහල පරිවර්තිත නාට්‍ය සහ විශ්වවිද්‍යාලවලින් පරිවර්තිත නාට්‍ය අතරින් තෝරා ගත් නාට්‍ය නිෂ්පාදන කිහිපයක් යොදා ගැනුණි. යම් මූල භාෂාවකින් රචිත නාට්‍යයක්, ඉලක්ක භාෂා ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීමේදී, ඇති වන භාෂාත්මක සහ සංස්කෘතික අභියෝග සඳහා ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය යොදා ගත හැකි ආකාරය පර්යේෂණාත්මකව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ විය. එම අභියෝග සඳහා ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය ඔස්සේ විසඳුම් ලබා ගත හැක්කේ කවරාකාරයෙන්ද යන පර්යේෂණ ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කෙරුණු අතර, ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ පුස්තකාලය හා අන්තර්ජාලය පරිශීලනය, සෘජු නිරීක්ෂණ, සහභාගීත්ව නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරමින්, විස්තරාත්මක සහ තුලනාත්මක විධික්‍රම ඔස්සේ දත්ත විශ්ලේෂණය කරන ලදි. නාට්‍ය පරිවර්තනයේදී ඇති වන අභියෝග භාෂාත්මක, සංස්කෘතික සහ වෙනත් වශයෙන් වර්ගීකරණය කරමින්, තෝරා ගත් නාට්‍ය පඨිත ඔස්සේ අධ්‍යයනය කෙරුණු අතර, සංඥාකාරකය සහ සංඥාකෘතය අතර සබඳතාව පවත්වා ගැනීම, අර්ථමය කාර්යය, නිර්මාණාත්මක සන්නිවේදනය, සංඥාමය දෘෂ්ටිවාද ක්‍රියාකාරීත්වය යනාදිය භාෂාත්මක අභියෝග ලෙසත්, සංස්කෘතික ඝට්ටනය, හිතුමතය, ආගන්තුකභාවය, ස්වාභාවිකකරණය යනාදිය සංස්කෘතික අභියෝග ලෙසත් පර්යේෂණයේදී අනාවරණය විය. එම අභියෝග සඳහා ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය ඔස්සේ නැවත ලිවීම, ව්‍යූහමය විසංයෝජනය, භාෂාභ්‍යන්තර ප්‍රතිපරිවර්තනය, ඉලක්ක භාෂාව පෙරබිමට කැඳවීම, නිර්වාග්මය සංඥා භාවිතය, නාට්‍ය අනුවර්තනය සහ නාට්‍ය කේන්ද්‍රීය ගවේෂණය විසඳුම් වශයෙන් සොයාගැනිණ. ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය, නාට්‍ය පරිවර්තන අභියෝග සඳහා ඍජු විසඳුමක් නොවුණත්, එය අදාළ අභියෝග හඳුනා ගැනීමටත්, එම අභියෝග සඳහා වඩාත් සුදුසු විසඳුම් තීරණය කිරීමටත්, තුන්වන පාර්ශ්වීය න්‍යායික සංකල්පයක් ලෙස යොදාගත හැකි බව පර්යේෂණයෙන් නිගමනය විය.

ප්‍රමුඛ පද : නාට්‍ය අනුවර්තනය, නාට්‍ය පරිවර්තනය, පරිවර්තන අභියෝග, ව්‍යූහවාදී සංස්කෘතික ප්‍රවේශය

මෙම අධ්‍යයනය සඳහා සුනිල් වික්‍රමසිංහගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

භාෂාව සාක්ෂ්‍යයක් ලෙස : අපරාධ සම්බන්ධ ලිපි ලේඛනවලින් ප්‍රකට වන සමාජ තොරතුරු සහ මනෝභාව පිළිබඳ අධ්‍යයනයක් (තංගල්ල පොලිස් කොට්ඨාසය ඇසුරෙන්)

ජී.ටී.ටී. විජේපාල
සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20849@arts.pdn.ac.lk

ලෝකයේ බොහෝ රටවල නාගරික ප්‍රදේශ ආශ්‍රිතව වීදි දරුවන් බිහිවීම සමාජ ප්‍රශ්නයක් බවට පත් වී තිබේ. ශ්‍රී ලංකාවේ ද මෙම ගැටලුව ළමුන් හා සම්බන්ධ ගැටලු අතර ප්‍රධාන කරුණක් වන අතර ලංකාවේ ළමා ජනගහනයෙන් සැලකිය කොටසක් වීදි දරුවන් ලෙස හඳුනාගත හැකි වීම මෙයට හේතු වී තිබේ. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ වීදි දරුවන් වීදියේ සිටි කාලයේ අධ්‍යාපනය ලබා ගැනීමට බාධා පැමිණ වූ සමාජීය හා ආර්ථික සාධක මොනවාද යන්න විමසා බැලීමයි. ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශය යටතේ අධ්‍යයනය සිදු කළ අතර සිද්ධි අධ්‍යයනයක් මඟින් දත්ත රැස් කරන ලදි. වයස අවුරුදු 10ත් 12ත් අතර පසුවන වීදිගතව සිට ආයතනගත වූ දරුවන් 10 දෙනෙකුගෙන් යුත් නියදියක් මෙහි දී භාවිත කරන අතර අධ්‍යයනය ක්ෂේත්‍රය ගම්පහ දිස්ත්‍රික්කයේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පහකින් සමන්විත වේ. මෙම අධ්‍යයනයේ දත්ත මඟින් තහවුරු වන ප්‍රධාන කරුණක් වන්නේ වීදි දරුවන් දෙමාපිය භාරකරුවන්ගේ අවධානයට හසු නොවූ පිරිසක් වන බවයි. මෙම දරුවන් වීදි දරුවන් වීම සඳහා හේතුවන ප්‍රධානතම කරුණක් ලෙස මෙම තත්ත්වය පෙන්වාදිය හැකිය. අධ්‍යයනය මඟින් තහවුරු වන අනිත් කරුණ වන්නේ ඉහත තත්ත්වය නිසාම මෙම දරුවන් සිඟාකෑම, අනතුරුදායක වැඩ පරිසරවල ළමා ශ්‍රමිකයන් ලෙස කටයුතු කිරීම විශේෂයෙන් ම මත්ද්‍රව්‍ය අලෙවිය සහ ප්‍රවාහනය සිදු කළ පිරිසක් ලෙස කටයුතු කරන බවයි. ළමා සංවර්ධනය පිළිබඳ න්‍යායන් ඉදිරිපත් කරන ලද ෆ්‍රොයිඩ්ට (1952) අනුව, දෙමාපිය අධීක්ෂණය හරහා අධ්‍යාපනික වටිනාකම් හා විනය අභ්‍යන්තරීකරණය වන බවත් පියාජේට (1977) අනුව, දෙමාපියන්ගේ අන්තර්ක්‍රියා හරහා දරුවන්ගේ පෞරුෂය ගොඩනැගෙනු ඇත. කෙසේ වෙතත් වීදි දරුවන් පවුල් සංස්ථාව සමඟ කිසිම සම්බන්ධතාවය නොමැති වීම හා ඒ සඳහා ඉඩක් නොමැති වීම දරුවන්ගේ අධ්‍යාපන අයිතිය පමණක් නොව ඒ සඳහා ඇති ඉඩකඩ සම්පූර්ණයෙන්ම අහිමි වීමක් සිදු වන බව අධ්‍යයනය මඟින් තහවුරු විය. ගුරුවරුන්, සමවයස් මිතුරන් විසින් වීදි දරුවන් ලෙස වෙන්කොට සැලකීම මෙම දරුවන්ගේ අධ්‍යාපනයේ කිසිදු ප්‍රගතියක් නොවීම සහ ඔවුන් පාසල තුළින් බැහැරවීම ඇති කරන බවට අධ්‍යයනය හරහා අනාවරණය විය. ඒ අනුව මෙම අධ්‍යයනයෙන් තහවුරු වී ඇත්තේ දෙමාපිය හෝ වැඩිහිටි භාරකරුවෙකුගේ අධීක්ෂණය නොලැබීම, සමාජ සම්බන්ධතාවයන්ගෙන් දූරස්ථ වීම වීදි දරුවන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් අහිමිවීමට සෘජුවම බලපා ඇති බවයි.

ප්‍රමුඛ පද: අධ්‍යාපන අයිතිවාසිකම්, වීදි දරුවන්, ළමා රැකවරණය.

මෙම අධ්‍යයනය සඳහා කුමාරි තෝරදෙණියගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මහනුවර නගරයේ එළිමහන් රැකියාවල නිරතවන ප්‍රජාව මුහුණපාන පාරිසරික සෞඛ්‍ය ගැටලු

ජී.ඒ.ඩී.එස්. දේශානි
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20128@arts.pdn.ac.lk

මහනුවර නගරයේ වායු දූෂණය ඉහළ යාම හේතුවෙන් බලපෑම් ඇති වී තිබෙන බව හඳුනාගෙන තිබේ. බොහෝ පර්යේෂණ ළමුන් සහ වැඩිහිටියන් කේන්ද්‍ර කරගෙන තිබුණ ද නගරයේ දෛනිකව එළිමහන් රැකියාවල නිරතවන ප්‍රජාව මුහුණදෙන සෞඛ්‍ය අවදානම පිළිබඳ පවතින්නේ අවම අවධානයකි. මෙම පර්යේෂණයේ හිඩැස පූරණය කරමින් එළිමහන් රැකියාවල නිරතවන ප්‍රජාව මුහුණපාන පාරිසරික සෞඛ්‍ය ගැටලු සඳහා විසඳුම් යෝජනා කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ගුණාත්මක ක්‍රමවේදය යටතේ රියදුරන්, රථ වාහන අංශයේ පොලිස් නිලධාරීන්, වෙළෙන්දන් සහ නගර පිරිසිදු කරන ප්‍රජාව ඇතුළත් වන පරිදි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන් ම පුද්ගලයන් 40 දෙනෙකුගෙන් යුත් නියැදියක් තෝරාගෙන අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ නාභිගත කණ්ඩායම් සාකච්ඡා ඔස්සේ දත්ත රැස් කරන ලදි. තවද ප්‍රධාන පොලිස් නිලධාරීවරයෙක් සහ විශේෂඥ වෛද්‍යවරියක් සමඟ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා දෙකක් කරන ලදි. පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීම්වලට අනුව අධික වාහන දුම් හේතුවෙන් මෙම ප්‍රජාව අතර ශ්වසන ආබාධ සහ ඇස් පෙනීමේ දුර්වලතා බහුලව ව්‍යාප්ත වී ඇති බව පෙනී යයි. එමෙන්ම දැඩි හිරු රශ්මිය නිසා අධික ලෙස දහඩිය දැමීම හේතුවෙන් වකුගඩු රෝග අවදානමක්ද පවතින අතර මෙම බලපෑම රැකියා අනුව වෙනස් වෙයි. වර්ෂා කාලවලදී ඇතිවන අධික සීතල නිසා සෙම් රෝග බහුල වී තිබේ. මෙම ප්‍රජාවට නිරන්තරයෙන් වැළඳෙන රෝගාබාධ සඳහා ඖෂධ ගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවී ඇත. මෙම අධ්‍යයනය මඟින් නාගරික එළිමහන් සේවකයන්ගේ වෘත්තීයමය සෞඛ්‍ය සුරක්ෂිතතාව තහවුරු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන අතර, ඔවුන් මුහුණදෙන පාරිසරික තර්ජන අවම කිරීම සඳහා ප්‍රතිපත්තිමය සහ ප්‍රායෝගික විසඳුම් සම්පාදනය කිරීම සඳහා සුවිශේෂ දායකත්වයක් සපයයි. එබැවින් මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කරගත් කරුණු මහනුවර නගරයේ සැලසුම්කරුවන්ට මෙන්ම සෞඛ්‍ය බලධාරීන්ටද ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මඟපෙන්වීමක් සපයනු ඇත. තවද, නාගරික ශ්‍රමිකයන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම උදෙසා වඩාත් තිරසාර පාරිසරික කළමනාකරණ වැඩපිළිවෙළක ඇති අවශ්‍යතාව මෙම පර්යේෂණයෙන් අවධාරණය වෙයි.

ප්‍රමුඛ පද: දේශගුණික විපර්යාස, පාරිසරික සෞඛ්‍ය, වායු දූෂණය, වෘත්තීයමය සෞඛ්‍ය, සෞඛ්‍ය අවදානම

මෙම අධ්‍යයනය සඳහා දිනුෂිකා යාපා අබේවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වෙරළාශ්‍රිත දරුවන් පාසල් හැරයාම සඳහා බලපාන සාධක: දෙහිවල වෙරළාශ්‍රිත මල්වත්ත ග්‍රාමසේවා වසම ඇසුරෙන්

ටී.වී.ආර්. දෙවන්මිණි
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20132@arts.pdn.ac.lk

පාසල් හැරයාම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂෙත්‍රය මුහුණ දෙන ප්‍රධාන සමාජ ගැටලුවක් වන අතර එය දරුවන්ගේ අධ්‍යාපනික, සමාජීය සහ ආර්ථික අනාගතයට අහිතකර බලපෑම් ඇති කරයි. විශේෂයෙන් වෙරළාශ්‍රිත ප්‍රදේශවල ජීවත්වන දරුවන් අතර පාසල් හැරයාමේ ප්‍රවණතාව වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර, ඒ සඳහා බලපාන සමාජීය සාධක පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමේ අවශ්‍යතාව පවතී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ දෙහිවල වෙරළාශ්‍රිත ප්‍රදේශයේ දරුවන් පාසල් හැරයාමට බලපාන සමාජීය සාධක හඳුනාගෙන ඒවා සමාජ විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමයි. ඒ සඳහා ආර්ථික අපහසුතා, පවුල් හා සමාජ සාධක, පාරිසරික හා භූගෝලීය සාධක, දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම සහ සංස්කෘතික බලපෑම් දරුවන්ගේ පාසල් හැරයාමට කෙසේ බලපාන්නේද යන්න විමර්ශනය කරන ලදි. මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශය භාවිත කරන ලදි. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා දෙමාපියන්, විදුහල්පතිවරුන් සහ ග්‍රාම නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතර පාසල් හැරගිය දරුවන් සහ ගුරුවරුන් සමඟ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා සිදු කරන ලදි. ද්විතීයික දත්ත ලෙස ග්‍රාම නිලධාරී වාර්තා, පාසල් පැමිණීමේ වාර්තා සහ අදාළ පර්යේෂණ ලිපි භාවිත කරන ලදි. දත්ත තේමාත්මක විශ්ලේෂණය මඟින් විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණයෙන් අනාවරණය වූයේ ආර්ථික අපහසුතා දරුවන් පාසල් හැරයාමට බලපාන ප්‍රධානතම සාධකය බවයි. අඩු පවුල් ආදායම, ජීවන වියදම් ඉහළ යාම සහ දරුවන්ගේ ශ්‍රමයට යොමුවීම පාසල් හැරයාමට හේතු වී ඇත. තවද පවුල් අස්ථාවරතාව, තනි මාපිය පවුල්, අඩු දෙමාපිය අධීක්ෂණය සහ අහිතකර මිතුරු බලපෑම් ද වැදගත් සාධක ලෙස හඳුනාගත හැකි විය. එමෙන්ම වෙරළාශ්‍රිත ප්‍රදේශයේ පවතින රැකියා අවස්ථා, ප්‍රවාහන ගැටලු, දෙමාපියන්ගේ අඩු අධ්‍යාපන මට්ටම සහ අධ්‍යාපනයට අඩු වටිනාකමක් ලබාදෙන සංස්කෘතික ආකල්ප ද පාසල් හැරයාමට බලපාන බව අනාවරණය විය. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූයේ පාසල් හැරයාම පුද්ගලික ගැටලුවක් නොව ආර්ථික, පවුල්, සමාජ, පාරිසරික සහ සංස්කෘතික සාධකවල අනන්‍ය සම්බන්ධතාවයෙන් නිර්මාණය වන බහුමාන සමාජ සංසිද්ධියක් බවයි. ජේම්ස් කෝල්මන්ගේ සමාජ ප්‍රාග්ධන න්‍යායට අනුව පවුල, පාසල සහ ප්‍රජාව අතර පවතින සමාජ සබඳතා දුර්වල වීම පාසල් හැරයාමේ අවදානම වැඩි කරන බව තහවුරු විය. එබැවින් පාසල් හැරයාම අවම කිරීම සඳහා පවුල්, පාසල්, ප්‍රජාව සහ රාජ්‍ය ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක වන වැඩසටහන් අවශ්‍ය බව නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: ආර්ථික අපහසුතා, පවුල් බලපෑම්, පාසල් හැරයාම, සමාජ ප්‍රාග්ධන න්‍යාය, සමාජීය සාධක, සංස්කෘතික බලපෑම්, වෙරළාශ්‍රිත ප්‍රදේශය

මෙම අධ්‍යයනය සඳහා ඒ.කේ.ඒ.එස්. ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

රජයේ විශ්වවිද්‍යාලවලට පිරිමි සිසුන්ගේ අඩු ප්‍රවේශයක් පැවතීමට බලපාන කරුණු පිළිබඳ අධ්‍යයනයක්

අයි.ජී.එල්.එන්. හේමසිරි
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20229@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්තමානය වන විට හඳුනාගත හැකි ප්‍රබල ප්‍රවණතාවක් වශයෙන් අධ්‍යාපනය ස්ත්‍රීකරණය වීම එසේත් නැතිනම් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය ඉහළ මට්ටමක පැවතීම හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණය යටතේ මෙකී ප්‍රවණතාව ඔස්සේ හඳුනාගත හැකි මෙරට විශ්වවිද්‍යාල පද්ධතියේ පිරිමි සිසුන්ගේ අඩු ප්‍රවේශයට බලපෑම් කරනු ලබන හේතු කාරණා කලා විෂය ධාරාව යටතේ අධ්‍යයනය කිරීම සිදුවේ. ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව අධ්‍යාපන කොට්ඨාසයේ පාසල් තුනක් ඇසුරින් උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන පිරිමි සිසුන් දහ දෙනෙකුගෙන් ගුරුවරුන් හය දෙනෙකුගෙන් ද යුක්ත 16ක නියැදියක් අහඹු නියැදීම යටතේ තෝරා ගනිමින්, ඔවුන් සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡාන් ඔස්සේ ලබාගත් දත්ත තේමාකරණ විශ්ලේෂණය යටතේ විශ්ලේෂණයට ලක් කිරීමට කටයුතු කරනු ලැබීය. මෙම පර්යේෂණය සඳහා සහභාගී වූවන් දක්වන ලද අදහස් දෙස අවධානය යොමු කිරීමේ දී වර්තමාන ආර්ථිකය යටතේ ගොඩනැගී ඇති තත්ත්වයන්, විශේෂයෙන් ම පවුලේ ආර්ථික අවශ්‍යතාවන්, තම ආර්ථික ස්වාධීනත්වයන් අපේක්ෂා කිරීම මත පදනම්ව කඩිනම් රැකියා අවස්ථා සෙවීමේ උවමනාවක් පිරිමි සිසුන් තුළ ගොඩනැගෙමින් පවතින බව හඳුනාගැනීමට හැකියාව ලැබිණි. එසේ ම පිරිමි සිසුන් වටා සිටින සමාජය හරහා ඔවුන්ගේ අධ්‍යාපනික තීරණ සඳහා සැලකිය යුතු බලපෑමක් සිදුකරන අතර, එම බලපෑම ඔවුන්ගේ අඩු විශ්වවිද්‍යාල ප්‍රවේශය කෙරෙහි බලපෑම් සහගත වන බව පැහැදිලිය. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධ ආදර්ශ සීමා සහිත වීම, ගුරුවරුන් සහ පවුලේ සාමාජිකයන් යටතේ අඩු අධ්‍යාපනික යොමු කිරීමක් සහ අඩු අවධානයක් යොමු වීම වැනි තත්ත්වයන් යටතේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැඳීමේ අඩු ප්‍රවණතාවක් හඳුනාගත හැකි ය. මෙය ඔවුන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සීමා කිරීමට හේතු සාධක වේ. තවද වර්තමානය වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනයත් කලා උපාධියත් සම්බන්ධයෙන් සමාජයේ නිර්මාණය වී ඇති සෘණාත්මක ආකල්ප මේ කෙරෙහි බලපෑම් කරනු ලබන බව පැහැදිලිය. උපාධිධාරී විරැකියාව, කලා විෂය ධාරාව යටතේ රැකියා වෙළඳපොළට අදාළ වෘත්තීය සුදුසුකම් සැපිරීම අඩු වශයෙන් සිදුවීම ප්‍රමුඛ කරුණු ලෙස දැක්විය හැකිය. මෙකී සියලු කාරණාවන් හේතු සාධක වෙමින් පිරිමි සිසුන්ගේ අධ්‍යාපනික උනන්දුව පහත බසින් අධ්‍යාපනික නියැලීම අඩු කිරීමක් සිදුවන බව පැහැදිලිය. එසේ ම අධ්‍යාපනික ක්‍රමයේ පවතින පිරිමි සිසුන් අධ්‍යාපනයෙන් දුරස් කිරීමට අදාළ තත්ත්ව යටතේ මෙකී අධ්‍යාපනික නියැලීම පහත බැසීමක් සිදුවන බවත් ඒ යටතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය අඩු වන බවත් පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද: අධ්‍යාපනය ස්ත්‍රීකරණය, කලා විෂය ධාරාව, පිරිමි සිසුන්, රජයේ විශ්වවිද්‍යාල

මෙම අධ්‍යයනය සඳහා ධම්මික හෙරත්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ළමා රැඳවුම් නිවාසවල සිදුවන පුනරුත්ථාපන ක්‍රියාවලියේ පවතින ගැටලු පිළිබඳ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක් : මධ්‍යම පළාතේ ඒරවලවත්ත ළමා රැඳවුම් මධ්‍යස්ථානය ආශ්‍රයෙන්

ටී.ඩබ්.ජී.ඩී. ඉමාෂා
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20250@arts.pdn.ac.lk

සමාජගත කිරීම සඳහා විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් පැවතීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා සංස්කෘතියේ ළමා රැඳවුම් නිවාසවල පවතින ව්‍යුහාත්මක සහ ආයතනික ගැටලු හේතුවෙන් මෙම පුනරුත්ථාපන ක්‍රියාවලිය අපේක්ෂිත මට්ටමින් සාර්ථක වී නොමැති බව පෙනී යයි. ලංකාවේ ළමා රැඳවුම් නිවාසවල ක්‍රියාත්මක වන පුනරුත්ථාපන ක්‍රියාවලියේ පවතින ගැටලු ගවේෂණය කිරීම මෙම පර්යේෂණයේ මූලික ගැටලුවයි. ආයතනික කාර්ය මණ්ඩලය මුහුණ දෙන ගැටලු, පුනරුත්ථාපන ක්‍රියාවලියේ සහ රැඳවුම් නිවාසගත ළමුන් මුහුණ දෙන ගැටලු මෙන්ම, සමස්ත ක්‍රියාවලිය තුළ පවතින ගැටලු අධ්‍යයනය කිරීම මෙහි අරමුණු විය. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර, අරමුණු සහගත නියැදිය යටතේ ආයතන නිලධාරීන් සිව් දෙනෙකු හා පරිවාස නිලධාරීන් දෙදෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා ද, රැඳවුම් නිවාසගත ළමුන් හය දෙනකු බැගින් වන සේ ඉලක්කගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා ද, යොදා ගනිමින් දත්ත රැස් කරන ලදි. රැස්කරගත් දත්ත තේමාකරණය ඔස්සේ විශ්ලේෂණයට ලක් කෙරිණි. පර්යේෂණ සොයාගැනීම්වලින් හෙළි වූයේ ප්‍රමාණවත් මනෝ-සමාජීය උපදේශනයක් නොමැතිකම, අවම අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු අවස්ථා මෙන්ම රැඳවුම් නිවාසවල සිදුවන අසාර්ථක පුනරුත්ථාපන වැඩසටහන් හේතුවෙන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය අඩාල වන බවයි. එමෙන්ම, ආයතන කාර්ය මණ්ඩලය අතර පවතින ගැටලු සහ කාර්යමණ්ඩලයේ පුහුණුව නොමැතිකම ද පුනරුත්ථාපනයට බාධාවක් වී ඇත. මීට අමතරව කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම ද ප්‍රධාන ගැටලුවක් ලෙස අනාවරණය විය. ස්ත්‍රී-පුරුෂ භාවය අනුව බලන කල, ගැහැණු ළමුන් මානසික පීඩනයට වැඩි වශයෙන් මුහුණ දෙන අතර, ඔවුන්ගේ පුනරුත්ථාපන ක්‍රියාවලිය තවත් වැඩිදියුණු විය යුතු බව පෙනී යයි. පිරිමි ළමයින් චර්යාත්මක ගැටලු සහ කලහකාරී ප්‍රවණතාවලින් පීඩා විඳින බවත්, ආයතනයේ කල්ලි ගැසෙමින් තව තවත් අපරාධකාරී චර්යා සඳහා නැඹුරු වන බව පෙනී යයි. ළමා රැඳවුම් නිවාසවල සිදුවන මෙම වත්මන් පුනරුත්ථාපන ක්‍රියාවලිය දරුවන්ගේ සාර්ථක නැවත සමාජගත වීමට ප්‍රමාණවත් නොවන බව මෙම අධ්‍යයනයේ නිගමනවලින් පෙනී යයි. ඒ අනුව, ආයතනික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, කාර්ය මණ්ඩලයට විධිමත් පුහුණුවක් ලබා දීම, ළමා-හිතකාමී සහ ස්ත්‍රී-පුරුෂ සංවේදී ප්‍රතිපත්ති සැකසීම මෙන්ම රාජ්‍ය මට්ටමින් ක්‍රමවත් අධීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දීම මෙමඟින් නිර්දේශ කෙරේ.

ප්‍රමුඛ පද: උපදේශනය, කාර්යමණ්ඩලය පුහුණුව, නීතිමය ප්‍රමාදය, පුනරුත්ථාපනය, ළමා රැඳවුම් නිවාස

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මිහිමිත් ප්‍රජාව සිය විවාහය පිළිබඳ අර්ථකථනයේදී සිය බාහිර ප්‍රතිරූපය කෙරෙහි දක්වන ආකල්ප: ශ්‍රී ලංකාවේ මිහිමිත් සංගමය ඇසුරින් කෙරෙන අධ්‍යයනයකි

ඩී.කේ.එම් ජයතිලක
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20284@arts.pdn.ac.lk

කෙටි උසක් සහිත වූ මිහිමිත් ප්‍රජාව මුහුණ දෙන සමාජීය සහ සංස්කෘතික අභියෝග රාශියකි. පුද්ගලයෙකුගේ බාහිර ප්‍රතිරූපය ඔහුගේ හෝ ඇයගේ ආත්ම අභිමානය කෙරෙහි සෘජුවම බලපාන අතර, එය විවාහය සහ පවුල තීරණාත්මක සන්ධිස්ථාන කෙරෙහි බලපෑම් කරනු ලැබේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මිහිමිත් ප්‍රජාවගේ බාහිර ප්‍රතිරූපය, ඔවුන්ගේ විවාහ අපේක්ෂා සහ පවුල් සංකල්පය ගොඩනඟා ගන්නා ආකාරය කෙරෙහි බලපාන ආකාරය ගවේෂණය කිරීමයි. මේ සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කරමින් විවාහක ස්ත්‍රී පුරුෂ, අවිවාහක සහ විවාහ වීමට අපේක්ෂා කරන ස්ත්‍රී පුරුෂ වශයෙන් මිහිමිත් පුද්ගලයන් 30 දෙනෙකු අරමුණු සහගත නියැදීම් ක්‍රමය යටතේ තෝරා ගන්නා ලදි. ප්‍රධාන දත්ත දායිකාව ලෙස Little People Association හි සභාපතිතුමිය සම්බන්ධ කරගනිමින්, අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත රැස් කරන ලදි. පර්යේෂණ සොයාගැනීම් අනුව, බාහිර ස්වරූපය පිළිබඳ සමාජයීය ආකල්ප සහ ඒකාකෘතික මතවාද මෙම ප්‍රජාවගේ විවාහ තීරණ කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. පවුලේ සහයෝගය සහ ඥාතීන්ගේ ප්‍රතික්ෂේප වීම් හමුවේ ඔවුන්ගේ අනාගත දිශානතිය යහපත් හා අයහපත් ලෙස ගොඩනැගෙන බව සහ විවාහ නොවූ සහ විවාහක පිරිස් තුළ විවාහය පිළිබඳ ආකල්පයේ විෂමතාවක් පවති. සහකරුවෙකු තෝරාගැනීමේදී සහ පවුලක් ආරම්භ කිරීමේදී තමන්ගේ ශාරීරික ස්වභාවය නිසා ඇතිවන සමාජයීය ප්‍රතික්ෂේපවීම් පිළිබඳ පවතින අදහසෙහි විෂමතාවක් පවති. එසේ වුවද, විවාහක පාර්ශවයන් තුළ සහයෝගීතාව මත පදනම් වූ ශක්තිමත් පවුල් සංකල්පයක් පවතින බවත්, විවාහ වීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට ආදරය සහ විවාහයට උස බාධාවක් ලෙස නොගන්නා බවත්, විවාහ නොවූ පුද්ගලයන් විවාහය කෙරෙහි යම්තාක් අකමැත්තක් පවතින නමුත් විවාහ වී සිටින ඔවුන්ගේම සමාජිකයන් පිළිබඳ තෘප්තිමත්භාවයක් සහ වයස් සීමා මත පදනම්ව විවාහයට උස බාධාවක් කර ගන්නා රටාවක් ප්‍රජාවෙන් නිරූපණය විය. සංගමය හරහා ලැබෙන සමාජයීය සහයෝගය ඔවුන්ගේ මානසික යහපැවැත්ම සඳහා විශාල අත්වැලක් සපයන බවත් සොයා ගැනීමට හැකි විය. මෙම අධ්‍යයනය මඟින් මිහිමිත් ප්‍රජාවගේ සහකරු තේරීමේ අයිතිය සහ පවුල් ජීවිතය පිළිබඳ පවතින සමාජීය ආකල්ප වෙනස් කිරීමේ සහ ඔවුන් වෙනුවෙන් වඩාත් සාධාරණ සමාජ වටපිටාවක් නිර්මාණය කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

ප්‍රමුඛ පද: පවුල් සංකල්පය, බාහිර ප්‍රතිරූපය, මිහිමිත් ප්‍රජාව, විවාහ අපේක්ෂා

මෙම අධ්‍යයනය සඳහා දිනුෂිකා යාපා අබේවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

වීදි වෙළෙන්දන් හේතුවෙන් සංචාරකයන්ට ඇති වී ඇති බලපෑම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.එම්.එස්.එස් කුමාරසිංහ
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20346@arts.pdn.ac.lk

ශ්‍රී ලංකාවේ වීදි වෙළඳාම නැගී එන ගැටලුවකි. මෙම සමාජ විද්‍යාත්මක අධ්‍යයනය යොමු කර ඇත්තේ මහනුවර නගරයේ වීදි වෙළෙන්දන් හේතුවෙන් සංචාරකයන්ට ඇති වී තිබෙන බලපෑම පිළිබඳවයි. වීදි වෙළෙන්දන්ගේ පැවැත්ම සංචාරකයන්ගේ අත්දැකීම් සඳහා ධනාත්මක මෙන්ම ඍණාත්මක ලෙසද බලපෑම් ඇති කළ හැකිය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ මහනුවර නගරයේ වීදි වෙළෙන්දන්ගේ ක්‍රියාකාරකම් හේතුවෙන් සංචාරකයන්ට ඇතිවන බලපෑම් විමර්ශනය කිරීමයි. ඒ සමගම සංචාරක ආකර්ෂණය ඇතිවීමේදී වීදි වෙළඳාම බලපාන්නේද, දේශීය හා විදේශීය බව, ස්ත්‍රී පුරුෂ භාවය හා ජාතිකත්වය අනුව සංචාරකයන්ට සිදු වන බලපෑමද විමර්ශනය කර ඇත. ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදය යටතේ අරමුණු සහගත නියැදීම ඔස්සේ පුද්ගලයන් 30 දෙනෙකුගෙන් දත්ත රැස් කර ඇත. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව වීදි වෙළෙන්දන් සංචාරකයන්ට දේශීය නිෂ්පාදන සංස්කෘතික භාණ්ඩ සහ ආහාර පහසුවෙන් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන අතර වීදි වෙළෙන්දන් සමග සිදුවන සෘජු අන්තර් ක්‍රියා හරහා ශ්‍රී ලාංකික ජන ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටත්, වීදි වෙළෙන්දන් ඉතා මිත්‍රශීලීව භාණ්ඩ අලෙවි කරන අතර එයින් සංචාරක අත්දැකීම වඩාත් යහපත් කරන බවත් ඇතැම් සංචාරකයන් සඳහන් කර ඇත්තේ වෙළෙන්දන්ගේ අධික විකුණුම් උත්සාහයන් සහ නැවත භාණ්ඩ මිලදී ගැනීමට ආරාධනා කිරීම අපහසුතාවයක් ඇති කරන බවයි. විශේෂයෙන්ම විදේශීය සංචාරකයින් අතර මෙම තත්ත්වය සංචාරයේ ගුණාත්මකභාවය අඩු කරන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත. තවද ඇතැම් ස්ථානවල වීදි වෙළඳ කුටි හේතුවෙන් මාර්ග අවහිරවීම, පදික ගමනාගමනයට බාධා ඇතිවීම සහ නගරයේ පිළිවෙළට අහිතකර බලපෑම් ඇතිවීමද පරිසරයේ අපිරිසිදුභාවය සංචාරකයන්ගේ සතුටට අහිතකර ලෙස බලපාන බවද අනාවරණය විය. එසේම විදේශීය සංචාරකයන්ට භාණ්ඩවල මිල ගණන් පිළිබඳ විනිවිදභාවයක් නොමැති වීම, ඉහළ මිල ගණන් ඉදිරිපත් කිරීම සහ භාණ්ඩවල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලුද, විදේශීය සංචාරකයින්ට සංස්කෘතික තිගැස්මක් ඇති වීම හා වීදි වෙළෙන්දන් විසින් පුද්ගලික දුරස්ථභාවයට බාධා කිරීම වැනි දේවල් සංචාරකයන් විසින් පෙන්වාදී ඇත. සමස්තයක් ලෙස ගත්විට වීදි වෙළෙන්දන් මහනුවර නගරයේ දේශීය ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන නමුත් සංචාරක හිතකාමී වෙළඳ පරිසරයක් ගොඩනැගීමෙන් මහනුවර නගරයේ සංචාරක කර්මාන්තය තවදුරටත් ප්‍රවර්ධනය කළ හැකි බව මෙම අධ්‍යයනය මගින් නිගමනය කරයි.

ප්‍රමුඛ පද: මහනුවර නගරය, වීදි වෙළෙන්දන්, සංචාරක අත්දැකීම්, සංචාරකයන්, සංචාරක කර්මාන්තය

මෙම අධ්‍යයනය සඳහා පූර්ණිකා සීලගමගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ වාර්තාකරණයේදී මාධ්‍යවල කාර්යභාරය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්: ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සහ කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරෙන්

ඒ.බී.ජී. ලක්මාලි
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20370@arts.pdn.ac.lk

නූතන සමාජයේ මාධ්‍ය මහජන මතය ගොඩනැගීමේ ප්‍රබල මෙවලමක් ලෙස ක්‍රියා කරයි. ශ්‍රී ලංකාවේ අපරාධ වාර්තාකරණයේදී මාධ්‍යවල කාර්යභාරය පිළිබඳ සමාජයේ පුළුල් කතිකාවක් පැවතියද, ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප විමර්ශනය කළ අධ්‍යයන සීමිත වේ. එබැවින් ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ වාර්තාකරණයේදී මාධ්‍යවල කාර්යභාරය පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන්ගේ ආකල්ප විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ විය. මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ලෙස, "ශ්‍රී ලංකාවේ සිදුවන අපරාධ වාර්තාකරණයේදී මාධ්‍යවල කාර්යභාරය පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන් දරන ආකල්ප මොනවාද?" යන්න දැක්විය හැකිය. අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයද, අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ විසිදෙනෙකුගේ නියැදියක් භාවිත කරන ලදි. දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන යොදා ගන්නා ලදි. අපරාධ හා මාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ වැඩි දැනුමක් ඇති ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යාව හා කැලණිය විශ්වවිද්‍යාලයේ සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයන උපාධිය හදාරන සිසුන් විසිදෙනෙකු සම්මුඛ සාකච්ඡා සඳහා දළ සේයා සඳෙව්මී ඝාතනය, ක්ලබ් වසන්ත ඝාතනය සහ කොටකෙතන කාන්තා ඝාතන සිද්ධි අධ්‍යයනය සඳහා ද යොදා ගත් අතර දත්ත විශ්ලේෂණය තේමාකරණය භාවිතයෙන් කරන ලදි. අධ්‍යයනයේ සොයාගැනීම් අනුව, බහුතර සිසුන්ගේ අදහස වූයේ මාධ්‍යය අපරාධ සම්බන්ධ තොරතුරු ජනතාවට ඉක්මනින් හා පුළුල් ලෙස ලබාදීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවයි. එමඟින් ජනතාව දැනුවත් කිරීම, අපරාධ වැළැක්වීම සිදුවන බව ඔවුන් පෙන්වාදී ඇත. ඇතැම් මාධ්‍ය ආයතන අපරාධ පුවත් සංවේදීකරණය කිරීම, අතිශයෝක්තියෙන් ඉදිරිපත් කිරීම සහ පොද්ගලිකත්වය උල්ලංඝනය වන අයුරින් වාර්තා කිරීම සම්බන්ධයෙන්ද සිසුන් විවේචනාත්මක අදහස් පළ කර ඇත. එවැනි වාර්තාකරණයන් මහජන භීතිය වැඩි කිරීමට, අපරාධ පිළිබඳ වැරදි ආකල්ප ගොඩනැගීමට සහ මාධ්‍ය පිළිබඳ විශ්වාසය අඩු කිරීමට හේතු වන බව ඔවුන්ගේ අදහස්වලින් අනාවරණය විය. සමාජ මාධ්‍යවල ව්‍යාප්තියත් සමඟ අපරාධ තොරතුරු ඉතා වේගයෙන් පැතිර යන නමුත්, ඒවායේ නිරවද්‍යතාව විශ්වසනීයත්වය පිළිබඳ ගැටලු පවතින බවද අධ්‍යයනයෙන් හෙළි විය. එබැවින් අපරාධ වාර්තාකරණයේදී මාධ්‍ය වෘත්තීය ආචාරධර්ම, සමාජ වගකීම සහ තොරතුරුවල නිරවද්‍යතාව ආරක්ෂා කරමින් කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව නිගමනය කළ හැකිය. මාධ්‍යය සමාජයට අත්‍යවශ්‍ය තොරතුරු සපයන ප්‍රබල ආයතනයක් වුවද, එහි වාර්තාකරණය වගකීම් සහගත හා සමබර විය යුතු බව මෙම අධ්‍යයනයෙන් අවධාරණය වේ.

ප්‍රමුඛ පද: අපරාධ වාර්තාකරණය, ආකල්ප, මාධ්‍ය, කාර්යභාරය, විශ්වවිද්‍යාල සිසුන්

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ග්‍රාමීය තරුණයන් සාමාන්‍යපෙළින් පසු අධ්‍යාපනයෙන් බැහැරව වෙනත් ක්ෂේත්‍ර වෙත යොමුවීමට බලපාන හේතු පිළිබඳ අධ්‍යයනයක්: මාතර දිස්ත්‍රික්කයේ කැකණදුර දකුණ ග්‍රාම නිලධාරී වසම ඇසුරින්

කේ.කේ. වරුනි ලක්මාලි
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20372@arts.pdn.ac.lk

වර්තමානය වන විට ග්‍රාමීය තරුණයන් සාමාන්‍යපෙළින් පසු අධ්‍යාපනයෙන් බැහැරව වෘත්තීය අධ්‍යාපනය වෙත, රැකියා වෙත, විදේශගත වීම්, ව්‍යාපාර ආරම්භ කිරීම වැනි විවිධ ක්ෂේත්‍ර වෙත යොමුවීමක් හඳුනාගත හැකිය. මෙම සමාජ විද්‍යාත්මක අධ්‍යයනයේ මූලික ඉලක්කය වූයේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය තරුණයන් සාමාන්‍ය පෙළින් පසු අධ්‍යාපනයෙන් බැහැරව මෙලෙස වෙනත් ක්ෂේත්‍ර වෙත යොමුවීමට බලපාන හේතු හඳුනා ගැනීමයි. එය ශ්‍රී ලාංකික ග්‍රාමීය තරුණයන්ගේ ආර්ථික පසුබිම, පවුල් පරිසරයේ ස්වභාවය, සමාජයේ ස්වභාවය මෙන්ම ඔවුන්ගේ අනාගත අපේක්ෂා හා වෘත්තීය ආකර්ෂණය ගවේෂණය කරයි. අධ්‍යයන දත්ත සිද්ධි අධ්‍යයන, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ ඉලක්කගත සමූහ සම්මුඛ සාකච්ඡා මඟින් රැස් කරන ලද අතර ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස සාමාන්‍යපෙළින් පසු අධ්‍යාපනය හැරගිය තරුණයන් අටදෙනෙකු ඇතුළුව අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ තිස් දෙනෙකුගේ අධ්‍යයන නියැදියක් අධ්‍යයනය සඳහා භාවිත කරන ලදි. ග්‍රාමීය තරුණයන් සාමාන්‍ය පෙළින් පසු අධ්‍යාපනයෙන් බැහැරව වෙනත් ක්ෂේත්‍ර වෙත යොමුවීමට බලපාන ප්‍රධාන හේතුවක් ලෙස ආර්ථික සාධක මතුවී තිබේ. පවුලේ ආර්ථික දුෂ්කරතා, අධ්‍යාපන වියදම් අධික වීම සහ රැකියා අවශ්‍යතාවය හේතු කොටගෙන තරුණයින් අධ්‍යාපනයෙන් බැහැර වෙමින් සිටී. එවගේම අධ්‍යාපනය කෙරෙහි පවතින උනන්දුව අවම වීම, සාමාන්‍ය පෙළ විභාගය අසාර්ථකත්වය, පාසලේ ඉගැන්වීම් ක්‍රියාවලියේ පවතින සීමාකම්, පවතින විෂයමාලා කෙරෙහි ඇති අකමැත්ත සහ උසස් අධ්‍යාපන අවස්ථා පිළිබඳ අනවබෝධය තරුණයන්ගේ අධ්‍යාපනික තීරණවලට ප්‍රබලව බලපා ඇත. තවද දෙමාපියන්ගේ නොදැනුවත්භාවය හා පවුල් ව්‍යුහයේ පවතින අසාර්ථකතා බලපෑමෙන් ද තරුණයින් අධ්‍යාපනය මගහැර විකල්ප මාර්ග වෙත යොමුව තිබේ. එවගේම සම වයස් මිතුරන්ගේ අදහස්, ග්‍රාමීය සමාජයේ රැකියා හා ආදායම් කේන්ද්‍රගත වටිනාකම් ද ග්‍රාමීය තරුණයින්ගේ අධ්‍යාපනික තීරණය කෙරෙහි බලපෑම් කර ඇත. ග්‍රාමීය තරුණයන්ගේ පවතින වෘත්තීය හා රැකියා ආකර්ෂණය සහ අනාගත අපේක්ෂාවන් හා ජීවන අරමුණු සමඟ වර්තමාන අධ්‍යාපන ක්‍රියාවලියේ නොගැළපීම මත ග්‍රාමීය තරුණයන් වෙනත් ක්ෂේත්‍ර වෙත යොමු වීමක් හඳුනාගත හැකිය. එවගේම ග්‍රාමීය පරිසරයේ අධ්‍යාපනික අවස්ථාවන් කෙරෙහි පවතින සීමාකම් ග්‍රාමීය තරුණයින් උසස් අධ්‍යාපනය කෙරෙහි යොමුවීම තවදුරටත් සීමා කරනු ලබයි. ඒ අනුව ආර්ථික වශයෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා අධ්‍යාපනික සහන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සාමාන්‍ය අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ඒකාබද්ධ කරන අධ්‍යාපන ක්‍රමවේදයක් හඳුන්වාදීම, කෙටිකාලීන අධ්‍යාපන සහ කුසලතා සංවර්ධන වැඩසටහන් පුළුල් කර ග්‍රාමීය තරුණයින්ගේ අවශ්‍යතාවලට ගැළපෙන නව විෂයමාලා හඳුන්වාදීමේ අවශ්‍යතාව මෙම අධ්‍යයනය මඟින් ඉස්මතු කරයි.

ප්‍රමුඛ පද: අධ්‍යාපනික මඟහැරීම, ආර්ථික දුෂ්කරතා, ග්‍රාමීය තරුණයන්, රැකියා ආකර්ෂණය, වෘත්තීය අධ්‍යාපනය

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය තරුණියන් අවම විවාහ වයස සම්පූර්ණවීමත් සමඟ නීත්‍යානුකූල විවාහය සඳහා යොමුවීමට බලපාන හේතු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ඩබ්ලිව්.ආර්.එන්.එම්. වතුපොල
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20422@arts.pdn.ac.lk

සමාජයේ පවතින මූලික සමාජ ආයතනයක් ලෙස විවාහයේ නව ප්‍රවණතා රැසක් දක්නට ලැබේ. ඒ අතර ග්‍රාමීය සමාජ ව්‍යුහයේ තරුණියන් අවම විවාහ වයස සම්පූර්ණවීමත් සමඟ නීත්‍යානුකූලව විවාහ ගිවිස ගැනීමේ ප්‍රවණතාවක් පවති. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ග්‍රාමීය තරුණියන් අවම විවාහ වයස සම්පූර්ණ වූ විගසම විවාහය සඳහා යොමුවීමට බලපාන හේතු අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයනය ක්ෂේත්‍රය වශයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මහින්දාගම ග්‍රාම නිලධාරී වසම තෝරාගන්නා ලදි. අධ්‍යයන නියදිය වශයෙන් අවුරුදු 18-23 අතර විවාහක කාන්තාවන් 20 දෙනෙකු හිමබෝල නියදි ක්‍රමය ඔස්සේ යමින් යොදා ගන්නා ලදි. දත්ත රැස් කිරීමට ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ යන ක්‍රමවේද භාවිත කළ අතර අධ්‍යයනයෙන් ලබාගත් ගුණාත්මක දත්ත තේමාකරණය ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. අධ්‍යයනයේ සොයා ගැනීම් අනුව දූරස්ථ ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් අවම විවාහ වයස සම්පූර්ණවීමත් සමඟ නීත්‍යානුකූලව විවාහ වීම සඳහා ආර්ථික, සමාජීය, සංස්කෘතික හා මනෝලිංගික හේතු බලපා තිබේ. පවුලේ දෙමාපියන් අතර පවතින ආරවුල්, මව විදේශගත වීම, නිවසේ මත්ද්‍රව්‍ය භාවිතය, ආර්ථික සුරක්ෂිතතාවය හා ස්වාධීනත්වය ළඟා කර ගැනීමේ උපායමාර්ගයක් ලෙස විවාහයට පිවිසීම සහ පාසල් අධ්‍යාපනය අතරමඟ නැවතීම මෙන්ම පාසල් වියේ ප්‍රේම සම්බන්ධතා,නව යොවුන්විය්ේ ඇතිවන විරුද්ධ ලිංගික ආකර්ෂණය සේම අඩු වයස් සහවාසි සබඳතා පැවැත්වීම මෙම විවාහ සඳහා බලපා තිබේ. අධ්‍යයනයේ යෝජනා ලෙස ග්‍රාමීය කාන්තාවන් ඉක්මනින් විවාහ වීම සඳහා පොළඹවන නිශේධනාත්මක හේතු අවම කිරීම උදෙසා මෙම ප්‍රදේශවල අධ්‍යාපන හා වෘත්තීය අවස්ථා පුළුල් කර එමඟින් ග්‍රාමීය තරුණියන්ගේ අධ්‍යාපනය අතරමඟ නැවැත්වීම වැළැක්වීම වැදගත් වේ. ග්‍රාමීය කුටුම්බවලට සුදුසු ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදුකළ හැකිය. එමෙන්ම ආකල්පමය වශයෙන් හා සමාජීය දැනුවත් කිරීම අවශ්‍ය වන අතර ග්‍රාමීය තරුණියන් වෙනුවෙන් උපදේශන හා මාර්ගෝපදේශන සේවා ශක්තිමත් කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද: අවම විවාහ වයස, විවාහක ග්‍රාමීය තරුණියන්, විවාහය,

මෙම අධ්‍යයනය සඳහා උපාලි වීරකෝන්ගෙන් ලැබුණු උපදේශනය හා අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සීතාවක ගඟ ආශ්‍රිත දිගු කාලීන ගංවතුර ආපදා බලපෑම් සඳහා වූ ප්‍රජා අනුවර්තනයන් පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

ජේ. ඒ. ඩී. එන් මිහිරුනී
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20444@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ජනගහනයෙන් බහුතරයකට බලපෑම් එල්ල කරන ප්‍රධානතම ස්වාභාවික ආපදාවක් ලෙස ගංවතුර හඳුනාගත හැකිය. දීර්ඝ කාලීනව ගංවතුර ආපදාවන්ට මුහුණ දීම හේතුවෙන් වත්මන් සමාජය තුළ එම තත්ත්වය සාමාන්‍යකරණය වී ඇති අතර, එහි බලපෑම් අවම කරගැනීම සඳහා ප්‍රජාව සැලසුම්සහගතව දේශීය දැනුම උපයෝගී කරගන්නා බව පෙනේ. දීර්ඝ කාලීනව ගංවතුර ආපදාවට ලක්වන ප්‍රජාව, ඊට අනුවර්තනය වෙමින් සිය නිවාසවල බාහිර හා අභ්‍යන්තර අවකාශයන් සැලසුම් කර ඇති ආකාරය සහ අවිධිමත් සමාජ සබඳතා පවත්වන ස්වභාවය හඳුනා ගැනීම අධ්‍යයනයේ මූලික අරමුණයි. කොළඹ දිස්ත්‍රික්කයේ සීතාවක නගර සභාවට අයත් ග්‍රාම නිලධාරී වසමක් අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගත් අතර, අරමුණු සහගත නියැදි ක්‍රමය යටතේ පවුල් 20ක් නියැදිය සඳහා ඇතුළත් කරගන්නා ලදී. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව, දීර්ඝ කාලීනව ගංවතුරට ලක්වන ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාව සතු ආර්ථික ශක්තිය ඔවුන්ගේ අනුවර්තන හැකියාවන් තීරණය කරන ප්‍රධානතම සාධකය වේ. ආර්ථික, අධ්‍යාපනික සහ සමාජීය මට්ටම් මත පදනම්ව ප්‍රජාව විසින් ගංවතුර හානි අවම වන පරිදි සිය නිවාසවල බාහිර හා අභ්‍යන්තර අවකාශයන් නිර්මාණය කර ඇත. ඒ අනුව, බාහිර අනුවර්තන උපක්‍රම ලෙස කොන්ක්‍රීට් කුළුණු මත නිවාස ඉදිකිරීම, මහල් ගණන වැඩි කිරීම, අත්තිවාරම උස් කිරීම සහ කානු පද්ධති සකස් කිරීම ආදිය හඳුනාගත හැකිය. අභ්‍යන්තර අනුවර්තන ලෙස මුළුතැන්ගෙය වැනි අත්‍යවශ්‍ය අවකාශයන් නිවසේ සෙසු කොටස්වලට වඩා උසින් ඉදිකිරීම සහ ලී බඩු වෙනුවට ප්ලාස්ටික් භාණ්ඩ භාවිතයට යොමුවීම කැපී පෙනේ. ප්‍රජාවෙන් බහුතරයක් සීතාවක ගඟ ආශ්‍රිත පතල් කර්මාන්තයේ නිරත වන බැවින්, දීර්ඝ කාලීනව ගංවතුරට ලක්වීම සම්බන්ධයෙන් කිසිදු පාර්ශ්වයකට දෝෂාරෝපණය කිරීමේ අඩු බවක් පෙන්නුම් කරයි. කුලී පදනම මත ජීවත්වන බහුතරයක් ජනතාව ආර්ථික දුෂ්කරතා, නගරයට ඇති සමීපතාව වැනි සාධක හේතුවෙන් ගංවතුර අවදානම මධ්‍යයේ වුවද එම ස්ථානවලම රැඳී සිටින අතර ගංවතුරට අනුවර්තනය වීම සම්බන්ධව ඇත්තේ අඩු වගකීමකි. ප්‍රජාව සතු අඩු අධ්‍යාපන මට්ටම සහ කාර්යබහුල රැකියා ජීවිතයට ප්‍රමුඛතාව දීම හේතුවෙන් ඔවුන් අතර සමාජීය දූරස්ථභාවය වර්ධනය වී ඇත. අවසාන වශයෙන්, ඔවුන් තුළ පවතින ආදායම් විෂමතාව, යැපුම් මානසිකත්වය සහ අනුවර්තන හැකියාවන් පිළිබඳ පවතින අධිතක්සේරුව මෙම ප්‍රජාව පුනරාවර්තන ගංවතුර ආපදාවන්ට ලක්වීමට මූලික හේතු ලෙස හඳුනාගත හැකිය.

ප්‍රමුඛ පද: අනුවර්තන, අභ්‍යන්තර අවකාශය, අවකාශීය සැලසුම්කරණය, අවිධිමත් සමාජ සබඳතා, ආර්ථික දුෂ්කරතා, ගංවතුර, බාහිර අවකාශය, ස්වාභාවික ව්‍යසන

මෙම අධ්‍යයනය සඳහා දිනුම්කා යාපා අබේවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ඝන අපද්‍රව්‍යය අවිධිමත් ලෙස බැහැර කිරීම හේතුවෙන් පැන නගින සමාජීය සහ පාරිසරික ගැටලු මහනුවර මැද ඇළ ප්‍රදේශය ඇසුරින්

ජී.එන්.එච් ප්‍රේමදාස
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20496@arts.pdn.ac.lk

මෙම අධ්‍යයනය මඟින් ඝන අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැරකිරීම හේතුවෙන් ප්‍රජාවට සිදුවන බලපෑම පිළිබඳ විවාදයට වැදගත් දායකත්වයක් සපයයි. අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රධාන ස්ථානයක් ලෙස මහනුවර මැද ඇළ අවට ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. ගුණාත්මක ක්‍රමවේද ප්‍රවේශයක් භාවිත කරමින්, අරමුණු සහගත නියැදීම් ක්‍රමය යටතේ නාභිගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා 3 සහ ප්‍රධාන තොරතුරු සපයන්නන් 4 දෙනෙකු ඇතුළුව, සමස්ත සහභාගිවන්නන් 30 දෙනෙකුගෙන් දත්ත රැස් කරන ලදි. පර්යේෂණ සොයාගැනීම්වලට අනුව අවිධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් සමස්ත පරිසර පද්ධතියට සහ මානව සමාජයට බරපතළ තර්ජන එල්ල වී ඇත. පාංශු දූෂණය, ජල දූෂණය, භූ දර්ශන විකෘති වීම සහ අපජලය හා ඝන අපද්‍රව්‍ය පල්වීමෙන් සිදුවන වායු දූෂණය වැනි සාර්ව පාරිසරික අර්බුදවල සමුච්චිත බලපෑම මැනවින් පැහැදිලි වේ. මෙම තත්ත්වයන් ඩෙංගු සහ පාචනය වැනි බෝවන රෝග ව්‍යාප්තිය ඉහළ නැංවීමට මෙන්ම, දුර්ගන්ධය හේතුවෙන් මානසික සෞඛ්‍ය ගැටලු ඇති වීමට ද හේතු වී තිබේ. තවද මේ හේතුව සමාජීය සහ සංස්කෘතික වශයෙන්, මැද ඇළ අවට ප්‍රදේශවාසීන්ගේ දුර්වල ජීවන තත්ත්වයන් ඔවුන් සමාජීය වශයෙන් හුදකලා කිරීමට හේතු වී ඇති අතර, පදිංචිකරුවන් සංක්‍රමණය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. ආර්ථික වශයෙන්, දේපළ වටිනාකම පහත වැටී ඇති අතර සංවර්ධන අවස්ථා ඇහිරීම නිසා ප්‍රදේශවාසීන් ආදායම් ඉපයීමේ අවස්ථා සීමා වී ඇත.දියුණු තාක්ෂණික ක්‍රමවේද සහ ප්‍රජා සහභාගිත්වය උපයෝගී කරගනිමින්, අපද්‍රව්‍ය විධිමත් ලෙස බැහැර කිරීමේ ක්‍රමවේද සහ තිරසාර අපද්‍රව්‍ය කළමනාකරණයක ඇති හදිසි අවශ්‍යතාව මෙම අධ්‍යයනයෙන් අවධාරණය කෙරේ. සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුළුල් පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරු කිරීම සහ අවදානම් සහගත පදිංචිකරුවන්ගේ යහපැවැත්ම උදෙසා ඔවුන් මැද ඇළ පරිශ්‍රයෙන් ඉවත් කර සුදුසු පරිදි නැවත පදිංචි කරවීම පර්යේෂණයේ ප්‍රධාන නිර්දේශ වේ. නිගමනය වශයෙන්, ඉහත සඳහන් අභියෝගවලට මුහුණ දෙමින් තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා පරිසරය, මහජන සෞඛ්‍යය සහ සමාජ-සංස්කෘතික අඛණ්ඩතාව ආරක්ෂා කෙරෙන, විද්‍යාත්මක පදනමකින් යුතු, නීත්‍යානුකූල සහ ක්‍රියාකාරී ප්‍රජා සහභාගීත්ව කමිටුවක් සහිත විසඳුම් පද්ධතියක අවශ්‍යතාව පෙන්වා දිය හැකිය.

ප්‍රමුඛ පද: ඝන අපද්‍රව්‍ය, බැහැරකිරීම, ප්‍රජාව, සමාජ පාරිසරික ගැටලු

මෙම අධ්‍යයනය සඳහා මල්ලිකා පින්නවලගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

සමාජ මාධ්‍ය තුළ සිදු වන ශරීරය ලැජ්ජාවට පත් කිරීම් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම කෙරෙහි සිදු කෙරෙන බලපෑම පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එල්. ජී. එම්. ප්‍රියංගිකා
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20540@arts.pdn.ac.lk

නූතන ඩිජිටල් අවකාශයේ (body shaming) ශාරීරික පෙනුම විවේචනය තාරුණ්‍යයේ මනෝ සමාජීය වර්ධනයට සෘජුව බලපායි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ සමාජ මාධ්‍ය තුළ සිදුවන ශරීරය ලැජ්ජාවට පත් කිරීම් විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගේ මනෝ සමාජීය යහපැවැත්මට බලපාන ආකාරය සහ ඔවුන්ගේ අනුවර්තන උපාය මාර්ග හඳුනා ගැනීමයි. ගුණාත්මක ප්‍රවේශයක් භාවිත කළ මෙම අධ්‍යයනය සඳහා අරමුණු සහගත නියැදිය යටතේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් දස දෙනෙකු සහ විශ්වවිද්‍යාල ශිෂ්‍ය උපදේශකවරුන් දෙදෙනෙකු සමඟ පැවැත්වූ ගැඹුරු සම්මුඛ සාකච්ඡා ඇසුරෙන් දත්ත රැස් කරන ලදි. සිසුන්ගේ දත්තවලට අනුව බහුතරයක් ෆේස්බුක් සහ ටික්ටොක් තුළ තම බර සහ හමේ පාට මුල් කරගෙන සෘණාත්මක ප්‍රතිචාරවලට ලක් වේ. ශිෂ්‍යාවන් සමකාලීන මිතුරන්ගෙන් සෘජු විවේචන ලැබුවද, පිරිමි සිසුන් ව්‍යාජ ගිණුම් (fake accounts) ඔස්සේ එල්ල වන නිර්නාමික උපහාසවලින් පීඩා විඳියි. උපදේශන දත්තවලට අනුව සෘජු විවේචනයට වඩා "අන් අය තමන්ව විවේචනය කරයි" යන අනුමාන බිය (assumption) නිසා සිසුන් සමාජයෙන් කොන් වේ. කෘත්‍රිම පරමාදර්ශී රූප (filters) සමඟ සැසඳීමෙන් ආත්ම අභිමානය බිඳවැටීම, සමාජ කාංසාව සහ විෂාද ලක්ෂණ මතු වී අධ්‍යයන කටයුතු අඩාල වේ. පිරිමි සිසුන් "පිරිමි බව" (masculinity) පිළිබඳ සම්මතයන් නිසාත්, ගැහැනු සිසුන් අනාගත සහකරුවෙකු අහිමි වීමේ බිය නිසාත් පීඩා විඳියි. මේ සඳහා සිසුන් ආහාර පාලනය, ඡායාරූප මකාදැමීම වැනි සෘණාත්මක ක්‍රම මෙන්ම ලිවීම, ව්‍යායාම, භාවනාව සහ උපදේශනය වැනි ධනාත්මක ක්‍රම භාවිත කරයි. අවසාන නිගමනයට අනුව සමාජ මාධ්‍ය තුළ ශරීරය ලැජ්ජාවට පත් කිරීම් පාලනයට සිසුන්ගේ ඩිජිටල් හා සයිබර් නීතිමය සාක්ෂරතාව වර්ධනය කිරීමත්, රහස්‍යභාවය සුරකින උපදේශන සේවා පුළුල් කිරීමත් අත්‍යවශ්‍ය වේ. එමෙන්ම ස්වයං-පිළිගැනීම (self-acceptance) සහ මානසික සෞඛ්‍යය නංවන වැඩසටහන් විශ්වවිද්‍යාල මට්ටමින් තවදුරටත් ශක්තිමත් කළ යුතුය.

ප්‍රමුඛ පදඃ අනුමාන බිය, මනෝ සමාජීය යහපැවැත්ම, ශරීරය ලැජ්ජාවට පත් කිරීම, සමාජ මාධ්‍ය, ස්වයං-පිළිගැනීම

මෙම අධ්‍යයනය සඳහා දිනුෂිකා යාපා අබේවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ග්‍රාමීය දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා පවුල මඟින් සිදුවන බලපෑම පිළිබඳව අධ්‍යයනයක්:මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙල්දොරවත්ත ග්‍රාම නිලධාරී වසම ඇසුරෙන්

කේ.ඩී.එච් නවාංජනා
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20562@arts.pdn.ac.lk

පුද්ගලයන්ට සමාජ හා ආර්ථික සංචලතාව උදෙසා මෙන් ම පුද්ගලික සංවර්ධනය අත්කර ගැනීමට ඇති ප්‍රධාන යාන්ත්‍රණය ලෙස අධ්‍යාපනය පිළිගැනේ. කෙසේ වුව ද ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල මෙම විභවය සාක්ෂාත් කර ගැනීම පවුල් ඒකකයේ සමාජ ආර්ථික තත්වයන් මගින් සැලකිය යුතු ලෙස සීමා කර ඇත. ග්‍රාමීය දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි පවුල මගින් සිදුවන වූ බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුවයි. මෙම පර්යේෂණයේ අරමුණු වන්නේ ග්‍රාමීය දරුවන්ගේ අධ්‍යාපනය සඳහා පවුලෙන් සිදුවන ආර්ථික,සමාජීය සහ වෙනත් තත්වයන් යටතේ සිදුවන බලපෑම් හඳුනා ගැනීමයි. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිත කළ අතර සම්මුඛ සාකච්ඡා හා නාභිගත සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කරන ලදි. අධ්‍යයනයේ දී නියැදිය ලෙස පාසල් සිසුන් 20ක් ද දෙමව්පියන් 10 දෙනෙකු ද පාසල් ගුරුවරයෙකු සහ ග්‍රාම නිලධාරීතුමා ද දත්ත දායකයන් ලෙස යොදා ගන්නා ලදි. රැස්කරගත් දත්ත තේමාකරණය ඔස්සේ විශ්ලේෂණයට ලක් කෙරිණි. පර්යේෂණ සොයා ගැනීම්වලින් හෙළි වූයේ ග්‍රාමීය පවුල්වලින් පවතින්නා වූ ආර්ථික දුෂ්කරතා පදනම් කරගෙන අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ගැනීමේදී බාධා ඇති වීම, දරුවා ශිෂ්‍යයකුව සිට ශ්‍රමිකයකු දක්වා පරිවර්තනය වීම වැනි තත්වයන් දක්නට ලැබෙන බවයි. ග්‍රාමීය ව පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව ඉහළ වීම දරුවන්ගේ අධ්‍යාපනයට විටෙක ධනාත්මක මෙන් ම සෘණාත්මක ප්‍රතිඵල ගෙන එන අතර පවුල තුළ පවතින වාතාවරණය දරුවාගේ මානසික ඒකාග්‍රතාවය උදෙසා බලපායි. දෙමව්පියන් දරුවාගේ ජයග්‍රහණ අගය කිරීම සහ සාර්ථකත්වයේ දී ධෛර්යමත් කිරීමෙන් දරුවාගේ අධ්‍යාපනයට ඇති උනන්දුව වර්ධනය වන බව ද පෙනී යයි. අධ්‍යාපනය පිළිබඳ මවුපියන්ගේ පවතින්නා වූ දැනුවත්භාවය සහ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමව්පියන් දෙනු ලබන කාලය දරුවාගේ සාර්ථකත්වය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරන බව තහවුරු විය. මෙම අධ්‍යයනය අනුව ග්‍රාමීය ව දරුවන්ගේ අධ්‍යාපනයට පවුල මඟින් වන බලපෑම් ඉතා ප්‍රබල බව සනාථ වේ. ඒ අනුව භූගෝලීය පදනම මත ශිෂ්‍යත්ව ක්‍රම ලබා දීමේ වැඩසටහන් දියත් කිරීම, දෙමාපිය පාසල් සබඳතා ශක්තිමත් කිරීම, ප්‍රජා ඩිජිටල් මධ්‍යස්ථාන ග්‍රාමීයව පිහිටුවීම හා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම මෙම අධ්‍යයනයේ නිර්දේශ ලෙස දැක්විය හැක.

ප්‍රමුඛ පද: අධ්‍යාපනික සාර්ථකත්වය, ග්‍රාමීය අධ්‍යාපනය, දෙමව්පිය සම්බන්ධතාව, සමාජ-ආර්ථික පසුබිම

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

භික්ෂුණී ජීවන ලෝකය නිර්මාණයෙහිලා භික්ෂුණීන්ගේ දායකත්වයත ප්‍රපංචවිද්‍යාත්මක විමසුමක්

ජී. අයි. ඩී. එශාන්ගි සත්සරණි
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20688@arts.pdn.ac.lk

භික්ෂුණීන්ගේ ජීවන ලෝකය නිර්මාණය වීමේ ක්‍රියාවලිය ඔවුන්ගේම අත්දැකීම් සහ අර්ථකථනයන් අනුසාරයෙන් ප්‍රපංච විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විමසා බැලීම මෙහිදී සිදුකරනු ලබයි. මෙහි පර්යේෂණ අරමුණ ලෙසට සමාජ අත්දැකීම් මගින් භික්ෂුණීන්ගේ ජීවන ලෝකයට වන බලපෑම මත ඔවුන් සිය ජීවන ලෝකය සකස් කරගනු ලබන ආකාරය පිළිබඳව විමසීම සිදුකරයි. මෙහිදී හයිඩෙගර්ගේ අර්ථකථනවාදී ප්‍රපංචවේද න්‍යාය භාවිත කොට ගනු ලබන අතර ගුණාත්මක ප්‍රවේශය යටතේ මෙම අධ්‍යයනය සිදු කොට ඇත. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස් කර ගැනීම ක්ෂේත්‍ර අධ්‍යයනය ඔස්සේ ව්‍යුහගත නොවන සම්මුඛ සාකච්ඡා මත සිදු කොට තිබේ. මෙහි අධ්‍යයන ක්ෂේත්‍රය වූයේ කළුතර දිස්ත්‍රික්කයේ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසේ පිහිටා ඇති දෙකදුවල භික්ෂුණී සේනාසනය වේ. පර්යේෂණ නියැදිය ලෙසට අවුරුදු තිහත් පනස් පහත් අතර වූ භික්ෂුණීන් වහන්සේලා දස දෙනෙකු අහඹු නියැදිය මගින් තෝරාගැනීම සිදුකොට ඇත. ඔවුන් මෙම අධ්‍යයනය සඳහා සහභාගි කොටගනු ලබන්නේ ඔවුන්ට තම ජීවිතය පිළිබඳ සහ සමාජය පිළිබඳ මනා අවබෝධයක්, අත්දැකීම් පවතිනු ලැබීම හේතුවෙනි. මෙහි ප්‍රධාන සොයාගැනීම් ලෙසට අධ්‍යයනය සඳහා සහභාගී වූ භික්ෂුණීන් වහන්සේලා බොහෝ දෙනකු සිය ජීවිතයේ දුක්ඛිත බව අවබෝධ කරගනිමින් පැවිදි දිවියට ඇතුළත්ව ඇති අතර ඔවුන් පැවිදි දිවිය සඳහා සමාජානුයෝජනය වී ඇත්තේ පැවිදි වීමට පෙරාතුව වසර දෙකක හෝ ඊට වැඩි පුහුණු කාලයකින් පසුවය. චීවරයේ වටිනාකම සහ ඊට දක්වනු ලබන සමාජ ගරුත්වය පිළිගැනීම පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව මොවුන් කටයුතු කරනු ලබන අතර ධර්ම දේශනා සිදු කිරීම්, මිනිසුන්ගේ සමාජමය ගැටලු විසඳීම්, ඔවුන්ගේ ගැටලු සඳහා පිහිට වීම් මෙන්ම එහිදී මුහුණ දුන් ගැටලු, ප්‍රජා කටයුතු සඳහා භික්ෂුණියක ලෙස දායක වන ආකාරය ද මෙහි සඳහන් වේ. එවන් ශාසනික මෙහෙවර තුළ පුරුෂ, ස්ත්‍රී දෙපාර්ශ්වයේම දෝෂාරෝපණ ඇතිවීම්, පොදු ප්‍රවාහනය තුළ ඇති ගැටලු, භික්ෂුණීන් අතර පවතින ගැටලුකාරී තත්ත්ව අසමගිකම් ශාසනයේ පරිහානිය උදෙසා බලපානු ලබන ආකාරය නිරූපණය වේ. මෙහිදී භික්ෂුණී ජීවන ලෝකය සැකසීමෙහිලා බාහිර සමාජ බලපෑම් හේතුවෙන් ඔවුන්ගේ ශාසනික කටයුතු, ප්‍රජා කටයුතු සීමා වීමකට ලක්ව ඇත. ඔවුන්ට ස්වාධීනව කටයුතු කිරීමට අවශ්‍ය නිදහස් මානසිකත්වය ඇතැම් විට දී මෙවැනි තත්ත්ව තුළ අහිමි වන බව පෙන්වා දී ඇත.

ප්‍රමුඛ පද: ප්‍රපංචවේදය, භික්ෂුණිය, ජීවන ලෝකය,

මෙම අධ්‍යයනය සඳහා ධම්මික හේරත්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

දරුවන් විදේශගතවීම වැඩිහිටියන්ගේ සමාජ හුදකලාවට බලපාන ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් : කොළඹ දිස්ත්‍රික්කය ආශ්‍රයෙන්

කේ.එල්.කේ. සත්සරණී
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20689@arts.pdn.ac.lk

සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජයෙහි වයස්ගත දෙමව්පියන් රැකබලා ගැනීම පවුල කේන්ද්‍ර කරගත් වගකීමක් වුව ද සමාජය තුළ සිදුවෙමින් පවතින සීඝ්‍ර සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික පරිවර්තනය තුළ තව දුරටත් එම තත්ත්වය යථාර්ථයක් නොවන බව පර්යේෂණ මඟින් තහවුරු කොට තිබේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ, දරුවන් විදේශගතවීම වැඩිහිටි දෙමව්පියන්ගේ සමාජ සහ මානසික ජීවිත කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කිරීමයි. ගුණාත්මක පර්යේෂණ සැලැස්ම යටතේ අරමුණු සහගත නියැදි ක්‍රමය භාවිත කරමින් වයස අවුරුදු හැට හා හැත්තපහ අතර කාන්තාවන් දස දෙනෙකු හා පිරිමි දහ දෙනෙකු ලෙස වැඩිහිටි දෙමව්පියන් විසි දෙනෙකු අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගන්නාද ලද අතර දත්ත විශ්ලේෂණය කිරීම තේමාකරණ ක්‍රමවේදය භාවිත කරන ලදි. අධ්‍යයනයට අනුව පැහැදිලි වූ ප්‍රධානතම කරුණක් වූයේ, අධ්‍යයනයට භාජනය වූ දෙමව්පියන් ආර්ථිකමය වශයෙන් ස්ථාවර තත්ත්වයක සිටින බවයි. සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ලබා ගැනීමට, පෞද්ගලික වෛද්‍ය පහසුකම් ලබා ගැනීම හා පෞද්ගලික ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට ආර්ථික වශයෙන් දෙමව්පියන් සවිබල ගැන්වීමට බොහෝ දරුවන් කටයුතු කර ඇති බව අධ්‍යයනය මඟින් තහවුරු විය. මෙම තත්ත්වය නිසාම මෙම දෙමාපියන්ගෙන් බහුතරයක් අසල්වැසියන් හා නෑදෑ හිතවතුන් සමග මනා සම්බන්ධයක් පෙන්නුම් කළ අතර ආගමික ජීවිතයක් ඔස්සේ තමාගේ ජීවිතය හැඩගසා ගැනීමට උත්සාහ කරන බව පැහැදිලි විය. විශේෂයෙන්ම යුරෝපීය රටවල ජීවත් වන දරුවන්ගේ දෙමව්පියන් හට මෙම ආර්ථික සුරක්ෂිතතාව හා ඒහා බැඳි ධනාත්මක මානසික තත්ත්වය පැහැදිලිව දක්නට ලැබුණත් මැද පෙරදිග රටවල ජීවත්වන දරුවන්ගේ දෙමව්පියන් තුළ යම් කිසි ආකාරයක ආර්ථික මෙන් ම මානසික අවධානාත්මක බව පවතින බව පැහැදිලි විය. කෙසේ වෙතත් මෙම අධ්‍යයනය මඟින් පැහැදිලි වන ප්‍රධානතම කරුණ වන්නේ, ශ්‍රී ලංකාවේ වැඩිහිටියන් තුළ සාර්ථක වයස්ගතභාවය තීරණය වන ප්‍රධානතම සාධකය බොහෝ විට ඔවුන්ගේ ආර්ථික සුරක්ෂිතතාව මත පදනම් වන බවයි.

ප්‍රමුඛ පද: දරුවන් විදේශගතවීම, වැඩිහිටි ජනගහනය, සමාජ හුදෙකලාව

මෙම අධ්‍යයනය සඳහා කුමාරි තෝරදෙණියගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

නවීන කුඩා අවන්හල් මූලික කරගත් නාකරික සංස්කෘතිය පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් : මහනුවර නගරය ඇසුරින්

එච්. ජී. ඩබ්. ඒ. අයි. සෙව්වන්දි
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20718@arts.pdn.ac.lk

මහනුවර වැනි සාම්ප්‍රදායික නගරයක, නවීන කුඩා අවන්හල් බිහිවීමත් සමඟ නාගරික ජනතාවගේ එදිනෙදා ජීවන රටාව සහ විවේකය ගතකරන ආකාරයෙහි වෙනසක් හඳුනාගත හැක. නවීන කුඩා අවන්හල් මහනුවර නගරයේ නාගරික සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කෙරෙහි බලපා ඇති ආකාරය ගවේෂණය කිරීම මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ වූ අතර මෙහිදී නවීන කුඩා අවන්හල් ලෙස අදහස් කෙරෙනුයේ එකවර පාරිභෝගිකයෙන් 25 දෙනෙකුට පමණ සිය අවශ්‍යතා තෘප්ත කර ගැනීමට හැකියාව පවතින අවකාශයකින් යුත් අවන්හල් ය. ගවේෂණාත්මක පර්යේෂණ සැලැස්ම යටතේ ගුණාත්මක ක්‍රමවේදයට අනුව සිදුකළ මෙම පර්යේෂණය මහනුවර නගරයේ ඩී. එස්. සේනානායක වීදිය, ඊ. එල්. සේනානායක වීදිය සහ කොළඹ වීදිය කේන්ද්‍ර කොටගෙන ඇති නවීන කුඩා අවන්හල් නියැදිය ලෙස ගෙන සහභාගිත්ව නිරීක්ෂණ ක්ෂේත්‍ර සටහන්, ඡායාරූප දත්ත (Visual Data), ගැඹුරු සම්මුඛ සාකච්ඡාල අර්ධ ව්‍යූහගත සම්මුඛ සාකච්ඡා ඔස්සේ රැස්කරගත් දත්ත, තේමාකරණ විශ්ලේෂණය යටතේ විස්තරාත්මක විශ්ලේෂණය හා ඡායාරූප අන්තර්ගත විශ්ලේෂණය ඔස්සේ සිදු කර ඇත. නූතන නාගරික අවකාශය තුළ සාම්ප්‍රදායික පොදු ස්ථානවලින් බැහැරව බිහිවෙමින් පවතින නවීන කුඩා අවන්හල් යනු හුදෙක් වාණිජමය පරිශ්‍රයක් නොව, නාගරික ජනයාගේ අනන්‍යතාව විශද කරන සුවිශේෂ අවකාශයන් බව පැහැදිලි ය. මෙම නවීන අවන්හල් පරිසරය තුළ සිදුකළ භෞතික නිරීක්ෂණවලට අනුව, එහි අභ්‍යන්තර අලංකරණ සඳහා භාවිත කර ඇති වර්ණ, සංගීතය මෙන්ම පුස්තකාල පරිහරණයට, සංගීත උපකරණ භාවිතයට ලබා දී ඇති නිදහස් අවකාශය මෙන්ම මහනුවරට ආවේණික සාම්ප්‍රදායික වැඩවසම් සමාජ ලකෂණ සිත්තම් හා දේශීය හස්ත කර්මාන්ත නිර්මාණ ඔස්සේ ගෙන හැරපෑම තුළ සම්ප්‍රදායන් ද්විත්ත්වයක සම්මිශ්‍රණයක් දැක ගත හැකිය. පාරිභෝගික දත්ත විශ්ලේෂණය කිරීමේදී, උසස් අධ්‍යාපනයේ නිරත වන සිසුන් නිදහසේ ස්වයං-අධ්‍යයනයෙහි නිරත වීමටත්, රැකියා ස්ථානවල කටයුතුවලට සම්බන්ධ මාර්ග ගත සාකච්ඡා පැවැත්වීමටත්, පෙම්වතුන් නිදහසේ කාලයගත කිරීමටත් මෙම අවකාශය තෝරාගන්නා බව පැහැදිලි වේ. විශේෂයෙන්ම, පාරිභෝගිකයින් එකම අවන්හල වෙත වැඩි වාර ගණනක් නැවත පැමිණීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින අතර එමඟින් තහවුරු වන්නේ, මෙම තේමාත්මක පසුබිම් ඔවුන්ගේ පෞරුෂය සහ සමාජීය හැසිරීම් හැඩගැස්වීම කෙරෙහි සෘජුවම දායක වන බවයි. ඒ අනුව මහනුවර නගරය තුළ පවතින නූතන කුඩා අවන්හල් යනු හුදෙක් ආහාර පාන අලෙවි කරන වාණිජමය ස්ථාන පමණක් නොව, නාගරික සංස්කෘතිය සහ ජනතාවගේ අනන්‍යතාව ප්‍රතිනිර්මාණය කරන සුවිශේෂ තෙවන අවකාශයක් ලෙස ක්‍රියාත්මක වන බවයි.

ප්‍රමුඛ පද: තෙවන අවකාශය, නවීන කුඩා අවන්හල්, නාගරික සංස්කෘතිය ප්‍රතිනිර්මාණය

මෙම අධ්‍යයනය සඳහා දිනුෂිකා යාපා අබේවර්ධනගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

මැද පෙරදිග ගෘහ සේවයේ නිරතව සිට පැමිණි කාන්තාවන් නැවත සංක්‍රමණය වීම සඳහා බලපාන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එච්.ඩී.එම්.ඩී. සිරිනිමල්
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20740@arts.pdn.ac.lk

ශ්‍රී ලාංකික සංක්‍රමණය සම්බන්ධයෙන් ගත් කළ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ රැකියා සඳහා විදේශගතවීමේ ප්‍රවණතාවයේ සීඝ්‍ර වැඩිවීමකි. ශ්‍රී ලාංකේය ආර්ථික ව්‍යුහය තුළ විදේශ ශ්‍රම සංක්‍රමණය තුළ විශේෂයෙන්ම මැදපෙරදිග රටවල ගෘහ සේවය සඳහා කාන්තාවන් දායක වීම ඉතා වැදගත් ක්ෂේත්‍රයක් බවට පත්ව ඇත. මෙම කාන්තාවන් උපයන විදේශ විනිමය රටේ ආර්ථිකයට ප්‍රමුඛ දායකත්වය සැපයුවද, සේවය නිමවා පැමිණෙන බොහෝ කාන්තාවන් නැවත විදේශගතවීමේ ප්‍රවණතාවක් වර්තමානය තුළ දක්නට ලැබේ. මෙම අධ්‍යනය කෑගල්ල දිස්ත්‍රික්කය කෙරෙහි අවධානය යොමු කරමින් මැද පෙරදිග ගෘහ සේවයේ නිරතව සිට ප්‍රත්‍යාගමනය වූ කාන්තාවන් නැවත සංක්‍රමණය වීම සඳහා බලපාන සාධක පිළිබඳ සමාජ විද්‍යාත්මකව ගවේෂණය කර ඇත. එමෙන්ම ප්‍රත්‍යාගමනය වූ කාන්තාවන් නැවත විදේශගතවීම සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සහ එම ගැටලු සඳහා සුදුසු විසඳුම් ඉදිරිපත් කිරීමයි. ඒ අනුව එක් වරකට වැඩි වාර ගණනක් විදේශගත වී මැද පෙරදිග ගෘහ සේවය කර නැවත සංක්‍රමණික කාන්තාවන් 12 යොදා ගනිමින් ගුණාත්මක ක්‍රමවේදය යටතේ අරමුණු සහගත නියැදිය භාවිත කරමින් අධ්‍යයනය සිදුකර ඇත. ඒ අනුව සම්මුඛ පරීක්ෂණ උපදෙස් මාලාවක් භාවිත කරමින් අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා හරහා ලබා ගත් දත්ත තේමාත්මක විශ්ලේෂණය හරහා විශ්ලේෂණය කර ඇත. විදේශගතව සිට මෙරටට පැමිණෙන කාන්තාවන් ස්ථාවර ජීවනෝපාය මාර්ගයක් නොමැති වීම, උපයන ලද ආදායම් නිසි ලෙස කළමනාකරණය කරගැනීමට නොහැකිවීම, පවුල් ඒකකය තුළ පවතින ආර්ථික පීඩනය මෙන්ම සමාජ සංදර්භය තුළදී මුහුණ දෙනු ලබන නිෂේධනීය ආකල්ප වැනි තල්ලු කිරීමේ සාධක ඔවුන් නැවත විදේශගතවීම සඳහා පොළඹවනු ලබන බව මෙම අධ්‍යයනයෙන් හෙළි විය. මෙම පර්යේෂණය මගින් නිගමනය කරනු ලබන්නේ මැද පෙරදිග ගෘහ සේවයේ නිරතව සිට පැමිණි කාන්තාවන් නැවත විදේශ ගත වීම සඳහා බලපානුයේ තනි හේතු සාධකයක් පමණක් නොව එකිනෙකට සම්බන්ධිත වූ මනෝ, සමාජීය හා ආර්ථික පද්ධතියක් බවයි. සොයා ගැනීම් මත පදනම්ව විදේශගතව සිට පැමිණෙන ගෘහ සේවිකාවන් දේශීය ආර්ථිකයට විධිමත්ව නැවත අනුකලනය කිරීම, ඔවුන්ගේ මනෝ සමාජීය ආරක්ෂාව තහවුරු කෙරෙන වඩාත් ප්‍රායෝගික රාජ්‍ය ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා බලධාරීන්ට මඟ පෙන්වීම සපයනු ඇත. ශ්‍රී ලංකාවේ මැද පෙරදිග ගෘහ සේවයේ නිරතව සිට පැමිණි කාන්තාවන් නගා සිටුවීම සහ සමස්ත යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා මෙම වෙනස්කම් අත්‍යවශ්‍ය වේ.

ප්‍රමුඛ පද: ඇදගැනීමේ සාධක, ගෘහ සේවිකාවන්, තල්ලු කිරීමේ සාධක, නැවත සංක්‍රමණය, මැදපෙරදිග

මෙම අධ්‍යයනය සඳහා අබේ රත්නායකගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී පොලිස් නිලධාරීන් මුහුණපාන ගැටලු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්: කටුවන පොලිස් බල ප්‍රදේශය ඇසුරෙන්

එච්. දිනුක්ෂි සුමුදුනි
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20761@arts.pdn.ac.lk

ශ්‍රී ලංකා සමාජයේ වර්තමාන තාක්ෂණික දියුණුවත් සමග අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී පොලිස් නිලධාරීන්ට බරපතල වශයෙන් ගැටලු බොහෝමයකට මුහුණ පෑමට සිදු වී ඇත. මෙය අපරාධ විමර්ශන ක්‍රියාවලිය සාර්ථකව සහ කාර්යක්ෂමව සිදු කිරීමට සෘජුව මෙන්ම වක්‍රාකාරව බලපෑම් ඇති කරයි. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී මුහුණ පාන ගැටලු පිළිබඳව පරීක්ෂා කිරීමයි. මෙහිදී අපරාධ විමර්ශන ක්‍රියාවලියේදී පොලිස් නිලධාරීන් වෘත්තිමය වශයෙන්, සමාජීය වශයෙන් සහ පරිපාලනමය වශයෙන් මුහුණපාන විවිධාකාර ගැටලු පිළිබඳ අධ්‍යයනය කරන ලදි. මෙම පර්යේෂණය ප්‍රාථමික දත්ත හා ද්විතියික දත්ත යන දත්ත මූලාශ්‍රය දෙකම පදනම් කර ගෙන ඇති අතර මෙම අධ්‍යයනය සඳහා මිශ්‍ර පර්යේෂණ සැලසුමක් භාවිත කරන ලදි. ප්‍රශ්නාවලි ක්‍රමවේදය මගින් පුද්ගලයන් 60 දෙනෙකුගෙන් සමන්විත වූ මූලික නියැදියක් භාවිත කරමින් ප්‍රමාණාත්මක දත්ත රැස් කරනු ලැබූ අතර අරමුණු සහගත නියැදුම් ක්‍රමය මගින් කටුවන පොලිස් ස්ථානයෙන් තෝරාගත් ප්‍රතිචාරකයින් 15 දෙනෙකු සම්මුඛ සාකච්ඡාවන් සිදු කිරීමෙන් අධ්‍යයනය සඳහා අවශ්‍ය ගුණාත්මක දත්ත රැස් කරන ලදි. මෙහිදී ගුණාත්මක දත්ත තේමාකරණය ඇසුරින් විශ්ලේෂණය කරන ලද අතර ලබාගත් ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදි. මෙම අධ්‍යයනයේ පර්යේෂණ සොයාගැනීමලට අනුව අධික වැඩබර, සේවා මුරවල පවතිනා අක්‍රමවත්භාවය සහ ප්‍රමාණවත් නිවාඩු නොමැතිකම හේතුවෙන් නිලධාරීන් දැඩි මානසික ආතතියකට හා පවුල් සංස්ථාව තුළ ගැටලුවලට මුහුණ දෙන බව පැහැදිලි විය. තවද නවීන තාක්ෂණික මෙවලම් හා විද්‍යාත්මක විමර්ශන පහසුකම් අවම වීම, සේවා ස්ථානයේ භෞතික සම්පත් හිඟකම මෙන්ම පවතින නෛතික හා පරිපාලනමය බාධාවන් විමර්ශනවල කාර්යක්ෂමතාව කෙරෙහි සෘජුවම බලපායි. මහජන සහයෝගය නිසි පරිදි නොලැබීම සහ පොලිස් සේවය පිළිබඳ සමාජය තුළ පවතින සෘණාත්මක ආකල්ප ද එම වෘත්තීය පසුබෑම තීව්‍ර කරයි. ඒ අනුව අපරාධ විමර්ශන ක්‍රියාවලිය වඩාත් සාර්ථක කිරීම සඳහා නිලධාරීන්ගේ සුභසාධනය ඉහළ නැංවීම, නවීන තාක්ෂණික පුහුණුව ලබාදීම සහ ආයතනික ව්‍යූහය වඩාත් නම්‍යශීලය සහ ප්‍රතිසංස්කරණය කිරීම අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනයෙන් නිගමනය කෙරේ.

ප්‍රමුඛ පද: අපරාධ, අපරාධ විමර්ශනය, පරිපාලනමය ගැටලු, පොලිස් නිලධාරීන්, වෘත්තිමය ගැටලු

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ළමුන් බාල අපරාධ සඳහා යොමුවීමට බලපා ඇති හේතු පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

එම්.ජී. එස්. තක්ෂිලා
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20765@arts.pdn.ac.lk

බාල අපරාධ යනු යම් රටක නීතිය මගින් නියම කර ඇති වයස් සීමාවකට අඩු දරුවකු විසින් සිදු කරනු ලබන නීතියෙන් දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස සැලකේ. වර්තමාන සමාජයේ බරපතල ගැටලුවක් වන අතර එය පුද්ගලයාගේ පවුලේ සහ සමාජයේ විවිධ සාධකවල ඒකාබද්ධ බලපෑමක ප්‍රතිඵලයක් වශයෙන් පැන නගී. මෙම අධ්‍යයනය මගින් වේරවලවත්ත ළමා රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා සිටින ළමුන්ගේ අත්දැකීම් ඇසුරින් බාල අපරාධ සඳහා යොමුවීමට බලපාන සමාජීය හේතු විමර්ශනය කෙරේ. මෙම පර්යේෂණයේ මූලික අරමුණ වූයේ ළමුන් බාල අපරාධ සඳහා යොමුවීමට බලපාන හේතු පිළිබඳ හඳුනාගැනීමයි. මෙම පර්යේෂණය ගුණාත්මක සමාජ විද්‍යාත්මක අධ්‍යයනයකි. අධ්‍යයන නියැදියට වේරවලවත්ත ළමා රැඳවුම් මධ්‍යස්ථානගත ගැහැනු ළමුන් සහ පිරිමි ළමුන් 10 දෙනෙකු බැගින්ද,පරිවාස නිළධාරීන් 05 දෙනෙකුද වේ. දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ලේඛන විශ්ලේෂණ ක්‍රම භාවිත කෙරුණු අතර දත්ත තේමාත්මක විශ්ලේෂණ ක්‍රමය භාවිතයෙන් විශ්ලේෂණය කෙරිණි. අධ්‍යයනයේ සොයාගැනීම් වූයේ ළමුන් බාල අපරාධ සඳහා යොමුවීමට ප්‍රධාන වශයෙන් සමාජීය හා පවුල්මය සාධක බලපාන බවයි. පවුල් ගැටුම්, දෙමාපියන්ගේ වෙන්වීම, දෙමාපියන්ගේ විදේශගතවීම, ආර්ථික දුෂ්කරතා, දෙමාපිය අධීක්ෂණයේ අඩුව, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මත්ද්‍රව්‍ය භාවිතය, සමාජ මාධ්‍ය බලපෑම, සමවයස් මිතුරු කණ්ඩායම්වල අහිතකර බලපෑම සහ නොසලකා හැරීම වැනි සාධක බාල අපරාධකාරී හැසිරීම් වර්ධනයට ප්‍රබල ලෙස බලපාන බව අනාවරණය විය. එසේම ළමා කාලයේදී අත්විඳින අහිතකර අත්දැකීම්, චිත්තවේගීය ආරක්ෂාව නොලැබීම සහ සමාජ විරෝධී පරිසරවල ජීවත්වීම ද අපරාධකාරී ප්‍රවණතා වර්ධනයට හේතු වන බව හඳුනාගන්නා ලදි. බාල අපරාධ යනු තනි පුද්ගල සාධකයක ප්‍රතිඵලයක් නොව පවුල, සමාජය, ආර්ථික තත්ත්වය සහ සමවයස් කණ්ඩායම් ඇතුළු විවිධ සමාජීය සාධකවල සංකීර්ණ අන්තර් ක්‍රියාවක ප්‍රතිඵලයක් බව මෙම අධ්‍යයනයෙන් තහවුරු වෙයි. බාල අපරාධ අවම කිරීම සඳහා සිදු කරන යෝජනා ලෙස පවුල් සවිබලගැන්වීම, දෙමව්පිය දැනුවත් කිරීම, ළමා ආරක්ෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම, පාසල් හා ප්‍රජා මට්ටමේ උපදේශන සේවා පුළුල් කිරීම සහ අවදානම් සහිත ළමුන් සඳහා පුනරුත්ථාපන හා මනෝසමාජීය සහාය වැඩිදියුණු කිරීම වැදගත් වේ.

ප්‍රමුඛ පදඃ පවුල් පරිසරය, පුනරුත්ථාපනය, බාල අපරාධ, ළමා රැඳවුම් මධ්‍යස්ථාන

මෙම අධ්‍යයනය සඳහා උපාලි වීරකෝන්ගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

ග්‍රාමීය පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් අපගාමී චර්යාවන් වෙත යොමු වීම සඳහා බලපාන හේතු පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් : කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොඩගම ග්‍රාම නිලධාරී වසම ඇසුරෙන්

ඩී.කේ.සී. වික්‍රමසිංහ
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20837@arts.pdn.ac.lk

ග්‍රාමීය පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් අතර පාසල් අත්හැරයාම, ගුරුවරුන්ට අකීකරුවීම, මත්ද්‍රව්‍ය, මත්පැන් වලට යොමුවීම, වීදි කල්ලිවලට සම්බනධවීම වැනි අපගාමී චර්යාව වැඩිවීම දැනට ලංකාවේ ග්‍රාමීය අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපාන ප්‍රධාන ගැටලුවක් වී ඇත. විශේෂයෙන්ම පර්යේෂණ දත්තවලින් පෙනී යන්නේ මෙම හැසිරීම් හුදෙක් විනය ගැටලු නොව සිසුන්ගේ අධ්‍යාපන ජීවිතය සහ අනාගතය අවදානමට ලක් කරන බරපතළ සමාජ ගැටලුවක් බවයි.මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන් අපගාමී චර්යාවන් වෙත යොමුවීමට බලපාන හෙතු හඳුනාගෙන ඒවා සමාජ විද්‍යාත්මකව විශ්ලේෂණය කිරීමයි. ඇල්බට් බන්ධුරා විසින් ඉදිරිපත් කරනු ලැබූ සමාජ ඉගෙනුම් න්‍යාය පාදක කරගත් මෙම අධ්‍යයනයට පාසල් යන වයසේ පසු වන ශිෂ්‍යයන් පස්දෙනෙක් හා ශිෂ්‍යාවන් පස්දෙනෙක් සමග සිදු කරනු ලැබූ සිද්ධි අධ්‍යයනද ඔවුන්ගේ දෙමාපියන් සහ ග්‍රාම නිලධාරී මහතා සමග සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා සහ ගුරුවරුන් සඳහා ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා මගින් රැස් කර ගනු ලැබූ දත්ත ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කරන ලදි. දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වූ ප්‍රධාන සොයාගැනීම් අනුව ග්‍රාමීය ප්‍රදේශවල දෙමාපියන්ගේ සංක්‍රමණ, මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිතය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ආදී ක්‍රියාකාරකම් දරුවන් විසින් නිරන්තරයෙන් නිරීක්ෂණය කිරීම සහ අපගාමී පාසල් කණ්ඩායම්වල ක්‍රියාකාරකම්, ජනප්‍රිය පුද්ගලයන් සහ මාර්ගගත පරිගණක ක්‍රීඩා අනුකරණය හේතුවෙන් මෙම අපගාමී හැසිරීම් ඉගෙන ගන්නා බවයි. ග්‍රාමීය සන්දර්භයේ ධනාත්මක ආදර්ශයන් හිඟවීම සහ ඍණාත්මක ආදර්ශයන් බහුල වීම මත ශිෂ්‍යයා තුළ සාමාන්‍ය දෙයක් යන සංජානන රටාව ගොඩ නගයි. තවද අපගාමී කණ්ඩායම්වල සමවයස් මිතුරන්ගේ පැසසුම් සහ ගෞරවය ලැබීම දැකීම දරුවාට වක්‍ර ශක්තිමත් කිරීමක් වන අතර දරුවාට ගුරුවරුන්ගෙන් වහා ප්‍රතිචාර නොලැබීම තුළ අපගාමී හැසිරීම් තවදුරටත් ශක්තිමත් කරයි. ඒ අනුව අපගාමී චර්යා වැළැක්වීමට නම් ඍණාත්මක ආදර්ශ ඉවත් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර ග්‍රාමීය පාසල් තුළ ධනාත්මක ආදර්ශයන් හඳුන්වාදීම ගුරුවරුන්ට සමාජ චිත්තවේගී ඉගැන්වීම් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් දරුවා නිරීක්ෂණය කරන පරිසරය වෙනස් කර අපගාමී චර්යා වෙනුවට ධනාත්මක හැසිරීම් ඉගෙන ගැනීමට සලස්වා ග්‍රාමීය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවිය හැකි බවත් නිගමනය කළ හැකිය.

ප්‍රමුඛ පද: අනුකරණය, අපගාමී චර්යා, ග්‍රාමීය පාසල් ශිෂ්‍ය/ශිෂ්‍යාවන්, නිරීක්ෂණය, සමාජය ඉගෙනුම් න්‍යාය

මෙම අධ්‍යයනය සඳහා සමින්ද ඥානරත්නගෙන් ලැබුණු උපදේශනය සහ අධීක්ෂණය ස්තුති පූර්වකව සිහිපත් කරමි.

විවාහක රෝහල් කාර්යමණ්ඩලය ඔවුන්ගේ වෘත්තීය ජීවිතය සහ පවුල් ජීවිතය සමතුලිත කර ගන්නා ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (රිකිල්ලගස්කඩ දිස්ත්‍රික් මූලික රෝහල ඇසුරෙන්)

ඩබ්ලිව්.එම්.එන්.අයි. විජේරත්න
සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
a20853@arts.pdn.ac.lk

